බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 31

සූත්‍රාන්තපිටකයෙහි

25 වන ග්‍රන්ථය

කුදුගත්සඟියේ දසවැනි වූ

ජාතකපාළි

ද්විතීය භාගය

සිංහලානුවාදය
මහරගම සිරි වජිරඤාණ ධර්මායතනාධිපති
මඩිහේ සිරි පඤ්ඤාසීහාභිධාන
මහානායක ස්ථවිරයන් වහන්සේ විසිනි

ශ්‍රී බු. ව. 2550
රාජ්‍ය වර්ෂ. 2006

Buddha Jayanti Tripitaka Series, Volume 31

The Twenty-fifth Book in the

Suttanta-Pitaka

Khuddaka- Nikāya (8)

25

JĀTAKA PĀLI (II)

With the Sinhala translation by

The Venerable

Madihe Siri Paññāsīha Mahā Nāyaka Thera

The Principal of Siri Vajiraññāna

Dharmāyatanaya, Maharagama

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස
චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස
තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ
චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ
ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

<u>බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා</u>
<u>පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ</u>
<u>මහා ධර්ම දානමය පුණ්‍යකර්මය</u>

"අපාරුතා තේසං අමතස්ස ද්වාරා
යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !
බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !
ලෝ සත්නට සෙත් වේවා !

"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"
(*යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය*)

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය
මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ
සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද
පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,
සමින්ද රණසිංහ.
2009.06.28

සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

ජාතකපාළි

දුතියො භාගො

සූත්‍රාන්තපිටකයෙහි කුදුගත්සඟියේ

ජාතකපාළි

ද්විතීය භාගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:12 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

පටුන
CONTENTS

	පිටු
සංස්කාරක නිවේදනය	xv
ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය	xvii
සංකේත නිරූපණය	xix
පාළි හෝඩිය	xxi
විසය සූචි	xxiii–xxiv
පෙළ හා පරිවර්තනය	2–441
ගාථාදිපාදනුක්කමණිකා	443–486
සඤ්ඤානාමානුක්කමණිකා	487–491
විසෙසපදනුක්කමණිකා	493–497
ශුද්ධාශුද්ධ නිරූපණය	499
බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා	501

සංස්කාරක නිවේදනය

ජාතක පාළියෙහි එකක නිපාතය පටන් පකිණ්ණක නිපාතය අවසන් කොට ඇති නිපාත තුදුසෙකි. එහි අපණ්ණක ජාතකාදි සාරසියසයානූ (496) ජාතක කෙනෙක් ජාතකපාළි ප්‍රථම භාගයෙහි ඇතුළත් වූහ. එහි ගාථා සංඛ්‍යාව දෙදහස් තුන්සිය සත්විස්සෙකි. (2327)

මෙ මැ ද්විතීය භාගයෙහි ලා වීසතිනිපාත යැ තිංසති නිපාත යැ චත්තාලීස නිපාත යැ පඤ්ඤාස නිපාත යැ සට්ඨි නිපාත යැ සත්තති නිපාත යැ අසීති නිපාත යැ යන සත් නිපාතයන්හි සංග්‍රහ වූ මාතඞ්ග ජාතකය ආදිකොට ඇති එක්සාලිස් (41) ජාතක කෙනෙක් වෙත්. ගාථා එක්දහස් නවසිය දෙඅනූවකි. (1992)

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි එක්තිස් (31) වැනි ග්‍රන්ථය වූ ජාතකපාළි ද්විතීය භාගය ද මහරගම සිරිවජිරඤාණ ධර්මායතනාධිපති මඩිහේ සිරි පඤ්ඤාසීහාභිධාන මහානායක ස්ථවිරයන් වහන්සේ විසින් ම සිංහල අනුවාදය සපයන ලද්දේ ය. වර්තමාන ත්‍රිපිටක මණ්ඩලයෙහි ශාස්ත්‍රාගමධර මහතෙරවරුන් විසින් පාඨශොධනය හා සිංහල අනුවාදය ද මැනැවින් සකස්කොට ගාථාදිපාද සූචිය ද සඤ්ඤා හා විශෙෂපද සූචි ද සම්පාදනය කොට ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තැන්පත් ඊ. ඇල්. බී. හුරුල්ලේ මැතිතුමාණන්ගේ මෙහෙයීමෙන් හා එ මැ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තැන්පත් සෝමපාල ජයවර්ධන මහතාණන්ගේ විශෙෂ උද්‍යොගය ද, ඇතැම් අමාත්‍යාංශ භාරයේ පවත්නා රාජ්‍ය සංස්ථා සභාපතිවරුන්ගේ සානුකම්පිත පරිත්‍යාගයන් ද හෙතුකොටගෙන බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි මුද්‍රණය අවසානය කරා යෙමින් පවත්නා බව ද ප්‍රීතියෙන් සඳහන් කරම්හ.

ත්‍රිපිටක ධර්මව්‍යාප්තිය සඳහා නොයෙක් අයුරින් අනුබල දෙන හැම සුධීහු ධර්මදානමය කුශල හෙතුයෙන් සුඛභාගී වෙත්වා යි ආශංසනය කරම්හ.

ජාතක ප්‍රස්තාවනාව තෘතීය භාගයෙහි ලා ප්‍රකාශ කරනු ලැබේ.

මේ වගට, ශාසනොදයකාරී,

ලබුගම ලඞ්කානන්ද

මහානායක ස්ථවිර

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ ප්‍රධාන සංස්කාරක

2526/1984 පෙබරවාරි 25 වැනි දින

115, මහානායක චාරිකාරාමයේ
ත්‍රිපිටක මණ්ඩලය,
විජේරාම මාවත,
කොළඹ 7.

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

උපදේශක :

අග්ගමහාපණ්ඩිත, **බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය** මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

සභාපති :

අහංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, **කෝදාගොඩ ශ්‍රී ඥානාලෝක** දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

ප්‍රධාන සම්පාදක ;

මොල්ලිගොඩ ප්‍රවචනොදය පරිවෙණාධිපති ශ්‍රී මහාවිහාරවංශාලඞ්කාර විමල කීර්ති ශ්‍රී ත්‍රිපිටකවාගීශ්වර, රාජකීය පණ්ඩිත **ලබුගම ශ්‍රී ලඞ්කානන්ද**—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ.

සම්පාදක :

කිරුළපන පූර්වාරාමයෙහි හා නාරාහේන්පිට අභයාරාමයෙහි අධිපති අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, **රද්දල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක** — කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, **වේඬරුවේ ශ්‍රී අනවමදර්ශී**-කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ, මාකඬවර විහාරාධිපති, ශ්‍රී රේවත පරිවෙණාධිපති, රාජකීය පණ්ඩිත, **කරහම්පිටිගොඩ සුමනසාර** ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති, රාජකීය පණ්ඩිත, **කරඳන ශ්‍රී ප්‍රඥාලඞ්කාර** නායක ස්ථවිරයන් වහන්සේ.

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි ත්‍රිපිටක අංශයෙහි මහාචාර්ය, ශාස්ත්‍රාචාර්ය, රාජකීය පණ්ඩිත, ත්‍රිපිටකාචාර්ය **උඩුවේ ජනානන්ද** ස්ථවිරයන් වහන්සේ.

ලේකම් :

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, **දෙරගමුවේ සිරි ධම්මපාල**-කොළඹදිශායෙහි ප්‍රධාන **සඞ්ඝ**-නායක ස්ථවිරයන් වහන්සේ.

සංකේත නිරූපණය

සී.මු. – සීහළක්ඛරමුද්දිත ජාතකපාළි

අට්ඨකථා – සීහළක්ඛර මුද්දිත ජාතකට්ඨකථා

ම.ඡ.සං - මරම්මරට්ඨෙ ඡට්ඨසංගීතියා සොධිත ජාතකපාළි

ස්‍යා. – තායයක්ඛරමුද්දිත ජාතකපාළි

වි. – විදුරුපොල විහාරෙ පොත්ථකං

THE PALI ALPHABET

IN SINHALA CHARACTERS

VOWELS

අ a	ආ ā	ඉ i	ඊ ī	උ u	ඌ ū	එ ē	ඔ ō

CONSONANTS

ක ka	ඛ kha	ග ga	ඝ gha	ඞ ṅa
ච ca	ඡ cha	ජ ja	ඣ jha	ඤ ña
ට ṭa	ඨ ṭha	ඩ ḍa	ඪ ḍha	ණ ṇa
ත ta	ථ tha	ද da	ධ dha	න na
ප pa	ඵ pha	බ ba	භ bha	ම ma

ය ya	ර ra	ල la	ව va	ස sa	හ ha	ළ ḷa	අං ṃ
ක ka	කා kā	කි ki	කී kī	කු ku	කූ kū	කෙ kē	කො kō
ඛ kha	ඛා khā	ඛි khi	ඛී khī	ඛු khu	ඛූ khū	ඛෙ khē	ඛො khō
ග ga	ගා gā	ගි gi	ගී gī	ගු gu	ගූ gū	ගෙ gē	ගො gō

CONJUNCT-CONSONANTS

ක්ක kka	ඤ්ඤ ñña	ත්‍ර tra	ම්ඵ mpha
ක්ඛ kkha	ණ්හ ṇha	ද්ද dda	ම්බ, ඹ mba
ක්‍ය kya	ඤ්ච ñca	ද්ධ ddha	ම්භ mbha
ක්‍රි kri	ඤ්ඡ ñcha	ද්‍ර dra	ම්ම mma
ක්ව kva	ඤ්ජ ñja	ද්ව, ද්ව dva	ම්හ mha
ඛ්‍ය khya	ඤ්ඣ ñjha	ධ්ව dhva	ය්‍ය, ය්ය yya
ඛ්ව khva	ට්ට ṭṭa	න්ත nta	ය්හ yha
ග්ග gga	ට්ඨ, ට්ඨ ṭṭha	න්ථ ntha	ල්ල lla
ග්ඝ ggha	ඩ්ඩ ḍḍa	න්ද nda	ල්‍ය lya
ඞ්ක ṅka	ඩ්ඪ ḍḍha	න්ධ ndha	ල්හ lha
ග්‍ර gra	ණ්ණ ṇṇa	න්න nna	ව්හ wha
ඞ්ඛ ṅkha	ණ්ට ṇṭa	න්හ nha	ස්ස ssa
ඞ්ග ṅga	ණ්ඨ ṇṭha	ප්ප ppa	ස්ම sma
ඞ්ඝ ṅgha	ණ්ඩ, ඬ ṇḍa	ප්ඵ ppha	ස්ව sva
ච්ච cca	ත්ත tta	බ්බ bba	හ්ම hma
ච්ඡ ccha	ත්ථ ttha	බ්භ bbha	ව්හ vha
ජ්ජ jja	ත්ව tva	බ්‍ර bra	ළ්හ ḷha
ජ්ඣ jjha		ම්ප mpa	

ා ā	ි i	ී ī	ු ු u	ූ ූ ū	ෙ ē

ජාතක පාළි

දුතියො භාගො

විසය සූචි

වීසති නිපාතො 2 – 87

ජාතක සංඛ්‍යා	ජාතකනාම	පිටුඅංකා
1.	මාතඞ්ග ජාතකං	2– 9
2.	චිත්තසම්භූත ,,	8–15
3.	සිවි ,,	14–21
4.	සිරිමන්ද ,,	20–27
5.	රොහන්තමිග ,,	26–33
6.	චූළහංස ,,	32–37
7.	සත්තිගුම්බ ,,	36–43
8.	භල්ලාටිය ,,	42–49
9.	සොමනස්ස ,,	48–55
10.	චම්පෙය්‍ය ,,	54–65
11.	පලොභන ,,	64–71
12.	පඤ්චපණ්ඩිත පඤ්හො	70–75
13.	හත්ථිපාල ජාතකං	76–81
14.	අයොඝර ,,	82–87

තිංසති නිපාතො 88 – 165

1.	කිංඡන්ද ජාතකං	88–93
2.	කුම්භ ,,	94–101
3.	ජයද්දිස ,,	100–109
4.	ඡද්දන්ත ,,	110–119
5.	සම්භව ,,	118–127
6.	මහාකපි ,,	126–135
7.	දකරක්ඛස පඤ්හො	134–141
8.	පණ්ඩරක ජාතකං	140–149
9.	සම්බුලා ,,	150–157
10.	ගන්ධතින්දුක ,,	156–165

විසය සූචි

චත්තාලීස නිපාතො 166 – 217

ජාතක සංඛ්‍යා	ජාතක නාම		පිට්ඨඞ්කා
1.	තෙසකුණ	ජාතකං	166–175
2.	සරභඞ්ග	,,	174–185
3.	අලම්බුසා	,,	186–193
4.	සඞ්ඛපාල	,,	194–207
5.	චූලසුතසොම	,,	206–217

පඤ්ඤාස නිපාතො 218 – 259

1.	නලිනිකා	ජාතකං	218–231
2.	උම්මාදන්ති	,,	230–247
3.	මහාබොධි	,,	246–259

සට්ඨි නිපාතො 260 – 285

1.	සොණක	ජාතකං	260–273
2.	සංකිච්ච	,,	272–285

සත්තති නිපාතො 286

1.	කුස	ජාතකං	286–303
2.	සොණනන්ද	,,	304–321

අසීති නිපාතො – 441

1.	චූලහංස	ජාතකං	322–337
2.	මහාහංස	,,	336–355
3.	සුධාභොජන	,,	354–379
4.	කුණාල	,,	378-411
5.	මහාසුතසොම	,,	412–441

සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

ජාතකපාළි

දුතියො භාගො

සුත්තන්තපිටකෙ – ඛුද්දකනිකායෙ

ජාතකපාළි

(දුතියො භාගො)

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

වීසතිනිපාතො

1. මාතඞ්ග ජාතකං

2328. කුතො නු ආගච්ඡසි රුම්මවාසී[1]
ඔතල්ලකො පංසුපිසාචකොව,
සඞ්කාරචොළං පටිමුච්ච[2] කණ්ඨෙ
කො රෙ තුවං හොහිසි අදක්ඛිණෙය්‍යො.

2329. අන්නං තව[3] ඉදං පකතං යසස්සි[4]
තං ඛජ්ජරෙ භුඤ්ජරෙ පිය්‍යරෙ ච,
ජානාසි මං ත්වං පරදත්තූපජීවිං[5]
උත්තිට්ඨපිණ්ඩං ලභතං සපාකො.

2330. අන්නං මම[6] ඉදං පකතං බ්‍රාහ්මණානං
අත්තත්ථාය සද්දහතො මමයිදං,
අපෙහි එත්තො කිමිධට්ඨිතොසි
න මාදිසා තුය්හං දදන්ති ජම්ම.

2331. ථලෙ ච නින්නෙ ච වපන්ති බීජං
අනූපඛෙත්තෙ ඵලමාසසානා[7],
එතාය සද්ධාය දදාහි දානං
අප්පෙව ආරාධයෙ දක්ඛිණෙය්‍යෙ.

2332. ඛෙත්තානි මය්හං විදිතානි ලොකෙ
යෙසාහං බීජානි පතිට්ඨපෙමි,
යෙ බ්‍රාහ්මණා ජාතිමන්තූපපන්නා
තානීධ ඛෙත්තානි සුපෙසලානි.

---

1. දුම්මවාස – මජසං, ස්‍යා.
2. පටිමුඤ්චා–මජසං, ස්‍යා.
3. තවෙදං–මජසං, තවයිදං–වි.
4. යසස්සිනං–වි, ස්‍යා.
5. ජීවි–මජසං, ස්‍යා.
6. මමෙදං–මජසං,
7. ඵලමාසිං සමානා–ස්‍යා. ඵලමාසමානා–ම. වි.

සූත්‍රාන්තපිටකයේ - ඛුද්දකනිකායෙහි

ජාතකපාලි

(ද්විතීය භාගය)

ඒ භගවත් අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.

වීසතිනිපාතය

1. මාතඞ්ග ජාතකය

2328. අපිරිසුදු කඩමාළු හඳනා, ලාමක පාංශුපිශාචයකු මෙන් කසළගොඩෙන් ඇසිඳගත් කඩක් ගෙලැ දවටී ලාමක වූ තෝ, කොහි සිට ආවෙහි ද? එම්බල දක්ෂිණාර්හ නො වූ තෝ කවරෙහි දැයි මණ්ඩබ්බ කුමාර තෙමේ ඇසීය.

2329. මහත් යශස්ඇති මාණ්ඩව්‍ය කුමාරය, පිළියෙළ කරන ලද ඔබගේ මේ ආහාරය බොහෝ දෙනා කති, බුදිති, පානය ද කරත්. නුඹ මෙරමා දුන් දෑයෙන් යැපෙන්නකු කොට මා දනුව. එහෙයින් යාචක පිණ්ඩය චණ්ඩාල තෙමේත් ලබාවා යී මාතඞ්ග තෙමේ කීය.

2330. මාගේ මේ ආහාරය ජාතිසම්පන්න බ්‍රාහ්මණයනට පිළියෙළ කරන ලදය. සැදැහැති මාගේ මේ දනය තමහට වැඩ පිණිස වේ. සැඩොල, මෙතනින් පහව යා. කුමකට මෙහි සිටිනෙහි ද? නීචය, මා වැන්නෝ තට නොදෙති.

2331. එම්බා කුමාරය, ශස්‍යඵල කැමැත්තෝ ගොඩ ද, වළ ද. දෙණිය ද යම්සේ බිජුවට වපුරද්ද, එසේම නුඹ මේ ඵල ශ්‍රද්ධා-යෙන් (දනයෙන් ලැබෙන උසස් විපාක ගැන ඇදහීමෙන් යුතුව) පැමිණි හැමට දන් දෙව. (මෙසේ) දක්ෂිණාර්හයන් අරියනෙහි (ලබනෙහි) නම් මැනවි.

2332. යම්බඳු පුණ්‍යක්ෂෙත්‍රයන්හි මම බිජුවට පිහිටුවම්ද, ලොකයෙහි ඒ පුණ්‍යක්ෂෙත්‍රයෝ මා විසින් දන්නා ලදහ. ජාතියෙන් ද මන්ත්‍ර-යෙන් ද යුක්ත වූ යම් බ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද, ඉතා ප්‍රියශීලී වූ ඔවුහු මෙලොව පුණ්‍යක්ෂෙත්‍ර වෙත්.

2333. ජාතිමදෙ ච අතිමානිතා ච
ලොභො ච දොසො ච මදෙ ච මොහො,
එතෙ අගුණා[1] යෙසු වසන්ති සබ්බෙ,
තානීධ ඛෙත්තානි අපෙසලානි.

2334. ජාතිමදෙ ච අතිමානිතා ච
ලොභො ච දොසො ච මදෙ ච මොහො,
එතෙ අගුණා යෙසු න සන්ති සබ්බෙ
තානීධ ඛෙත්තානි සුපෙසලානි.

2335. කෙවත්ථ[2] ගතා උපජොතියො ච
උපජ්ඣායො අථවා භණ්ඩකුච්ඡි,[3]
ඉමස්ස දණ්ඩඤ්ච වධඤ්ච දත්වා
ගලෙ ගහෙත්වා ඛලයාථ[4] ජම්මං.

2336. ගිරිං නඛෙන ඛණසි අයො දන්තෙන ඛාදසි,
ජාතවෙදං පදහසි යො ඉසිං පරිභාසසි.

2337. ඉදං වත්වාන මාතඞ්ගො ඉසි සච්චපරක්කමො,
අන්තලික්ඛස්මිං පක්කාමි බ්‍රාහ්මණානං උදික්ඛතං.

2338. ආවෙඨිතං[5] පිට්ඨිතො උත්තමඞ්ගං
බාහං[6] පසාරෙති අකම්මනෙය්‍යං
සෙතානි අක්ඛීනි යථා මතස්ස
කො මෙ ඉමං පුත්තමකාසි එවං.

2339. ඉධාගමා සමණො රුම්මවාසී
ඔතල්ලකො පංසුපිසාචකොව
සඞ්කාරචොළං පටිමුච්ච කණ්ඨෙ
සො තෙ ඉමං පුත්තමකාසි එවං.

2340. කතමං දිසං අගමා භූරිපඤ්ඤ
අක්ඛාථ මෙ මාණවා එතමත්ථං
ගන්ත්වාන තං පටිකිරියෙමු[7] අච්චයං
අප්පෙව නං පුත්තං ලභෙමු ජීවිතං.

2341. වෙහායසං අගමා භූරිපඤ්ඤ
පථද්ධුනො පණ්ණරසෙව චන්දො,
අපිචාපි සො පුරිමං දිසං අගඤ්ඡි
සච්චප්පටිඤ්ඤ ඉසි සාධුරූපො.

---

1. එතෙ අගුණා යෙසුච සන්ති සබ්බෙ – මජසං.
2. කත්ථ – සයා.
3. ගණ්ඩ – මජසං.
4. ගලයාත – මජසං. සයා.
5. ආවෙල්ලිතං සයා. ආවෙළිත – මජසං.
6. බාහුං – මජසං. සයා.
7. පටිකරෙමු – මජසං.

2333. ජාතිමදය ද අතිමානය ද ලොභය ද ද්වෙෂය ද මදය ද මොහය ද යන තෙල හැම දොෂයෝ යම් කෙනකුන් කෙරෙහි පවතිද්ද, මෙලොව ඒ ක්‍ෂෙත්‍රයෝ (සපුන් පිරි තුඹස් සේ) අපෙශල වෙති.

2334. ජාතිමදය ද අතිමානය ද ලොභය ද ද්වෙෂය ද මදය ද මෝහය ද යන තෙල හැම දොෂයෝ යම් කෙනකුන් කෙරෙහි නැද්ද, මෙලොව ඒ ක්‍ෂෙත්‍රයෝ සුපෙශල වෙති. (ඔවුන් කෙරෙහි දෙන ලද්ද මහත් ඵල වෙයි.)

2335. (මේ වාසල් තුනෙහි රැකවලැ යෙදූණු) උපජොති ද උපජඣාය ද, භණ්ඩකුච්ඡි ද යන මොහු කොහි ගියාහු ද? මොහුට දඬුවම් ද වධ ද දී, සැඩොලා ගෙලෙහි ගෙනැ බැහැර කරවු (යී මාණවක කුමාරයා කීවේය.)

2336. මාණවකය, යම්බඳු වූ නුඹ ඍෂියාට පරිභව කරන්නෙහි ද? ඒ නුඹ පර්වතයක් නියෙන් සාරන්නෙහි ය. දතින් යකඩ කන්-නෙහි ය. ගිනි ගිලීමට උත්සාහ කරන්නෙහි ය. (ඍෂියාට පරිභව කිරීම පර්වතයක් නියෙන් සෑරීම වැනි තම පරිහානියට ම හෙතු වන බව මේ කී සැටි යී.)

2337. ස්වාභාවික පරාක්‍රමයෙන් යුත් මාතඞ්ග ඍෂි තෙමෙ මෙසේ කියා බමුණන් බලා සිටියදී ම අහසෙහි නැඟී ගියේ ය.

2338. හිස පිටුපසට පෙරළන ලදී. අත ද අකර්මණ්‍ය ලෙස දිග හරියී. (දරදඬු ය) මළ එකක්හුගේ මෙන් ඇස් සුදු ය. මාගේ පුත්‍රයාට කවරෙක් නම් මේ විපත සිදු කෙළේ ද?

2339. අපිරිසුදු කඩමාලුයෙන් මැසූ වස්ත්‍ර ඇති ලාමක පාංශු-පිශාචයකු මෙන් කසළගොඩෙන් ඇසිඳගත් කඩක් ගෙල දවටා ගත් ශ්‍රමණයෙක් මෙහි ආවේ ය. හෙ තෙමේ තීගේ මේ පුතුට මෙසේ කෙළේ ය. (යී එහි සිටි ජනයා කීවේය.)

2340. මාණවකයෙනි, බොහෝ ප්‍රඥා ඇත්තා වූ ඒ ශ්‍රමණයන් වහන්සේ කිනම් දිශාවකට ගියාහු ද? යන මේ කරුණ මට කියවු. ඔහු වෙත ගොස් ඒ වරදට පිළියම් කරන්නෙමු. (ක්‍ෂමා කරවන්නෙමු.) පුතුට ජීවිතය ලබා දෙන්නෙමු නම් ඉතා යෙහෙක (යි දිට්ඨමඞ්ගලිකාව කීවාය.)

2341. බොහෝ ප්‍රඥා ඇති ඒ ශ්‍රමණ තෙම ආකාශපථයාගේ මැද පූර්ණචන්ද්‍රායමාණ වැ අහසට වැඩම කෙළේය. තවද සත්‍ය වූ ප්‍රතිඥා ඇති යහපත් ස්වභාව ඇති ඒ ඍෂි තෙමේ පෙරදිගට වැඩම කළේය. (යී එහි හුන් මාණවකයෝ කීහ.)

2342. ආවෙඨිතං පිට්ඨිතො උත්තමඞ්ගං
බාහං පසාරෙති අකම්මනෙය්‍යං,
සෙතානි අක්ඛීනි යථා මතස්ස
කො මෙ ඉමං පුත්තමකාසි එවං.

2343. යක්ඛා හවෙ සන්ති මහානුභාවා
අන්වාගතා ඉසයො සාධුරූපා,
තෙ දුට්ඨචිත්තං කුපිතං විදිත්වා
යක්ඛා හි තෙ පුත්තමකංසු එවං.

2344. යක්ඛා ච මෙ පුත්තමකංසු එවං
ත්වඤ්ඤෙව මෙ මා කුද්ධො බ්‍රහ්මචාරි,
තුම්හෙව පාදෙ සරණං ගතාස්මි
අන්වාගතා පුත්තසොකෙන භික්ඛු.

2345. තදෙව හි එතරහි ච මය්හං
මනොපදොසො න මමත්ථි කොචි,
පුත්තො ච තෙ වෙදමදෙන මත්තො
අත්ථං න ජානාති අධිච්ච වෙදෙ.

2346. අද්ධා හවෙ භික්ඛු මුහුත්තකෙන
සම්මුය්හතෙව පුරිසස්ස සඤ්ඤා,
එකාපරාධං ඛම භූරිපඤ්ඤ
න පණ්ඩිතා කොධබලා භවන්ති.

2347. ඉමඤ්ච[1] මය්හං උත්තිට්ඨපිණ්ඩං
තං මණ්ඩව්‍යො භුඤ්ජතු අප්පපඤ්ඤො,
යක්ඛා ච තෙ නං න විහෙඨයෙය්‍යුං
පුත්තො[2] ච තෙ හොහිති සො අරොගො.

2348. මණ්ඩව්‍ය බාලොසි පරිත්තපඤ්ඤො
යො පුඤ්ඤක්ඛෙත්තානං අකොවිදොසි,
මහක්කසාවෙසු දදහි[3] දානං
කිලිට්ඨකම්මෙසු අසඤ්ඤතෙසු.

2349. ජටා ච කෙසා අජිනා නිවත්ථා
ජරූදපානංව මුඛං පරූළ්හං,
පජං ඉමං පස්සථ රූම්මරූපිං[4]
න ජටාජිනං තායතෙ අප්පපඤ්ඤං.

---

1. ඉදඤ්ච – මජසං. වි.
2. පුත්තං – සයා.
3. දදසි – මජසං.
4. දුම්මරූප – මජසං.

2342. (මාගේ පුත්‍රයාගේ) හිස පිටිපසට කැරැකිණි. අකර්මණ්‍ය ලෙස අත දිග හරියි, මළ එකක්හුගේ මෙන් ඇස් සුදුවන් ය, මාගේ පුත්‍රයාට මේ විප්‍රකාරය කවරෙක් කෙළේ ද? (යනුවෙන් දිට්ඨමංගලිකාව මාතඞ්ග පණ්ඩිතයන්ගෙන් ඇසුවා ය.)

2343. සාමීන් අනුව ගිය යහපත් ස්වභාවය ඇති මහානුභාවසම්පන්න යක්ෂයෝ ඇත්තාහු ම ය. ඒ යක්ෂයෝ දුෂ්ට සිත් ඇති කිපුණා වූ ඔබ පුතු දැන මේ විප්‍රකාරය කළහ.

2344. මාගේ පුතුට යක්ෂයෝ මෙසේ කළාහු ද, බ්‍රහ්මචාරීන් වහන්ස, නුඹ වහන්සේ ම මාගේ පුත්‍රයාට නො කිපෙන සේක්වා, මම නුඹ වහන්සේගේ ම පාදයන් සරණ කොට ගියමු. තවුසාණන් වහන්ස, මම පුත්‍රශොකයෙන් නුඹ වහන්සේ කරා පැමිණියමු.

2345. දිට්ඨමංගලිකාවෙනි, ඒ බණින කල්හිත් තීගේ පුතුට මා සිත්හි කිසියම් දොෂයෙක් නො වී ය, දනුදු නැත, තීගේ පුත්‍රයා වනාහි වේදයන් ඉගෙන වේද මදයෙන් මත් වූයේ වැඩ අවැඩ නො දනී.

2346. තවුසාණන් වහන්ස, එකාන්තයෙන් ම මිනිසාගේ සංඥාව මොහොතකින් මුළා වේ ම ය. මහාප්‍රාඥය, මේ එක ම අපරාධය කමා කරන සේක්වා, පණ්ඩිතයෝ නම් ක්‍රොධය බල කොට ඇත්තෝ නො වෙත්.

2347. මාගේ මේ ඉඳුල් බත්පිඩ අනුවණ මාණ්ඩව්‍ය තෙමේ අනුභව කෙරේවා, ඒ යක්ෂයෝ ද ඔහු නො වෙහෙසත්නාහ, තීගේ ඒ පුත් තෙමේ ද නිරොග වන්නේ ය.

2348. නුඹ මහත් වූ රාගාදි කෙලෙස් කසටින් යුත් කිළුටු කම් ඇති අසංඥතයන් කෙරෙහි දන් දෙන්නෙහි ය. යම්බඳු වූ නුඹ මෙසේ කිරීමෙන් පුණ්‍යක්ෂෙත්‍රයන් පිළිබඳ දනුමෙහි අදක්ෂ වෙහි ද, මාණ්ඩව්‍ය කුමාරය, එහෙයින් නුඹ අඥාන වෙහි ය.

2349. පුත මාණ්ඩව්‍යය, නුඹගේ දක්ෂිණාර්හයන් අතුරෙන් ඇතැමුන්ගේ කෙසයෝ හැඩපළු ගසා බඳින ලද්දහ. බුර සහිත අඳුන් දිවිසම් පොරවන ලද්දහ. ජීර්ණකූපයක්සේ දික් රැවුලෙන් වැසුණු මුව සිදුරු ඇති අපිරිසුදු රාක්ෂස වෙසය ඇති මේ ප්‍රජාව බලවු. මේ දළ මඩුලු හා අඳුන් දිවිසම් දරන තැනැත්තා මඳ නුවණැත්තහු නො රකී. හෙවත් පිහිට නො වේ.

2350. යෙසං රාගො ච දොසො ච
අවිජ්ජා ච විරාජිතා,
ඛීණාසවා අරහන්තො
තෙසු දින්නං මහප්ඵලං.

*උපහච්ච මනං මෙජ්ඣො මාතඞ්ගස්මිං යසස්සිනෙ,
සපාරිසජ්ජො උච්ඡින්නො මෙජ්ඣාරඤ්ඤං තද අහූ'ති.

මාතඞ්ග ජාතකං.

2. චිත්තසම්භූතජාතකං

2351. සබ්බං නරානං සඵලං සුචිණ්ණං
න කම්මනා[1] කිඤ්චන මොඝමත්ථි,
පස්සාමි සම්භූතං මහානුභාවං
සකම්මනා පුඤ්ඤඵලූපපන්නං.

2352. සබ්බං නරානං සඵලං සුචිණ්ණං
න කම්මනා කිඤ්චන මොඝමත්ථි,
කච්චිනු චිත්තස්සපි එවමෙව
ඉද්ධො මනො තස්ස යථාපි මය්හං.

2353. සබ්බං නරානං සඵලං සුචිණ්ණං
න කම්මනා කිඤ්චන මොඝමත්ථි,
චිත්තං විජානාහි තථෙව දෙව
ඉද්ධො මනො තස්ස යථාපි තුය්හං.

2354. භවං නු චිත්තො සුතමඤ්ඤතො තෙ
උදාහු තෙ කොචිනං එතදක්ඛා,
ගාථා සුගීතා න මමත්ථි කඞ්ඛා
දදාමි තෙ ගාමවරං සතඤ්ච.

2355. න වාහං චිත්තො සුතමඤ්ඤතො මෙ
ඉසී ච මෙ එතමත්ථං අසංසි
ගන්ත්වාන රඤ්ඤො පටිගාහි ගාථං
අපි තෙ වරං අත්තමනො දදෙය්‍ය.[2]

2356. යොජෙන්තු වෙ රාජරථෙ සුකතෙ චිත්තසිබ්බනෙ,
කච්ඡං නාගානං බන්ධථ ගීවෙය්‍යං පටිමුඤ්චථ.

---

* මරම්ම සයාමපොත්ථකෙසු අයං ගාථා න දිස්සති,
1. න කම්මුනා - මජසං. සයා.
2. අපි නු තෙ අත්තමනො වරං දදෙ - මජසං,

2350. යම් කෙනකුගේ රාගයත් ද්වෙෂයත් අවිද්‍යාවත් පහවී ද, ක්‍ෂය කළ ආසුව ඇති රහත්හු වෙද්ද උන්වහන්සේ කෙරෙහි දෙන ලද්ද මහත් ඵල වේ.

*මෙධ්‍ය රජ තෙම යශස් ඇත්තා වූ මාතඞ්ග සෘෂි කෙරෙහි සිත දූෂ්‍ය කොට සහපිරිවරින් වැනැසුණේ ය. එකල්හි මෙධ්‍යාරණ්‍යය වූයේ ය.

මාතඞ්ග ජාතක යි.

2. චිත්තසම්භූත ජාතකය

2351. මිනිසුන් විසින් මැනැවින් පුරුදු කරන ලද හැම කර්මයක් ම විපාක සහිත ය. කුශලාකුශල කර්‍ම අතුරෙන් හිස් කර්‍ම කිසිවක් නැත. ස්වකීය කර්‍මයෙන් පුණ්‍ය විපාකයට පැමිණි මහත් අනුභාව ඇති සම්භූත නම් වූ තමන් ප්‍රත්‍යක්‍ෂයෙන් දකිමි.

2352. මිනිසුන් විසින් මොනොවට පුරුදු කරන ලද හැම කර්‍මයක් ම විපාක සහිත ය. කුශලාකුශල කර්‍ම අතුරෙන් හිස් කර්‍ම කිසිවක් නැත. යම්සේ මාගේ යශස් සමෘද්ධවීද කිම? එසේම මා සොහොවුරු චිත්‍රයාගේ සිතත් සමෘද්ධ වීද?

2353. මිනිසුන් විසින් මොනොවට පුරුදු කරන ලද හැම කර්මයක් ම විපාක සහිත ය. කුශලාකුශල කර්ම අතුරෙන් හිස් කර්ම කිසිවක් නැත. දේවයන් වහන්ස යම්සේ නුඹ වහන්සේගේ යශස් සමෘද්ධ වී ද, එසේ ම ඒ චිත්තයාගේ ද සිත සමෘද්ධ විය. චිත්තයා ගැන (මෙසේ) දැන ගන්නේ මැනැවි.

2354. පින්වත, මම චිත්ත නම් වෙ මැ යි කියන චිත්තයාගෙන් ම තට මෙය අසන්නට ලැබිණි ද? නැතහොත් අනෙකකුගෙන් අසන්නට ලැබිණි ද? මෙය නුඹට කවරෙක් කීවේ ද? ගාථාව නම් මැනැවින් ගායනය කරන ලදී. ඒ ගැන මට සැකෙක් නැත. නුඹට ගම්වර සියයක් ද දෙමි.

2355. මම චිත්ත නම් වේ මැ යි කියන චිත්තයාගෙන් ම මට මෙය අසන්නට නො ලැබිණි. ඔබ තුමාගේ උයනෙහි වෙසෙන සෘෂිවරයෙක් මට මේ කරුණ කීවේ ය. රජු වෙත ගොස් මේ ගාථාව ගයව. එවිට තුටුසිත් ඇති රජ තෙමේ තට වරයක් ද දෙන්නේ ය.

2356. විසිතුරු මැසුම් ඇති අලංකාර ලෙස සරසන ලද රාජ රථයන් යොදන්වා, ඇතුන්ගේ පොරොද්ද බඳිමු. ග්‍රීවාභරණයන් ද පළඳමු.

* බුරුම සියම් පොත්හි මෙය නොපෙනේ.

2357. ආහඤ්ඤන්තු භෙරිමුදිඞ්ගසඞ්ඛෙ
සීඝානි යානානි ච යොජයන්තු
අජ්ජෙව හං අස්සමං තං ගමිස්සං
යත්ථෙව දක්ඛිස්සං ඉසිං නිසින්නං.

2358. සුලද්ධලාභො වත මෙ අහොසි
ගාථා සුගීතා පරිසාය මජ්ඣෙ,
සොහං ඉසිං සීලවතූපපන්නං
දිස්වා පතීතො සුමනොහමස්මි.

2359. ආසනං උදකං පජ්ජං පතිගණ්හාතු නො භවං,
අග්ඝෙ භවන්තං පුච්ඡාම අග්ඝං කුරුතු නො භවං.

2360. රම්මඤ්ච තෙ ආවසථං කරොන්තු
නාරීගණෙහි පරිචාරයස්සු
කරොහි ඔකාසමනුග්ගහාය
උභොපිමං ඉස්සරියං කරොම.

2361. දිස්වා ඵලං දුච්චරිතස්ස රාජ
අථො සුචිණ්ණස්ස මහාවිපාකං,
අත්තානමෙවං පටිසඤ්ඤමිස්සං
න පත්ථයෙ පුත්තං පසුං ධනං වා.

2362. දසෙවිමා වස්සදසා මච්චානං ඉධ ජීවිතං,
අප්පත්තඤ්ඤෙව තං ඔධිං නළො ඡින්නොව සුස්සති.

2363. තත්ථ කා නන්දි කා ඛිඩ්ඩා කා රතී කා ධනෙසනා,
කිංමෙ පුත්තෙහි දාරෙහි රාජ මුත්තොස්මි බන්ධනා.

2364. සො අහං සුප්පජානාමි මච්චු මෙ නප්පමජ්ජති,
අන්තකෙනාධිපන්නස්ස කා රතී කා ධනෙසනා.

2365. ජාති නරානං අධමා ජනින්ද
චණ්ඩාලයොනි දිපද කනිට්ඨා,
සකෙහි කම්මෙහි සුපාපකෙහි
චණ්ඩාලගබ්භෙ අවසිම්හ පුබ්බෙ.

2366. චණ්ඩාලාහුම්හ අවන්තීසු මිගා නෙරඤ්ජරම්පති,
උක්කුසා නම්මදාතීරෙ ත්යජ්ජ බ්‍රාහ්මණඛත්තියා,

2357. බෙර – මිහිඟු බෙර – සක් යන තූර්‍ය්‍යයන් නාද කෙරෙත්වා, වේග ගමන් ඇති වාහන ද යොදත්වා, යම් තැනක හුන් ඍෂිවරයා දක්නට හැක්කෙම් නම්, අද ම ඒ අසපුවට යන්නෙමි යි රජ තෙමේ කීවේ ය.

2358. ඒකාන්තයෙන් මට යහපත් ලාභයෙක් විය. මා විසින් පිරිස් මැද ගාථාව මැනැවින් ගායනය කරන ලදී. ශීල ව්‍රතයෙන් සමන්විත වූ ඍෂිවරයා දැක ඒ මම ප්‍රීත වූයෙම් සතුටුසිත් ඇත්තෙම් වෙමි.

2359. පින්වතුන් වහන්ස, අපගේ අසුන ද පා දෝනා පැන් ද පිළිගන්නා සේක්වා, පින්වතුන් වහන්සේ ආගන්තුක සත්කාරයෙන් පිදීම් වශයෙන් විචාරමි. පින්වතුන් වහන්සේ අපගේ ආගන්තුක සත්කාරය පිළිගන්නා සේක්වා.

2360. නුඹ වහන්සේට සිත්කලු ගෘහයක් කෙරෙත්වා, ස්ත්‍රීසමූ-හයා විසින් තෙපි පිරිවරනු ලබව. අනුග්‍රහ පිණිස එයට අවකාශ කළ මැනැවැ. අපි දෙදෙනා මැ මේ රජ සැපත අනුභව කරම්හ යි රජ තෙම කීවේ ය.

2361. මහරජ, දුශ්චරිතයාගේ විපාකය දැක වැළිදු මනාව පුරුදු කළ සුචරිතයාගේ විපාකයත් දැක මෙසේ තමන් ම සංවරයට පැමිණියෙමි. පුත්‍ර සම්පත් හෝ ගව මහිෂාදි පශු සම්පත් හෝ ධන සම්පත් හෝ නො පතන්නෙමි.

2362. මෙලොව මිනිසුන්ගේ ජීවිතය වර්‍ෂයන් සම්බන්ධ දශක දශකයෙක් ම ය. ඒ දශකයන් සම්බන්ධ සීමාවට නොපැමිණ ම සිඳින ලද බට ගසක් මෙන් වියළෙයි. (මැරෙයි.)

2363. මහරජ, ඒ නැසෙන ජීවිතයෙහි ලා පස්කම් අරබයා කවර සතුටක් ද? කිනම් කායික ක්‍රීඩාවක් ද? කවර සොම්නස් සහගත ඇල්මක් ද? කිනම් ධනොපාර්ජනයෙක් ද? දරුවන්ගෙන් හා භාර්‍ය්‍යාවන්ගෙන් ඇති ප්‍රයොජනය හෝ කුමක් ද? මම බන්ධන-යෙන් මිදුණෙමි.

2364. ඒ මම හොඳින් ම දනිමි. මරුවා මට පමා නො වේ. මරුවාහට යටත් වූවහුට කවර රතියක් ද? කිනම් ධනොපාර්ජන-යෙක් ද?

2365. මහරජ, මිනිසුන්ගේ අධම වූ චණ්ඩාලයොනිය දෙපා ඇත්ත-වුන් අතර පහත් වේ. පෙර අපි ස්වකීය පාපකර්ම විපාකයෙන් සැඩොල් මව් ගැබ්හි වුසුම්හ.

2366. අපි දෙදෙන අවන්ති දනව්වෙහි චණ්ඩාලයෝ වූම්හ. ඉන් සැව නෙරඤ්ජරා ඉවුරෙහි මුවෝ වූම්හ. එයින් චුත ව නම්දා නදී තීරයෙහි උකුස්සෝ දෙදෙනෙක් වූම්හ. අද ඒ අපි බ්‍රාහ්මණ හා ක්‍ෂත්‍රිය වූම්හ.

2367. උපනීයති ජීවිතමප්පමායු
ජරූපනීතස්ස න සන්ති තාණා,
කරොහි පඤ්චාල මමෙතවාක්‍යං
මාකාසි කම්මානි දුක්ඛුද්‍රයානි.

2368. උපනීයති ජීවිතමප්පමායු
ජරූපනීතස්ස න සන්ති තාණා,
කරොහි පඤ්චාල මමෙතවාක්‍යං
මාකාසි කම්මානි දුක්ඛප්ඵලානි.

2369. උපනීයති ජීවිතමප්පමායු
ජරූපනීතස්ස න සන්ති තාණා,
කරොහි පඤ්චාල මමෙතවාක්‍යං
මාකාසි කම්මානි රජස්සිරානි.

2370. උපනීයති ජීවිතමප්පමායු
වණ්ණං ජරා හන්ති නරස්ස ජීයතො,
කරොහි පඤ්චාල මමෙතවාක්‍යං
මාකාසි කම්මං නිරයූපපත්තියා.

2371. අද්ධා හි සච්චං වචනං තවෙතං
යථා ඉසි භාසසි එවමෙතං,
කාමා ච මෙ සන්ති අනප්පරූපා
තෙ දුච්චජා මාදිසකෙන භික්ඛු.

2372. නාගො යථා පඞ්කමජ්ඣෙ බ්‍යසන්නො
පස්සං ථලං නාභිසම්භොති ගන්තුං,
එවම්පහං කාමපඞ්කෙ බ්‍යසන්නො
න භික්ඛුනො මග්ගමනුබ්බජාමි.

2373. යථාපි මාතා ච පිතා ච පුත්තං
අනුසාසරෙ කින්ති සුඛීභවෙය්‍ය,
එවම්පි මං ත්වං අනුසාස භන්තෙ
යථාචිරං පෙච්ච සුඛීභවෙය්‍යං.

2374. නො චෙ තුවං උස්සහසෙ ජනින්ද
කාමෙ ඉමෙ මානුසකෙ පහාතුං,
ධම්මං බලිං පට්ඨපයස්සු රාජ
අධම්මකාරො ච තෙ මාහු රට්ඨෙ.

2375. දූතා විධාවන්තු දිසා චතස්සො
නිමන්තකා සමණබ්‍රාහ්මණානං,
තෙ අන්නපානෙන උපට්ඨහස්සු
වත්ථෙන සෙනාසනපච්චයෙන ච.

3367. මහරජ, මේ ජීවිතය මරණය කරා පැමිණෙයි. සත්වයන්ගේ ආයුෂ කාලය ස්වල්ප ය. ජරාවෙන් මරුවෙතට පැමිණියහුට පුත්‍රාදීහු පිහිට නො වෙති. පාංචාලය, මාගේ මේ වචනය කරව. (පිළිපදුව.) දුක් වැඩෙන්නා වූ පාපකර්ම නොකරව.

2368. ජීවිතය මරණය කරා පැමිණෙයි, සත්වයන්ගේ ආයු කාලය ස්වල්ප ය, ජරාවෙන් මරු වෙතට පැමිණියහුට පුත්‍රාදීහු පිහිට නො වෙත්. පාංචාලය, මාගේ මේ වචනය කරව. (පිළිපදුව.) දුක් විපාක ගෙන දෙන කර්ම නො කරව.

2369. ජීවිතය මරණය කරා පැමිණෙයි. සත්වයන්ගේ ආයු කාලය ස්වල්ප ය. ජරාවෙන් මරු වෙතට පැමිණියහුට පුත්‍රාදීහු පිහිට නො වෙත්. පාංචාලය, මාගේ මේ වචනය පිළිපදුව. කෙලෙස් රජසින් වැසීගිය හිස් ඇති කර්මයන් නො කරව.

2370. ජීවිතය මරණයට පැමිණෙයි. සත්වයන්ගේ ආයුෂ කාලය ස්වල්ප ය. දිරන්නා වූ මිනිසාගේ ශරීරවර්ණය ජරා තොමෝ නසයි. පාංචාලය, මාගේ මේ වචනය කරව. නිරයෙහි ඉපදීමට හෙතු වන කර්ම නො කරව.

2371. ඒකාන්තයෙන් ම නුඹ වහන්සේගේ වචනය සත්‍ය ය. ඍෂි තෙම යම්සේ කියන්නේ නම්, ඒය එසේ ම ය. අප්‍රමාණ කාම සම්පත් මට ඇත්තාහ. ඍෂිවරය, ඒ කාම සම්පත් මා වැන්නකු විසින් අත්හැරිය නො හැකි ය.

2372. මඩවගුරෙහි එරුණු ඇත් තෙමේ ගොඩ දක්නේ යම්සේ යා නො හැක්කේ වේ ද, එමෙන් ම කාම පඞ්කයෙහි එරුණු මම භික්ෂුවගේ අනුශාසනා මාර්ගයට නො පැමිණෙමි. හෙවත් පැවිදි වන්නට නො පිළිවන් වෙමි.

2373. කවරාකාරයෙකින් පුතු සුවපත් වන්නේ ද යි සලකා යම්සේ නම් මවුපියෝ පුතුට අනුශාසනා කෙරෙද්ද. ස්වාමීනි, එසේ ම යම් ලෙසකින් පිළිපදින්නෙම් නම් පරලොව සුව පිණිස හෙතු වේ ද, එසේ ම මට අනුශාසනා කරන සේක්වා.

2374. ජනාධිපති මහරජ, ඉදින් තෙපි මිනිසුන් පිළිබඳ මේ පස්කම් සුව අත්හරින්නට නො හැක්කහු නම්, දැහැමින් අයබදු පිහිටුවවු. තොපගේ රටෙහි අධර්ම ක්‍රියාවෝ ද නො වෙත්වා.

2375. මහණබමුණන් හට ආරාධනය කරන්නා වූ දූතයෝ සිව් දිගට යවත්වා, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන් ආහාරයෙන් හා ගිලන්පසින් ද වස්ත්‍රයෙන් හා සෙනසුනින් ද සෙසු පසයෙන් ද උවටැන් කෙරෙත්වා.

2376. අන්නෙන පානෙන පසන්නචිත්තො
සන්තප්පය සමණබ්‍රාහ්මණෙ ච,
දත්වා ච භුත්වා ච යථානුභාවං
අනින්දිතො සග්ගමුපෙහි ඨානං.

2377. සචෙ ච තං රාජ මදෙ සහෙය්‍ය
නාරීගණෙහි පරිචාරයන්තං
ඉමමෙවගාථං මනසීකරොහි
භාසෙසි චෙ නං පරිසාය මජ්ඣෙ.

2378. අබ්භොකාසසයො ජන්තු වජන්ත්‍යා ඛීරපායිතො,
පරිකිණ්ණො සුපානෙහි ස්වාජ්ජ රාජාති වුච්චතීති.

චිත්තසම්භූත ජාතකං.

3. සිවිජාතකං[1]

2379. දූරෙ අපස්සං ථෙරොව චක්ඛුං යාචිතුමාගතො,
එකනෙත්තා භවිස්සාම චක්ඛුං මෙ දෙහි යාචිතො.

2380. කෙනානුසිට්ඨො ඉධමාගතොසි
වණිබ්බක චක්ඛුපථානු යාචිතුං,
සුදුච්චජං යාචසි උත්තමඞ්ගං
යමාහු නෙත්තං පුරිසෙන දුච්චජං.

2381. යමාහු දෙවෙසු සුජම්පතීති
මඝවාති තං ආහු මනුස්සලොකෙ,
තෙනානුසිට්ඨො ඉධමාගතොස්මි
වණිබ්බකො චක්ඛුපථානි යාචිතුං.

2382. වණිබ්බතො මය්හ වණිං අනුත්තරං
දදහි මෙ චක්ඛුපථානි යාචිතො,
දදහි මෙ චක්ඛුපථං අනුත්තරං
යමාහු නෙත්තං පුරිසෙන දුච්චජං.

2383. යෙන අත්ථෙන ආගඤ්ඡි යමත්ථමභිපත්ථයං,
තෙ තෙ ඉජ්ඣන්තු සඞ්කප්පා ලභ චක්ඛූනි බ්‍රාහ්මණ.

2384. එකං තෙ යාචමානස්ස උභයානි දදාමහං
සචක්ඛුමා ගච්ඡ ජනස්ස පෙක්ඛතො,
යදිච්ඡසෙ ත්වං තං තෙ[2] සමිජ්ඣතු.

1. සිවිරාජ ජාතකං - ස්‍යා.
2. තදතෙ - සීමු.

2376. පහන් සිත් ඇත්තේ ආහාරයෙන් ද ගිලන්පසින් ද මහණ බමුණන් සතපවූ, හැකි පරිදි දීමත් කොට බුදීමත් කොට නින්‍ද නොලබන ලද්දේ ස්වර්ග ලොකයට එළඹෙවූ.

2377. මහරජ, ඉදින් ස්ත්‍රී සමූහයා සමග පරිවරණය කරන තොප රාජමදය තෙමේ යටපත් කෙරේ නම් මේ ගාථාව ම මෙනෙහි කරවූ. තවද මේ ගාථාව පිරිස් මැද කියවූ.

2378. පෙර මම තෘණ කුටියක් පමණ සෙවණකුත් නො වූයෙන් අභ්‍යවකාශයෙහි ශයනය කරන සැඩොලෙක් වීමි. එකල මව කිරි පොවා වලට ගිය කල්හි බැල්ලක විසින් කිරි පොවන ලද්දෙමි, බලු පැටවුන් විසින් පිරිවරන ලදුව වාසය කෙළෙමි. ඒ මම අද රජ යයි කියනු ලබමි.

චිත්තසම්භූත ජාතක යි.

3. සිවි ජාතකය

2379. මහරජ, ඇසින් කිසිවක් නො දක්නෙමි, මහල්ලෙක් වැ දුර සිට ඇසක් ඉල්ලා ගැනීම පිණිස ආවෙමි. (මාවිසින්) ඉල්ලන ලද (ඔබතුමා) මට ඇසක් දෙනු මැනැවි. (එවිට) අපි දෙදෙන ම එකැස් ඇත්තමෝ වන්නෙමු.

2380. දූගී පුරුෂය, කවරකු විසින් අනුශාසනා කරන ලද්දේ ඇස් ඉල්ලීමට මෙහි ආවෙහි ද? මිනිසකු විසින් දෙන්නට අපහසු-යයි යමක් උදෙසා කියත් ද, ශරීරය පිළිබඳ උත්තමාඞ්ගයක් වූ ඒ ඇස් ඉල්ලන්නෙහිය.

2381. දෙවියන් අතර සුජම්පති යයි යමකු උදෙසා කියද්ද, මිනිස් ලොවැ ඔහුට මඝවත් යයි කියත්. ඔහු විසින් අනුශාසනා කරනු ලැබූ දූගී මම ඇස් ඉල්ලීමට මෙහි පැමිණියෙමි.

2382. ඉල්ලීම් අතර මාගේ මේ ඉල්ලීම ප්‍රධානය. ඉල්ලන ලද තෙපි මට ඇස් දෙවු. මිනිසා විසින් දීමට දුෂ්කර යයි යමක් කියද්ද ඒ ඇස් මට දෙනුමැනැවි.

2383. යම් බලාපොරොත්තුවකින් යමක් පතමින් මෙහි ආයෙහි ද තොපගේ ඒ අදහස් සමෘද්ධ වේවා, බමුණ ඇස් ලබව.

2384. එක ඇසක් ඉල්ලන්නාවූ තොපට මම ඇස් දෙක ම දෙමි. ඇස් ඇත්තෙක්වැ ජනයා බලාසිටියදී ම නුඹ මගෙන් යමක් බලා-පොරොත්තු වෙහි ද, එය තට සමෘද්ධ වේවා, යි සිවිරජ තෙමේ කීවේය.

2385. මා නො දෙව අද චක්ඛුං මා නො සබ්බෙ පරාකරි,
ධනං දෙහි මහාරාජ මුත්තා වෙළුරියා බහූ.

2386. යුත්තෙ දෙව රථෙ දෙහි ආජානීයෙ චලඞ්කතෙ,
නාගෙ දෙහි මහාරාජ හෙමකප්පනවාසසෙ.

2387. යථා තං සිවයො සබ්බෙ සයොග්ගා සරථා සද,
සමන්තා පරිකිරෙය්‍යුං එවං දෙහි රථෙසභ.

2388. යො වෙ දස්සන්ති වත්වාන අදනෙ කුරුතෙ මනො,
භූම්‍යා සො පතිතං පාසං ගීවාය පටිමුඤ්චති.

2389. යො වෙ දස්සන්ති වත්වාන අදනෙ කුරුතෙ මනො,
පාපා පාපතරො හොති සම්පත්තො යමසාධනං.

2390. යං හි යාචෙ තං හි දදෙ යං න යාචෙ න තං දදෙ,
ස්වාහං තමෙව දස්සාමි යං මං යාචති බ්‍රාහ්මණො.

2391. ආයුං නු වණ්ණං නු සුඛං බලං නු
කිං පත්ථයානො නු ජනින්ද දෙසි,
කථං හි රාජා සිවිනං අනුත්තරො
චක්ඛූනි දජ්ජා පරලොකහෙතු.

2392. නවාහමෙතං යසසා දදමි
න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං,
සතඤ්ච ධම්මො චරිතො පුරාණො
ඉච්චෙව දනෙ රමතෙ මනො මමං.

2393. න මෙ දෙස්සා උභො චක්ඛූ අත්තානං මෙ න දෙස්සියං
සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා චක්ඛුං අදසහං.

2394, සඛා ච මිත්තො ච මමාසි සීවක
සුසික්ඛිතො සාධු කරොහි මෙ වචො,
උද්ධත්ව චක්ඛූනි මමං ජිගිංසතො
හත්ථෙසු ආවෙසි වණිබ්බකස්ස.

2395. චොදිතො සිවිරාජෙන සීවකො වචනංකරො,
රඤ්ඤො චක්ඛූනි උද්ධත්වා බ්‍රාහ්මණස්සූපනාමයි
සචක්ඛු බ්‍රාහ්මණො ආසි අන්ධො රාජා උපාවිසි.

2385. දෙවයන්වහන්ස, ඇස් නොදෙනු මැනැවි. ඇස් දී අප සියල්ලන් හැර නොදමනු මැනැවි. මහරජ (මොහුට) ධනය දෙනු මැනවි. බොහෝ මුතු ද වෙරළුමිණි ද යන වස්තුව දුන මැනැවි.

2386. දෙවයන්වහන්ස, අසුන් යොදන ලද රථ ද, අලංකෘත ආජානෙය අශ්වයන් ද, දෙනු මැනැවි. රන් අබරණින් සැරසූ ඇතුන් දෙනු මැනැවි.

2387. රජ්ජුරුවන් වහන්ස, සේනා සහිත වූ රථ සහිත වූ මුළු සිවිරට වාසීහු හැම කල්හි නුඹ වහන්සේගේ හාත්පසැ යම්සේ පිරිවරා සිටිද්ද, මෙසේ ම ඇස් නොදී සෙසු වස්තූන් දුන මැනැවැ යි කීහ.

2388. යමෙක් යමක් දෙන්නෙමි යි කියා පසුව නො දීමට සිත් පහළ කෙරේ ද, හෙ තෙමේ එකාන්තයෙන් ම බිමැ හුණු මළ පුඩුවක් ගෙන බෙල්ලෙහි බහාගනී.

2389. යමෙක් යමක් දෙන්නෙමැ යි කියා පසුව නොදෙන්නට සිතයි ද, හෙ තෙමේ පව්ටිකුටත් වඩා පව්ටු වූයේ යමයාගේ අණ පවත්නා තැනට පැමිණියේ වෙයි.

2390. යමක් ඉල්ලන්නේ නම් එය ම දෙන්නේ ය. යමක් නො ඉල්ලන්නේ නම් එය නො දෙන්නේ ය. බමුණු තෙම යමක් මගෙන් ඉල්ලා ද, ඒ මම එය ම දෙන්නෙමි යි රජ තෙම කීය.

2391. ජනාධිපති මහරජතුමනි, ආයුෂ පතා ඇස් දෙන්නෙහි ද? එසේ නැත. වර්ණය පතා ද? එසේත් නැත. සැපය පතා ද? එසේත් නැත. බලය පතා ද? මෙයින් කවරක් පතමින් දෙන්නෙහි ද? සිවිරට වාසීන්ට උතුම් වූ රජ පරලෝ සැප පිණිස කෙසේ නම් ඇස් දෙන්නෙහි ද?

2392. මම යශස හෙතු කොට ගෙන මේ ඇස් නො දෙමි. පුත්‍ර සම්පත්තිය නො කැමැත්තෙමි. ධනය ද නො කැමැත්තෙමි. රටෙහි අධිපති බව ද නො කැමැත්තෙමි. එසේ ද වුවත් මෙය සත්පුරුෂයන් විසින් පුරුදු කරන ලද ධර්මයෙකි. මාගේ සිත එසේ හෙයින් දනයෙහි ම ඇලෙයි.

2393. මට දෙඇස් අප්‍රිය නැත. මාගේ ආත්මය (ජීවිතය) ද අප්‍රිය නැත. මට සර්වඥතාඥනය ප්‍රිය ය. ඒ නිසා මම ඇස් දිනිම් යි.

2394. යහළු සීවකය, තෙපි මාගේ යහළුවා ද මිත්‍රයා ද වව. වෛද්‍ය ශිල්පයෙහි මනාව හික්මුණෙහිය. මාගේ වචනය කරව. මා බලා සිටිය දී ම ඇස් උදුරා දුගියාගේ අතෙහි තබව.

2395. සිවිරජ විසින් මෙහෙයවන ලද සීවක තෙමේ රජුගේ වචනය කෙළේ ය. රජුගේ ඇස් උදුරා බ්‍රාහ්මණයාට දුන්නේ ය. බ්‍රාහ්මණ තෙමේ ඇස් සහිත විය. අන්ධ වූ රජ තෙමේ හිඳගත්තේ ය.

2396. තතො සො කතිපාහස්ස උපරූළ්හෙසු චක්ඛුසු,
සූතං ආමන්තයී රාජා සිවීනං රට්ඨවඩ්ඪනො.

2397. යොජෙහි සාරථී යානං යුත්තඤ්ච පටිවෙදය,
උය්‍යානභූමිං ගච්ඡාම පොක්ඛරඤ්ඤො වනානි ච.

2398. සො ච පොක්ඛරණියා තීරෙ පල්ලඞ්කෙන උපාවිසි,
තස්ස සක්කො පාතුරහු දෙවරාජා සුජම්පති.

2399. සක්කොහමස්මි දෙවින්දො ආගතොස්මි තවන්තිකෙ,
වරං වරස්සු රාජීසි යං කිඤ්චි මනසිච්ඡසි.

2400. පහූතං මෙ ධනං සක්ක බලං කොසො චනප්පකො,
අන්ධස්ස මෙ සතොදානි මරණඤ්ඤෙව රුච්චති.

2401. යානි සච්චානි දිපදින්ද තානි භාසස්සු ඛත්තිය,
සච්චන්තෙ භණමානස්ස පුන චක්ඛුං භවිස්සති.

2402. යෙ මං යාචිතුමායන්ති නානාගොත්තා වණිබ්බකා,
යොපි මං යාචතෙ තත්ථ සොපි මෙ මනසො පියො.
එතෙන සච්චවජ්ජෙන චක්ඛුම්මෙ උපපජ්ජථ.

2403. යං මං සො යාචිතුං ආග දෙහි චක්ඛුන්ති බ්‍රාහ්මණො,
තස්ස චක්ඛූනි පාදාසිං බ්‍රාහ්මණස්ස වණිබ්බිනො.

2404. භිය්‍යො මං ආවිසී පීති සොමනස්සඤ්චනප්පකං,
එතෙන සච්චවජ්ජෙන දුතියම්මෙ උපපජ්ජථ.

2405. ධම්මෙන භාසිතා ගාථා සිවීනං රට්ඨවඩ්ඪන,
එතානි තව නෙත්තානි දිබ්බානි පටිදිස්සරෙ.

2406. තිරො කුඩ්ඩං තිරො සෙලං සමතිග්ගය්හ පබ්බතං,
සමන්තා යොජනසතං දස්සනං අනුභොන්තු තෙ.

2407. කොනීධ විත්තං න දදෙය්‍ය යාචිතො
අපි විසිට්ඨං සුපියම්පි අත්තනො,
තදිඞ්ඝ සබ්බෙ සිවයො සමාගතා
දිබ්බානි නෙත්තානි මමජ්ජ පස්සථ.

2396. ඉන්පසු සිවිරටියන්ගේ රට දියුණු කරන්නා වූ ඒ රජ තෙම ඇස් පිහිටි තන්හි මස් ලියලූ විට රියදුරා ඇමතුවේ ය.

2397. එම්බා සාරථිය, යානයක් යොදව. යොදන ලද්ද ද දන්වව. උයන් බිමට ද, පොකුණුවලට ද, වනයට ද යමි යි රජ තෙමේ කීවේ ය.

2398. ඒ රජ තෙමේ ද පොකුණුතෙර පයඞ්කායෙන් හිදගත්තේ ය. ඔහුගේ ඉදිරියෙහි සුජම්පති නාම වූ සක්දෙව්රජ තෙම පහළ විය.

2399. මම දෙවෙන්ද්‍ර වූ ශක්‍ර වෙමි. නුඹ වහන්සේගේ සමීපයට ආයෙම් වෙමි. රාජර්ෂිය, නුඹ වහන්සේ සිත්හි යමක් කැමතිවන සේක් නම් වරයක් ඉල්ලව.

2400. ශක්‍රය, මාගේ ධන බොහෝ ය. බලය බෙහෙවි. කොෂ්ඨාගාරය ද අනල්ප ය. දැන් අන්ධ වූ මට මරණය ම රුච්වේ යයි රාජර්ෂි තෙම කීවේ ය.

2401. දෙපා ඇතියන්ට ප්‍රධාන වූ රජතුමනි, යම් සත්‍ය කාරණයෝ වෙද්ද, ඒ සත්‍යයන් ම කියනු මැනව සත්‍යයකියන්නා වූ නුඹ වහන්සේට නැවැත ඇසක් ඇතිවන්නේ ය.

2402. නා නා ගොත්‍ර ඇති යම් යාචක කෙනෙක් මගෙන් ඉල්ලන්නට පැමිණෙද්ද, ඔවුන් අතුරෙහි යමෙක් මගෙන් ඉල්ලා ද හෙ තෙමේ ද මාගේ සිතට ප්‍රිය වේ. මේ සත්‍යවචනය කරණ කොට ගෙන මට ඇසක් පහළ වේවා.

2403. ඒ බ්‍රාහ්මණ තෙමේ යම් හෙයෙකින් ඇසක් දෙවයි ඉල්ලීමට මා කරා පැමිණියේ ද, දුගී ඒ බමුණාට ඇස් දුනිමි.

2404. මට බොහෝ ප්‍රීතිය ඇති විය. නො අඩු සොම්නසක් ද විය. මේ සත්‍යවචනයෙන් දෙවැනි ඇස උපදීවා.

2405. සිවීන්ගේ රටට වැඩ සිදු කරන උතුමාණෙනි, නුඹ වහන්සේ විසින් දැහැමි ස්වභාවයෙන් ම ගාථා කියන ලද. නුඹ වහන්සේගේ දිව්‍යානුභාවයෙන් යුත් මේ ඇස් දක්නට ලැබෙත්.

2406. මහරජ, නුඹ වහන්සේගේ මේ ඇස් බිත්තියෙන් සරස ද ශෛලයෙන් සරස ද පර්වතයෙන් සරස ද යි මෙසේ හාත්පස යොදුන් සියයක් තුළ රූප දර්ශනය සිද්ධ කෙරේවා' යි ශක්‍ර තෙම ආශිර්වාද කෙළේ ය.

2407. මෙලොව ඉල්ලන ලද්දේ උතුම් වූ ද තමනට ඉතා ප්‍රිය වූ ද කුමන වස්තුවක් වුවත් කවරෙක් නම් නො දෙන්නේ ද, එසේ දීමෙන් පහළ වූ දිව්‍යමය වූ මාගේ ඇස් අද මෙහි රැස් වූ සිවිරට වැසි සියල්ලෝ ම බලත්වා.

2408. තිරො කුඩ්ඩං තිරො සෙලං සමතිග්ගය්හ පබ්බතං,
සමන්තා යොජනසතං දස්සනං අනුභොන්ති මෙ.

2409. න චාගමත්තා පරමත්ථි කිඤ්චි මච්චානං ඉධ ජීවිතෙ,
දත්වා මානුසකං චක්ඛුං ලද්ධං මෙ චක්ඛුං අමානුසං.

2410. එතම්පි දිස්වා සිවයො දෙථ දානානි භුඤ්ජථ
දත්වා ච භුත්වා ච යථානුභාවං
අනින්දිතා සග්ගමුපෙථ ඨානන්ති.

සිවි ජාතකං.

4. සිරිමන්දජාතකං

2411. පඤ්ඤායුපෙතං සිරියා විහීනං
යසස්සිනඤ්චාපි අපෙතපඤ්ඤං,
පුච්ඡාමි තං සෙනක එතමත්ථං
කමෙත්ථ සෙය්‍යො කුසලා වදන්ති.

2412. ධීරා ච බාලා ච හවෙ ජනින්ද
සිප්පූපපන්නා ච අසිප්පිනො ච,
සුජාතිමන්තොපි අජාතිමස්ස
යසස්සිනො පෙස්සකරා භවන්ති.
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤො නිහීනො සිරිමාව සෙය්‍යො.

2413. තවම්පි පුච්ඡාමි අනොමපඤ්ඤ
මහොසධ කෙවලධම්මදස්සි,
බාලං යසස්සිං පණ්ඩිතං අප්පභොගං
කමෙත්ථ සෙය්‍යො කුසලා වදන්ති.

2414. පාපානි කම්මානි කරොති බාලො
ඉදමෙව සෙය්‍යො ඉති මඤ්ඤමානො
ඉධලොකදස්සී පරලොකං අදස්සී,
උභයත්ථ බාලො කලිමග්ගහෙසි
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤොව සෙය්‍යො න යසස්සී බාලො.

2408. මාගේ මේ දිව්‍ය නෙත්‍රයෝ භිත්තියෙන් සරස ද ගලින් සරස ද පර්වතය ඉක්මවා ද, හාත්පස යොදුන් සියයක් රූප දක්ම සිද්ධ කෙරෙත්.

2409. ජීවලොකයෙහි මිනිසුනට ත්‍යාගයට වඩා උතුම් වූ අන් කිසිවක් නම් නැත. මිනිස් ඇසක් දී මා විසින් දිව්‍ය නෙත්‍රයක් ලබන ලදී.

2410. මේ කාරණය ද දැක සිවිරට වැසියෙනි, දන් දෙවූ. අනුභවය ද කරවූ. ශක්ති පමණින් දීමත් කොට අනුභවයත් කොට නින්‍ද නොලබන ලද්දහු ස්වර්ගලොකයට පැමිණෙවූ යයි.

සිවි ජාතක යි.

4. සිරිමන්‍ද ජාතකය

2411. එම්බා සෙනකය, ප්‍රඥාවෙන් යුතු වූ සම්පතින් තොර තැනැත්තා ද යශසින් යුතු වූ ප්‍රඥාවෙන් තොර තැනැත්තා ද යන මේ දෙදෙනා අතුරෙන් කවරෙක් උතුමැ යි පණ්ඩිතයෝ කියද්ද? යන මේ කරුණ මෙහි දී නුඹගෙන් අසමි යි රජ තෙම කීවේ ය.

2412. මහරජ, පණ්ඩිතයෝ ද මෝඩයෝ ද ශිල්ප දන්නෝද ශිල්ප නො දන්නෝ ද උසස් ජාති ඇත්තෝ ද යන සියල්ලෝ ද පහත් ජාතික සම්පත් ඇත්තහුගේ මෙහෙකරුවෝ වෙත්. මේ කරුණ ද දැක ප්‍රඥා ඇත්තා නිහීන ය. සම්පත් ඇත්තා ම ශ්‍රෙෂ්ඨ ය යි කියමි යි සේනක තෙමේ කීවේ ය.

2413. අලාමක ප්‍රඥා ඇති සියලු ධර්මයන් දක්නාසුලු මහෞෂධය, ඔබ ද විචාරමි. අඥාන වූ සම්පත් ඇත්තහු ද පණ්ඩිත වූ සම්පත් නැත්තහු ද යන මේ දෙදෙනා අතුරෙන් කවරෙක් ශ්‍රෙෂ්ඨ යයි පණ්ඩිතයෝ කියද්ද යි මෙහි දී අසමි යි රජ තෙම කීයේ ය.

2414. මේ ලොකයෙහි ඓශ්වර්‍ය්‍යය ම ශ්‍රෙෂ්ඨය යි හඟිමින් අඥාන තෙමේ පව්කම් කරයි. මෙලොව ගැන පමණක් පෙනෙන පරලොව ගැන නො පෙනෙන අඥාන තෙමේ දෙලොවෙහි ම පරාජය ම ගනියි. (ලබයි.) මේ කරුණ ද දැක නුවණැත්තේ ම ශ්‍රෙෂ්ඨ ය. සම්පත් ඇත්තා වූ අඥානයා උතුම් නො වේ ය යි මම කියමි යි. මහෞෂධ තෙමේ කීවේ ය.

2415. න සිප්පමෙතං විදධාති භොගං
න බන්ධවා න සරීරාවකාසො
පස්සෙළමූගං සුඛමෙධමානං
සිරිහීනං භජතෙ ගොරිමන්දං
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤා නිහීනො සිරිමාව සෙය්‍යො.

2416. ලද්ධා සුඛං මජ්ජති අප්පපඤ්ඤො
දුක්ඛෙන ඵුට්ඨොපි පමොහමෙති
ආගන්තුනා සුඛදුක්ඛෙන ඵුට්ඨො
පවෙධති වාරිචරොව සම්මෙ
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤාව සෙය්‍යො න යසස්සි බාලො.

2417. දුමං යථා සාදුඵලං අරඤ්ඤෙ
සමන්තතො සබ්බෙ චරන්ති පක්ඛී
එවම්පි අඩ්ඪං සධනං සභොගං,
බහුජ්ජනො භජති අත්ථහෙතු
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤා නිහීනො සිරිමාව සෙය්‍යො.

2418. න සාධු බලවා බාලො සාහසං වින්දතෙ ධනං
කන්දන්තමෙව දුම්මෙධං කඩ්ඪන්ති නිරයෙ භුසං,
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤාව සෙය්‍යො න යසස්සි බාලො.

2419. යා කාචි නජ්ජො ගඞ්ගමභිස්සවන්ති,
සබ්බාව තා නාමගොත්තං ජහන්ති
ගඞ්ගා සමුද්දං පටිපජ්ජමානා
න ඛායතෙ ඉද්ධිපරො හි ලොකෙ,
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤා නිහීනො සිරිමාව සෙය්‍යො.

2420. යමෙතමක්ඛා උදධිං මහන්තං
සවන්ති නජ්ජො සබ්බකාලං අසඞ්ඛං,
සො සාගරො නිච්චමුළාරවෙගො
වෙලං න අච්චෙති මහාසමුද්දො.

2421. එවම්පි බාලස්ස පජප්පිතානි
පඤ්ඤං න අච්චෙති සිරී කදචි,
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤාව සෙය්‍යො න යසස්සි බාලො.

2415. මහරජ, මේ ශිල්පය සම්පත් නො දරයි. ශිල්ප දන්නා පමණක් මුත් නැයන් ඇත්තේ නො වෙයි. ශරීරාවකාශ ඇත්තේත් නො වෙයි. කෙළ වැගිරෙන මුව ඇතිවැ සැප විඳින්නා වූ මේ ගොරිමන්‍ද සිටුහු බැලුව මැනැවි. ශ්‍රී තොමෝ ඒ ගොරිමන්‍දයා භජනය කෙරෙයි. මේ කාරණය ද දැක නුවණැත්තා නිහීනය. සම්පත් ඇත්තා ම ශ්‍රෙෂ්ඨය යයි මම කියමි යි සෙනක තෙම කීයේ ය.

2416. මහරජ, මඳ නුවණැත්තේ සැප ලබා මත්වේ. දුකින් ස්පර්ශ කරන ලද්දේ මුළාවට යෙයි. ආගන්තුක වූ සුවදුක් දෙකින් ස්පර්ශ කරන ලද්දේ අව්වෙහි තබන ලද මත්ස්‍යයකු මෙන් සැලෙයි. මෙයත් දැක නුවණැත්තේ ම ශ්‍රෙෂ්ඨ ය. සම්පත් ඇති බාලයා එසේ ශ්‍රෙෂ්ඨ නො වේ ය යි මම කියමි යි මහෞෂධ තෙම කීය.

2417. මහරජ, වනයෙහි මිහිරිපල ඇති රුක් සිසාරා පක්ෂීහු යම්සේ හැසිරෙද්ද, එසේ ම ආඪ්‍ය වූ ධන සහිත වූ සම්පත් ඇති පුද්ගලයා ඇසුරු කිරීමෙන් ලැබෙන ප්‍රයොජනය තකා බොහෝ දෙන ආශ්‍රය කරත්. මේ කාරණය දැක නුවණැත්තා උතුම් නො වේ. සම්පත් ඇත්තේ ම උතුම් වේ යයි මම කියමි යි සේනක තෙම කීය.

2418. මහරජ, අඥාන වූ බලවතා යහපත් නොවේ. හේ සාහසික ලෙස ධනය ලබයි. පසුව නිරයපාලකයෝ අඩන්නා වූ ම ඔහු රුදුරු නිරයට ඇද ගනිති, මේ කාරණය ද දැක නුවණැත්තා උතුම් වෙයි. සම්පත් ඇති බාලයා එසේ උතුම් නො වේය යි මම කියමි යි මහෞෂධ තෙම කීයේ ය.

2419. යම්කිසි ඇළ දෙළවල් ගඟකරා ගළා බසිද්දී ඒ සියල්ලෝ ම පෙර පැවති නාමගොත්‍ර හැරදමද්ද, මුහුදට ගළාබස්නා ගංගාව ද මුහුදට වැටුණු පසු ප්‍රකට නොවන්නී ද? එපරිද්දෙන් ම ලෝවැසි තෙම ඉසුරුමත් තැනැත්තා ප්‍රධාන කොට ඇත්තේය. මේ කරුණ ද දැක නුවණැත්තා නිහීන යැ, සම්පත් ඇත්තා ම උතුමය යි කියමි යි සෙනක තෙම කීයේ ය.

2420. යම් ඒ මහාසාගරයක් නුඹ කීයෙහි ද? එයට හැම කල්හි ම නොගිණිය හැකි සංඛ්‍යාවක් ඇළ දෙළ ගළා බසිත්. ඒ සාගරය නිතර මහාරළවෙග ඇත්තේ වෙරළ නො ඉක්මවා ද?

2421. මෙපරිද්දෙන් ම අඥනයාගේ කථාවෙන් නුවණැත්තහු ඉක්මවා නොයත් (නුවණැත්තහු කරා පැමිණ බිඳෙත්.) සම්පත් තොමෝ ද කිසිකලෙකත් ප්‍රඥවන්තයා නො ඉක්මවයි. මේ කරුණ ද දැන නුවණැත්තා ම ශ්‍රෙෂ්ඨය. සම්පත් ඇති බාලයා එසේ ශ්‍රෙෂ්ඨ නැතැයි කියමියි කීයේ ය.

2422. අසඤ්ඤතො චෙපි පරෙසමත්ථං
භණාති සණ්ඨානගතො යසස්සී,
තස්සෙව තං රූහති ඤාතිමජ්ඣෙ
සිරිහීනං තාරයතෙ න පඤ්ඤා
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤා නිහීනො සිරිමාව සෙය්‍යො.

2423. පරස්ස වා අත්තනොවාපි හෙතු
බාලො මුසා භාසති අප්පපඤ්ඤො
සො නින්දිතො හොති සභාය මජ්ඣෙ,
පෙච්චාපි සො දුග්ගතිගාමී හොති.
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤාව සෙය්‍යො න යසස්සි බාලො.

2424. අප්පම්පි චෙ භාසති භූරිපඤ්ඤො
අනාළ්හියො අප්පධනො දලිද්දො
න තස්ස තං රූහති ඤාතිමජ්ඣෙ
සිරී ච පඤ්ඤාණවතො න හොති,
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤා නිහීනො සිරිමාව සෙය්‍යො.

2425. පරස්සවා අත්තනොවාපි හෙතු
න භාසති අලිකං භූරිපඤ්ඤො
සො පූජිතො හොති සභාය මජ්ඣෙ
පෙච්චං ච සො සුග්ගතිගාමී හොති.
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤාව සෙය්‍යො න යසස්සි බාලො.

2426. හත්ථීගවාස්සා මණිකුණ්ඩලා ච
නාරියො ච ඉද්ධෙසු කුලෙසු ජාතා
සබ්බාව තා උපභොගා භවන්ති,
ඉද්ධස්ස පොසස්ස අනිද්ධිමන්තො
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤා නිහීනො සිරිමාව සෙය්‍යො.

2427. අසංවිහිතකම්මන්තං බාලං දුම්මන්තමන්තිනං
සිරී ජහති දුම්මෙධං ජිණ්ණංව උරගො තචං,
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤාව සෙය්‍යො න යසස්සි බාලො.

2428. පඤ්ච පණ්ඩිතා මයං භදන්ත
සබ්බෙ පඤ්ජලිකා උපට්ඨිතා
ත්වං නො අභිභුය්‍ය ඉස්සරොසි
සක්කො භූතපතීව දෙවරාජා
එතම්පි දිස්වාන අහං වදාමි
පඤ්ඤා නිහීනො සිරිමාව සෙය්‍යො.

2422. කායාදිසංයම නැත්තා වූ ද යස පිරිවර ඇති තැනැත්තේ විනිශ්චය ස්ථානයෙහි සිට අනුනට වැඩ පිණිස කරුණක් ප්‍රකාශ කෙරේද, නෑ සමූහයා මැද ඔහුගේ කීම ම පිළිගැනේ. එය සම්පත් තොමෝ ම සිදු කරවයි. මෙය ද දැක නුවණැත්තේ නිහීනය. සම්පත් ඇත්තේ ම ශ්‍රේෂ්ඨය යි මම කියමි යි සෙනක තෙම කීයේ ය.

2423. මඳ නුවණැති බාලතෙම අනුන් හෝ තමන් හෙතු කොට ගෙන හෝ මුසා බෙණේ නම්, හෙතෙමේ සභා මධ්‍යයෙහි නින්දිතයෙක් වේ. හෙතෙමේ පරලෙව්හි ද දුගතිගාමි වෙයි. මෙය ද දැක නුවණැත්තේ ම ශ්‍රේෂ්ඨය. සම්පත් ඇති බාලයා එසේ ශ්‍රේෂ්ඨ නැතැයි මම කියමියි මහෞෂධ තෙම කීයේ ය.

2424. සහල් නැළියක් පමණකුදු නැති නිර්ධන දිළිඳු මහනුවණැත්තෙක් සත්‍ය කාරණයක් කියන්නේ නමුත් ඔහුගේ ඒ වචන ඤාති සමූහයා මැද ගණනට නොයේ. සම්පත් තොමෝ ද නුවණැත්තහුට නොවේ. මේ කාරණය ද දැක නුවණැත්තා හීනය. සම්පත් ඇත්තා ම උසස් යයි මම කියමි යි සෙනක තෙම කීවේ ය.

2425. මහනුවණැතිතෙම අනුන් හෝ තමන් හෝ හෙතු කොට ගෙන බොරු නො කියයි ද, හෙතෙමේ සභා මධ්‍යයෙහි පූජිත වෙයි, පරලෙව්හි ද හෙතෙමේ සුගතිගාමී වන්නේය. මේ කරුණ ද දැන ප්‍රඥාවන්තයා ම ශ්‍රේෂ්ඨය. සම්පත් ඇති බාලයා එසේ ශ්‍රේෂ්ඨ නොවේ යයි මම කියමියි කීයේ ය.

2426. ඇත්තු ද ගවයෝ ද අශ්වයෝ ද මාණික්‍යකුණ්ඩලාභරණයෝ ද සමෘද්ධ කුලයන්හි උපන් ස්ත්‍රීහු ද නිර්ධනයෝ ද යන ඒ සියලු වස්තූහු ධනවතාගේ උපභොග වස්තූහු වෙති. මේ කාරණය ද දැක නුවණැත්තා නිහීනය. සම්පත් ඇත්තා ම උතුම් යයි කියමි යි සෙනක තෙම කීයේ ය.

2427. හොඳින් විධාන නො කළ කර්මාන්ත ඇති නපුරු කතා ඇති මන්ත්‍රීන්ගෙන් යුත් අනුවණ බාලයා දිරාගිය සැව හැරපියා යන සර්පයකු සෙයින් ශ්‍රී තොමෝ හැරපියා යන්නීය. මෙය ද දැක නුවණැත්තේ ම ශ්‍රේෂ්ඨය. සම්පත් ඇති බාල තෙමේ එසේ ශ්‍රේෂ්ඨ නොවේ යයි මම කියමියි මහෞෂධ තෙම කීය.

2428. ස්වාමීනි, අපි පණ්ඩිතයෝ පස්දෙන සියල්ලෝ ම ඇඳිලි බැඳගත්තෝ එළඹ සිටියෙමු. නුඹවහන්සේ භූතයනට අධිපති සක් දෙව් රජහු මෙන් අප සියල්ලන් මැඩගෙන අධිපති වන්නාහුය. මෙය ද දැක නුවණැත්තා නිහීනය. සම්පත් ඇත්තා ම ශ්‍රේෂ්ඨය යි කියමි යි සෙනක තෙම කීයේ ය.

2429. දසො ව පඤ්ඤස්ස යසස්සී බාලො
අත්ථෙසු ජාතෙසු තථාවිධෙසු
යං පණ්ඩිතො නිපුණං සංවිධෙති,
සම්මොහමාපජ්ජති තත්ථ බාලො
එතම්පි දිස්වාන අහං වදමි
පඤ්ඤාව සෙය්‍යො න යසස්සී බාලො.

2430. අද්ධා හි පඤ්ඤාව සතං පසත්ථා
කන්තා සිරී භොගරතා මනුස්සා
ඤාණඤ්ච බුද්ධානමතුල්‍යරූපං
පඤ්ඤං න අච්චෙති සිරී කදචි.

2431. යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො
මහොසධ කෙවලධම්මදස්සී
ගවං සහස්සං උසභඤ්ච නාගං
ආජඤ්ඤයුත්තෙ ච රථෙ දස ඉමෙ
පඤ්හස්ස වෙය්‍යාකරණෙන තුට්ඨො
දදමි තෙ ගාමවරානි සොළසානි.

සිරිමන්ද ජාතකං.

5. රොහන්තමිගජාතකං

2432. එතෙ යූථා පටියන්ති භීතා මරණස්ස චිත්තක,
ගච්ඡ තුවම්පි මා කඞ්ඛි ජීවිස්සන්ති තයා සහ.

2433. නාහං රොහන්ත ගච්ඡාමි හදයම්මෙ අවකස්සති,
න තං අහං ජහිස්සාමි ඉධ හෙස්සාමි ජීවිතං.

2434. තෙ හි නූන මරිස්සන්ති අන්ධා අපරිනායකා,
ගච්ඡ තුවම්පි මා කඞ්ඛි ජීවිස්සන්ති තයා සහ.

2435. නාහං රොහන්ත ගච්ඡාමි හදයම්මෙ අවකස්සති,
න තං බද්ධං ජහිස්සාමි ඉධ හෙස්සාමි ජීවිතං.

2436. ගච්ඡ භීරු පලායස්සු කූටෙ බද්ධොස්මි ආයසෙ,
ගච්ඡ තුවම්පි මා කඞ්ඛි ජීවිස්සන්ති තයා සහ.

2429. එබඳු කටයුතු ඇති වූ කල්හි යශස් ඇත්තා වූ බාල තෙම නුවණැත්තාට දසයකු මෙන් වේ. නුවණැත්තේ යම් කරුණක් දක්ෂ ලෙස සංවිධානය කෙරේද, එහිදී අඥාන තෙමේ මුළාවට පැමිණෙන්නේය. මෙය ද දැක නුවණැත්තේම උතුම් සම්පත් ඇති අනුවණයා එසේ උසස් නොවේ යයි මම කියමියි මහෞෂධ තෙම කීයේ ය.

2430. මහරජ, ප්‍රඥාතොමෝ බුද්ධාදි සත්පුරුෂයන් විසින් එකාන්තයෙන් ම පසස්නා ලද්දීය. මිනිස්සු සම්පත්හි ඇලුණාහු ම වෙත්. එහෙයින් ශ්‍රීතොමෝ ඔවුන් කැමැත්තීය. ඥානවෘද්ධයන්ගේ නුවණ ද අසමාන ස්වභාව ඇත්තේය. ශ්‍රී තොමෝ කිසිකලෙකත් නුවණැත්තහු නො ඉක්මවා යයි මහෞෂධ තෙම කීයේ ය.

2431. සියලු ධර්මයන් දන්නා ස්වභාවය ඇති මහෞෂධ පණ්ඩිතයන් වහන්ස, අපි යමක් විචාළෙමු නම් එය අපට කීයෙහිය. ප්‍රශ්න විසඳීමෙන් තුටු වූ සිත් ඇති මම ගවයන් දහසක් ද ශ්‍රෙෂ්ඨ හස්තියකු ද ආජානෙය අසුන් යෙදූ මේ රථ දශයක් ද ගම්වර සොළසක් ද තොපට දෙමි යි රජ තෙම කීයේ ය.

සිරිමන්ද ජාතක යි.

5. රොහන්ත මිග ජාතකය

2432. චිත්‍රකය, මේ රැළෙහි වූ මුවෝ මරණයට බියවූවෝ පැනදුවති. තොපි ද යව, බලාපොරොත්තු නොවව. තොප සමග ඒ මුවෝ ජීවත් වන්නාහ. මෙසේ රොහන්ත මෘග තෙම කීයේ ය.

2433. රොහන්තය, මම නොයමි. මාගේ හෘදය ශොකයෙන් අදිනු ලැබේ. මම තොප නො හරිමි. මෙහි ම ජීවිතය හරනෙමි.

2434. ඇස් අන්ධ වූ පිළිදගුම් කරන්නකු නැති ඒ අපගේ මවුපියෝ එකාන්තයෙන් මැරෙන්නාහ. එහෙයින් සහොදරය, තෙපි එහි යව, බලාපොරොත්තු නො වව. තොප සමග ඒ මවුපියෝ ජීවත් වන්නාහු ය.

2435. රොහන්තය, මම නො යමි. මාගේ හෘදය ශොකයෙන් ඇදගනී. මළපුඩුවෙහි බැඳුණු තොප හැර නො යමි. ජීවිතය මෙහි ම හරනෙමි.

2436. බියවනසුලු තැනැත්තිය, වහා යව. පැනදුවව. මම අයොමය කණුවක ඇට වූ මළ පුඩුවෙක්හි බැඳුණෙමි. තෙපි ද යව. බලාපොරොත්තු නො වව. තොප සමග ඒ මුවෝ ජීවත් වන්නාහු යයි බෝසත් තෙම සුතනු නම් නැගණියන්ට කීයේ ය.

2437. නාහං රොහන්ත ගච්ඡාමි හදයම්මෙ අවකස්සති,
න තං අහං ජහිස්සාමි ඉධ හෙස්සාමි ජීවිතං.

2438. තෙ හි නූන මරිස්සන්ති අන්ධා අපරිනායකා,
ගච්ඡ තුවම්පි මා කඞ්ඛි ජීවිස්සන්ති තයා සහ.

2439. නාහං රොහන්ත ගච්ඡාමි හදයම්මෙ අවකස්සති,
න තං බද්ධං ජහිස්සාමි ඉධ හෙස්සාමි ජීවිතං.

2440. අයං සො ලුද්දකො එති රුද්දරූපො සහාවුධො,
සො නො වධිස්සති අජ්ජ උසුනා සත්තියාමපි.

2441. සා මුහුත්තං පලායිත්වා භයට්ටා භයතජ්ජිතා,
සුදුක්කරං අකරා භීරු මරණායූපනිවත්තථ.

2442. කින්නු තෙ මෙ මිගා හොන්ති මුත්තා බද්ධං උපාසරෙ,
න තං චජිතුමිච්ඡන්ති ජීවිතස්සපි කාරණා.

2443. භාතරො හොන්ති මෙ ලුද්ද සොදරියා එකමාතුකා,
න මං චජිතු මිච්ඡන්ති ජීවිතස්සපි කාරණා.

2444. තෙ හි නූන මරිස්සන්ති අන්ධා අපරිනායකා,
පඤ්චන්නං ජීවිතං දෙහි භාතරං මුඤ්ච ලුද්දක.

2445. සො වො අහං පමොක්ඛාමි මාතාපෙත්තිභරං මිගං,
නන්දන්තු මාතාපිතරො මුත්තං දිස්වා මහාමිගං.

2446. එවං ලුද්දක නන්දස්සු සහ සබ්බෙහි ඤාතිභි,
යථාහමජ්ජ නන්දාමි මුත්තං දිස්වා මහාමිගං.

2447. කථං පමොක්ඛො ආසි උපනීතස්මිං ජීවිතෙ,
කථං පුත්ත අමොචෙසි කූටා පාසම්හා ලුද්දකො.

2437. පින්වත් රොහන්තය, මම නො යමි. මාගේ හෘදය ශොකයෙන් ඇදගනී. මළ පුඩුවෙහි බැඳුණු තොප මම නො හරිමි. මෙහි ම ජීවිතය හරනෙමි යි සුතනු මුවදෙන කීවා ය.

2438. අන්ධ වූ පිළිදගුම් කරන්නකු නැති ඒ අපගේ මවුපියෝ ඒකාන්තයෙන් මැරෙන්නාහ. එසේ හෙයින් සහොදරිය, තෙපි ද මෙතැනින් යව. බලාපොරොත්තු නො වව. තොප සමග ඒ මවුපියෝ ජීවත්වන්නාහ යි රොහන්ත තෙම කීයේ ය.

2439. පින්වත් රොහන්තය, මම නො යමි. මාගේ හෘදය ශොකයෙන් ඇදගනී. මළ පුඩුවෙහි බැඳුණු තෙපි මම නො හරිමි. මෙහි ම ජීවිතය හරනෙමි. සුතනු නම් මුවදෙන කීවාය.

2440. රෞද්‍ර ස්වභාව ඇත්තේ ආවුධ සහිත වැ ඒ මේ වැදිතෙම එයි. හේ අද අපට හීයෙන් ද අඩයටියෙන් ද හිංසා කරන්නේ ය. (එහෙයින්) වහා පැනයව යි මුවරජ තෙම කීයේ ය.

2441. බියෙන් පෙළුණා වූ බියෙන් තැතිගත්තා වූ බියවනසුලු වූ ඒ මුවැත්තිය මොහොතක් කල් පැන ගොස් ඉතා දුෂ්කර වූවක් කළා. මරණය සඳහා නැවැත පෙරළා ආවා ය.

2442. බන්ධනයෙන් මිදුණාහු මළ පුඩුවෙහි බැඳුණු තොප සමීපයෙහි හිඳිති. ජීවිතය හෙතුකොට ගෙන ද තොප හැරයන්නට නො කැමැති වෙති. මේ මුවෝ තොපගේ කවරහු වෙද්ද යි වැදි තෙම ඇසුවේ ය.

2443. එම්බා වැදි පුත්‍රය, මොහු සමානකුස ඇත්තා වූ එක මව වෙත වැඩුණා වූ මාගේ සහොදරයෝ වෙති. මොහු ජීවිතය හෙතු කොටගෙන හෝ මා හැර යන්නට නො කැමැති වෙති යි මුවරජ තෙම කීයේ ය.

2444. එම්බා වැදි පුත්‍රය, පිළිදගුම් කරන්නකු නැති අන්ධ වූ ඒ මවුපියෝ ඒකාන්තයෙන් ම මැරෙන්නාහ. එහෙයින් ඔවුන් දෙදෙනාගේ ද අප තිදෙනාගේ ද යන අප පස් දෙනකුගේ ජීවිත දෙනු මැනැවි. මාගේ සහොදරයා මුදහරිනු මැනැවැ යි චිත්‍රක නම් මෘග තෙම කීයේ ය.

2445. එම්බා මුවරජ, ඒ මම මවුපියන් පොෂණය කරන්නා වූ මුවරජහු මුද හරනෙමි. මරණයෙන් මිදුණා වූ මුවරජ දැක මවුපියෝ සතුටු වෙත්වා යි වැදි තෙම කීයේ ය.

2446. එම්බා වැදිපුත්‍රය, මම අද මරණයෙන් මිදුණා වූ මුවරජු දැක යම්සේ සතුටුවන්නෙම් ද, එසේ ම නුඹ ද සියලු නෑයන් සමග සතුටුවෙහිවා යි චිත්‍රක තෙම අනුමෙවෙනි වශයෙන් ප්‍රකාශ කෙළේ ය.

2447. පුත්‍රය, ජීවිතය මරණයට ළං කොට පැමිණ වූ කල්හි (මරණාසන්නයේ දී) කෙසේ මිදුණෙහි ද? පුත්‍රය, වැදි තෙම නුඹ මළ පුඩුවෙන් කෙසේ මුද හැරියේ ද?

2448. භණං කණ්ණසුඛං වාචං හදයඞ්ගං හදයනිස්සිතං,
සුභාසිතාහි වාචාහි චිත්‍රකො මං අමොචයි.

2449. භණං කණ්ණසුඛං වාචං හදයඞ්ගං හදයනිස්සිතං,
සුභාසිතාහි වාචාහි සුතනා මං අමොචයි.

2450. සුත්වා කණ්ණසුඛං වාචං හදයඞ්ගං හදයනිස්සිතං,
සුභාසිතානි සුත්වාන ලුද්දකො මං අමොචයි.

2451. එවං ආනන්දිතො හොතු සහ දාරෙහි ලුද්දකො,
යථා මයජ්ජ නන්දාම දිස්වා රොහන්තමාගතං.

2452. නනු ත්වං අවචා ලුද්ද මිගචම්මානි ආහරිං,
අථ කෙන නු වණ්ණෙන මිගචම්මානි නාහරි.

2453. ආගමාචෙව හත්ථත්තං කූටපාසඤ්ච සො මිගො,
අබජ්ඣිතඤ්ච මිගරාජං තඤ්ච මුත්තා උපාසරෙ.

2454. තස්ස මෙ අහු සංවෙගො අබ්භුතො ලොමහංසනො,
ඉමං චාහං මිගං හඤ්ඤෙ අජ්ජ හෙස්සාමි ජීවිතං.

2455. කීදිසා තෙ මිගා ලුද්ද කීදිසා ධම්මිකා මිගා,
කථංවණ්ණා කථංසීලා බාළ්හං ඛො තෙ පසංසසි.

2456. ඔදාතසිඞ්ගා සුචිවාලා ජාතරූපතචූපමා,
පාදා ලොහිතකා තෙසං අඤ්ජිතක්ඛා මනොරමා.

2457. එදිසා තෙ මිගා දෙව එදිසා ධම්මිකා මිගා,
මාතාපෙත්තිභරා දෙව න තෙ සො *අභිහාරයුං.

2458. දම්මි නික්ඛසතං ලුද්ද ථූලඤ්ච මණිකුණ්ඩලං,
චතුස්සදඤ්ච පල්ලඞ්කං උමාපුප්ඵසිරින්නිභං.

---

* අභිහාරයිනන්තිපි පාඨො.

2448. පින්වත් මවුපියවරුනි, මාගේ චිත්‍රක නම් සහොදර තෙම හෘදයඞගම වූ හෘදයනිඃශ්‍රිත වූ කනට සුව ගෙනදෙන්නා වූ වචන කියන්නේ ඒ සුභාෂිත වචන බලයෙන් මා මළපුඩුවෙන් මිදුවී.

2449. පින්වත් මවුපියවරුනි, සුතනා තොමෝ ද සිත් ඇදගන්නා වූ හෘදයනිඃශ්‍රිත කර්ණරසායන වචන කියන්නී ඒ සුභාෂිත වචන බලයෙන් මා මළපුඩුවෙන් මිදුවූ ය.

2450. සිත් ඇදගන්නාසුලු හෘදයනිඃශ්‍රිත වූ කනට සුවදෙන වචන අසා තුටු පහටු වූ වැදිතෙමේ මනා කොට කියූ ඒ වචන ඇසීම හෙතු කොටගෙන මා බන්ධනයෙන් මිදුවේ ය.

2451. මරණයෙන් මිදී ආ රොහනතා නම් මුවරජු දක අද අපි යම්සේ ප්‍රීත වෙමු ද, වැදි තෙමේත් එසේ ම සිය අඹුදරුවන් සමග ප්‍රීත වේවා යි මවුපියෝ අනුමෙවෙනි කළහ.

2452. එම්බා වැදිපුත්‍රය, මුවකු හෝ මුවසම් හෝ ගෙනෙන්-නෙමි යි නුඹ කීවෙහි නොවේ ද? එසේ කියා තිබිය දී කවර කාරණයකින් මුවකු හෝ මුවසම් හෝ නො ගෙනාවෙහි ද? යි රජ තෙම ඇසී ය.

2453. මහරජ, ඒ මුව තෙම මා ඇට වූ මළපුඩුවෙහි බැඳුණේ මාගේ අත්පසට ම පැමිණියේ ම ය. ඒ මුවරජ පුඩුවෙහි බැඳුණේ ය. පුඩුවෙහි බැඳුණු ඒ මුවා ඇසුරු කැරගෙන නො බැඳුණු මුවෝ දෙදෙනෙක් සිටියහ.

2454. ඒ මට ලොමුදහ ගන්නා වූ නො වූ විරූ සංවේගයෙක් පහළ විය. මම මේ මුවා නසන්නෙම් නම් අද මෙහි ම ජීවිතය හරනෙමි යි කියා යි.

2455. වැදිපුත්‍රය, ඒ මුවෝ කෙබඳු ද? කෙබඳු ධර්මයෙහි පිහිටි-යාහු ද? කෙබඳු වර්ණ ඇත්තෝ ද? කෙබඳු ස්වභාව ඇත්තෝ ද? නුඹ දැඩි කොට ප්‍රශංසා කරන්නෙහි යයි රජ ඇසුවේ ය.

2456. මහරජ, ඒ මුවන්ගේ රිදී දම් වැනි අං ඇත්තාහ. සෙමර වල්ග වැනි පිරිසුදු වල්ග ඇත්තේය. සම රන්වන් ය. ලේවන් පා ඇත්තාහ. අඳුන්ගාන ලද ඇස් වැනි සිත්කලු ඇස් ඇත්තේ ය.

2457. දේවයන් වහන්ස, ඒ මුවෝ මෙබඳුයහ. ඒ මුවෝ මෙබඳු ධර්ම ඇත්තෝ ය. දේවයන් වහන්ස, ඒ මම මවුපියන් පොෂණය කරන්නා වූ ඒ මුවන් නො ගෙනාවෙමි යි වැදි තෙම කීවේ ය.

2458. එම්බා වැදිපුත්‍රය, තට රනින් නිෂ්ක සියයක් දෙමි. බොහෝ අගනා මිණි කොඬොලක් ද දෙමි. දිය බෙරළිය මල් බඳු පසතුරුණු ඇතුරූ උස් වූ සිවුරැස් අසුනක් ද දෙමි.

2459. ද්වෙ ච සාදිසියො භරියා උසභඤ්ච ගවං සතං,
ධම්මෙන රජ්ජං කාරෙස්සං බහුකාරො මෙසි ලුද්දක.

2460. කසී වණිජ්ජා ඉණදානං උඤ්ඡාචරියාය ලුද්දක,
එතෙහි දරං පොසෙහි මා පාපං අකරා පුනන්ති.

රොහන්තමිගජාතකං.

6. චූලහංසජාතකං

2461. එතෙ හංසා පක්කමන්ති වක්කඞ්ගා භයමෙරිතා,
හරිත්තච හෙමවණ්ණ කාමං සුමුඛ පක්කම.

2462. ඔහාය මං ඤාතිගණා එකං පාසවසං ගතං,
අනපෙක්ඛමානා ගච්ඡන්ති කිං එකො අවහීයසි.

2463. පතෙව පතතං සෙට්ඨ නත්ථි බද්ධෙ සහායතා.
මා අනීඝාය හාපෙසි කාමං සුමුඛ පක්කම.

2464. නාහං දුක්ඛපරෙතොති ධතරට්ඨ තුවං ජහෙ,
ජීවිතං මරණං වා මෙ තයා සද්ධිං භවිස්සති.

2465. එතදරියස්ස කල්‍යාණං යං ත්වං සුමුඛ භාසසි,
තඤ්ච වීමංසමානොහං පතතෙතං අවස්සජිං.

2466. අපදෙන පදං යාති අන්තලික්ඛචරො දිජො,
ආරා පාසං න බුජ්ඣි ත්වං හංසානං පවරුත්තමො.

2467. යදා පරාභවො හොති පොසො ජීවිතසඞ්ඛයෙ,
අථ ජාලඤ්ච පාසඤ්ච ආසජ්ජාපි න බුජ්ඣති.

2459. රූපයෙන් හා භොගයෙන් ඔවුනොවුනට සමාන භාර්‍ය්‍යා-වරුන් දෙදෙනකුන් ද දෙමි. වෘෂභයකු ඇතුළු ගවයන් සියයක් ද දෙමි. වැදිපුත්‍රය, මම දැහැමින් රජය ද කරවන්නෙමි. තෝ මට බොහෝ උපකාර ඇතියෙක් වෙහි ය.

2460. වැදිපුත්‍රය, තෝ සී සෑම ය, වෙළඳාම ය, ණයදීම ය, සිලා හැසිරීම ය යන මෙයින් අඹුදරුවන් පෝෂණය කරව. නැවැත පාපයක් නො කරව යි රජ තෙම කීවේ ය.

රොහනතමිග ජාතක යි.

6. චූලහංස ජාතකය

2461. රන්වන් සිවි ඇති රන්වන් පැහැති සුමුඛ නම් හංසය, වක් වූ අවයව ඇති භයින් කම්පා වූ මේ හංසයෝ ඉවත්ව යෙති. තෙපි ද එකාන්තයෙන් ඉවත්වව.

2462. මාගේ නෑ සමූහයා මා ගැන බලාපොරොත්තුවක් නැත්-තාහු හුදකලා ව මළ පුඩුවෙහි බැඳුණු මා අත්හැර යෙත්. එකලාවූ තෝ කවර හෙයින් වෙන් වැ නවතින්නෙහි ද?

2463. අහස පියාසර කරන්නවුන්ගෙන් ශ්‍රෙෂ්ඨ වූ හංසය, පාශ-යෙහි බැඳුණහු කෙරෙහි යහළුබවෙක් නැත. සිය නිදුක්බව සඳහා කළයුතු වීර්‍ය්‍යය නො පිරිහෙළව. සුමුඛය, එකාන්තයෙන් ම මෙතනින් යව.

2464. ධතරට්ඨ නම් හංසරාජය, නුඹවහන්සේ මරණ දුකින් පෙළෙතැ යි එපමණෙකින් මම නුඹ වහන්සේ අත් නො හරිමි. මාගේ ජීවත්වීම හෝ මරණය හෝ නුඹ වහන්සේ සමග වන්නේ යයි සුමුඛ තෙම කීවේ ය.

2465. එම්බා සුමුඛය, "මම නුඹ වහන්සේ අත් නො හරිමි" යි නුඹ යමක් කියෙහි ද, මෙය ආචාරයෙන් යුත් ආර්‍ය්‍යයාගේ යහපත් වචනය වේ. මම වනාහි නුඹ විමසන්නෙමි 'පැන යව' යි යන මේ වචනය කීවෙමි' යි හංසරාජ තෙම කීවේ ය.

2466. අහසෙහි හැසිරෙන්නා වූ පක්ෂි තෙම පියවර නො තැබී මෙන් අහසෙහි පියවර කොට ගමන් කරයි. හංසයන් අතුරෙන් ඉතා උතුම් වූ නුඹ වහන්සේ දුර දී ම මළ පුඩුව නො දුටුහු ද යි වැදි තෙම ඇසීය.

2467. වැදිපුත්‍රය, යම් කලෙක පිරිහීමෙක් වේ ද, ජීවිතාවසානයට පමුණුවන එබඳු පිරිහීමේ දී පුරුෂ තෙම දැලට හෝ මළපුඩුවට හෝ ඉතා ළං වුව ද නො දනියි හංස තෙම කීවේ ය.

2468. එතෙ හංසා පක්කමන්ති වක්කඞ්ගා භයමෙරිතා,
හරිත්තච හෙමවණ්ණ ත්වඤ්ච තං අවහීයසි.

2469. එතෙ භුත්වා පිවිත්වා ච පක්කමන්ති විහඞ්ගමා,
අනපෙක්ඛමානා වක්කඞ්ග ත්වඤ්ඤෙවෙකො උපාසසි.

2470. කින්නු තායං දිජො හොති මුත්තො බද්ධං උපාසසි,
ඔහාය සකුණා යන්ති කිං එකො අවහීයසි.

2471. රාජා මෙ'සො දිජො මිත්තො සඛා පාණසමො ච මෙ,
නෙව නං විජහිස්සාමි යාව කාලස්ස පරියායං.

2472. යො ච ත්වං සඛිනො හෙතු පාණං චජිතුමිච්ඡසි.
සො තෙ සහායං මුඤ්චාමි හොතු රාජා තවානුගො.

2473. එවං ලුද්දක නන්දස්සු සහ සබ්බෙහි ඤාතිහි,
යථාහමජ්ජ නන්දාමි මුත්තං දිස්වා දිජාධිපං.

2474. කච්චිනු භොතො කුසලං කච්චි භොතො අනාමයං,
කච්චි රට්ඨමිදං ඵීතං ධම්මෙන මනුසාසසි.

2475. කුසලං චෙව මෙ හංස අථො හංස අනාමයං,
අථො රට්ඨමිදං ඵීතං ධම්මෙන මනුසාසහං.

2476. කච්චි භොතො අමච්චෙසු දොසො කොචි න විජ්ජති,
කච්චි ආරා අමිත්තා තෙ ඡායා දක්ඛිණතොරිව,

2477. අථොපි මෙ අමච්චෙසු දොසො කොචි න විජ්ජති,
අථො ආරා අමිත්තා මෙ ඡායා දක්ඛිණතොරිව.

2478. කච්චි තෙ සාදිසී භරියා අස්සවා පියභාණිනී,
පුත්තරූපයසූපෙතා තව ඡන්දවසානුගා.

2479. අථො මෙ සාදිසී භරියා අස්සවා පියභාණිනී,
පුත්තරූපයසූපෙතා මම ඡන්දවසානුගා.

2468. රන්වන් වූ සිවිය ඇති රන්වන් වූ පැහැති පක්ෂිය, වක් වූ අවයව ඇති කම්පා වූ මේ පක්ෂීහු මොබින් ඉවත් වෙති. නුඹ පමණක් මෙහි රඳනෙහි ය.

2469. වක් වූ අවයව ඇති, අහස්හි හැසිරෙන මේ පක්ෂීහු අනුභව කොට පැන් බී බලාපොරොත්තු නැත්තාහු බැහර යෙති, නුඹ පමණක් හුදෙකලා ව මොහු ඇසුරු කරන්නෙහි ය.

2470. මිදුණා වූ නුඹ පාසයෙහි බැඳුණාහු ඇසුරු කරන්නෙහි ය. මේ පක්ෂි තෙම තට නෑකමින් කවරෙක් වන්නේ ද? අනිත් පක්ෂීහු මේ පක්ෂියා හැරදමා යෙති නුඹ පමණක් කුමක් නිසා මෙහි රැඳෙන්-නෙහි ද? යි වැදි තෙම ඇසී ය.

2471. මේ පක්ෂි තෙම මාගේ රජ වෙයි. මිත්‍ර වෙයි. මාගේ ප්‍රාණය හා සම යහළුවාත් වෙයි. එහෙයින් ජීවිතාන්තය දක්වා මම මොහු නො හරිමි යි සුමුඛ තෙම කීවේ ය.

2472. පින්වත් හංසය, යම්බඳු නුඹ යහළුවා නිසා ප්‍රාණය පුදන්නට කැමැත්තෙහි ද, එහෙයින් නුඹගේ ඒ යහළුවා මුදමි. නුඹගේ රජ නුඹ අනුව යන්නෙක් වේවා, යි වැදි තෙම කීවේ ය.

2473. මළපුඩුවෙන් මිදුණු පක්ෂිරාජයා දැක අද මම යම්සේ සන්තොෂ වෙම් ද, එපරිද්දෙන් ම වැදිපුත්‍රය, නුඹ හැම නෑයන් සමග තුටුවෙහිවා යි සුමුඛ තෙම අනුමෝදනා කෙළේ ය.

2474. කිමෙක් ද පින්වත් මහරජ, ඔබතුමන්හට සුව ද? කිමෙක් ද පින්වත්හට ආරොග්‍යය ඇත්තේ ද? කිමෙක් ද මේ රට සමෘද්ධ ද? ධර්මයෙන් අනුශාසනා කරන්නෙහි ද? කියා හංසරාජයා ඇසුවේ ය.

2475. හංසරාජය, මට සුව ය. තව ද හංසය නීරොගය. මේ රට ද සමෘද්ධ ය. මම දැහැමින් අනුශාසනාත් කරමි.

2476. කිමෙක් ද පින්වත්හුගේ ඇමතියන් කෙරෙහි කිසියම් දෙසෙක් නැද් ද? කිම? නුඹගේ අමිත්‍රයෝ (සතුරෝ) දක්ෂිණදිශාභි-මුඛ සෙවණැල්ල මෙන් නො වැඩෙද් ද?

2477. තවද, මාගේ ඇමතියන් කෙරෙහි කිසි දෙසෙක් නැත. වැලි මාගේ අමිත්‍රයෝ (සතුරෝ) දක්ෂිණදිශාභිමුඛ සෙවණැල්ල මෙන් නො වැඩෙත්.

2478. කිම නුඹගේ භාර්‍ය්‍යාවෝ සමාන ගුණැත්තියෝ ද? කීකරු ද? ප්‍රිය තෙපුල් බෙණෙද් ද? රූප සම්පත් යශස් යන මේ සම්පතින් යුක්ත වූවාහු ද? නුඹගේ කැමැත්ත අනුව පවතිද් ද?

2479. තවද, මාගේ භාර්‍ය්‍යාවෝ සමාන ගුණැත්තියෝ ය. කීකරු ය. ප්‍රිය තෙපුල් බෙණෙති. දරු සම්පත් රූ සම්පත් යශස් යන මේ සම්පතින් යුක්ත වූවා මාගේ කැමැත්ත අනුව පවතිත්.

2480. කච්චි තෙ බහවො පුත්තා සුජාතා රට්ඨවඩ්ඪන,
පඤ්ඤාජවෙන සම්පන්නා සම්මොදන්ති තතො තතො.

2481. සතං එකො ච මෙ පුත්තා ධතරට්ඨ මයා සුතා,
තෙසං ත්වං කිච්චමක්ඛාහි නාවරුජ්ඣන්ති තෙ වචො.

2482. උපපන්නොපි චෙ හොති ජාතියා විනයෙන වා,
අථ පච්ඡා කුරුතෙ යොගං කිච්චෙ ආපාසු සීදති.

2483. තස්ස සංහීරපඤ්ඤස්ස විවරො ජායතෙ මහා,
නත්තමන්ධොව රූපානි ථූලානි මනුස්සති.

2484. අසාරෙ සාරයොගඤ්ඤූ මතිං නත්වෙව වින්දති,
සරභොව ගිරිදුග්ගස්මිං අන්තරායෙව සීදති.

2485. හීනජච්චො'පි චෙ හොති උට්ඨාතා ධිතිමා නරො,
ආචාරසීලසම්පන්නො නිසෙ අග්ගීව භාසති.

2486. එතං මෙ උපමං කත්වා පුත්තෙ විජ්ජාසු වාචය,
සංවිරූළ්හෙථ මෙධාවී ඛෙත්තෙ බීජංව වුට්ඨියාති.

චූළහංස ජාතකං.

7. සත්තිගුම්බජාතකං

2487. මිගලුද්දො මහාරාජා පඤ්චාලානං රථෙසභො,
නික්ඛන්තො සහ සෙනාය ඔගණො වනමාගමා.

2488. තත්ථද්දසා අරඤ්ඤස්මිං තක්කරානං කුටිං කතං,
තස්සා කුටියා නික්ඛම්ම සුවො ලුද්දානි භාසති.

2480. මහරජ, නුඹගේ රට දියුණු කිරීමෙහි සමත් මවුපිය දෙපසින් පිරිසුදු උත්පත්තියක් ඇති බොහෝ පුත්‍රයෝ ප්‍රඥාවෙගයෙන් යුක්ත වූවාහු ඒ ඒ තන්හි අවිරුද්ධව සන්තොෂ වෙද්ද? යි හංස තෙම ඇසුවේ ය.

2481. ධෘතරාෂ්ට්‍ර නම් හංසරාජය, මා හා ප්‍රකට වූ මාගේ පුත්‍රයෝ එකසිය එක්දෙනෙක් වෙත්. ඔවුන්ට කළමනා දේ නුඹ වහන්සේ ප්‍රකාශ කරන සේක්වා, නුඹ වහන්සේගේ වචනය ඔවුහු නො වරද-වති යි රජ තෙම කීය.

2482. ඉදින් යමෙක් ජාතියෙන් හෝ ආචාරයෙන් හෝ යුක්ත වූයේ ද, උගතයුතු කාලයෙහි නොඉගෙන පසුව උත්සාහ කෙරේ ද, ඒ තැනැත්තා කායර්‍යයක් පැමිණි කල්හි හෝ විපතෙහි දී හෝ ගිලෙයි.

2483. නුගත් හෙයින් අනිශ්චල ප්‍රඥා ඇති ඔහුට භොගාදිය සම්බන්ධ සිදුරක් (පිරිහීම් දෙරටුවක්) හටගනී. හෙතෙම රාත්‍රියෙහි මහත් රූප ම දක්නා රාත්‍රිඅන්ධයකුමෙන් ඖදරික කාරණා මිස සියුම් කරුණු නො දකී.

2484. නිස්සාර වූ ආගම ධර්ම කෙරෙහි මේ ධර්මය සාරත්වයෙන් යුක්තයයි සිතන තැනැත්තා බොහෝ ඉගෙන ද නුවණ නො ලබයි. ගිරිදුර්ගයෙහි වේගයෙන් නිවෙසකරා දුව එන සරභමෘගයෙක් සම-ස්ථානයකැයි සිතා විසමස්ථානයෙන් පැන අතරමඟ දීම මහාප්‍රපාත-යෙහි ගිලෙන්නේ යම්සේ ද එමෙනි.

2485. ඉදින් පහත් ජාති ඇත්තේ ද උත්ථාන වීර්‍යයෙන් යුක්ත ද ප්‍රාඥ ද, ආචාරයෙන් හා ශීලයෙන් සමන්විත ද, ඒ මනුෂ්‍යතෙම රාත්‍රිකාලයෙහි ගින්නක් මෙන් බබළයි.

2486. මා විසින් කියන ලද මේ කරුණු උපමා කොටගෙන නුඹ වහන්සේගේ පුත්‍රයන් හට විද්‍යාවන් උගන්වව. එසේ උගන්-වන ලද්දවූ නුවණැත්තේ මනා කෙතෙහි වපුළ බිජුවට වැසි දියෙන් සශ්‍රීකව වැඩෙන්නාක් මෙන් මනාව දියුණුවන්නේ යයි හංසරාජ තෙම ප්‍රකාශ කෙළේ ය.

චූලහංස ජාතක යි.

7. සත්තිගුම්බ ජාතකය

2487. පඤ්චාල දෙශ වාසීන්ගේ රටශ්‍රෙෂ්ඨ වූ මුව දඩයම් කරන්නාවූ මහරජ තෙම සෙනග සමග නික්මුණේ සමූහයාගෙන් වෙන්ව වනයට පිවිසියේ ය.

2488. ඒ වනයෙහි සොරුන් විසින් කරන ලද කුටියක් ඒ රජතෙම දුටුවේ ය. ගිරවෙක් ඒ කුටියෙන් නික්ම අවුත් රෞද්‍ර වචන කියයි.

2489. සමිද්ධනවාහනො පොසො යුවා සම්මට්ඨකුණ්ඩලො,
සොභති ලොහිතුණ්හීසො දිවාසූරියොව භාසති.

2490. මජ්ඣන්තිකෙ සම්පට්ටිකෙ සූතෙන රාජා සසාරථී,
හදයස්සාභරණං සඞ්ඛං ගණ්හාම සහසා මයං.

2491. නිසීදෙපි රහොදනි සූතෙන රාජා සසාරථී,
ආදාය වත්ථං මණිකුණ්ඩලඤ්ච හන්ත්වාන සාඛාහි අපත්ථරාම.

2492. කිනනු උම්මත්තරූපොව සත්තිගුම්බ පහාසසි,
දුරාසද හි රාජානො අග්ගි පජ්ජලිතො යථා.

2493. අථ ත්වං පතිකොළුම්බො[1] මත්තො ථුල්ලානි ගච්ඡසි,
මාතරි මය්හ නග්ගාය කිනනු ත්වං විජිගුච්ඡසෙ.

2494. උට්ඨෙහි සම්ම තරමානො රථං යොජෙහි සාරථී,
සකුණා මෙ න රුච්චන්ති අඤ්ඤං ගච්ඡාම අස්සමං.

2495. යුත්තො රථො මහාරාජ යුත්තො ච බලවාහනො,
අධිතිට්ඨ මහාරාජ අඤ්ඤං ගච්ඡාම අස්සමං.

2496. කොනු මෙව ගතා සබ්බෙ යෙ අස්මිං පරිචාරකා,[2]
එස ගච්ඡති පඤ්චාලො මුත්තො තෙසං අදස්සනා.

2497. කොදණ්ඩකානි ගණ්හථ සත්තියො තොමරානි ච,
එස ගච්ඡති පඤ්චාලො මා වො මුඤ්චිත්ථ ජීවිතං.

2498. අථාපරො[3] පටිනන්දිත්වා සුවො ලොහිතතුණ්ඩකො,
ස්වාගතං තෙ මහාරාජ අථො තෙ අදුරාගතං.
ඉස්සරොසි අනුප්පත්තො යං ඉධත්ථි පවෙදය.

2499. තින්දුකානි පියාලානි මධුකෙ කාසුමාරියො,
ඵලානි ඛුද්දකප්පානි භුඤ්ජ රාජ වරං වරං.

2500. ඉදම්පි පානීයං සීතං ආභතං ගිරිගබ්භරා,
තතො පිව මහාරාජ සචෙ ත්වං අභිකඞ්ඛසි.

1. පටිකොළුම්බ – මජසං ස්‍යා, පතිකොළුම්බෙ.
2. පරිචාරිකා – මජසං.
3. අපරො – මජසං,

2489. අශ්වවාහනයෙන් යුක්ත වූ රතු පැහැති නළල්පටක් ඇති තරුණ වූ පුරුෂ තෙම දිවා සූර්‍ය්‍යයා මෙන් බබළයි.

2490. දැන් මේ මධ්‍යාහ්නයෙහි රියැදුරු සහිත රජ තෙම නිදයි. අපි එකාන්තයෙන් ම මොහුගේ සියලු අබරණ බලාත්කාරයෙන් ගනිමු.

2491. රියැදුරු සහිත රජතෙම මධ්‍යම රාත්‍රියෙහි මෙන් දැනු දු නිදයි. මොහුගේ වස්ත්‍ර ද මිණිකොඬොල් ද ගෙන මරා ගෙළ අතුවලින් වසාදමමුයි සත්තිගුම්බ නම් ගිරවා පතිකොළම්බ නම් සොරාට කීවේ ය.

2492. එම්බා සත්තිගුම්බය, කිම තෝ උමතුවූවකු මෙන් දෙඩන්නෙහි ද? රජවරු වනාහි දිලිසෙන ගින්නක් සේ ළංවියැ නො හැක්කාහු වෙත්.

2493. එම්බා පතිකොළම්බය, තෝ මත් වූයෙහි මහත් වූ ගර්ජනා කරන්නෙහි ද? මාගේ මව (ද) නග්න ව සිටි කල්හි කවරහෙයින් නුඹ සොරකම පිළිකුල් කරන්නෙහිදැ යි සත්තිගුම්බතෙම ඇසීය.

2494. යහළු රියැදුර, වහා නැඟීසිටුව. රිය යොදව. මේ පක්ෂීහු මට රුචි නො වෙත්. අන් අසපුවකට යමුයි රජ තෙම කීය.

2495. මහරජ, බලැති අසුන් බැඳි රිය යොදන ලදී. මහරජ එහි නගිනු මැනව. අන් අසපුවකට යමුයි රියැදුරා කීවේ ය.

2496. මේ අසපුවෙහි වාසය කරන්නා වූ යම් සොර කෙනෙක් වෙද්ද? මේ සියල්ලෝම කොහි ගියාහු ද? ඒ සොරුන්ගේ නො දැක්ම හෙතු කොටගෙන මිදුණා වූ මේ පඤ්චාල රජතෙම යෙයි.

2497. දුනු ගනිවු, අඩයටි ද තෝමර ද ගනිවු. මේ පඤ්චාල තෙමේ යයි. තෙපි ජීවත්වන පඤ්චාලයා නො මුදව.

2498. ඉක්බිති ලේවන් තුඩක් ඇති වෙන ගිරවෙක් මහරජ, නුඹ වහන්සේගේ යහපත් පැමිණීමක් වේවා. තවද, අප සමීපයට නුඹ වහන්සේගේ පැමිණීම ඉතා යහපති. මෙහි පැමිණියා වූ නුඹ වහන්සේ මෙහි අධිපතිවන්නහුය. මෙහි කැමති යමක් වේ නම් දන්වනු මැනවි.

2499. තිඹිරිගෙඩි ද මොරගෙඩි ද මීගෙඩි ද එරමිණිය ද යන මේ එල ඇත්තාහ. මහරජ, හොඳ හොඳ මේ කුඩාගෙඩි අනුභව කරනු මැනවි.

2500. මහරජ. මේ සිහිල් පැන් ද කඳුරැළියෙන් ගෙනෙන ලදය. මහරජ, ඒ නිසා නුඹවහන්සේ කැමැත්තහු නම් එය පානය කරනු මැනවි.

2501. අරඤ්ඤං උඤ්ඡාය ගතා යෙ අස්මිං පරිචාරකා,
සයං උට්ඨාය ගච්ඡව්හො හත්ථා මෙ නත්ථි දතවෙ.

2502. භද්‍රකො[1] වත යං පක්ඛී දිජො පරමධම්මිකො,
අථෙසො ඉතරො පක්ඛී සුවො ලුද්දානි භාසති.

2503. එතං හනථ බන්ධථ මා වො මුඤ්චිත්ථ ජීවිතං,
ඉච්චෙවං විලපන්තස්ස සොත්ථිං පත්තොස්මි අස්සමං.

2504. භාතරොස්ම මහාරාජ සොදරියා එකමාතුකා,
එකරුක්ඛස්මිං සංවඩ්ඪා නානාඛෙත්තගතා උභො.

2505. සත්තිගුම්බො ච චොරානං අහඤ්ච ඉසිනං ඉධ,
අසතං සො සතං අහං තෙන ධම්මෙන නො විනා.

2506. තත්ථ වධො ච බන්ධො ච නිකතී වඤ්චනානි ච,
ආලොපසහසාකාරා[2] තානි සො තත්ථ සික්ඛති.

2507. ඉධ සච්චඤ්ච ධම්මො ච අහිංසා සඤ්ඤමො දමො,
ආසනූදකදායීනං අඞ්කෙ වද්ධොස්මි භාරත.

2508. යං යං හි රාජ භජති සතං[3] වා යදි වා අසං,
සීලවන්තං විසීලං වා වසං තස්සෙව ගච්ඡති.

2509. යාදිසං කුරුතෙ මිත්තං යාදිසඤ්චූපසෙවති,
සොපි තාදිසකො හොති සහවාසො හි තාදිසො.

2510. සෙවමානො සෙවමානං සම්ඵුට්ඨො සම්ඵුසං පරං,
සරො දිද්ධො කලාපං ව[4] ආලිත්තමුපලිම්පති.
උපලෙපභයා[5] ධීරො නෙව පාපසඛා සියා.

---

1. භද්දකො - මජසං.
2. ආලොපා - මජසං.
3. සන්තං - මජසං. ස්‍යා.
4. සරො දුට්ඨො කලාපංව - මජසං.
5. උපලිම්පභයා - මජසං.

2501. 'මහරජ, මේ අසපුවෙහි වාසය කරන්නාවූ යම් ඍෂි කෙනෙක් වෙද්ද. උන්වහන්සේලා පලවැළ පිණිස වනයට ගියහ. එහෙයින් තෙමේ නැගිට ගොස් ගනුමැනවි. දීමට මට අත් නැතැ' යි පුෂ්පක නම් ගිරාතෙම කියේ ය.

2502. යම්හෙයකින් ද්විජ නම් වූ මේ පක්ෂිතෙම උතුම් ධර්මයෙහි පිහිටියේ ද එබැවින් හෙ යහපත්ය. තවද, මේ අනිත් ගිරා පක්ෂි තෙම රෞද්‍ර වචන කියයි.

2503. මොහු මරවූ, බඳිවු. මොහුගේ ජීවිතය තිබෙනතුරු අත්නොහරිවූ. මෙසේ කියද්දී ම සුවසේ ආශ්‍රමයට පැමිණියෙම් වෙමියි රජතෙම කීවේ ය.

2504. මහරජ, අපි දෙදෙන එක ම මවක විසින් පොෂණය කරන ලද්ද වූ එක ගසෙක්හි වැඩුණා වූ නොයෙක් තැන්වලට ගියා වූ එක ම මවුකුසැ උපන් සහොදරයෝ වෙමු.

2505. ඒ සත්තිගුම්බතෙම සොරුන් වෙතට ගියේය. මම් වනාහි මෙහි තවුසන් වෙතට පැමිණියෙමි. හේ අසත්පුරුෂයන්ගේ සමීපයට ගියේය. මම සත්පුරුෂයන් ළඟට පැමිණියෙමි. ඒ කරුණින් අපගේ වෙනස් බව ඇතිවීය යි පුෂ්පක තෙම කීයේ ය.

2506. මහරජ, ඒ සොරුන්ගේ සමීපයෙහි හිංසාව ද බැඳීම ද රැවටීම ද වංචාව ද දවල් ගම්පැහැරීම ද බලාත්කාරකම් ද ඇත්තාහ. හෙතෙමේ එහි දී ඒවා ඉගෙන ගනී.

2507. මහරජ, මම වනාහි මෙහි දී සත්‍යය ද සුචරිත ධර්මය ද අවිහිංසාව ද සංවරශීලය ද ඉන්ද්‍රියදමනය ද යන මේ ගුණ දහම් පුරුදු කරන්නාවූ ආගන්තුකයනට අසුන් පැනවීම් පැන් එළවා තැබීම් ආදී වතාවත් පුරන තවසන්ගේ ඇකයෙහි වැඩුණෙම් වෙමියි, පුෂ්පක තෙම කීයේ ය.

5208. මහරජ, යමෙක් සත්පුරුෂ හෝ අසත්පුරුෂ හෝ සිල්වත් හෝ දුසිල් හෝ යම්බඳු කෙනකුන් ඇසුරු කෙරේ ද හේ ඔහුගේ ම වසයට යන්නේ ය.

2509. යමෙක් යම්බඳු කෙනකුන් මිත්‍රයකු වශයෙන් තබාගනී ද යම්බඳු කෙනකුන් ඇසුරු කෙරේ ද හෙතෙමේත් එබඳු ම වෙයි. එක්ව විසීම ඒ ස්වභාවය ඇත්තකි.

2510. සෙවුනා ලබන්නේ සෙවුනා අනිකා ද පහස්නා ලද්දේ පහස්නා අනෙකා ද විෂපොවන ලද ඊය ඊතලබ (විෂ ගල්වන්නාක්) මෙන් පාපධර්මයෙහි නො තැවැරුණහු තවරයි. පාපධර්මයෙහි තැවැරීම් බියෙන් නුවණැත්තේ පවිටු යහළුවන් ඇත්තෙක් නො වන්නේ ය.

2511. පූතිමච්ඡං කුසග්ගෙන යො නරො උපනය්හති.
කුසාපි පූති වායන්ති එවං බාලූපසෙවනා.

2512. තගරඤ්ච පලාසෙන යො නරො උපනය්හති,
පත්තාපි සුරභී වායන්ති එවං ධීරූපසෙවනා.

2513. තස්මා ඵල[1]පුටස්සෙව ඤත්වා සම්පාකමත්තනො,
අසන්තෙ නොපසෙවෙය්‍ය සන්තෙ සෙවෙය්‍ය පණ්ඩිතො
අසන්තො නිරයං නෙන්ති සන්තො පාපෙන්ති සුග්ගතින්ති.

සත්තිගුම්බජාතකං.

8. භල්ලාටියජාතකං

2514. භල්ලාටියො නාම අහොසි රාජා
රට්ඨං පහාය මිගවං අචාරි සො,
අගමා ගිරිවරං ගන්ධමාදනං
සම්පුප්ඵිතං කිම්පුරිසානුචිණ්ණං.

2515. සාලූරසඞ්ඝඤ්ච නිසෙධයිත්වා
ධනුං කලාපඤ්ච සො නික්ඛිපිත්වා,
උපාගමී වචනං වත්තුකාමො
යත්ථට්ඨිතා කිම්පුරිසා අහෙසුං.

2516. හිමච්චයෙ හෙමවතාය තීරෙ
කිමිධට්ඨිතා මන්තයව්හො අභිණ්හං,
පුච්ඡාමි වො මානුසදෙහවණ්ණෙ
කථං වො ජානන්ති මනුස්සලොකෙ.

2517. *මල්ලං ගිරිං පණ්ඩරකං තිකූටං
[2]සීතොදියා අනුවිචරාම නජ්ජො,
මිගා මනුස්සාව නිභාසවණ්ණා
ජානන්ති නො කිම්පුරිසාති ලුද්ද.

2518. සුකිච්ඡරූපං පරිදෙවයව්හො
ආලිඞ්ගිතොචාසි පියො පියාය,
පුච්ඡාමි වො මානුසදෙහවණ්ණෙ
කිමිධ වනෙ රොදථ අප්පතීතා.

---

1. තස්මා පලාස – මජසං.
* මල්ලාගිරින්ති පි පාඨො.
2. සීතොදිකා – මජසං.

2511. යම් මිනිසෙක් කුණු මසුන් කුසතණ අගින් බඳියි (දවටා) ද ඒ කුසතණ ද ගඳ වහනය වන්නේ ය. බාලයන් ඇසුරු කිරීමත් මෙසේ ම ය.

2512. යම් මිනිසෙක් පත්‍රයකින් තුවරලා දවටා ද, ඒ පත්‍රයෝ ද සුවඳ හමත්. පණ්ඩිතයන් ඇසුරුකිරීමත් මෙබඳු ය.

2513. එබැවින් සුවඳ එතු කොළයෙහි ඇති වූ සුවඳවත් බව මෙන් තමහට වන විපාකය දන නුවණැත්තේ අසත්පුරුෂයන් සේවනය නො කරන්නේ ය. සත්පුරුෂයන් ම සේවනය කරන්නේ ය. අසත්පුරුෂයෝ තමන් ඇසුරු කරන අන්‍යයා නිරයට පමුණුවත්. සත්පුරුෂයෝ තමන් ඇසුරු කරන අන්‍යයන් සුගතියට පමුණුවත්.

සතතිගුම්බජාතක යි.

8. හලලාටිය ජාතකය

2514. පෙර හලලාටිය නම් රජෙක් විය. හේ රට හැර මුව දඩයමට ගියේ ය. මනාව පිපුණා වූ කිඳුරන්ගෙන් ගැවසීගත් ගන්ධමාදන නම් උතුම් පර්වතයට ගියේ ය.

2515. හෙතෙම සුනඛ සමූහයා වළකා දුනු හියවුරු බහාතබා වචනයක් කියනු (බණනු) කැමැත්තේ කිඳුරෝ යම් තැනෙක්හි සිටියාහු ද එහි එළැඹියේ ය.

2516. හෙමන්ත සෘතුවගේ අවසන්හි හෙමවත නම් ගං ඉවුරෙහි සිටියා වූ තෙපි මෙහි කුමක් ගැන නිතර කතා කරන්නහු ද? මිනිස් සිරුරබඳු සිරුරු ඇති තොප අතින් මෙ කරුණ අසමි. තෙපි මිනිස් ලෙව්හි කෙසේ නම් හඳුන්වන්නහු ද? කියා යි.

2517. සබඳ වැද්දණෙනි, අපි මේ මල්ලපණ්ඩරක - ත්‍රිකූට යන පර්වත ද සිහිල් දිය ඇති ගංගාවන් ද අනුව හැසිරෙමු. මිනිසුන් හා සමාන මෘගයෝ වන අපි කිම්පුරිසයෝ යයි හඳුන්වනු ලබමු.

2518. තෙපි ඉතා දුකට පැමිණියාක් මෙන් වැලපෙන්නහු ය. ප්‍රියාව විසින් ප්‍රියයා වැළඳගන්නා ලද්දේ ය. මිනිස් සිරුරු බඳු සිරුරු ඇති තොප අතින් මේ කරුණ විචාරමි. නොසතුටු සිත් ඇත්තාහු කුමක් නිසා මේ වනයෙහි හඬවු ද?

2519. සුකිච්ඡරූපං පරිදෙවයව්හො
ආලිඞ්ගිතො චාසි පියො පියාය,
පුච්ඡාමි වො මානුසදෙහවණ්ණෙ
කිමිධ වනෙ විලපථ අප්පතීතා.

2520. සුකිච්ඡරූපං පරිදෙවයව්හො
ආලිඞ්ගිතො චාසි පියො පියාය,
පුච්ඡාමි වො මානුසදෙහවණ්ණෙ
කිමිධ වනෙ සොචථ අප්පතීතා.

2521. මයමෙකරත්තං[1] විප්පවසිම්හ ලුද්ද
අකාමකා අඤ්ඤමඤ්ඤං සරන්තා,
තමෙකරත්තිං අනුතප්පමානා
සොචාම සා රත්ති පුනං න හෙස්සති.

2522. යමෙකරත්තිං අනුතප්පථෙතං
ධනං ච නට්ඨං පිතරං ච පෙතං,
පුච්ඡාමි වො මානුසදෙහවණ්ණෙ
කථං විනාවාසමකප්පයිත්ථ.

2523. යයිමං[2] නදිං පස්සසි සීඝසොතං
නානාදුමච්ඡදනං සෙලකූටං,
තම්මෙ පියො උත්තරි වස්සකාලෙ
මමඤ්ච [3]මඤ්ඤං අනුබන්ධතීති.

2524. අහඤ්ච අඞ්කොලකං ඔචිනාමි
අති[4]මුත්තකං සත්තලියොථිකඤ්ච,
පියො ච මෙ හොහිති මාලභාරී
අහඤ්ච නං මාලිනී අජ්ඣුපෙස්සං.

2525. අහඤ්චිදං කුරවකං ඔචිනාමි
උද්දාලකා පාටලිසින්දුවාරකා,
පියො ච මෙ හොහිති මාලභාරී
අහඤ්ච නං මාලිනී අජ්ඣුපෙස්සං.

2526. අහඤ්ච සාලස්ස සුපුප්ඵිතස්ස
ඔචෙය්‍ය පුප්ඵානි කරොමි මාලං,
පියො ච මෙ හොහිති මාලභාරී
අහඤ්ච නං මාලිනී අජ්ඣුපෙස්සං.

1. මයෙකරත්තං පවසිම්හ - මජසං.
2. යමිමං - මජසං.
3. මඤ්ඤෙ - මජසං. සයා.
4. අධි - මජසං. සයා.

2519. තෙපි ඉතා දුකට පැමිණියාක් මෙන් වැලැපෙන්නහු ය. ප්‍රියාව විසින් ප්‍රියයා වැළැඳගන්නා ලද්දේ ය. මිනිස් සිරුරු බඳු සිරුරු ඇති තොප අතින් මේ කරුණ විචාරමි. නොසතුටු සිත් ඇත්තාහු කුමක් නිසා මේ වනයෙහි විලාප කියන්නහු ද?

2520. තෙපි ඉතා දුකට පැමිණියාක් මෙන් වැලැපෙන්නහු ය. ප්‍රියාව විසින් ප්‍රියයා වැළඳගන්නා ලද්දේ ය. මිනිස් සිරුරු බඳු සිරුරු ඇති තොප අතින් මෙය විචාරමි. නොසතුටු සිත් ඇත්තාහු කුමක් නිසා මේ වනයෙහි ශොක කරවු ද?

2521. සබඳ වැද්දයෙනි, අපි නො කැමැත්තමෝ ඔවුනොවුන් සිහි කරමින් එක් රැයක් වියෝවැ වුසුම්හ. ඒ එක් රැය ගැන තැවෙ-මින් ඒ රැය නැවත නො එන්නී යයි ඒ එක රැය අනුව තැවෙන්නමෝ ශොක කරමු.

2522. තෙපි යම්බඳු එක්රැයක් ගැන තැවෙන්නහු ද, එය නැසුණු ධනය හෝ පරලෝ ගිය පියා හෝ මිතා ඒ අනුව තැවෙන්නහු ද? මිනිස් සිරුරු බඳු සිරුරු ඇති තොපගෙන් මෙය විචාරමි. කෙසේ නම් වෙන්ව විසූහු ද කියා යි.

2523. වහා බස්නා දිය පහර ඇති නොයෙක් ගසින් වැසීගියා වූ පර්වත දෙකක් අතරින් බැස යන යම් මේ ගංගාවක් දක්නෙහි ද? මාගේ ප්‍රිය තෙම මා ද පසුපසැ එනවා යයි හඟිමින් වර්ෂා කාලයෙහි ඒ ගඟ තරණය කෙළේ ය.

2524. මම වනාහි පිපීගිය අඟුනාමල් ද කෝඩු මල් ද සත්පෙති දෑ සමන් ද නෙළීමි. මාගේ ප්‍රිය තෙමේ ද මල්මාලාබර ඇත්තෙක් වන්නේය. මම ද මල් මාලා ඇති ව ඔහු වෙත එළැඹෙන්නෙමැ යි සිතීමි.

2525. මම වනාහි පිපුණ රත්කරවුමල් ද ඇසළ ද පළොල් ද නිකමල් ද කඩා රැස් කෙළෙමි. මාගේ ප්‍රිය තෙමේ ද මල්මාලාබර ඇත්තෙක් වන්නේ ය. මම ද මල්මාලා ඇත්තී ඔහු වෙත එළැ-ඹෙන්නෙමි යි කියා යි.

2526. තවද, මම වනාහි මනාව පිපීගිය සල්ගසක මල් නෙළා මාලාවක් කෙළෙමි. මාගේ ප්‍රිය තෙමේ මල්බර ඇත්තෙක් වන්නේ ය. මම ද මාලා ඇත්තී ඔහු වෙත එළඹෙන්නෙමි.

2527. අහඤ්ච සාලස්ස සුපුප්ඵිතස්ස
ඔචෙය්‍ය පුප්ඵානි කරොමි හාරං,
ඉදඤ්ච නො හොහිති සන්ථරත්තං
යත්ථජ්ජමං විහරිස්සාමු රත්තිං.

2528. අහං ච ඛො අගළුං චන්දනඤ්ච
සිලාය පිංසාමි පමත්තරූපා,
පියො ච මෙ හොහිති රොසිතඞ්ගො
අහඤ්ච න රොසිතා අජ්ඣුපෙස්සං.

2529. අථාගමා සලිලං සීඝසොතං
නුදං සාලෙ සලළෙ කණ්ණිකාරෙ.
අපූරථ තෙන මුහුත්තකෙන
සායං නදී ආසි මයා සුදුත්තරා.

2530. උභොසු තීරෙසු මයං තද ඨිතා
සම්පස්සන්තා උභයො අඤ්ඤමඤ්ඤං,
සකිම්පි රොදම සකිං හසාම
කිච්ඡෙන නො අගමා සංවරී සා.

2531. පාතො ච ඛො උග්ගතෙ සූරියම්හි
චතුක්කං නදිං උත්තරියාන ලුද්ද,
ආලිඞ්ගියා අඤ්ඤමඤ්ඤං මයං උභො
සකිම්පි රොදම සකිං හසාම.

2532. තීහූනකං සත්ත සතානි ලුද්ද
යමිධ මයං විප්පවසිම්හ පුබ්බෙ,
වාසෙකිමං* ජීවිතං භූමිපාල
කොනීධ කන්තාය විනා වසෙය්‍ය.

2533. ආයුඤ්ච වො කීවතකො නු සම්ම
සචෙපි ජානාථ වදෙථ ආයුං,
අනුස්සවා වඩ්ඪතො ආගමා වා
අක්ඛාථ මෙ තං අවිකම්පමානා.

2534. ආයුඤ්ච නො වස්සසහස්සං ලුද්ද
න චන්තරා පාපකො අත්ථි රොගො,
අප්පඤ්ච දුක්ඛං සුඛමෙව භිය්‍යො
අවීතරාගා විජහාම ජීවිතං.

2535. ඉදඤ්ච සුත්වාන අමානුසානං
භල්ලාටියො ඉත්තරං ජීවිතන්ති,
[1]නිවත්තථ න මිගවධං අචාරි
අදසි දනානි අභුඤ්ජි භොගෙ.

---

* වාසෙකිමන්ති වාසං එකං ඉමං.

1. නිවත්තථ න මිගවං අචාරි. – මජසං.

2527. මම වනාහි මනාව පිපීගිය සල්ගසක මල්නෙළා බරක් කෙළෙමි. යම් තැනක අද මේ රැය වසන්නෙමු ද මේ මල්රස ද එහි ඇතිරිම පිණිස වන්නේ ය.

2528. මම වනාහි ප්‍රමාද වූවා අගිල් ද සඳුන් ද ගලෙහි ලා ඇඹරිමි. මගේ ප්‍රිය තෙමේ ද සුවඳ ගල්වන ලද ශරීර ඇත්තෙක් වන්නේ ය. මම ද සුවඳ ගැල්වූවා ඔහු වෙත එළැඹෙන්නෙමි.

2529. ඉක්බිති වහා බස්නා වූ ගඟදිය රැස් කරන ලද සල්මල් ද සළලමල් ද කිණිහිරිමල් ද ගසාගෙන යළින් පැමිණියේ ය. ඒ මොහොතකින් ගඟ පිරී ගියා ය. මේ ගඟ මා විසින් එතර කළ නොහැකි වූවා ය.

2530. එද අපි දෙතෙර සිටියමෝ ඔවුනොවුන් දක්නමෝ වරක් හැඬීමු. වරක් සිනාසුණෙමු. මෙසේ අපට ඒ රාත්‍රිතොමෝ දුකින් ගතවූවා ය.

2531. එම්බා වැදිපුත්‍රය, උදෑසන හිරු උද වූ කල්හි දිය හිස් වූ නදිය තරණය කොට අපි දෙදෙන ඔවුනොවුන් වැළඳගෙන වරකුත් හැඬීමු. වරකුත් සිනාසුණෙමු.

2532. වැදිපුත්‍රය, යම් කලෙක්හි අපි වෙන්ව විසුවෙමු ද, ඒ කාලය මෙයින් පෙර තුනකින් අඩු වූ සත්සිය වසකට පෙර ය. භූමිපාලය, වාසය කිරිම මේ එක්සිය වසක් පමණ වූ ජීවිත කාලය තුළ ය. මේ සුළු ජීවිත කාලයෙහි කවරෙක් නම් ප්‍රිය භාර්‍යාවන් ගෙන් වෙන් ව වාසය කෙරේ දැ යි ඇසී ය.

2533. යහපත් කිඳුරෙනි, තොපගේ ආයුෂ කොතෙක් වේදැ යි. ඉදින් දන්නහු නම් කියව. කිසිවකු කියන කල්හි ඇසීමෙන් හෝ මවුපියාදි වැඩිහිටියන් අතින් ඉගෙනීමෙන් හෝ දැනීමක් ඇත් නම් කම්පා නොවී එය මට කියනු මැනැවි.

2534. සබඳ වැද්දුණෙනි, අපගේ ආයුෂ කාලය වර්ෂ දහසෙකි මේ ආයුෂ කාලය තුළ පව්වු රෝගයක් ද නැත්තේ ය. දුක ස්වල්ප ය. සැප ම අධික ය. ඔවුනොවුන් කෙරෙහි පහ නොවූ ප්‍රෙම ඇති ව ජීවිතය හරිමු යි කිඳුරිය කීවා ය.

2535. හලලාටිය රජතෙම නොමිනිස් වූ කිඳුරන්ගේ මේ අනු-ශාසනය අසා ජීවිත කාලය ස්වල්ප යයි දැන ආපසු හැරී ගියේ ය. මුව දඩයම සඳහා නො ගියේ ය. දන් දුන්නේ ය. සම්පත් අනු භවය ද කෙළේ ය.

2536. ඉදඤ්ච සුත්වාන අමානුසානං
සම්මොදථ මා කලහං අකත්ථ,
මා වො තපී අත්තකම්මාපරාධො
යථාපි තෙ කිම්පුරිසෙකරත්තිං.

2537. ඉදඤ්ච සුත්වාන අමානුසානං
සම්මොදථ මා විවාදං අකත්ථ,
මා වො තපී අත්තකම්මාපරාධො
යථාපි තෙ කිම්පුරිසෙකරත්තිං.

2538. විවිධඅධිමනා සුණොමහං
වචනපථං තව අත්ථසංහිතං,
මුඤ්ච ගිරං නුදසෙව මෙ දරං
සමණ සුඛාවහ ජීව මෙ චිරන්ති.

භල්ලාටියජාතකං.

9. සොමනස්සජාතකං

2539. කො තං හිංසති හෙඨෙති[1]
කිං දුම්මනො සොචසි අප්පතීතො,
කස්සජ්ජ මාතාපිතරො රුදන්තු
ක්වජ්ජ[2] සෙතු නිහතො පථව්‍යා.

2540. තුට්ඨොස්මි දෙව තව දස්සනෙන
චිරස්ස පස්සාමි තං භූමිපාල,
අහිංසකො රෙණුමනුප්පවිස්ස
පුත්තෙන තෙ හෙඨයිතොස්මි දෙව.

2541. ආයන්තු දොවාරිකා ඛග්ගබද්ධා,
කාසාවියා යන්තු අන්තෙපුරං තං,
ගන්ත්වාන[3] තං සොමනස්සං කුමාරං
ඡෙත්වාන සීසං වරමාහරන්තු.

2542. පෙසිතා රාජිනො දූතා කුමාරං එතදබ්‍රවුං,
ඉස්සරෙන විතිණ්ණොසි [4]වධප්පත්තොසි ඛත්තිය.

2543. ස රාජපුත්තො පරිදෙවයන්තො
දසඞ්ගුලිං අඤ්ජලිං පග්ගහෙත්වා,
අහම්පි ඉච්ඡාමි ජනින්ද දට්ඨුං
ජීවං පනෙත්වා[5] පටිදස්සයාථ.

---

1. පොථෙති – මජසං.
2. කොනවජ්ජසෙතු – මජසං.
3. හන්ත්වාන – මජසං.
4. වධං – මජසං. ස්‍යා.
5. ජීවං මං නෙත්වා – මජසං. ස්‍යා.

2536. නොමිනිස් වූ කිඳුරන්ගේ මේ වචනය ද අසා සතුටු වවු. කලහ නො කරවු. ඒ කිඳුරෝ එක් රැයක් වෙන්ව විසීමෙන් යම්සේ තැවුණාහු ද එබඳු ආත්මකර්මාපරාධයෙන් තොප නො තවාවා.

2537. නොමිනිස් වූ කිඳුරන්ගේ මේ වචනය ද අසා සතුටු වවු. විවාද නො කරවු. ඒ කිඳුරෝ එක්රැයක් වෙන්ව විසීමෙන් යම්සේ තැවුණාහු ද, එබඳු ආත්මකර්මාපරාධයෙන් තොප නො තවාවා .

2538. ස්වාමීනි බුදුරජාණන් වහන්ස, නොයෙක් ලෙසින් අලං-කාර කොට දේශනා කරන ලද නුඹ වහන්සේගේ වැඩදයක වූ වචනය පහන් සිතැති ව ඇසුවෙමි. කර්ණරසායන මිහිරි වචන මුදු මාගේ ශොකය දුරු කළ සේක. දෙව් මිනිස් සුව හා ලොවීලොවතුරා සුවත් ගෙන දෙන්නා වූ ධර්මරාජන් වූ බුදුරජාණන් වහන්ස, බොහෝ කාලයක් ජීවත් වනුමැනැව යි මල්ලිකාදෙවිය කීවා ය.

හලලාටිය ජාතක යි.

9. සොමනස්ස ජාතකය

2539. ස්වාමීනි, කවරෙක් නුඹ වහන්සේට පහරදේ ද? කවරෙක් ආක්‍රොශ කරයි ද? දෙම්නසින් යුතුව නො සතුටු සිතැත්තේ කුමක් හෙයින් ශොක කෙරෙහි ද? අද කවරකුගේ මවුපියෝ හඬද් ද? අද කවරෙක් නසන ලද්දේ පොළොවෙහි ශයනය කෙරේ දැ රේණු රජ තෙම ඇසීය.

2540. දෙවයන් වහන්ස, නුඹ වහන්සේගේ දැක්මෙන් තුටුවෙමි. භූමිපාලය, නුඹ වහන්සේ බොහෝ කාලයෙකින් දකිමි. රේණු නම් රජතුමනි, නුඹ වහන්සේගේ පුත්‍රයා විසින් අසපුවට පිවිස අහිංසක වූ මම වෙහෙසට පමුණුවන ලද්දෙමි යි කූට ජටිලයා කීවේ ය.

2541. කඩුබඳනාලද දෙරටුපාලයෝ යෙත්වා. චෝර සාතකයෝ අන්තඃපුරයට යෙත්වා. ගොස් ඒ සොමනස්ස කුමාරයා නසා උතුම් හිස ගෙනෙත්වා. (රජ අණ කෙළේ ය.)

2542. යවන ලද රජුගේ දූතයෝ කුමරහුට මෙය කීහ. එම්බා රාජ කුමාරය, නුඹ වහන්සේ රජහු විසින් හැර දමන ලද්දහු ය. එහෙයින් වධයට පැමිණියහු ය.

2543. ඒ රාජපුත්‍ර තෙම අඬමින් දසැඟිලි එක් කොට ඇඳිලි බැඳ මම ද රජහු දක්නට කැමැත්තෙමි. ජීවත්වන්නා වූ මා ගෙන ගොස් රජුට දක්ව යි කීවේ ය.

2544. තස්ස තං වචනං සුත්වා රඤ්ඤො පුත්තං අදස්සයුං,
පුත්තො ච පිතරං දිස්වා දූරතොවජ්ඣභාසථ.

2545. ආගඤ්ඡුං දොවාරිකා ඛග්ගබද්ධා
කාසාවියා හනන්තු මමං ජනින්ද,
අක්ඛාහි මෙ පුච්ඡිතො එතමත්ථං
අපරාධො කොනිධ මමජ්ජ අත්ථි.

2546. සායඤ්ච පාතො උදකං සජාති
අග්ගිං සදා පරිචරතප්පමත්තො,
තං තාදිසං සංයතං බ්‍රහ්මචාරිං
කස්මා තුවං බ්‍රූසි ගහපතීති.

2547. තාලා ච මූලා ච ඵලා ච දෙව
පරිග්ගහා විවිධා සන්තිමස්ස,
තෙ රක්ඛති ගොපයතප්පමත්තො
බ්‍රාහ්මණො[1] ගහපති තෙන හොති.

2548. සච්චං ඛො එතං වදසි කුමාර
පරිග්ගහා විවිධා සන්තිමස්ස,
තෙ රක්ඛති ගොපයතප්පමත්තො
බ්‍රාහ්මණො[2] ගහපති තෙන හොති.

2549. සුණන්තු මය්හං පරිසා සමාගතා
සනෙගමා ජානපදා ච සබ්බෙ,
බාලායං බාලස්ස වචො නිසම්ම
අහෙතුනා ඝාතයතෙ ජනින්දො.

2550. දළ්හස්මි මූලෙ විසටෙ විරූළ්හෙ
දුන්නික්ඛයො වෙළු පසාඛජාතො,
වන්දාමි පාදානි තව ජනින්ද
අනුජාන මං පබ්බජිස්සාමි දෙව.

2551. භුඤ්ජස්සු භොගෙ විපුලඵලෙ[3] කුමාර
සබ්බඤ්ච තෙ ඉස්සරියං දදාමි,
අජ්ජෙව ත්වං කුරූනං හොහි රාජා
මා පබ්බජී පබ්බජ්ජා හි දුක්ඛා.

2552. කින්නූධ දෙව තවමත්ථි භොගො
පුබ්බෙවහං දෙවලොකෙ රමිස්සං,
රූපෙහි සද්දෙහි අථො රසෙහි
ගන්ධෙහි ඵස්සෙහි මනොරමෙහි.

1. තස්මා අහං බ්‍රූමි ගහපතීති - මජසං.
2. සබ්‍රාහ්මණො - මජසං.
3. නාරද විපුලෙ.

2544. දූතයෝ කුමාරයාගේ වචනය අසා රජුට පෙන්වූහ. පුත්‍ර තෙමේ ද පියා දැක දුර දී ම මෙසේ කීවේ ය.

2545. මහරජාණන් වහන්ස, කඩු බඳනා ලද දෙරටු පාලයෝ ආවාහු ය. මා නසන්නට චොරඝාතකයෝ ආවාහ. මෙහි මාගේ කවර නම් අපරාධයෙක් ඇද්දැයි විචාරනලද මට අද ඒ කරුණ ප්‍රකාශ කරනු මැනැවි.

2546. සවස ද උදය ද දියට බැසීම කරයි. නො පමා වූයේ හැම්කල්හි ගිනි පුදයි. එබඳු සංයම වූ ඒ බ්‍රහ්මචාරී තාපසයාට නුඹ කුමක් හෙයින් ගෘහපතියායි කීයෙහි ද? (කියා රජ ඇසීය.)

2547. දෙවයන්වහන්ස, තල් ද අලමුල් ද එලවර්ග ද යන විවිධ වස්තූහු මොහුට ඇත්තාහ. මෙතෙම ඒවා රකී. නො පමාවූයේ ඒ වස්තූන් ආරක්‍ෂා කෙරෙයි. එහෙයින් මේ බ්‍රාහ්මණතෙම ගෘහපති නම් වේ' යි කුමාරයා කීය.

2548. කුමාරය, මොහුට නොයෙක් වස්තූහු ඇත්තාහ. ඒවා රකී. නො පමාවූයේ ආරක්‍ෂා කරයි. එහෙයින් (මේ) බ්‍රාහ්මණතෙම ගෘහපති-යෙක යන මේ සත්‍යයක් ම නුඹ කීයෙහිය.

2549. නියම්ගම්වැසියන් සහිත මෙහි රැස්වූ සියලු දනව්වැසි පිරිස ම මාගේ වචනය අසත්වා. මේ අඥාන වූ රජතෙම අඥාන වූ තවුසාගේ වචනය අසා නිකරුණේ මා මරවා යී (කුමරා) කීය.

2550. දැඩි වූ මුල ඇතිව මහත්ව වැඩුණු කල්හි අතුපතර හට-ගත් උණ පඳුර වෙන් කොට අදින්නට නොපිළිවන. මහරජාණන් වහන්ස, නුඹ වහන්සේගේ පා වඳිමි. දේවයන්වහන්ස, මම පැවිදි වෙමි. එයට අනුදැන වදළ මැනවි.

2551. කුමාරය, මහත් ප්‍රයොජන ඇත්තා වූ සම්පත් අනුභව කරව. තොපට හැම ඉසුරු ම දෙමි. තෙපි අද ම කුරුරට වැසි-යන්හට රජවවූ. පැවිදි නොවවූ. පැවිද්ද වනාහි දුක් වන්නේය.

2552. දේවයන්වහන්ස, මෙහි නුඹ වහන්සේගේ කවර සම්පතක් ඇත්තේ ද? පෙර මම දෙව්ලොව සිත්කලු රූපවලින් ද ශබ්දවලින් ද රසවලින් ද සුවඳින් ද ස්පර්ශයෙන් ද සිත් අලවා විසීමි.

2553. භුත්තා මෙ භොගා තිදිවස්මිං දෙව
පරිවාරිතා අච්ඡරානං ගණෙන,
තුවඤ්ච බාලං පරනෙය්‍යං විදිත්වා
න තාදිසෙ රාජකුලෙ වසෙය්‍යං.

2554. සචාහං බාලො පරනෙය්‍යොහමස්මි
එකාපරාධං ඛම පුත්ත මය්හං,
පුනාපි චෙ එදිසකං භවෙය්‍ය
යථාමති සොමනස්සං[1] කරොහි.

2555. අනිසම්ම කතං කම්මං අනවත්ථාය චින්තිතං,
භෙසජ්ජස්සෙව වෙභඞ්ගො විපාකො හොති පාපකො.

2556. නිසම්ම ච කතං කම්මං සම්මාවත්ථාය චින්තිතං,
භෙසජ්ජස්සෙව සම්පත්ති විපාකො හොති භද්‍රකො.

2557. අලසො ගිහී කාමභොගී න සාධු
අසඤ්ඤතො පබ්බජිතො න සාධු,
රාජා න සාධු අනිසම්මකාරී
යො පණ්ඩිතො කොධනො තං න සාධු.

2558. නිසම්ම ඛත්තියො කයිරා නානිසම්ම දිසම්පති,
නිසම්මකාරිනො රාජ යසො කිත්ති ච වඩ්ඪති.

2559. නිසම්ම දණ්ඩං පණයෙය්‍ය ඉස්සරො
වෙගාකතං[2] තපතෙ[3] භූමිපාල,
සම්මාපණිධි ච නරස්ස අත්ථා
අනානුතප්පා තෙ භවන්ති පච්ඡා.

2560. අනානුතප්පානි හි යෙ කරොන්ති
විභජ්ජ කම්මායතනානි ලොකෙ,
විඤ්ඤුප්පසත්ථානි සුඛුද්‍රයානි
භවන්ති වද්ධානුමතානි තානි.

2561. ආගඤ්ඡුං දොවාරිකා ඛග්ගබද්ධා
කාසාවියා හන්තු මමං ජනින්ද,
මාතු ච අඞ්කස්මිං අහං නිසින්නො
ආකඩ්ඪිතො සහසා තෙහි දෙව.

1. සොමනස්ස - මජසං.
2. වෙගසා - මජසං.
3. තප්පති - මජසං. ස්‍යා.

2553. දේවයන්වහන්ස, අප්සරා සමූහයා විසින් පිරිවරන ලද මා විසින් දෙව්ලොව සම්පත් අනුභව කරන ලදි. අනුන් විසින් පැමිණවියැයුතු වූ නුඹ බාලයෙකැයි දැන එබඳු රජ කුලයෙහි නොවසන්නෙමි.

2554. ඉදින් මම අනුන් විසින් පැමිණවියැයුතු (මගපෙන්වියැයුත්තෙක්) බාලයෙක් වන්නෙම් නම් පුත්‍රය, මාගේ ඒ එක ම අපරාධය ගැන කමා කරව. සොමනස්ස කුමාරය, ඉදින් නැවතත් මෙබඳු වරදෙක් වේ නම් තෙපි කැමැත්තක් කරව.

2555. නො විමසා කළ ක්‍රියාව ද, නො සසඳා සිතන ලද්ද ද වැරදුණු බෙහෙතක්හුගේ විපත්තිය මෙන් ලාමක විපාක ඇත්තේ වෙයි.

2556. විමසා කරන ලද ක්‍රියාව ද මනා කොට සිතන ලද්දද බෙහෙතක්හුගේ සම්පත මෙන් යහපත් විපාක ඇත්තේ වෙයි.

2557. අලස වූ කාමභොගී ගිහියා නො මැනැවි. සංයම නොවූ පැවිද්ද නො මැනැවි. පරීක්‍ෂා නො කොට කටයුතු කරන රජතෙමේ නො මැනැවි. යම් පණ්ඩිතයෙක් කිපෙනසුලු වේද, එය නො මැනැවි.

2558. ක්‍ෂත්‍රිය තෙමේ විමසා කටයුතු කරන්නේය. රජතෙම නො විමසා කටයුතු නො කරන්නේය. මහරජ, විමසා කටයුතු කරන්නහුගේ යශසත් කීර්තියත් වැඩේ.

2559. මහරජ, අධිපතිතෙම පරීක්‍ෂා කොට දඬුවම් පණවන්නේ ය. නො විමසා වහා කරන ලද්ද තැවීම් ඇති කරන්නේය. නුවණින් මෙනෙහි කොට කරන ලද අර්ථයෝ (යහපත් ක්‍රියාවෝ) වෙද්ද, ඔවුහු පසුව තැවීම් ගෙනදෙන්නෝ නො වෙති.

2560. ලෙව්හි යම් කෙනෙක් කටයුතු නො කටයුතු දැ විමසා බලා වැඩ කෙරෙද්ද නුවණැත්තන් විසින් පසස්නා ලද සැප විපාක ගෙන දෙන්නා වූ ඒ වැඩ වෘද්ධයන් (පණ්ඩිතයන්) අනුමත කරනු ලබන්නා වූ ද, තැවීම් ගෙන නොදෙන්නා වූ ද කර්මයෝ වෙති.

2561. මහරජ, දෙරටුපාලකයෝ ද කඩු බඳනාලද වධකයෝ ද මා නසන්නට ආවාහු ය. දේවයන් වහන්ස, මවු ඇකයෙහි හුන් මම ඔවුන් විසින් වහා අදින ලද්දෙම් වෙමි.

2562. කටුකම්හි සම්බාධං සුකිච්ඡපත්තො
මධුරං පියං ජීවිතං ලද්ධු රාජ,
කිච්ඡෙනාහං අජ්ජ වධා පමුත්තො
පබ්බජ්ජමෙවාභිමනොහමස්මි.

2563. පුත්තො තවායං තරුණො සුධම්ම
අනුකම්පකො සොමනස්සො කුමාරො,
තං යාචමානො න ලභාමි සජ්ජ
අරහාසි නං යාචිතවෙ තුවම්පි.

2564. රමස්සු භික්ඛාචරියාය පුත්ත
නිසම්ම ධම්මෙසු පරිබ්බජස්සු,
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
අභිකිඤ්චනො බ්‍රහ්මමුපෙහි ඨානං.

2565. අච්ඡරියරූපං[1] වත යාදිසඤ්ච
දුක්ඛිතං මං දුක්ඛාපයසෙ සුධම්ම,
යාචස්සු පුත්තං ඉති වුච්චමානො
භිය්‍යොව උස්සාහයසෙ කුමාරං.

2566. යෙ විප්පමුත්තා අනවජ්ජභොජිනො,
පරිනිබ්බුතා ලොකමිමං චරන්ති,
තමරියමග්ගං පටිපජ්ජමානං
න උස්සහෙ වාරයිතුං කුමාරං.

2567. අද්ධා හවෙ සෙවිතබ්බා සපඤ්ඤා
බහුස්සුතා යෙ බහුඨානචින්තිනො,
යෙසායං සුත්වාන සුභාසිතානි
අප්පොස්සුක්කා වීතසොකා සුධම්මා'ති.

සොමනස්ස ජාතකං.

10. චම්පෙය්‍යජාතකං

2468. කානු විජ්ජුරිවාභාසි ඔසධී විය තාරකා,
දෙවතානුසි ගන්ධබ්බී න තං මඤ්ඤාමි මානුසිං[2]

2569. නම්හි දෙවී න ගන්ධබ්බී න මහාරාජ මානුසී,
නාගකඤ්ඤාම්හි[3] භද්දන්ත අත්ථෙනම්හි ඉධාගතා.

---

1. අච්ඡෙර - මජ්ඣං.
2. මානුසී - වි. මජ්ඣං. ස්‍යා.
3. නාගකඤ්ඤාස්මි-මජ්ඣං. ස්‍යා.

2562. මහරජ කටුක වූ සම්බාධ වූ ඉතා දුකට පැමිණියෙම් වෙමි. ඒ මම අද දුකසේ වධයෙන් මිදුණෙම් මිහිරි වූ ප්‍රිය වූ ජීවිතය ලබා සිටිමි. දැන් ඒ මම පැවිදිවනු රිස්සෙමි යි කුමර තෙම කීයේ ය.

2563. සුධර්මාවෙනි, තීගේ මේ තරුණ පුත්‍ර සොමනස්ස කුමාර තෙම අනුකම්පා ඇත්තෙකි. දැන් යාච්ඤා කරනු ලබන්නේ ඔහු නො ලදිමි. තෙපි ද ඔහුට යාච්ඤා කරන්නට නිසි නො වහු දැයි රජ තෙම කීයේ ය.

2564. පුත්‍රය, පිඬුසිඟීමෙහි ඇලෙව. ධර්මයන්හි ලා විමසීම් ඇති කොට තන්හි තන්හි හැසිරෙව. සියලු සත්ත්වයන් කෙරෙහි දඬුවම් අත්හැර නිඳා නො ලබන්නෙක්ව බ්‍රහ්මලොකයට එළඹෙනු මැනැවැ යි රජබිසොව කීවා ය.

2565. සුධර්මාවෙනි, යම්බඳු වූ දුකට පත් මා තෙපි වැඩියත් දුකට පැමිණවූවහු ය. පුත්‍රයා ගිහිගෙයි වසන පරිදි යාච්ඤා කරන්නට යයි කියනු ලබන්නී කුමරා වැඩියත් පැවිදිබවට උනන්දු කළා ය. ආශ්චර්යයකි.

2566. රාගාදියෙන් මිදුණු නිරවද්‍ය භොජන ඇති කෙලෙස් පිරිනිවීයෙන් පිරිනිවුණු යම්බඳු රහත්හු මේ ලෙව්හි හැසිරෙද්ද උන්වහන්සේලාගේ ඒ උතුම් මඟ පිළිපන්නා වූ කුමාරයා වළකාලන්නට උත්සාහ නො කරමි යි මවුබිසව කීවාය.

2567. මේ සුධර්මා තොමෝ යම් කෙනකුන්ගේ යහපත් වචන අසා එකාන්තයෙන් අල්පොත්සුක වූවා පහවූ ශොක ඇත්තී වූවා ද යම් කෙනෙක් ප්‍රාඥ වූවාහු බොහෝ ඇසූ පිරූ තන් ඇත්තාහු නොයෙක් කරුණු සිතන්නෝ වෙද්ද, එකාන්තයෙන් ම ඔවුහු සේවනය කළ යුත්තෝ වෙති යි රජ තෙම කීයේ ය.

සොමනස්ස ජාතක යි.

10. චම්පෙය්‍ය ජාතකය

2568. විදුලිය සේ ද ඔසධී තරුව සේ ද බබළන තෝ කවර නම් තැනැත්තියක් ද? දෙවතාවක් ද ගාන්ධර්ව ස්ත්‍රියක් ද? තී මිනිස් මාගමකැ යි නො හඟිමි යි උග්‍රසෙන රජතෙම කීය.

2569. මහරජ, මම දෙව්දුවක් නොවමු. ගාන්ධර්ව ස්ත්‍රියක් ද නොවමු. මිනිස් මාගමක් ද නොවමු. ස්වාමීනි, මම නාග කන්‍යාවක්මු. මෙහි යම්කිසි කටයුත්තක් සඳහා ආවමු.

2570. විබ්භන්තචිත්තා කුපිතින්ද්‍රියාසි
නෙත්තෙහි තෙ වාරිගණා සවන්ති,
කිං තෙ නට්ඨං කිම්පන පත්ථයානා
ඉධාගතා නාරි තදිඞ්ඝ බ්‍රූහි.

2571. යමුග්ගතෙජො උරගොති චාහු
නාගොති නං ආහු ජනා ජනින්ද,
තමග්ගහී පුරිසො ජීවිකත්ථො
තං බන්ධනා මුඤ්ච පතී මමෙසො.

2572. කථංචයං බලවිරියූපපන්නො
හත්ථත්ථ මාගඤ්ඡි[1] වණිබ්බකස්ස,
අක්ඛාහි මෙ නාගකඤ්ඤෙ තමත්ථං
කථං විජානෙමු ගහීතනාගං.

2573. නගරම්පි නාගො භස්මං කරෙය්‍ය
තථා හි සො බලවිරියූපපන්නො
ධම්මඤ්ච නාගො අපචායමානො
තස්මා පරක්කම්ම තපො කරොති.

2574. චාතුද්දසිං පණ්ණරසිඤ්ච රාජ
චතුප්පථෙ සම්මති නාගරාජා,
තමග්ගහී පුරිසො ජීවිකත්ථො
තං බන්ධනා මුඤ්ච පතී මමෙසො.

2575. සොළසිත්ථිසහස්සානි ආමුත්තමණිකුණ්ඩලා,
වාරිගෙහසයා[2] නාරී තාපි තං සරණඞ්ගතා.

2576. ධම්මෙන මොචෙහි අසාහසෙන
ගාමෙන නික්ඛෙන ගවං සතෙන,
ඔස්සට්ඨකායො[3] උරගො චරාතු
පුඤ්ඤත්ථිකො මුච්චතු බන්ධනස්මා.

2577. ධම්මෙන මොචෙමි අසාහසෙන
ගාමෙන නික්ඛෙන ගවංසතෙන,
ඔස්සට්ඨකායො උරගො චරාතු
පුඤ්ඤත්ථිකො මුච්චතු බන්ධනස්මා.

2578. දම්මි නික්ඛසතං ලුද්ද ථූලඤ්ච[4] මණිකුණ්ඩලං,
චතුස්සදං[5] ච පල්ලඞ්කං උමාපුප්ඵසිරින්නිභං,

2579. ද්වෙ ච සාදිසියො භරියා උසභඤ්ච ගවං සතං,
ඔස්සට්ඨකායො උරගො චරාතු
පුඤ්ඤත්ථිකො මුච්චතු බන්ධනස්මා.

1. මාගච්ඡි - වි. මජසං. සයා.
2. වාරිගෙහා වි.
3. ඔසට්ඨ - මජසං.
4. ථූලඤ්ච - මජසං සයා.
5. චතුරස්සඤ්ච - මජසං.

2570. එම්බා නාගකන්‍යාව, තෝ විභ්‍රාන්ත සිත් ඇත්තී කිපුණු ඉඳුරන් ඇත්තී වෙහිය. තීගේ ඇස්වලින් කඳුළුධාරාවෝ වැගිරෙත්. තීගේ කවර නම් දෑයක් නටුයේ ද? කවරක් පතමින් මෙහි ආවා ද? එය මට කියනු මැනැවි.

2571. මහරජ, උග්‍රතෙජය් ඇති යමකුට 'උරගය' යි (බඩගා යන්නෙකැයි) කීහු ද? ජනයෝ ඔහුට නාගය යි කීහු. දිවි රැකීම ප්‍රයොජන කොට ඇති පුරුෂයෙක් ඔහු අල්ලා ගත්තේ ය. ඔහු බැඳුමෙන් මුදලව. ඒ මාගේ ස්වාමිපුරුෂයා ය.

2572. එම්බා නාග කන්‍යාවෙනි, බලයෙන් හා වීය්‍ය්‍යෙයෙන් යුක්ත වූ මේ නාග තෙම කෙසේ නම් වණිබ්බකයාගේ අතට පත්වී ද? නාගකන්‍යාවනි, ඒ කරුණ මට කියව. ගන්නා ලද නාගයා ගැන තොරතුරු කෙසේ නම් දනිමු ද?

2573. බලයෙන් හා වීය්‍ය්‍යෙයෙන් යුක්ත වූ නාග තෙම නගරය අළු කරන්නේ ය. නාග තෙම ධර්මය ම ගරු කරන්නේ වේ. එහෙයින් දුක ඉවසා තපස් කරන්නේ ය.

2574. මේ නාරජ තෙම තුදුස්වක්හි ද පසළොස්වක්හි ද සතර මංසන්ධියක්හි පෙහෙව වාසය කරයි. ස්කීය ජීවිකාව ප්‍රයොජන කොට ඇති පුරුෂයෙක් ඔහු අල්ලා ගත්තේ ය. ඔහු බැඳුමෙන් මුදලව. හෙ තෙම මාගේ සැමියා ය.

2575. අමුණන ලද මිණි කොඩොල් ඇති ජලය ම ගෘහශයනය කොට ඇති සොළොස් දහසක් ස්ත්‍රීහු වෙද්ද ඒ ස්ත්‍රීහු ඔහු සරණ ගියාහු ය.

2576 ගම්වර දීමෙන් ද ස්වර්ණනිෂ්ක දීමෙන් ද සිය ගණන් ගවයින් දීමෙන් ද නොසැහැසි - දැහැමිබැවින් මොහු මුදනු මැනැවි. නාග තෙමේ මිදුණු සිරුරැත්තේ සිත්සේ හැසිරේවා, පින් කැමැති නාග තෙමේ බන්ධනයෙන් මිදේවා.

2577. ගම්වර දීමෙන් ද ස්වර්ණ නිෂ්ක දීමෙන් ද සිය ගණන් ගවයන් දීමෙන් ද නො සැහැසිකමින් ම දැහැමින් ම මොහු මුදමි. මිදුණු සිරුරැති නාග තෙම සිත්සේ හැසිරේවා පින් කැමැති නාග තෙමේ බන්ධනයෙන් මිදේවා.

2578-2579. වැදි පුත්‍රය, ස්වර්ණ නිෂ්ක සියයක් ද මහත් වූ මිණි කොඩොලක් ද සිවුපසින් දිය බෙරළිය මල් පැහැති උස පය්‍ය්‍යඞ්ක-යක් ද සමාන ගුණැති භාය්‍ය්‍යාවන් දෙදෙනකුන් ද ගවයන් සියයක් සහිත වෘෂභයකු ද දෙමි. මිදුණු සිරුරැති නාග තෙමේ සිත්සේ හැසිරේවා, පින් කැමැති නාග තෙමේ බැඳුමෙන් මිදේවා.

2580. විනාපි දනා තව වචනං ජනින්ද
මුඤ්චෙමු නං උරගං බන්ධනස්මා,
ඔස්සට්ඨකායො උරගො චරාතු
පුඤ්ඤත්ථිකො මුච්චතු බන්ධනස්මා.

2581. මුත්තො චම්පෙය්‍යකො නාගො රාජානං එතදබ්‍රවි,
නමො තෙ කාසිරාජත්ථු නමො තෙ කාසිවඩ්ඪන
අඤ්ජලිං තෙ පග්ගණ්හාමි පස්සෙය්‍යමෙ නිවෙසනං.

2582. අද්ධා හි දුබ්බිස්සසමෙතමාහු
යං මානුසො විස්සසෙ අමානුසම්හි,
සචෙච මං යාචසි එතමත්ථං
දක්ඛෙමු තෙ නාග නිවෙසනානි.

2583. සචෙහි වාතො ගිරිමාවහෙය්‍ය
චන්දො ච සුරියො ච ඡමාපතෙය්‍යුං,
සබ්බා ච නජ්ජො පටිසොතං වහෙය්‍යුං
න ත්වෙවහං රාජ මුසා භණෙය්‍යං.

2584. නභං ඵලෙය්‍ය උදධීපි සුස්සෙ
සංවට්ටයං භූතධරා වසුන්ධරා,
සිලුච්චයො මෙරු සමූලමුබ්බහෙ
නත්වෙවහං රාජ මුසා භණෙය්‍යං.

2585. අද්ධා හි දුබ්බිස්සසමෙතමාහු
යං මානුසො විස්සසෙ අමානුසම්හි,
සචෙ ච මං යාචසි එතමත්ථං
දක්ඛෙමු තෙ නාග නිවෙසනානි.

2586. තුම්හෙ ඛොත්ථ ඝොරවිසා උළාරා
මහාතෙජා ඛිප්පකොපී ච හොථ,
මම කාරණා[1] බන්ධනස්මා පමුත්තො
අරහසි නො ජානිතායෙ[2] කතානි.

2587. සො පච්චතං නිරයෙ ඝොරරූපෙ
මා කායිකං සාතමලත්ථ කිඤ්චි,
පෙළාය බද්ධො මරණං උපෙතු
යො තාදිසං කම්ම කතං න ජානෙ.

2588. සච්චප්පටිඤ්ඤා තව මෙස හොතු
අක්කොධනො[3] හොහි අනුපනාහී,
සබ්බඤ්ච තෙ නාගකුලං සුපණ්ණා
අග්ගිංව ගිම්හාසු විවජ්ජයන්තු.

1. මං කාරණා – මජසං.
2. ජානිතුයෙ – මජසං. සයා, ජානිතවෙ. නා. ජානිතයෙ.
3. අකොධනො – මජසං.

2580. මහරජාණන් වහන්ස, මේ වස්තු දීමෙන් තොරව ද මුබවහන්සේගේ වචනය ගරු කොට ඒ නාගයා බැඳුමෙන් මුදමු. මිදුණු සිරුරැති නා තෙමේ සිත්සේ හැසිරේවා! පින් කැමැති නාග තෙමේ බැඳුමෙන් මිදේවා.

2581. බැඳුමෙන් මිදුණු චම්පෙය්‍යක නාග තෙමේ රජුට මෙසේ කීයේ ය. කසීරට මහරජ, නුඹවහන්සේට නමස්කාර වේවා, කසීරට දියුණු කරන මහරජාණන් වහන්ස, නුඹවහන්සේට නමස්කාර වේවා, මාගේ නාග භවනය දකුම්කලුය. එය සපිරිවරින් අවුත් බලන මෙන් ආරාධනා කොට නුඹවහන්සේට ඇඳිලි බඳිමි යි නාරජ තෙම කීයේ ය.

2582. පින්වත් නාරජ, මනුෂ්‍යයෙක් තෙම අමනුෂ්‍යයකු කෙරෙහි විශ්වාසය තබන්නේ ය යන යමක් වේ නම් එය එකාන්තයෙන් ම විශ්වාස නො කොට හැක්කකැ යි කියත්. ඉදින් මේ ගැන මට යාච්ඤා කරන්නෙහි නම්. නුඹගේ නාග භවනයත් දක්නෙමු යි රජ තෙම කීයේ ය.

2583. මහරජ ඉදින් (වනාහි) වාතය තෙම පර්වතයක් ගසාගෙන යන්නේ නමුදු සඳ හිරු දෙදෙනා බිමැ වැටෙන්නාහු නමුදු හැම නදීහු ම උඩුගං බලා යෙත් නමුදු මම බොරු නො කියමි යි බෝසත් තෙමේ කීයේ ය.

2584. අහස පැළෙන්නේ නමුත් මුහුද වියැළෙන්නේ නමුත් භූතයන් දරා සිටින්නා වූ පෘථිවි තොමෝ හැකිළෙන්නී නමුත් පර්වතයන් අතුරෙන් උස් වූ මහමෙර සහමුලින් ඉදිරෙන්නේ නමුත් මහරජ මම බොරුවක් නම් නො කියමි යි බෝසත් තෙම කීයේ ය.

2585. එම්බා නාරජ, මනුෂ්‍යයෙක් තෙම අමනුෂ්‍යයකු කෙරෙහි විශ්වාසය තබන්නේ ය යන යමක් වේ නම් එය එකාන්තයෙන් ම විශ්වාස නො කොට හැක්කකැ යි කියත්, ඉදින් මේ ගැන මට යාච්ඤා කරන්නෙහි නම් නුඹගේ නා විමන් දකිමු යි රජ තෙම කීයේ ය.

2586. නාරජ, තෙපි වනාහි මහත් වූ දරුණු විෂ ඇති මහාතේජස් ඇති වහා කිපෙන සුල්ලෝ ද වන්නහු ය. මා නිසා බන්ධනයෙන් මිදුණේ මා කළ උපකාර දැනගන්නට වටනෙහි ය.

2587. යමෙක් කරනලද එබඳු උපකාර නො දන්නේ නම් හෙ තෙමේ භයානක දුක් ඇති නිරයයෙහි පැසේවා, කිසියම් කායික සුවයක් නොලබාවා! පැසෙහි බැඳුණේ මරණයට යේවා, (මෙසේ කියා නාරජ තෙම දිවුලේ ය.)

2588. පින්වත් නා රජ, නුඹගේ මේ ප්‍රතිඥාව සත්‍ය ප්‍රතිඥාවක් වේවා නුඹ ක්‍රොධ නො කරන්නෙක් වෙහිවා, බද්ධ වෛර නැත්තෙක් වෙහිවා, නුඹගේ මුළු නාකුලය ම සුපර්ණයෝ ග්‍රීෂ්මකාලයෙහි ගින්න මෙන් දුරු කෙරෙත්වා.

2589. අනුකම්පසි නාගකුලං ජනින්ද
මාතා යථා සුප්පියං එකපුත්තං,
අහං ච තෙ නාගකුලෙන සද්ධිං
කාහාමි වෙය්‍යාවටිකං උළාරං.

2590. යොජෙන්තු වෙ රාජරථෙ සුචිත්තෙ
කම්බොජකෙ අස්සතරෙ සුදන්තෙ,
නාගෙ ච යොජෙන්තු සුවණ්ණකප්පනෙ
දක්ඛෙමු නාගස්ස නිවෙසනානි.

2591. භෙරී මුදිඞ්ගා පණවා ච සඞ්ඛා
ආවජ්ජිසුං[1] උග්ගසෙනස්ස රඤ්ඤො,
පායාසි රාජා බහුසොභමානො
පුරක්ඛතො නාරිගණස්ස මජ්ඣෙ.

2592. සුවණ්ණචිතකං[2] භූමිං අද්දක්ඛි[3] කාසිවද්ධනො,
සොවණ්ණමයෙ ච පාසාදෙ වෙළුරියඵලකත්ථතෙ.

2593. ස රාජා පාවිසි ව්‍යම්හං චම්පෙය්‍යස්ස නිවෙසනං,
[4]ආදිච්චවණ්ණූපනිභං කංසවිජ්ජුපභස්සරං.

2594. නානාරුක්ඛෙහි සඤ්ඡන්නං නානාගන්ධසමෙරිතං[5],
සො පාවෙක්ඛි කාසිරාජා චම්පෙය්‍යස්ස නිවෙසනං.

2595. පවිට්ඨම්හි[6] කාසිරඤ්ඤෙ චම්පෙය්‍යස්ස නිවෙසනං,
දිබ්බා තුරියා වජ්ජිංසු[7] නාගකඤ්ඤා ච නච්චිසුං.

2596. තං නාගකඤ්ඤා චරිතං ගණෙන
අන්වාරුහී කාසිරාජා පසන්නො,
නිසීදි සොවණ්ණමයම්හි පීඨෙ
සාපස්සයෙ චන්දනසාරලිත්තෙ.

2597. සො තත්ථ භුත්වා ච අථො රමිත්වා
චම්පෙය්‍යකං කාසිරාජා අවොච,
විමානසෙට්ඨානි ඉමානි තුය්හං
ආදිච්චවණ්ණානි පභස්සරානි.
නෙතාදිසං අත්ථි මනුස්සලොකෙ
කිම්පත්ථියං නාග තපො කරොසි.

---

1. ආවජ්ජයිංසු - මජසං. සයා. අවජ්ජයිංසු. පී. අවජ්ජංසු.
2. චිත්තකං - මජසං. සයා.
3. අද්දක්ඛී - මජසං.
4. ආදිච්චවණ්ණසන්නිභං - මජසං. සයා.
5. සමීරිතං - මජසං.
6. පවිට්ඨස්මිං - මජසං. සයා.
7. පවජ්ජිංසු - මජසං. සයා.

2589. මහරජාණන් වහන්ස, නුඹ වහන්සේ ඉතා ප්‍රිය එකම පුතකු ගැන අනුකම්පා කරන මවක මෙන් නාකුලයට අනුකම්පා කරන්නහු ය. මම ද නාකුලය සමග නුඹවහන්සේට බොහෝ වතාවත් කරමි යි නා රජ කීයේ ය.

2590. මනා කොට විසිතුරු කරනලද රාජරථයෙහි ඉතා දමුණු කාම්බොජ අශ්වතරයන් යොදත්වා. රනින් සැරසුවා වූ ඇතුන් ද යොදත්වා, නාගයාගේ විමානයන් දකිමු යි රජ තෙම කීයේ ය.

2591. උග්‍රසෙන රජුගේ මහබෙර ද මිහිඟුබෙර ද පණාබෙර ද හක් ද වාදනය කළාහු ය. පිරිවරනලද ස්ත්‍රී සමූහයා මැද උග්‍රසෙන රජ ඉතා හොබනේ ගියේයයි වදළසේක.

2592. කසීරට දියුණු කරන රජ තෙමේ රන්වැලි අතුළ බිම ද වෛඩූර්‍ය්‍ය පුවරු අතුළ රන්මුවා ප්‍රාසාද ද දුටුවේ ය.

2593. සූර්‍ය්‍යයාගේ වර්ණයට බඳු වූ රන්වන් විදුලිය සේ පැහැ විහිදෙන චම්පෙය්‍ය නාගයාගේ විමානයට ඒ උග්‍රසෙන රජ තෙම පිවිසියේ ය.

2594. ඒ කසීරජ තෙම නොයෙක් ගසින් ගැවසුණු නොයෙක් සුවඳින් සුවඳ කවනලද චම්පෙය්‍ය නාගයාගේ විමානය දක්කේ ය.

2595. කසීරජ චම්පෙය්‍ය නාගයාගේ නිවසට පිවිසි කල්හි දිව්‍යමය තූර්‍ය්‍ය වාදනය කළහ. නාගකන්‍යාවෝ නැටූහ.

2596. නාගකන්‍යා සමූහයා විසින් හැසිරෙන ලද ඒ විමානයට පහන් සිත් ඇති කසීරජ තෙම නැඟුණේ ය. සඳුන් කල්ක ගල්වන ලද හේත්තුවන පුවරු සහිත ස්වර්ණමය පුටුවෙහි හිඳගත්තේ ය.

2597. ඒ කසීරජ තෙම එහි අනුභව කොට නැවත සිත් අලවා වැස චම්පෙය්‍යක නාගයාහට මෙසේ කීයේ ය. නුඹගේ මේ සූර්‍ය්‍ය-යාට බඳු වර්ණ ඇති පැහැ විහිදෙන උතුම් විමානයෝ වෙති. මිනිස් ලොවැ මෙබන්දක් නැත. නාගය කුමක් බලාපොරොත්තු-වෙන් තපස් කරහි ද?

2598. තා කම්බුකෙයූරධරා සුවත්ථා
වට්ටඞ්ගුලී තම්බතලූපපන්නා,
පග්ගය්හ පායෙන්ති අනොමවණ්ණා
නෙතාදිසං අත්ථි මනුස්සලොකෙ
කිමත්ථියං නාග තපො කරොසි.

2599. නජ්ජො ච තෙමා පුථුලොමමච්ඡා
ආටා[1] සකුන්තාභිරුදා සුතිත්ථා,
නෙතාදිසං අත්ථි මනුස්සලොකෙ
කිමත්ථියං නාග තපො කරොසි.

2600. කොඤ්චා මයූරා දිවියා ච හංසා
වග්ගුස්සරා කොකිලා සම්පතන්ති,
නෙතාදිසං අත්ථි මනුස්සලොකෙ
කිමත්ථියං නාග තපො කරොසි.

2601. අම්බා ච සාලා තිලකා ච ජම්බුයො
උද්දලකා පාටලියො ච ඵුල්ලා,
නෙතාදිසං අත්ථි මනුස්සලොකෙ
කිමත්ථියං නාග තපො කරොසි.

2602. ඉමා ච තෙ පොක්ඛරඤ්ඤො සමන්තතො
දිව්‍යා ච[2] ගන්ධා සතතං සම්පතන්ති,
නෙතාදිසං අත්ථි මනුස්සලොකෙ
කිමත්ථියං නාග තපො කරොසි.

2603. න පුත්තහෙතු න ධනස්ස හෙතු
න ආයුනො චාපි ජනින්ද හෙතු,
මනුස්සයොනිං අභිපත්ථයානො
තස්මා පරක්කම්ම තපො කරොමි.

2604. ත්වං ලොහිතක්ඛො විහතන්තරංසො
අලඞ්කතො කප්පිතකෙසමස්සු,
සුරොසිතො ලොහිතචන්දනෙන
ගන්ධබ්බරාජාව දිසා පභාසසි.

2605. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
සබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතො,
පුච්ඡාමි තං නාගරාජෙතමත්ථං
සෙය්‍යො ඉතො කෙන මනුස්සලොකො.

1. ආද - වි. මජසං.
2. දිබ්බා සයා. දිබ්‍යා - මජසං.

2598. රන් අබරණ දරන්නා වූ මනාකොට හඳනා ලද වස්ත්‍ර ඇති වට ඇඟිලි ඇති තඹවන් අතුල් පතුල් වලින් යුක්ත වූ අලාමක වූ පැහැසටහන් ඇති ඒ නාගකන්‍යාවෝ දිව්‍යපානය ගෙනවුත් පොවති. මිනිස් ලොව මෙවැන්නක් නැත. නාගය, කුමක් බලාපොරොත්තුවෙන් තපස් කරහි ද?

2599. පුළුල් වරලින් යුත් මසුන් ඇති උකුසු පක්ෂීන් විසින් පවත්වන ලද නාද ඇති මනා තොටුපලින් යුත් ඒ මේ ගංගාවෝ ද ඇත්තාහ. මිනිස් ලොව එබන්දක් නැත. නාගය කුමක් බලාපොරොත්තුවෙන් තපස් කරහි ද?

2600. කොස්ළිහිණියෝ ද මොනරු ද දිව්‍ය හංසයෝ ද මිහිරි නාද පවත්වන කොවුලෝ ද ගසින් ගසට මාරුවෙති. මිනිස් ලොවැ මෙබන්දක් නැත. නාගය කුමක් බලාපොරොත්තුවෙන් තපස් කරහි ද?

2601. එම්බා නාගරාජය, පිපීගිය අඹ ද සල් ද එරහැන්ද ද දඹ ද ඇසළ ද පළොල් ද ඇත්තාහ. මිනිස් ලොව මෙබන්දක් නැත. නාගය කුමක් බලාපොරොත්තුවෙන් තපස් කරහි ද?

2602. එම්බා නාරජ' මේ පොකුණු හාත්පසැ නිතර දිව්‍යමය වූ සුවඳ හමයි. මිනිස් ලොව මෙබන්දක් නැත. නාගය කුමක් බලාපොරොත්තුවෙන් තපස් කරහි ද?

2603. මහරජ, මම පුත්‍රයන් හෙතු කොට ගෙන පෙහෙවස් නො රකිමි, ධනය හෙතුකොට ගෙන ද නො රකිමි, ආයුෂ හෙතු කොට ගෙන ද නො රකිමි, මිනිස් ලොව උත්පත්තිය පතමි· එහෙයින් වීය්‍යීය වඩා තපස් රකිමි යි නාරජ කීයේ ය.

2604. එම්බා මහරජ, නුඹ වහන්සේ ලේවන් ඇස් ඇත්තේ නසන ලද අන්තරාය ඇති සරසන ලද්දේ කපන ලද කෙස් රවුළු ඇති රත්සඳුනෙන් සුවඳ ගල්වන ලද්දේ ගාන්ධර්ව රාජයකු මෙන් දිශාවන් බබුළුවන්නෙහි ය.

2605. නාගරාජය. නුඹ සියලු කාමසම්පත්න් යුක්ත වූයෙහි මහානුභාව සම්පන්න වූයෙහි දිව්‍යමය සෘද්ධියට පැමිණියෙහි ය. මේ කාරණය නුඹ අතින් විචාරමි. කවර හෙයින් මිනිස් ලොව මීට වඩා ශ්‍රෙෂ්ඨ ද?

2606. ජනින්ද නාඤ්ඤත්‍ර මනුස්සලොකා
සුද්ධී ච සංවිජ්ජති සංයමො ච,
අහඤ්හි ලද්ධාන මනුස්සයොනිං
කාහාමි ජාතිමරණස්ස අන්තං.

2607. අද්ධා හවෙ සෙවිතබ්බා සපඤ්ඤා
බහුස්සුතා යෙ බහුඨානචින්තිනො,
නාරියො ච දිස්වාන තවං ච නාග
කාහාමි පුඤ්ඤානි අනප්පකානි.

2608. අද්ධා හවෙ සෙවිතබ්බා සපඤ්ඤා
බහුස්සුතා යෙ බහුඨානචින්තිනො,
නාරියො ච දිස්වාන මමඤ්ච රාජ
කරොහි පුඤ්ඤානි අනප්පකානි.

2609. ඉදඤ්ච මෙ ජාතරූපං පහූතං[1]
රාසී සුවණ්ණස්ස ච තාලමත්තා,
ඉතො හරිත්වා[2] සොවණ්ණඝරානි[3] කාරය
රූපියස්ස ච පාකාරං කරොන්තු.

2610. මුත්තානඤ්ච[4] වාහසහස්සානි පඤ්ච
වෙළුරියමිස්සානි ඉතො හරිත්වා,
අන්තෙපුරෙ භූමියං සන්ථරන්තු
නික්කද්දමා හොහිති[5] නීරජා ච.

2611. එතාදිසං ආවස රාජසෙට්ඨ
විමානසෙට්ඨං බහුසොභමානං,
බාරාණසිං[6] නගරං ඉද්ධඵීතං
රජ්ජඤ්ච කාරෙහි අනොමපඤ්ඤාති.

චම්පෙය්‍ය ජාතකං.

11. පලොභනජාතකං

2612. බ්‍රහ්මලොකා චවිත්වාන දෙවපුත්තො මහිද්ධිකො,
රඤ්ඤො පුත්තො උදපාදි සබ්බකාමසමිද්ධිසු.

2613. කාමා වා කාමසඤ්ඤා වා බ්‍රහ්මලොකෙ න විජ්ජති,
ස්වාස්ස[7] තායෙව සඤ්ඤාය කාමෙහි විජිගුච්ඡථ.

---

1. බහුතං - මජසං.
2. හරිත්වාන - මජසං.
3. සුවණ්ණ - මජසං.
4. මුත්තානීච - වි. මජසං.
5. හෙහිති මජසං. ස්‍යා.
6. බාරානසී නගරං - මජසං.
7. ස්වාස්ස. නා ස්වාස්සු - වි. මජසං.

2606. මහරජ, මිනිස් ලොවින් වෙන් ව නිර්වාණ ශුද්ධියක් හෝ සීලසංයමයක් හෝ නැත්තේ ය. මම ද මිනිස් උපත ලබා ජාතිමරණයන් කෙළවර කරමි යි සිතා තපස් කරමි යි නාරජ කීවේ ය.

2607. නාගරාජය, යම් කෙනෙක් බොහෝ කරුණු සිතන්නාහු බහුශ්‍රැත වෙද්ද, නුවණැති ඔවුහු සෙවනය කටයුත්තාහ. නුඹ ද නාග කන්‍යාවරුන් ද දක බොහෝ පින් කරමි යි රජ ප්‍රකාශ කෙළේ ය.

2608. මහරජ, යම් කෙනෙක් බොහෝ කරුණු සිතන්නාහු බහුශ්‍රැත වෙද්ද, නුවණැති ඔවුහු සෙවනය කටයුත්තාහ. මා ද නාග කන්‍යාවරුන් ද දක බොහෝ පින් කරව යි නාරජ තෙම උග්‍රසෙන රජුට කීවේ ය.

2609. මහරජ, මාගේ මේ බොහෝ වූ රන් ඇත. තල්ගස් පමණ ස්වර්ණ රාශීහු ද ඇත්තාහ. මෙයින් රන් ගෙන ගොස් ස්වර්ණ ගෘහ කරව. රිදියෙන් පවුරක් ද කරව.

2610. වෛඩූර්‍ය්‍ය මිශ්‍ර වූ මුතු ගැල් පන්දහසක් මෙයින් ගෙන ගොස් අන්තඃපුර භූමියෙහි අතුරත්වා, භූමි තොමෝ මඩ නැත්තී රජස් විරහිත වන්නී ය.

2611. රාජශ්‍රෙෂ්ඨය, ඉතා හොබනා වූ මෙබඳු උතුම් විමාන-යෙක්හි වාසය කරව. අලාමක වූ නුවණැත්ත, සමෘද්ධියෙන් පිරීගිය බරණැස් නුවර රාජ්‍යය ද කරව යි නාරජ තෙම කීයේ ය.

චම්පෙය්‍ය ජාතක යි.

11. මහා පලොභන ජාතකය

2612. මහත් සෘද්ධි ඇති දෙව් පුතෙක් බඹ ලොවින් සැව සියලු කාමසම්පතින් සමෘද්ධ වූ කසී දනව්වෙහි රජුහට පුත් ව උපන්නේ ය.

2613. යම් කුමාරයෙක් බඹලොව දී හටගත් කාම විරහිත එම සංඥයෙන් ම කාමයන් කෙරෙන් පිළිකුල් ඇති කරයි ද, බඹලෙව්හි ඒ කාමයෝ හෝ කාමසංඥාවෝ හෝ විද්‍යමාන නො වෙති.

2614. තස්ස චන්තෙපුරෙ ආසි ඣානාගාරං සුමාපිතං,
සො තත්ථ පතිසල්ලීනො එකො රහසි ඣායථ.

2615. ස රාජා පරිදෙවෙසි පුත්තසොකෙන අට්ටිතො,
එකපුත්තො චයං මය්හං න ච කාමානි භුඤ්ජති.

2616. කොනු ඛ්වෙත්ථ[1] උපායො සො[2] කො වා ජානාති කිඤ්චනං,
කො මෙ පුත්තං පලොභෙය්‍ය යථා කාමානි පත්ථයෙ.

2617. අහු කුමාරී තත්ථෙව රූපවණ්ණ[3]සමාහිතා,
කුසලා නච්චගීතස්ස වාදිතෙ ච පදක්ඛිණා
සා තත්ථ උපසඞ්කම්ම රාජානං එතදබ්‍රවි.

2618. අහං ඛො තං පලොභෙය්‍යං සචෙ භත්තා භවිස්සති,
තං තථාවාදිනිං රාජා කුමාරිං එතදබ්‍රවි.
ත්වඤ්ඤෙව නං පලොභෙහි තව භත්තා භවිස්සති.

2619. සා ච අන්තෙපුරං ගන්ත්වා බහු කාමූපසංහිතං,
හදයඞ්ගමා පෙමණීයා චිත්‍රගාථා[4] අභාසථ.

2620. තස්සා ච ගායමානාය සද්දං සුත්වාන නාරියා,
කාමච්ඡන්දස්ස උප්පජ්ජි ජනං සො පරිපුච්ඡථ.

2621. කස්සෙසො සද්දො කො වා සො භණති උච්චාවචං බහු,
හදයඞ්ගමං පෙමණීයං අහො කණ්ණසුඛං මම.

2622. එසා ඛො පමදා දෙව ඛිඩ්ඩා එසා අනප්පිකා,
සචෙ ත්වං කාමෙ භුඤ්ජෙය්‍ය භිය්‍යො භිය්‍යො ඡාදෙයසු තං.

2623. ඉඞ්ඝ ආගච්ඡතොරෙන අවිදූරම්හි ගායතු,
අස්සමස්ස සමීපම්හි සන්තිකෙ මය්හ ගායතු.

2624. තිරොකුඩ්ඩම්හි ගායිත්වා ඣානාගාරම්හි පාවිසි,
බන්ධි[5] නං අනුපුබ්බෙන ආරඤ්ඤමිව කුඤ්ජරං.

2625. තස්ස කාමරසං ඤත්වා ඉස්සාධම්මො අජායථ,
අහමෙව කාමෙ භුඤ්ජෙය්‍යං මා අඤ්ඤො පුරිසො අහු.

---

1. ඛෙවත්ථ.
2. යො – මජසං. සයා.
3. වණ්ණ රූප – වි, මජසං.
4. චිත්‍රා – මජසං, සයා.
5. බන්ධිතුං – මජසං.

2614. ඔහුගේ අන්තඃපුරයෙහි පියා විසින් කරවනලද ධ්‍යානාගාරයෙක් විය. හෙතෙමේ එහි විවේකයෙහි ඇළුණේ තනි ව රහසිගත ව ධ්‍යාන කෙළේ ය.

2615. පුත්‍රශොකයෙන් පෙළුණු ඒ රජ තෙම මාගේ එක ම පුත්‍රයා කාමසම්පත් පරිභොග නො කෙරේ යයි වැළපුණේ ය.

2616. මෙහිලා කවර නම් උපායෙක් ඇත්තේ ද? එයට පළිබොධයක් කවරෙක් නම් දනී ද? යම්සේ මාගේ පුත්‍රයා කාමසම්පත් ප්‍රාර්ථනා කෙරේ නම් එසේ කවරෙක් නම් පොළඹවා ද?

2617. රූපයෙන් හා වර්ණයෙන් යුත් නෘත්‍යගීතයන්හි දක්ෂ වාදනයෙහි ද සමත් කුමරියක් ඒ අන්තඃපුරයෙහි ම වූ යැ. ඕ එහි එළැඹ රජුට මෙසේ කීවා ය.

2618. හෙ තෙමේ මට සැමි වන්නේ නම් මම ඔහු පොළඹවන්නෙමි. (ඈය කී විට) රජ තෙම එසේ කියන්නා වූ ඒ කුමරියට මෙසේ කීයේ ය. තෝ ඒ කුමරා පොළඹවා ගනුව, තට හේ සැමි වන්නේ ය කියායි.

2619. ඕ ද ඒ අන්තඃපුරයට ගොස් කාමූපසංහිත වූ ත් හෘදයංගම වූ ත් ප්‍රේමණීය වූ ත් බොහෝ විචිත්‍රුරු ගාථාවන් කිවු ය.

2620. ගායනා කරන ඒ ස්ත්‍රියගේ හඬ අසා ඒ කුමාරයාට කාමාසාව උපන්නේ ය. හෙ තෙමේ ජනයා අතින් විචාළේ ය.

2621. මේ හඬ කවරකුගේ ද? ඒ කවරෙක් නම් හෘදයංගමව ප්‍රෙමණීය ව කර්ණසුඛ ව උස් පහත් හඬින් බොහෝ කොට බෙණේ ද කියා (අනිත්ථිගන්ධ) කුමාර තෙම ඇසී ය.

2622. දේවයන් වහන්ස, මේ තොමෝ ස්ත්‍රියක, මේ තොමෝ මහත් වූ ක්‍රීඩිකාවක, ඉදින් නුඹ වහන්සේ කාමසම්පත් අනුභව කරන්නහු නම්, ඊට වැඩිවැඩියක් කැමතිවන්නහු ය.

2623. එසේ නම් මොබට ඒවා, නුදුරු තන්හි ගායනා කෙරේවා, ශයනාගාරයට සමීප ව මාගේ සමීපයෙහි ගායනා කෙරේවා.

2624. බිත්තියෙන් පිටත්හි ගායනය කොට ධ්‍යානාගාරයට පිවිසියා ය. කැලේ ඇතකු මෙන් ක්‍රමයෙන් ඕ ඔහු බැඳගත්තා ය.

2625. ඒ කුමාරයාට කාමරසය දැනී ඊර්ෂ්‍යා ස්වභාවයෙක් හටගත්තේ ය. මම ම කාමයන් අනුභව කරමි. කම්සැප විඳින අන් පුරුෂයෙක් නො වේවා කියා යි.

2626. තතො අසිං ගහෙත්වාන පුරිසෙ හන්තුං උපක්කමි,
අහමෙව එකො භුඤ්ජිස්සං මා අඤ්ඤො පුරිසො සියා.

2627. තතො ජානපදා සබ්බෙ විකන්දිංසු සමාගතා,
පුත්තො ත්‍යායං මහාරාජ ජනං හෙඨෙත්‍යදූසකං.

2628. තඤ්ච රාජා විවාහෙසි සම්හා රට්ඨාතො ඛත්තියො,
යාවතා විජිතං මය්හං න තෙ වත්තබ්බ[1] තාවදෙ.

2629. තතො සො භරියං ආදාය සමුද්දං උපසඞ්කමි,
පණ්ණසාලං කරිත්වාන වනං උඤ්ඡාය[2] පාවිසි.

2630. අථෙත්ථ ඉසිමාගඤ්ඡි සමුද්දං උපරූපරි,
සො තස්ස ගෙහං පාවෙක්ඛි භත්තකාලෙ උපට්ඨිතෙ.

2631. තඤ්ච භරියා පලොභෙසි පස්ස යාව සුදාරුණං,
චුතො සො බ්‍රහ්මචරියම්හා ඉද්ධියා පරිහායථ.

2632. රාජපුත්තො ච උඤ්ඡාතො වනමූලඵලං බහුං,
සායං කාජෙන ආදාය අස්සමං උපසඞ්කමි.

2633. ඉසී ච ඛත්තියං දිස්වා සමුද්දං උපසඞ්කමි,
වෙහායසං ගමිස්සන්ති සීදතෙ සො මහණ්ණවෙ.

2634. ඛත්තියො ච ඉසිං දිස්වා සීදමානං මහණ්ණවෙ,
තස්සෙව අනුකම්පාය ඉමා ගාථා අභාසථ.

2635. අභිජ්ජමානෙ වාරිස්මිං සයං ආගම්ම ඉද්ධියා,
මිස්සීභාවිත්ථියා ගන්ත්වා සංසීදසි මහණ්ණවෙ.

2636. ආවට්ටනී මහාමායා බ්‍රහ්මචරියවිකොපනා,
සීදන්ති නං විදිත්වාන ආරකා පරිවජ්ජයෙ.

2637. අනලා මුදුසම්භාසා දුප්පූරා තා නදීසමා,
සීදන්ති නං විදිත්වාන ආරකා පරිවජ්ජයෙ.

1. වත්තබ්බං - මජසං.
2. වනමුඤ්ඡාය - වි. මජසං.

2626. ඉක්බිති කඩුවක් ගෙන පුරුෂයන් මරන්නට පටන් ගත්තේ ය. මම ම තනිවැ කම්සුව අනුභව කරමි. අන් පුරුෂයෙක් නො වේවා කියා යි.

2627. ඉක්බිති දනව්වැසි සියල්ලෝ ම රැස්ව "මහරජුනි, නුඹ වහන්සේගේ මේ පුත්‍රයා නිරපරාධ ජනයා නසති" යි වැළැපෙමින් කියා සිටියහ.

2628. රජ තෙමේ ද ඔහු "මාගේ රට යම්තාක් වේ ද ඒ තාක් තැන නොසිටිය යුතුය" යි සිය රටින් බැහැර කෙළේ ය.

2629. ඉක්බිති ඒ කුමර තෙම බිරිය ගෙන මුහුදු වෙරළට එළැඹියේ ය. එහි පන්සලක් කොට වසන්නේ පලවැළ පිණිස වනයට ද පිවිසියේ ය.

2630. එකල්හි ඍෂිවරයෙක් දීපාන්තරයෙහි සිට මුහුදු දිය මතුයෙහි එහි පැමිණියේ ය. හෙතෙමේ ආහාර වේලාව පැමිණි කල්හි ඔහුගේ ගෙට ඇතුළු විය.

2631. භාර්‍ය්‍යා තොමෝ ඒ තවුසා ද පොළඹවා ගත්තා ය. ඇයගේ ඉතා දරුණුකමක් බලව. හේ බඹසරින් චුතවූයේ ඍද්ධි-යෙන් ද පිරිහුණේ ය.

2632. රාජපුත්‍ර තෙමේ ද සිහීමෙන් ලත් බොහෝ වනමුල් ඵලාඵල සවස් කාලයෙහි කදින්ගෙන ආශ්‍රමයට එළැඹියේ ය.

2633. ඍෂිතෙමේ ද ක්‍ෂත්‍රියයා දැක සමුද්‍රයකරා පැමිණියේ යැ. හෙ අහසෙහි යන්නෙමැ යි මහමුහුදෙහි ම ගිලෙයි.

2634. ක්‍ෂත්‍රිය තෙමේ ද මහසයුරෙහි ගිලෙන ඍෂිහු දැක ඔහුට ම අනුකම්පා පිණිස මේ ගාථාවන් කීයේ ය.

2635. තෙමේ, නොබිඳෙන දිය මතුපිට ඍද්ධියෙන් අවුත් ස්ත්‍රිය හා එක්වීමට පැමිණ මහසයුරෙහි ගිලෙහි ය.

2636. මේ ස්ත්‍රීහු නම් කාමාවර්තයෙන් ආවර්තනය කරන හෙයින් ආවර්තනීයහ. මහත් වූ මායා ඇත්තාහ. බ්‍රහ්මචර්‍ය්‍ය විනාශ කිරී-මෙන් පුරුෂයන් අපායෙහි ගල්වන්නාහ. මෙය දැන නුවණැති පුරුෂ තෙමේ ස්ත්‍රීන් දුරින් ම දුරුකරන්නේ ය.

2637. කොතෙක් පිරිමින් ලදුවත් සෑහීමකට පත් නොවන හෙයින් අනලා නම් වූ මොළොක් කථා ඇති තෘප්ත නො කට හැක්කා වූ ගංගාවන් හා සමාන වන්නා වූ ඒ ස්ත්‍රීහු තමන් වෙත පැමිණියවුන් අපායයෙහි ගල්වති යි දැන නුවණැත්තන් විසින් දුරින් ම දුරුකට යුත්තාහු ය.

2638. යං එතා උපසෙවන්ති ඡන්දසා වා ධනෙන වා,
ජාතවෙදෙව සණ්ඨානං ඛිප්පං අනුදහන්ති තං.

2639. ඛත්තියස්ස වචො සුත්වා ඉසිස්ස නිබ්බිද අහු,
ලද්ධා පොරාණකං මග්ගං ගච්ඡතෙ සො විහායසං.

2640. ඛත්තියො ච ඉසිං දිස්වා ගච්ඡමානං විහායසං,
සංවෙගං අලභී ධීරො පබ්බජ්ජං සමරොචයි.

2641. තතො සො පබ්බජිත්වාන කාමරාගං විරාජයි,
කාමරාගං විරාජෙත්වා බ්‍රහ්මලොකූපගො අහූති.

මහාපලොභන ජාතකං.

12. පඤ්චපණ්ඩිතපඤ්හා

2642. පඤ්ච පණ්ඩිතා සමාගතා
පඤ්හා මෙ පටිභාති තං සුණාථ,
නින්දියමත්ථං පසංසියං වා,
කස්සෙවාවිකරෙය්‍ය ගුය්හමත්ථං.

2643. ත්වං නො ආවිකරොහි භූමිපාල
භත්තා භාරසහො තුවං වදෙතං.
තව ඡන්දඤ්ච රුචිඤ්ච සම්මසිත්වා
අථ වක්ඛන්ති ජනින්ද පඤ්ච ධීරා.

2644. යා සීලවතී අනඤ්ඤධෙය්‍යා
භත්තුච්ඡන්දවසානුගා මනාපා,
නින්දියමත්ථං පසංසියං වා
භරියායාවිකරෙය්‍ය ගුය්හමත්ථං.

2645. යො කිච්ඡගතස්ස ආතුරස්ස
සරණං හොති ගතී පරායණඤ්ච,
නින්දියමත්ථං පසංසියං වා
සඛිනොවාවිකරෙය්‍ය ගුය්හමත්ථං.

2646. ජෙට්ඨො අථ මජ්ඣිමො කණිට්ඨො
සො චෙ සීලවතො සමාහිතො ඨිතත්තො,
නින්දියමත්ථං පසංසියං වා
භාතුවාවිකරෙය්‍ය ගුය්හමත්ථං.

2638. මේ ස්ත්‍රීහු සිය කැමැත්තෙන් හෝ ධනය හෙතුකොට හෝ යම් පුරුෂයකු සෙවනය කෙරෙද්ද ස්වකීය ස්ථානය දවන්නා වූ ගින්න මෙන් වහා ඒ සෙවනය කළහු දවත්.

2639. ක්‍ෂත්‍රියයාගේ වචනය අසා ඍෂිවරයාහට කලකිරීම ඇති විය. හෙතෙමේ පැරණි ධ්‍යාන මාර්ගය ලැබ අහසින් යයි.

2640. ක්‍ෂත්‍රිය තෙමේ ද අහසින් යන ඍෂිහු දැක සංවේගය ලැබ ගත්තේ ය. ඒ ක්‍ෂත්‍රිය පණ්ඩිත තෙමේ ද පැවිද්ද කැමති විය.

2641. ඉක්බිති හේ පැවිදිව කාමරාගය දුරු කෙළේ ය. කාමරාගය දුරු කොට බඹලොව උපන්නේ යි.

මහාපලොභන ජාතක යි.

12. පස්පඬි පැනය

2642. මෙහි රැස් වූ පස් පඬිවරුනි, මට ප්‍රශ්නයෙක් වටහයි. එය අසවු නිඳ්‍ද කටයුතු කරුණක් හෝ ප්‍රශංසා කටයුතු කරුණක් හෝ රහසක් නම් කවරකුහට එළිදරව් කළයුතු වන්නේ දැ යි රජ තෙම ඇසී ය.

2643. මහරජ, නුඹ වහන්සේ අපට එළිදරව් කරනු මැනව. නුඹ වහන්සේ වනාහි අපගේ ස්වාමියා ද බර උසුලන තැනැත්තේ ද වන්නහු ය. එහෙයින් පළමු කොට නුඹ වහන්සේ ම මෙය කියන සේක්වා, මහරජ, නුඹ වහන්සේගේ කැමැත්ත ද රුචි කරුණු ද දැනගෙන අනතුරු ව පඤ්ච පණ්ඩිතයෝ ප්‍රකාශ කරත් යී සෙනක තෙම කීවේ ය.

2644 යම් භාර්‍ය්‍යාවක් සිල්වත් ද, අනුන් වසඟයෙහි නො පවතී ද, සැමියාගේ කැමැත්ත අනුව ජීවත් වන්නී ද, මනවඩන්නී ද එවැනි භාර්‍ය්‍යාවට නිඳ්‍ද කටයුතු කරුණක් හෝ ප්‍රශංසා කටයුතු කරුණක් හෝ රහස් කරුණ එළිදරව් කළයුතු වන්නේ ය.

2645. යමෙක් පිහිටක් නො මැතිව කරදරයට පත් වූ ගිලනාහට පිහිට වේද නිඳ්‍ද කටයුතු කරුණක් හෝ ප්‍රශංසා කටයුතු කරුණක් හෝ රහස් කරුණ එබඳු යහළුවාට එළිදරව් කරන්නේ ය.

2646. ජ්‍යෙෂ්ඨ වූ හෝ මධ්‍යම වූ හෝ කණිෂ්ඨ වූ හෝ යම් ඒ සහෝදරයෙක් තෙම ශීලයෙන් යුක්ත වූයේ ස්ථිර ස්වභාව ඇත්තේ වේ ද, නිඳ්‍ද කටයුතු කරුණක් හෝ ප්‍රශංසා කටයුතු කරුණක් හෝ රහස් කරුණ එබඳු සහොදරයාට ප්‍රකාශ කරන්නේ ය.

2647. යො වෙ හදයස්ස පද්ධගු
අනුජාතො පිතරං අනොමපඤ්ඤ,
නින්දියමත්ථං පසංසියං වා
පුත්තස්සාවිකරෙය්‍ය ගුය්හමත්ථං.

2648. මාතා දිපද ජනින්දසෙට්ඨ
යා තං පොසෙති ඡන්දසා පියෙන,
නින්දියමත්ථං පසංසියං වා
මාතුයාවිකරෙය්‍ය ගුය්හමත්ථං.

2649. ගුය්හස්ස හි ගුය්හමෙව සාධු
නහි ගුය්හස්ස පසත්ථමාවිකම්මං,
අනිප්ඵාදය සහෙය්‍ය ධීරො
නිප්ඵන්නත්ථො යථා සුඛං භණෙය්‍ය.

2650. කින්නු ත්වං විමනොසි රාජසෙට්ඨ
දිපදින්ද වචනං සුණොම නෙතං,
කිං චින්තයමානො දුම්මනොසි
නූන දෙව අපරාධො අත්ථි මය්හං.

2651. පඤ්ඤ වජ්ඣො මහොසධොති
ආණත්තො මෙ වධාය භූරිපඤ්ඤ,
තං චින්තයන්තො දුම්මනොස්මි
න හි දෙවි අපරාධො අත්ථි තුය්හං.

2652. අභිදොසගතො ඉදානි එසි
කිං සුත්වා කිමාසඞ්කතෙ මනො තෙ,
කො තෙ කිමවොච භූරිපඤ්ඤ
ඉඞ්ඝ තං වචනං සුණොම බ්‍රෑහි මෙතං.

2653. පඤ්ඤ වජ්ඣො මහොසධොති
යදි තෙ මන්තයිතං ජනින්ද දොසං,
භරියාය රහොගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතං.

2654. යං සාලවනස්මිං සෙනකො
පාපකම්මං අකාසි අසබ්භිරූපං,
සඛිනොව රහො ගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතං.

2655. පුක්කුසපුරිසස්ස තෙ ජනින්ද
උප්පන්නො රොගො අරාජයුත්තො,
භාතුව්ව රහො ගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතං.

2647. යමෙක් ඒකාන්තයෙන් පියාගේ සිත් වූ පරිදි ක්‍රියා කෙරේ ද පියා හා සමගුණ ඇත්තේ වේ ද, අලාමක ප්‍රඥා ඇත්තේ ද එබඳු පුත්‍රයාට නිඥා කටයුතු කරුණක් හෝ ප්‍රශංසා කටයුතු කරුණක් හෝ රහස් කරුණ ප්‍රකාශ කරන්නේ ය.

2648. දෙපා ඇත්තවුන් අතුරෙන් ශ්‍රේෂ්ඨ වූ මහරජතුමනි, යම් මවක් කැමැත්තෙන් හා ප්‍රේමයෙන් පුතකු පොෂණය කරන්නී ද නිඥා කටයුතු කරුණක් හෝ ප්‍රශංසා කටයුතු කරුණක් හෝ සැඟවිය යුතු කරුණ ඒ මවට ප්‍රකාශ කරන්නේ ය.

2649. සැඟවියයුත්ත සැඟවීම ම යහපති. සැඟවියයුත්ත එළිදරව් කිරීම ප්‍රශස්ත නො වේ. ප්‍රාඥතෙම අදහස මුදුන් පැමිණෙන තුරු ඉවසා සිටින්නේ ය. මුදුන් පැමිණි අදහස් ඇත්තේ ඒ කරුණ සුවසේ කියන්නේ ය.

2650. උතුම් මහරජතුමනි, නුඹ වහන්සේ කුමක් හෙයින් දොම්නස් වන්නහු ද? දෙපා ඇත්තවුන්හට ශ්‍රේෂ්ඨය, නුඹ වහන්සේගේ මේ වචනය නො අසමු. කුමක් සිතමින් දොම්නස් වන්නහු ද? දේවයන් වහන්ස, ඒකාන්තයෙන් මාගේ අපරාධයෙක් ඇත්තේ ද? කියා උදුම්බරා දේවිය ඇසූ ය.

2651. බොහෝ නුවණැති මහෞෂධ පණ්ඩිත තෙමේ මැරිය යුතු යයි මා විසින් මරණයට නියම කරන ලද ඒ කරුණ සිතමින් දොම්නස් වෙමි. දේවිය තිගේ වරදෙක් නැතැ යි රජ තෙම කීයේ ය.

2652. බොහෝ නුවණ ඇති මහෞෂධය, ඊයේ සවස ගිය නුඹ දැන් එන්නෙහිය. තාගේ සිත කුමක් අසා කුමකට සැක කෙරේ ද? මහත් ප්‍රඥා ඇත්ත, නුඹට කවරෙක් කුමක් කීයේ ද? ඒ වචනය මට කියව. මම එය අසමියි රජතෙම කීයේ ය.

2653. මහරජ, මහා ප්‍රඥා ඇති මහෞෂධ පණ්ඩිත තෙමේ මැරිය යුතුයයි නුඹ වහන්සේ විසින් පඬිවරුන් සමග මන්ත්‍රණය කරන ලද, එය රාත්‍රියෙහි කවරකුට කියන ලද ද? නුඹ වහන්සේ විනාහි රහසිගත ව භාර්‍යාවට කීසේක. ඒ සැඟවිය යුතු කරුණ ප්‍රකට කරන ලද බව මා විසින් අසන ලදී.

2654. සෙනකතෙම සල් උයන්හි අසභ්‍ය වූ යම්බඳු පාපකර්මයක් කෙළේ ද, එය රහසිගතව යහළුවකුට ම කීයේය. ප්‍රකට කළ ඒ රහස මට අසන්නට ලැබිණි.

2655. මහරජ, නුඹ වහන්සේගේ පුක්කුස නම් රාජපුරුෂයා හට රජුන් විසින් ළං නොවිය යුතු කුෂ්ඨ රොගයෙක් තිබේ. හෙතෙම රහසිගතව එය සහොදරයාට කීයේය. ප්‍රකට කළ ඒ රහස ද මට අසන්නට ලැබිණ.

2656. ආබාධොයං අසබ්භිරූපො
කාවින්දො නරදෙවෙන ඵුට්ඨො,
පුත්තස්ස රහොගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතං.

2657. අට්ඨවඞ්කං මණිරතනං උළාරං
සක්කො තෙ අදද පිතාමහස්ස,
දෙවින්දස්ස ගතං තදජ්ජ හත්ථං
මාතුච්ච රහො ගතො අසංසි
ගුය්හං පාතුකතං සුතං මමෙතං.

2658. ගුය්හස්ස හි ගුය්හමෙව සාධු
න හි ගුය්හස්ස පසත්ථමාවිකම්මං,
අනිප්ඵාදය සහෙය්‍ය ධීරො
නිප්ඵන්නත්ථො යථාසුඛං භණෙය්‍ය.

2659. න ගුය්හමත්ථං විවරෙය්‍ය රක්ඛෙය්‍ය නං යථා නිධිං,
නහි පාතුකතො සාධු ගුය්හො අත්ථො පජානතා.

2660. ථියා ගුය්හං න සංසෙය්‍ය අමිත්තස්ස ච පණ්ඩිතො,
යො චාමිසෙන සංහීරො හදයත්ථෙනො ච යො නරො.

2661. ගුය්හමත්ථමසම්බුද්ධං සම්බොධයති යො නරො,
මන්තභෙදභයා තස්ස දාසභූතො[1] තිතික්ඛති.

2662. යාවන්තො පුරිසස්සත්ථං ගුය්හං ජානන්ති මන්තිනං,
තාවන්තො තස්ස උබ්බෙගා තස්මා ගුය්හං න විස්සජෙ.

2663. විවිච්ච භාසෙය්‍ය දිවා රහස්සං
රත්තිං ගිරං[2] නාතිවෙලං පමුඤ්චෙ,
උපස්සුතිකා හි සුණන්ති මන්තං
තස්මා මන්තො ඛිප්පමුපෙති භෙදං.

පඤ්චපණ්ඩිතපඤ්හං.

1. දාසභූතොව - වි. මජසං.
2. රත්තිගිරං - වි. මජසං.

2656. මහරජ, කාවින්දතෙම නරදෙව නම් යකකු විසින් පහස්නා ලද්දේය. මේ ආබාධය ලාමකය. රහසිගතවූයේ පුත්‍රයාහට කීයේ ය. ප්‍රකට කළ ඒ රහස මට අසන්නට ලැබිණ.

2657. මහරජ, සක්දෙව් තෙමෙ මහත් අනුභාව ඇති අෂ්ටවංක නම් වූ මැණිකක් නුඹ වහන්සේගේ මුත්තා වන කුසරජුට දුන්නේය. දුන් ඒ මැණික දෙවිඳුයාගේ හස්තගතව පවතී. මේ කරුණ මවට රහසිගතව කීයේය. ප්‍රකට කළ ඒ රහස මට අසන්නට ලැබිණ.

2658. සැඟවිය යුත්ත සැඟවීම යහපති. සැඟවිය යුත්ත එළිදරව් කිරීම ප්‍රශස්ත නොවේ. ප්‍රාඥතෙම අදහස මුදුන් පැමිණෙන තුරු ඉවසා සිටින්නේය. මුදුන් පැමිණි අදහස් ඇත්තේ ඒ කරුණ සුවසේ කියන්නේය.

2659. රහස එළිදරව් නොකරන්නේය. එය නිධානයක් ලෙස රක්නේය. නුවණැත්තහු විසින් රහස එළිදරව් නොකරන ලද්දේම යහපති.

2660. පණ්ඩිත තෙම ස්ත්‍රියට ද සතුරාට ද රහස නො කියන්නේය. යමෙක් ආමිෂයෙන් සංග්‍රහ ලැබ එකමුතු වන්නේද, යමකුත් සිතින් එකක් සිතමින් මුවින් අනෙකක් බෙණෙන මිත්‍ර ප්‍රතිරූපකයෙක් වේද, ඒ දෙදෙනාට ද රහස නො කියන්නේය.

2661. යම් මිනිසෙක් අනුන් නොදන්නා වූ රහස් කරුණ දන්වා ද, මන්ත්‍රණය බිඳෙන බියෙන් ඔහු විසින් කැරෙන ආක්‍රොෂාදිය දුස ස්වභාවයෙන් සිටියේ ඉවසයි.

2662. මන්ත්‍රණය කළවුන් අතුරෙන් යම්තාක් දෙනා ඒ පුරුෂයාගේ රහස් කරුණ දනිද්ද, ඔහුට එපමණම සන්ත්‍රාසයෝ (තැති ගැනුම්) හටගනිත්. එහෙයින් රහස එළිදරව් නො කරන්නේය.

2663. දවල් කාලයෙහි විවේකව රහස කියන්නේ යි. යම් හෙයකින් බිත්ති ආදියෙහි සැඟවී සිට රහස අසන්නෝ වෙද්ද, එහෙයින් රාත්‍රිකාලයෙහි රහස කියන්නේ සීමාව ඉක්මවා ශබ්ද නඟමින් නො කියන්නේය. රහස වනාහි වහා අසමගිය ඇති කරන්නක් හෙයිනි.

පස් පඬි පැනය යි.

13. හත්ථිපාලජාතකං

2664. චිරස්සං වත පස්සාම බ්‍රාහ්මණං දෙවවණ්ණිනං,
මහාජටං ඛාරිධරං පඞ්කදන්තං රජස්සිරං.

2665. චිරස්සං වත පස්සාම ඉසිං ධම්මගුණෙ රතං,
කාසායවත්ථවසනං වාකචීරං පටිච්ඡදං.

2666. ආසනං උදකං පජ්ජං පතිගණ්හාතු[1] නො භවං,
අග්ඝෙ භවන්තං පුච්ඡාම අග්ඝං කුරුතු නො භවං.

2667. අධිච්ච වෙදෙ පරියෙස විත්තං
පුත්තෙ ගෙහෙ[2] තාත පතිට්ඨපෙත්වා,
ගන්ධෙ රසෙ පච්චනුභුය්‍ය සබ්බං
අරඤ්ඤං සාධු මුනි සො පසත්ථො.

2668. වෙද න සච්චා න ච විත්තලාභො
න පුත්තලාභෙන ජරං විහන්ති,
ගන්ධෙ රසෙ මුච්චනමාහු සන්තො
සකම්මනා[3] හොති ඵලූපපත්ති.

2669. අද්ධා හි සච්චං වචනං තවෙතං
සකම්මනා හොති ඵලූපපත්ති,
ජිණ්ණා ච මාතාපිතරො තවයිමෙ
පස්සෙය්‍යු[4] තං වස්සසතං අරොගං.

2670. යස්සස්ස[5] සක්ඛි[6] මරණෙන රාජ
ජරාය මෙත්ති නරවිරියසෙට්ඨ,[7]
යො චාපි ජඤ්ඤා න මරිස්සං කදාචි
පස්සෙය්‍යු තං වස්සසතං අරොගං.

2671. යථාපි නාවං පුරිසො දකම්හි
එරෙති චෙනං උපනෙති තීරං,
එවම්පි ව්‍යාධි සතතං ජරා ච
උපනෙන්ති මච්චං[8] වසමන්තකස්ස.

2672. පඞ්කො ච කාමා පලිපො ච කාමා
මනොහරාදුත්තරා මච්චුධෙය්‍යා,
එතස්මිං පඞ්කෙ පලිපෙ ව්‍යසන්නා[9]
හීනත්තරූපා න තරන්ති පාරං.

1. පටිගණ්හාතු - මජසං. ස්‍යා.
2. ගෙහෙ - මජසං.
3. සකම්මුනා - මජසං. ස්‍යා.
4. පස්සෙය්‍යුං - වි. මජසං.
5. යස්සස්සු - මජසං. ස්‍යා.
6. සක්ඛී - ස්‍යා.
7. නරවීරසෙට්ඨ - මජසං. ස්‍යා.
8. උපනෙති මච්චු - මජසං. ස්‍යා.
9. විසන්නා - මජසං. ස්‍යා.

13. හත්ථිපාල ජාතකය

2664. ශ්‍රේෂ්ඨවර්ණ ඇති මහත් වූ ජටාවක් ඇති තවුස් පිරිකර දරන මැලියම් සහිත දත් ඇති රජසින් යුත් හිස ඇති බමුණකු ඒකාන්තයෙන් බොහෝ කලකින් දකිමි.

2665. සුචරිත කොටස්හි ඇළුණු කසාවත් හැන්ද වූ වැහැරි සිවුරක් පෙරවූ ඍෂියකු ඒකාන්තයෙන් බොහෝ කලකින් දකිමි.

2666. පින්වත් තෙමේ අපගේ ආසන ද ජලය ද පය ගල්වන තෙල් ද පිළිගනීවා, මේ ආසනාදී පිදිය යුතු දෑ පින්වත්හු විචාරමු. අපගේ මේ පිදිය යුතු දෑ පිළිගැනීම කෙරේවා.

2667. දරුව, වෙදයන් හදරා වස්තුව සොයාගෙන ගෙහි පුත්‍රයන් වස්වා ගන්ධ රස ඇතුළත් කොට ඇති සියලු පංචකාමයන් අනුභව කොට වනයට යෑම යොග්‍ය වේ. එසේ වූ තපස්වී තෙම බුද්ධාදීන් විසින් පසස්නා ලද්දේ වෙයි.

2668. වේදයෝ සත්‍ය නොවෙත් ධන ලාභය ද නිෂ්ඵල වේ. පුත්‍ර ලාභයෙන් ජරාව නොවැළැක්වේ. ගන්ධයන් හා රසයන් ඇතුළත් කොටැති සියලු පංචකාමයන්ගෙන් මිදීම ම යහපතැයි සත්පුරුෂයෝ පවසති. ස්වකීය කර්මයෙන් ම ඵලය ඉපදීම වේයයි කීයේය.

2669. ඒකාන්තයෙන් ම නුඹගේ මේ වචනය සත්‍යය. ඵලයාගේ උපත ස්වකීය කර්මයෙන් වේ. නුඹගේ මේ ජරායෙන් ජීර්ණ වූ මවුපියෝ වර්ෂ සියයක් ගතව ගිය නීරොග වූ නුඹ දක්නහුය.

2670. මහරජ, යමකුගේ මරණය හා යහළුබවෙක් වන්නේ ද, නරවීර ශ්‍රේෂ්ඨය, යමකුගේ ජරාව හා මිත්‍රත්වයකුත් වන්නේ ද යමෙක් වනාහි මම කිසි කලෙකත් නොමැරෙමියි දන්නේ ද වර්ෂ සියයක් ගතව ගිය නීරොග වූ ඔහු දකිමි.

2671. යම්සේ පුරුෂයෙක් දියෙහි නැවක් මෙහෙයාද ඉවුරටත් එය පමුණුවාද එසේ ම ව්‍යාධියටත් ජරාවටත් නිතර සත්ත්වයා මරු-වසඟයට පමුණුවන්නේය.

2672. කාමයෝ වනාහි ලග්ගවාලන ස්වභාව ඇති හෙයින් මඩට බඳු උපමා ඇත්තේය. සිත් ඇදගන්නේය. තරණයට දුෂ්කරයහ. මරු වසඟයට පමුණුවන්නාහ මෙබඳු කාමසංඛ්‍යාත ලැගෙන මඩෙහි ද, ගැලෙන මඩෙහි ද ගිළුණු ලාමක ස්වභාව ඇති සත්ත්වයෝ නිර්වාණ සංඛ්‍යාත පරතෙරට යන්නට නොසමත් වෙත්.

2673. අයං පුරෙ ලුද්දමකාසි කම්මං
ස්වායං ගහීතො න හි මොක්ඛිතො මෙ,
ඔරුද්ධියානං[1] පරිරක්ඛිස්සාමි
මායං පුනලුද්දමකාසි කම්මං.

2674. ගාවංව නට්ඨං පුරිසො යථා වනෙ
පරියෙසති[2] රාජ අපස්සමානො,
එවං නට්ඨො එසුකාරී මමත්ථො
සොහං කථං න ගවෙසෙය්‍ය[3] රාජ.

2675. හියොති හීයති පොසො
පරෙති පරිහායති,
අනාගතං නෙතමත්ථීති ඤත්වා,
උප්පන්නං ඡන්දං[4] කොපනුදෙය්‍ය ධීරො.

2676. පස්සාමි වොහං දහරිං කුමාරිං
මත්තූපමං කෙතක[5] පුප්ඵනෙත්තං,
අභුත්තභොගෙ[6] පඨමෙ වයස්මිං
ආදාය මච්චු වජතෙ කුමාරිං.

2677. යුවා සුජාතො සුමුඛො සුදස්සනො
සාමො කුසුම්භපරිකිණ්ණමස්සු,
හිත්වාන කාමෙ පටිගච්ච ගෙහං
අනුජාන මං පබ්බජිස්සාමි දෙව.

2678. සාඛාහි රුක්ඛො ලභතෙ සමඤ්ඤං
පහීනසාඛං පන ඛාණුමාහු,
පහීනපුත්තස්ස මමජ්ජ හොති
වාසෙට්ඨි භික්ඛාචරියාය කාලො.

2679. අඝස්මිං කොඤ්චාව යථා හිමච්චයෙ
තන්තානි[7] ජාලානි පදාලෙය්‍ය හංසා,
ගච්ඡන්ති පුත්තා ච පතී ච මය්හං
සාහං කථං නානුවජෙ පජානං.

2680. එතෙ භුත්වා වමිත්වා ච පක්කමන්ති විහඞ්ගමා,
යෙ ච භුත්වා න වමිංසු තෙ මෙ හත්ථත්ථමාගතා.

---

1. ඔරුන්ධිය නං – මජසං.
2. අනෙවසති – මජසං. ස්‍යා.
3. ගවෙසෙය්‍යං – මජසං. ස්‍යා.
4. උපාතන ඡන්දං – මජසං.
5. කෙ[illegible]ක – මජසං.
6. භොගෙ අභුත්වා – මජසං.
7. කතානි – මජසං.

2673. මහරජ, මාගේ මේ ආත්ම භාවය තෙම පෙර අස් ගොච්චන් සමග එක්ව මං පැහැරුම් ආදී බොහෝ සැහැසිකම් කෙළේය. ඒ මේ ආත්මභාවය එහි විපාක ගන්නා ලදී. මට එයින් මිදීමක් නැත. දැන් කායවාග්ද්වාරයන් අවුරාගෙන එය ආරක්ෂා කරන්නෙමි. මාගේ මේ ආත්මය නැවත සැහැසිකම් නො කෙරේවා කියාය.

2674. මහරජ, යම්සේ පුරුෂයෙක් තෙම නැති වූ ගවයකු නො දක්නේ සොයා ද එසුකාරී නම් රජුනි, මෙපරිද්දෙන් ම මාගේ ප්‍රව්‍රජ්‍යා සංඛ්‍යාත අර්ථය තෙම නැතිවූයේ වෙයි. මහරජ, ඒ මම කෙසේ නම් එය නො සොයම්දැයි කීයේය.

2675. මහරජ, අද කටයුතු දේ හෙටයයි ද හෙට කටයුතු දේ අනිද්දයයි ද කල් දමන පුරුෂ තෙම පිරිහේ. යමෙක් නොපැමිණියේ ද මෙය නැත්තේය යි දැන උපන්නා වූ කුසල් අදහස කවර නම් පණ්ඩිතයෙක් දුරු කරන්නේ දැයි ගොපලු කුමාරතෙම කීයේය.

2676. භාවභාව විලාසයෙන් මත් වූවක මෙන් හැසිරෙන වැටකෙයියා මල්පෙති බඳු ඇස් ඇත්තා වූ තරුණ කුමරියක දකිමි. කාමසම්පත් අනුභව නො කළා වූ පළමු වයස්හි සිටියා වූ ඒ කුමරිය මෘත්‍යුමාරයා හැරගෙන යේ.

2677. තරුණ වූ මනාව හටගත් ශොභන මුඛයක් ඇති දැකුම් කලු රන්වන් පැහැති තරුණ කොමඩු කෙසරු මෙන් ගැවසී ගත් රවුළු ඇති කුමාරයෙක් වේද, මෙබඳු කුමාරයෙක් ද මරුවසභයට යන්නේය. එහෙයින් ඉන් පළමුව කාමයන් හා ගිහිගේ අත්හැර පැවිදිවන්නෙමි. දේවයන් වහන්ස, මට පැවිද්දට අවසර දෙනු මැනැවි යි අජපල් කුමාරතෙම කීයේ ය.

2678. අතුවලින් ගසයයි නම ලබයි. පහව ගිය අතු ඇත්ත කණුවය යි කියත්. පින්වත් වාසෙට්ඨී ගොත්‍ර ඇති බැමිණිය, පහව ගියා වූ පුත්‍රයන් ඇති මට දැන් පැවිදිවීමට කාලය පැමිණ තිබෙයි. පුරොහිත බ්‍රාහ්මණතෙම කීයේ ය.

2679. අහසෙහි නො ගැටෙමින් ගමන් කරන කොස් ළිහිණියන් මෙන් ද, වැසි කල් අවසන්හි අදින ලද දැල පලාගෙන යන හංසයන් මෙන් ද මාගේ පුත්‍රයෝත් සැමියාත් කාම සම්පත් නමැති දැල බිඳගෙන යති. ඒ මම දරුවන් ගියමඟ අනුව කිම නොයන්නෙම් ද?

2680. මේ ළිහිණි පක්ෂීහු මස් අනුභව කොට වමාරා බැහැර යෙති. යම් කෙනෙකුත් අනුභව කොට නො වැමැරුවාහු ද ඔවුහු මාගේ අතට පැමිණියාහුය.

2681. අවමී බ්‍රාහ්මණො කාමෙ තෙ ත්වං පච්චාවමිස්සසි,
වන්තාදො පුරිසො රාජ න සො හොති පසංසියො.

2682. පඞ්කෙව පොසං පලිපෙ ව්‍යසන්නං[1]
බලී යථා දුබ්බලං උද්ධරෙය්‍ය,
එවම්පි මං ත්වං උදතාරි හොති
පඤ්චාලි ගාථාහි සුභාසිතාහි.

2683. ඉදං වත්වා මහාරාජා එසුකාරී දිසම්පති,
රට්ඨං හිත්වාන පබ්බජි[2] නාගො ඡෙත්වා[3] ච බන්ධනං.

2684. රාජා ච පබ්බජ්ජමරොචයිත්ථ
රට්ඨං පහාය නරවිරියසෙට්ඨො,
තුවම්පි නො හොහි යථෙව රාජා
අම්හෙහි ගුත්තං අනුසාස රජ්ජං.

2685. රාජා ච පබ්බජ්ජමරොචයිත්ථ
රට්ඨං පහාය නරවිරියසෙට්ඨො,[4]
අහම්පි එකාව චරිස්සාමි ලොකෙ
හිත්වාන කාමානි යථොධිකානි.

2686. අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො
වයොගුණා අනුපුබ්බං ජහන්ති,
අහම්පි එකාව චරිස්සාමි ලොකෙ
හිත්වාන කාමානි මනොරමානි.

2687. අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො
වයො ගුණා අනුපුබ්බං ජහන්ති,
අහම්පි එකාව චරිස්සාමි ලොකෙ
හිත්වාන කාමානි යථොධිකානි.

2688. අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො
වයො ගුණා අනුපුබ්බං ජහන්ති,
අහම්පි එකාව චරිස්සාමි ලොකෙ
සීතිභූතා සබ්බමතිච්ච සඞ්ගන්ති.

හත්ථිපාල ජාතකං.

---

1. විසන්නං - මජසං.
2. පබ්බජී - මජසං.
3. ඡෙත්වාන - මජසං.
4. නරවීරසෙට්ඨං - මජසං.

2681. බ්‍රාහ්මණතෙම කාම සම්පත් වැමැරුවේය. ඒ සම්පත් නුඹ පසුව අනුභව කරන්නෙහිය. මහරජ, වැමැරූ දෙය අනුභව කරන්නා වූ යම් පුරුෂයෙක් වේද හෙතෙම බුද්ධාදි පණ්ඩිතයන් විසින් පැසසිය යුතු නො වේයයි (අගමෙහෙසිය) කිවු ය.

2682. පංකයෙහි (ලැගෙන මඩෙහි) පලිපයෙහි (ගැලෙන මඩෙහි) හෝ ගිලුණු දුබල පුරුෂයකු යම්සේ නම් බලවතෙක් ගොඩනගන්-නේ ද, මෙපරිද්දෙන් ම පින්වත් පංචාල රාජ දුහිතෘව මනාව කියන ලද ගාථා වලින් නුඹ මා කාම පංකයෙන් ගොඩලූයෙහි ය.

2683. දිශාධිපති වූ එසුකාරී රජතෙම මෙසේ කියා බැඳුම් සිඳ ලූ හංසයකු මෙන් රට හැර පැවිදි වූයේය.

2684. නරවීරශ්‍රෙෂ්ඨ වූ රජතෙමේ ද රට හැර දමා පැවිදි වීමට කැමති විය. රජ තෙමේ යම් සේ වේ නම් තෙපි ද අපට එසේ වෙව. අප විසින් රක්නා ලද රාජ්‍යය අනුශාසනා කරව යි මහජනයා දේවියට කීය.

2685. නරවීරශ්‍රෙෂ්ඨ වූ රජ තෙමේ ද රට හැරදමා පැවිද්ද කැමැති විය. මම ද සිත්කලු වූ කාමයන් හැරදමා තනියම හැසිරෙන් නෙම් යි.

2686. පෙරවරු ආදි කාලයෝ ඉක්මයති. රාත්‍රිහු ආයුසංස්කාර ක්‍ෂයකරමින් තරණය කරති. ප්‍රථම වයසාදි වයස් කොටස් පිළිවෙළින් පුද්ගලයන් හැර දමත්. මම ද මනරම් කාමයන් හැරදමා තනියම හැසිරෙන්නෙමි.

2687. පෙරවරු ආදි කාලයෝ ඉක්මයති. රාත්‍රිහු ආයුසංස්කාර ක්‍ෂය කරමින් තරණය කරති. ප්‍රථමවයසාදි වයස් කොටස් පිළිවෙළින් පුද්ගලයා හැර දමත්. මම ද තුබු තුබූ පරිදි කාම කොටස් හැර දමා හුදෙකලාව හැසිරෙන්නෙමි.

2688. පෙරවරු ආදි කාලයෝ ඉක්මයති. රාත්‍රිහු ආයුසංස්කාර ක්‍ෂයකරමින් තරණය කරති. ප්‍රථමවයසාදි වයස් කොටස් පිළිවෙළින් පුද්ගලයා හැර දමත්. මම ද සිහිල් වූවා සියලු රාගාදි සංගයන් ඉක්මවා ලොකයෙහි හුදෙකලාව හැසිරෙන්නෙමි යි දේවිය කීවාය.

හත්ථිපාල ජාතක යි.

14. අයොඝරජාතකං

2689. යමෙකරත්තිං පඨමං ගබ්භෙ වසති මාණවො,
අබ්භුට්ඨිතොව සයති සගච්ඡං න නිවත්තති.

2690. න යුජ්ඣමානා න බලෙන වස්සිතා
නරා න ජීරන්ති නවාපි මීයරෙ,
සබ්බං හි තං ජාතිජරායුපද්දුතං
තමෙම මතී හොති චරාමි ධම්මං.

2691. චතුරඞ්ගිනිං සෙනං සුභිංසරූපං
ජයන්ති රට්ඨාධිපතී පසය්හ,
න මච්චුනො ජයිතුං උස්සහන්ති
තමෙම මතී හොති චරාමි ධම්මං.

2692. හත්ථීහි අස්සෙහි රථෙහි පත්තිහි
පරිවාරිතා මුච්චරෙ[1] එකවෙය්‍යා,[2]
න මච්චුනො මුච්චිතුං[3] උස්සහන්ති[4]
තමෙම මතී හොති චරාමි ධම්මං.

2693. හත්ථීහි අස්සෙහි රථෙහි පත්තිහි
සූරා[4] පභඤ්ජන්ති පධංසයන්ති,
න මච්චුනො භඤ්ජිතුං උස්සහන්ති
තමෙම මතී හොති චරාමි ධම්මං.

2694. මත්තා ගජා භින්නගළා පභින්නා
නගරානි මද්දන්ති ජනං හනන්ති,
න මච්චුනො මද්දිතුං උස්සහන්ති
තමෙම මතී හොති චරාමි ධම්මං.

2695. ඉස්සාසිනො කතහත්ථාපි ධීරා
දූරෙපාතී අක්ඛණවෙධිනොපි,
න මච්චුනො විජ්ඣිතුං උස්සහන්ති
තමෙම මතී හොති චරාමි ධම්මං.

2696. සරානි ඛීයන්ති සසෙලකානනා
සබ්බං හි තං[5] ඛීයති දීඝමන්තරං,
සබ්බං හි තං භඤ්ජරෙ කාලපරියං
තමෙම මතී හොති චරාමි ධම්මං.

---

1. මුඤ්චරෙ – මජසං. සයා.
2. එකවෙය්‍ය – මජසං. සයා.
3. මුඤ්චිතුමුස්සහන්ති – සයා.
4. පුරා – මජසං.
5. සබ්බං හිදං සයා. සබ්බමපිතං – මජසං.

14. අයොඝර ජාතකය

2689. සත්වතෙම යම් එක රැයක ප්‍රථමයෙන් මව්කුසැ වාසය කෙරේ ද? හෙතෙම වලාකුළක් මෙන් ඉදිරියට යයි. යමින් හේ ආපස්සට ගමන් නො කෙරෙයි.

2690. යුද්ධකරන්නා වූ ද, බලයෙන් යුක්ත වූ ද මනුෂ්‍යයෝ නො-දිරන්නෝ නො වෙත්. නොමියන්නෝ නො වෙත්. ඒ සියල්ලෝ ම ජාති ජරාවන්ගෙන් උපද්‍රුතයහ. එහෙයින් "ධර්මයෙහි හැසිරෙමි" යන මේ සිත මට ඇති වෙයි.

2691. ඉතා බිහිසුනු ස්වභාව ඇති සිවුරඟ සෙනඟ ගෙන රාෂ්ට්‍රාධිපති රජවරු බලාත්කාරයෙන් ජය ගනිති. මරහුගේ සෙනග ජය ගන්නට උත්සාහ නො කෙරෙත්. එහෙයින් "ධර්මයෙහි හැසි-රෙමි" යන මේ සිත මට ඇති වෙයි.

2692. ඇත් - අස් - රිය - පාබල යන සිවුරඟ සෙනඟින් පිරිවරන ලද ඇතැමෙක් සතුරන්ගෙන් මිදෙති. ඔවුහු මරසෙනඟින් මිදෙන්නට උත්සාහ නො කෙරෙත්. එහෙයින් "ධර්මයෙහි හැසිරෙමි" යන මේ සිත මට ඇති වෙයි.

2693. ඇත් - අස් - රිය - පාබල යන සිවුරඟ සෙනඟින් පිරිවරන ලද ශූර රජවරු පසමිතුරන්ගේ නුවරවල් බිඳිති. පසමිතුරන් නසති. ඔවුහු මරහුගේ බල බිඳින්නට උත්සාහ නො කෙරෙත්. එහෙයින් "ධර්මයෙහි හැසිරෙමි" යන මේ සිත මට පහළ වෙයි.

2694. ත්‍රිමද ගලිත හස්තිහු නුවරවල් මඩිති. ජනයා නසති. ඔවුහු මරහු මඩින්නට උත්සාහ නො කෙරෙත්. එහෙයින් "ධර්ම-යෙහි හැසිරෙමි" යන මේ සිත මට ඇති වෙයි.

2695. නුවණැති ඉලක්කය නො වරදවා දුරවිදීමෙහි දක්ෂ වූ කෘතහස්ත ධනුර්ධරයෝ ඇත්තාහ. ඔවුහු මරහු විදින්නට උත්සාහ නො කෙරෙත්. එහෙයින් මම "ධර්මයෙහි හැසිරෙමියි" යන මේ සිත මට ඇති විය.

2696. අනවතප්තාදී මහවිල් සත ද පර්වතයන් සහිත මහා වනයෝ ද ක්‍ෂය වෙත්. දිගු කලක් ඇවෑමෙන් ඒ සියල්ල ම ක්‍ෂය වෙයි. ඒ සියල්ල ම නස්නා කාලයට පැමිණ බිඳෙයි. එහෙයින් "ධර්මයෙහි හැසිරෙමි" යන මේ සිත මට ඇති වෙයි.

2697. සබ්බසමෙවං හි නරානනාරිනං
වලාවලං පාණභුනොධ ජීවිතං,
පටොව ධුත්තස්ස දුමොව කූලජො
තමෙම මතී හොති චරාමි ධම්මං.

2698. දුමප්ඵලානෙව පතන්ති මාණවා
දහරා ච වුද්ධා ච සරීරභෙදා,
නාරියො නරා මජ්ඣිමපොරිසා ච
තමෙම මතී හොති චරාමි ධම්මං.

2699. නායං වයො තාරකරාජසන්නිභො
යදබ්භතීතං ගතමෙවදානි තං,
ජිණ්ණස්ස හි නත්ථි රතී කුතො සුඛං
තමෙම මතී හොති චරාමි ධම්මං.

2700. යක්ඛා පිසාචා අථවාපි පෙතා
කුපිතාපි[1] තෙ අස්සසන්ති මනුස්සෙ,
න මච්චුනො අස්සසිතුස්සහන්ති[2]
තමෙම මතී හොති චරාමි ධම්මං.

2701. යක්ඛෙ පිසාචෙ අථවාපි පෙතෙ
කුපිතෙපි[3] තෙ නිජ්ඣපනං කරොන්ති,
න මච්චුනො නිජ්ඣපනං කරොන්ති
තමෙම මතී හොති චරාමි ධම්මං.

2702. අපරාධකෙ හෙඨකෙ දූසකෙ ච
රාජානො දණ්ඩෙන්ති විදිත්වා දොසං,
න මච්චුනො දණ්ඩයිතුස්සහන්ති
තමෙම මතී හොති චරාමි ධම්මං.

2703. අපරාධකා දූසකා හෙඨකා ච
ලභන්ති තෙ රාජිනො නිජ්ඣපෙතුං,
න මච්චුනො නිජ්ඣපනං කරොන්ති
තමෙම මතී හොති චරාමි ධම්මං.

2704. න ඛත්තියොති න පි බ්‍රාහ්මණොති
න අඩ්ඪකා බලවා තෙජවාපි,
න මච්චුරාජස්ස අපෙක්ඛමත්ථි
තමෙම මතී හොති චරාමි ධම්මං.

1. කුප්පිතාපි – මජසං.
2. අස්සසිතුමුස්සහන්ති – මජසං.
3. කුප්පිතෙපි – මජසං. ස්‍යා.

2697. මෙසේ ම මෙලොව නර නාරීන්ගේ ද සියලු ප්‍රාණීන්ගේ ද ජීවිතය චංචල වේ. සුරාධූර්තයකුගේ වස්ත්‍රය මෙන් ද ගං ඉවුරෙහි හටගත් ගසක් මෙන් ද සත්ත්වයන්ගේ ජීවිතය සථිර නොවේ. එහෙයින් "ධර්මයෙහි හැසිරෙමි" යන මේ සිත මට පහළ වෙයි.

2698. ළදරුවෝ ද වෘද්ධයෝ ද තරුණයෝ ද ස්ත්‍රීහු ද පුරුෂයෝ ද උභතොබ්‍යඤ්ජනකයෝ ද යන සියල්ලෝ ම ගස්වල ගෙඩි මෙන් ශරීරභෙදයෙන් වැටෙත්. එහෙයින් "ධර්මයෙහි හැසිරෙමි" යන මේ අදහස මට ඇති වෙයි.

2699. මේ සත්ත්වයන්ගේ වයස කෘෂ්ණ පක්ෂයෙහි පිරිහී ශුක්ල පක්ෂයෙහි වැඩෙන්නා වූ සඳ මෙන් නොවේ. යමක් ඉක්මැ ගියේද දූන් එය ගියේ මැ යි. ජරාජීර්ණයාහට කාමගුණයන්හි ඇල්මෙක් නැති. සැපතක් නම් කොයින් ද? එහෙයින් ධර්මයෙහි හැසිරෙමි යන මේ සිත මට පහළ වෙයි.

2700. යක්ෂයෝ ද පාංශුපිශාචයෝ ද ප්‍රෙතයෝ ද කිපුණාහු මිනිසුන්හට ආවෙශ වෙති. ඔවුහු මරුහට ආවෙශ වන්නට උත්සාහ නො කෙරෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමි යන මේ අදහස මට ඇති වෙයි.

2701. යක්ෂයන් ද පාංශුපිශාචයන් ද ප්‍රෙතයන් ද කිපුණු කල්හි බලිකර්මාදිය කිරීමෙන් ඔවුන් පහදවති, මරුවා නො පහදවත්. එහෙයින් "ධර්මයෙහි හැසිරෙමි" යන මේ අදහස මට පහළ වෙයි.

2702. රාජාපරාධ කරන්නාවූ ද රාජ්‍යදූෂකවූ ද ජනයා පෙළන්නාවූ ද මිනිසුන්ගේ අපරාධ දූන රජවරු දඬුවම් කරත්. ඔවුහු මරහුට දඬුවම් කරන්නට උත්සාහ නො කෙරෙත්. එහෙයින් "ධර්මයෙහි හැසිරෙමි" යන මේ අදහස මට ඇති වෙයි.

2703. රාජාපරාධකරුවෝ ද රාජ්‍ය දූෂකයෝ ද ජනයා පෙළන්නෝ ද (සාක්ෂිවලින් තමන්ගේ නිරපරාධී බව ප්‍රකාශ කරවා) අස් වැසීමක් ලබති. මරහු (එසේ සාක්ෂිවලින්) නිරපරාධ බව ප්‍රකාශ නො කරවත්. එහෙයින් "ධර්මයෙහි හැසිරෙමි" යන මේ අදහස මට ඇති වෙයි.

2704. ක්ෂත්‍රියයෙකැ බ්‍රාහ්මණයෙකැ ආඪ්‍යයෙකැ බලැත්තෙකැ තෙදැත්තෙකැයි මාරයාගේ අපෙක්ෂාවක් නැත්තේය. එහෙයින් "ධර්මයෙහි හැසිරෙන්නෙමි" යන අදහස මට පහළ වෙයි.

2705. සීහා ච ව්‍යග්ඝා ච අථොපි දීපියො
පසය්හ ඛාදන්ති විප්ඵන්දමානං,
න මච්චුනො ඛාදිතුං උස්සහන්ති
තමෙම මතී හොති චරාමි ධම්මං.

2706. මායාකාරා[1] රඞ්ගමජ්ඣෙ කරොන්තා
මොහෙන්ති චක්ඛූනි ජනස්ස තාවදෙ,
න මච්චුනො මොහයිතුස්සහන්ති[2]
තමෙම මතී හොති චරාමි ධම්මං.

2707. ආසීවිසා කුපිතා උග්ගතෙජා
ඩසන්ති මාරෙන්තිපි තෙ මනුස්සෙ,
න මච්චුනො ඩසිතුං උස්සහන්ති
තමෙම මතී හොති චරාමි ධම්මං.

2708. ආසීවිසා කුපිතා[3] යං ඩසන්ති[4]
තිකිච්ඡකා තෙසං විසං හනන්ති,
න මච්චුනො දට්ඨවිසං හනන්ති
තමෙම මතී හොති චරාමි ධම්මං.

2709. ධම්මන්තරී වෙතරණී[5] ච භොජො
විසානි හන්ත්වාන භුජඞ්ගමානං,
සූයන්ති තෙ කාලකතා[6] තථෙව
තමෙම මතී හොති චරාමි ධම්මං.

2710. විජ්ජාධරා ඝොරමධීයමානා
අදස්සනං ඔසධෙහි වජන්ති,
න මච්චුරාජස්ස වජන්තාදස්සනං
තමෙම මතී හොති චරාමි ධම්මං.

2711. ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති,
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී.

2712. න හි ධම්මො අධම්මො ච උභො සමවිපාකිනො,
අධම්මො නිරයං නෙති ධම්මො පාපෙති සුග්ගතින්ති.

14. අයොඝරජාතකං.

වීසතිනිපාතො නිට්ඨිතො.

තස්සුද්දානං:

මාතඞ්ග සම්භූත සිවි සිරිමන්තො[7]
රොහණ හංස සත්තිගුම්බො භල්ලාටිය,
සොමනස්ස චම්පෙය්‍ය බ්‍රහ්ම පඤ්ඤා
පණ්ඩිත චිරස්සං වත අයොඝරානි.

---

1. මායා කරා - මජසං,
2. මොහයිතු මුස්සහන්ති - වි. මජසං, සයා.
3. කුප්පිතා - මජසං.
4. ඩස්සන්ති - මජසං.
5. වෙතරුණො - මජසං.
6. කාලං කතා - මජසං,
7. සිරිමන්දො-නා,

2705. සිංහයෝ ද ව්‍යාඝ්‍රයෝ ද දිවියෝ ද මිනිසුන් බලාත්කාරයෙන් අල්ලාගෙන බෙහෙවින් කම්පාවන ඔවුන් කති. ඔවුහු ද මරහු අල්ලාකන්නට උත්සාහ නොකෙරෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙමි යන අදහස මට ඇති වෙයි.

2706. නෘත්‍යස්ථාන මධ්‍යයෙහි මායා කරන්නාවූ මායා කාරයෝ එකෙණෙහි ජනයාගේ ඇස් මුළාකෙරෙති. ඔවුහු මරහු මුළාකරන්නට උත්සාහ නොකෙරෙත්. එහෙයින් මම ධර්මයෙහි හැසිරෙමි යන මේ අදහස මට පහළ වෙයි.

2707. කිපියා වූ උග්‍රතෙජස් ඇති සර්පයෝ මිනිසුන් දෂ්ට කෙරෙති. එයින් ම මරණයට පවා පත් කරති. ඔවුහු මරහු ඩසින්නට උත්සාහ නොකෙරෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙන්නෙමි යන මේ අදහස මට පහළ වෙයි.

2708. කිපියා වූ සර්පයෝ යම් පුද්ගලයකු ඩසිත් නම්, විෂ වෛද්‍යවරු ඔහුගේ විෂ නැති කරති. ඔවුහු ද මරහු දෂ්ට කළ විෂ නො නසත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙන්නෙමි යන මේ සිත මට පහළ වෙයි.

2709. ධම්මන්තරී, වෙතරණී, භොජ නම් වූ වෛද්‍යයෝ සර්පයන්ගේ විෂ නසා, තුමූ ද කාලක්‍රියා කළහයි අසනු ලැබේ. එහෙයින් ධර්මයෙහි හැසිරෙන්නෙමි යන අදහස මට ඇති වෙයි.

2710. ඝොර නම් විද්‍යාව හදරන විද්‍යාධරයෝ ඖෂධ බලයෙන් සතුරන්ගේ නො දැක්මට යෙති. ඔවුහු ද මරහුගේ නො දැක්මට නොයෙත්. එහෙයින් ධර්මයෙහි හැසිරෙන්නෙමි යන මේ හැඟීම මට ඇති වෙයි.

2711. ධර්මය තෙමේ ධර්මයට අනුව හැසිරෙන්නහු එකාන්තයෙන් ම රකී. මනාව පුරුදු කරන ලද ධර්මය සුව ගෙන දෙයි. ධර්මය හොඳින් පුරුදු කළ කල්හි මේ අනුසසි. ධර්මයට අනුව හැසිරෙන්නා දුගතියට නොයයි.

2712. ධර්මයත් අධර්මයත් දෙක සම විපාක ඇත්තේ නොවේ. අධර්මය නරකයට පමුණුවයි. ධර්මය සුගතියට පමුණුවයි.

14. අයොසර ජාතක යි.

විසිවැනි නිපාතය නිමියේ ය.

(උද්දානය සුගම යි.)

තිංසනිපාතො

1. කිංඡන්‍ද ජාතකං

2713. කිං ඡන්‍ද කිමධිප්පායො එකො සම්මසි ඝම්මනි,
කිං පත්‍ථයානො කිං එසං කෙන අත්‍ථෙන බ්‍රාහ්මණ.

2714. යථා මහාවාරිධරො කුම්භො සුපරිණාහවා,
තථූපමං අම්බපක්කං වණ්ණගන්‍ධරසුත්තමං.

2715. තං වුය්හමානං සොතෙන දිස්වානාමලමජ්ඣිමෙ,
පාණීහි නං ගහෙත්වාන අග්‍යායතනමාහරිං.

2716. තතො කදලිපත්තෙසු නික්ඛිපිත්වා සයං අහං,
සත්ථෙන නං විකප්පෙත්වා ඛුප්පිපාසං අහාසි මෙ.

2717. සොහං අපෙතදරථො ව්‍යන්තීභූතො දුඛක්ඛමො,[1]
අස්සාදං නාධිගච්ඡාමි ඵලෙස්වඤ්ඤෙසු කෙසුපි.

2718. සොසෙත්වා[2] නූන මරණං තං මමං ආවහිස්සති,
අම්බං යස්ස ඵලං සාදුං මධුරග්ගං මනොරමං
යමුද්ධරිං වුය්හමානං උදධිස්මා මහණ්ණවෙ.

2719. අක්ඛාතං තෙ මයා සබ්බං යස්මා උපවසාමහං,
රම්මං පතිනිසින්නොස්මි පුථුලොමායුතා පුථු.

2720. ත්වං ච ඛො මෙ අක්ඛාහි අත්තානමපලායිනී,
කා වා ත්වමසි කල්‍යාණි කිස්ස වා ත්වං සුමජ්ඣිමෙ.

2721. රුප්පපට්ටපලිමට්ඨීව ව්‍යග්ඝීව ගිරිසානුජා,
යා සන්ති නාරියො දෙවෙසු දෙවානං පරිචාරිකා,

2722. යාව මනුස්සලොකස්මිං රූපෙනන්වාගතිත්ථියො,
රූපෙ තෙ සාදිසී නත්ථි දෙවෙසු ගන්‍ධබ්බමනුස්සලොකෙ,[3]
පුට්ඨාසි මෙ චාරුපුබ්බඞ්ගි බ්‍රෑහි
අක්ඛාහි මෙ නාමඤ්ච බන්‍ධවෙ ච.[4]

2723. යං ත්වං පතිනිසින්නාසි රම්මං බ්‍රාහ්මණ කොසිකිං,
සාහං භුසාලයාවුත්ථා වරවාරිවහොඝසා.

2724. නානාදුමගණාකිණ්ණා බහුකා ගිරිකන්‍දරා,
මමෙව පමුඛා හොන්ති අභිසන්‍දන්ති පාවුසෙ.

---

1. දුක්ඛ – මජසං, ස්‍යා.
2. සෙසිත්වා – මජසං. ස්‍යා.
3. දෙවගන්‍ධබ්බමානුසෙ – ස්‍යා.
4. බෲහි නාමඤ්ච බන්‍ධවෙ – ස්‍යා.

තිංසති නිපාතය

කිංඡන්ද ජාතකය

2713. බ්‍රාහ්මණය, කවර අදහස් ඇත්තේ කුමක් සිතමින් කුමක් පතමින් කුමක් සොයමින් කවර කරුණක් නිසා ග්‍රීෂ්ම ඇත්තා වූ මේ ගං ඉවුරෙහි එකලාව හිඳිනෙහි ද? යි දෙව්දුව ඇසූ ය.

2714. විශාල වූ මහත් වූ දියකළයක් යම්සේ ද එබඳු වූ වර්ණයෙන් ද සුවඳින් ද රසයෙන් ද උතුම් වූ අඹගෙඩියක් විය.

2715. නිර්මල වූ මධ්‍ය ප්‍රදෙශ ඇති දෙව්දුනි, ගඟ දියෙන් ගසාගෙන යන්නා වූ එය දැක අතින් රැගෙන ගිනිහල්ගෙට ගෙන ගියෙමි.

2716. ඉන්පසු කෙසෙල් කොළවල එය තබා මම නෙමේ ම පිහියෙන් එය කපා මගේ සාපිපාසා දුරුකර ගත්තෙමි.

2617. ඒ මම පහව ගියා වූ කාය චිත්ත පීඩා ඇත්තෙමි. ඒ අඹඵලය අවසන් වූයේ දුක ඉවසන්නේ අන්කිසිම ඵලයෙක්හි ආස්වාදයක් නො ලබමි.

2718. යම් අඹ ඵලයක් මිහිරි වූ රසයෙන් අග්‍ර වූ සිත්කලු වූවක් වී ද. මහාජලයෙහි පාවෙන්නා වූ යම්බඳු අඹයක් මම දියෙන් ගොඩ ගනිම් ද එය මා වියළවා මට එකාන්තයෙන් මරණය එළවන්නේ ය.

2719. යම් හෙයෙකින් මම උපවාසය කෙරෙම් ද, මසුන්ගෙන් යුක්ත වූ දිගු පුළුලැති සිත්කලු වූ ගඟ බලා හුන්නෙම් ද? මා විසින් ඒ සියල්ල නුඹට කියන ලදී.

2720. අපලායිනිය හෙවත් පැන නොයන්නිය, තෙපි ද තමා ගැන මට කියව. කල්‍යාණිය තෙපි කවරක් හෝ වවූ ද, යහපත් වූ මධ්‍ය ප්‍රදෙශ ඇත්තිය, කුමකට හෝ තෙපි මෙහි අවු ද?

2721. තෙපි මනාව මට කරන ලද රන් පටක් බඳු වූවහු. පර්වතයෙක්හි උපන් තරුණ ව්‍යාඝ්‍ර ධෙනුවක මෙන් වූවහුය. දෙවියන් අතුරෙහි දෙවියන්ගේ පරිචාරිකා ස්ත්‍රීහු වෙද්ද?

2722. මිනිස්ලෙව්හි ද රුවින් අගනන්පත් යම් ස්ත්‍රීහු වෙද්ද, දෙව් – ගදෙව් – මිනිස් යන ලෙව්හි රූපයෙන් තොප හා සම කළ හැකි තැනැත්තියක් නැත. මනොඥ වූ උතුම් ලක්ෂණයෙන් යුත් තැනැත්තිය, මා විසින් විචාරණ ලද්දී එය කියව. මට තොපගේ නම ද නෑයන් ද කියව.

2723. බ්‍රාහ්මණය, තෙපි සිත්කලු වූ යම් කෝසිකී නම් ගංගාවක් බලා හුන්නහු ද? උතුම් ජලය බැසයන සැඩපහරින් යුත් ගඟෙහි පිහිටි විමානයෙහි අධිගෘහිත වූ දෙවතා දූ නම් මමය.

2724. නොයෙක් වෘක්ෂසමූහයෙන් ගැවැසීගත් බොහෝ වූ කඳු රැලි මා මැ ප්‍රමුඛ කොට ඇත්තාහු වෙත්. බොහෝ වූ වර්ෂා ජලය මේ ගඟට ම පිවිසෙයි.

2725. අථො බහූ වනා තොද නීලවාරිවහන්ධරා,
බහුකා නාගවිත්තොද අභිසන්දන්ති වාරිනා.

2726. තා අම්බජම්බුලබුජා නීපා තාලා චුදුම්බරා,[1]
බහූනි ඵලජාතානි ආවහන්ති අභිණ්හසො.

2727. යං කිඤ්චි උභතො තීරෙ ඵලං පතති අම්බුනි,
අසංසයං තං සොතස්ස ඵලං හොති වසානුගං.

2728. එතදඤ්ඤාය මෙධාවී පුථුපඤ්ඤ සුණොහි මෙ,
මා රොචයමභිසඞ්ගං පටිසෙධ ජනාධිප.

2729. න වාහං වඩ්ඪවං මඤ්ඤෙ යං ත්වං රට්ඨාභිවඩ්ඪන,
ආචෙය්‍යමානො රාජිසි මරණං අභිකඞ්ඛසි.

2730. තස්ස ජානන්ති පිතරො ගන්ධබ්බා ච සදෙවකා,
යෙ චාපි ඉසයො ලොකෙ සඤ්ඤතත්තා යසස්සිනො[2]
අසංසයන්තෙ[3] ජානන්ති වඩ්ඪභූතා යසස්සිනො.

2731. එවං විදිත්වා විදූ සබ්බධම්මං
විද්ධංසනං චවනං ජීවිතස්ස,
නාචීයති තස්ස නරස්ස පාපං
සචෙ න චෙතෙති වධාය තස්ස.

2732. ඉසිපූගසමඤ්ඤාතෙ එවං ලොකය්‍යා විදිතා සති,
අනරිය[4] පරිසම්භාසෙ පාපකම්මං ජිගිංසසි.[5]

2733. සචෙ අහං මරිස්සාමි තීරෙ තෙ පුථු සුස්සොණි,
අසංසයං අසිලොකො මයි පෙතෙ ආගමිස්සති.

2734. තස්මා හි පාපකං කම්මං රක්ඛස්සෙව[6] සුමජ්ඣිමෙ,
මා තං[7] සබ්බො ජනො පච්ඡා පකුට්ඨායි මයි මතෙ.

2735. අඤ්ඤාතමෙතං අවිසය්හසාහි
අත්තානං අම්බං ච දදමි තෙ තං,
යො දුච්චජෙ කාමගුණෙ පහාය
සන්තිඤ්ච ධම්මඤ්ච අධිට්ඨිතොසි.

1. නීපා තාලමුදුම්බරා – මජසං.
2. තපස්සිනො – මජසං.
3. අසංසයං තෙපි – මජසං.
4. අනරියං – වි. ස්‍යා.
5. ජිගීසසි – මජසං.
6. රක්ඛස්සුව – ස්‍යා.
7. ත්වං – ස්‍යා.

2725. තවද බොහෝ වූ ඒ ඒ වනයෙන් වැහෙන්නා වූ ජලයෝ ද ප්‍රවිෂ්ට වෙත්. නීලවර්ණ ජලයෙන් යුත් දියකඳ දරන්නා වූ බොහෝ නාගයන් තුටු කරන ජලයෙන් යුත් නොයෙක් ගංගාවෝ මේ ගඟට ගලා බසිත්.

2726. ඒ නදීහු අඹ දඹ හා දෙල් ද බක්මී තල් ද දිඹුල් ද යන බොහෝ ඵලජාතීන් නිතර ඇද ගනිත්.

2727. ඒ ගඟ උභයතීරයෙහි යම් කිසි ඵලයක් දියෙහි වැටේ ද ඒ ඵලය නිසැක ව මාගේ ස්‍රොතස අනුව යන්නේ වේ.

2728. මහත් වූ ප්‍රඥා ඇත්තාණෙනි, මෙය දන මාගේ වචනය අසව. මහරජ, තෘෂ්ණා වශයෙන් ඇලීම නො කොට එය දුරු කරව.

2729. රට වර්ධනය කරන්නා වූ මහරජ, රාජර්ෂිය, මස් ලෙහෙයින් වැඩෙමින් තරුණ ව සිටි නුඹ වහන්සේ යම් හෙයෙකින් නිරාහාර ව වැස මරණයට කැමැත්තහු ද එහෙයින් මම මෙය නුඹගේ නුවණින් වැඩිහිටි බවකැ යි නො හඟිමි.

2730. ඔහුගේ තෘෂ්ණා වසඟවීම බ්‍රහ්මයෝ ද දෙවියන් සහිත වූ ගන්ධර්වයෝ ද යශසින් යුත් සංයත වූ ආත්ම ඇති යම් බඳු ඍෂීහු හෝ ලොව්හි වෙද්ද, නුවණින් වැඩුණු යශස් ඇති ඔවුහු නිසැක ව දනගනිත් යයි දෙව්දුව කීය.

2731. නුවණැත්තේ සියලු සුචරිත ධර්ම මෙසේ දන ජීවිතයාගේ නැසීම ද චුතවීම ද දන සිටී ද, හෙතෙමේ අනායයාගේ වධය පිණිස නො සිතා ද, ඒ මිනිසාට පව් රැස් නො වේ.

2732. මෙසේ ලොකයාහට හිත ඇත්තේ යයි ඍෂි සමූහයා විසින් දක්නා ලද කල්හි මා කෙරෙහි නින්දා කිරීම රිසි තැනැත්තිය, තී පාපකර්මයන් රැස් කැර ගැනුමට කැමැත්තෙහි ය.

2733. පුළුල් වූ යහපත් කටිප්‍රදෙශ ඇත්තිය, ඉදින් මම තීගේ ගං ඉවුරෙහි මැරෙම් ද මා පරලොව ගිය කල්හි සැක නැති ව තිට අපකීර්තියක් පැමිණෙන්නේ ය.

2734. යහපත් මධ්‍ය ප්‍රදෙශ ඇත්තිය, එහෙයින් පාපකර්මයෙන් ආරක්ෂා වෙව. මා මළකල්හි තිට ජන තෙමේ නින්දා නො කෙරේවා.

2735. නො ඉවසිය හැකි දැ ඉවසනසුලු මහරජ, මේ කරුණ මා විසින් දන්නා ලදී. යමෙක් තෙම හැර දැමීමට දුෂ්කර කාමගුණයන් හැර දමා සංයම සීලයෙහි ද සුචරිත ධර්මයෙහි ද පිහිටියේ නම්, ඒ නුඹට තමා ද ඒ අඹ ද දෙමි.

2736. යො හිත්වා පුබ්බසංයොගං පච්ඡා සංයොජනෙ ඨිතො,
අධම්මඤ්චෙව චරති පාපකඤ්චස්ස පවඩ්ඪති.

2737. එහි තං පාපයිස්සාමි කාමං අප්පොස්සුක්කො භව,
උපානයාමි සීතස්මිං විහරාහි අනුස්සුකො.

2738. තං පුප්ඵරසමත්තෙහි වක්කඞ්ගෙහි අරින්දම,
කොඤ්චා මයූරා දිවියා කොයට්ඨිමධුසාලියා.

2739. කූජිතා හංසපූගෙහි කොකිලෙත්ථ පබොධරෙ,
අම්බෙත්ථ විප්පසූනග්ගා පලාලඛලසන්නිභා
කොසුම්භසලලා නීපා පක්කතාලවිලම්බිනො.

2740. මාලී තිරීටී කායූරී අඞ්ගදී චන්දනුස්සදෙ,
රත්තිං ත්වං පරිචාරෙසි දිවා වෙදෙසි වෙදනං.

2741. සොළසිත්ථිසහස්සානි යා තෙමා පරිචාරිකා,
එවං මහානුභාවොසි අබ්භුතො ලොමහංසනො.

2742. කිං කම්මමකරි පුබ්බෙ පාපං අත්තදුක්ඛාවහං,
යං කරිත්වා මනුස්සෙසු පිට්ඨිමංසානි ඛාදසි.

2743. අජ්ඣෙනානි පටිග්ගය්හ කාමෙසු ගථිතො අහං,
අචරිං දීඝමද්ධානං පරෙසං අහිතායහං.

2744. යො පිට්ඨිමංසිකො හොති එවං උක්කච්ච ඛාදති,
යථාහමජ්ජ ඛාදමි පිට්ඨිමංසානි අත්තනොති.

කිංඡන්ද ජාතකං.

2736. යමෙක් තෙම පෙරබන්ධනය හැරදමා පසුව තෘෂ්ණා බන්ධනයෙහි පිහිටියේ වේ ද, හෙතෙම අධර්මයෙහි ද හැසිරෙයි. ඔහුට පාපය ද වැඩේ.

2737. එව, ඒ අඹ උයනට පමුණුවන්නෙමි. එකාන්තයෙන් අඹ ඵල කෙරෙහි මන්දෝත්සාහ වව. සිහිල් වූ අඹ උයනෙහි නො කලකිරී වසව.

2738. මහරජ, මල් රසයෙන් මත් වූ වක් වූ ග්‍රීවා ඇති පක්ෂීන් විසින් නාද කරන ලද ඒ අඹ උයන බලව. ඒ අඹ උයන්හි දිව්‍ය වූ කොස්ලිහිණියෝ ද මොනරු ද ස්වර්ණශාරිකා පක්ෂීහු ද මධුශාරිකා පක්ෂීහු ද වාසය කරත්.

2739. හංස සමූහයා විසින් නාද කරන ලද මේ අඹ උයනෙහි කොවුලෝ නාද කරන්නාහු තමන් ප්‍රබොධ කෙරෙත්. පලබරින් නැමුණු ශාඛා ඇති අඹ වෘක්ෂයෝ මල් හටගැනුමෙන් හැල් පිදුරු ඇති කලවිටි සමාන ය. වතුක් ද හොරගස් ද බක්මී ද පැසුණු පල බරින් යුත් තල්ගස් ද ඇත්තේ යයි කීවා ය.

2740. දිවමල් දරන දිව්‍යමය හිස් වෙළුම් වෙළන, දිව්‍යාභරණ-යෙන් සැරසුණු අංගදාභරණයෙන් යුක්ත වූ රත්හඳුන් ගැල් වූ තෙපි රාත්‍රියෙහි දිව්‍ය සම්පත් අනුභව කරන්නහු ය. දහවල් දුක් වෙදනා විඳින්නහු ය.

2741. යම් මේ සොළොස් දහසක් පිරිවර දිව්‍යස්ත්‍රීහු වෙද්ද ඒ සියලු දිව්‍යස්ත්‍රීහු නුඹට පරිචරණය කරන්නාහ. මෙසේ අද්භූත වූ දුටුවන් ලොමුදහගන්වන්නා වූ මහත්අනුභාව ඇත්තේ වෙහි ය.

2742. මිනිස් ලොවෙහි යම් බඳු කර්මයක් කොට පිටමස් කඩා කන්නෙහි ද? පෙර තමහට ම දුක් එළවන්නා වූ කවර නම් පාප කර්මයක් කෙළෙහි ද?

2743. පෙර ජාතීන්හි මම වේද හදරා කාමයන්හි ඇළුණෙම් වීමි. බොහෝ කලක් අනුන්ට අහිත පිණිස හැසිරුණෙමි.

2744. යමෙක් තෙම අනුන්ගේ පිටමස් කන්නා වූ කේලාම් කියන්නෙක් වේ ද, යම්සේ මම අද තමන්ගේ පිටමස් කන්නෙම් ද මෙසේ හෙ තෙම තමාගේ පිටමස් කඩ කඩා කන්නේ යයි විමාන ප්‍රෙතයා කීයේ යයි වදාළසේක.

කිංඡන්ද ජාතක යි.

2. කුම්භජාතකං

2745. කො පාතුරාසි තිදිවා නභම්හි
ඔභාසයං සංවරිං චන්දිමාව,
ගත්තෙහි තෙ රස්මියො නිච්ඡරන්ති
සතෙරිතා[1] විජ්ජුරිවන්තලික්ඛෙ.

2746. සො ඡින්නවාතං කමසි[2] අසම්හි
වෙහාසයං ගච්ඡසි තිට්ඨසී ච,
ඉද්ධී නු තෙ වත්ථුකතා සුභාවිතා
අනද්ධගුණම්පි දෙවතානං

2747. වෙහාසයං කම්මාගම්ම තිට්ඨසි[3]
කුම්භං කිණාථාති යමෙතමත්ථං,
කො වා තුවං කිස්ස ච තාය කුම්භො
අක්ඛාහි මෙ බ්‍රාහ්මණ එතමත්ථං.

2748. න සප්පිකුම්භො නපි තෙලකුම්භො
න ඵාණිතස්ස න මධුස්ස කුම්භො,
කුම්භස්ස වජ්ජානි අනප්පකානි
දොසෙ බහූ කුම්භගතෙ සුණාථ.

2749. ගළෙය්‍ය යං පිත්වා පතෙ පපාතං
සොබ්භං ගුහං චන්දනියොළිගල්ලං,
බහුම්පි භුඤ්ජෙය්‍ය අභොජනෙය්‍යං
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2750. යං වෙ පිත්වා[4] චිත්තස්මිං[5] අනෙසමානො
ආහිණ්ඩති ගොරිව භක්ඛසාදී,
අනාථමානො උපගායති නච්චති ච
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2751. යං වෙ පිත්වා අචෙලකොව නග්ගො
චරෙය්‍ය ගාමෙ විසිඛන්තරානි,
සම්මූළ්හචිත්තො අතිවෙලසායී*
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2752. යං වෙ පිත්වා වුට්ඨාය පවෙධමානො
සීසඤ්ච බාහුඤ්ච පසාරයන්තො,
සො නච්චති දාරුකටල්ලකොව
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

1. සතෙරතා. – වි.
2. කප්පසි.
3. වෙහාසයංගම්මමාගම්ම තිට්ඨසි – මජසං.
4. යං පිත්වා – වි. මජසං. ස්‍යා.
5. චිත්තසම් – මජසං.
* අතිවෙලචාරිනිපි පාඨො.

2. කුම්භ ජාතකය

2745. බ්‍රාහ්මණය, නුඹ කොහි සිට පහළවූයෙහි ද? දෙව්ලොවින් අවුත් රාත්‍රිය බබුළුවන චන්ද්‍රයා මෙන් අහසෙහි සිටිනෙහි ය. (සිය ගණන් රැලි ඇති) සතෙරිත නම් වූ විදුලිය මෙන් නුඹගේ ශරීරයෙන් රශ්මීහු නික්මෙත්.

2746. ඒ නුඹ වාතය රහිත අහස්හි සිටිනෙහි, පයින් මඟ නොයන්නා වූ දෙවතාවන්ගේ යම් සෘද්ධියක් වේ ද, ඒ සෘද්ධි තොමෝ නුඹ විසින් මනාව මඩනා ලද්දී ප්‍රතිෂ්ඨාවක් මෙන් කරන ලද්දී වෙයි.

2747. අහසෙහි ගමන් කරමින් මෙහි අවුත් සිටිනෙහි. කළය මිල දී ගනිවු යි යම් කරුණක් කියහි ද, ඒ නුඹ කවරෙක් ද? මේ කළය කුමකින් යුක්ත ද? බ්‍රාහ්මණය, මේ කරුණ මට කියව යි සබ්බමිත්ත නම් රජ කීයේ ය.

2748. මහරජ, මේ කළය ගිතෙල් කළයක් නො වෙයි. තලතෙල් කළයක් ද නො වෙයි. උක්සකුරු කළයක් ද නො වෙයි. මීපැණි කළයක් ද නො වෙයි. මේ කළය පිළිබඳ නොයෙක් ආදීනවයෝ ඇත්තාහ. කළයෙහි වූ බොහෝ දොසයන් අසවු.

2749. යම් සුරාවක් පානය කොට ගමන් කරන්නේ පියවරක් පාසා පෙරළෙන්නේ ද, ප්‍රපාතයට ද, වළට ද ගුහාවට ද අපිරිසිදු මඩවළට ද ගවරවළට ද වැටෙන්නේ ද, අනුභව නො කටයුතු බොහෝ දෙයත් අනුභව කරන්නේ ද, ඒ සුරායෙන් පිරුණු මේ කළය මිළදී ගනිවු.

2750. යම් සුරාවක් පානය කොට තම සිතෙහි අධිපති බව නැත්තේ සුරා කසට අනුභව කරන්නා වූ ගවයකු මෙන් ඇවිදී ද, අනාථයකු මෙන් ගයන්නා වූ අනෙකකු දක ගායනය කෙරේ ද නැටීමත් කෙරේ ද ඒ සුරාවෙන් පිරුණු මේ කළය මිලදී ගනිවු.

2751. යම්බඳු සුරාවක් පානය කොට නිර්වස්ත්‍ර තවුසකු මෙන් ගමෙහි හා වීථි අතරෙහි හැසිරේ ද, ඉතා මුළා වූ සිතැතිව බොහෝ වේලා සයනය කෙරෙද්ද, ඒ සුරායෙන් පිරුණු මේ කළය මිලදී ගනිවු.

2752. යම්බඳු සුරාවක් පානය කොට නැගිට හෙතෙම වෙවුලමින් හිස ද අත ද දිගු කරමින් දවමුවා යන්ත්‍රරූපයක් මෙන් නටයි ද, එයින් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2753. යං වෙ පීත්වා[1] අග්ගිදඩ්ඪා සයන්ති
අථො සිගාලෙහිපි ඛාදිතාසෙ,
බන්ධං වධං භොගජානිඤ්චුපෙන්ති
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2754. යං වෙ පීත්වා භාසෙය්‍ය අභාසනෙය්‍යං
සභායමාසීනො අපෙතවත්ථො,
සම්මක්ඛිතො වන්තගතො ව්‍යසන්නො
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2755. යං වෙ පීත්වා උක්කට්ඨො ආවිලක්ඛො[2]
මමෙව සබ්බපඨවීති* මඤ්ඤති,
න මෙ සමො චාතුරන්තොපි රාජා
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2756. මානාතිමානා කලහානි පෙසුනී
දුබ්බණ්ණිනී නග්ගියිනී පලායිනී,
චොරාන ධුත්තාන[3] ගතී නිකෙතො
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2757. ධඤ්ඤං ධනං රජතං ජාතරූපං
ඛෙත්තං ගවං යත්ථ විනාසයන්ති,
උච්ඡෙදනී විත්තවතං කුලානං
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2758. ඉද්ධානි ඵීතානි කුලානි අස්සු
අනෙකසාහස්සධනානි ලොකෙ,
උච්ඡින්නදායජ්ජකතානිමාය
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2759. යං පීත්වා දුට්ඨරූපොව පොසො
අක්කොසති පිතරං මාතරඤ්ච,
සස්සුම්පි ගණ්හෙය්‍ය අථොපි සුණ්හං
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2760. යං වෙ පීත්වා දුට්ඨ[4]රූපාව නාරී
අක්කොසති සසුරං සාමිකඤ්ච,
දසම්පි ගණ්හෙ පරිචාරකම්පි
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

---

1. පිවිත්වා – මජ්සං, ස්‍යා.
2. අතවෙලවාර් තිපි පාඨො
* සබ්බාපඨවීති පි පාඨො.
3. චොරානං ධුත්තානං – වි. මජ්සං.
4. දිත්ත – වි. මජ්සං.

2753. යම් සුරාවක් පානය කොට ගින්නෙන් දැවුණක්හු (මෙන්) ශයනය කෙරෙද්ද. වැලිදු සිඟාලයන් විසිනුත් කනුලබත් ද බන්ධනයට ද වධයට ද සම්පත් පිරිහීමට ද පත්වෙත් ද ඒ සුරායෙන් පිරුණු කළය මිල දී ගනිවු.

2754. යම්බඳු සුරාවක් පානය කොට නො කියයුත්ත කියන්නේ ද, සභායෙහි හුන්නේ පහවූ වස්ත්‍ර ඇත්තේ ද කුණු තැවරීම් සහිතව සිය වමනයෙහි ගැලුණේ ව්‍යසනයට පැමිණියේ වේ ද, ඒ සුරායෙන් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2755. යම්බඳු සුරාවක් පානය කොට මම හැමට ම වඩා උත්කෘෂ්ඨ වෙමි යි සිතා ද, කැළැඹුණු ඇස් ඇත්තේ ද, සියලු පෘථිවිය මාගේ යයි හඟී ද, සතර දිශාවට අධිපති රජෙක් ද මා හා සම නො වේයයි සිතා ද, එබඳු සුරායෙන් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2756. යම් සුරාවක් පානය කොට මානය ඇත්තාහු අධික මානය ඇත්තාහු වෙද්ද, කලහ ඇත්තාහු කේලාම් කියන්නාහු වෙද්ද, අයහපත් වර්ණ ඇත්තාහු නග්න භාවය ඇත්තාහු පලායන්නෝ ද, සොරුන්ගේත් ධූර්තයන්ගේත් නිෂ්පත්තියට නිවාසස්ථාන වේ ද, එබඳු සුරායෙන් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2757. සුරාපානය කළා වූ යම් කුලයෙක්හි ධාන්‍ය ද ධනය ද රන්රිදී ද කෙත් ද ගවයෝ ද යන මේ වස්තූහු විනාශයට යෙත් ද, යමක් පොහොසත් කුලයන්ගේ විනාශය ඇති කෙරේ ද, එබඳු සුරායෙන් පිරුණු මේ කළය මිලදී ගනිවු.

2758. ලෙව්හි නොයෙක් දහස් ගණන් ධනය ඇති සමෘද්ධ වූ වස්ත්‍රාලංකාරාදියෙන් පිරිගියා වූ යම් කුලයෝ වූහු ද, ඒ සියල්ල මේ සුරායෙන් සිඳුණු ධනය ඇති කුල බවට පමුණුවන ලද්දේය. ඒ සුරායෙන් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2759. යම් සුරාවක් පානය කොට දුෂ්ට ස්වභාව ඇති පුරුෂ තෙම පියාට ද මවට ද ආක්‍රොෂ කෙරේ ද, නැන්දනිය ද භාර්‍ය්‍යාව යයි සිතා අතින් අල්ලාගන්නේ ද, ලේළිය ද භාර්‍ය්‍යාව යයි සිතා අතින් අල්ලාගන්නේ ද එබඳු සුරායෙන් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2760. යම් සුරාවක් පානය කොට දුෂ්ට ස්වභාව ඇති ස්ත්‍රී තොමෝ මාමාට ද ස්වාමිපුරුෂයාහට ද ආක්‍රොෂ කරන්නී ද, දාසයා ද සමීපයෙහි හැසිරෙන තැනැත්තා ද ස්වාමි පුරුෂයා යයි (කෙලෙස් වශයෙන්) ගන්නී ද, ඒ සුරායෙන් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2761. යං වෙ පිවිත්වාන[1] හනෙය්‍ය පොසො
ධම්මෙ ඨිතං සමණං බ්‍රාහ්මණං වා,
ගච්ඡෙ අපායම්පි තතො නිදානං
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2762. යං වෙ පිත්වා දුච්චරිතං චරන්ති
කායෙන වාචාය ච චෙතසා වා,
නිරයං වජන්ති දුච්චරිතං චරිත්වා
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2763. යං යාචමානා න ලභන්ති පුබ්බෙ
බහුං හිරඤ්ඤම්පි පරිච්චජන්තා,
සො තං පිවිත්වා අලිකං භණාති
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2764. යං වෙ පිත්වා පෙසනෙ පෙසයන්තො
අච්චායිකෙ කරණීයම්හි ජාතෙ,
අත්ථම්පි සො නප්පජානාති වුත්තො
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2765. හිරීමනාපි අහිරීකභාවං
පාතුං කරොන්ති මදනාය මත්තා,
ධීරාපි සන්තා බහුකං භණන්ති
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2766. යං වෙ පිත්වා එකථූපා සයන්ති
අනාසකා ථණ්ඩිලදුක්ඛසෙය්‍යං,
දුබ්බණ්ණියං ආයසක්‍යඤ්චුපෙන්ති
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

2767. යං වෙ පිත්වා පත්තක්ඛන්ධා සයන්ති
ගාවො කූටහතාරිව
න හි වාරුණියා වෙගො
නරෙන සුස්සහොරිව.

2768. යං මනුස්සා විවජ්ජෙන්ති[2] සප්පං ඝොරවිසම්ඉව,
තං ලොකෙ විසසමානං කො නරො පාතුමරහති.

2769. යං වෙ පිත්වා අන්ධකවෙණ්හුපුත්තා
සමුද්දතීරෙ පරිචාරයන්තා,
උපක්කමුං මුසලෙහ අඤ්ඤමඤ්ඤං
තස්සා පුණ්ණං කුම්භමිමං කිණාථ.

1. පිත්වාන – සයා.
2. විවජ්ජන්ති – මජසං.

2761. යම් සුරාවක් පානය කළ පුරුෂ තෙම දහම්හි හැසිරෙන ශ්‍රමණයකුට හෝ බ්‍රාහ්මණයකුට හෝ හිංසා කෙරේ ද, ඒ හෙතු-වෙන් අපායට යන්නේ ද, ඒ සුරායෙන් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2762. යම් සුරාවක් පානය කොට කයින් හෝ සිතින් හෝ දුසිරිත්හි හැසිරෙද්ද, දුසිරිත්හි හැසිර නිරයට යෙද්ද, ඒ සුරායෙන් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2763. පෙර බොහෝ වූ රන් පරිත්‍යාග කරමින් යදින්නාහු නමුත් යමකු ලවා බොරු කියැවීම නො ලබත් ද, හෙතෙම ඒ සුරාව පානය කොට බොරු කියා ද එබඳු සුරායෙන් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2764. යම් සුරාවක් පානය කොට, ඉක්මන් කටයුත්තක් ඇති කල්හි පණිවිඩ යැවිය යුතු කරුණෙක්හි ලා පණිවිඩය සඳහා යවනු ලබන්නේ (කුමක් පිණිස ආයෙහි ද යි) විචාරන ලද්දේ කියන ලද කරුණ නොදනී ද එබඳු සුරායෙන් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2765. ලජ්ජා සහගත සිත් ඇත්තාහු ද, සුරාමදයෙන් මත්වූවාහු නිර්ලජ්ජාගතිය පහළ කෙරෙද්ද, ධීරවුවත් බොහෝ කොට බෙණෙද්ද, එබඳු සුරායෙන් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2766. යම් සුරාවක් පානය කොට ඌරු පැටවුන් මෙන් පහත් කුල ඇත්තවුන් සමහත් එක්රැස් වූවාහු නිරාහාරව බිම දූකසේ සයනය කෙරෙද්ද, දුර්වර්ණ භාවයට හා නින්දවටත් පැමිණෙත් ද, එබඳු සුරායෙන් පිරුණා වූ මේ කළය මිල දී ගනිවු.

2767. ඉදින් යම් සුරාවක් පානය කොට, පාශයෙන් පෙළුණු ගවයන් මෙන් කර බාගෙන හොවිත් ද. ඒ සුරාපාන වේගය මිනිසා විසින් නො ඉසිලිය හැක්කේ ය.

2768. මනුෂ්‍යයෝ යම් සුරාවක් විෂ ඝෝර සර්පයකු මෙන් දුරු කෙරෙද්ද. ලොකයෙහි විෂ හා සම එය කවර මිනිසෙක් පානය කරන්නට සුදුසු වේ ද?

2769. යම් සුරාවක් පානය කොට අන්ධක වෙණ්හුපුත්‍ර නම් දසබෑ රජ දරුවෝ මුහුදු තෙර හැසිරෙන්නාහු මොහොලින් ඔවු-නොවුන්ට පහර දුන්නාහු ද එබඳු සුරායෙන් පිරුණු මේ කළය මිල දී ගනිවු.

2770. යං වෙ පීත්වා පුබ්බදෙවා පමත්තා
තිදිවා චුතා සස්සතියා සමායා,
තං තාදිසං මජ්ජමිමං නිරත්ථකං
ජානං මහාරාජ කථං පිබෙය්‍ය.

2771. නයිමස්මිං කුම්භස්මිං දධි වා මධුං වා
එවං අභිඤ්ඤාය කිණාහි රාජ,
එවං හි මං කුම්භගතා මයා තෙ
අක්ඛාතරූපං තව සබ්බමිත්ත.

2772. න මෙ පිතා වා අථවාපි මාතා
එතාදිසො යාදිසකො තුවංසි,
හිතානුකම්පී පරමත්ථකාමො
සොහං කරිස්සං වචනං තවජ්ජ.

2773. දදමි තෙ ගාමවරානි පඤ්ච
දසීසතං සත්ත ගවං සතානි,
ආජඤ්ඤයුත්තෙ ච රථෙ දසා ඉමෙ
ආචරියො හොසි මමත්ථකාමො.

2774. තවෙව දසී සතමත්ථු රාජ
ගාමා ච ගාවො ච තවෙව හොන්තු,
ආජඤ්ඤයුත්තා ච රථා තවෙව
සක්කො හමස්මි[1] තිදසානමින්දො.

2775. මංසොදනං සප්පිපායසඤ්ච[2] භුඤ්ජ
ඛාදස්සු ච ත්වං මධුමාසපූවෙ,[3]
එවං තුවං ධම්මරතො ජනින්ද
අනින්දිතො සග්ගමුපෙහි ඨානන්ති.

කුම්භජාතකං.

3. ජයද්දිසජාතකං.

2776. චිරස්සං වත මෙ උදපාදි අජ්ජ
භක්ඛො මහා සත්තමිභත්තකාලෙ,
කුතොසි කො වාසි තදිඞ්ඝ බ්‍රූහි
ආචික්ඛ ජාතිං විදිතො යථාසි.

1. හමස්මිං – සීමු.
2. සප්පිපායාස – වි. මජසං.
3. මධූනාසපූපෙ – වි. මජසං.

2770. ඉදින් යම් සුරාවක් පානය කොට ප්‍රමාදපත්න වූ මායා සහිත අසුරයෝ ශාස්වත යයි සම්මත වූ (තව්තිසා) දෙව් ලොවින් චුත වූවාහු ද, මහරජ, ඒ මේ සුරාව එබඳු නිරර්ථක එකෙකැයි දන්නේ (නුඹ වැන්නෙක්) කෙසේ නම් පානය කෙරේ ද?

2771. මහරජ, මේ කළයෙහි දී හෝ මී හෝ නො වේ යයි මෙසේ දැනගෙන මිල දී ගනුව. සබ්බමිත්ත නම් රජතුමනි, මෙසේ වනාහි මේ කළයෙහි වූ දේ ස්වභාව වශයෙන් මා විසින් නුඹට කියන ලද්දේ යැයි (බමුණු වෙසින් ආ ශක්‍රයා කීයේ ය.)

2772. (බ්‍රාහ්මණය,) නුඹ යම්බඳු හිතානුකම්පා ඇත්තෙක් උතුම් වැඩ කැමැත්තෙක් වෙහි ද, මාගේ පියා හෝ මව හෝ මෙබඳු නො වෙයි. අද ඒ මම නුඹගේ වචනය පිළිපදිනෙමි.

2773. මම නුඹට ගම්වර පසක් ද දසීන් සියයක් ද ගවයන් සත් සියයක් ද මේ ආජඤ්ඤ අශ්වයන් යෙදූ රිය දසය ද දෙමි. මට වැඩ කැමති නුඹ ඇදුරු වෙහි.

2774. මහරජ, දසීන් සියය නුඹට ම වේවා. ගම්වර ද ගවයෝ ද නුඹට ම වෙත්වා. ආජඤ්ඤ අශ්වයන් යෙදූ රිය ද නුඹට ම වේවා. මම වනාහි දෙවියන්ට අධිපති වූ ශක්‍ර වෙමි.

2775. මහරජ, නුඹ මාංශයෙන් යුත් බත ද ගිතෙල් හා කිරි ද වළඳුව. මීයෙන් යුක්ත වූ මැවලින් කළ කැවුම් ද අනුභව කරව. මෙසේ නුඹ ධර්මයෙහි ඇලුණේ නින්ද නො ලබන්නෙක් ව ස්වර්ග ලොකයට (උප්පත්ති වශයෙන්) යව.

කුම්භ ජාතක යි.

3. ජයද්දිස ජාතකය

2776. එකාන්තයෙන් නිරාහාර වැ සිටිනා වූ මට සත්වැනි දිනයෙහි ආහාර වේලාව පැමිණි කල්හි බොහෝ කලකින් කෑ යුතු ආහාරයක් පහළ විය. තෙපි කොහි සිට ආවහු ද කවරෙක් හෝ වවූ ද එය යම්සේ මම දන්නා ලද්දෙම් වෙම් ද එසේ තොපගේ ජාතිය කියව.

2777. පඤ්චාලරාජා මිගවං පවිට්ඨො[1]
ජයද්දිසො නාම යදිස්සුතො තෙ,
චරාමි කච්ඡානි වනානි චාහං
පසදිමං[2] ඛාද මමජ්ජ මුඤ්ච.

2778. සෙනෙව ත්වං පණසි සස්සමානෙ[3]
මමෙසො භක්ඛො පසදෙ යං වදෙසි,
තං ඛාදියාන පසදං ජිඝඤ්ඤං*
ඛාදිස්සං පච්ඡා න විලාපකාලො.

2779. න චත්ථි මොක්ඛො මම විඤ්ඤයෙන[4]
ගන්ත්වාන පච්ඡා ගමනාය පණ්හෙ,
තං සඞ්ගරං බ්‍රාහ්මණස්සප්පදාය
සච්චානුරක්ඛී පුනරාවජිස්සං.

2780. කිං කම්මජාතං අනුතප්පතී තං[5]
පත්තං සමීපං මරණස්ස රාජ,
ආචික්ඛ මෙ තං අපි සක්කුණෙමු
අනුජානිතුං ආගමනාය පණ්හෙ.

2781. කතා මයා බ්‍රාහ්මණස්ස ධනාසා
තං සඞ්ගරං පටිමොක්ඛං[6] න මුත්තං,
තං සඞ්ගරං බ්‍රාහ්මණස්සප්පදාය
සච්චානුරක්ඛී පුනරාවජිස්සං.

2782. යං තෙ කතා බ්‍රාහ්මණස්ස ධනාසා
තං සඞ්ගරං පටිමොක්ඛං න මුත්තං,
තං සඞ්ගරං බ්‍රාහ්මණස්සප්පදාය
සච්චානුරක්ඛී පුනරාවජස්සු.

2783. මුත්තො ච සො පුරිසාදස්ස හත්ථා
ගන්ත්වා සකං මන්දිරං කාමකාමී,
තං සඞ්ගරං බ්‍රාහ්මණස්සප්පදාය
ආමන්තයී පුත්ත මලීනසත්තං.[7]

2784. අජ්ජෙව රජ්ජං අභිසෙචයස්සු
ධම්මඤ්ච රට්ඨෙසු ජනෙසු චාපි,[8]
අධම්මකාරො ච තෙ මාහු රට්ඨෙ
ගච්ඡාමහං පොරිසාදස්ස ඤාතෙ.

---

1. පවුට්ඨො – වි.
2. පසදං ඉමං – වි.
3. සඤ්ඤමානො – වි. මජසං. ස්‍යා.
* ජිඝච්ඡන්ති භවිතබ්බං
4. නික්කයෙන – මජසං. ස්‍යා.
5. අනුතප්පෙත්වං – මජසං.
6. පටිමුක්කං – මජසං.
7. මලීනසත්තුං – වි. මජසං. ස්‍යා.
8. ධම්මං චරස්සු පුරෙසුවාපි. – ම. ධම්මංචරෙසෙසු පරෙසු – මජසං.

2777. මුව දඩයමට පිවිසියා වූ ජයද්දිස නම් වූ පංචාල රජ තොප විසින් අසන ලද්දේ ද ඒ මම පර්වත පාර්ශවයන්හි ද වනයන්හි ද හැසිරෙමි. මේ පසදම්ෘගයා අනුභව කරව. අද මා මුදවයි ජයද්දිස රජ තෙම කීයේ ය.

2778. මා විසින් හිංසා කරනු ලබන තෙපි මා සතු දෙයින් ම තමා විකුණාගන්නහු යැ. තා පළමු අනුභව කොට අනුභව කරනු කැමැති වූ මේ පසද මුවා පසුව කන්නෙමි. තොපට මේ වැලැපීමට කාලය නො වේ යයි යක්ෂ තෙම කීයේ ය.

2779. ඉදින් මට ගනුදෙනුවෙන් මිදීමෙක් නැද්ද, එහෙයින් ගොස් බමුණාට ඒ පොරොන්දු ධනය දී හෙට උදෑසන පෙරළා ඊමට ප්‍රතිඥා ගනුව. සත්‍යවචනය රක්නෙම් නැවත මෙහි එන්නෙමි යි රජ තෙම කීයේ ය.

2780. මහරජ, මරු සමීපයට පැමිණි තොප කිනම් කර්මයක් තවා ද? හෙට උදෑසන ඊමට හැක්කහු නම්, අවසර දෙන්නට හැක්කෙමු. එය මට කියව යි කීයේ ය.

2781. මා විසින් බ්‍රාහ්මණයාහට යම් ධනාශාවක් කරන ලද්දී නම්, එය මා විසින් නොමුදන ලදී. ඒ පොරොන්දුව බ්‍රාහ්මණයාහට දී සත්‍යවචනය රකිමින් නැවත පෙරළා එන්නෙමි යි රජ තෙම කීයේ ය.

2782. තොප විසින් බ්‍රාහ්මණයාහට යම් ධනාශාවක් ඇති කරන ලද්දී නම් ඒ පොරොන්දු ඇපය නොමුදන ලද්දේ ය. බ්‍රාහ්මණයාහට ඒ පොරොන්දු ධනය දී සත්‍ය රක්නේ නැවත පැමිණෙව යි යක්ෂ තෙම කීයේ ය.

2783. කාමයන් කැමැති හෙ පොරිසාදයාගේ අතින් මිදුණේ සිය මැදුරට ගොස් ඒ පොරොන්දු ධනය බ්‍රාහ්මණයාහට දී අලීනසත්ත නම් පුත් කුමරු කැඳවූයේ ය.

2784. පුත්‍රය, අද ම රාජ්‍යයෙහි අභිසෙක වෙව. රටවැසියන් කෙරෙහි ද ජනයන් කෙරෙහි ද දැහැමින් රාජ්‍යය කරව. තොපගේ රටෙහි අධර්මයෙන් රාජ්‍යය කිරීමෙක් නම් නො වෙවා, මම පොරිසාදයාගේ සමීපයට යමි.

2785. කිං කම්ම කුබ්බං තව දෙව පාදෙ
නාරාධයිං තදිච්ඡාමි සොතුං,
යමජ්ජ රජ්ජම්හි උදස්සයෙ ත්වං
රජ්ජම්පි න ඉච්ඡෙය්‍යං[1] තයා විනා අහං.

2786. න කම්මුනා වා වචසාව තාත
අපරාධිතොහං තුවියං සරාමි,
සන්ධිඤ්ච කත්වා පුරිසාදකෙන
සච්චානුරක්ඛී පුනහං ගමිස්සං.

2787. අහං ගමිස්සාමි ඉධෙව හොහි
නත්ථි තතො ජීවතො විප්පමොක්ඛො,
සචෙ තුවං ගච්ඡසියෙව රාජ
අහම්පි ගච්ඡාමි උභො න හොම.

2788. අද්ධා හි තාත සතානෙස ධම්මො
මරණා ච මෙ දුක්ඛතරං තදස්ස,
කම්මාසපාදෙ තං යද පචිත්වා
පසය්හ ඛාදෙ හිද රුක්ඛ[2]සූලෙ.

2789. පාණෙන තෙ පාණමහං නිමිස්සං
මා ත්වමගො පොරිසාදස්ස සන්තෙ,
එතඤ්ච තෙ පාණමහං නිමිස්සං
තස්මා මතං ජීවිතස්ස වරෙමි.[3]

2790. තතො හවෙ ධිතිමා රාජපුත්තො
වන්දිත්වා මාතුච්ච පිතුච්ච පාදෙ,
දුක්ඛිනිස්ස මාතා නිපතී පථබ්‍යා[4]
පිතස්ස පග්ගය්හ භුජානි කන්දති.

2791. තං ගච්ඡන්තං තාව පිතා විදිත්වා
පරම්මුඛො වන්දති පඤ්ජලීකො,[5]
සොමො ච රාජා වරුණො ච රාජා
පජාපතී චන්දිමා සූරියො ච
එතෙහි ගුත්තො පුරිසාදකම්හා
අනුඤ්ඤාතො සොත්ථි පච්චෙහි තාත.

2792. යං දණ්ඩකාරඤ්ඤගතස්ස මාතා
රාමස්සකා[6] සොත්ථානං සුගුත්තා,
තන්තෙ අහං සොත්ථානං කරොමි
එතෙන සච්චෙන සරන්තු දෙවා.
අනුඤ්ඤාතො සොත්ථි පච්චෙහි පුත්ත.

---

1. නිච්ඡෙය්‍ය – මජසං.
2. හිදරුක්ඛ – මජසං.
3. වණ්ණෙමි – වි. මජසං. සයා.
4. නිපාතාපථබ්‍යා – වි – පථව්‍යා – මජසං.,
5. පඤ්ජලීසො – වි. පඤ්ජලිංසො – මජසං.,
6. රාමස්සකාසි – මජසං,

2785. දේවයන් වහන්ස, නුඹ වහන්සේට කිනම් කර්මයක් කරමින් සතුටු නො කෙළෙම් ද? යම් හෙයකින් අද නුඹ මා රාජ්‍ය-යෙහි අභිෂේක කරන්නෙහි ද, එය අසන්නට කැමැත්තෙමි. නුඹ වහන්සේගෙන් වෙන් ව මම රාජ්‍යය ද නො කැමැත්තෙමි කුමාරයා කීයේ ය.

2786. පුත්‍රය, මම නුඹගේ ක්‍රියාවකින් හෝ වචනයෙකින් හෝ සිදු වූ අපරාධයක් සිහි නො කරමි. මම පොරිසාදයා සමග පොරොන්දුවක් වී ආයෙමි. සත්‍යය රක්නෙම් නැවත මම එහි යන්නෙමි යි රජ තෙම කීයේ ය.

2787. පියාණන් වහන්ස, මම යන්නෙමි. නුඹ වහන්සේ මෙහි ම වුව මැනැවි. ඒ පොරිසාදයා කෙරෙන් ජීවත්වන්නහුගේ මිදීමෙක් නම් නැත්තේ ය. ඉදින් නුඹ යන්නෙහි ම නම් මම ද යන්නෙමි. එසේ ඇති කල්හි අපි දෙදෙනා ම නො වන්නෙමු යි කුමාර තෙම කීයේ ය.

2788. පුත්‍රය, මෙය ඒකාන්තයෙන් ම සත්පුරුෂයන්ගේ ස්ව-භාවය වේ. එසේ වුවත් යම් දවසක කම්මාසපාද නම් වූ පොරිසාද තෙම තියුණු හුලින් ඇන පලහා නුඹ කන්නේ ද එය මට මරණයටත් වඩා දුකෙකැ යි රජ තෙම කීයේ ය.

2789. පිය රජ්පුරුවෙනි, මම නුඹවහන්සේගේ පණින් මාගේ පණ පරිවර්තනය කරන්නෙමි. නුඹ වහන්සේ පොරිසාදයාගේ ළඟට නො යන සේක්වා, යම් හෙයෙකින් නුඹ වහන්සේගේ ප්‍රාණය හා මාගේ ප්‍රාණය මාරු කරන්නෙමි, යන යමෙක් ඉවිද එහෙයින් මම ජීවත්වීමට වඩා මරණය කැමැත්තෙමි යි කීයේ ය.

2790. ඉන්පසු ඒකාන්තයෙන් ධෛර්‍ය්‍යවත් රාජපුත්‍ර තෙමේ මවගේ ද පියාගේ ද පා වැන්දේ ය. මොහුගේ මවු තොමෝ දුක් ඇත්තී බිම ඇද වැටුණීය. මොහුගේ පිය තෙම අත් බැඳගෙන හඬයි.

2791. පළමු කොට පියරජ තෙමේ යනනා වූ ඔහු දැන ඇඳිලිබැඳගත්තේ වඳියි. පුත්‍රය, සොම දෙව්රජ ද වරුණ දෙව්රජ ද මහබ්‍රහ්ම ද සඳ ද හිරු ද, යන මේ දෙවියන් විසින් රක්නා ලද නුඹ පොරිසාදයා කෙරෙන් අවසර ලද්දේ සුවසේ පෙරළා පැමි-ණෙත්වා යි ආශංසනය කෙළේ ය.

2792. දණ්ඩකාරණ්‍යයට ගියා වූ රාම නම් තැනැත්තහුට මනාව රක්නා ලද ඔහුගේ මව යම්බඳු සුවයක් කළා ද, ඒ සුවය මම අද නුඹට කරමි. පුත්‍රය, මේ සත්‍යය කරණකොට ගෙන දෙවියෝ සිහි කරත්වා, පොරිසාදයාගෙන් අවසර ලද්දෙහි සුවසේ පෙරළා එවයි මව සත්‍යක්‍රියා කළා ය.

2793. ආවී රහො වාපි මනොපදොසං
නාහං සරෙ ජාතුමලීනසත්තො,
එතෙන සච්චෙන සරන්තු දෙවා
අනුඤ්ඤාතො සොත්ථි පච්චෙහි තාත.

2794. යස්මා ච මෙ අනධිමනොසි සාමි
නචාපි මෙ මනසා අප්පියොසි,
එතෙන සච්චෙන සරන්තු දෙවා
අනුඤ්ඤාතො සොත්ථි පච්චෙහි සාමි.

2795. බ්‍රහා උජු චාරුමුඛො කුතොසි
න මං පජානාසි වනෙ වසන්තං,
ලුද්දඤ්හි මං ඤත්වා පුරිසාදකොති
කො සොත්ථිමාජානමිධාවජෙය්‍ය.

2796. ජානාමි ලුද්ද පුරිසාදකො ත්වං
න තං න ජානාමි වනෙ වසන්තං,
අහඤ්ච පුත්තොස්මි ජයද්දිසස්ස
මමජ්ජ ඛාද පිතුනො පමොක්ඛා.

2797. ජානාමි පුත්තොති ජයද්දිසස්ස
තථාහි වො මුඛවණ්ණො උභින්නං,
සුදුක්කරඤ්ඤෙව කතං තවෙදං
යො මත්තුමිච්ඡෙ[1] පිතුනො පමොක්ඛා.

2798. න දුක්කරං කිඤ්චිමහෙත්ථ මඤ්ඤෙ
යො මත්තුමිච්ඡෙ පිතුනො පමොක්ඛා,
මාතුච[2] හෙතු පරලොකගම්‍යා[3]
සුඛෙන සග්ගෙන ච සම්පයුත්තො.

2799. අහඤ්ච ඛො අත්තනො පාපකිරියං
ආවී රහො වාපි සරෙ න ජාතු,
සඞ්ඛාතජාතිමරණොහමස්මි
යථෙව මෙ ඉධ තථා පරත්ථ.

2800. ඛාදජ්ජ මං දානි මහානුභාව
කරස්සු කිච්චානි ඉමං සරීරං,
රුක්ඛස්ස වා තෙ පපතාමි අග්ගා
ඡාදයමානො මය්හං ත්වමදෙසි මංසං.

1. යො මත මිච්ඡෙ - මජසං.
2. මාතුච - වී. මජසං.
3. පරලොකං ගන්ත්වා - මජසං.

2793. අලීනසත්තු නම් මාගේ සහොදරයා ඉදිරියෙහි හෝ රහසින් හෝ කළ සිත් වේදනාවක් එකාන්තයෙන් මම සිහි නො-කරමි. සහොදරය, මේ සත්‍යය කරණකොට ගෙන දෙවියෝ සිහි කෙරෙත්වා, සහොදරය, පොරිසාදයාගෙන් අවසර ලද්දෙහි සුවසේ පෙරළා එවයි නැගණිය සත්‍යක්‍රියා කළා ය.

2794. මාගේ ස්වාමී වූ අලීනසත්තු කුමාරයාණෙනි, යම්හෙයෙ-කින් නුඹ වහන්සේ මා නො ඉක්මවාලූ සිත් ඇත්තහු ද එසේ ම මාගේ සිතින් ද නුඹ වහන්සේ අප්‍රිය නොවහු ද, මේ සත්‍ය-යෙන් දෙවියෝ සිහි කෙරෙත්වා, පොරිසාදයා කෙරෙන් අවසර ලද්දහු සුවසේ පෙරළා පැමිණෙත්වා යි අගමෙහෙසිය සත්‍යක්‍රියා කළා ය.

2795. මහත් වූ ඍජු වූ මනොඥ වූ මුහුණක් ඇති නුඹ කොයි සිට ආයෙහි ද? වනයෙහි වසන්නා වූ මා ගැන නො දන්නෙහි ද? රෞද්‍ර වූ මා පුරුෂයන් කන්නෙකැයි දන්නා කවරෙක් නම් සුව පතා මෙහි එන්නේ ද?

2796. රෞද්‍ර වූ තැනැත්ත, නුඹ පුරුෂයන් කන්නෙකැ යි මම දනිමි. වෙනෙහි වෙසෙන්නා වූ නුඹ ගැන නො දන්නෙම් නො-වෙමි. මම් වනාහි ජයද්දිස රජුගේ පුත්‍ර වෙමි. පියාගේ මිදීම හෙතු කොටගෙන අද මා කව යි අලීනසත්තු කුමාරයා කීයේ ය.

2797. නුඹ වහන්සේ ජයද්දිස රජුගේ පුත්‍රයා යයි දනිමි. තමුන්නාන්සේලා දෙදෙනාගේ ම මුඛවර්ණය එකාකාර ය. යමෙක් පියාගේ මිදීම හෙතු කොට ගෙන මරණයට කැමැති වේ නම්, මෙය නුඹ විසින් කරන ලද ඉතා දුෂ්කර දෙයකි.

2798. යමෙක් පියාගේ මිදීම හෙතු කොට ගෙන හෝ මවගේ මිදීම හෙතු කොට ගෙන හෝ මරණයට කැමැති වන්නේ නම්, හෙතෙම පරලොව ගොස් ස්වර්ගයෙහි වූ සැපයෙන් යුක්ත වේ. එහෙයින් මෙහි ලා කිසි දුෂ්කරයක් ගැන නො හඟිමි යි කුමාර තෙමේ කීයේ ය.

2799. මම ද වනාහි ඉදිරියෙහි හෝ රහසිගත ව හෝ කිසි-විටෙකැ තමන්ගේ පාපක්‍රියාවක් සිහි නො කරමි. මම නුවණින් පිරිසිඳින ලද ජාති මරණ ඇත්තෙම් වෙමි. මට මේ ලොකයෙහි යම්සේ ද පරලොව ද එසේම ය.

2800. මහත් අනුභාව ඇත්ත, අද මා අනුභව කරව. මේ ශරීරයෙන් කළයුතු වැඩ කරව. ගස් කෙළවරකින් හෝ තා පිණිස මම වැටෙමි. කැමැති වන්නෙහි නුඹ මාගේ මස් අනුභව කරව යි කුමාර තෙම කීයේ ය.

2801. ඉදඤ්ච තෙ රුච්චති රාජපුත්ත
චජාසි පාණං පිතුනො පමොක්ඛා,
තස්මාතිහ ත්වං[1] තරමානරූපො
සම්භඤ්ජ කට්ඨානි ජලෙහි අග්ගිං.

2802. තතො හවෙ ධිතිමා රාජපුත්තො
දරුං[2] සමාහත්ව[3] මහන්තමග්ගිං,
ආදීපයිත්වා[4] පටිවෙදයිත්ථ
ආදීපිතොදනි මහායමග්ගි.

2803. ඛාදජ්ජ මං දනි පසය්හකාරි
කිං මං මුහුං පෙක්ඛසි හට්ඨලොමො,
තථා තථා තුය්හමහං කරොමි
යථා යථා මං ඛාදයමානො[5] අදෙසි.

2804. කො තාදිසං අරහති ඛාදිතායෙ
ධම්මෙ ඨිතං සච්චවාදිං වදඤ්ඤුං,
මුද්ධාපි තස්ස විඵලෙය්‍ය සත්තධා
යො තාදිසං සච්චවාදිං අදෙය්‍ය.

1805. ඉදං හි සො* බ්‍රාහ්මණං[6] මඤ්ඤමානො
සසො අවාසෙසි සකෙ සරීරෙ,
තෙනෙව සො චන්දිමා දෙවපුත්තො
සසත්ථුතො කාමදුහජ්ජ යක්ඛ.

2806. චන්දො යථා රාහුමුඛා පමුත්තො
විරොචතෙ පණ්ණරසෙව භානුමා,
එවං තුවං පොරිසාද පමුත්තො
විරොච කම්පිල්ල මහානුභාව,
ආමොදයං පිතරං මාතරඤ්ච
සබ්බො ච තෙ නන්දතු ඤාතිපක්ඛො.

2807. තතො හවෙ ධිතිමා රාජපුත්තො
කතඤ්ජලී පරියගා[7] පොරිසාදං,
අනුඤ්ඤාතො සොත්ථි සුඛී අරොගො
පච්චාගමා කම්පිල්ලමලීනසත්තො.

2808. තං නෙගමා ජානපද ච සබ්බෙ
හත්ථාරොහා රථිකා පත්තිකා ච,
නමස්සමානා පඤ්ජලිකා උපාගමුං
නමත්ථු තෙ දුක්කරකාරකොසීති.

ජයද්දිසජාතකං.

1. තස්මාහි සො ත්වං – මජසං.
2. දරුං – මජසං., ස්‍යා.
3. සමාහිත්වා – මජසං.,
4. සන්දීපයිත්වා – වි. මජසං.
5. ඛාදමානො – මජසං., ස්‍යා.
* 'ඉදංහි සො' ඉති සබ්බත්ථ. 'ඉදං හි සො' ඉති භවිතබ්බං.
6. බ්‍රාහ්මණ – මජසං.
7. පරිග්ගය්හ – ස්‍යා. පරියාය – මජසං.

2801. රාජපුත්‍රය, නුඹ පියාගේ මිදීම කැමැත්තෙහි ප්‍රාණය හරනෙහි. එහෙයින් නුඹ වහා හර ඇති දර ගෙනවුත් ගිනි දල්වව.

2802. ඉන්පසු නුවණැති රාජපුත්‍ර තෙමේ දර රැස්කොට මහත් වූ ගින්නක් දල්වා දූන් මේ මහගින්නක් මා විසින් දල්වන ලද්දේ යයි දැන්වී ය.

2803. බලාක්කාරකම් කරන ස්වභාවය ඇති තැනැත්ත, අද දූන් මා අනුභව කරව. ලොමුදහගත්තේ කුමක් නිසා මා දෙස නැවත නැවත බලන්නෙහි ද? යම් යම් පරිද්දෙකින් කැමැති වන්නෙහි මා අනුභව කරන්නෙහි ද? ඒ ඒ පරිද්දෙන් නුඹගේ වචනය මම කරමි යි කුමාර තෙම කීයේ ය.

2804. ධර්මයෙහි පිහිටි සත්‍ය වචන ඇති ප්‍රතිග්‍රාහකයන්ගේ වචන දන්නා වූ නුඹ වැන්නකු අනුභව කරන්නට කවරෙක් නම් සුදුසු වේ ද? යමෙක් නුඹ වැනි සත්‍ය වචන ඇත්තකු අනුභව කරන්නේ නම් ඔහුගේ මුදුන ද සත්කඩක් වැ පැළෙන්නේ යයි පොරිසාදයා කීයේ ය.

2805. මේ වනාහි සස පණ්ඩිත තෙම බ්‍රාහ්මණයෙකැ යි හඟිමින් ස්වකීය ශරීරමාංශය දීම පිණිස බමුණා වාසය කරවී ද යක්‍ෂය, එහෙයින් ම ඒ චන්ද්‍රදිව්‍යපුත්‍ර තෙම සසලාඤ්ඡන සහිත වූයේ ප්‍රසිද්ධ වැ ප්‍රේම වර්ධනය කරන්නේය යි කීයේ ය.

2806. යම්සේ රාහුමුඛයෙන් මිදුණු පසළොස්වක්හි චන්ද්‍ර තෙම බබළා ද, යම්සේ සූර්‍ය්‍යයා බබළා ද, එපරිද්දෙන් මහත් අනුභාව ඇති කුමාරය, පොරිසාදයාගෙන් මිදුණා වූ නුඹ පියා ද මව ද සතුටු කරමින් කම්පිල්ල දෙශය බබළව. නුඹගේ සියලු නෑ පිරිවර ද සතුටුවේවා, (යි පොරිසාදයා පවසා මහසත්හු පිටත් කෙළේ ය.)

2807. ඉක්බිති ප්‍රාඥ වූ අලීනසත්ත රාජපුත්‍ර තෙම පොරිසාදයාට කළ ඇඳිලි ඇත්තේ පෙරළා ගියේ ය. පොරිසාදයා විසින් අනුදන්නා ලද කුමාර තෙම සුව ඇත්තේ නීරොග වූයේ කම්පිල්ල දෙශයට සුවසේ ගියේ ය.

2808. නියම්ගම් වැස්සෝ ද දනව් වැස්සෝ ද ඇතරුවෝ ද රථ සෙනඟ ද පාබල සෙනඟ ද යන සියල්ලෝ ම බැඳැඳිලි ඇත්තාහු (නමස්කාර කරමින්) නුඹ වහන්සේ දුෂ්කර ක්‍රියා කරන්නෙක් වන්නහු ය. නුඹ වහන්සේට නමස්කාර වේවා යි කියමින් එළඹියාහ.

ජයද්දිස ජාතක යි.

4. ඡද්දන්තජාතකං

2809. කින්නු සොචසි අනුච්චඞ්ගි, පණ්ඩූසි වරවණ්ණිනි,
මිලායසි විසාලක්ඛි මාලාව පරිමද්දිතා.

2810. දොහළො මෙ මහාරාජ සුපිනන්තෙනුපච්චගා,
න සො සුලභරූපොව යාදිසො මම දොහළො.

2811. යෙ කෙචි මානුසා කාමා ඉධ ලොකස්මිං නන්දනෙ,
සබ්බෙ තෙ පචුරා මය්හං අහන්තෙ දම්මි දොහළං.

2812. ලුද්දා දෙව සමායන්තු යෙ කෙචි විජිතෙ තව,
එතෙසං අහමක්ඛිස්සං යාදිසො මම දොහළො.

2813. ඉමෙ තෙ ලුද්දකා දෙව කතහත්ථා විසාරදා,
වනඤ්ඤූ ච මිගඤ්ඤූ ච මමත්ථෙ චත්තජීවිතා.

2814. ලුද්දපුත්තා නිසාමෙථ යාවන්තෙත්ථ සමාගතා,
ඡබ්බිසාණං ගජං සෙතං අද්දසං සුපිනෙ අහං,
තස්ස දන්තෙහි මෙ අත්ථො අලාභෙ නත්ථි ජීවිතං.

2815. න නො පිතූනං න පිතාමහානං
දිට්ඨො සුතො කුඤ්ජරො ඡබ්බිසාණො,
යමද්දසා සුපිනෙ රාජපුත්ති
අක්ඛාහි නො යාදිසො හත්ථිනාගො.

2816. දිසා චතස්සො විදිසා චතස්සො
උද්ධං අධො දසදිසා ඉමායො,
කතමං දිසං තිට්ඨති නාගරාජා
යමද්දසා සුපිනෙ ඡබ්බිසාණං.

2817. ඉතො උජුං උත්තරියං[1] දිසායං
අතික්කම්ම සො සත්ත ගිරී බ්‍රහන්තෙ,
සුවණ්ණපස්සො නාම ගිරී උළාරො
සුපුප්ඵිතො කිම්පුරිසානුචිණ්ණො.

2818. ආරුය්හ සෙලං භවනං කින්නරානං
ඔලොකය පබ්බතපාදමූලං,
අථ දක්ඛසි මෙඝසමානවණ්ණං
නිග්‍රොධරාජං අට්ඨසහස්සපාදං.[2]

1. උත්තරායං – සයා.
2. අට්ඨසහස්සපෙරං – මජසං.

4. ඡද්දන්ත ජාතකය

2809. රන්වන් සිරුරු ඇත්තිය, කුමක් නිසා ශොක කරහි ද? උතුම් ශරීරවර්ණ ඇත්තිය, කුමක් නිසා පඬුවන් වෙහි ද? විශාල වූ ඇස් ඇත්ති ය, අතින් මඩනා ලද පියුම් මාලාවක් මෙන් කුමක් නිසා මලානික වෙහි ද? යි රජ ඇසී ය.

2810. මහරජ, මට සිහිනෙන් දෙළෙක් හටගත්තේ ය. මගේ යම්බඳු ඒ දෙළෙක් නම්, එය සන්හිඳුවීම පහසු නැතැ යි බිසොව කීවා ය.

2811. එම්බා නඳුනිය, මිනිසුන් පිළිබඳ වූ යම්කිසි කාම සම්පත්ති කෙනෙක් මෙලොව ඇද්ද? ඒ සියල්ල මට ඉතා සුලභ ය. මම තිගේ දෙළ දෙමි යි රජ තෙම කීය.

2812. දේවයන් වහන්ස, නුඹ වහන්සේගේ රටෙහි වැද්දෝ පැමිණෙත්වා, මාගේ යම්බඳු වූ දෙළෙක් වේ ද, එය ඔවුන්ට මම කියන්නෙමි.

2813. එම්බා දේවිය, ඒ මේ වැද්දෝ කෘතහස්තතා ඇති නිර්භය වූවෝ වෙති. වනය දන්නෝ ද මුවන් දන්නෝ ද වෙති. මා සඳහා හරනලද දිවි ඇත්තෝ ද වෙත්.

2814. මෙහි යම්තාක් වැදි පුත්‍රයෝ රැස්වූවාහු ද? ඒ සියල්ලෝ මා කියන කරුණ අසවු. මම ස්වප්නයෙහි ෂඩ්වර්ණ දළ ඇති ශ්වෙත වර්ණ ඇතකු දිටිමි. උගේ දළවලින් මට ප්‍රයොජන ඇත්තේ ය. එය නො ලැබීමෙහි මාගේ ජීවිතය නැතැ යි දේවී කීවා ය.

2815. එම්බා දේවිය, අපගේ මවුපියන් විසින් ද මුත්තණුවන් විසින් ද ෂඩ්වර්ණ දළ ඇති ඇතෙක් දක්නා ලද බවක් නො මැ අසන ලද. රාජපුත්‍රිය, ස්වප්නයෙහි දී යම්බඳු ඇතකු දුක්කෙහි නම්, ඒ ඇතා යම්සේ නම් එය අපට කියව.

2816. ෂඩ්වර්ණ දළ ඇති යම්බඳු ඇතකු ස්වප්නයෙහි දක්කා නම් සතර දිගය සතර අනුදිග ය උඩ ය යට ය යන මේ දස දිගුන් අතර කවර නම් දිසාවෙක්හි ඒ ඇත්රජ සිටී දැයි වැද්දෝ ඇසූහ.

2817. මොබින් උතුරු දිශාවෙහි කෙළින් මහත් පර්වත සතක් ඇත. එයින් සයක් ඉක්ම ගියතැන කිඳුරන්ගෙන් ගැවැසීගත්තා වූ මනාව පිපීගිය ස්වර්ණ පාර්ශ්ව නම් මහත් වූ පර්වතයෙක් වෙයි.

2818. කිඳුරන්ගේ වාස භවනය වූ ඒ පර්වතයට නැඟී පර්වත පාදයාගේ මුල බලව. එවිට මෙඝයට සමාන වර්ණ ඇති අට-දහසක් මුල් ඇති නුගගසක් දක්නෙහි ය.

2819. තත්ථච්ඡති කුඤ්ජරො ඡබ්බිසාණො
සබ්බසෙතො දුප්පසහො පරෙහි,
රක්ඛන්ති නං අට්ඨසහස්සනාගා
ඊසාදන්තා වාතජවප්පහාරිනො.

2820. තිට්ඨන්ති තෙ තුමුලං පස්සසන්තා
කුප්පන්ති වාතස්සපි එරිතස්ස,
මනුස්සභූතං පන තත්ථ දිස්වා
භස්මං කරෙය්‍යුං නාස්ස රජොපි නස්සාති.

2821. බහූ හි මෙ රාජකුලම්හි සන්ති
පිළන්ධනා ජාතරූපස්ස දෙවි,
මුත්තා මණිවෙළුරියාමයා ච
කිං කාහසි දන්තපිළන්ධනෙන,
මාරෙතුකාමා කුඤ්ජරං ඡබ්බිසාණං
උදහු ඝාතෙස්සසි ලුද්දපුත්තෙන.

2822. සා ඉස්සිතා දුක්ඛිතා වස්මි ලුද්ද
උද්ධඤ්ච සුස්සාමි අනුස්සරන්තී,
කරොහි මෙ ලුද්දක එතමත්ථං
දස්සාමි තෙ ගාමවරානි පඤ්ච.

2823. කත්ථච්ඡති කත්ථමුපෙති ඨානං
වීථිස්ස කා නහානගතස්ස හොති,
කථඤ්හි සො නහායති නාගරාජා
කථං විජානෙමු ගතිං ගජස්ස.

2824. තත්ථෙව සා පොක්ඛරණී අදූරෙ
රම්මා සුතිත්ථා ච මහොදිකා ච,
සම්පුප්ඵිතා භමරගණානුචිණ්ණා
එත්ථ හි සො නහායති නාගරාජා.

2825. සීසං[1] නහාතො උප්පලමාලධාරී
සබ්බසෙතො පුණ්ඩරීකත්තචඞ්ගී,
ආමොදමානො ගච්ඡති සන්තිකෙ තං
පුරක්ඛත්වා මහෙසිං සබ්බභද්දං.

2826. තත්ථෙව සො උග්ගහෙත්වාන වාක්‍යං
ආදාය තූණිඤ්ච ධනුඤ්ච ලුද්දො,
විතුරිය[2] සො සත්ත ගිරී බ්‍රහන්තෙ
සුවණ්ණපස්සං නාම ගිරිං උළාරං.

1. සීතං – මජසං.
2. විතුරෙය්‍ය

2819. එහි ෂඩ්වර්ණ දළ ඇති තනි සුදු පැහැයෙන් යුත් අන්‍යයන් විසින් මැඩලිය නො හැකි ඇත්රජ හිඳියි. රිය හිසකට සමාන දළ ඇති වාත වේගයෙන් ගොස් සතුරන්ට පහර දෙන්නා වූ අටදහසක් ඇත්හු ඒ ඇතු ආරක්ෂා කෙරෙත්.

2820. ඒ ඇත්හු බිහිසුණු ලෙස ප්‍රශ්වාස කරමින් සිටිත්. කම්පා වූ වාතයට ද කිපෙත්. එහි දී මිනිස් චූවකු දුක අළු කරන්නාහ. ඔහුගේ ධූලි ද ඉතිරි නො වන්නේය යි දේවී තොමෝ කීවා ය.

2821. එම්බා දේවීනි, මේ රජකුලයෙහි රන්මුවා පළඳනාවෝ ද මුතු මැණික් වෙරළු මිණිමුවා බොහෝ පළඳනාවෝ ද ඇත්තාහ. දළ පැළඳුමෙන් කවරක් කරන්නට ද? ෂඩ්වර්ණ දළැති ඇතු මරවනු කැමැත්ති වෙහි. නො එසේ නම් වැදි පුත්‍රයන් නස්වනු කැමැත්තෙහි ද? යි වැදි පුත්‍රයා ඇසී ය.

2822. වැදි පුත්‍රය, ඒ මම හටගත් ඊර්ෂ්‍යා ඇත්තී දුකින් පෙළුණිම් ද වෙමි. එය සිහි කරමින් මම මත්තෙහි ද සුසුම් ලන්නෙමි. වැදි පුත්‍රය, මාගේ මේ කාරණය කරව. තට ගම්වර පසක් ද දෙන්නෙමි යි දේවිය කීවා ය.

2823. දේවීනි, ඒ හස්තිනාග තෙම කොතනක වෙසේ ද? කිනම් තැනක සිටීමට පැමිණියේ ද? නෑමට ගියා වූ ඔහුගේ ගමන් මාර්ගය කවරෙක් ද? හේ කෙසේ ස්නාන කෙරේ ද? ඇතුගේ ගතිය (පිළිවෙළ) කෙසේ නම් දනගනිමු ද යි වැදි තෙම ඇසුවේ ය.

2824. ඒ වාසස්ථානයෙහි ම නුදුරුතන්හි සිත්කලු මනා තොටුපළක් ඇති මහත් ජලයෙන් යුත් මනාව පිපීගිය බමර සමූහයා විසින් ගැවැසීගත් ඒ පුෂ්කරණියක් (ඡද්දන්ත නම් විල) ඇත්තේ ය. ඒ හස්තිරාජ තෙම මෙහි ස්නානය කරයි.

2825. හිස පටන් නැවාවූ උපුල් මල් දරන්නා වූ සියල්ල සුදු වූ හෙළ පියුම් බඳු සමින් යුත් ශරීර ඇති ඇත්රජ තෙම සතුටු වෙමින් "සබ්බභද්දා" නම් මෙහෙසිය පෙරට කොට ස්වකීය වාසස්ථානයට පැමිණියේ යයි දේවී තොමෝ කීවා ය.

2826. ඒ වැදි තෙම එහි දී ම දේවියගේ වචනය ඉගෙන හියවුර ද මහඳුන්න ද ගෙන මහත් වූ පර්වත හත ඉක්මවා "සුවණ්ණපස්ස" නම් වූ මහාපර්වතය දන ගත්තේ ය.

2827. ආරුය්හ සෙලං භවනං කින්නරානං
ඔලොකයී පබ්බතපාදමූලං,
තත්ථද්දසා මෙඝසමානවණ්ණං
නිග්‍රොධරාජං අට්ඨසහස්සපාදං.

2828. තත්ථද්දසා කුඤ්ජරං ඡබ්බිසාණං
සබ්බසෙතං දුප්පසහං පරෙහි,
රක්ඛන්ති තං අට්ඨසහස්සනාගා
ඊසාදන්තා වාතජවප්පහාරිනො.

2829. තත්ථද්දසා පොක්ඛරණිං අදූරෙ
රම්මං සුතිත්ථඤ්ච මහොදිකඤ්ච,
සම්පුප්ඵිතං භමරගණානුචිණ්ණං
යත්ථ හි සො නහායති නාගරාජා.

2830. දිස්වාන නාගස්ස ගතිං ඨිතිඤ්ච
වීථිස්ස යා නහානගතස්ස හොති,
ඔපාතමාගච්ඡි අනරියරූපො
පයොජිතො චිත්තවසානුගාය.

2831. ඛණිත්වාන[1] කාසුං ඵලකෙහි ඡාදයි
අත්තානමොධාය ධනුඤ්ච ලුද්දො,
පස්සාගතං පුථුසල්ලෙන නාගං
සමප්පයී[2] දුක්කට[3]කම්මකාරී.

2832. විද්ධො ච නාගො කොඤ්චමනාදි ඝොරං
සබ්බෙව නාගා නින්නදුං ඝොරරූපං,
තිණඤ්ච කට්ඨඤ්ච චුණ්ණං කරොන්තා
ධාවිංසු තෙ අට්ඨ දිසා සමන්තතො.

2833. වධිස්සමෙතන්ති පරාමසන්තො
කාසාවමද්දක්ඛි ධජං ඉසීනං,
දුක්ඛෙන ඵුට්ඨස්සුදපාදි සඤ්ඤා
අරහද්ධජො සබ්භි අවජ්ඣරූපො.

2834. අනික්කසාවො කාසාවං යො වත්ථං පරිදහෙස්සති,
අපෙතො දමසච්චෙන න සො කාසාවමරහති.

2835. යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො,
උපෙතො දමසච්චෙන ස වෙ කාසාවමරහති,

1. කත්වාන - වි.
2. සමප්පයි - මජසං.
3. දුක්කත - වි.

2827. කිඳුරන්ගේ වාසභවනය වූ පර්වතයට නැඟ පර්වතයාගේ පාමුල බැලුවේ ය. එහි මෙසයට සමාන වර්ණ ඇති අට දහසක් මුල් ඇති නුගගස දුටුවේ ය.

2828. එහි ෂඩ්වර්ණ දළ ඇති සියල්ල සුදු වූ අන්‍යයන් විසින් මැඩ පැවැත්විය නො හැකි හස්තියා දක්කේ ය. රියහිස සමාන දළ ඇති වාත වේගයෙන් ගොස් පහර දෙනසුලු වූ අට දහසක් හස්තීහු ඒ ඇත්රජු ආරක්ෂා කරත්. යම් තැනෙක්හි ඒ හස්තිරාජයා ස්නානය කෙරේ ද,

2829. එහි තුඳුරු තන්හි පිහිටි සිත්කලු යහපත් තොටුපලක් ඇති, මහත් දියෙන් පිරුණු මනාව මල් පිපිගිය බමර සමූහයා විසින් ගැවැසීගත් පොකුණ දුටුවේ ය.

2830. ඇත්රජහු ගමන් කරන තැන් ද නැවැති සිටින තැන් ද ස්නානයට ගියා වූ මොහුගේ යම් ගමන් වීථියක් වේ නම් එය දැක චිත්ත වසභයට ගියා වූ මෙහෙසිය විසින් මෙහෙයවන ලද අනාර්‍ය්‍ය ස්වභාව ඇති වැදි තෙමේ වළක් සෑරුවේ ය.

2831. වැදි තෙම වළක් සාරා තමන් ද දුන්න ද එහි ප්‍රවෙශ කරවා පුවරු වලින් වැසුවේ ය. නපුරුකම් කරනසුලු වූ ඒ වැදි තෙම තමන් පාර්ශවයෙහි ආවා වූ ඒ ඇත්රජුට මහත් වූ ඊයකින් විද්දේ ය.

2832. විදිනලද ඇත් තෙමේ භයානක ලෙස කුඤ්චනාද කෙළේ ය. සියලු හස්තීහු ම භයානක ලෙස කුඤ්චනාද කළාහු ය. ඒ හස්තීහු තෘණ ද කාෂ්ට ද සුණු කරමින් හාත්පස අටදිගට ම දිව්වෝ ය.

2833. මොහු නසමි යි පරාමර්ශනය කරන්නේ සෘෂීන්ගේ ධවජය වූ කාෂාය වස්ත්‍රය දුටුවේ ය. දුකින් ස්පර්ශ කරන ලද්ද වූ ඒ ඇත්රජුට රහතුන්ගේ ධවජය සත්පුරුෂයන් විසින් නො නැසියයුතු යයි හැඟීමක් පහළ විය.

2834. යමෙක් වනාහි රාගාදි කෙලෙස් කසටින් යුක්ත වූයේ ඉන්ද්‍රිය දමනයෙන් හා වාක්සත්‍යයෙන් තොර වූයේ කසාවත් දරයි ද හේ කසාවත් දැරීමට නුසුදුසු වේ.

2835. යමෙක් වනාහි ආර්‍ය්‍ය මාර්ගයෙන් වමාරා දමූ කෙලෙස් කසට ඇතිවැ සිවුපිරිසිදු සිල්හි පිහිටියේ නම් ඉඳුරන් දැමීමෙන් හා ඇත්ත කීමෙන් ද යුත් ඔහු කසාවත් දැරීමට සුදුසුය.

2836. සමප්පිතො පුථුසල්ලෙන නාගො
අදුට්ඨචිත්තො ලුද්දකං අජ්ඣභාසි,
කිමත්ථයං කිස්ස වා සම්ම හෙතු
මමං වධී කස්ස වායං පයොගො.

2837. කාසිස්ස රඤ්ඤො මහෙසී භදන්ත
සා පූජිතා රාජකුලෙ සුභද්දා,
තං[1] අද්දසා සා ච මමං අසංසි
දන්තෙහි අත්ථො ති ච මං අවොච.

2838. බහූ හි මෙ දන්තයුගා උළාරා
යෙ මෙ පිතූනඤ්ච පිතාමහානං,
ජානාති සා කොධනා රාජපුත්තී
වධත්ථිකා වෙරමකාසි බාලා.

2839. උට්ඨෙහි ත්වං ලුද්ද ඛරං ගහෙත්වා
දන්තෙ ඉමෙ ඡින්ද පුරා මරාමි,
වජ්ජාසි තං කොධනං රාජපුත්තිං
නාගො හතො හන්ද ඉමස්ස දන්තා.

2840. උට්ඨාය සො ලුද්දො ඛරං ගහෙත්වා
ඡෙත්වාන දන්තානි ගජුත්තමස්ස,
වග්ගූ සුභෙ අප්පටිමෙ පථබ්‍යා[2]
ආදාය පක්කාමි තතො හි ඛිප්පං.

2841. භයද්දිතා[3] නාගවධෙන අට්ටා
යෙ තෙ නාගා අට්ඨ දිසා විධාවුං,
අදිස්වා[4] පොසං ගජපච්චමිත්තං
පච්චාගමුං යෙන සො නාගරාජා.

2842. තෙ තත්ථ කන්දිත්වා රොදිත්වා[5] නාගා
සීසෙ සකෙ පංසුකං ඔකිරිත්වා,
අගමංසු[6] තෙ සබ්බෙ සකං නිකෙතං
පුරක්ඛත්වා මහෙසිං සබ්බභද්දං.

2843. ආදාය දන්තානි ගජුත්තමස්ස
වග්ගූ සුභෙ අප්පටිමෙ පථබ්‍යා,
සුවණ්ණරාජීහි සමන්තමොදරෙ
සො ලුද්දකො කාසිපුරං උපාගමි
උපනෙසි සො රාජකඤ්ඤාය දන්තෙ
නාගො හතො හන්ද ඉමස්ස දන්තා.

1. සා තං අද්දස සාච - වි. ස්‍යා. සා තං අද්දස සා - මජසං.
2. පථව්‍යා - වි.
3. භයට්ටිතා - මජසං. ස්‍යා.
4. අදිස්වාන - මජසං, ස්‍යා.
5. රොදිත්වාන - මජසං. ස්‍යා.
6. ආගමිංසු - මජසං, ස්‍යා.

2836. මහත් වූ රියකින් විදිනු ලැබූ ඇත් තෙම දූෂිත නො වූ සිත් ඇත්තේ වැද්දට මෙසේ කීයේ ය: යහළු වැදිපුත්‍රය, කුමක් පතමින් කුමක් හෙතු කොට ගෙන මට විද්දෙහි ද? මේ කවරකුගේ ප්‍රයොගයෙක් ද?

2837. පින්වතුන් වහන්ස, කසී රජුගේ සුභද්‍රා නම් ඒ මහිෂිකා තොමෝ රජකුලයෙහි පුදන ලද්දී ය. ඕ නුඹ දුටුවා ය. ඕ තොමෝ දළවලින් ප්‍රයොජන ඇතැ යි මට ද කීවා ය.

2838. මාගේ පියවරුන්ගේ ද මුත්තණුවරුන්ගේ ද මහත් වූ බොහෝ දන්ත යුග්මයෝ ඇත්තාහ යි ඕ තොමෝ දන්නී ය. ක්‍රොධ ස්වභාව ඇති අඥාන වූ මා නසනු රිසි වූ, ඒ රාජපුත්‍රී තොමෝ වෛර කළා ය.

2839. වැදිපුත්‍රය, තෝ කියත ගෙන නැඟී සිටුව. මාගේ මරණයට පෙර මේ දළ සිඳුව. "හස්ති තෙම එකාන්තයෙන් නසන ලද. එබැවින් මේ ඔහුගේ දළ දෙක ගනුව" යි ඒ ක්‍රොධ ස්වභාවය ඇති රාජපුත්‍රියට කියව යි බෝසත් තෙම කීයේ ය.

2840. ඒ වැදි තෙමේ ද කියත ගෙන නැඟීසිට උතුම් හස්තියාගේ දළ සිඳ මිහිපිට ඇති හැම දළයකට ම වඩා අසමාන වූ සොභා ඇති ඉතා යහපත් වූ ඒ දළ දෙක ගෙන එතැනින් වහා නික්ම ගියේ ය.

2841. ඇත්රජුට විදීමෙන් මරණ බියෙන් බියපත් වූ යම් ඒ හස්තිහු අට දිසාවට දිවගියාහු ද, ඇත් රජුගේ පසමිතුරු පුරුෂයා නො දැක ඒ ඇත්රජ යම් තැනෙක්හි නම් එහි පෙරළා පැමිණියාහු ය.

2842. ඒ ඇත්හු එහි හඬා වැලැප ස්වකීය හිස මත්තෙහි පස් විසුරුවා ගියහ. ඒ සියල්ලෝ ම සර්වභද්‍රා නම් මෙහෙසිය පෙරට කොට සිය නිවෙස් බලා ගියෝ ය.

2843. ඒ වැදි තෙම මිහිපිට තිබෙන හැම දළයකට ම වඩා මනොඥ වූ ද සුන්දර වූ ද අසමාන වූ ද රන්වන් රැසින් හාත්පස බබළන්නා වූ ද ඇත්රජුගේ දළදෙක රැගෙන කසී රටට පැමිණි-යේ ය. හෙ තෙමේ "හස්තිරාජ තෙමේ නසන ලද්දේ ය. මේ ඔහුගේ දළ දෙක ගනුව යි" රාජකන්‍යාවට දුන්නෙ ය.

2844. දිස්වාන දන්තානි ගජුත්තමස්ස
භත්තුප්පියස්ස පුරිමාය ජාතියා,
තත්ථෙව තස්සා හදයං අඵාලි
තෙනෙව සා කාලමකාසි බාලා.

2845. *සම්බොධිපත්තො ච මහානුභාවො
සිතං අකාසි පරිසාය මජ්ඣෙ,
පුච්ඡිංසු භික්ඛූ සුවිමුත්තචිත්තා
නාකාරණෙ පාතුකරොන්ති බුද්ධා.

2846. යමද්දසාථ දහරිං කුමාරිං
කාසාවවත්ථං අනගාරියං චරන්තිං,
සා ඛො තදා රාජකඤ්ඤා අහොසි
අහං තදා නාගරාජා අහොසිං.

2847. ආදාය දන්තානි ගජුත්තමස්ස
වග්ගූ සුභෙ අප්පටිමෙ පථබ්‍යා,
යො ලුද්දකො කාසිපුරං උපාගමි
සො ඛො තදා දෙවදත්තො අහොසි.

8248. අනාවසූරං චිරරත්තසංසිතං
උච්චාවචං චරිතමිදං පුරාණං,
වීතද්දරො වීතසොකො විසල්ලො
සයං අභිඤ්ඤාය අභාසි බුද්ධො.

2849. අහං වො තෙන කාලෙන අහොසිං තත්ථ භික්ඛවො,
නාගරාජා තදා හොසිං එවං ධාරෙථ ජාතකන්ති.

ඡද්දන්තජාතකං.

5. සම්භවජාතකං

2850. රජ්ජඤ්ච පටිපන්නාස්මා ආධිපච්චං සුචීරත,[1]
මහන්තං[2] පත්තුමිච්ඡාමි විජෙතුං පථවිං ඉමං.

2851. ධම්මෙන නො අධම්මෙන අධම්මො මෙ න රුච්චති,
කිච්චොව ධම්මො චරිතො රඤ්ඤො හොති සුචීරත.

2852. ඉධ චෙවානින්දිතා යෙන පෙච්ච[3] යෙන අනින්දිතා,
යසං දෙවමනුස්සෙසු යෙන පප්පෙමු[4] බ්‍රාහ්මණ.

---

* (සම්බොධිපත්තො ච මහානුභාවො ඉච්චාදිකා) ඉමාගාථා දසබලස්ස ගුණෙ වණ්ණෙන්තෙහි ධම්මසඞ්ගාහකත්ථෙරෙහි ඨපිතා, අට්ඨකථා.

1. සුචීරතං – මජසං
2. මහන්තං – වි. මජසං
3. පච්ච – මජසං.
4. පප්පොමු – මජසං, ස්‍යා.

2844. පළමු ජාතියෙහි ප්‍රිය ස්වාමියා වූ උතුම් හස්තියාගේ දළ දෙක දැක එහිදී ම ඇගේ හදවත පැළුණේ ය. ඒ අඥ තැනැත්තිය එයින් ම කලුරිය කළා ය.

2845. බුද්ධත්‍වයට පත් මහත් අනුභාව ඇත්තා වූ ශාස්තෲන් වහන්සේ පිරිස් මැද සිනා පහළ කළසේක. කෙලෙසුන් කෙරෙන් මිදුණා වූ භික්ෂූහු බුදුවරයෝ නම් නිකරුණේ සිනා පහළ නො කරති යි කාරණය විචාළහ.

2846. මහණෙනි, කසාවත් හැන්ද වූ සසුන්හි පැවිදි ව වසන්නා වූ යම් තරුණ කුමරියක් දක්නහු ද ඕ තොමෝ වනාහි එකල්හි රාජකන්‍යාව වූවා ය. මම වනාහි එකල්හි ඇත්රජ වීමි.

2847. යමෙක් මිහිපිට තිබෙන දළ අතුරෙන් හැමට වඩා මනොඥ වූ යහපත් වූ අසම වූ දළ ගෙන කසී රටට ගියේ ද? හෙ වනාහි මෙකල දෙවදත්ත විය.

2848. පහ වූ කෙලෙස් දරථ ඇති පහ වූ ශොක ඇති රාගාදි කෙලෙස් හුල් රහිත වූ බුදුරජ බොහෝ කලකට පෙර පුරුදු කරන ලද නොයෙක් ආකාර ඇති මේ පූර්ව චරිතය ප්‍රකාශ කොට වදාළසේක.

2849. මහණෙනි, මම වනාහි එකල්හි ඒ ඡද්දන්ත විලෙහි වූයෙමි. එකල්හි ඇත් රජ ද වීමි. මෙසේ මේ ඡද්දන්ත ජාතකය දරවූ.

ඡද්දන්තජාතක යි.

5. සමුහව ජාතකය

2850. සුවීරත බ්‍රාහ්මණය, අපි මේ ඉඳිපත් නුවර රාජ්‍යයට ද කුරුරට අධිපති භාවයට ද පැමිණියෙමු. දැන් මේ ප්‍රාජීවිය දිනන්නටත් රාජ්‍යය මහත් බවට පමුණුවා ගන්නටත් කැමැත්තෙමු.

2851. එය ද ධර්මයෙන් වේ. අධර්මයෙන් නො වේ. අධර්මය රුචි නො වේ. සුවීරත නම් බ්‍රාහ්මණය, රජුගේ ම ධර්මයත් චරිතයත් සෙසු ජනයා විසින් අනුගමනය කටයුතු ය.

2852. බ්‍රාහ්මණය, යම් හෙයෙකින් මේ ලොකයෙහි ද නින්‍දා නො ලබන ලද්ද වූ පරලෙව්හි ද නින්‍දා නො ලබන ලද වෙමු ද යම් හෙයෙකින් දෙව්මිනිසුන් අතුරෙහි යසසට පැමිණෙන්නෙමු ද එය කියනු මැනැවි.

2853. යොහං අත්ථඤ්ච ධම්මඤ්ච කත්තුමිච්ඡාමි බ්‍රාහ්මණ,
තං ත්වං අත්ථඤ්ච ධම්මඤ්ච බ්‍රාහ්මණක්ඛාහි පුච්ඡිතො

2854. නාඤ්ඤත්‍ර විධුරා රාජ එතදක්ඛාතුමරහති,
යං ත්වං අත්ථඤ්ච ධම්මඤ්ච කත්තුමිච්ඡසි ඛත්තිය.

2855. එහි ඛො පහිතො ගච්ඡ විධුරස්ස උපන්තිකං
නික්ඛං රතනසුවණ්ණස්ස හරං ගච්ඡ සුචීරත,
අභිහාරං ඉමං දජ්ජා අත්ථධම්මානුසිට්ඨියා.

2856. ස්වාධිප්පාගා භාරද්වාජො විධුරස්ස උපන්තිකං,
තමද්දස මහාබ්‍රහ්මා අසමානං සකෙ ඝරෙ.

2857. රඤ්ඤොහං පහිතො දූතො කොරබ්‍යස්ස යසස්සිනො,
අත්ථං ධම්මඤ්ච පුච්ඡෙසි ඉච්චබ්‍රවි යුධිට්ඨිලො
තං ත්වං අත්ථඤ්ච ධම්මඤ්ච විධුරක්ඛාහි පුච්ඡිතො.

2858. ගඞ්ගං මෙ පිදහිස්සන්ති න තං සක්කොමි බ්‍රාහ්මණ,
අපිධෙතුං මහාසින්ධුං තං කථං සො භවිස්සති
න තෙ සක්කොමි අක්ඛාතුං අත්ථං ධම්මඤ්ච පුච්ඡිතො.

2859. භද්‍රකාරො ච මෙ පුත්තො ඔරසො මම අත්‍රජො,
තං ත්වං අත්ථඤ්ච ධම්මඤ්ච ගන්ත්වා පුච්ඡස්සු බ්‍රාහ්මණ.

2860. ස්වාධිප්පාගා භාරද්වාජො භද්‍රකාරස්ස සන්තිකං,
තමද්දස මහාබ්‍රහ්මා නිසින්නං සම්හි වෙස්මනි.

2861. රඤ්ඤොහං පහිතො දූතො කොරබ්‍යස්ස යසස්සිනො,
අත්ථං ධම්මඤ්ච පුච්ඡෙසි ඉච්චබ්‍රවි යුධිට්ඨිලො
තං ත්වං අත්ථඤ්ච ධම්මඤ්ච භද්‍රකාර බ්‍රවීහි මෙ.

2853. බ්‍රාහ්මණය, යම්බඳු මම ඵල විපාක සංඛ්‍යාත අර්ථය ද මේ අර්ථයට හෙතු වූ ධර්මය ද කිරීමට කැමැත්තෙම් ද බ්‍රාහ්මණය, ඔබ විචාරන ලද්දේ ඒ අර්ථය ද ධර්මය ද මට කියව.

2854. ක්‍ෂත්‍රිය රජතුමනි, නුඹ වහන්සේ අර්ථය ද ධර්මය ද කිරීමට කැමැත්තහු ය යන යමක් වේ ද, මෙය ප්‍රකාශ කිරීමට විධුරපණ්ඩිතයා හැර අනෙකෙක් සුදුසු නො වේ යයි සුචීරත බ්‍රාහ්මණ තෙම කීයේ ය.

2855. සුචීරත බ්‍රාහ්මණය, මෙහි එව. මා විසින් මෙහෙයන ලද්දෙහි විධුර පණ්ඩිතයන් සමීපයට යව. ස්වර්ණය පිළිබඳ නිෂ්ක දහසක් හැරගෙන යව. අර්ථයෙන් හා ධර්මයෙන් අනුශාසනා කිරීම පිණිස පූජා වශයෙන් මෙය දෙව යි රජ තෙම කීයේ ය.

2856. ඒ භාරද්වාජ ගොත්‍රයෙහි වූ සුචීරත බ්‍රාහ්මණ තෙම විධුර පණ්ඩිතයන් සමීපයට ගියේ ය. මහාබ්‍රාහ්මණ තෙමේ තම ගෙහි ආහාර අනුභව කරන්නා වූ ඔහු දුටුවේ ය.

2857. මම වනාහි යස පිරිවර ඇත්තා වූ කොරව්‍ය රජු විසින් එවන ලද දූතයෙම් වෙමි. යුධිට්ඨිල ගොත්‍රයෙහි වූ ධනඤ්ජය රජ තෙම අර්ථය ද ධර්මය ද අසවයි මට කීයේ ය. විධුර පණ්ඩිතය, විචාරන ලද නුඹ වහන්සේ ඒ අර්ථයත් ධර්මයත් මට කියා දෙනුමැන.

2858. බ්‍රාහ්මණය, මහාජනයාගේ නොයෙක් සිතුවිලි නැමැති ගඟ වසන්නෙමි යි කටයුත්තෙක් මට ඇතිවිය. ඒ මම ඒ සිතුවිලි නැමිති මහමුහුද වසන්නට නො පිළිවන් වෙමි. ඊට කෙසේ නම් අවකාශයක් වන්නේ ද එහෙයින් අර්ථය ද ධර්මය ද විචාරන ලද්දු වූ මම තොපට කියන්නට නො සමත්මි යි විධුර පණ්ඩිත තෙම කීයේ ය.

2859. බ්‍රාහ්මණය, තමාට දව උපන් භද්‍රකාර නම් ඖරස පුත්‍රයෙක් මට ඇත. නුඹ ඔහු වෙත ගොස් අර්ථයත් ධර්මයත් විචාරව යි විධුරපණ්ඩිතයා කීයේ ය.

2860. ඒ භාරද්වාජ තෙමේ භද්‍රකාරයා කරා ගියේ ය. මහා බ්‍රාහ්මණ තෙමේ සිය ගෙහි හුන් ඒ භද්‍රකාර කුමරා දුටුවේ ය.

2861. මම වනාහි යස පිරිවර ඇති කොරව්‍ය රජහු වෙතින් පිටත්කර එවන ලද දූතයෙමි. යුධිට්ඨිල ගොත්‍ර ඇති ඒ රජ තෙම අර්ථයත් ධර්මයත් ගැන අසව යි කීයේ ය. භද්‍රකාරය, ඔබ ඒ අර්ථයත් ධර්මයත් මට ප්‍රකාශ කරනු මැනව.

2862. මංසකාජං[1] අවහාය ගොධං අනුපතාමහං,
න තෙ සක්කොමි අක්ඛාතුං අත්ථං ධම්මඤ්ච පුච්ඡිතො.

2863. සඤ්ජයො නාම මෙ භාතා කණිට්ඨො මෙ සුචීරත,
තං ත්වං අත්ථඤ්ච ධම්මඤ්ච ගන්ත්වා පුච්ඡස්සු බ්‍රාහ්මණ.

2864. සචාධිපාගා භාරද්වාජො සඤ්ජයස්ස උපන්තිකං,
තමද්දස මහාබ්‍රහ්මා නිසින්නං සම්හි වෙස්මනි.

2865. රඤ්ඤාහං පහිතො දූතො කොරව්‍යස්ස යසස්සිනො,
අත්ථං ධම්මඤ්ච පුච්ඡෙසි ඉච්චබ්‍රවි යුධිට්ඨිලො
තං ත්වං අත්ථඤ්ච ධම්මඤ්ච සඤ්ජයක්ඛාහි පුච්ඡිතො.

2866. සද මං ගිලති[2] මච්චු සායං පාතො සුචීරත,
න තෙ සක්කොමි අක්ඛාතුං අත්ථං ධම්මඤ්ච පුච්ඡිතො.

2867. සම්භවො නාම මෙ භාතා කණිට්ඨො මෙ සුචීරත,
තං ත්වං අත්ථඤ්ච ධම්මඤ්ච ගන්ත්වා පුච්ඡස්සු බ්‍රාහ්මණ.

2868. අබ්භුතො වත භො ධම්මො නායං අස්මාකරුච්චති,
තයො ජනා පිතාපුත්තා තෙසු පඤ්ඤාය නො විදූ.

2869. න තං සක්කොථ අක්ඛාතුං අත්ථං ධම්මඤ්ච පුච්ඡිතා,
කථං නු දහරො ජඤ්ඤා අත්ථං ධම්මඤ්ච පුච්ඡිතො.

2870. මා නං දහරොති උඤ්ඤාසි[3] අපුච්ඡිත්වාන සම්භවං,
පුච්ඡිත්වා සම්භවං ජඤ්ඤා අත්ථං ධම්මඤ්ච බ්‍රාහ්මණ.

2871. යථාපි චන්දො විමලො ගච්ඡං ආකාසධාතුයා,
සබ්බෙ තාරා[4]ගණෙ ලොකෙ ආභාය අතිරොචති.

2872. එවම්පි දහරූපෙතො පඤ්ඤායොගෙන සම්භවො,
මා නං දහරොති උඤ්ඤාසි අපුච්ඡිත්වාන සම්භවං
පුච්ඡිත්වා සම්භවං ජඤ්ඤා අත්ථං ධම්මඤ්ච බ්‍රාහ්මණ.

2873. යථාපි රම්මකො මාසො ගිම්හානං හොති බ්‍රාහ්මණ,
අතෙවඤ්ඤෙහි මාසෙහි දුමපුප්ඵෙහි සොභති.

---

1. කාචං - වි,
2. ගිලතෙ - වි. මජසං.
3. මඤ්ඤාසි - සයා.
4. තාර - වි. සයා. සබ්බාතර - මජසං.

2862. යම්සේ පුරුෂයෙක් මුව මස් කඳ බිම තබා ගොයකු ලුහු බඳිද එමෙන් ම මම ගෙහි බිරිඳ සිටිය දී පරදරාවන් වෙත යමි. එහෙයින් අර්ථය ද ධර්මය ද විචාරන ලද්ද වූ මම තොපට කියන්නට නො හැක්කෙමි යි කීයේ ය.

2863. සුචීරත බ්‍රාහ්මණය, සඤ්ජය නම් වූ මාගේ කනිටු සහොදරයෙක් ඇත. නුඹ ගොස් අර්ථයත් ධර්මයත් ඔහු විචාරව.

2864. ඒ භාරද්වාජ තෙමේ සඤ්ජය වෙත ගියේ ය. මහාබ්‍රාහ්මණ සිය නිවසෙහි හුන් ඔහු දුටුවේ ය.

2865. මම වනාහි යස පිරිවර ඇත්තා වූ කොරව්‍ය රජහු වෙතින් එවන ලද දූතයෙමි. යුධිට්ඨිල ගොත්‍ර ඇති ඒ රජ තෙම අර්ථයත් ධර්මයත් අසව යි මෙසේ කීයේ ය.

2866. එම්බා සුචීරත බ්‍රාහ්මණය, හැම කල්හි හවස ද, උදය ද මරුවා මා ගිලියි. අර්ථයත් ධර්මයත් අසන ලද්දෙහි මම නුඹට කියන්නට නො හැක්කෙමි යි සඤ්ජය තෙම කීයේ ය.

2867. එම්බා සුචීරත බ්‍රාහ්මණය, මාගේ සම්භව නම් කනිටු සහොදරයෙක් ඇත්. නුඹ එහි ගොස් අර්ථයත් ධර්මයත් ඔහු විචාරව යි සඤ්ජය තෙම කීයේ ය.

2868. පින්වත එකාන්තයෙන් මේ ධර්මය අද්භූත ය. අපට මෙය රුචි නො වේ. පියාත් දෙපුතුනුත් යන තිදෙනෙක් වූහ. ඔවුනතර එකෙකුත් මේ ධර්මය ප්‍රඥායෙන් නො දකිත්.

2869. අර්ථය ද ධර්මය ද විචාරන ලද ඔවුහු එය කියන්නට නො හැකිවාහු ය. අර්ථයත් ධර්මයත් අසන ලද ළදරු තෙමේ කෙසේ නම් එය දනී ද?

2870. සම්භවකුමරා නොවිචාරා ඔහු දරුවෙකැ යි අවඥා නො-කරව, බ්‍රාහ්මණය, සම්භව කුමරු විචාරා අර්ථයත් ධර්මයත් දනුව.

2871. යම්සේ අහස්හි යන චන්ද්‍ර තෙම නිර්මල ද? ඒ චන්ද්‍රයා ස්වකීය දීප්තියෙන් ම ලෙව්හි සියලු තාරකාවන් ඉකමවා ද?

2872. එසේ ම ප්‍රඥායොගයෙන යුත් සම්භව කුමරා ළදරු වූයේ ද සෙස්සන් ඉක්මවා බබළයි. ඒ සම්භව කුමරු නො විචාරා ළදරු යයි අවඥා කොට නො සිතව. අර්ථයත් ධර්මයත් සම්භව කුමරු විචාරා දැනගනුව.

2873. බ්‍රාහ්මණය, යම්සේ ග්‍රීෂ්මමාසයන් සම්බන්ධ වූ සිත්කලු වූ බක්මස සෙසු මාසවලට වඩා ගස්වල පිපි මලවලින් ඉතා ශොභමාන වේ ද–

2874. එවම්පි දහරූපෙතො පඤ්ඤායොගෙන සම්භවො,
මා නං දහරොති උඤ්ඤාසි අපුච්ඡිත්වාන සම්භවං
පුච්ඡිත්වා සම්භවං ජඤ්ඤා අත්ථං ධම්මඤ්ච බ්‍රාහ්මණ.

2875. යථාපි හිමවා බ්‍රහ්මෙ පබ්බතො ගන්ධමාදනො,
නානාරුක්ඛෙහි සඤ්ඡන්නො මහාභූතගණාලයො
ඔසධෙහි ච දිබ්බෙහි දිසා භාති පවාති ච.

2876. එවම්පි දහරූපෙතො පඤ්ඤායොගෙන සම්භවො,
මා නං දහරොති උඤ්ඤාසි අපුච්ඡිත්වාන සම්භවං
පුච්ඡිත්වා සම්භවං ජඤ්ඤා අත්ථං ධම්මඤ්ච බ්‍රාහ්මණ.

2877. යථාපි පාවකො බ්‍රහ්මෙ අච්චිමාලී යසස්සිමා,
ජලමානො වනෙ ගච්ඡෙ අනලො කණ්හවත්තනී.

2878. ඝතාසනො ධූමකෙතු උත්තමාහෙවනං දහො,
නිසීථෙ[1] පබ්බතග්ගස්මිං පහූතෙධො[2] විරොචති.

2879. එවම්පි දහරූපෙතො පඤ්ඤායොගෙන සම්භවො,
මා නං දහරොති උඤ්ඤාසි අපුච්ඡිත්වාන සම්භවං
පුච්ඡිත්වා සම්භවං ජඤ්ඤා අත්ථං ධම්මඤ්ච බ්‍රාහ්මණ.

2880. ජවෙන භද්‍රං ජානන්ති බලිවද්දඤ්ච[3] වාහියෙ,[4]
දොහෙන ධෙනුං ජානන්ති භාසමානඤ්ච පණ්ඩිතං.

2881. එවම්පි දහරූපෙතො පඤ්ඤායොගෙන සම්භවො,
මා නං දහරොති උඤ්ඤාසි අපුච්ඡිත්වාන සම්භවං
පුච්ඡිත්වා සම්භවං ජඤ්ඤා අත්ථං ධම්මඤ්ච බ්‍රාහ්මණ.

2882. ස්වාධිප්පාගා භාරද්වාජො සම්භවස්ස උපන්තිකං,
තමද්දස මහාබ්‍රහ්මා කීළමානං බහීපුරෙ.

---

1. නිස්සීතෙ – ස්‍යා. නිසීධෙ – මජසං.
2. බහුතෙජො – ස්‍යා, මජසං.
3. බලිබද්දඤ්ච – මජසං. ස්‍යා.
4. වාහනෙ – මජසං.

2874. එසේ ම ප්‍රඥායොගයෙන් යුත් සම්භව කුමරා ළදරු වූයේ ද සෙස්සන් ඉක්මවා බබළයි. සම්භව කුමරු නො විචාරා ළදරු යයි අවමන් කොට නො සිතව. බ්‍රාහ්මණය, අර්ථයත් ධර්මයත් සම්භව කුමරු අතින් විචාරා දැනගනුව.

2875. බ්‍රාහ්මණය, යම්සේ, හිමෙන් යුක්ත වූ නොයෙක් වෘක්ෂයෙන් ගැවැසීගත්තා වූ දෙවසමූහයාට වාසස්ථාන වූ ගන්ධමාදන පර්වතය දිව්‍යමය වූ ඖෂධයෙන් සියලු දිශාවන් බබුළුවා ද, සුවඳ විහිදුවා ද,

2876. එසේ ම ප්‍රඥායොගයෙන් යුත් සම්භව කුමරා ළදරු වූයේ ද, සෙස්සන් ඉක්මවා බබළයි. සම්භව කුමරු නො විචාරා ළදරු යයි අවමන් කොට නො සිතව. බ්‍රාහ්මණය, අර්ථයත් ධර්මයත් සම්භව කුමරු අතින් විචාරා දැනගනුව.

2877. බ්‍රාහ්මණය, ගිනිසිළු ඇති තෙජසින් යුත් කොතෙක් දර ලූවත් සෑහීමට පත් නොවන්නා වූ ගියමග කළු කරන්නා වූ ගින්න යම්සේ නම් බබළා ද–

2878. පූජා වශයෙන් ලූ ගිතෙල් අනුභව කරන්නා වූ ස්වකීය ධූමයෙන් ම කෙතු කෘත්‍යය සිදු කරන්නා වූ උතුම් වන ලැහැබ් දවන්නා වූ බොහෝ දර දවන්නා වූ කඳුමුදුන්හි ගින්න රාත්‍රියෙහි යම්සේ බබළා ද,

2879. එසේ ම ප්‍රඥා යොගයෙන් යුත් සම්භව කුමරා ළදරු වූයේ ද සෙස්සන් ඉක්මවා බබළයි. සම්භව කුමරු නො විචාරා ළදරු යයි අවමන් කොට නො සිතවු. බ්‍රාහ්මණය, සම්භව කුමරු අතින් අර්ථයත් ධර්මයත් විචාරා දැනගනුව.

2880. ගමන් වේගයෙන් ආජානීය අශ්වයා ගැන දැනගනිත්. බර ඉසිලීමෙන් වෘෂභයා ගැන දැනගනිත්. දෙවීමෙන් ධෙනුව ගැන දැනගනිත්. කථාවෙන් පණ්ඩිතයා ගැන දැනගනිත්.

2881. එසේ ම ප්‍රඥායොගයෙන් යුත් සම්භව කුමරා ළදරු වූයේ ද සෙස්සන් ඉක්මවා බබළයි. සම්භව කුමරු නො විචාරා ළදරු යයි අවමන් කොට නො සිතවු. බ්‍රාහ්මණය, සම්භව කුමරා අතින් අර්ථයත් ධර්මයත් විචාරා දැනගනුව.

2882. භාරද්වාජ ගොත්‍රයෙහි වූ ඒ බ්‍රාහ්මණ තෙමේ සම්භව කුමරුගේ සමීපයට ගියේ ය. මහාබ්‍රාහ්මණ තෙම ගෙයින් පිටත්හි ක්‍රීඩා කරන්නා වූ ඔහු දුටුයේ යයි වදාළසේක.

2883. රක්ඛිතුං පහිතො දූතො කොරව්‍යස්ස යසස්සිනො,
අත්ථං ධම්මඤ්ච පුච්ඡෙසි ඉච්චබ්‍රවි යුධිට්ඨිලො
තං. ත්වං අත්ථඤ්ච ධම්මඤ්ච සම්භවක්ඛාහි පුච්ඡිතො.

2884. තගඝ තෙ අහමක්ඛිස්සං යථාපි කුසලො තථා,
රාජා ච ඛො තං ජානාති යදි කාහති වා නවා.

2885. අජ්ජ සුවෙති සංසෙය්‍ය රඤ්ඤො පුට්ඨො සුචීරත,
මා කත්වා අවසී රාජා අත්ථෙ ජාතෙ යුධිට්ඨිලො.

2886. අජ්ඣත්තඤ්ඤෙව සංසෙය්‍ය රඤ්ඤො පුට්ඨො සුචීරත,
කුම්මග්ගං[1] න නිවෙසෙය්‍ය යථා මූළ්හො අචෙතසො.

2887. අත්තානං නාතිවත්තෙය්‍ය අධම්මං න සමාචරෙ,
අතිත්ථෙ නප්පතාරෙය්‍ය[2] අනත්ථෙ න යුතො සියා.

2888. යො ච එතානි ඨානානි කත්තුං ජානාති ඛත්තියො,
සදා සො වඩ්ඪතෙ රාජා සුක්කපක්ඛෙව චන්දිමා.

2889. ඤාතීනඤ්ච පියො හොති මිත්තෙසු ච විරොචති,
කායස්ස භෙදා සප්පඤ්ඤො සග්ගං සො උපපජ්ජතීති.

සම්භවජාතකං.

6. මහාකපිජාතකං

2890. බාරාණස්සං[3] අහු රාජා කාසීනං රට්ඨවඩ්ඪනො[4],
මිත්තාමච්චපරිබ්බූළ්හො[5] අගමාසි මිගාජිරං[6].

2891. තත්ථ බ්‍රාහ්මණමද්දක්ඛි සෙතං චිත්‍රංකිලාසිනං,
විද්ධස්තං කොවිළාරංව කිසං ධමනිසන්ථතං.

1. කුම්මග්ගං - මජ්ඣං.
2. නප්පකාරෙය්‍ය - නා.
3. බාරාණස්‍යං - ස්‍යා. බාරාණසියං - වි.
4. වඩ්ඪනො - මජ්ඣං.
5. පරිබ්බූළ්හො - ස්‍යා. මජ්ඣං.
6. මිගාජිනං - ස්‍යා, මජ්ඣං. මිගාචිරං - වි.

2883. මම වනාහි යස පිරිවර ඇති කොරව්‍ය රජු වෙතින් පිටත් කරන ලද දූතයෙම් වෙමි. යුධිට්ඨිල ගොත්‍ර ඇති ඒ රජ අර්ථයත් ධර්මයත් අසව යි කීයේ ය. සම්භව කුමාරය, මා විසින් විචාරන ලද ඔබ වහන්සේ ඒ අර්ථයත් ධර්මයත් කියා දෙනුමැන.

2884. එබැවින් ඉතා දක්ෂයෙක් යම්සේ ද, තොපගේ රජ තෙමේත් යම්සේ දනගනී ද? එසේ මම තොපට කියන්නෙමි. ඉදින් කරන්නේ හෝ නො කරන්නේ හෝ වේ ද, එයින්, මට කම් නැත.

2885. සුචීරත බ්‍රාහ්මණය, අද කටයුත්තක් ගැන රජු විසින් විචාරන ලද ප්‍රධාන ඇමතියෙක් සෙට යයි කියා ද, යුධිට්ඨිල ගොත්‍ර-යෙහි වූ රජ එබඳු කටයුත්තක් ඇති වූ කල්හි එය ප්‍රමාද කොට නො වෙසේවා.

2886. සුචීරත බ්‍රාහ්මණය, රජහු විසින් විචාරන ලද්දේ අධ්‍යාත්මය පිළිබඳ අනිත්‍යතා ලක්‍ෂණය ම කියන්නේ ය. චින්තන ශක්තියක් නැති මුළා වූවෙක් යම්සේ නම්, එසේ වූ අන්ධානුකරණ-යෙන් විශ්වාස කරනු ලබන දෙසැට මිසදිටු සංඛ්‍යාත වැරදි මාර්ගයෙහි නො පිහිටුවන්නේ ය. දශකුශලකර්මපථ මාර්ගයෙහි පිහිටු වන්නේ ය.

2887. තමා ඉක්මවා නො පවත්නේ ය. හෙවත් අපායගාමි අකුසල් නො කරන්නේ ය. ත්‍රිවිධ දුශ්චරිත සංඛ්‍යාත අධර්මයෙහි නො හැසිරෙන්නේ ය. දෙසැට දෘෂ්ටි සංඛ්‍යාත අනර්ථයෙහි නො-බස්නේ ය. නිකරුණේ යමක නො යෙදෙන්නේ ය.

2888. යම් රජෙක් තෙමේ මෙකී කාරණ කරන්නට දනී ද, ඒ රජ හැමකල්හි පුරපස සඳ මෙන් වැඩේ.

2889. හෙ ඤාතීන්හට ද ප්‍රිය වෙයි. මිත්‍රයන් අතර ද බබළයි. ඒ ප්‍රාඥ තෙමේ ශරීරයාගේ බිඳීමෙන් පසු ස්වර්ගලොකයෙහි උප්-පත්තියට යේයි වදළසේක.

සම්භව ජාතක යි.

6. මහාකපි ජාතකය

2890. බරණැස් නුවර කසී දනවු වැස්සන්ගේ රට දියුණු කරන්නා වූ රජෙක් විය. සගයහළු ඇමතියන් ද පිරිවරන ලද ඒ රජ මිගාජිර නම් උයනට ගියේ ය.

2891. එහි ශ්වෙතකුෂ්ටයෙන් සුදු වූ කබර කුෂ්ටයෙන් කැලැල් ඇති, පූයා වැගිරෙන, කසන කුෂ්ටයෙන් යුත්, පිපුණු කොබෝ ලීල ගසක් මෙන් තැනින් තැන කැඩී ගියා වූ කෘශ වූ ඉල්පී ගිය නහර ඇත්තා වූ බමුණකු දුටුයේ ය.

2892. පරමකාරුඤ්ඤතං පත්තං දිස්වා කිච්ඡගතං නරං,
අවච බ්‍යම්හිතො රාජා යක්ඛානං කතමොනුසි.

2893. හත්ථපාද ච තෙ සෙතා තතො සෙතතරං[1] සිරො,
ගත්තං කම්මාසවණ්ණන්තෙ කිලාසබහුලොචසි.

2894. වට්ටනාවළිසඞ්කාසා පිට්ඨි තෙ නින්නතුන්නතා,
කාළපබ්බාව තෙ අඞ්ගා නාඤ්ඤං පස්සාමි එදිසං.

2895. උග්ඝට්ටපාදෙ තසිතො කිසො ධමනිසන්ථතො,
ඡාතො ආතත්තරූපොසි කුතොසි[2] කත්ථ ගච්ඡසි.

2896. දුද්දසී අප්පකාරොසි දුබ්බණ්ණො භීමදස්සනො[3],
ජනෙත්ති යාපි තෙ මාතා න තං ඉච්ඡෙය්‍ය පස්සිතුං.

2897. කිං කම්මමකරා[4] පුබ්බෙ කිං[5] අවජ්ඣං අසාතයි,
කිබ්බිසං යං කරිත්වාන ඉදං දුක්ඛං උපාගමි.

2898. තග්ඝ තෙ අහමක්ඛිස්සං යථාපි කුසලො තථා,
සච්චවාදිං හි ලොකස්මිං පසංසන්තීධ පණ්ඩිතා.

2899. එකො චරං ගොගවෙසෙ මූළ්හො අච්චසරිං වනෙ,
අරඤ්ඤෙ ඊරිණෙ[6] විවනෙ නානාකුඤ්ජරසෙවිතෙ.

2900. වාළමිගානුචරිතෙ විප්පනට්ඨොස්මි කානනෙ,
අචරිං තත්ථ සත්තාහං ඛුප්පිපාසාසමප්පිතො.

2901. තත්ථ තින්දුකමද්දක්ඛිං[7] විසමට්ඨං බුභුක්ඛිතො,
පපාතමභි ලම්බන්තං සම්පන්නඵලධාරිනං.

2902. වාතසීතානි[8] භක්ඛෙසිං තානි රුච්චිංසු මෙ භුසං,
අතිත්තො රුක්ඛමාරුය්හ[9] තත්ථ හෙස්සාමි ආසිතො[10]

2903. එකමෙව භක්ඛිතං ආසි දුතියං අභිපත්ථිතං,
තතො සා භඤ්ජථ[11] සාඛා ඡින්නා ඵරසුනා විය.

---

1. සෙතතරො – වි.
2. කුතොනු ත්වං ගච්ඡසි – වි
3. භිම්ම – මජසං,
4. මකරං – වි,
5. කං – වි,
6. ඉරිණෙ – මජසං, ඉරණෙ – වි,
7. තිණ්ඩුක – මජසං, ස්‍යා,
8. වාතස්සිතානි – මජසං. ස්‍යා.
9. රුක්ඛමාරුහිං – වි. මජසං,
10. අස්සිතො – ස්‍යා.
11. භජ්ජිතා – වි.

2892. අතිශයින් බැගෑපත් බවට පැමිණි, දුකින් පීඩිත ඒ මිනිසා දැක විශ්මය පත් වූ රජ තෝ කිනම් යක්‍ෂයෙහි දැ? යි ඇසුවේ ය.

2893. නුඹගේ හස්ත පාදයෝත් ශ්වෙතවර්ණයහ. සිරස ඊටත් වඩා සුදු ය. නුඹගේ ශරීරය තිත් සහිතය. මෙසේ නුඹ කුෂ්ට රෝග බහුල කොට ඇත්තෙහි ය.

2894. තොපගේ පිට ඇටවැළක් මෙන් උස් පහත් ය. තොපගේ ශරීරාවයවයෝ කළුවැල්පුරුක් මෙන් වෙති. මෙබඳු අන් පුරුෂයකු නම් නොදුටු විරිමි.

2895. නුඹ රජසින් ගැවැසීගත් පා ඇත්තෙහි ය. හටගත් උද්වෙග ඇත්තෙහි ය. කෘෂ වූයෙහි, ඉල්පුණ නහර ඇත්තෙහි, සයින් පීඩිත වූයෙහි, වියළි සිරුරු ඇත්තෙහි ය. කොහි සිට එන්නෙහි ද? කොහි යන්නෙහි ද?

2896. බැලිය නොහැකි වූ, අයහපත් සටහන් ඇත්තෙහි ය. දුර්වර්ණ වූයෙහි බිහිසුණු දැකුම් ඇත්තෙහි ය. නුඹගේ වැදූ මව වූ යම් තැනැත්තියක් වේ ද, ඒ මව පවා තා දක්නට නො කැමැති වන්නී ය.

2897. පෙර කිනම් කර්මයක් කෙළෙහි ද? කවර නම් අවධ්‍ය-යකු (වද නො කටයුත්තකු) නැසුයේ ද? යම් ඒ දරුණු කර්මයක් කොට මේ දුකට පැමිණියේ දැ? යි ඇසුවේ ය.

2898. යම් හෙයෙකින් වනාහි මෙලොව සත්‍ය වචන කියන් නහුට නුවණැත්තෝ පසසත් ද, එබැවින් මම දක්ෂ පුරුෂයෙක් යම්සේ ද එසේ ඔබට කියන්නෙමි.

2899. මම එකලාව ගවයන් සොයමින් ඇවිදිමින් මං මුළා වූයෙමි. අරාජක වූ, හිස් වූ විවෙකයෙන් යුත් නොයෙක් හස්තීන් විසින් සේවනය කරන ලද්දවූ හිමාලයේ මිනිස් පියස ඉක්මවා හැසුරුණෙමි.

2900. චණ්ඩ මෘගයන් විසින් හැසිරෙන ලද මහවනයෙහි මම මුළා වූයෙමි. එහි සත් දිනක් තිස්සේ සා පවසින් පෙළෙමින් හැසුරුණෙමි.

2901. ආහාර අනුභව කැමැති වූ මම එහි විෂම තැනෙක්හි පිහිටියා වූ ප්‍රපාතය දෙසට නැමුණු මිහිරි ඵල දරන තිඹිරි ගසක් දැක්කෙමි.

2902. පළමු නොට සුළඟින් වැටුණා වූ ගෙඩි අනුභව කෙළෙමි. ඒ ගෙඩි මට බොහෝ සෙයින් රුචි විය. එයින් සෑහීමකට පත් නො වූයෙම් ඒ ගසට නැඟ එහි හිඳගෙන හුන්නෙමි.

2903. මා විසින් එක ගෙඩියක් කන ලදි. දෙවන ගෙඩිය කැමැති වන ලදි. ඉන්පසු පොරොවෙන් සිඳනා ලද්දක් මෙන් ඒ ශාඛා තොමෝ බිඳුණාය.

2904. සොහං සහාව සාඛාහි උද්ධංපාදො අවංසිරො,
අප්පතිට්ඨෙ අනාලම්බෙ ගිරිදුග්ගස්මිං පාපතං.

2905. යස්මා ච වාරිගම්භීරං තස්මා න සම්පජ්ජසිං,[1]
තත්ථ සෙසිං නිරානන්දො අනාථො දස රත්තියො.

2906. අථෙත්ථ කපි මාගඤ්ඡි ගොනඞ්ගුට්ඨො[2] දරීචරො,
සාඛාහි සාඛං විචරන්තො ඛාදමානො දුමප්ඵලං.

2907. සො මං දිස්වා කිසං පණ්ඩුං කාරුඤ්ඤමකරා[3] මයි,
අම්භො කොනාම සො එත්ථ එවං දුක්ඛෙන අට්ටිතො
මනුස්සො අමනුස්සො වා අත්තානං මෙ පවෙදය.

2908. තස්සඤ්ජලිං පණාමෙත්වා ඉදං වචනමබ්‍රවිං,
මනුස්සොහං බ්‍යසම්පත්තො[4] සා මෙ නත්ථි ඉතො ගති
තං වො වදමි[5] භද්දං වො ත්වඤ්ච මෙ සරණං භව.

2909. ගරුසිලං[6] ගහෙත්වාන විචරං[7] පබ්බතෙ කපි,
සිලාය යොග්ගං කත්වාන නිසභො එතදබ්‍රවි.

2910. එහි මෙ පිට්ඨිමාරුය්හ ගීවං ගණ්හාහි බාහුභි,
අහං තං උද්ධරිස්සාමි ගිරිදුග්ගත වෙගසා.

2911. තස්ස තං වචනං සුත්වා වානරින්දස්ස සිරීමතො,
පිට්ඨිමාරුය්හ ධීරස්ස ගීවං බාහාහි අග්ගහිං.

2912. සො මං තතො සමුට්ඨාසි තෙජස්සී බලවා කපි,
විහඤ්ඤමානො කිච්ඡෙන ගිරිදුග්ගත වෙගසා,

2913. උද්ධරිත්වාන මං සන්තො නිසභො එතදබ්‍රවි,
ඉඞ්ඝ මං සම්ම රක්ඛස්සු පස්සුපිස්සං මුහුත්තකං.

2914. සීහා ව්‍යග්ඝා ච දිපි ච අච්ඡකොකතරච්ඡයො,
තෙ මං පමත්තං හිංසෙය්‍යුං තෙ ත්වං දිස්වා නිවාරය.

2915. එවං මෙ පරිත්තාතූන පස්සුපී සො මුහුත්තකං,
තදහං පාපකං දිට්ඨිං පටිලච්ඡිං අයොනිසො.

---

1. සම්පජ්ජිසං – මජසං. සයා.
2. ගොනඞ්ගුළො – වි. මජසං. සයා.
3. කාරුඤ්ඤමකරං – වි. මජසං. සයා,
4. වසම්පත්තො – වි. මජසං. සයා.
5. භද්දන්තෙ – මජ °. සයා.
6. ගරුං – වි. මජසං. සයා.
7. විවරි – වි. මජසං.

2904. ඒ මම අතු සමඟ උඩුකුරු වූ පා ඇත්තෙම් යටිකුරු වූ හිස ඇත්තෙම් පිහිටක් ආලම්බනයක් නැති පර්වතදුර්ගයෙහි වැටුණෙමි.

2905. යම් හෙයෙකින් ජලයෙන් ගැඹුරු වී ද එහෙයින් අත් පා බිඳීමට නො පැමිණියෙමි. එහි දුක්වූයෙම් පිහිටක් නැත්තෙම් දස රැයක් සයනය කෙළෙමි.

2906. ඉක්බිති ගෙරින්ගේ වල්ග වැනි වලගක් ඇති පර්වතයෙහි හැසිරෙන්නා වූ වඳුරෙක් අත්තෙන් අත්තට පනිමින් ගස්වල ගෙඩි කමින් එහි පැමිණියේ ය.

2907. ඒ වඳුරා කෘශ වූ පඬුවන් මා දැක මා කෙරෙහි කුළුණු කෙළේ ය. චින්වත, මෙහි දුකින් පෙළුණා වූ හේ (මෙතෙම) කවරෙක් නම් වේ ද? මනුෂ්‍යයෙක් ද? අමනුෂ්‍යයෙක් ද? තමා තතු මට දන්වව.

2908. ඒ වඳුරාට ඇඳිලි බැඳ මේ වචනය කීයෙමි. මම වනාහි විපතට පත් මිනිසෙක්මි. මට මෙතැනින් යැමෙක් නම් නැත. එය නුඹට කියමි. නුඹට යහපතෙක් වේවා, නුඹ ද මට පිහිට වෙවයි කීමි.

2909. වඳුරු රජ තෙම බර වූ ගලක් ගෙන ගල හා යෙදීමක් කොට පර්වතයෙහි හැසිරෙමින් මෙය කීයේ ය.

2910. එව මගේ පිටට නඟුව. දෝතින් ගෙල අල්ලා ගනුව. මම තා වේගයෙන් ගිරි දුර්ගයෙන් ගොඩට ගන්නෙමි යි වඳුරා කීයේ ය.

2911. ශ්‍රීමත් වූ ඒ වඳුරු රජුගේ වචනය අසා ධෛර්‍ය්‍ය සම්පන්න වූ ඔහුගේ පිටට නැඟ දෙ අතින් ගෙල අල්ලා ගත්තෙමි.

2912. තෙජස් ඇති ශක්ති සම්පන්න වූ ඒ වඳුරා ඉතා වෙහෙසට පැමිණෙමින් දුකසේ ඒ නරකාවාටයෙන් මා වහා ගොඩ ගත්තේ ය.

2913. මා ගොඩ ගෙන වෙහෙස වූ ශ්‍රෙෂ්ඨ වඳුරු තෙම මේ වචන කීයේ ය. යහළුව, මම මොහොතක් කල් නිදන්නෙමි. එබැවින් මා ආරක්ෂා කරව.

2914. සිංහයෝ ද ව්‍යාඝ්‍රයෝ ද දිවියෝ ද වලස්සු ද වෘකයෝ ද යනාදි චණ්ඩ මෘගයෝ මේ වනයෙහි වෙද්ද, නිදි ගත් හෙයින් ප්‍රමත්ත වූ මා ඒ සත්වයෝ හිංසා කෙරෙත්, නුඹ ඔවුන් දැක වළකව.

2915. මෙසේ මට ආරක්ෂා කරන්නට කියා ඒ වඳුරු තෙම මොහොතක් නිද ගත්තේ ය. එකල්හි නුනුවණින් මෙනෙහි කිරීමෙහි යෙදුණු මම ලාමක වූ අදහසක් ඇති කරගත්තෙමි.

2916. භක්ඛො අයං මනුස්සානං යථා චඤ්ඤෙ වනෙ මිගා,
යන්නූනිමං වධිත්වාන ඡාතො ඛාදෙය්‍යං වානරං.

2917. අසිතො ච ගමිස්සාමි මංසමාදය සම්බලං,
කන්තාරං නිත්ථරිස්සාමි පාථෙය්‍යං මෙ භවිස්සති.

2918. තතො සිලං ගහෙත්වාන මත්ථකං සන්නිතාළයිං,
මම භත්තකිලන්තස්ස[1] පහාරො දුබ්බලො අහු.

2919. සො ච වෙගෙනුදප්පත්තො කපි රුධිරමක්ඛිතො,[2]
අස්සුපුණ්ණෙහි නෙත්තෙහි රොදන්තො මං උදික්ඛති.

2920. මාය්‍යො මං කරි භද්දන්තෙ ත්වං ච නාමෙදිසං කරි,
ත්වං ච ඛො නාම දීඝායු අඤ්ඤෙ වාරෙතුමරහසි.

2921. අහො වත රෙ පුරිස තාව දුක්කරකාරක,
එදිසා විසමා දුග්ගා පපාතා උද්ධතො මයා.

2922. ආනීතො පරලොකාව දුබ්භෙය්‍යං මං අමඤ්ඤථ,
තන්තෙන පාපධම්මෙන පාපං පාපෙන චින්තිතං.

2923. මා හෙව ත්වං අධම්මට්ඨ වෙදනං කටුකං ඵුසි,
මාහෙව පාපකම්මන්තං ඵලං වෙළුංව තං වධි.

2924. තයි මෙ නත්ථි විස්සාසො පාපධම්මො අසඤ්ඤතො,*
එහි මෙ පිට්ඨිතො ගච්ඡ දිස්සමානොව සන්තිකෙ.

2925. මුත්තොසි[3] හත්ථා වාලානං පත්තොසි මානුසිං පදං,
එස මග්ගො අධම්මට්ඨ තෙන ගච්ඡ යථා සුඛං.

2926. ඉදං වත්වා ගිරිවරො රුහිරං පක්ඛාල්‍ය[4] මත්ථකං,
අස්සූනි සම්පමජ්ජිත්වා තතො පබ්බතමාරුහි.

2927. සොහං තෙනාභිසත්තොස්මි පරිළාහෙන අද්දිතො,[5]
ඩය්හමානෙන ගත්තෙන වාරිං පාතුං උපාගමිං.

1. ගත්ත - මජසං.
2. කපිරුහිර - වි. මජසං,
* පාපධම්ම අසඤ්ඤතෙ - සු.
3. මුත්තාති - නා.
4. පක්ඛල්‍ය - වි. මජසං, ස්‍යා.
5. අට්ටිතො භවිතබ්බං - වි. මජසං.

2916. සෙසු වන මෘගයන් මෙන් ම මෙ තෙමේ ද මිනිසුන්ගේ ආහාරය වේ. එබැවින් සා දුකින් පෙළුණෙම් මොහු මරා කන්නෙම් නම් යෙහෙකැ යි සිතුවෙමි.

2917. අනුභව කරන ලද්දේ ද මාර්ගොපකරණ වශයෙන් මස් හැරගෙන යන්නෙමි. එහෙයින් වන කාන්තාරය එතෙර කරන්නෙමි. මට මාර්ගොපකරණ ද වන්නේය.

2918. ඉන්පසු ගලක් ගෙන හිසට ගැසුවෙමි. ආහාරයෙන් ක්ලාන්ත වූ මගේ පහර දුර්වල විය.

2919. වේගයෙන් නැගිට ලෙයින් වැකුණා වූ ඒ වඳුරු තෙමේ කඳුළු පිරි දෙනෙතින් හඬමින් මා දෙස බැලුවේ ය.

2920. පින්වත් තෙම මට යහපතක් නො කළේ ය. නුඹ මෙබන්දක් මට කෙළෙහි ය. නුඹ ද දීර්ඝායු වෙහිවා, මට විපත් කරන අන්‍යයන් වළකන්නට වටනෙහි ය.

2921. මෙබඳු නො කළ හැක්කක් කළා වූ අසත්පුරුෂය, මා විසින් මේ දුර්ගම වූ ප්‍රපාතයෙන් ගොඩ නඟන ලද තෝ මෙබඳු අයුත්තක් කෙළෙහි ය.

2922. පරලොවින් ගෙනෙන ලද්දකු මෙන් නරාවළින් ගොඩ ගත්තා වූ තෝ (මා) මැරියයුතු කොට සිතුවෙහි ය. ලාමක ස්වභාව ඇති පාපී වූ තා විසින් ඒ පවිටු අදහස් සිතන ලදී.

2923. අධර්මයෙහි පිහිටි තැනැත්ත, තෝ මෙබඳු කටුක වෙදනාවක් ස්පර්ශ නො කෙරෙහි වා, තා විසින් කළ ඒ පාප කර්මයාගේ විපාකය හුණ ගස නසන්නා වූ ඵලය මෙන් තා නො නසාවා.

2924. ලාමක ස්වභාව ඇති නො හික්මුණු තා කෙරෙහි මාගේ විශ්වාසයෙක් නැත. මා පිටුපස එව. ළඟ දකිමින් ම යව.

2925. පින්වත් පුරුෂය, තෝ ව්‍යාලමෘගයන් අතින් මුදන ලද්දෙහි ය. මිනිස්පියට පැමිණියෙහි ය. අධර්මිෂ්ඨය, මේ මාර්ගය යි. ඒ මගින් සැපසේ යව.

2926. පර්වතචාරි වූ වඳුරු තෙම මෙසේ ප්‍රකාශ කොට මස්තකයෙහි ලේ සෝද පියා කඳුළු පිසදමා එතැනින් පර්වතයට නැංගේ ය.

2927. ඒ මම වඳුරු රජු විසින් සාප කරන ලද්දෙම් දැවිල්ලෙන් පෙළුණෙමි. දැවෙනු ලබන්නා වූ ශරීරයෙන් යුක්ත වැ ජලය පානය කරන්නට (එක් විලකට) ආවෙමි.

2928. අග්ගිනා විය සන්තත්තො රහදෙ රුධිරමක්ඛිතො,
පුබ්බලොහිතසඞ්කාසො සබ්බො මෙ සමපජ්ජථ.

2929. යාවන්තො උදබින්දූනි කායස්මිං නිපතිංසු මෙ,
තාවන්තො ගණ්ඩු ජායෙථ අඩ්ඪබෙලුවසාදිසා.

2930. පභින්නා පග්ඝරිංසු මෙ කුණපා පුබ්බලොහිතා,
යෙන යෙනෙව ගච්ඡාමි ගාමෙසු නිගමෙසු ච.

2931. දණ්ඩහත්ථා නිවාරෙන්ති ඉත්ථියො පුරිසා ච මං,
ඔකිණ්ණා[1] පූතිගන්ධෙන මාස්සු ඔරෙන ආගමා.

2932. එතාදිසං ඉදං දුක්ඛං සත්ත වස්සානිදානි මෙ,
අනුභොමි සකං කම්මං පුබ්බෙ දුක්කටමත්තනො.

2933. තං වො වදාමි භද්දං වො යාවන්තෙත්ථ සමාගතා,
මාස්සු මිත්තාන දුබ්භිත්ථො මිත්තදුබ්භො හි පාපකො.

2934. කුට්ඨී කිලාසී භවති යො මිත්තානං[2] ඉධද්දූභී,
කායස්ස භෙද මිත්තද්දු[3] නිරයං සො උපපජ්ජතීති.

මහාකපිජාතකං.

7. දකරක්ඛසපඤ්හො

2935. සචෙ වො වුය්හමානානං සත්තන්නං උදකණ්ණවෙ,
මනුස්සබලිමෙසානො නාවං ගණ්හෙය්‍ය රක්ඛසො
අනුපුබ්බං කථං දත්වා මුඤ්චෙසි දකරක්ඛිනො.

2936. මාතරං පඨමං දජ්ජං භරියං දත්වාන භාතරං,
තතො සහායං දත්වාන පඤ්චමං දජ්ජං[4] බ්‍රාහ්මණං
ඡට්ඨාහං දජ්ජමත්තානං නෙවදජ්ජං මහොසධං.

2937. පොසෙතා තෙ ජනෙත්තී ච දීඝරත්තානුකම්පිකා,
ඡබ්භී තයි පදුට්ඨස්මිං පණ්ඩිතා අත්ථදස්සිනී
අඤ්ඤං උපනිසං කත්වා වධා තං පරිමොචයි.

---

1. ඔක්කිණ්ණා – වි. මජසං.
2. මිත්තානිධ දුබ්භති – මජසං
3. මිත්තදූභි – මජසං
4. දජ්ජ – වි. ස්‍යා

2928. මුළු විල ගිත්තෙන් හුණු කරන ලද්දක් සේ ද ලෙයින් වැකී ගියාක් මෙන් ද පූයාවට හා ලෙයට සමාන ව මට වැටහුණේ ය.

2929. යම්තාක් දිය බින්දු මාගේ ශරීරයෙහි වැටුණාහු ද, ඒ තාක් අඩබෙලිපල පමණ බුබුළු හටගනී.

2930. මේ ගණ්ඩයෝ කුණුවූවාහු බිඳී පූයා ලේ වැගුරුණාහ. යම් යම් මගෙකින් ගම් නියම්ගම්හි යෙම් ද–

2931. එහි ස්ත්‍රීහු ද පුරුෂයෝ ද දඬුගත් අත් ඇත්තාහු කුණු ගඳින් ගැවැසිගත් හෙයින් මේ දිශාවට නො එව යි මා වළකත්.

2932. දැන් මාගේ මේ දුකට හවුරුදු සතක් විය. පෙර තමන්ගේ දුෂ්කෘත කර්මයාගේ විපාකය අනුභව කරමි.

2933. එහෙයින් තොපට මම කියමි. තොපට යහපතක් ම වේවා, යම් තාක් දෙනා මෙහි රැස් වූවාහු ද, ඒ සියල්ලෝ ම මිත්‍රද්‍රෝහී නො වෙත්වා , යම් හෙයෙකින් මිත්‍රද්‍රොහකර්මය ලාමක වේ ද එහෙයිනි.

2934. මෙලොව යමෙක් මිත්‍රයනට ද්‍රොහ කෙරේ ද, හෙ කුෂ්ටරොගියෙක් කිලාස ඇත්තෙක් වේ. ඒ මිත්‍රද්‍රොහී තෙම මරණින් මතු නිරයෙහි උපදී යයි වදාළසේක.

මහාකපි ජාතක යි.

7. උදකරාක්‍ෂස ප්‍රශ්නය

2935. මහරජ, ගැඹුරු සයුරෙහි නැවකින් යාත්‍රා කරන කල්හි මිනිස් බිල්ලක් සොයන්නා වූ රකුසෙක් නැව අල්ලා ගන්නේ නම් නුඹගේ මෑණියන් ඇතුළු සත් දෙනා අතුරෙන් කවරකු කෙසේ පිළිවෙළින් දියරකුසාට දී (දිය රකුසාගෙන්) මිදෙන්නෙහි ද යි භෙරී නම් පරිව්‍රාජිකාව ඇසුවා ය.

2936. ආයුෂ්මවනි, පළමු කොට මෑණියන් දෙන්නෙමි. ඉන්පසු බිරිය දී සහෝදරයා දෙන්නෙමි. සතරවනුව යහළුවා දී පස්වනුව බ්‍රාහ්මණයා දෙන්නෙමි. සවනුව මම තමන් දෙන්නෙමි. මහෞෂධ පණ්ඩිතයන් නො මැ දෙන්නෙමි යි රජ තෙම කීයේ ය.

2937. මහරජ, නුඹගේ ඔව නුඹ වැදූ තැනැත්තී ය. නුඹ පොෂණය කළ තැනැත්තී ය. ඡම්භී නම් බ්‍රාහ්මණයා නුඹ කෙරෙහි දුෂ්ට වූ කල්හි නුවණැති වූ යහපත දක්මෙහි සමත් ඕ අනෙකකු පෙන්නා නුඹ මරණයෙන් මිදුවා ය.

2938. තං තාදිසං පාණදදිං ඔරසං ගබ්භධාරිණිං,
මාතරං කෙන දෙසෙන දජ්ජාසි දකරක්ඛිනො.

2939. දහරා විය අලඞ්කාරං ධාරෙති අපිළන්ධනං,
දෙවාරිකෙ අනීකට්ඨෙ අතිවෙලං පජග්ඝති.

2940. තතොපි පටිරාජානං සයං දූතානි සාසති,
මාතරං තෙන දෙසෙන දජ්ජාහං දකරක්ඛිනො.

2941. ඉත්ථිගුම්බස්ස පවරා අච්චන්තපියවාදිනී[1],
අනුග්ගතා[2] සීලවතී ඡායාව අනපායිනී.

2942. අක්කොධනා පඤ්ඤවතී පණ්ඩිතා අත්ථදස්සිනී,
උබ්බරිං[3] කෙන දෙසෙන දජ්ජාසි දකරක්ඛිනො.

2943. ඛිඩ්ඩාරතිසමාපන්නං අනත්ථවසමාගතං,
සා මං සකානං පුත්තානං අයාචං යාචතෙ ධනං.

2944. සොහං දදමි සාරත්තො[4] බහුං උච්චාවචං ධනං,
සුදුච්චජං චජිත්වාන පච්ඡා සොචාමි දුම්මනො
උබ්බරිං තෙන දෙසෙන දජ්ජාමි දකරක්ඛිනො.

2945. යෙනොචිතා ජානපදා[5] ආනීතා ච පටිග්ගහං,
ආහතං පරරජ්ජෙහි අභිට්ඨාය[6] බහුං[7] ධනං.

2946. ධනුග්ගහානං පවරං සූරං තික්ඛිණමන්තිනං,
භාතරං කෙන දෙසෙන දජ්ජාසි දකරක්ඛිනො.

2947. මයොචිතා[8] ජානපදා ආනීතා ච පටිග්ගහං,
ආහතං පරරජ්ජෙහි අභිට්ඨාය බහුං ධනං.

2948. ධනුග්ගහානං පවරො සූරො තික්ඛිණමන්තී ච,
මයායං සුඛිතො රාජා අතිමඤ්ඤති දූරකො.

2949. උපට්ඨානම්පි මෙ අය්‍යෙ න සො එති යථා පුරෙ,
භාතරං තෙන දෙසෙන දජ්ජාහං දකරක්ඛිනො.

---

1. අච්චන්තං පිය භාණිනී – මජසං. ස්‍යා.
2. අනුබ්බතා – ස්‍යා, අනුපුබ්බතා – මජසං.
3. උප්පරිං – මජසං.
4. සාරත්තො – ස්‍යා.
5. ජනපදා – මජසං.
6. අභිත්ථාය – මජසං.
7. බහු – ස්‍යා.
8. යෙනොචිතා – මජසං.

2938. ප්‍රාණය දුන්නා වූ ළෙහි හොවා හැදූ ගැබිහි දරා සිටි එබඳු මැණි කෙනකුන් කිනම් වරදක් නිසා ජලරකුසාට දෙන්නෙහි-දැ යි පරිව්‍රාජිකාව ඇසුවා ය.

2939. මහලු වුව ද තරුණියක සේ නො පැළඳිය මනා අබරණ පළඳියි. දෙරටුපාලයන් හා යුද සෙබළුන් හා වේලා ඉක්මවා මහත් කොට සිනාසෙයි.

2940. තවද සාමන්ත රජුනට මාගේ හස්න සේ අහවා තොමෝ මැ දූතයන් අත හසුන්පත් යවයි. ඒ දෙෂය හෙතු කොට ගෙන මව දිය රකුසාට දෙන්නෙමි යි කීය.

2941. මේ නන්‍ද දේවි තොමෝ ස්ත්‍රී සමූහයාහට උතුම් වූ බොහෝ ප්‍රිය වචන බෙණෙන බාලකාලයේ පටන් සිතැඟි ලෙස හැසුරුණු ආචාර සීලයෙන් යුත් සෙවණැල්ල මෙන් නොහැර පවත්නා වූ,

2942. නො කිපෙනසුලු වූ නුවණැති පණ්ඩිත වූ යහපත අයහපත දක්මෙහි සමත් තැනැත්තියකි. එබඳු අගමෙහෙසිය කිනම් දෙසක් නිසා දිය රකුසාට දෙන්නෙහි ද යි.

2943. කාම ක්‍රීඩා රතියෙන් යුක්ත වූ අවැඩදායක වූ කෙලෙස් වසයට පැමිණි මාගෙන් මේ නන්‍ද තොමෝ දූ පුතුන්හට දෙන ලද හෙයින් නො ඉල්වියයුතු ධනය ඉල්ලයි.

2944. කාමයෙන් ඇලුණා වූ ඒ මම දීමට දුෂ්කර වූ කුඩු මහත් ධනය දී පසුව (අඩමින් මා වෙත එන දූ පුතුන් දැක) දොම්නස් වූයෙමි ශොක කරමි. ඒ දෙෂයෙන් මම අගබිසොව දිය රකුසාට දෙන්නෙමි යි රජ තෙම කීයේ ය.

2945. මහරජ, යමකු විසින් ජනපදයෝ දියුණු කරන ලද්දහු ද, යමකුන් විසින් පිටරට විසූ තමුන්නාන්සේ නැවත ගෙට පමුණුවන ලද්දහු ද පිටරටවලින් ඔවුන් මැඩලා බොහෝ ධනය ගෙනෙන ලද්දේ ද-

2946. ධනුර්ධරයන් අතුරෙන් උතුම් වූ ශූර වූ සියුම් නුවණැති ඒ සහොදරයා කිනම් දෙසක් නිසා දිය රකුසාට දෙන්නෙහි ද?

2947. මා විසින් ජනපදයෝ දියුණු කරන ලද්දහ. පිටරට සිටි රජ ද සිය ගෙට පමුණුවන ලද්දේ ය. පිටරටවලින් ඔවුන් මැඩලා බොහෝ ධනය ගෙනෙන ලද්දේ ය.

2948. මම ධනුර්ධරයන්ගෙන් උතුම් ද වෙමි. ශූර ද වෙමි. සියුම් නුවණැත්තෙම් ද වෙමි. මා විසින් මේ රජ සුවපත් කරන ලද්දේ යයි තරුණ වූ මෙතෙමේ මා ඉක්මවා හඟියි.

2949. ආයසීාවෙනි, හෙ පෙර මෙන් උපස්ථානයට ද මා කරා නො එයි. ඒ දෙෂය හෙතු කොට ගෙන සහොදරයා දිය රකුසාට දෙමි යි රජ තෙමේ කීය.

2950. එකරත්තෙන උභයො තුවඤ්ඤ[1] ධනුසෙඛවා,
උභො ජාතෙත්ථ පඤ්චාලා සහායා සුසමාවයා.

2951. චරියා තං අනුබන්ධිත්වා[2] එකදුක්ඛසුඛො තව,
උස්සුක්කො තෙ දිවාරත්තිං සබ්බකිච්චෙසු ව්‍යාවටො[3].
සහායං කෙන දෙසෙන දජ්ජාසි දකරක්ඛිනො.

2952. චරියාය[4] අයං අය්‍යො පජග්ඝිත්වා මයා සහ,
අජ්ජාපි තෙන වණ්ණෙන අතිවෙලං පජග්ඝති.[5]

2953. උබ්බරියාපි මෙ අය්‍යො මන්තයාමි රහොගතො,
අනාමන්තා පවිසති පුබ්බෙ අප්පටිවෙදිතො.

2954. ලද්ධවාරො කතොකාසො අහිරිකං අනාදරං,
සහායං තෙන දෙසෙන දජ්ජාහං දකරක්ඛිනො.

2955. කුසලො සබ්බනිමිත්තානං රුදඤ්ඤූ[6] ආගතාගමො,
උප්පාදෙ සුපිනෙ යුත්තො නිය්‍යාණෙ ච පවෙසනෙ.

2956. පද්ධො[7] භුම්මන්තලික්ඛස්මිං නක්ඛත්තපදකොවිදො,
බ්‍රාහ්මණං කෙන දෙසෙන දජ්ජාසි දකරක්ඛිනො.

2957. පරිසායම්පි මෙ අය්‍යො මීලයිත්වා උදික්ඛති,
තස්මා අජ්ජ භමුං ලුද්දං දජ්ජාහං දකරක්ඛිනො.

2958. සසමුද්දපරියායං මහිං සාගරකුණ්ඩලං,
වසුන්ධරං ආවසසි අමච්චපරිවාරිතො.

2959. චාතුරන්තො මහාරට්ඨො විජිතාවී මහබ්බලො,
පඨව්‍යා එකරාජාසි යසො තෙ විපුලං ගතො[8].

2960. සොළසිත්ථිසහස්සානි ආමුත්තමණිකුණ්ඩලා,
නානාජනපද නාරියො දෙවකඤ්ඤූපමා සුභා.

---

1. ත්වංසඤ්ඤ - මජසං,
2. අනුබන්ධො - මජසං.
3. වාවටො - මජසං,
4. චරියාම - මජසං.
5. සඤ්ජග්ඝති - මජසං.
6. රුතඤ්ඤූ - මජසං.
7. පට්ඨො.
8. විපුලග්ගතො - වි.

2950. ඔබ වහන්සේ ද ධනුශෙඛර කුමරා ද යන දෙදෙන ම මේ නුවර එක රැයෙක්හි උපන්නාහුය. එවක් පටන් සමාන වයස් ඇති ඔවුහු පංචාල දෙශයෙහි යහළුවෝ වූහ.

2951. හේ කුඩාකල සිට ම ඔබ වහන්සේ සමග ම හැසිරුණේ ය. ඔබ හා සමාන සුව දුක් ඇත්තේ ය. දිවා රෑ දෙක්හි උත්සාහවත් ව ඔබගේ සැම කටයුත්තෙහි යෙදුණෙකි. එබඳු යහළුවා කිනම් දෙසයක් නිසා දිය රකුසාට දෙන්නෙහි දැ යි ඇසුවා ය.

2952. ආයර්‍යාවෙනි, පෙර මා සමග හැසිරීමෙන් මොහු මහත් කොට සිනාසුණේ ය. අදත් ඒ ආකාරයෙන් ම සීමාව ඉක්මවා මහත් කොට සිනාසේ යයි රජ තෙම කීය.

2953. ආයර්‍යාවෙනි, මා අගබිසොව සමග රහසිගත ව කථා කරන කල්හි නො කැඳවා ලද (මේතෙම) වහා ගේ තුළට පිවිසෙයි.

2954. ලද වාර ඇත්තේ අවකාශ ලැබූ මම විළිනැති අනාදරව හැසිරෙන ඒ යහළුවා ඒ දෙෂයෙන් දිය රකුසාට දෙමි යි රජ තෙම කීය.

2955. මහරජ, මේ කේවට්ට නම් බමුණු තෙම සියලු නිමිති කීමෙහි දක්ෂය. සතුන්ගේ හඬ දන්නේ ය. ධර්මශාස්ත්‍ර උගත්තේ ය. චන්ද්‍රග්‍රහණ සූර්‍යග්‍රහණාදිය ඇතිවීමෙහි හෙතු දන්නේ ය. ස්වප්න ඵලාඵල දන්නේ ය. ගමන් යාමෙහි ද ගෘහප්‍රවෙශයෙහි ද ගුණාගුණ කියන්නේ ය.

2956. භූමියෙහි ද අහසෙහි ද ගුණාගුණ කීමෙහි දක්ෂය. නක්ෂත්‍ර පද දැනුමෙහි සමර්ථය. එබඳු බමුණා කිනම් දෙසක් නිසා දෙන්නෙහි දැ යි.

2957. ආයර්‍යාවෙනි, මේ බ්‍රාහ්මණයා පිරිස් මැද දී මා දෙස ඇස දල්වා බලයි. එහෙයින් මම රෞද්‍ර වූ බැම ඇති බමුණා රකුසාට දෙමි යි රජ තෙම කීයේ ය.

2958. මුහුදින් වට වූ සාගරයට කුණ්ඩලාභරණයක් බඳු වූ සියල්ල දරන්නා වූ මේ පොළොව ඇමතියන් විසින් පිරිවරන ලද නුඹ වහන්සේ අයත් කොට ගෙන වසන්නහු ය.

2959. නුඹ වහන්සේ සිව් දිගට පතළා වූ මහත් රට ඇති දිනාගන්නා ලද ප්‍රදෙශ ඇත්තේ මහාබලැත්තහුය. මුළු පොළවෙහි එක ම රජ වූවහු ය. නුඹ වහන්සේගේ යශස මහත් ව පැතිර ගියේ ය.

2960. පළඳනා ලද මිණිකොඩොල් ඇති නොයෙක් ජනපදයන්ට අයත් වූ ස්ත්‍රීහු දෙවඟනන් සේ පැහැපත් වූවාහු සොළොස් දහසක් වෙති.

2961. එවං සබ්බඞ්ගසම්පන්නං සබ්බකාමසමිද්ධිනං,
සුඛිතානං පියං දීඝං ජීවිතං ආහු ඛත්තිය.

2962. අථ ත්වං කෙන වණ්ණෙන කෙන වා පන හෙතුනා,
පණ්ඩිතං අනුරක්ඛන්තො පාණං චජසි දුච්චජං.

2963. යතොපි ආගතො අය්‍යො මම හත්ථං මහොසධො,
නාභිජානාමි ධීරස්ස අණුමත්තම්පි දුක්කතං.

2964. සචෙ ච[1] කිස්මිචි[2] කාලෙ මරණං මෙ පුරෙ සියා,
පුත්තෙ ච මෙ පපුත්තෙ[3] ච සුඛාපෙය්‍ය මහොසධො.

2965. අනාගතං පච්චුප්පන්නං සබ්බමත්ථං විපස්සති,
අනාපරාධකම්මන්තං න දජ්ජං දකරක්ඛිනො.

2966. ඉදං සුණොථ පඤ්චාලා චූළනීයස්ස[4] භාසිතං,
පණ්ඩිතං අනුරක්ඛන්තො පාණං චජති දුච්චජං.

2967. මාතු භරියාය[5] භාතුච්ච සඛිනො බ්‍රාහ්මණස්ස ච,
අත්තනො චාපි පඤ්චාලො ඡන්නං චජති ජීවිතං.

2968. එවං මහත්ථිකා[6] පඤ්ඤා නිපුණා සාධුචින්තනී,[7]
දිට්ඨධම්මෙ හිතත්ථාය සම්පරායෙ සුඛාය චාති.

දකරක්ඛසපඤ්හා.

8. පණ්ඩරකජාතකං

2969. විකිණ්ණවාචං අනිගුය්හමන්තං[8]
අසඤ්ඤතං අපරිචක්ඛිතාරං
භයං තමෙති සයං අබොධං
නාගං යථා පණ්ඩරකං සුපණ්ණා.

2970. යො ගුය්හමන්තං පරිරක්ඛණෙය්‍යං
මොහා නරො සංසති භාසමානො,
තං භින්නමන්තං භයමෙති ඛිප්පං
නාගං යථා පණ්ඩරකං සුපණ්ණා.

---

1. සචෙපි – මජසං.
2. කිස්මිඤ්චි – වි. මජසං.
3. පුත්තා – මජසං.
4. චූළනෙය්‍යස්ස – මජසං.
5. භරියාච – වි.
6. මහිද්ධිකා – වි. මජසං. ස්‍යා.
7. සාධුචින්තිනී – මජසං.
8. අනිගුළ්හ – වි.
9. අපරිරක්ඛිතාරං – වි.

2961. මහරජ, මෙසේ සියලු අංගයන්ගෙන් යුත් සියලු කාම සම්පතින් පිරිගිය සුවපත් ව වෙසෙන්නන්හට දිගු කලක් ජීවත්වීම ප්‍රිය යයි නුවණැත්තෝ කියත්.

2962. එසේ තිබිය දී කවර හෙතුවක් නිසා මහෞෂධ පණ්ඩිතයන් රකිමින් හරනට නොහැකි වූ ප්‍රාණය පවා කෙසේ නම් හරනෙහි ද යි පරිව්‍රාජිකාව ඇසුවා ය.

2963. ආයුෂ්මාවනි, මහෞෂධ තෙමේ යම් දිනක සිට මා වෙතට පැමිණියේ ද එද සිට මෙතෙක් කාලය තුළ මහෞෂධ පණ්ඩිතයන්ගේ ස්වල්ප මාත්‍ර වූ වරදක් ගැනවත් නො ම දනිමි.

2964. ඉදින් මාගේ මරණය පළමු කොට සිදු වෙ නම් මහෞෂධ තෙමේ මාගේ දූ පුතුන් ද මුණුබුරන් ද සුවපත් කරන්නේ ය.

2965. මෙ තෙමේ අනාගතාර්ථයන් ප්‍රත්‍යුත්පන්නාර්ථයන් යන සියල්ල දකී. නිරපරාධ වූ ක්‍රියා ඇති ඔහු දියරකුසාට නො දෙමි යි රජ තෙම කීය.

2966. එම්බා පංචාල රටවැසියෙනි, චූලනීබ්‍රහ්මදත්ත රජුගේ මෙ කීම අසවු. රජ තෙමේ මහෞෂධ පණ්ඩිතයන් රකිමින් හැර දැමිය නොහැකි ප්‍රාණය පවා හැර දමයි.

2967. පංචාල රජ තෙම සිය මවගේ ද භාර්‍යාවගේ ද සහොදරයාගේ ද යහළුවාගේ ද බ්‍රාහ්මණයාගේ ද තමන්ගේ ද යන සදෙනාගේ ම හැර දැමිය නො හැකි ජීවිත හැර දමයි.

2968. මෙසේ ප්‍රඥාතොමෝ මහත් ප්‍රයොජන ඇත්තී ය. නිපුණ ය. යහපත් සිතුවිලි දනවන්නී ය. මෙලොවැ හිත පිණිස හා පරලොව සුව පිණිස ද වන්නී ය, (භෙරි නම් පරිව්‍රාජිකාව කීවා යයි වදළසේක.)

උදකරාක්ෂස පැනය යි,

8. පණ්ඩරක ජාතකය

2969. විසුරුණා වූ වචන ඇති, නො සඟවන ලද මන්ත්‍රණ ඇති, සංයත නො වූ කියයුතු නො කියයුතු බව නොදන්නා වූ අනුවණ ඒ පුද්ගලයා අනුව තමා විසින් කරන ලද්ද වූ ම භය පසු පස යෙයි. කුමක් මෙන් ද යත්: පණ්ඩරක නාග නම් වූ මා අනුව ගිය සුපර්ණයා මෙනි.

2970. යම් මිනිසෙක් සැඟවියයුතු රහස් මන්ත්‍ර කථා කරමින් එය රැකිය නො හැක්කහුට මුළායෙන් කියා ද බිඳුණා වූ මන්ත්‍ර ඇති ඒ පුද්ගලයා පසු පසැ බිය ගමන් කෙරෙයි. කවරකු මෙන් ද යත්: පණ්ඩරක නම් නාගයා අනුව ගිය සුපර්ණයා මෙනි.

2971. නානුම්මිතො ගරුං අඤ්ඤං ගුය්හං වෙදිතුමරහති[1],
සුම්මිතො ච අසම්බුද්ධං සම්බුද්ධං වා අනත්ථවා.

2972. විස්සාසමාපජ්ජිමහං අචෙලො
සමණො අයං සම්මතො භාවිතත්තො,
තස්සාහමක්ඛිං විවරං[2] ගුය්හමත්ථං
අතීතමත්ථො කපණං රුදමි.

2973. තස්සාහං පුරිමං බ්‍රහ්මෙ ගුය්හං
වාචං හි මං නාසක්ඛිං[3] සංයමෙතුං
තප්පක්ඛතො හි භයමාගතං මෙ
අතීතමත්ථො කපණං රුදමි.

2974. යො වෙ නරො සුහදං මඤ්ඤමානො
ගුය්හමත්ථං සංසති දුක්කුලීනෙ,
දොසා භයා අථවා රාගරත්තො
පල්ලත්ථිතො[4] බාලො අසංසයං සො.

2975. තිරොක්ඛවාචො අසතං පවිට්ඨො
යො සඞ්ගතීසු මුදීරෙති වාක්‍යං,
ආසීවිසො දුම්මුඛො ත්‍යාහු තං නරං
ආරා ආරා සංයමෙ තාදිසම්හා.

2976. අන්නං පානං කාසි[5]කචන්දනඤ්ච
මනාපිත්ථියො මා[6]ලච්ඡාදනඤ්ච,
ඔහාය ගච්ඡාමසෙ සබ්බකාමෙ
සුපණ්ණ පාණූපගතාව ත්‍යම්හා.

2977. කොනීධ[7] තිණ්ණං ගරහං උපෙති
අස්මිඤ්ච ලොකෙ පාණභූ නාගරාජ,
සමණො සුපණ්ණො අථවා තවෙව
කිං කාරණා පණ්ඩරකග්ගහීතො.

2978. සමණොති මෙ සම්මතත්තො අහොසි
පියො ච මෙ මනසා භාවිතත්තො,
තස්සාහමක්ඛිං විවරං ගුය්හමත්ථං
අතීතමත්ථො කපණං රුදමි.

2979. න චත්ථි සත්තො අමරො පඨබ්‍යා
පඤ්ඤාවිධා නත්ථි න නින්දිතබ්බා,
සච්චෙන ධම්මෙන ධියා දමෙන
අලබ්භමබ්‍යාහරතී නරො ඉධ.

1. වෙදෙතු – වි.
2. විවරිං – වි. මජසං, සයා.
3. නාසක්ඛි – මජසං.
4. පල්ලත්ථො – වි. පල්ලත්ථිකො – මජසං.
5. කාසිකං – වි.
6. මාලමුච්ඡාදනඤ්ච – මජසං.
7. කොනචිධං – මජසං.

2971. අනුවර්තන මාත්‍රයෙන් මිත්‍ර වූයේ ගරු වූ සඟවාලියයුතු කරුණ දැනගන්නට නිසි නොවේ. අනුවණ සුහද මිතුරා ද අනර්ථකාරී නුවණැතියා ද රහස දැනගන්නට නිසි නොවේ.

2972. මම මේ අචේලකයා ශ්‍රමණයෙකැ යි ද ලොකසම්මත යැයි ද භාවිත සිත් ඇත්තෙකැ යි ද විශ්වාසයට පැමිණියෙමි. ඔහුට මම ගුහ්‍යාර්ථය විවෘත කොට කීමි. දැන් ඉක්ම ගිය යහපත ඇත්තේ බැගෑපත් ව හඬමි.

2973. සුපර්ණය, පළමු කොට සැඟවිය යුතු මේ වචනය ඔහුට සඟවන්නට මම නොසමත් වීමි. මේ බිය මට ඔහුගේ පාර්ශ්වයෙන් පැමිණියේ ය. එහෙයින් ඉක්ම ගිය යහපත ඇත්තෙම් බැගෑපත් ව හඬමි.

2974. යම් මිනිසෙක් මොහු සුහෘදය යි හඟිමින් පහත් කුලැතියකු කෙරෙහි ද්වෙෂයෙන් හෝ බියෙන් හෝ වැලි රාගවශයෙන් ඇල්මෙන් හෝ සැඟවියයුතු කරුණක් කියා නම්, ඒ අඥාන තෙම නිසැක ව ම පෙරළා විනාශයට පමුණුවනු ලබන්නේ ය.

2975. පිළිසන්වචන ඇති අසත්පුරුෂයන්ට අයත් වූ යමෙක් සැඟවිය යුතු වචනය පිරිස් මැද කියා ද ඒ මිනිසා ආශීර්විෂයකු මෙන් අයහපත් මුඛ ඇත්තෙකැ යි කියත්. එබන්දහු කෙරෙන් දුරින් ම දුරු වන්නේ ය.

2976. ආහාර ද පාන වර්ග ද කසී සඳුන් ද මනවඩන ස්ත්‍රීන් ද මල් ද දිව්‍යමය සිවුදැගඳ ද ඇඟ ඉලීම් ද, යන සියලු කාම සම්පත් අත් හැර දමා යන්නෙමු. සුපර්ණය, දිවිහිමි කොට තොප කරා පැමිණියම්හ. අපට පිහිට වව යි.

2977. ප්‍රාණියකු වූ නාගරාජය, ශ්‍රමණයා ද සුපර්ණයා ද නුඹ ද යන තිදෙනා අතුරෙන් මෙලොව කවරෙක් නම් නින්දාවට පැමිණේ ද කවර හෙයෙකින් සුපර්ණයා විසින් මම ගන්නා ලද්දෙම්දැයි තමාට ම නින්දා කරව.

2978. හෙතෙම මා විසින් (සත්පුරුෂ) ශ්‍රමණයෙකැයි සම්මත කරන ලද්දේ විය. මට ප්‍රියයෙක් ද විය. සිතින් සම්භාවනා කරන ලද්දෙක් ද විය. එහෙයින් මම ඔහුට සැඟවියයුතු කරුණ ප්‍රකට කොට කීමි. ඉක්ම ගිය යහපත ඇත්තේ බැගෑපත් ව හඬමි.

2979. නාගරාජය, මේ පෘථිවියෙහි නො මැරෙන ස්වභාව ඇති සත්වයෙක් නම් නැත්තේ ය. ප්‍රඥාව සමාන වූ නින්දා නො කටයුතු අන්කිසිවෙක් ද නැත. සත්‍යවචනයෙන් ද සුචරිත ධර්මයෙන් ද ප්‍රඥායෙන් ද ඉන්ද්‍රිය දමනයෙන් ද මෙලොව මනුෂ්‍ය තෙම නො ලැබිය හැකි දෑය (අෂ්ටසමාපත්ති මාර්ග ඵල නිර්වාණ) ලබන්නේ ය.

2980. මාතා පිතා පරමා බන්ධවානං
නාස්ස[1] තතියො අනුකම්පකත්ථි,
තෙසම්පි ගුය්හං පරමං න සංසෙ
මන්තස්ස භෙදං පරිසඞ්කමානො.

2981. මාතාපිතා භගිනීභාතරො ච
සහායා වා යස්ස හොන්ති සපක්ඛා,
තෙසම්පි ගුය්හං පරමං න සංසෙ
මන්තස්ස භෙදං පරිසඞ්කමානො.

2982. භරියා චෙ පුරිසං වජ්ජා කොමාරී පියභාණිනී
පුත්තරූපයසූපෙතා ඤාතිසඞ්ඝපුරක්ඛතා,
තස්සාපි ගුය්හං පරමං න සංසෙ
මන්තස්ස භෙදං පරිසඞ්කමානො.

2983. න ගුය්හමත්ථං විවරෙය්‍ය රක්ඛෙය්‍ය නං යථා නිධිං,
න හි පාතුකතො සාධු ගුය්හමත්ථො[2] පජානතා.

2984. ථියා ගුය්හං න සංසෙය්‍ය අමිත්තස්ස ච පණ්ඩිතො,
යො චාමිසෙන සංහීරො හදයත්ථෙනො ච යො නරො.

2985. ගුය්හමත්ථමසම්බුද්ධං සම්බොධයති යො නරො,
මන්තභෙදභයා තස්ස දාසභූතො තිතික්ඛති.

2986. යාවන්තො පුරිසස්සත්ථං ගුය්හං ජානන්ති මන්තිනං,
තාවන්තො තස්ස උබ්බෙගා තස්මා ගුය්හං න විස්සජෙ.

2987. විවිච්ච භාසෙය්‍ය දිවා රහස්සං
රත්තිං ගිරං නාතිවෙලං පමුඤ්චෙ,
උපස්සුතිකා හි සුණන්ති මන්තං
තස්මා මන්තො ඛිප්පමුපෙති භෙදං.

2988. යථාපි අස්ස නගරං මහන්තං
අද්වාරකං ආයසං භද්දසාලං,
සමන්තඛාතාපරිඛාඋපෙතං
එවම්පි මෙ තෙ ඉධ ගුය්හමන්තා.

2989. යෙ ගුය්හමන්තා අවිකිණ්ණවාචා
දළ්හා සදත්ථෙසු නරා දුජිව්හ,
ආරා අමිත්තා බ්‍යවජන්ති තෙහි
ආසීවිසාවාරිව සත්තසඞ්ඝා.

1. තස්ස – මඡසං.
2. ගුය්හො අත්ථො – වි.

2980. නෑයන් අතුරෙන් මවුපියෝ උසස් වෙති. මොහුට මවු පියනට වඩා අනුකම්පා කරන ස්වභාව ඇති තුන්වැන්නෙක් නම් නැත්තේ ය. මන්ත්‍ර භෙදයෙහි සැක කරනුයේ ඔවුනට ද පරම රහස් නො කියන්නේ ය.

2981. යමකුගේ මවුපියෝ ද සහොදර සහොදරීහු ද යහළුවෝ ද යන ස්වපක්ෂයෙහි වූවෝ වෙත් නම්, මන්ත්‍ර භෙදයෙහි සැක කරනුයේ ඔවුනට ද ප්‍රධාන රහස් නො කියන්නේ යැ.

2982. ඉදින් ළදරු වියෙහි පසුවන ප්‍රිය තෙපුල් බෙණෙන, පුත්‍ර සම්පත්තියෙන් හා රූපසම්පත්තියෙන් ද යසසින් ද යුක්ත වූ නෑ සමූහයා විසින් පෙරවූ කරන ලද භාර්යා තොමෝ (තොපගේ රහස මට කියවයි) පුරුෂයාට කියන්නී නමුදු මන්ත්‍ර භෙදයෙහි සැක කරනුයේ ඇයට ද ප්‍රධාන රහස් නො කියන්නේ යැ.

2983. සැඟවිය යුත්ත ප්‍රකට කොට නො කියන්නේ ය. එය නිධානයක් මෙන් රක්නේ ය. දන්නහු විසින් සැඟවියයුතු කරුණු ප්‍රකට කිරීම යහපත් නොවේ.

2984. පණ්ඩිතතෙම රහස ස්ත්‍රියට නො කියන්නේ ය. සතුරාට ද නො කියන්නේ ය. යමෙක් ආමිෂය හෙතු කොට ගෙන එක් වේද ඔහුට ද, හිතෙහි සඟවාගත් සොර (කපටි) අදහස් ඇත්තහුට ද රහස නො කියන්නේ ය.

2985. යම් මිනිසෙක් සැඟවියයුතු කරුණු නො දන්නහුට දක්වා ද හෙතෙම මන්ත්‍රණය අන්කෙනකුන් දන ගනිතැයි හටගත් බියෙන් ඔහුට දසයෙක් ව ඉවසයි.

2986. මිනිසකුගේ මන්ත්‍රණය කරන ලද යම්තාක් සැඟවිය යුතු කරුණු යම් කෙනෙක් දනිත් නම් ඒතාක් ම ඔහුට තැති ගැනීම් ඇති වේ. එබැවින් රහස් නො මුදන්නේ ය.

2987. දවල් කාලයෙහි රහස් කරුණු විවේකව සිට කියන්නේ ය. රාත්‍රියෙහි කියන්නේ සීමාව ඉක්මවා හෙවත් බිත්තියෙන් පිට ඇසෙන සේ නො කියන්නේ ය. යම් හෙයකින් ළඟ අසා සිටියහු මන්ත්‍රණය අසද්ද, එහෙයින් මන්ත්‍රණය වහා ම භෙදයට පැමිණෙන්-නේ යැ.

2988. දෙර නැත්තා වූ සුන්දර ශාලා ඇත්තා වූ හාත්පස කරන ලද දියඅගල් ඇත්තා වූ මහත් අයොමය නුවරක් යම්සේ වන්නේ ද, මේ ලොකයෙහි රහස් මන්ත්‍රණ ඇති ඒ පුරුෂයෝ ද මෙබන්දෝ යයි මට වැටහේ.

2989. නාගරාජය, රහස් මන්ත්‍රණ ඇත්තා වූ නො විසුරුණු වචන ඇත්තා වූ සවාත්‍මයෙහි ස්ථිර වූ යම්බඳු මනුෂ්‍යයෝ වෙද්ද. (ජීවත්වනු කැමැති) සත්වසමූහයා සර්පයන් කෙරෙන් මෙන් පස මිතුරෝ ඔවුන් කෙරෙන් බැහැර වෙත්. ඔවුන් කරා ළංවන්නට අවකාශයක් නො ලබත්.

2990. හිත්වා ඝරං පබ්බජිතො අචෙලො
නග්ගො මුණ්ඩො විචරති ඝාසහෙතු,
තම්හි නු ඛො විවරිං ගුය්හමත්ථං
අත්ථා ච ධම්මා ච අපාගතම්හා.[1]

2991. කථං කරො හොති සුපණ්ණරාජ
කිංසීලො කෙන වතෙන වත්තං,
සමණො චරං හිත්වා මමායිතානි
කථංකරො සග්ගමුපෙති ඨානං.

2992. හිරියා තිතික්ඛාය දමෙන ඛන්තියා
අක්කොධනො පෙසුනියං පහාය,
සමණො චරං හිත්වා මමායිතානි[2]
එවංකරො සග්ගමුපෙති ඨානං.

2993. මාතා ච පුත්තං තරුණං තනූජං[3]
සම්ඵස්ස තං සබ්බගත්තං ඵරෙති,
එවම්පි මෙ ත්වං පාතුරහු දිජින්ද
මාතාව පුත්තං අනුකම්පමානො.

2994. හන්දජ්ජ ත්වං මුච්ච[4] වධා දුජිව්හ
තයො හි පුත්තා නහි අඤ්ඤො අත්ථි,
අන්තෙවාසී දින්නකො අත්‍රජො ච
රජ්ජස්සු පුත්තඤ්ඤතරො මෙ අහොසි.

2995. ඉච්චෙව වාක්‍යං විසජ්ජි[5] සුපණ්ණො
භුම්‍යං[6] පතිට්ඨාය දිජො දුජිව්හං,
මුත්තජ්ජ ත්වං සබ්බභයාතිවත්තො
ථලූදකෙ හොහි මයාභිගුත්තො.

2996. ආතඞ්කිනං යථා කුසලො භිසක්කො
පිපාසිතානං රහදොව සීතො,
වෙස්මං යථා හිමසීතට්ටිතානං[7]
එවම්පි තෙ සරණමහං භවාමි.

2997. සන්ධිං කත්වා අමිත්තෙන අණ්ඩජෙන ජලාබුජ,
විවරිය දාඨං සයසි[8] කුතො තං භයමාගතං.

2998. සඞ්කෙථෙව අමිත්තස්මිං මිත්තස්මිම්පි න විස්සසෙ,
අභයා භයමුප්පන්නං අපි මූලානි කන්තති.

---

1. අපගතම්හා - මජසං.
2. මමායතානි - නා.
3. තනුජ්ජං - වි. මජසං. ස්‍යා.
4. මුඤ්ච - වි. මජසං.
5. විස්සජ්ජි - මජසං.
6. භුම්‍යා - වි.
7. හිම සිසිරට්ටිතානං - වි.
8. යස්සසි - මජසං.

2990. ගිහිගේ අත්හැර පැවිදි වූ නිර්වස්ත්‍ර නග්න මුඩු මහණෙක් පිඩු පිණිස හැසිරෙයි. මම ඔහු කෙරෙහි රහස් කථා එළිදරව් කෙළෙමි. එහෙයින් අර්ථයෙන් ද ධර්මයෙන් ද පිරිහුණෙමු.

2991. එම්බා සුපර්ණරාජය, කෙසේ කරනුයේ කවර ආචාර-යෙකින් සමන්වාගත වූයේ කිනම් ව්‍රතයෙකින් පවත්නේ පැවිද්දෙහි හැසිරෙමින් තෘෂ්ණා මමායන හැරපියා කෙසේ පිළිපදින්නේ ස්වර්ග-ස්ථානයට එළඹේ ද?

2992. (යහළු නාරජ,) ලජ්ජායෙන් ද, ඉන්ද්‍රිය දමනයෙන් ද තිතික්ඛා සංඛ්‍යාත අධිවාසන ක්‍ෂාන්තියෙන් ද (ඉවසීමෙන් ද) යුක්ත වූ නො-කිපෙන ස්වභාව ඇත්තේ කේලාම් බස් හැරපියා මමායන දුරුකොට හැසිරෙන්නේ ශ්‍රමණ නම් වන්නේ ය. මෙසේ ක්‍රියා කරන්නේ ස්වර්ග-ස්ථානයට එළැඹෙන්නේ ය.

2993. යම්සේ මව සිරුරෙන් උපන් තරුණ පුත්‍රයා දක ඔහු (වැළඳ) මුළු සිරුරෙහි පුත්පහස පතුරුවා ද, පක්ෂිරාජය, පුතුට අනුකම්පා කරන්නා වූ මව්ක මෙන් නුඹ මට පහළ වූයෙහි.

2994. එම්බා නාගය, එසේ වී නම් අද තෝ වධයෙන් මිදෙව. පුත්‍රයෝ තිදෙනෙක් ම වෙති. අනෙක් සතරවැන්නෙක් නැත. ඔහු නම්, අතවැසියැ, අනුන් විසින් දෙන ලද්දේ යැ. තමාට දව උපන්-නේයැ යි. නුඹ මට ඔවුන්ගෙන් එක්තරා පුත්‍රයෙක් වූයෙහි ය. ඇලුම් කොට වසව,

2995. සුපර්ණ තෙම මේ වාක්‍යය කියා නාගයා හැරපීය. තෙමේ ද පොළොවෙහි පිහිටියේ "නුඹ අද මිදුණේ සියලු බිය ඉක්මවා සිටියෙහිය. ගොඩ හා දියෙහි මා විසින් රක්නා ලද්දෙක් වෙව.

2996. ලෙඩකුට දක්ෂ වෛද්‍යයකු යම්සේ ද පවස් ඇත්තකුහට සීතල ජලාශය යම්සේ ද, හිම කාලයෙහි සීතලෙන් පීඩා ඇත්තහුට ගෙයක් යම්සේ ද, එසේ ම මම තොපට පිහිට වෙමි." (කීය.)

2997. එම්බා නාගරාජය, පසමිතුරු වූ පක්ෂියකු හා මිත්‍රසන්ථ-වය කොට දළ විවෘත කොට සයනය කෙරෙහි. තට කොයින් බියක් ආයේ දැ යි (සුපර්ණයා ඇසී ය.)

2998. අමිත්‍රයා කෙරෙහි සැක කටයුතු මය. අමිත්‍රයා මිත්‍ර වූ කල්හි ද විශ්වාස නො කරන්නේ ය. අභයස්ථාන වූ මිතුරා කෙරෙන් බිය උපන්නේ ය. ජීවිත සංඛ්‍යාත වූ මුල ම සිඳියි.

2999. කථන්නු විස්සසෙ ත්‍යම්හි යෙනාසි කලහො කතො,
නිච්චයත්තෙන ඨාතබ්බං සො දිසබ්භි න රජ්ජති.

3000. විස්සාසයෙ න ච නං විස්සසෙය්‍ය
අසඞ්කිතො ච සඞ්කිතො භවෙය්‍ය,
තථා තථා විඤ්ඤූ පරක්කමෙය්‍ය
යථා යථා භාවං පරො න ජඤ්ඤා,

3001. තෙ දෙවවණ්ණා සුඛුමාලරූපා
උභො සමා සුජයො පුඤ්ඤක්ඛන්ධා,
උපාගමුං කාදම්බියං අවෙලං
මිස්සීභූතා අස්සවාහාව නාගා.

3002. තතො හවෙ පණ්ඩරකො අවෙලං
සයමෙවුපාගම්ම ඉදං අවොච,
මුත්තජ්ජහං සබ්බභයාතිවත්තො
න හි නූන තුය්හං මනසො පියම්හා.

3003. පියො හි මෙ ආසි සුපණ්ණරාජා
අසංසයං පණ්ඩරකෙන සච්චං,
සො රාගරත්තො ච අකාසිං එතං
පාපං කම්මං සම්පජානො න මොහා.

3004. න මෙ පියං අප්පියං වාපි හොති
සම්පස්සතො ලොකමිමං පරඤ්ච,
සුසඤ්ඤතානං හි වියඤ්ජනෙන
අසඤ්ඤතො ලොකමිමං චරාසි.

3005. අරියාවකාසොසි අනරියො වාසි
අසඤ්ඤතො සඤ්ඤතසන්නිකාසො,
කණ්හාභිජාතිකොසි අනරියරූපො
පාපං බහුං දුච්චරිතං අචාරි.

3006. අදුට්ඨස්ස තුවං දුබ්භි දුබ්භි ච පිසුනො චසි,
එතෙන සච්චවජ්ජෙන මුද්ධා තෙ ඵලතු සත්තධා.

3007. තස්මා හි මිත්තානං න දුබ්භිතබ්බං
මිත්තදුබ්භා පාපියො නත්ථි අඤ්ඤො;
ආසිත්තසත්තො නිහතො පථබ්‍යා
ඉන්දස්ස වාක්‍යෙන හි සංවරො හතොති.

පණ්ඩරකජාතකං.

2999. යමකු සමඟ කලහ කරන ලද්දේ ද ඔහු කෙරෙහි කෙසේ නම් විශ්වාස කරන්නෝ ද? සතුරන් ඇත්තහු විසින් නිතර යත්නයෙන් විසියයුතුයි. හෙතෙම සතුරන් සමඟ නො ඇලෙයි.

3000. තමා කෙරෙහි විශ්වාසය ඇතිකරවන්නේය. එහෙත් ඔහු විශ්වාස නො කරන්නේය. තමා කෙරෙහි සැක නො කරන ලද්දේ ද (සතුරා කෙරෙහි) සැක කරන්නෙක් වන්නේය. යම් යම් විදියකින් අන්‍යයා අදහස නො දනගනී නම් නුවණැත්තේ එසේ එසේ වීර්‍ය්‍ය කරන්නේ ය.

3001. දෙවියන්ට සමාන වර්ණ ඇති සිවුමැලි වූ, පිරිසිදු වූ පිත්කඳු දෙකක් බඳු ඔවුනොවුන් එක සමාන වූ පුරුෂ නාගයෝ දෙදෙන එක්ව රිය උසුලන අසුන් මෙන් කාදම්බිය නම් අචෙලකයා වෙත පැමිණියහ.

3002. ඉක්බිති පණ්ඩරක නම් නාරජ තෙම අචෙලකයා වෙත තෙමේ ම පැමිණ මෙය කීයේ ය. "අද සියලු භය ඉක්ම වූ මිදුණා වූ මම ඒකාන්තයෙන් නුඹගේ සිතට ප්‍රියයෙක් නො වීමි" යි.

3003. පණ්ඩරක නම් නාගයාට වඩා සුපර්ණරාජයා නිසැකයෙන් ම මට ප්‍රියය යන මේ කරුණ සත්‍යයකි. රාගයෙන් ඇලුණා වූ ද ඒ මම දනගෙන ම මේ පාපකර්මය කෙළෙමි. මුළාවෙන් නො දන නො වේ යයි අචෙලකයා කීයේ ය.

3004. මෙලොවත් පරලොවත් බලන්නා වූ පැවිද්දකුට මට ප්‍රියය, අප්‍රිය ය, යන හැඟීමක් නැත. නුඹ වනාහි මනා සංයත වූ පැවිද්දන්ගේ වෙශයෙන් අසංයත වූයෙහි මෙලොව හැසිරෙන්නෙහි ය.

3005. නුඹ වනාහි ආර්‍ය්‍යයකුට බඳු ස්භාව ඇත්තෙහි. එහෙත් ගති පැවතුමින් අනාර්‍ය්‍ය ද වෙහි. සංයම නැත්තෙහි. එහෙත් සංයමී ඇත්තකු බඳු වෙහි. පාප සංඛ්‍යාත කෘෂ්ණයෙහි ඇලුණෙක් වෙහි. නිර්ලජ්ජා ස්වභාවය ඇත්තෙහි. ලාමක වූ බොහෝ දුශ්චරිතයෙහි හැසුරුණෙහි යයි නාරජ තෙම නින්‍දා කෙළේ ය.

3006. "(එම්බා නිගණ්ඨය,) මිත්‍රද්‍රොහි වූ නුඹ ද්‍රොහ නො කළා වූ මිත්‍රයාට ද්‍රොහ කෙළේ ද වෙහි. කේලාම් කියන්නේ ද වූයෙහි. මේ සත්‍ය වචනය කරණ කොට ගෙන තොපගේ මස්තකය සත් කඩක්ව පැලේවා" යි නාරජ සාප කෙළේ ය.

3007. මිත්‍රද්‍රොහිකම අනිෂ්ට විපාක ගෙන දෙන හෙයින් මිත්‍රයන්ට ද්‍රොහ නො කළ යුතු. මිත්‍ර ද්‍රොහකමට වඩා අන් පාපයෙක් නැත්තේය. පොළෝහි ඉසින ලද විෂ ඇති නාගයා විසින් ශාපකරන ලද්දේ, නා රජුගේ සත්‍ය ක්‍රියාවෙන් සංවරයෙහි සිටිමි යි ප්‍රතිඥා කළ (ඒ) කුට ආජීවක තෙම නැසුණේ යයි වදළසේක.

පණ්ඩරක ජාතක යි.

9. සම්බුලාජාතකං

3008. කා වෙධමානා ගිරිකන්‍දරාය
එකා තුවං තිට්ඨසි සඤ්ඤතූරු,
පුට්ඨාසි මෙ පාණිපමෙය්‍යමජ්ඣෙ
අක්ඛාහි මෙ නාමඤ්ච බන්‍ධවෙ ච.

3009. ඔභාසයං වනං රම්මං සීහව්‍යග්ඝනිසෙවිතං,
කා වා ත්වමසි කල්‍යාණි කස්ස වා ත්වං සුමජ්ඣිමෙ
අභිවාදෙමි තං භද්දෙ දනවාහං නමත්ථු තෙ.

3010. යො පුත්තො කාසිරාජස්ස සොත්ථිසෙනොති නං විදූ,
තස්සාහං සම්බුලා භරියා එවං ජානාහි දනව
අභිවාදෙමි භද්දන්තෙ සම්බුලාහං නමත්ථු තෙ.

3011. වෙදෙහපුත්තො භද්දන්තෙ වනෙ වසති ආතුරො,
තමහං රොගසම්මත්තං එකා එකං උපට්ඨහිං.

3012. අහඤ්ච වනමුඤ්ඡාය මධුමංසං මිගාවිලං,
යද හරාමි තං භක්ඛො තස්ස නූනජ්ජ නාධති.

3013. කිං වනෙ රාජපුත්තෙන ආතුරෙන කරිස්සසි,
සම්බුලෙ පරිචිණ්ණෙන අහං භත්තා භවාමි තෙ.

3014. සොකට්ටාය දුරත්තාය කිං රූපං විජ්ජතෙ මම,
අඤ්ඤං පරියෙස භද්දන්තෙ අභිරූපතරං මයා.

3015. එහිමං ගිරිමාරුය්හ භරියා මය්හං චතුස්සතා,
තාසං ත්වං පවරා හොහි සබ්බකාමසමිද්ධිනී.

3016. නූන තාරකවණ්ණාභෙ යඞ්කිඤ්චි මනසිච්ඡසි,
සබ්බං තං පචුරං මය්හං රමස්සුජ්ජ මයා සහ.

3017. නො චෙ තුවං මහෙසෙය්‍යං සම්බුලෙ කාරයිස්සසි,
අලං ත්වං පාතරාසාය මඤ්ඤෙ භක්ඛා භවිස්සසි.

9. සම්බුලා ජාතකය

3008. මේ පර්වත කඳුරැළියෙහි වෙව්ලමින් පිරුණු වටොර යුවලක් ඇති එකලා වැ සිටුනා තෝ කවරහි. මිටින් ගතහැකි මධ්‍ය ප්‍රදෙශ ඇත්තිය, මා විසින් විචාරන ලද වෙහි. තිගේ නම ද ඤාතීන් ද මට කියව.

3009. යහපත් මධ්‍ය ප්‍රදේශ ඇති සුන්දර ස්ත්‍රිය, සිංහව්‍යාඝ්‍රාදීන්ගෙන් ගැවැසීගත් සිත්කලු වූ මේ වනය බබුළුවමින් සිටුනා තෝ කවරහි. සොඳුර තිට වඳිමි. මම අසුරයෙක්මි. තිට නමස්කාර වේවා යි අසුරයා කීයේ ය.

3010. අසුරය, කසී රජුගේ යම් පුත්‍රයෙක් වේද, සොත්ථිසෙන යයි ඔහු දනිත්. මම වනාහි ඔහුගේ සම්බුලා නම් භාර්‍ය්‍යා වෙමි, අසුරය මෙසේ දන ගනුව.

3011. සම්බුලා නම් වූ මම තොප වඳිමි. තොපට නමස්කාර වේවා. පින්වත් අසුරය, වෙදෙහ පුත්‍ර තෙමේ රොගී වූයේ වනයෙහි වෙසෙයි. මම වනාහි රොගයෙන් පෙළුණු එකලා වූ ඔහුට එකලා වැ උපස්ථාන කෙළෙමි.

3012. මම ද මැස්සන් නැති මීත් සිංහාදීන් කා දමූ මසුත් සොයා ගෙන යම් කලෙක හැරගෙන එම් ද, වේදෙහ පුත්‍ර තෙම එය බුදින්නේය. අද ඔහුට එය ද නො ලැබ එකාන්තයෙන් තැවෙතියි සිතමි.

3013. සම්බුලාවෙනි, ආතුර වූ දිරාපත් වූ රාජපුත්‍රයකු හෙතුවින් කුමට පරිචර්‍ය්‍යා කරහි ද? මම තිට ස්වාමි පුරුෂ වෙමි යි (දනවයා කීය.)

3014. ශොකාතුර වූ දුගී අත්බැව් ඇති මාගේ කවර රූප සම්පත්තියක් විද්‍යමාන ද? තට යහපතක් වේවා. මට වඩා රුවැති අන් අඟනක් සොයා ගනුව යි.

3015. සුන්දරිය, එව. මේ පර්වතයට නැඟෙව. මාගේ භාර්‍ය්‍යාවෝ සාරසියක් වෙති. සියලු කාමසම්පතින් සමෘද්ධ වූ තී ඔවුනට ප්‍රධාන වෙහි.

3016. තරුබඳු ආලොක ඇත්තිය, සිතින් යම්බඳු ප්‍රාර්ථනයක් කෙරෙහි නම් ඒ සියල්ල මට අධික ව තිබේ. මා සමඟ අභිරමණය කරව.

3017. සම්බුලාව, ඉදින් තී මාගේ මෙහෙසි බව නො කරන්නී නම්, තී මාගේ ප්‍රාතරාසයට නිසි ඛාද්‍යය වන්නෙහියයි සිතමි.

3018. තස්ස සත්තජටො ලුද්දො කළාරො පුරිසාදකො,
වනෙ නාථං අපස්සන්තිං සම්බුලං අග්ගහී භුජෙ.

3019. අධිපන්නා පිසාචෙන ලුද්දෙනාමිසචක්ඛුනා,
සා ච සත්තුවසම්පත්තා පතිමෙවානුසොචති.

3020. න මෙ ඉදං තථා දුක්ඛං යං මං ඛාදෙය්‍ය රක්ඛසො,
යඤ්ච මෙ අය්‍යපුත්තස්ස මනො හෙස්සති අඤ්ඤථා.

3021. න සන්ති දෙවා පවසන්ති නූන
න හි නූන සන්ති ඉධ ලොකපාලා,
සහසා කරොන්තානං අසඤ්ඤතානං
න හි නූන සන්ති පටිසෙධිතාරො.

3022. ඉත්ථීනමෙසා පවරා යසස්සිනී
සන්තා සමා අග්ගිරිවුග්ගතෙජා,
තඤ්චෙ තුවං රක්ඛසාදෙසි කඤ්ඤං
මුද්ධා ච හි සත්තධා තෙ ඵලෙය්‍ය
මා ත්වං දහි මුඤ්ච පතිබ්බතා සා.

3023. සා ච අස්සමමාගඤ්ඡි පමුත්තා පුරිසාදකා,
නීළං ඵලිනසකුණීව ගතසිඞ්ගංව ආලයං.

3024. සා තත්ථ පරිදෙවෙසි රාජපුත්තී යසස්සිනී,
සම්බුලා උතුමත්තක්ඛා වනෙ නාථං අපස්සතී.

3025. සමණෙ බ්‍රාහ්මණෙ වන්දෙ සම්පන්නචරණෙ ඉසෙ,
රාජපුත්තං අපස්සන්තී තුම්හම්හි සරණං ගතා.

3026. වන්දෙ සීහෙ ච බ්‍යග්ඝෙ ච යෙ ච අඤ්ඤෙ වනෙ මිගා,
රාජපුත්තං අපස්සන්තී තුම්හම්හි සරණං ගතා.

3027. තිණලතානි ඔසධ්‍යො පබ්බතානි වනානි ච,
රාජපුත්තං අපස්සන්තී තුම්හම්හි සරණං ගතා.

3018. සත් දළමඩුල්ලක් ඇති රෞද්‍ර වූ පිටතට නික්මුණු දළ ඇත්තා වූ මිනිසුන් කන්නා වූ (ඒ රකුස් තෙම) වනයෙහි පිහිටක් නො දක්නා වූ ඒ සම්බුලාව ද අතින් අල්ලාගත්තේය.

3019. රෞද්‍ර වූ ක්ලෙශාමිෂ වශයෙන් ලොල් වූ ඇස් ඇති පිශාචයා විසින් යටත් කරන ලද (එහෙයින් ම) සතුරාගේ වසහයට පැමිණියා වූ ඒ සම්බුලාව ද ස්වාමියා අනුවම ශොක කරයි.

3020. යම් හෙයෙකින් මා රකුසා කන්නේ නම් මෙ මට දුකෙක් නො වේ. මාගේ ආර්‍ය්‍යපුත්‍රයාගේ සිත අන් ලෙසක් වේ නම්, එය මට ඊට වඩා දුකෙකි.

3021. දෙවියෝ නැත. දුරැරට වෙසෙති සිතමි. මෙහි ලොක-පාලයෝ නැත් මැ යි සිතමි. එහෙයින් මැ බලාත්කාරකම් කරන අශික්ෂිතයන් වළකන්නාහු නැත් මැ යි සිතමි.

3022. මෝතොමෝ යශස් ඇත්තා වූ ශාන්ත වූ සම හැසිරීම් ඇති ගින්නක් මෙන් උග්‍ර තෙජස් ඇත්තියකි. ස්ත්‍රීන් අතුරෙන් උතුම් තැනැත්තියකි. රාක්‍ෂසය, ඉදින් තෝ ඒ කන්‍යාව කන්නෙහි නම්, තාගේ මුදුන සත්කඩක් ව පැළෙන්නේ ය. තෝ මැය නො-නවව. මුදු හරුව. ඕ තොමෝ පතිව්‍රතාවකි යි (එහි පැමිණි සක් දෙව්රජ කී).

3023. මිනීමස් කන අසුරයාගෙන් මිදුණා වූ ඕතොමෝ ගොදුරු ගෙන එන පක්ෂිධෙනුවක් හිස් කැදැල්ලට මෙන් ද, ගවදෙනක් නික්ම ගිය වස්සා ඇති ගවහලට මෙන් ද, හිස් අසපුවට පැමිණියා ය.

3024. ඒ සම්බුලා නම් යශස් ඇති රාජපුත්‍රී තොමෝ ඒ වෙනෙහි හිමියා නො දක්මින් සොවින් උපන් උසුමින් රත් වූ ඇස් ඇති වැ වැලැපුණා යැ.

3025. මම ශ්‍රමණයන් ද බ්‍රාහ්මණයන් ද චරණ ධර්මයන්ගෙන් යුත් සෘෂිවරුන් ද වඳිමි. රාජ පුත්‍රයා නො දක්නා වූ සම්බුලා නම් වූ මම තොපගේ පිහිට සොයා ගියා වෙමි.

3026. සිංහයන් ද ව්‍යාඝ්‍රයන් ද වෙනෙහි යම් සෙසු මෘගයෝ වෙත් නම් ඔවුන් ද මම වඳිමි. රාජ පුත්‍රයා නො දක්නා වූ සම්බුලා නම් වූ මම තොපගේ සරණ ගියා වෙමි.

3027. තෘණ වර්ග ද ලතා වර්ග ද ඔෂධි වර්ග ද පර්වත ද වන ද යන මේ තන්හි යම් දෙවිකෙනෙක් අධිගෘහිත ව වෙසෙද් ද, මම ඔවුන් වඳිමි. රාජපුත්‍රයා නො දක්නා වූ සම්බුලා නම් වූ මම තොප පිහිට සොයා ගියා වෙමි.

3028. වන්දෙ ඉන්දීවරීසාමං රත්තිං නක්ඛත්තමාලිනිං,
රාජපුත්තං අපස්සන්තී තුම්හම්හි සරණං ගතා.

3029. වන්දෙ භාගීරථිං ගඞ්ගං සවන්තීනං පටිග්ගහං,
රාජපුත්තං අපස්සන්තී තුම්හම්හි සරණං ගතා.

3030. වන්දෙ අහං පබ්බතරාජසෙට්ඨං හිමවන්තං සිලුච්චයං,
රාජපුත්තං අපස්සන්තී තුම්හම්හි සරණං ගතා.

3031. අතිසායං වතාගච්ඡි රාජපුත්ති යසස්සිනි,
කෙනනුජ්ජ සමාගච්ඡි කො තෙ පියතරො මයා.

3032. ඉදං ඛොහං තදවොචං ගහිතා තෙන සත්තුනා,
න මෙ ඉදං තථා දුක්ඛං යං මං ඛාදෙය්‍ය රක්ඛසො
යඤ්ච මෙ අය්‍යපුත්තස්ස මනො හෙස්සති අඤ්ඤථා.

3033. චොරීනං බහුබුද්ධීනං යාසු සච්චං සුදුල්ලභං,
ථීනං භාවො දුරාජානො මච්ඡස්සෙවොදකෙ ගතං.

3034. තථා මං සච්චං පාලෙතු පාලයිස්සති චෙ මමං,
යථාහං නාභිජානාමි අඤ්ඤං පියතරං තයා
එතෙන සච්චවජ්ජෙන ව්‍යාධි තෙ වූපසම්මතු.

3035. යෙ කුඤ්ජරා සත්තසතා උළාරා
රක්ඛන්ති රත්තින්දිවං උය්‍යුතාවුධා,
ධනුග්ගහානඤ්ච සතානි සොළස
කථං විධෙ පස්සසි භද්දෙ සත්තවො.

3036. අලඞ්කතායො පදුමුත්තරත්තචා
විරාගිතා පස්සති හංසගග්ගරා,
තාසං සුණිත්වා මිතගීතවාදිතං
න දනි මෙ තාත තථා යථා පුරෙ.

3028. නැකැත් පෙළින් යුක්ත වූ නිලුපුල් බඳු වර්ණ ඇති රාත්‍රිය ද මම වදිමි. රාජපුත්‍රයා නො දක්නා වූ සම්බුලා නම් වූ මම තොපගේ සරණ ගියා වෙමි.

3029. සෙසු ගංගාවන්ගේ ජලය පිළිගන්නා වූ භාගීරථී නම් ගඟ මම වදිමි. රාජපුත්‍රයා නො දක්නා වූ සම්බුලා නම් වූ මම තොපගේ සරණ ගියා වෙමි.

3030. හිමවන්ත නම් පර්වතරාජශ්‍රෙෂ්ඨයා මම වදිමි. රාජ පුත්‍රයා නො දක්නා වූ සම්බුලා නම් මම තොපගේ සරණ ගියා වෙමි යි (සම්බුලා තොමෝ වැළපුණා ය.)

3031. යශස් ඇත්තා වූ රාජපුත්‍රිය, තෝ ඉතා සවස්හි ආයෙහි ය. අද කවරකු හා එක්වූවා ද? තිට මට වඩා ප්‍රියතරයෙක් කවරේ දැ යි රාජපුත්‍රයා ඇසී ය.

3032. ඒ සතුරා විසින් අල්ලා ගන්නා ලද මම ඔහුට මෙය ප්‍රකාශ කෙළෙමි. යම්හෙයෙකින් රකුස් තෙම මා කන්නේ නම් එය මට දුකක් නො වේ. මාගේ ස්වාමිපුත්‍රයාගේ සිත්හි යම්බඳු වෙනසක් වේ නම් එය මට එයට වඩා දුකකැ යි කියා යි.

3033. සෙරවූ ද, බොහෝ අදහස් ඇත්තා වූ ද යම් ඒ ස්ත්‍රීන් අතුරෙහි සත්‍යවචනය ඉතා දුර්ලභ ය. මත්ස්‍යයන්ගේ දියෙහි ගමන් මාර්ගය මෙන් ස්ත්‍රීන්ගේ ස්වභාවය දැනගන්නට අපහසුය.

3034. යම්සේ මම නුඹට වඩා ඉතා ප්‍රිය වූ අන්‍යයකු නො-දනිමි යි කියම් ද, ඉදින් එසේ මාගේ සත්‍යය රක්නේ නම්, ඒ සත්‍ය තෙමේ මා රකීවා. මේ සත්‍ය වචනය කරණ කොට ගෙන තොපගේ ව්‍යාධිය සන්හිඳේවා යි (සම්බුලා තොමෝ සත්‍යක්‍රියා කළාය.)

3035. සම්බුලාවෙනි, මහත් හස්තීහු සත්සියයක් ද (ඔවුන් පිට නැඟි) අවිදරන ධනුර්ධරයන් සොළොස්සියයක් ද මෙනුවර රකිත්. (එසේ කල්හි) කෙබඳු සතුරන් දක්නෙහි දැයි (රාජතාපස තෙමේ සම්බුලාවගෙන් ඇසුවේය.)

3036. පියාණන් වහන්ස, නුඹවහන්සේගේ පුත්‍ර තෙමේ පියුම් ගැබ මෙන් මතුපිට රන්වන් සිවියෙන් බබළන්නා වූ අලංකාර ලෙස සැරසුණා වූ සිහින් මධ්‍ය ප්‍රදෙශ ඇත්තා වූ හංසයන්ගේ බඳු ස්වර ඇත්තා වූ ස්ත්‍රීන් දකී. ඔවුන්ගේ මිහිරි ගීත වාදිතය අසා හෙතෙමේ පෙර මෙන් දැන් මා කෙරෙහි නො පවතී.

3037. සුවණ්ණසඞ්ඛාවචධරා සුචිග්ගහා
අලඞ්කතා මානුසියච්ඡරූපමා,
සෙනොපියා තාත අනින්දිතඞ්ගියො[1]
ඛත්තියකඤ්ඤා පටිලොභයන්ති නං.

3038. සචෙ අහං තාත තථා යථා පුරෙ
පතිං තමුජ්ඣාය[2] පුනා වනෙ හරෙ,
සම්මානයෙ මං න ච මං විමානයෙ
ඉතොපි මෙ තාත තතො වරං සියා.

3039. යමන්නපානෙ විපුලස්මිං ඔහිතෙ
නාරී විමට්ඨාභරණා අලඞ්කතා,
සබ්බඞ්ගු[3]පෙතා පතිනො ච අප්පියා
අබජ්ඣ තස්සා මරණං තතො වරං.

3040. අපි චෙ දළිද්දා කපණා අනාළ්හියා[4]
කටාදුතීයා පතිනොව සා පියා,
සබ්බඞ්ගුපෙතායපි අප්පියාය
අයමෙව සෙය්‍යා කපණාපි යා පියා.

3041. සුදුල්ලභිත්ථී පුරිසස්ස යා හිතා
භත්තිත්ථියා දුල්ලභො යො හිතො ච,
හිතා ච තෙ සීලවතී ච භරියා
ජනින්ද ධම්මං චර සම්බුලාය.

3042. සචෙ තුවං විපුලෙ[5] ලද්ධභොගෙ
ඉස්සාවතිණ්ණා මරණං උපෙසි,
අහඤ්ච තෙ භද්දෙ ඉමා රාජකඤ්ඤා
සබ්බෙව තෙ වචනකරා භවාමි.

සම්බුලා ජාතකං.

10. ගන්ධතින්දුකජාතකං.*

3043. අප්පමාදෙ අමතපදං පමාදෙ මච්චුනො පදං,
අප්පමත්තා න මීයන්ති යෙ පමත්තා යථා මතා.

---

1. අනින්දිතඞ්ගියො – නා.
2. පතිත උජ්ඣාය – වි.
3. පඤ්චඞ්ගු – මජසං.
4. අනාළියා – මජසං. ස්‍යා.
5, විපුල – මජසං.
* ගණ්ඩතින්දුක – ස්‍යා.

3037. ස්වර්ණමය සංකවචාභරණ (තනපට) දරන්නා වූ අලංකාර කරන ලද මනා සිරුරු ඇත්තා වූ මිනිස් දෙවඟනන් බඳු වූ ක්‍ෂත්‍රිය කන්‍යාවරු නිඳු නොකරන ලද ශරීරාවයව ඇත්තාහු සොත්ථිසෙන රජුට ප්‍රිය වෙත්. පියාණෙනි, ඒ කන්‍යාවෝ සොත්ථිසෙන රජු පොළඹවත්.

3038. පියාණෙනි, ඉදින් මම පෙර මෙන් නැවත ද වනයෙහි සිහා හැසිරීමෙන් ඒ ස්වාමියා පොෂණය කරන්නෙම් නම්, මට සම්මානන කරන්නේය. මට අවමන් නො කරන්නේය. පියාණෙනි, මෙයට වඩා මට එය උතුම් වන්නේය.

3039. ආහාර පාන බොහෝ කොට පිළියෙළ කොට තිබෙන ගෘහයෙහි නානාලංකාරයෙන් සැරසුණා වූ සියලු අංගයන්ගෙන් යුක්ත වූ ස්ත්‍රී තොමෝ ස්වාමියාහට අප්‍රිය වන්නී නම්, ඇයට ගෙල වැල බැඳගෙන මරණයට පත්වීම ඒ ගෘහවාසයට වඩා උතුම් වේ.

3040. තවද දිළිඳු වූ බැගෑපත් වූ සහල් නැළියක්වත් නැත්තා වූ නිදන කලාල දෙවැනි කොට ඇති ස්ත්‍රියක් වන්නී නම් ඕ තොමෝ සැමියාට ප්‍රිය ද, සියලු අංගයන්ගෙන් යුක්ත වූ ද අප්‍රිය ස්ත්‍රියට වඩා දුප්පත් වූ යම්බඳු ප්‍රිය තැනැත්තියක් වේ නම් ඕ උතුම් යි (සම්බුලා තොමෝ කීවාය.)

3041. යම් තැනැත්තියක් පුරුෂයාට හිතවත් ද ඕ ඉතා දුර්ලභ ස්ත්‍රියකි. යම් පුරුෂයෙක් තෙමේ ස්ත්‍රියට බැතිමත් ද හෙතෙමේත් දුර්ලභය. මේ සම්බුලා නම් භාර්‍යා තොමෝ තොපට හිතවත් ය. ගුණවත්ය. මහරජ, සම්බුලාව සමග දැහැමින් වාසය කරවයි තාපස වූ පිය රජතෙම අවවාද කෙළේය.

3042. සම්බුලාවෙනි, ඉදින් තෙපි අභිෂෙකවශයෙන් ලබන ලද මහත් භොග ඇති කල්හි ඊර්ෂ්‍යාවට බැස ගත්තාහු මරණයට පැමිණෙන්නහු ද, එසේ නම් සොඳුර, මමත් මේ හැම රාජ කන්‍යාවරුත් තිගේ වචනය පිළිපදින්නමෝ වෙමුයි රජතෙම කීයේය.

සම්බුලා ජාතක යි.

10. ගන්ධතින්දුක ජාතකය

3043. කුශලයෙහි සිහියෙන් වෙන් නොවීම නම් වූ නො පමාව නිවනට මඟ යි. කුසල් පිරීමේ එළඹ සිටි සිහියක් නැතිබව සසර දුකට මඟ යි. නො පමාවූවෝ සසර දුකට නොපැමිණෙත් හෙවත් නොමැරෙත්. පමාවූවෝ මළවුන් වැනි වෙත්.

3044. මදා පමාදො ජායෙථ පමාදා ජායතෙ ඛයො,
ඛයා ච දොසා[1] ජායන්ති මා මදා භරතූසභ.[2]

3045. බහූ හි ඛත්තියා ජීනා අත්ථං රට්ඨං පමාදිනො,
අථොපි ගාමිනො ගාමා අනාගාරා අගාරිනො.

3046. ඛත්තියස්ස පමත්තස්ස රට්ඨස්මිං රට්ඨවඩ්ඪන,
සබ්බෙ භොගා විනස්සන්ති රඤ්ඤො තං වුච්චතෙ අඝං.

3047. නෙස ධම්මො මහාරාජ අතිවෙලං පමජ්ජසි,
ඉද්ධං ඵීතං ජනපදං චොරා විද්ධංසයන්ති නං.

3048. න තෙ පුත්තා භවිස්සන්ති න හිරඤ්ඤං න ධානියං,
රට්ඨෙ විලුප්පමානම්හි සබ්බභොගෙහි ජීයසි.

3049. සබ්බභොගපරිජිණ්ණං රාජානං වාපි ඛත්තියං[3],
ඤාතිමිත්තා සුහජ්ජා ච න තං මඤ්ඤන්ති මානියං.[4]

3050. හත්ථාරොහා[5] අනීකට්ඨා රථිකා පත්තිකාරකා,
තමෙවමුපජීවන්තා න තං මඤ්ඤන්ති මානියං.

3051. අසංවිහිතකම්මන්තං බාලං දුම්මන්ති මන්තිනං,
සිරී ජහති දුම්මෙධං ජිණ්ණංව උරගො තචං.

3052. සුසංවිහිතකම්මන්තං කාලුට්ඨායිං අතන්දිතං,
සබ්බෙ භොගාභිවඩ්ඪන්ති ගාවො සඋසභාමිව.

3053. උපස්සුතිං මහාරාජ රට්ඨෙ ජනපදෙ චර,
තත්ථ දිස්වා ච සුත්වා ච තතො තං පටිපජ්ජසි.

3054. එවං වෙදෙතු පඤ්චාලො සඞ්ගාමෙ සරසමප්පිතො,[6]
යථාහමජ්ජ වෙදෙමි කණ්ටකෙන සමප්පිතො.

1. පදොසා - වි. මජසං. සයා.
2. මාපමාදෙ භරමූසභ - මජසං. මාපමාදෙ භාරතූසභ - වි.
3. ඛත්තියා - වි. මජසං.
4. ඛත්තිය - වි.
5. හත්ථාරුහා - වි.
6. සරමපිපිතො - මජසං.

3044. මහරජ, ආරොග්‍යාදී ත්‍රිවිධ මදයෙන් ප්‍රමාදය හටගනී. ප්‍රමාදයෙන් විනාශය හටගනී. විනාශ හෙතුවෙන් ද්වෙෂයෝ හට-ගනිත්. එබැවින රට පොෂණය කරන්නාවූ ශ්‍රෙෂ්ඨය, මදයට නො පැමිණෙව.

3045. ප්‍රමාද වූ බොහෝ රජදරුවෝ වස්තුවය රටය යන මෙයින් පිරිහුණාහ. තවද ප්‍රමාදපන්න වූ ගම්දෙටුවෝ ගමින් පිරි-හුණාහ. ප්‍රමාදපන්න ගිහිගේ වැස්සෝ ධාන්‍යාදියෙන් සහ ගිහිගෙයින් ද, පැවිද්දෝ පැවිදි බවෙන් ද පිරිහුණාහ.

3046. රටදියුණු කරන්නා වූ මහරජ, පමා වූ රජුගේ රටෙහි හැම සම්පත්හු ම වැනසෙත්. එය රජුට දුකය යි කියනු ලැබේ.

3047. මහරජ, සීමාව ඉක්මවා පමාවන්නෙහි නම් එය පැරණි රජුන්ගේ ස්වභාවය නොවෙයි. ආහාර පානාදියෙන් සමෘද්ධ වූ ස්වර්ණාදියෙන් පිරුණා වූ ජනපදය සොරු විනාශ කරත්.

3048. රට පැහැර ගනු ලබන කල්හි සියලු භොගයන්ගෙන් පිරිහෙන්නේය. එවිට ප්‍රවෙණිය රකින පුත්‍රයෝ ද නො වන්නාහ. (අධර්ම රජුගේ පුත්‍රයෝයයි රට වැසියෝ ඔහු බැහැර කරත්.) එසේ ම අධාර්මික රජුගේ හිරණ්‍යාදි ධනය ද නො වන්නේය. ධාන්‍යාදිය ද නො වන්නේය.

3049. සියලු භොග සම්පතින් පිරිහුණු ක්‍ෂත්‍රිය රජහු පවා නෑමිතුරෝ ද සුහදයෝ ද ඔහු පිදියයුතු කොට නො සිතත්.

3050. ඇතරුවෝ ද බළඇණිවල නියුක්තයෝ ද රිය පද-වන්නෝ ද පාබළසේනාවෝ ද යන සියල්ලෝම ඔහු ඇසුරු කරමින් ජීවත්වන්නාහු නමුත් ඔහු පිදිය යුත්තකු වශයෙන් නො හඟිත්.

3051. හොඳින් විධාන නො කළ කර්මාන්ත ඇති නපුරු කථා ඇති මන්ත්‍රීන්ගෙන් යුත් අනුවණ බාලයා, දිරාගිය සැව හැරයන සර්පයකු මෙන්, ශ්‍රී තොමෝ හැරදමා යන්නීය.

3052. හොඳින් විධාන කරන ලද කර්මාන්ත ඇති සුදුසු කල්හි වීය්‍ය්‍ය කරන්නා වූ අනලස් වූ රජුට වෘෂභයා සහිත ගව මුළ මෙන් සියලු සම්පත් වැඩෙත්.

3053. මහරජ, දනවුපුවත් ඇසීම පිණිස රටෙහි ද ජනපදයෙහි ද හැසිරෙව. එහි දක්ක යුතු දෑ දක ඇසිය යුතු දෑ අසා (මැනවින් දැනගෙන) එයට අනුව පිළිපදුව.

3054. අද මම කටුවකින් විදුනා ලද්දේ යම්සේ දුක් විඳිම් ද, මෙසේ ම පඤ්චාල රජතෙම යුද්ධයෙහි දී ඊයෙන් විදින ලද්දේ දුක් විඳීවා.

3055. ජිණ්ණො දුබ්බලචක්ඛූසි න රූපං සාධු පස්සසි,
කිං තත්ථ බ්‍රහ්මදත්තස්ස යං තං මග්ගෙය්‍ය කණ්ටකො.

3056. බහවෙත්ථ[1] බ්‍රහ්මදත්තස්ස යොහං මග්ගෙ[2] බ්‍රාහ්මණ,
අරක්ඛිතා ජානපද අධම්මබලිනා හතා.

3057. රත්තිඤ්හි චොරා ඛාදන්ති දිවා ඛාදන්ති තුණ්ඩියා,
රට්ඨස්මිං කූටරාජස්ස බහු අධම්මිකො ජනො.

3058. එතාදිසෙ භයෙ තාත[3] භයට්ටා තාව[4] මානවා,
නිලෙණකානි කුබ්බන්ති වනෙ ආහත්වා[5] කණ්ටකං.

3059. කදස්සු නාමයං රාජා බ්‍රහ්මදත්තො මරිස්සති,
යස්ස රට්ඨම්හි[6] ජීයන්ති[7] අප්පතිකා[8] කුමාරිකා.

3060. දුබ්භාසිතඤ්හි තෙ ජම්මි අනත්ථපදකොවිදෙ,
කුහිං රාජා කුමාරීනං භත්තාරං පරියෙසති.

3061. න මෙ දුබ්භාසිතං බ්‍රහ්මෙ කොවිදත්ථපද අහං,
අරක්ඛිතා ජානපද අධම්මබලිනා හතා.

3062. රත්තිඤ්හි චොරා ඛාදන්ති දිවා ඛාදන්ති තුණ්ඩියා,
රට්ඨස්මිං කූටරාජස්ස බහූ අධම්මිකො ජනො
දුජ්ජීවෙ දුබ්භරෙ[9] දාරෙ කුතො භත්තා කුමාරියො.

3063. එවං සයතු පඤ්චාලො සඞ්ගාමෙ සත්තියා හතො,
යථායං කපණො සෙති හතො ඵාලෙන සාලියො.

1. පහොත්ථ – වි.
2. මග්ගස්මිං – වි.
3. ජාතෙ – මජසං.
4. තාත – වි. මසං.
5. ආහන්ත්වා – මජසං.
6. රට්ඨස්මිං – වි. මජසං.
7. ජීවන්ති – වි.
8. අප්පතීතා – වි.
9. දුබ්බරෙ – මජසං.

3055. (එම්බා මහලු පුරුෂය,) නුඹ ජරායෙන් ජීර්ණවූයෙහි දුර්වල ඇස් ඇත්තෙහිය. හොඳින් රූප නො දක්නෙහිය. ඒ නිසා කටුවක් ඇනුනේය යන යමක් ඇද්ද එහි බඹදත් රජුගේ කිනම් දොෂයෙක්දැයි (පුරොහිත තෙම ඇසීය.)

3056. බ්‍රාහ්මණය, යම් ඒ මම කටු ඇති මාර්ගයෙහි (කටු ඇනුනෙම් ද) මෙහි බ්‍රහ්මදත්ත රජුගේ බොහෝ දොෂයෝ වෙත්. රජු විසින් ජනපද වැසියෝ නො රක්නා ලද්දහුය. නො දැහැමි අයබදු ගැනුමෙන් ඒ ජනපද වැසියෝ නසන ලද්දහ.

3057. රාත්‍රි කාලයෙහි ද සොරු පැහැර ගනිත්. දවල් අධර්ම-යෙන් අයබදු ගන්නෝ පැහැර ගනිත්. පාපිරජහුගේ රටෙහි ජනයා බොහෝ සෙයින් අධාර්මිකයහ.

3058. දරුව, මෙබඳු බිය ඇති වූ කල්හි බියෙන් පෙළුණු මිනිස්සු කටු ගෙනවුත් (දෙරටුව අවුරා ගෙවල් හැරගොස්) වනයෙ සැඟවී සිටිය හැකි තැන් සාද ගනිත්.

3059. යම් රජකුගේ රටෙහි සැමියන් නැති කුමරියෝ මහලුවෙත් ද, මේ බ්‍රහ්මදත්ත රජ කවර දවසක මැරෙන්නේ දැ යි (දිළිඳු මවක් හඬමින් කීවාය.)

3060. අවැඩ වචන කීමෙහි දක්ෂ නීච තැනැත්තිය, ති විසින් නපුරු වචනයක් ම කියන ලද. කුමරියන්හට සැමියන් සොයන රජෙක් කොහි වෙසේ ද? (කියා පුරෝහිතයා ඇසුවේය.)

3061. බ්‍රාහ්මණය, මා විසින් නපුරක් නො කියන ලද. මම අර්ථ පද කීමෙහි දක්ෂ වෙමි. රජු විසින් ජනපද වැසියෝ නො-රක්නා ලද්දහ. නො දැහැමින් අයබදු ගැනුමෙන් ජනපද වැසියෝ නසන ලද්දහ.

3062. රාත්‍රියෙහි ද සොරු පැහැර ගනිත්. දවල් කාලයෙහි අධර්මයෙන් අයබදු ගන්නෝ පැහැර ගනිත්. පාපි රජුගේ රටෙහි ජනයා බොහෝ අධාර්මිකයහ. දුකසේ ජීවත්වන්නාවූ, දුකසේ භාර්‍යාවන් පොෂණය කරන්නා වූ රටෙහි දූරියෝ කොයින් සැමියන් ලබත් ද?

3063. යම්සේ සාලිය නම් ගව තෙම සීවැලින් ඇනුණේ බැගෑපත්ව සයනය කෙරේ ද? මෙපරිද්දෙන් ම පඤ්චාල රජතෙම යුද්ධ භූමියෙහි හෙල්ලකින් අනින ලද්දේ ශයනය කෙරේවායි (ගොවියෙක් ශාප කෙළේය.)

3064. අධම්මෙන තුවං ජම්ම බ්‍රහ්මදත්තස්ස කුජ්ඣසි,
යො ත්වං සපසි රාජානං අපරජ්ඣිත්වාන අත්තනො.[1]

3065. ධම්මෙන බ්‍රහ්මදත්තස්ස අහං කුජ්ඣාමි බ්‍රාහ්මණ,
අරක්ඛිතා ජානපදා අධම්මබලිනා හතා.

3066. රත්තිඤ්හි චොරා ඛාදන්ති දිවා ඛාදන්ති තුණ්ඩියා,
රට්ඨස්මිං කූටරාජස්ස බහු අධම්මිකො ජනො.

3067. සා නූන පුන රෙ පක්කා විකාලෙ භත්තමාහරි,
භත්තහාරිං අපෙක්ඛන්තො හතො ඵාලෙන සාලියො.

3068. එවං හඤ්ඤතු පඤ්චාලො සඞ්ගාමෙ අසිනා හතො,[2]
යථාහමජ්ජ පහතො ඛීරඤ්ච මෙ පවට්ටිතං.[3]

3069. යං පසු ඛීරං ඡඩ්ඩෙති පසුපාලඤ්ච හිංසති.[4]
කිං තත්ථ බ්‍රහ්මදත්තස්ස යං නො ගරහතෙ[5] භවං.

3070. ගාරය්හා බ්‍රහ්මෙ පඤ්චාලො බ්‍රහ්මදත්තස්ස රාජිනො,
අරක්ඛිතා ජානපදා අධම්මබලිනා හතා.

3071. රත්තිඤ්හි චොරා ඛාදන්ති දිවා ඛාදන්ති තුණ්ඩියා,
රට්ඨස්මිං කූටරාජස්ස බහු අධම්මිකො ජනො.

3072. චණ්ඩා අටනකා ගාවී යං පුරෙ න දුහාමසෙ,
තං දනි අජ්ජ දෙහාම ඛීරකාමෙහුපද්දුතා.

3073. එවං කන්දතු පඤ්චාලො විපුත්තො විප්පසුක්ඛතු,
යථායං කපණා ගාවී විපුත්තා පරිධාවති.

1. අත්තනා - වි.
2. දළ්හා - වි.
3. පවත්තිතං - සයා.
4. ඵාලං විහිංසති - මජසං.
5. ගරහතො - වි.

3064. නීච ගොවිය, යම්බඳු වූ තෝ තමා ම අපරාධ කොට රජුට ශාප කරන්නෙහි ද එබඳු තෝ බ්‍රහ්මදත්ත රජුට නිකරුණේ කිපුණෙහි ය.

3065. බ්‍රාහ්මණය, මම බඹදත් රජුට ධර්මයෙන් (කරුණු ඇතිව) කිපෙමි. රජු විසින් ජනපද වැසියෝ නො රක්නා ලද්දහ. ඔහු විසින් අධර්ම අයබදු ගැනුමෙන් ඔහු පෙළන ලද්දහ.

3066. රාත්‍රියෙහි සොරු පැහැර ගනිති. දවල් කාලයෙහි අධර්මයෙන් අයබදු ගන්නෝ පැහැර ගනිති. පාපී රජුගේ රටෙහි නොදැහැමි ජනයා බොහෝ ය.

3067. ඒ මාගේ භාර්‍යා තොමෝ දෙවනුව පිස විකාලයෙහි බත් ගෙනාවා ය. බත් ගෙනෙන තැනැත්තිය ගැන අපෙක්ෂා ඇත්තේ වීමි. එවිට සාලිය තෙමේ සීවැලින් හැනුණේය යි ගොවියා කීයේ ය.

3368. අද යම්සේ දෙන විසින් මම පහරදෙන ලද්දෙම් ද, මාගේ කිරි බඳුනත් පෙරළන ලද ද, මෙසේ ම පඤ්චාල රජ තෙම, යුද්ධ භූමියෙහි කඩුවෙන් ගසන ලද්දේ නැසේවා යි ගොපල්ලෙක් කී ය.

3069. දෙන කිරි බඳුන පෙරළුවා ය. ගොපල්ලාටත් හිංසා කළා ය. යන යමක් ඇද්ද පින්වත, එහිලා යම් හෙයකින් නුඹ බ්‍රහ්මදත්ත රජුට ගර්හා කරන්නෙහි නම්, ඒ කවර හෙයකින් ද?

3070. බ්‍රාහ්මණය, පඤ්චාල රජ තෙමේ ගර්හා කළ යුත්තෙකි. බ්‍රහ්මදත්ත රජු විසින් ජනපද වැසියෝ නො රක්නා ලද්දහු නො-දැහැමි අයබදු ගැනුමින් නසන ලද්දහ.

3071. රාත්‍රියෙහි සොරු පැහැර ගනිති. දවල් කාලයෙහි අය-බදු ගන්නෝ පැහැර ගනිති. පාපී රජුගේ රටෙහි ජනයා බොහෝ සෙයින් අධාර්මික වේ.

3072. නපුරු වූ පැන දුවන්නා වූ මේ දෙන යම් හෙයකින් පෙර නො දෙවුමෝ ද, අද කිරි කැමැති රාජපුරුෂයන් විසින් උපද්‍රැත වූවාහු ඇය දෙවම්හ.

3073. මේ දූප්පත් ගවදෙන පුත්‍රයාගෙන් වෙන් වූවා, වැළපෙමින් ඔබමොබ දුවයි ද එසේ ම පඤ්චාල රජ තෙම පුත්‍රයාගෙන් වෙන් වූයේ හඬාවා, පුත්‍රයන්ගෙන් වෙන් වූයේ වියළේවා යි ගම් දරුවෝ ශාප කළහ.

3074. යං පසු පසුපාලස්ස පබ්භමෙය්‍ය රවෙය්‍ය වා,
කොනිධ අපරාධත්ථි බ්‍රහ්මදත්තස්ස රාජිනො.

3075. අපරාධො මහාබ්‍රහ්මෙ බ්‍රහ්මදත්තස්ස රාජිනො,
අරක්ඛිතා ජානපදා අධම්මබලිනා හතා.

3076. රත්තිඤ්හි චොරා ඛාදන්ති දිවා ඛාදන්ති තුණ්ඩියා,
රට්ඨස්මිං කූටරාජස්ස[1] බහු අධම්මිකො ජනො
කථං නො අසිකොසත්ථා ඛීරපා හඤ්ඤතෙ පජා.

3077. එවං භජ්ජතු පඤ්චාලො හතො යුද්ධෙ සපුත්තකො,
යථාහමජ්ජ භජ්ජාමි ගාමකෙහි[2] අරඤ්ඤජො.

3078. න සබ්බභූතෙසු විධෙන්ති රක්ඛං
රාජානො මණ්ඩූක මනුස්සලොකෙ,
නෙත්තාවතා රාජා අධම්මචාරී
යා තාදිසං ජීවමදෙය්‍යුං ධඞ්ඛා.

3079. අධම්මරූපො වත බ්‍රහ්මචාරි
අනුප්පියං[3] භාසසි[4] ඛත්තියස්ස,
විලුම්පමානාය[5] පුථුප්පජාය
පූජෙසි රාජං පරමප්පවාදං.[6]

3080. සචෙ ඉදං බ්‍රහ්මෙ සුරජ්ජකං සියා
ඵීතං රට්ඨං මුදිතං විප්පසන්නං,
භුත්වා බලිං අග්ගපිණ්ඩඤ්ච කාකා
න මාදිසං ජීවමදෙය්‍යුං ධඞ්ඛාති.

ගන්ධතින්දුක* ජාතකං.

තිංසති නිපාතො නිට්ඨිතො.

තස්සුද්දානං:

කිංඡන්ද කුම්භජයද්දිසඡද්දන්ත
අථ පණ්ඩිත සම්භව සිරකපි,
දකරක්ඛස පණ්ඩරනාසවරො
අථ සම්බුල තින්දුකදෙවපුත්තොති.

---

1. කූඩඩ - වි,
2. ගාමිකෙහි – මජසං. සයා.
3. අනුප්පිය – වි. මජසං. සයා.
4. භාසති - වි.
5. විලුප්පමානාය – මජසං,
6. පරමප්පවාදිං – වි. සයා.
* ගණ්ඩ තිණ්ඩුක – සයා.

3074. දරුවෙනි, ගවයා නම් ගොපල්ලා වෙත දුවන්නේ ය. ගොපල්ලා දැක කැගසන්නේ ය. මෙහි ලා බඹදත් රජුගේ කවර නම් අපරාධයක් ඇත්තේ ද?

3075. මහාබ්‍රාහ්මණය, බඹදත් රජුගේ අපරාධය නම්: රජු විසින් දනව්වැස්සෝ නොරක්නා ලද්දුහ. අධර්ම අයබදු ගැනීමෙන් පෙළන ලද්දුහ.

3076. රාත්‍රියෙහි සොරු පැහැර ගනිති. දවල් නො දැහැමි අයබදු ගන්නෝ පැහැර ගනිති. පවිටු රජුගේ රටෙහි නො දැහැමි ජනයා බොහෝ ය. කඩු කොපුව තනා ගැනීම පිණිස කිරිබොන වස්සෝ කෙසේ නම් නසනු ලැබෙද්ද?

3077. වනයෙහි උපන් මම ගම්වැසි කවුඩන් විසින් ඇදකනු ලබම් ද? එසේ ම පඤ්චාල රජ තෙමේ යුද්ධයෙහි පුත්‍රයන් සහිත ව නසන ලදුයේ කනු ලබාවා.

3078. මණ්ඩූකය, මිනිස් ලොව රජවරු සියලු සතුන් කෙරෙහි ආරක්ෂාව නොපිහිටුවමින් තා වැනි ජීවත්වන්නකු කපුටෝ කන්නාහු ය යන යමක් වේ ද, මේ නිසා රජ තෙම අධාර්මික නො වේ යයි පුරොහිතයා කීයේ ය.

3079. බ්‍රාහ්මණ තෙම එකාන්තයෙන් අධර්ම ස්වභාවය ඇත්තෙක. රජුගේ කැමැත්ත අනුව ම කියන්නේ ය. බොහෝ සතුන් විනාශ කරනු ලබන කල්හි අතිශයින් දෙස් කියයුතු රජ පුදන්නේ ය.

3080. බ්‍රාහ්මණය, ඉදින් මෙරට සමෘද්ධ වූ විශෙෂයෙන් ප්‍රසන්න වූ ජනයා ඇති යහපත් රාජ්‍යයක් වන්නේ නම්, කවුඩෝ පූජාව වූ අග්‍ර පිණ්ඩය අනුභව කොට වාසය කෙරෙත්. මා වැනි ජීවත් වන්නකු කවුඩෝ නො කන්නාහ යි මැඩියා කී ය.

ගණ්ඩතින්දුක ජාතක යි.

තිංසති නිපාතය නිමි.

එහි උද්දානය:

කිංඡන්දජාතක යැ කුම්භජාතක යැ ජයද්දිසජාතක යැ ඡද්දන්තජාතක යැ සම්භවජාතක යැ මහාකපිජාතක යැ දකරක්ඛසජාතක යැ පණ්ඩරකජාතක යැ සම්බුලාජාතක යැ ගණ්ඩතින්දුකජාතක යැ යි දසයෙකි.

චත්තාළීසනිපාතො

1. තෙසකුණ ජාතකං

3081. වෙස්සන්තරං තං පුච්ඡාමි සකුණ භද්දමත්ථු තෙ,
රජ්ජං කාරෙතුකාමෙන කිංසු කිච්චං කතං වරං.

3082. චිරස්සං වත මං තාතො කංසො බාරාණසිග්ගහො,
පමත්තො අප්පමත්තම්පි[1] පිතා පුත්තං අවොදයි.

3083. පඨමෙනෙව විතථං කොධං හාසං නිවාරයෙ,
තතො කිච්චානි කාරෙය්‍ය තං වතං[2] ආහු ඛත්තිය.

3084. යං ත්වං තාත තපෙ[3] කම්මං පුබ්බෙ කතමසංසයං,
රත්තො දුට්ඨො ච යං කයිරා න තං කයිරා තතො පුන.

3085. ඛත්තියස්ස පමත්තස්ස රට්ඨස්මිං රට්ඨවඩ්ඪන,
සබ්බෙ භොගා විනස්සන්ති රඤ්ඤො තං වුච්චතෙ අඝං.

3086. සිරී ච තාත ලක්ඛී[4] ච පුච්ඡිතා එතදබ්‍රවුං,
උට්ඨානවිරියෙ පොසෙ රමාහං අනුසූයකෙ[5].

3087. උසූයකෙ[6] දුහදයෙ පුරිසෙ කම්මදූසකෙ,[7]
කාලකණ්ණී මහාරාජ රමති චක්කභඤ්ජනී.

3088. සො ත්වං සබ්බෙසු[8] සුහදයො සබ්බෙසං රක්ඛිතො භව,
අලක්ඛිං නුද මහාරාජ ලක්ඛ්‍යා භව නිවෙසනං.

3089. සලක්ඛී ධිතිසම්පන්නො පුරිසො හි මහග්ගතො,
අමිත්තානං කාසිපති මූලං අග්ගඤ්ච ඡින්දති.

3090. සක්කොපි හි භූතපති උට්ඨානෙ නප්පමජ්ජති,
සකල්‍යාණෙ ධිතිං කත්වා උට්ඨානෙ කුරුතෙ මනො.

3091. ගන්ධබ්බා පිතරො දෙවා සජීවා[9] හොන්ති තාදිනො,
උට්ඨහතො අප්පමජ්ජතො අනුතිට්ඨන්ති දෙවතා.

---

1. අපමත්තං - මජසං., අප්පමත්ත. - සයා.,
2. වත - මජසං.
3. තපො - වි. මජසං.
4. තාකලක්ඛී - සීමු.
5. අනුසුයාකෙ - සීමු.
6. උස්සුයාකෙ - සීමු.
7. දූසාකෙ - මජසං., සයා.
8. සබ්බෙ සුහදයො - මජසං.
9. සාජීවා - මජසං., සයා.

චත්තාළීස නිපාතය

1. තෙසකුණ ජාතකය

3081. වෙස්සන්තර නම් පක්ෂිය, තට යහපතක් වේවා ! රාජ්‍යය කරවනු කැමැත්තහු විසින් කවර නම් කෘත්‍යයක් කරන ලද්දේ යහපත් ද?

3082. පිය වූ කංස නම් බරණැස් රජතෙම බොහෝ කල් පමා වූයේ නොපමා වූ ද පුත්‍ර වූ ද මාගෙන් ප්‍රශ්නයක් විචාළේ යැ යි වෙස්සන්තර නම් බකමූණු පක්ෂියා චොදනා කෙළේ ය.

3083. පිය රජුනි, රජ තෙමේ, පළමු කොට බොරුව ද, දෙවනුව ක්‍රොධය ද, තෙවනු ව ක්‍රීඩාශීලී ස්වභාවය ද දුරු කරන්නේ ය. ඉක්බිති රාජ්‍යකෘත්‍යයන් කරවන්නේ ය. එය රාජව්‍රත යයි කීය.

3084. පිය රජුනි, පෙර කළා වූ යම් ඒ කර්මයක් එකාන්ත-යෙන් නුඹ තවන්නේ ද, රාගයෙන් රත් වූයේ ද්වෙෂයෙන් දුෂ්ට වූයේත් යම් කර්මයක් කරයි ද, ඉන්පසු නැවත ඒ කර්මය නො කරන්නේ ය.

3085. රට දියුණු කරන්නා වූ මහරජ, පමා වූ රජුගේ රටෙහි සියලු භොගයෝ වැනැසෙත්. ඒ පාපය රජුගේ යයි කියනු ලැබේ.

3086. පිය රජුනි, ශ්‍රී කාන්තාව ද කාලකණ්ණිය ද විචාරන ලද්දහු මෙය කීහ. ශ්‍රී නම් වූ මම උට්ඨානවීය්‍ය්‍යය ඇති අනුනට ඊර්ෂ්‍යා නො කරන්නා වූ පුරුෂයා කෙරෙහි සිත් අලවම් යි කීවා ය.

3087. මහරජ, සම්පත් චක්‍රය බිඳින්නා වූ කාලකණ්ණි තොමෝ මෙරමාට ඊර්ෂ්‍යා කරන නපුරු සිත් ඇත්තා වූ යහපත් වැඩ දූෂ්‍ය කරන්නා වූ පුරුෂයා කෙරෙහි සිත් අලවයි.

3088. මහරජ, ඒ නුඹ සියල්ලන් කෙරෙහි සුහෘද වව. සියල්ල රක්නෙක් වව. කාලකණ්ණිය දුරු කරව. ශ්‍රී කාන්තාවට වාසස්ථාන වව.

3089. කසී රට අධිපති රජුනි, ලක්ෂ්මිය සහිත වූ ප්‍රඥායෙන් හා වීය්‍ය්‍යයෙන් යුක්ත වූ උසස් අදහස් ඇති පුරුෂ තෙම පස මිතු-රන්ගේ මුල ද අග ද සිඳී.

3090. මහරජ, ශක්‍ර තෙමේ ද උට්ඨානවීය්‍ය්‍යයෙහි ප්‍රමාද නො වේ. හෙ තෙමේ කුශලක්‍රියායෙහි ම ධෛය්‍ය්‍ය කොට උට්ඨානවීය්‍ය්‍යයෙහි සිත පිහිටුවයි.

3091. ගන්ධර්වයෝ ද බ්‍රහ්මයෝ ද ඒ සක්රජුට සමාන ජීවිකා ඇත්තෝ ය. දෙවතාවෝ උත්සාහවත් වූ පමා නොවන්නා වූ ඔහු අනුව පවතිත්.

3092. සො අප්පමත්තො අකුද්ධො තාත කිච්චානි කාරය,
වායමස්සු ච කිච්චෙසු[1] නාලසො වින්දතෙ සුඛං.

3093. තථෙව තෙ වත්තපද එසාව අනුසාසනී,
අලං මිත්තෙ සුඛාපෙතුං අමිත්තානං දුඛාය ච.

3094. සක්ඛී[2] තුවං කුණ්ඩලිනී මඤ්ඤසි ඛත්තබන්ධුනී,
රජ්ජං කාරෙතු කාමෙන කිංසු කිච්චං කතං වරං.

3095. ද්වෙව තාත පදකානි යත්ථ සබ්බං පතිට්ඨිතං,
අලද්ධස්ස ච යො ලාභො ලද්ධස්ස අනුරක්ඛනා.

3096. අමච්චෙ තාත ජානාහි ධීරෙ අත්ථස්ස කොවිදෙ,
අනක්ඛාකිතවෙ[3] තාත අසොණ්ඩෙ අවිනාසකෙ.

3097. යො ච තං තාත රක්ඛෙය්‍ය ධනං යඤ්චෙව තෙ සියා,
සූතොව රථං සඞ්ගණ්හෙ සො තෙ කිච්චානි කාරයෙ.

3098. සුසඞ්ගහීතන්තජනො සයං විත්තං අවෙක්ඛිය,
නිධිඤ්ච ඉණදානඤ්ච න කරෙ පරපත්තියා.

3099. සයං ආයං වයං ජඤ්ඤා සයං ජඤ්ඤා කතාකතං,
නිග්ගණ්හෙ නිග්ගහාරහං පග්ගණ්හෙ පග්ගහාරහං.

3100. සයං ජානපදං අත්ථං අනුසාස රථෙසභ,
මා තෙ අධම්මිකා යුත්තා ධනං රට්ඨඤ්ච නාසයුං.

3101. මා ච වෙගෙන කිච්චානි කාරෙසි කාරයෙසි වා,
වෙගසා හි කතං කම්මං මන්දො පච්ඡානුතප්පති.

3102. මා තෙ අධිසරෙ මුච්ච[4] සුබාළ්හමධිකොපිතං,
කොධසා හි බහූ ඵීතා කුලා අකුලතං ගතා.

3103. මා තාත ඉස්සරොම්හීති අනත්ථාය පතාරයි,
ඉත්ථීනං පුරිසානඤ්ච මා තෙ ආසි දුඛුද්‍රයො.

---

1. සකිච්චෙසු – මජසං. ස්‍යා.
2. සක්ඛිසි – මජසං.
3. අනක්ඛා කිං තවෙ – මජසං,
4. මුඤ්ච – මජසං.

3092. පියාණෙනි, ඒ නුඹ නොපමා වූයේ නොකිපියේ කටයුතු කළ මැනව. කටයුතුවල වැයම් කරන්නේ මැනව. අලස තෙමේ සැප නොවිඳී.

3093. මහරජ, ඒ මා කී ප්‍රකාශනයෙහි ම ඒ ව්‍රතපදයෝ වෙත්. මෙෝ නොමෝ මැ අනුශාසනා වන්නී ය. මිතුරන් සුවපත් කිරීමට ද සතුරන්හට දුක් පිණිස ද මෙය සමර්ථ වේ යයි වෙස්සන්තර නම් පක්ෂියා කීවේ ය.

3094. බත්ත නම් බකමූණු පක්ෂියාට සහෝදරිය වන කුණ්ඩලිණිය, මා විසින් විචාරන ලද ප්‍රශ්නය කියන්නට හැක්කෙහි ද? රජය කරවනු කැමැත්තහු විසින් කවර කෘත්‍යයක් කරන ලද්දේ යහපත් ද?

3095. යමෙක්හි සියල්ල පිහිටියේ නම්, එබඳු පද දෙකකි. නො ලද ලාභ ලබා ගැනුම ද ලද දෙය රැක ගැනුම ද යන දෙක ය.

3096. පියාණෙනි, ප්‍රාඥ වූ යහපතට දක්ෂ වූ දුකෙළියෙහි නොයෙදෙන්නා වූ ඇමතියන් භාණ්ඩාගාරිකාදි තනතුරුවල යෙදිය යුතු බව දැනගනු මැනවි.

3097. පියාණෙනි, නුඹගේ යම් ධනයකුත් වේ නම්, යම් ඇමතියෙක් එය රක්නේ ද, රිය සගන්නා රියදුරකු වැනි වූ හෙතෙම නුඹගේ කටයුතුවල යෙදවීම කරව.

3098. මනා කොට සංග්‍රහ කරන ලද ඇතුළත්හි වූ ජනය ඇතිව තෙමේ ම වස්තුව බලා තැන්පත් කර තැබීම ද, ණය දීම ද කරන්නේ ය. අනුන් ලවා නො කරවන්නේ ය.

3099. තෙමේ ම අයවැය දැනගන්නේ ය. කළ නො කළ දේත් තෙමේ ම දැන ගන්නේ ය. නිග්‍රහ කටයුත්තාට නිග්‍රහ කරන්නේ ය ප්‍රග්‍රහ කටයුත්තාට ප්‍රග්‍රහ කරන්නේ ය.

3100. මහරජ, ඒ දනව්වැස්සෝ නො දැහැමි වූවාහු ධනයත් රටත් නො නසන්වා යි කියා දනව් වැස්සන්හට තමනට ප්‍රත්‍යක්ෂ කරුණින් අනුශාසනා කරන්නේ ය.

3101. පිරික්සා නො බලා වහා කටයුතු කරන්නෙක් නො වව. අනුන් ලවා කරවන්නෙක් හෝ නො වව. වහා කරන ලද කර්ම අනුව අඥාන තෙම පසුව තැවේ.

3102. පියාණෙනි, නුඹගේ සිත අකුශලය ඉක්මවා යන කල්හි අනුන්ගේ අකුශල කර්මයෙහි ඉතා දැඩිව කොප වී කටයුතු නොකරව. ක්‍රොධයෙන් වනාහි බොහෝ සමෘද්ධ වූ කුලයෝ අකුල බවට ගියාහ.

3103. පියාණෙනි, මම අධිපති වෙමි යි අන්‍යයා අනර්ථයට නො බස් වව නුඹගේ රාජ්‍යයෙහි ස්ත්‍රීන්ට ද පුරුෂයන්ට ද දුකෙක් නො වේවා.

3104. අපෙතලොමහංසස්ස රඤ්ඤො කාමානුසාරිනො,
සබ්බෙ භොගා විනස්සන්ති රඤ්ඤො තං වුච්චතෙ අඝං.

3105. තඤ්ඤෙව තෙ වත්තපද එසාව අනුසාසනී,
දක්ඛස්සුදානි පුඤ්ඤකරො අසොණ්ඩො අවිනාසකො
සීලවස්සු[1] මහාරාජ දුස්සීලො විනිපාතිකො.

3106. අපුච්ඡිම්හා කොසියගොත්තං කුණ්ඩලිනිං තථෙව ච,
ත්වං දානි වදෙහි ජම්බුක බලානං බලමුත්තමං.

3107. බලං පඤ්චවිධං ලොකෙ පුරිසස්මිං මහග්ගතෙ,
තත්ථ බාහුබලං නාම චරිමං වුච්චතෙ බලං.

3108. භොගබලඤ්ච දීඝාවු දුතියං වුච්චතෙ බලං,
අමච්චබලඤ්ච දීඝාවු තතියං වුච්චතෙ බලං.

3109. අභිජච්චබලඤ්චෙව තං චතුත්ථං අසංසයං,
යානි එතානි සබ්බානි අධිගණ්හාති පණ්ඩිතො.

3110. තං බලානං බලං සෙට්ඨං අග්ගං පඤ්ඤාබලං වරං,
පඤ්ඤාබලෙනුපත්ථද්ධො අත්ථං වින්දති පණ්ඩිතො.

3111. අපි චෙ ලභති මන්දො ඵීතං ධරණිමුත්තමං,
අකාමස්ස පසය්හ වා අඤ්ඤො තං පටිපජ්ජති.

3112. අභිජාතොපි චෙ හොති රජ්ජං ලද්ධාන ඛත්තියො,
දුප්පඤ්ඤො හි කාසිපති සබ්බෙනපි න ජීවති.

3113. පඤ්ඤා සුතං විනිච්ඡිනී
පඤ්ඤා කිත්තිසිලොකවඩ්ඪනී,[3]
පඤ්ඤාසහිතො නරො ඉධ
අපි දුක්ඛෙපි සුඛානි[4] වින්දති.

3114. පඤ්ඤඤ්ච ඛො අසුස්සූසං න කොචි අධිගච්ඡති,
බහුස්සුතං අනාගම්ම ධම්මට්ඨං අවිනිබ්භුජං.

1. සීලවාස්සු – මජසං.
2. පසය්හං – සීමු.
3. කිත්ති – මජසං.
4. සුඛානු – මජසං.

3104. පහ වූ ලොමුදහ ගැනුම් ඇති කැමැති පරිදි හැසිරෙන්නා වූ රජුගේ සියලු භොගයෝ වැනසෙත්. එහි පාපය වේ යයි කියනු ලැබේ.

3105. මහරජ, නුඹගේ මේ ප්‍රශ්නයෙහි ම වෘතපදයෝ ඇතුළත් වෙත්. මෝ ම අනුශාසනාව යි. දැන් පින් කරන රාසොඩ නොවූ වස්තුව විනාශ නො කරන දක්ෂයෙක් වව. මහරජ, සිල්වතෙක් වව. දුස්සීලයා වනාහි නිරයෙහි වැටෙන්නේ යයි කුණ්ඩලිනිය කීවා ය.

3106. පුත්‍ර ජම්බුකය, තොපගේ කොසිය ගොත්‍ර ඇති වෙස්සන්තර නම් සහෝදරයා ද එසේ ම කුණ්ඩලිනී, නම් සහොදරිය ද රාජ ධර්මය විචාළෙමු. දැන් නුඹ බල අතුරින් උතුම් බලය කුමක් ද යි කියව.

3107. මහරජ, මහත් අදහස් ඇති පුරුෂයා කෙරෙහි ලෙව්හි පවත්නා බලය පස් ආකාර ය. එහි කායබලය නම් ලාමක බල-යයි කියනු ලැබේ.

3108. දීර්ඝායුෂ ඇති මහරජ, සම්පත් බලය දෙවැනි බලය යි කියනු ලැබේ. දීර්ඝායුෂ ඇති මහරජ, අමාත්‍යබලය තුන්වැනි බලයයි කියනු ලැබේ.

3109. ඒ ජාති සම්පත්තියෙන් ඇතිවූ බලය නිසැකයෙන් සතරවැනි බලය යි. යම් මේ සියලු බල කෙනෙක් වෙද්ද නුව-ණැත්තේ ඒ සියල්ල (ඥාන බලයෙන්) යටපත් කෙරේ.

3110. බලයන් අතුරෙන් ශ්‍රෙෂ්ඨබලය වූ ද අග්‍ර වූ ද ඒ ප්‍රඥා බලය ඉතා උතුම් ය. ප්‍රඥාබලයෙන් යුක්ත වූ පණ්ඩිත තෙම අභිවෘද්ධියට පැමිණේ.

3111. ඉදින් අඥාන තෙමේ සම්පතින් පිරුණා වූ උතුම් වූ පෘථිවිය ලබා ද එය නුවණැති අන්‍යයෙක් බලහත්කාරකම් කොට හෝ ඔහුගේ නොකැමැත්ත තිබිය දී උදුරා ගනී ද,

3112. කසී රට අධිපති මහරජ, විශිෂ්ඨ ජාති ඇති ක්ෂත්‍රිය වුව ද රාජ්‍යය ලැබගත් නමුත් අඥානයෙක් වන්නේ නම්, ඒ සියලු රාජ්‍යය ඇති ව ජීවත් වන්නට අසමත් වේ.

3113. ප්‍රඥා තොමෝ අසන ලද්ද විනිශ්චය කරන්නී ය. ප්‍රඥා තොමෝ කීර්තිඝෝෂය හා ලාභ සත්කාර වඩන්නී ය. ප්‍රඥායෙන් යුත් මනුෂ්‍ය තෙම මෙලොව දුක් ඇති වූ කල්හි ද උපාය කුශල-තායෙන් ක්‍රියා කොට සැප විඳියි.

3114. නුවණැත්තන් සෙවනය නො කොට බහුශ්‍රැතයන් කරා නො එළඹ දැහැමි නො දැහැමි කරුණු විනිශ්චය නො කොට ස්වභාව කාරණයෙහි පිහිටා සිටීමෙන් පමණක් කිසිවෙක් නුවණ නො ලබයි.

3115. යො ච ධම්මවිභඞ්ගඤ්ඤූ කාලුට්ඨායී අතන්දිතො[1],
අනුට්ඨහති කාලෙන තප්ඵලං[2] තස්ස ඉජ්ඣති.[3]

3116. අනායතන[4] සීලස්ස අනායතනසෙවිනො,
න නිබ්බින්දියකාරිස්ස සම්මදත්ථො විපච්චති.

3117. අජ්ඣත්තඤ්ච පයුත්තස්ස තථායතනසෙවිනො,
අනිබ්බින්දියකාරිස්ස සම්මදත්ථො විපච්චති.

3118. යොගප්පයොගසඞ්ඛාතං සම්භතස්සානුරක්ඛණං,
තානි ත්වං තාත සෙවස්සු මා අකම්මාය රන්ධයි
අකම්මුනා ච දුම්මෙධො නළාගාරංව සීදති.

3119. ධම්මං චර මහාරාජ මාතාපිතූසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3120. ධම්මං චර මහාරාජ පුත්තදාරෙසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3121. ධම්මං චර මහාරාජ මිත්තාමච්චෙසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3122. ධම්මං චර මහාරාජ වාහනෙසු බලෙසු ච,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3123. ධම්මං චර මහාරාජ ගාමෙසු නිගමෙසු ච,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3124. ධම්මං චර මහාරාජ රට්ඨෙසු ජනපදෙසු ච,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3125. ධම්මං චර මහාරාජ සමණබ්‍රාහ්මණෙසු ච,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

---

1. මතන්දිතො – මජ්සං.
2. කම්මඵලං – සීමු.
3. සිජ්ඣති – මජ්සං.
4. නානායතන – වි.

3115. දශ කුශලකර්ම විභාගය දන්නා වූ සුදුසු කාලයෙහි උත්සාහ කරන්නා වූ අනලස් වූ යමෙක් ඒ ඒ කාලයෙහි කළමනා කටයුතු කෙරේ ද ඔහුගේ ඒ ක්‍රියා ඵලය සමෘද්ධ වේ.

3116. දුස්සීලකම් කරන්නා වූ එබඳු ම දුස්සීල පුද්ගලයන් ආශ්‍රය කරන්නා වූ කලකිරී කටයුතු කරන පුද්ගලයාගේ කුශලකර්ම විපාකය මැනවින් විපාක නො දේ.

3117. තමා පිළිබඳව ද අනිත්‍යාදි වශයෙන් සලකන්නා වූ එබඳු ම සිල්වතුන් ඇසුරු කරන්නා වූ නො කලකිරී කටයුතු කරන්නාගේ කුශලකර්ම විපාකය මනා කොට විපාක දේ.

3118. යෙදිය යුතු කරුණෙහි යෙදීමට සුදුසු වූ ප්‍රඥාව ද, රැස් කරන ලද ධනය රක්‍ෂා කරන්නා වූ ප්‍රඥාව ද, යන දෙක සහ පෙර කී ප්‍රඥාවන් ද යන සියල්ල පියාණෙනි, නුඹ සෙවනය කරව. නිකරුණෙහි ධනය නො නසව. නුසුදුසු කටයුතු කිරීමෙන් අනුවණ පුද්ගල තෙමේ හුණ ගසින් කල ගෙයක් දිරා වැටෙන්නා සේ ගැලේ යයි ජම්බුක තෙම කීයේ ය.

3119. මහරජ, මවුපියන් කෙරෙහි කළමනා උපස්ථාන ධර්මයෙහි හැසිරෙව. මහරජ, මෙලොවැ ධර්මයෙහි හැසිර ස්වර්ගයට යන්නෙහි ය.

3120. ක්‍ෂත්‍රිය මහරජ, අඹු දරුවන් කෙරෙහි කළමනා යුතුකම් කිරීම් සංඛ්‍යාත ධර්මයෙහි හැසිරෙව. මහරජ, මෙලොවැ ධර්මයෙහි හැසිර ස්වර්ගයට යන්නෙහි ය.

3121. ක්‍ෂත්‍රිය මහරජ, මිත්‍රාමාත්‍යයන් කෙරෙහි කළමනා යුතුකම් කිරීම් සංඛ්‍යාත ධර්මයෙහි හැසිරෙව. මහරජ, මෙලොවැ ධර්මයෙහි හැසිර ස්වර්ගලොකයට යන්නෙහි ය.

3122. මහරජ, හස්ති අශ්වාදි වාහනයන් කෙරෙහි ද කළමනා යුතුකම් දහම්හි හැසිරෙව. මහරජ, මෙලොව ධර්මයෙහි හැසිර ස්වර්ග ලොකයට යන්නෙහි ය.

3123. මහරජ, ගම් නියම්ගම් වැස්සන් කෙරෙහි අධික අයබදු ගැනීම් ආදිය නො කොට ධර්මයෙහි හැසිරෙව. මහරජ, මෙලොවැ ධර්මයෙහි හැසිර ස්වර්ගලොකයට යන්නෙහි ය.

3124. මහරජ, රටවැසියා කෙරෙහි ද දනව් වැසියා කෙරෙහි ද හිතවත් බව එළවීම් සංඛ්‍යාත ධර්මයෙහි හැසිරෙව. මහරජ, මෙලොවැ ධර්මයෙහි හැසිර ස්වර්ගලොකයට යන්නෙහි ය.

3125. මහරජ, මහණ බමුණන් කෙරෙහි ද සිව්පසය දීමාදී ධර්මයෙහි හැසිරෙව. මහරජ, මෙලොවැ ධර්මයෙහි හැසිර ස්වර්ග ලොකයට යන්නෙහි ය.

3126. ධම්මං චර මහාරාජ මිගපක්ඛීසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3127. ධම්මං චර මහාරාජ ධම්මො චිණ්ණො[1] සුඛාවහො,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3128. ධම්මං චර මහාරාජ සඉන්දා[2] දෙවා සබ්‍රහ්මකා,
සුචිණ්ණෙන දිවං[3] පත්තා මා ධම්මං රාජ පමාදො.

3129. තත්‍රෙව තෙ වත්තපදා එසාව අනුසාසනී,
සප්පඤ්ඤසෙවීකල්‍යාණී සමත්තං[4] සාමතං[5] විදූති.

තෙසකුණජාතකං.

2. සරභඞ්ගජාතකං

3130. අලඞ්කතා කුණ්ඩලිනො සුවත්ථා
වෙළුරියමුත්තා ථරුඛග්ගබන්ධා,
රථෙසභා තිට්ඨථ කෙනු තුම්හෙ
කථං වො ජානන්ති මනුස්සලොකෙ.

3131. අහමට්ඨකො භීම[6]රථො පනායං
කාලිඞ්ගරාජා පන උග්ගතො අයං,
සුසඤ්ඤතානං ඉසීනං දස්සනාය
ඉධාගතා පුච්ඡිතායම්හ පඤ්හෙ.

3132. වෙහායසං තිට්ඨති අන්තලික්ඛෙ
පථද්ධුනො පණ්ණරසෙව චන්දො,
පුච්ඡාමි තං යක්ඛ මහානුභාව
කථං තං ජානන්ති මනුස්සලොකෙ.

3133. යමාහු දෙවෙසු සුජම්පතීති
මඝවාති තං ආහු මනුස්සලොකෙ,
සදෙවරාජා ඉදමජ්ජ පත්තො
සුසඤ්ඤතානං ඉසීනං දස්සනාය.

---

1. සුචිණ්ණො - මජසං, සයා.
2. ඉන්දා - මජසං. සයා.
3. තිදිවං - වි.
4. සමත්ථං - මජසං.
5. සමතං - මජසං.
6. භිම - මජසං.

3126. ක්‍ෂත්‍රිය මහරජ, මුව පක්ෂීන් කෙරෙහි අභය දානය කිරීම් සංඛ්‍යාත ධර්මයෙහි හැසිරෙව. මහරජ, මෙලොව ධර්මයෙහි හැසිර ස්වර්ගලොකයට යන්නෙහි ය.

3127. මහරජ, කුසල ධර්මයෙහි හැසිරෙව. පුරුදු කරන ලද ධර්මය තෙම සුව එළවයි. මහරජ, මෙලොවැ ධර්මයෙහි හැසිර ස්වර්ගයට යන්නෙහි ය.

3128. මහරජ, කුශල ධර්මයෙහි හැසිරෙව. ශක්‍ර බ්‍රහ්මයන් සහිත වූ දෙවියෝ ධර්මයෙහි හැසිරීමෙන් දෙව්ලොවට ගියහ. මහරජ, ධර්මයෙහි නොපමා වව.

3129. ඒ ප්‍රශ්නයෙහි ම ඒ වෘතපදයෝ ඇතුළත් වෙති. මෝ තොමෝ ම අනුශාසනාව වන්නී ය. නුවණැත්තන් ඇසුරු කරමින් යහපත් ගුණයෙන් යුක්ත ව තෙමේ ම මේ ගුණයන් හොඳින් දැන සමාදන් ව මේ අනුශාසනාවන් නො ඉක්මවා පිළිපදුව යි අවවාද කෙළේ ය.

තෙසකුණ ජාතක යි.

2. සරභඞ්ග ජාතකය

3130. අලංකාර ලෙස සැරසුණු කුණ්ඩලාභරණ පැළැන්ද වූ යහපත් වස්ත්‍ර ඇන්ද වූ වෛඩූර්‍ය මැණික්වලින් හා මුතුවලින් ද සරසන ලද මිට් ඇති කඩු බඳිනා ලද රථෙශ්වර වූ නුඹ වහන්සේ මෙහි සිටින්නහු ය. නුඹ වහන්සේ කවරහු ද? කෙසේ නම් හඳුනද් ද?

3131. මම අට්ඨක නම් වෙමි. මෙතෙම වනාහි භීමරථ නම් වෙයි. ප්‍රකට ව පෙනෙන මෙතෙමේ කලිඞුරජ ය. අපි මනා සංවර ඇති සෘෂීන් දැකුමටත් සරභංග ශාස්තෘවරයාගෙන් ප්‍රශ්න අසන්නටත් මෙහි පැමිණියෙමු.

3132. අන්තරීක්‍ෂ නම් වූ අහසෙහි පසළොස්වක්හි අහස් මැදට වන් චන්ද්‍රයා මෙන් සිටින්නෙහි ය. මහත් අනුභාව ඇති යක්‍ෂය නුඹ විචාරමි. මිනිස් ලොව තා කෙසේ දනිද්ද? කියා ය.

3133. දෙවියන් අතර සුජම්පතී යයි යමකු ගැන කියද්ද, මිනිස් ලොවැ ඔහුට "මඝවා" යි කියත්. ඒ සක්දෙව්රජ වන මම මනා සංවර ඇති සෘෂීන් දක්මට අද මෙහි පැමිණියෙමි.

3134. දූරෙ සුතා නො ඉසයො සමාගතා
මහිද්ධිකා ඉද්ධිගුණූපපන්නා,
වන්දාමි තෙ අයිරෙ පසන්නචිත්තො
යෙ ජීවලොකෙත්ථ මනුස්සසෙට්ඨා.

3135. ගන්ධො ඉසීනං චිරදික්ඛිතානං
කායා චුතො ගච්ඡති මාලුතෙන,
ඉතො පටික්කම්ම සහස්සනෙත්ත
ගන්ධො ඉසීනං අසුචි දෙවරාජ.

3136. ගන්ධො ඉසීනං චිරදික්ඛිතානං
කායා චුතො ගච්ඡතු[1] මාලුතෙන,
විචිත්‍රපුප්ඵං සුරභිංව මාලං
ගන්ධං එතං පාටිකඞ්ඛාම භන්තෙ
න හෙත්ථ දෙවා පටික්කූලසඤ්ඤිනො.

3137. පුරින්දදො භූතපතී යසස්සී
දෙවානමින්දො මඝවා සුජම්පති,
ස දෙවරාජා අසුරගණප්පමද්දනො
ඔකාසමාකඞ්ඛති පඤ්හ[2]පුච්ඡිතුං.

3138. කොනෙවිමෙසං ඉධ පණ්ඩිතානං
පඤ්හෙ පුට්ඨො නිපුණෙ ව්‍යාකරිස්සති,
තිණ්ණඤ්ච රඤ්ඤං මනුජාධිපානං
දෙවානමින්දස්ස ච වාසවස්ස.

3139. අයං ඉසි සරභඞ්ගො යසස්සී
යතො ජාතො විරතො මෙථුනස්මා,
ආචරිය[3]පුත්තො සුවිනීතරූපො
සො නෙසං පඤ්හානි ව්‍යාකරිස්සති.

3140. කොණ්ඩඤ්ඤ පඤ්හානි වියාකරොහි
යාචන්ති තං ඉසයො සාධුරූපා,
කොණ්ඩඤ්ඤ එසො මනුජෙසු ධම්මො
යං වුද්ධමාගච්ඡති එස භාරො.

3141. කතාවකාසා පුච්ඡන්තු භොන්තො
යං කිඤ්චි පඤ්හං මනසාභිපත්ථිතං,
අහං හි තං තං වො වියාකරිස්සං
ඤත්වා සයං ලොකමිමං පරඤ්ච.

3142. තතො ච මඝවා සක්කො අත්ථදස්සී පුරින්දදො,
අපුච්ඡි පඨමං පඤ්හං යඤ්චාසි අභිපත්ථිතං.

---

1. ගච්ඡති - වි.
2. පඤ්හං - මජ්සං. පඤ්හෙ - වි.
3. ආචෙර - මජ්සං.

3134. ස්වාමීනි, මහත් සෘද්ධි ඇති සෘද්ධි ගුණයෙන් යුත් සෘෂි වරු මෙහි රැස්වූවා යැයි අප විසින් දුරදී ම අසන ලද්දහ. ස්වාමීනි, මේ මිනිස් ලොව මනුෂ්‍ය ශ්‍රෙෂ්ඨ වූ යම් සෘෂිවරයෙක් වෙත් නම් ඔවුන් පැහැදුණා වූ සිතින් මම වඳිමි.

3135. දහසක් නුවණැස් ඇති දිව්‍යරාජය, පැවිදි වූ බොහෝ කල් ඇති තාපසවරුන්ගේ ශරීරයෙන් නික්මෙන ගඳ වාතයෙන් ගෙන යයි. ශක්‍රය, මෙතැනින් ඉවත් වව. සෘෂිවරුන්ගේ ගඳ අපිරිසිදු යැයි තාපස තෙම කීයේ ය.

3136. ස්වාමීනි, පැවිදි වූ බොහෝ කල් ඇති සෘෂිවරුන්ගේ කයින් නික්මෙන ගඳ සුළඟින් යේවා. සුවඳැති විසිතුරු මලක් මෙන් ද මල් මාලාවක් මෙන් ද අපි මේ ගඳ කැමැති වෙමු. මේ ගඳෙහි ලා දෙවියෝ පිළිකුල් සංඥා ඇත්තෝ නො වෙත්.

3137. පෙර දන්දුන් හෙයින් පුරින්දද නම් වූ භූතයන් අතර ශ්‍රෙෂ්ඨ බැවින් භූතපති නම් වූ පරිවාර සම්පත්තීන් යුත් දෙවියන්ගේ ප්‍රධානයා හෙයින් දෙවානමින්ද නම් වූ පෙර ජාතියක වශයෙන් මඝ නම් වූ සුජා නම් අසුර කන්‍යාවගේ ස්වාමි බැවින් සුජම්පති නම් වූ දෙවියන්ගේ සිත් අලවන බැවින් දෙවරාජ නම්වූ අසුර සමූහයා මඩින්නා වූ ඒ ශක්‍ර තෙම ප්‍රශ්න අසන්නට බලාපොරොත්තු වෙයි.

3138. මෙහි සිටින පණ්ඩිතයන් අතුරෙන් කවරෙක් නම් රජුන් තිදෙනා විසින් ද ශක්‍රයා විසින් ද අසන ලද සියුම් ප්‍රශ්න විසඳන්නේ ද?

3139. පරිවාර සම්පත් ඇති උපන්ද සිට ම මෙවුන්දමින් වැළැකුණු පුරොහිත බ්‍රාහ්මණයාගේ පුත්‍ර වූ ඉතා කීකරු වූ සරභංග නම් යම් මේ සෘෂිවරයෙක් වේ නම් හෙ මොවුන්ගේ ප්‍රශ්න විසඳන්නේ ය.

3140. කොණ්ඩඤ්ඤ ගොත්‍ර ඇත්තා වූ සෘෂීන් වහන්ස, ප්‍රශ්න විසඳනු මැනැවි. යහපත් ස්වභාවය ඇති සෘෂිවරු තොප යදිත්, කොණ්ඩඤ්ඤ ගොත්‍ර ඇති සෘෂිවරයාණන් වහන්ස, නුවණින් වැඩි දියුණු වූ යම් බඳු වෘද්ධයකු වෙතොත් ප්‍රශ්න විසඳීම් භාරය ඔහු අයත් ය යන මෙකරුණ මිනිසුන් කෙරෙහි පවත්නා ස්වභාවයෙකි.

3141. යම් කිසි ප්‍රශ්නයක් සිතින් කැමතිවන ලද ද කරන ලද අවකාශ ඇත්තෝ එය අසත්වා, මෙලොවත් පරලොවත් දැක දැන මම ඒ ඒ ප්‍රශ්න තොපට විසඳන්නෙමි.

3142. ඉක්බිති යහපත දන්නා වූ පුරින්ද ද නම් ශක්‍ර තෙම සිත්හි ලා සලකන ලද යම් ප්‍රශ්නයෙක් වී නම් ඒ ප්‍රථම ප්‍රශ්නය ඇසුවේ ය.

3143. කිංසු වධිත්වා න කදාචි සොචති
කිස්සප්පහානං ඉසයො වණ්ණයන්ති,
කස්සීධ වුත්තං ඵරුසං ඛමෙථ
අක්ඛාහි මෙ කොණ්ඩඤ්ඤ එතමත්ථං.

3144. කොධං වධිත්වා න කදාචි සොචති
මක්ඛප්පහානං ඉසයො වණ්ණයන්ති,
සබ්බෙසං වුත්තං ඵරුසං ඛමෙථ
එතං ඛන්තිං උත්තමමාහු සන්තො.

3145. සක්කා උභින්නං වචනං තිතික්ඛිතුං
සදිසස්ස වා සෙට්ඨතරස්ස වාපි,
කථන්නු හීනස්ස වචො ඛමෙථ
අක්ඛාහි මෙ කොණ්ඩඤ්ඤ එතමත්ථං.

3146. භයා හි සෙට්ඨස්ස වචො ඛමෙථ
සාරම්භහෙතු පන සාදිසස්ස,
යො චීධ හීනස්ස වචො ඛමෙථ
එතං ඛන්තිං උත්තමමාහු සන්තො.

3147. කථං විජඤ්ඤා චතුමට්ඨරූපං
සෙට්ඨං සරික්ඛං අථවාපි හීනං,
විරූපරූපෙන චරන්ති සන්තො
තස්මා හි සබ්බෙස වචො ඛමෙථ.

3148. න හෙතමත්ථං මහතීපි සෙනා
සරාජිකා යුජ්ඣමානා ලභෙථ,
යං ඛන්තිමා සප්පුරිසො ලභෙථ
ඛන්තීබලස්සූපසමන්ති වෙරා.

3149. සුභාසිතන්තෙ අනුමොදියාන
අඤ්ඤං තං පුච්ඡාමි තදිඞ්ඝ බෲහි,
යථා අහූ දණ්ඩකී නාළිකීරො[1]
අථජ්ජුනො කලාබු චාපි රාජා,
තෙසං ගතිං බෲහි සුපාපකම්මිනං
කත්ථූපපන්නා ඉසීනං විහෙඨකා.

3150. කිසං හි[2] වච්ඡං අවකිරිය[3] දණ්ඩකී
උච්ඡින්නමූලො සජනො සරට්ඨො,
කුක්කුළනාමෙ නිරයම්හි පච්චති
තස්ස ඵුලිඞ්ගානි පතන්ති කායෙ.

1. නාළිකෙරො - මජ්ඣං,
2. කිසඤ්හි - මජ්ඣං.
3. අවකිර - මජ්ඣං,

3143. කුමක් නසා කිසි කලෙක ශෝක නො කෙරේ ද? සෘෂීහු කවරකුගේ ප්‍රහාණය වර්ණනා කරද් ද? මේ ලොකයෙහි කවරක්හු කියන ලද පරුෂ වචනය ඉවසන්නේ ද? කොණ්ඩඤ්ඤය, ඒ කාරණය මට කියව.

3144. ක්‍රොධය නසා කිසි කලෙක ශොක නො කරමි. ගුණමකු ගතිය ප්‍රහාණය කිරීම සෘෂීහු වර්ණනා කරත්. සියල්ලන් ම කියන ලද පරුෂ වචනය ඉවසන්නේයැ. සත්පුරුෂයෝ එය උතුම් ක්ෂාන්ති යයි කීහු.

3145. කොණ්ඩඤ්ඤතුමනි, සමානයකුගේ හෝ තමනට වඩා ශ්‍රෙෂ්ඨයකුගේ හෝ යන දෙදෙනාගේ පරුෂ වචන ඉවසන්නට පිළිවන. නීචයාගේ වචන කෙසේ නම් ඉවසිය හැකි ද යි යන මේ කරුණ මට ප්‍රකාශ කරනු මැනැවි.

3146. ශ්‍රෙෂ්ඨයාගේ වචන බියෙන් ඉවසන්නේ ය. කරණුත්තරියකරණය හෙතුකොට සමානයාගේ වචන ඉවසන්නේ ය. යමෙක් වනාහි හීනයාගේ පරුෂ වචන ඉවසා නම් එය උතුම් ක්ෂාන්ති යයි කීහ.

3147. සතර ඉරියව්වෙන් වැසී ගිය ස්වභාවය ඇත්තහු ශ්‍රෙෂ්ඨ යයි කියාත් සමාන යයි කියාත් වැළිදු හීනය කියාත් කෙසේ නම් දැන ගන්නේ ද? උතුම් සත්පුරුෂයෝ ද ලාමකයන්ගේ ස්වරූපයෙන් හැසිරෙත්. එහෙයින් ශ්‍රෙෂ්ඨ-සමාන-පහත් යන සියල්ලන්ගේ ම පරුෂ වචන ඉවසන්නේ ය.

3148. ඉවසනසුලු සත්පුරුෂ තෙම යම් අර්ථයක් ලබයි ද, යුද කරන්නා වූ රජුන් සහිත මහසෙනඟ ද මෙබඳු අර්ථයක් යහපතක් නො ලබන්නේ ය. ඉවසීමේ බලයෙන් වෛරයෝ සන්හිඳෙත්.

3149. නුඹ වහන්සේගේ සුභාෂිතය අනුමෝදන් ව අන් ප්‍රශ්නයක් නුඹ අතින් විචාරමි. එබැවින් එය කියනු මැනවි. දණ්ඩකී නම් රජ ද නාළිකීර නම් රජ ද අර්ජුන නම් රජ ද කලාබු නම් රජ ද යන මොවුහු යම් සේ වූහු නම් අතිශයින් කරන ලද පාප ක්‍රියා ඇත්තා වූ ඔවුන්ගේ පරලොව ගමන ගැන කියනු මැනවි. සෘෂීන්හට වෙහෙස කළා වූ ඔවුහු කොහි උපන්නෝ ද?

3150 දණ්ඩකී නම් රජ තෙම කිසවච්ඡ නම් තාපසයාට අවමන් කොට සපිරිවරින් රටවැසියා සහිත ව සිඳින ලද මුල් ඇත්තේ (ප්‍රතිෂ්ඨාවක් නැතිව) කුක්කුල නම් නරකයෙහි පැසෙයි. ඔහුගේ ශරීරයෙහි සහළඟුරු වැටේ.

3151. යො සඤ්ඤතෙ පබ්බජිතෙ අහෙඨයි[1]
ධම්මං භණන්තෙ සමණෙ අදූසකෙ,
තං නාළිකේරං සුනඛා පරත්ථ
සඞ්ගම්ම ඛාදන්ති විඵන්දමානං.

3152. අජ්ජුනො නිරයෙ සත්තිසූලෙ
අවංසිරො පතිතො උද්ධපාදෙ,
අඞ්ගීරසං ගොතමං හෙඨයිත්වා
ඛන්තිං තපස්සිං චිරබ්‍රහ්මචාරිං.

3153. යො ඛණ්ඩසො පබ්බජිතං[2] අඡේදයි
ඛන්තිං වදන්තං සමණං අදූසකං,
කලාබුවීචිං උපපජ්ජ පච්චති
මහාපතාපං කටුකං භයානකං.

3154. එතානි සුත්වා නිරයානි පණ්ඩිතො
අඤ්ඤානි පාපිට්ඨතරානි චෙත්ථ,
ධම්මං චරෙ සමණබ්‍රාහ්මණෙසු
එවං කරො සග්ගමුපෙති ඨානං.

3155. සුභාසිතං තෙ අනුමොදියාන
අඤ්ඤං තං පුච්ඡාමි තදිඞ්ඝ බ්‍රෑහි,
කථං විධං සීලවන්තං වදන්ති
කථං විධං පඤ්ඤවන්තං වදන්ති,
කථං විධං සප්පුරිසං වදන්ති
කථං විධං නො සිරි නො ජහාති.

3156. කායෙන වාචාය ච යො ධ සඤ්ඤතො
මනසා ච කිඤ්චි න කරොති පාපං,
න අත්තහෙතු අලිකං භණාති[3]
තථා විධං සීලවන්තං වදන්ති.

3157. ගම්භීර පඤ්හං මනසා විචින්තයං
නාච්චාහිතං[4] කම්ම කරොති ලුද්දං,
කාලාගතං අත්ථපදං න රිඤ්චති
තථා විධං පඤ්ඤවන්තං වදන්ති.

1. අඡේදයි - මජසං.
2. පබ්බජිතං - මජසං.
3. භණෙති - මජසං.
4. නච්චාහිතං - මජසං, සයා.

3151. යම් රජෙක් කිසිවකුට දුෂ්ට චෙතනා පහළ නො කළ සන්හිඳුවන ලද පව් ඇති (අකුශල ධර්ම සංඛ්‍යාත) බණ දෙශනා කරන්නා වූ සංයත වූ නිරපරාධ වූ පැවිද්දන් වෙහෙසුයේ ද, වැනසෙන්නා වූ ඒ නාලිකීර නම් රජ පරලෙව්හි දී සුනඛයෝ රස්ව කා දමත්.

3152. තවද අර්ජුන නම් රජ තෙම දිවසීම් ඇති බොහෝ කල් රක්නා ලද බඹසර ඇති ගෞතම ගොත්‍රයෙහි වූ අංගීරස නම් වූ තාපසයන් හිංසා කොට සත්ත්සූල නම් නිරයෙහි හිස යටිකුරු ව පා උඩුකුරු ව වැටුණේ වෙයි.

3153. යම් රජෙක් ක්‍ෂාන්තිය ප්‍රකාශ කරන්නා වූ නිරපරාධ වූ සන්හිඳුවන ලද පව් ඇති පැවිද්දකු කඩ කඩ කොට සින්දේ ද කලාබු නම් ඒ රජ තෙම භයානක වූ කටුක වූ මහත් දුක් ඇත්තා වූ අවීචියේ ඉපද පැසේ.

3154. ශක්‍රය, නුවණැත්තේ මේ නරකයන් ද මෙයටත් වඩා ලාමක (පාපිෂ්ඨතර) නරකයන් ද අසා දැන මෙහි (මෙලොව) මහණ බමුණන් කෙරෙහි දැහැමින් හැසිරෙන්නේ ය. මෙසේ කරන්නා වූ පුද්ගල තෙම දෙව්ලොවට පැමිණෙන්නේ යයි ප්‍රකාශ කෙළේ ය.

3155. නුඹ වහන්සේගේ සුභාෂිතය අනුමෝදන් ව වෙන ප්‍රශ්නයක් නුඹ වහන්සේ අතින් විචාරමි. එය ද කියනු මැනවි. කෙබඳු වූවහු සිල්වත් යැ යි කියද් ද? කෙබඳු වූවහු නැණවත් යැ යි කියද් ද? කෙබන්දකු සත්පුරුෂ යැ යි කියද් ද? කෙබඳු පුද්ගලයකු සම්පත්ති තොමෝ අත් නො හරී යයි කියද් ද?

3156. යමෙක් මෙලොව කයින් ද වචනයෙන් ද සිතින් ද සංයම වූයේ කිසි පාපයක් නො කරයි ද තමා හෙතු කොටගෙන පවා බොරුවක් නො කියා ද එබඳු පුද්ගලයා සිල්වතෙකැයි කියත්.

3157. ගැඹුරු වූ ප්‍රශ්න සිතින් සිතමින් යමෙක් අතිශයින් අවැඩදයක රෞද්‍ර කර්ම නො කෙරේ ද, සුදුසු කාලයට පැමිණියා වූ අර්ථපදය හෙවත් යහපත් කටයුත්ත හිස් නො කරයි ද, එබඳු වූවහු ප්‍රඥාවත් පුද්ගල යයි කියත්.

3158. යො වෙ කතඤ්ඤූ කතවෙදි ධීරො
කල්‍යාණමිත්තො දළ්හභත්ති ච හොති,
දුඛිතස්ස සක්කච්ච කරොති කිච්චං
තථාවිධං සප්පුරිසං වදන්ති.

3159. එතෙහි සබ්බෙහි ගුණෙහුපෙතො
සද්ධො මුදු සංවිභාගී වදඤ්ඤූ,
සඞ්ගාහකං සඛිලං සණ්හවාචං
තථාවිධං නො සිරි නො ජහාති.

3160. සුභාසිතත්ථෙන අනුමොදියාන
අඤ්ඤං තං පුච්ඡාමි තදිඞ්ඝ බ්‍රෑහි,
සීලං සිරිඤ්චාපි සතඤ්ච ධම්මං
පඤ්ඤඤ්ච කං සෙට්ඨතරං වදන්ති.

3161. පඤ්ඤා හි සෙට්ඨා කුසලා වදන්ති
නක්ඛත්තරාජාරිව තාරකානං,
සීලං සිරිඤ්චාපි සතඤ්ච ධම්මො
අන්වායිකා පඤ්ඤවතො භවන්ති.

3162. සුභාසිතත්ථෙන අනුමොදියාන
අඤ්ඤං තං පුච්ඡාමි තදිඞ්ඝ බ්‍රෑහි,
කථංකරො කින්තිකරො කිමාචරං
කිං සෙවමානො ලභතීධ පඤ්ඤං
පඤ්ඤායිදන්ති[1] පටිපදං වදෙහි
කථං කරො පඤ්ඤවා හොති මච්චො.

3163. සෙවෙථ වුද්ධෙ නිපුණෙ බහුස්සුතෙ
උග්ගාහකො පරිපුච්ඡකො[2] සියා,
සුණෙය්‍ය සක්කච්ච[3] සුභාසිතානි
එවංකරො පඤ්ඤවා හොති මච්චො.

3164. ස පඤ්ඤවා කාමගුණෙ අවෙක්ඛති
අනිච්චතො දුක්ඛතො රොගතො ච,
එවං විපස්සී පජහාති ඡන්දං
දුක්ඛෙසු කාමෙසු මහබ්භයෙසු.

3165. ස වීතරාගො පවිනෙය්‍ය දොසං
මෙත්තං චිත්තං භාවයෙ අප්පමාණං,
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
අනින්දිතො බ්‍රහ්මමුපෙති ඨානං.

1. පඤ්ඤායදන්ති - වි. මජසං.
2. ච පරිපුච්ඡකො - සීමු
3. සක්කච්චං - මජසං.

3158. යම් ප්‍රාඥයෙක් කළගුණ දන්නේ කෘතොපකාර සලකන්නේ යහපත් මිතුරන් ඇත්තේ දෘඪ භක්ති ඇත්තේ ද දුකට පැමිණියා වූ තම යහළුවාගේ කටයුත්ත සකස්කොට කෙරේ ද, එබඳු පුද්ගලයා සත්පුරුෂයා යයි කියත්.

3159. මෙකී සියලු ගුණයන්ගෙන් යුත් ශ්‍රද්ධා ඇත්තාවූ මෘදු වචන ඇත්තා වූ ලද දෙය බෙදගෙන පරිභොග කරනසුලු වූ යාචකයන්ගේ වචන දන්නා වූ යමෙක් වේ ද, සිව්සඟරා වතින් සංග්‍රහ කරන්නා වූ මිහිරි වචන ඇත්තා වූ සිලුටු වචන ඇත්තා වූ එබඳු පුද්ගලයා සම්පත්ති තොමෝ අත් නොහරී යයි කීයේ ය.

3160. නුඹ වහන්සේගේ සුභාෂිතය අනුමෝදන් ව වෙනත් ප්‍රශ්නයක් නුඹ වහන්සේ අතින් විචාරමි. එබැවින් එය ප්‍රකාශ කරනු මැනවි. ශීලයත් සම්පත්තියත් සත්පුරුෂ ධර්මයත් ප්‍රඥාවත් යන මේවා අතුරෙන් කවරක් ඉතා ශ්‍රෙෂ්ඨ යයි කියද් ද?

3161. තරු අතුරෙන් චන්ද්‍රයා ම ප්‍රධාන වන්නාක් මෙන් නොහොත් සෙසු හැම තරු චන්ද්‍රයා ම පිරිවරාගෙන සිටින්නාක් මෙන් කුශලයෝ වනාහි ප්‍රඥාව ශ්‍රෙෂ්ඨ කොට ඇත්තෝ ම ය. යම් හෙයකින් ශීලයත් ඓශ්වර්‍ය්‍යයත් සත්පුරුෂ ධර්මයත් යන මේ තුන ම ප්‍රඥාවන්තයා පසුපස යන්නාහු වෙද්ද? එහෙයිනි.

3162. නුඹ වහන්සේගේ සුභාෂිතය අනුමෝදන් ව වෙන ප්‍රශ්නයක් නුඹ වහන්සේ අතින් විචාරමි. එබැවින් එය ප්‍රකාශ කරනු මැනවි. කෙසේ කරන්නේ කිනම් කර්මයක් කරන්නේ කිමෙකැ හැසිරෙන්නේ කවරකු සෙවනය කරන්නේ (මෙලොව) ප්‍රඥාව ලබා ද? දැන් ප්‍රඥාව ලබාගැනීම පිණිස පිළිවෙත ප්‍රකාශ කරනු මැනවි. මිනුෂ්‍ය තෙම කෙසේ කරන්නේ නුවණැත්තේ වේ ද?

3163. ප්‍රඥායෙන් වැඩී සිටි, සියුම් කරුණු දැනීමෙහි සමත් බොහෝ ඇසූපිරූතැන් ඇත්තන් සෙවනය කරන්නේ ය. ඉගෙන ගන්නේ ප්‍රශ්න විචාරන්නෙක් වන්නේ ය. සුභාෂිතයන් ඉතා සැලකිල්ලෙන් අසන්නේ ය. මෙසේ කරන්නා වූ මිනුෂ්‍ය තෙම නුවණැත්තේ වෙයි.

3164. ඒ නුවණැත්තේ පංච කාමයන් අනිත්‍ය වශයෙන් ද, දුක් වශයෙන් ද, රෝග වශයෙන් ද, බලයි. මෙසේ නුවණින් බලන තැනැත්තේ දුක් වූ මහත් බිය එළවන්නා වූ කාමයන් කෙරෙහි ආශාව තදංග ප්‍රහාණ වශයෙන් දුරු කරයි.

3165. ශක්‍රය, තදංග ප්‍රහාණ වශයෙන් කාමයන් ප්‍රහීණ වූ ඒ වීතරාගී පුද්ගල තෙමේ නව ආඝාත වස්තුයෙන් හටගන්නා ද්වෙෂය දුරු කොට සියලු සත්‍වයන් කෙරෙහි දඬු බහාතබා අප්‍රමාණ වූ මෛත්‍රී සිත දියුණු කරන්නේ ය. නින්ද නො ලබන්නේ බ්‍රහ්ම ලොකයට උපපත්ති වශයෙන් එළඹෙයි.

3166. මහිද්ධියං[1] ආගමනං අහොසි
තවමට්ඨක භීමරථස්ස චාපි,
කාලිඞ්ගරාජස්ස ච උග්ගතස්ස
සබ්බෙස[2] වො කාමරාගො පහීනො.

3167. එවං මෙතං පරචිත්තවෙදි
සබ්බෙස නො කාමරාගො පහීනො,
කරොහි ඔකාසමනුග්ගහාය
යථාගතිං තෙ අභිසම්භවෙම.

3168. කරොමි ඔකාසමනුග්ගහාය
තථා හි වො කාමරාගො පහීනො,
ඵරාථ කායං විපුලාය පීතියා
යථා ගතිං මෙ අභිසම්භවෙථ.

3169. සබ්බං කරිස්සාම තවානුසාසනං
යං යං තුවං වක්ඛසි භූරිපඤ්ඤ,
ඵරාම කායං විපුලාය පීතියා
යථා ගතිං තෙ අභිසම්භවෙම.

3170. කතායං වච්ඡස්ස කිසස්ස පූජා
ගච්ඡන්තු භොන්තො ඉසයො සාධුරූපා,
ඣානෙ රතා හොථ සදා සමාහිතා
එසා රතී පබ්බජිතස්ස සෙට්ඨා.

3171. සුත්වාන ගාථා පරමත්ථසඤ්හිතා
සුභාසිතා ඉසිනා පණ්ඩිතෙන,
තෙ වෙදජාතා අනුමොදමානා
පක්කාමු දෙවා දෙවපුරං යසස්සිනො.

3172. ගාථා ඉමා අත්ථවතී සුබ්‍යඤ්ජනා
සුභාසිතා ඉසිනා පණ්ඩිතෙන,
යො කොචිමා අට්ඨිකත්වා සුණෙය්‍ය
ලභෙථ පුබ්බාපරියං විසෙසං
ලද්ධාන පුබ්බාපරියං විසෙසං
අදස්සනං මච්චුරාජස්ස ගච්ඡෙ.

3173. සාලිස්සරො සාරිපුත්තො මෙණ්ඩිස්සරො නාම කස්සපො,
පබ්බතො අනුරුද්ධො ච කච්චායනො ච දෙවලො.

3174. අනුසිස්සො ච ආනන්දො කිසවච්ඡො ච කොලිතො,
නාරදො පුණ්ණො මන්තාණිපුත්තො සෙසපරිසා බුද්ධපරිසා
සරභඞ්ගො ලොකනාථො එවං ධාරෙථ ජාතකන්ති.

සරභඞ්ගජාතකං.

---

1. මහත්ථියං - මජසං.
2. සබ්බෙසං - වි. මජසං.

3166. අට්ඨක නම් රජ නුඹගේ ද භීම රථ රජුගේ ද ප්‍රසිද්ධ වූ කලිඟු රජු ගේ ද මෙහි පැමිණීම මහත් සමෘද්ධි ඇත්තක් විය. ඔබ සියල්ලන්ගේ ම කාම රාගය තෙම තදංග වශයෙන් ප්‍රහීණ වූයේ යැයි තාපස තෙම කීයේ ය.

3167. පරසිත් දන්නා තාපසයාණන් වහන්ස, එය එසේ ම ය. අප සියල්ලන්ගේ කාමරාගය තදංග වශයෙන් ප්‍රහීණ විය. අපට අනුග්‍රහ පිණිස පැවිදි වීමට අවකාශ කරව. නුඹ වහන්සේගේ නිෂ්පත්තිය යම්සේ ද එබඳු නිෂ්පත්තියට අපි පැමිණෙන්නෙමු යි රජවරු කීහ.

3168. මහරජුනි, එසේ ම ය. තොපගේ කාමරාගය ප්‍රහීණ ය. අනුග්‍රහ කොට පැවිදි වීමට අවකාශ කරමි. මහත් වූ ධ්‍යාන ප්‍රීති-යෙන් කය පිනවයි. මාගේ නිෂ්පත්තිය යම්සේ ද එබඳු නිෂ්පත්තියට පැමිණෙමි යි තාපස තෙම කීයේ ය.

3169. මහත් ප්‍රඥා ඇති තාපසයන් වහන්ස, නුඹ වහන්සේ යමක් යමක් කියන්නෙහි ද? නුඹ වහන්සේගේ ඒ සියලු අනුශාසනා පිළිපදිමි. මහත් ධ්‍යාන ප්‍රීතියෙන් කය පිණවමි, නුඹ වහන්සේගේ නිෂ්පත්තිය යම්සේ ද එබඳු නිෂ්පත්තියට පැමිණෙන්නෙමු යි රජවරු කීහ.

3170. පින්වත්නි, කිසවච්ඡ තාපසයන්හට මේ පූජාව කරන ලදී. සෘෂිහු යහපත් ස්වභාව ඇත්තෝ යෙත්වා, හැම කල්හි ධ්‍යානයෙහි ඇළුණාහු එකඟ වූ සිත් ඇත්තාහු වවු. පැවිද්දහට මේ ඇල්ම ශ්‍රේෂ්ඨ ය.

3171. පණ්ඩිත වූ සෘෂිහු විසින් මනා කොට කියන ලද පරමාර්ථ-යෙන් යුත් වූ ගාථාවන් අසා සතුටු වූ පිරිවර ඇත්තා වූ ඒ දෙවියෝ අනුමෝදන් වෙමින් දෙව්ලොවට ගියහ.

3172. පණ්ඩිත වූ සෘෂිවරයා විසින් අර්ථවත් වූ ද ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත වූ ද මේ ගාථාවෝ මනා කොට කියන ලද්දහ. යම් කිසිවෙක් මේ ගාථාවන් අර්ථ වශයෙන් මෙනෙහි කොට අසන්නේ නම් හේ ප්‍රථම–ද්විතීය ධ්‍යානයන් ලබන්නේ ය. ප්‍රථම ද්විතීය ධ්‍යාන ලබා මෘත්‍යුරාජයාගේ නො දකීමට ද (නිවනට ද) යන්නේ ය.

3173. එකල්හි සාලිස්සර නම් තාපස තෙම දැන් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ය. මෙණ්ඩිස්සර නම් තාපස තෙම කාශ්‍යප තෙරණුවෝ ය. පබ්බත නම් තවුස් තෙම අනුරුද්ධ තෙරුන් වහන්සේ ය. දෙවල නම් තවුස් තෙමේ කච්චායන ස්ථවිරයන් වහන්සේ ය.

3174. අනුසිස්ස නම් තවුස් තෙමේ ආනන්ද ස්ථවිරයන් වහන්සේ ය. කිසවච්ඡ නම් තවුස් තෙමේ කොලිත නම් විය. නාරද නම් තාපස තෙම පුණ්ණමන්තානිපුත්ත තෙරණුවෝ ය. සෙසු පිරිස බුදු පිරිස විය. සරභංග නම් බොධිසත්ව තෙමේ දැන් බුදුවූ ලොකනාථයන් වහන්සේ යයි ජාතකය මෙසේ දරා ගනිවු යයි වදාළ සේක.

සරභඞ්ග ජාතක යි.

3. අලම්බුසාජාතකං

3175. අථබ්‍රවි බ්‍රහා ඉන්‍දො වත්‍රභූ ජයතං පිතා,
දෙවකඤ්ඤං පරාභෙත්වා සුධම්මායං අලම්බුසං.

3176. මිස්සෙ දෙවා තං යාචන්ති තාවතිංසා සඉන්‍දකා,
ඉසිපලොභිකෙ ගච්ඡ ඉසිසිඞ්ගං අලම්බුසෙ.

3177. පුරායං අම්හෙ අච්චෙති වත්තවා බ්‍රහ්මචරියවා,
නිබ්බානාභිරතො වුද්ධො තස්ස මග්ගානි ආවර.

3178. දෙවරාජ කිමෙව ත්වං මමෙව තුවං සික්ඛසි,
ඉසි පලොභිකෙ ගච්ඡ සන්ති අඤ්ඤාපි අච්ඡරා.

3179. මාදිසියො පවරා චෙව අසොකෙ නන්‍දනෙ වනෙ,
තාසම්පි හොතු පරියායො තාපි යන්තු පලොභිකා.

3180. අද්ධා හි සච්චං භණසි සන්ති අඤ්ඤාපි අච්ඡරා,
තාදිසියො පවරා චෙව අසොකෙ නන්‍දනෙ වනෙ.

3181. න තා එවං පජානන්ති පාරිචරියං පුමං ගතා,
යාදිසං ත්වං පජානාසි නාරි සබ්බඞ්ග සොභනෙ.

3182. ත්වමෙව ගච්ඡ කල්‍යාණි ඉත්ථීනං පවරා චසි,
තවෙව වණ්ණරූපෙන වසමානාපයිස්සසි.[1]

3183. න චාහං න ගමිස්සාමි දෙවරාජෙන පෙසිතා,
විභෙමි චෙතං ආසාදුං උග්ගතෙජො හි බ්‍රාහ්මණො.

3184. අනෙකෙ නිරයං පත්තා ඉසිමාසාදියා ජනා,
ආපන්නා මොහසංසාරං තස්මා ලොමානි හංසයෙ.

3185. ඉදං වත්වාන පක්කාමි අච්ඡරා කාමවණ්ණිනී,
මිස්සා මිස්සෙතු[2]මිච්ඡන්ති ඉසිසිඞ්ගං අලම්බුසා.

---

1. සවසමානයිස්සසි - මජසං.
2. මිස්සිතු - මජසං.

3. අලම්බුසා ජාතකය

3175. ඉක්බිති වක්‍ර නම් අසුරයා මැඩ පැවැත් වූ ජයප්‍රාප්ත ව දෙවියන්ගේ පිතෘස්ථානයෙහි වැජඹෙන්නා වූ මහත් අනුභාව ඇති ශක්‍ර තෙම සුධර්මා නම් දිව්‍ය සභායෙහි පරීක්‍ෂා කොට දූන අලම්බුසා නම් දිව්‍ය කන්‍යාවට මෙය කීයේ ය.

3176. පුරුෂයන් කෙලෙස් මිශ්‍රණයෙන් මිශ්‍ර කරන හෙයින් මිශ්‍රා නම් වූ ස්‍වාමීන් පොලොබවා ලීමෙහි දක්ෂ අලම්බුසාවනි, ශක්‍රයා සහිත තව්තිසා වැසි දෙවියෝ ඉසිසිංග තාපසයා පොලොබවීටම තිට යාචඤා කෙරෙත්, එහි යව.

3177. එම්බා අලම්බුසාව, ව්‍රත රක්නා බ්‍රහ්මචාරි වූ ඒ ඉසිසිංග තාපසයා ගුණයන්ගෙන් වැඩි සිටියේ නිවන්හි ඇලුණේ ය. මොහු අපගේ විෂය ඉක්මවා යන්නට පෙර ඔහුගේ දෙව්ලොව යන මාර්ගයන් ආවරණය කරව.

3178. දිව්‍යරාජයාණෙනි, කිම නුඹ වහන්සේ මේ දෙව්ලොව ස්‍වාමීන් පොලොබවීම පිණිස මාම දක්නෙහි ද? තවත් අප්සරාවෝ ඇත්තාහු නො වෙද්ද යි අලම්බුසාව ප්‍රශ්න කළා ය.

3179. ශොක රහිත වූ නන්දන වනයෙහි මා වැනි අප්සරා-වෝද මට වඩා උතුම් අප්සරාවෝ ද ඇත්තාහ. ඔවුනට මේ ගමන් වාරය වේවා. ඔවුහු ද තවුසා පොලොබවීමට යෙත්වා.

3180. එකාන්තයෙන් ම තෝ ඇත්තක් කියව. ශොක රහිත නන්දන වනයෙහි තී හා සමාන වූ ද තිට වඩා උතුම් වූ ද තවත් අප්සරාවෝ ඇත්තාහ.

3181. සියලු අංගයන්ගෙන් හොබනා වූ අලම්බුසාවනි, පුරුෂයකු වෙත ගියා වූ ඒ අප්සරාවරු තී යම් යම්බඳු පාරිචය්‍යීයක් දන්නී නම්, එය නොදන්නාහ.

3182. යහපත් තැනැත්තිය, තෝ ම යව. තී ස්ත්‍රීන් අතුරෙන් උතුම් වන්නී ය. තිගේ ම වර්ණයෙන් ද රූප සම්පත්තියෙන් ද ඒ තාපසයා වසහයට පමුණුවා ගන්නෙහි ය.

3183. දෙව්රජහු පිටත්කර යවන ලද මම නො යන්නෙම් නො වෙමි. එහෙත් මේ තවුසාට ළංවන්නට බිය වෙමි. ඒ තාපස තෙම උග්‍ර තෙජස් ඇත්තේ ය.

3184. ස්‍වාමීන් පොලොබවීමට ගිය බොහෝ දෙන මොහයෙන් සංසාරයට බැසගත්තාහු නිරයට පැමිණියහ. ඒ නිසා ලොමුදහ ගනිත්.

3185. පුරුෂයන් කැමතිවන ශරීර වර්ණයක් ඇති පුරුෂයන් ක්ලෙශයෙන් මිශ්‍ර කරන්නා වූ අලම්බුසා නම් ඒ අප්සරාව මෙසේ කියා ඉසිසිංග තවුසා ක්ලෙශයන්ගෙන් මිශ්‍ර කරන්නට ගියා ය.

3186. සා ච තං වනමොගය්හ ඉසිසිඞ්ගෙන රක්ඛිතං,
බිම්බි[1]ජාලසඤ්ඡන්නං සමන්තා අඩ්ඪයොජනං.

3187. පාතොව පාතරාසම්හි උදණ්හසමයං පති,
අග්ගිට්ඨං පරිමජ්ජන්තං ඉසිසිඞ්ගං උපාගමි.

3188. කා නු විජ්ජුරිවාභාසි ඔසධී විය තාරකා,
විචිත්තහත්ථාභරණා ආමුත්තමණිකුණ්ඩලා.

3189. ආදිච්චවණ්ණසඞ්කාසා හෙමචන්දනගන්ධිනී,
සඤ්ඤතූරූ මහාමායා කුමාරී චාරුදස්සනා.

3190. විලාකා[2] මුදුකා සුද්ධා පාදා තෙ සුප්පතිට්ඨිතා,
කමනා[3] කමනීයා තෙ හරන්තියෙව මෙ මනො.

3191. අනුපුබ්බා ච තෙ ඌරූ නාගනාසසමූපමා,
විමට්ඨා තුය්හං සුස්සොණී අක්ඛස්ස ඵලකං යථා.

3192. උප්පලස්සෙව කිඤ්ජක්ඛා නාභි තෙ සාධු සණ්ඨිතා,
පූරා කණ්හඤ්ජනස්සෙව දූරතො පටිදිස්සති.

3193. දුවිධා ජාතා උරජා අවණ්ටා සාධුපච්චුදා,
පයොධරා අප්පතීතා අඩ්ඪලාබුසමා ථනා.

3194. දීඝා කම්බුතලාභාසා ගීවා එණෙය්‍යකා යථා,
පණ්ඩරාවරණා වග්ගු චතුත්ථමනසන්නිභා.

3195. උද්ධග්ගා ච අධග්ගා ච දුමග්ගපරිමජ්ජිතා,
දුවිජා නෙලසම්භූතා දන්තා තව සුදස්සනා.

3196. අපණ්ඩරා ලොහිතන්තා ජිඤ්ජූකඵලසන්නිභා,
ආයතා ච විසාලා ච නෙත්තා තව සුදස්සනා.

3197. නාතිදීඝා සුසම්මට්ඨා කනකබ්‍යාසමොචිතා,
උත්තමඞ්ගරුහා තුය්හං කෙසා චන්දනගන්ධිකා.

3198. යාවතා කසිගොරක්ඛා වාණිජානඤ්ච යා ගති,
ඉසීනඤ්ච පරක්කන්තං සඤ්ඤතානං තපස්සිනං.

1. බිම්බ – මජසං.
2. විලග්ගා – මජසං.
3. ගමනා – මජසං, සයා.

3186. ඕ තොමෝ ද ඉසිසිංග තාපසයා විසින් රක්නා ලද රත් කරව් ගසින් ගැවසීගත්තා වූ හාත්පස යොදුනක් පමණ වූ ඒ වනයට වැද.

3187. පෙර බත්කාලයෙහි ඉර උදවන්නා වූ උදෑසන ම අමදිමින් ගිනිහල් ගෙහි සිටියා වූ ඉසිසිංග තාපසයන් වෙතට එළැඹියා ය.

3188. විසිතුරු වස්ත්‍රාභරණයෙන් සැරසුණු අමුණන ලද මිණි-කොඩොල් ඇති තී විදුලියක සේ ද ඔසධී තරුව සේ ද බබළන්නෙහි ය. තෝ කවර තැනැත්තියක් ද?

3189. සූර්‍ය්‍ය රශ්මිය වැනි වර්ණ ඇති, රත්සඳුන් සුවඳැති තෝ මනා වට වූ ඌරුයුග්ම ඇත්තී ය. මහා මායා ඇත්තී ය. ළදරුවයස් ඇත්තී ය. මනොඥ දකුම් ඇත්තී ය.

3190. තෝ සිහින් වූ ඉහටියක් ඇත්තී ය. සියුමැලි ය. නිර්මල ය. තීගේ පාදයෝ මනාව පිහිටියෝ ය. ගමන්කරන්නා වූ තෝ ඉතා කමනීය ය. මාගේ සිත ඇද ගන්නී ම ය.

3191. තීගේ කලවා යුවළ පිළිවෙළින් මහත් ය. ඇත් හොඬයක් බඳු උපමා ඇත්තේ ය. තීගේ ඉතා විශාල වූ උකුල රන් පෝරුවක් මෙනි.

3192. මනාව පිහිටියා වූ තීගේ නාභිය උපුල් කර්ණිකාවක් බඳු ය. කළු අඳුනෙන් පිරිගියාක් මෙන් දුරට දක්නා ලැබේ.

3193. තීගේ පයොධර යුවළ ළෙහි හටගත් නැටි රහිත ව මනාව පැන නැඟුණා වූ කිරි රඳා පවත්නා වූ මලානික නො වූ සමවට කුඩා ලබු ගෙඩියක් දෙකට කපා තැබූවාක් මෙනි.

3194. දික් වූ මිහිඟු බෙරයකට සමාන බැබැළීම් ඇති තීගේ ග්‍රීවය ඒණි මුවකුගේ බඳු ය. මනහර දෙතොල් දිවට බඳු පැහැයෙන් යුතුව.

3195. නිදෙස් හනුමස් කෙළවර හටගන්නා වූ උඩුදත් හා යටි දත් දැහැටිවලින් පිරිමදින ලද්දහු ඉතා දකුම්කලු ය.

3196. කළුපැහැ මුල ඇති රතුපැහැ අග ඇති ඔලිඳ ඇට බඳු තීගේ ඇස් දික් වූයේත් මහත් වූයේත් ඉතා දකුම්කලු ය.

3197. ඉතා දික් නොවූ මැනැවින් මට කරන ලද්ද වූ රන්-පණායෙන් පීරන ලද තීගේ හිසෙහි වූ කෙස් සඳුන් සුවඳ ඇත්තේ ය.

3198. යම් තාක් සීසාන්නාහු ගෙරින් රක්නාහු ද, වෙළඳුන්ගේ යම් ස්වභාවයක් වේ ද සංයම ඇත්තා වූ තපස් රක්නා ඍෂිවරුන්-ගේත් යම් පරාක්‍රමයකුත් වේ ද.

3199. න තෙ සමසමං පස්සෙ අස්මිං පථවිමණ්ඩලෙ,
කො වා ත්වං කස්ස වා පුත්තො කථං ජානෙමු තං මයං.

3200. න පඤ්හකාලො භද්දන්තෙ කස්සපෙවං ගතෙ සති,
එහි සම්ම රමිස්සාම උභො අස්මාක අස්සමෙ
එහි තං උපගූහිස්සං රතීනං කුසලො භව.

3201. ඉදං වත්වාන පක්කාමි අච්ඡරා කාමවණ්ණිනී,
මිස්සා මිස්සෙතුමිච්ඡන්තී ඉසිසිඞ්ගං අලම්බුසා.

3202. සො ච වෙගෙන නික්ඛම්ම ඡෙත්වා දන්ධපරක්කමං,
තමුත්තමාසු වෙණීසු අජ්ඣප්පත්තො පරාමසි.

3203. තමුදාවත්ත කල්‍යාණී පලිස්සජි සුසොභනා,
චවි තම්හි බ්‍රහ්මචරියා යථා තං අථ තොසිතා.

3204. මනසා අගමා ඉන්දං වසන්තං නන්දනෙ වනෙ,
තස්සා සඞ්කප්පමඤ්ඤාය මඝවා දෙවකුඤ්ජරො.

3205. පල්ලඞ්කං පහිණී ඛිප්පං සොවණ්ණං සොපවාහනං,
ස උත්තරච්ඡදපඤ්ඤාසං සහස්සපටිකත්ථතං.

3206. තමෙනං තත්ථ ධාරෙසි උරෙ කත්වාන සොභනා,
යථා එකමුහුත්තංව තීණි වස්සානි ධාරයි.

3207. විමදො තීහි වස්සෙහි පබුජ්ඣිත්වාන බ්‍රාහ්මණො,
අද්දසාසි හරිතරුක්ඛෙ සමන්තා අග්ගියායනං.

3208. නවපත්තවනං ඵුල්ලං කොකිලාගණඝොසිතං,
සමන්තා ස විලොකෙත්වා[1] රුදං අස්සූනි වත්තයි.

3209. න ජුහෙ න ජපෙ මන්තෙ අග්ගිහුත්තං පහාපිතං,
කො නු මෙ පාරිචරියාය පුබ්බෙ චිත්තං පලොභයි.

3210. අරඤ්ඤෙ මෙ විහරතො යො මෙ තෙජාහ සම්භතං,
නානාරතනපරිපුණ්ණං නාවංව ගණ්හි අණ්ණවෙ.

1. පවිලොකෙත්වා - වි, මජ්සං.

3199. මේ පොළෝ මඩුල්ලෙහි තොපට සමයකු නො දක්කෙමි. නුඹ කවරෙක් ද? කාගේ පුත්‍රයෙක් ද? අපි තොප කෙසේ දනිමු ද?

3200. කාශ්‍යප ගොත්‍ර ඇති තාපසයාණෙනි, මෙසේ නුඹගේ සිත පැවැති කල්හි ප්‍රශ්න කිරීමට කල් නො වෙයි. නුඹට වැඩෙක් ම වේවා. මිත්‍ර තාපසය, අපි දෙදෙනා අපගේ ආශ්‍රමයෙහි අභිරමණය කරන්නෙමු. එව නුඹ වැළඳැ ගන්නෙමි යි නුඹ පස්කම් සුව විඳින්නවුන් අතුරෙන් දක්ෂයෙක් වව යි අලම්බුසාව කීවා ය.

3201. පුරුෂයන් කැමැති වන්නා වූ ශරීර වර්ණයක් ඇත්තා වූ පුරුෂයන් ක්ලෙශයන් හා මිශ්‍ර කරන්නා වූ අලම්බුසා නම් ඒ අප්සරාව ඉසිසිංග තාපසයා ක්ලෙශයෙන් මිශ්‍ර කරනු කැමැත්තී මෙසේ කියා ගියා ය.

3202. තාපස තෙමේ ද සෙමින් යන ගමන අත්හැර වෙගයෙන් නික්ම ගොස් ඇය වෙතට පැමිණියේ උතුම් කෙස් වැටිය ගෙන පිරිමැද්දේ ය.

3203. ඉතා ශොභමාන වූ කල්‍යාණ දර්ශන ඇති ඕ තොමෝ පෙරළා නැවති තවුසා වැළඳගත්තී ය. එසේ වැළඳගැනීමෙන් බ්‍රහ්ම-චර්‍ය්‍යයෙන් චුත වූ කල්හි ශක්‍රයා යම්සේ සිතී ද, එය සිද්ධ වූයේ ය. එකල්හි අලම්බුසා තොමෝ ද සතුටු කරන ලද්දී ය.

3204. අලම්බුසා තොමෝ නන්දන වනයෙහි වසන්නා වූ ශක්‍රයා වෙත සිතින් පැමිණියා ය. දෙවියන්ට උතුම් වූ ශක්‍ර තෙම ඇයගේ සිතුවිල්ල දැන-

3205. ශක්‍ර තෙමේ ද, පිරිවර සහිත වූ මත්කෙහි වසන ලද ඇතිරිලි පනසක් ඇති කොඳු පලස් දහසක් අතුරන ලද්ද වූ ස්වර්ණමය පර්‍ය්‍යංකයක් එවී ය.

3206. ශොභන වූ අලම්බුසා තොමෝ ඒ මේ ඉසිසිංග තවුස්හු පුරා තුන්වර්ෂයක් ඒ පලඟෙහි ලා ළෙහි හොවා දැරුවා ය.

3207. පහවූ මත් වීම් ඇති ඒ බ්‍රාහ්මණ තෙමේ තෙවසකින් පිබිද ගිනිහල් ගෙය සමීපයෙහි නිල්වන්ව වැඩී ගිය ගස් දුටුවේ ය.

3208. තාපස තෙම කොවුලන් විසින් පවත්වන ලද නාද ඇති නවපත්‍රයෙන් සැදුම් ලත් පිපීගිය ඒ වනය හාත්පස බලා අඬමින් කඳුළු වගුරවන්නට පටන් ගත්තේ ය.

3209. යාග නො කෙළෙමි. මන්ත්‍ර ජප නො කෙළෙමි. හො-මාග්නිය නසන ලදි. පරිචර්‍ය්‍යාවෙන් කවරෙක් නම් මාගේ සිත මෙයින් පෙර පෙළඹවී ද? කියා තවුස් තෙම කැ ගසා ඇඬුවේ ය.

3210. අරණ්‍යයෙහි වසන්නා වූ මා විසින් ශ්‍රමණ තෙජසින් රැස් කරන ලද්ද වූ මහාසාගරයෙහි නොයෙක් රුවනින් පිරීගිය නැවක් මෙන් වූ මාගේ ධ්‍යාන ගුණය යමෙක් පැහැර ගත්තේ නම් හේ කවරෙක් ද යි තාපස තෙම මුරගා කී ය.

3211. අහනෙත පාරිචරියාය දෙවරාජෙන පෙසිතා,
අවධිං චිත්තං චිත්තෙන පමාද ත්වං න බුජ්ඣසි.

3212. ඉමානි කිර මං තාතො කස්සපො අනුසාසති,
කමලාසරිසිත්ථියො තායො බුජ්ඣෙසි මාණව.

3213. උරෙ ගණ්ඩායො බුජ්ඣෙසි තායො බුජ්ඣෙසි මාණව,
ඉච්චානුසාසි මං තාතො යථා මං අනුකම්පකො.

3214. තස්සාහං වචනං නාකං පිතු වුද්ධස්ස සාසනං,
අරඤ්ඤෙ නිම්මනුස්සම්හි ස්වාජ්ජ ඣායාමි එකකො.

3215. සොහං තථා කරිස්සාමි ධිරත්ථු ජීවිතෙන මෙ,
පුන වා තාදිසො හෙස්සං මරණං වා මෙ භවිස්සති.

3216 තස්ස තෙජඤ්ච වීරියඤ්ච ධිතිං ඤත්වා සුවට්ඨිතං,
සිරසා අග්ගහී පාදෙ ඉසිසිඞ්ගං අලම්බුසා.

3217. මා මෙ කුජ්ඣ මහාවීර මා මෙ කුජ්ඣ මහාඉසි,
මහා අත්ථො මයා චිණ්ණො තිදසානං යසස්සිනං
තයා පකම්පිතං[1] ආසි සබ්බං දෙවපුරං තදා.

3218. තාවතිංසා ච යෙ දෙවා තිදසානඤ්ච වාසවො,
ත්වඤ්ච භද්දෙ සුඛී හොහි ගච්ඡ කඤ්ඤෙ යථාසුඛං.

3219. තස්ස පාදෙ ගහෙත්වාන කත්වා ච නං පදක්ඛිණං,
අඤ්ජලිං පග්ගහෙත්වාන තම්හා ඨානා අපක්කමි.

3220. යො ච තස්සා ආසි පල්ලඞ්කො සොවණ්ණො සොපවාහනො,
සඋත්තරච්ඡදපඤ්ඤාසො සහස්සපටිකත්ථතො
තමෙව පල්ලඞ්කමාරුය්හ අගා දෙවාන සන්තිකෙ.

3221. තමොක්කමිව ආයන්තිං ජලන්තිං විජ්ජුතං යථා,
පතීතො සුමනො විත්තො දෙවින්දො අදදා වරං.

3222. වරං චෙ මෙ අදො සක්ක සබ්බභූතානමිස්සර,
න ඉසිපලොභිකා ගච්ඡෙ එතං සක්ක වරං වරෙති.

අලම්බුසාජාතකං.

1. සඞ්කම්පිතං

3211. පින්වත් තාපසය, ශක්‍ර දිව්‍ය රාජයා පරිචය්‍යාව පිණිස මෙහෙයන ලද මම මාගේ සිතින් නුඹගේ සිත මැඩ පැවැත්වීමි. එය නුඹ වහන්සේ ප්‍රමාදයෙන් අවබෝධ නො කළහ.

3212. මාගේ පිය වූ කාශ්‍යප තෙම මට මේ වචන කීයේ ය. මාණවකය, ලියතඹර මල් වැනි ස්ත්‍රීහු වෙත්. ඔවුන් දැනගනුව' යි කීයේ ය.

3213. අනුකම්පා ඇත්තකු සේ මට මාගේ පිය වූ කාශ්‍යප තෙම අවවාද දෙනුයේ, මාණවකය, ළයෙහි මස්ගඩු දෙකක් ඇති ස්ත්‍රීන් දැන ගනුව. ඒ ස්ත්‍රීහු තමන් වසඟයට පැමිණියවුන් නසති යි දැනගනුව යි මෙසේ කීයේ ය.

3214. වයොවෘද්ධ වූ ඒ පියාගේ අනුශාසනය මම නො පිළිපැද්දෙමි. මනුෂ්‍යයන් විරහිත වනයෙහි ඒ මම අද එකලා වැ වැලපෙමි යි තවුසා කීයේ ය.

3215. ඒ මම එසේ කරන්නෙමි. මාගේ ජීවිතයට නින්ද වේවා, නොහොත් මාගේ ජීවිතයෙන් ඇති ඵලය කුමක් ද? නැවත හෝ එබන්දෙක් වන්නෙමි. (නැතිව ගිය ධ්‍යාන ලබා ගන්නෙමි) නො එසේ නම් මාගේ මරණය හෝ වන්නේ යැ යි තාපසයා නැවතත් අධිෂ්ඨාන කර ගත්තේ ය.

3216. ඒ ඉසිසිංග තාපසයා නැවත මනාව වඩන ලද තෙජසත් වීය‍්‍යීයත් උත්සාහයත් දැන අලම්බුසාව ඉසිසිංග තාපසයාගේ පාළඟ හිසින් වැටී දෙපා වැඳ කමා කරවා ගත්තා ය.

3217. මහාවීරයන් වහන්ස, මට නො කිපෙනු මැන. මහර්ෂිය, මට නො කිපෙනු මැන. පිරිවර ඇත්තා වූ තාවතිංස දෙවියනට මා විසින් මහත් වැඩක් කරන ලදී. එකල්හි මුළු දෙව්පුරය නුඹ වහන්සේ විසින් වෙසෙසින් කම්පා කරන ලද්දේ ය.

3218. තව්තිසා වැසි යම් දෙවි කෙනෙක් වේ නම් ඔහු ද දෙව්ලෝ වැස්සන්ට අධිපති වූ ශක්‍රයාත් යන මොහු සුවපත් වෙත්වා සොඳුර නී ද සුවපත් වව. කන්‍යාවෙනි සුවසේ යව.

3219. අලම්බුසාව උන් වහන්සේගේ පා අල්ලා වැඳ ප්‍රදක්ෂිණා කොට ඇඳිලි බැඳ එතැනින් බැහැර වූවා ය.

3920. පිරිවර සහිත වූ මත්තෙහි වසනලද ඇතිරිලි පනසක් ඇති කොඳුපලස් දහසක් අසුරන ලද්ද වූ ඇගේ ස්වර්ණමය යම් පය‍්‍යීංකයක් වී ද එම පය‍්‍යීංකයට ම නැඟ දෙවියන් වෙත ඕ ගියා ය.

3221. බබළන්නා වූ උල්කාව යම්සේ ද, විදුලිය යම්සේ ද, එසේ එන්නා වූ ඇය දැක ප්‍රීතිමත් වූ සතුටු සිත් ඇති ශක්‍ර තෙමේ වරයක් දුන්නේ ය.

3222. සියලු භූතයන්ට අධිපති වූ ශක්‍ර දෙවෙන්ද්‍රය, ඉදින් තෙපි මට වරයක් දෙවූ නම් සෘෂීන් පෙළඹවීමට නො යන්නෙමි යන තෙල වරය ඉල්ලමි යි අලම්බුසාව කීවා ය.

අලම්බුසා ජාතක යි.

4. සඞ්ඛපාලජාතකං

3223. අරියාවකාසොසි පසන්නනෙත්තො
මඤ්ඤෙ භවං පබ්බජිතො කුලම්හා,
කථන්නු විත්තානි පහාය භොගෙ
පබ්බජි[1] නික්ඛම්ම ඝරා සපඤ්ඤ.

3224. සයං විමානං නරදෙව දිස්වා
මහානුභාවස්ස මහොරගස්ස,
දිස්වාන පුඤ්ඤාන මහාවිපාකං
සද්ධායහං පබ්බජිතොම්හි රාජ.

3225. න කාමකාමා න භයා න දොසා
වාචං මුසා පබ්බජිතා භණන්ති,
අක්ඛාහි මෙ පුච්ඡිතො එතමත්ථං
සුත්වාන මෙ ජායිහිතිප්පසාදො.

3226. වාණිජ්ජ රට්ඨාධිප ගච්ඡමානො
පථෙ අද්දසාසිම්හි මිලාචපුත්තෙ,
පවඩ්ඪකායං උරගං මහන්තං
ආදය ගච්ඡන්තෙ පමොදමානෙ.

3227. සොහං සමාගම්ම ජනින්ද තෙහි
සංහට්ඨලොමො අවචම්හි[2] භීතො,
කුහිං අයං නීයති භීම[3]කායො
නාගෙන කිං කාහථ භොජපුත්තා.

3228. නාගො අයං නීයති භොජනත්ථං
පවඩ්ඪකායො උරගො මහන්තො,
සාදුඤ්ච ථූලඤ්ච මුදුඤ්ච මංසං
න ත්වං රසඤ්ඤාසි විදෙහපුත්ත.

3229. ඉතො මයං ගන්ත්වා සකං නිකෙතං
ආදය සත්ථානි විකොපයිත්වා,
මංසානි භොක්ඛාම පමොදමානා
මයං හි වෙ සත්තවො පන්නගානං.

3230. සචෙ අයං නීයති භොජනත්ථං
පවඩ්ඪකායො උරගො මහන්තො,
දදාමි වො බලිවද්දානි[4] සොළස
නාගං ඉමං මුඤ්චථ බන්ධනස්මා.

1. පබ්බජි - වි. මජසං.
2. අවචම්හි - මජසං. සයා.
3. භිමා - මජසං.
4. බලිබද්දානි - මජසං.

4. සඞ්ඛපාල ජාතකය

3223. නුඹ වහන්සේ මනා රූ ඇති සේක්, ප්‍රසන්න වූ ඇස් ඇත්තහු ය. පින්වතා ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ දෙකුලයෙන් හෝ සිටු කුලයෙන් හෝ නික්ම පැවිදි වූහ යි සිතමි. ප්‍රඥාවන්තය, භොග සම්පත් හා ධනය හැරදමා ගිහි ගෙයින් නික්ම කුමක් අරමුණු කොට පැවිදි වූ සේක් ද?

3224. නරදෙව වූ මහරජ, මහත් අනුභාව ඇති මහොරගයාගේ විමානය දැක එසේ ම පුණ්‍යයන්ගේ මහත් විපාක දැක මම කර්මයත් කර්මවිපාකයත් පරලොවත් යන මේවා ගැන සැදැහැයෙන් තෙමේ පැවිදි වීමි.

3225. කැමති දෑ ලැබගැනුමේ කැමැත්තෙන් ද භයින් ද ද්වෙෂයෙන් ද පැවිද්දෝ බොරු බස් නො කියත්. විචාරන ලද්දේ මට මේ කරුණ කියනු මැනවි. එය අසා මාගේ ප්‍රසාදය හටගන්නේ ය.

3226. මහරජ, වෙළඳාම පිණිස යන්නා වූ මම මහාමාර්ගයෙහි අතිශයින් වැඩුණා වූ ශරීරයක් ඇති මහානාගයකු තඩලාගෙන සතුටු සිතින් යන්නා වූ වැදි පුත්‍රයන් දුටුවෙමි.

3227. මහරජ, ඒ මම ඔවුන් හා එක්වූයෙමි. අතිශයින් ලොමු දහගත්තෙමි බිය වූයෙමි මෙසේ කීමි. වැදි පුත්‍රවරුනි, බිහිසුණු ශරීරයක් ඇති මේ නාගයා කොහි ගෙනයනු ලබයි ද? නාගයාගෙන් කවරක් කරන්නහුද යි ඇසීමි.

3228. විශෙෂයෙන් වැඩුණු ශරීරයක් ඇති බඩගා යන්නා වූ මේ මහානාග තෙම භොජනය පිණිස ගෙනයනු ලබයි. වෛදෙහ පුත්‍රය, මොහුගේ මාංශය මිහිරි ද මහත් ද මෘදු ද වන්නේ ය. නුඹ ඒ රසය නොදන්නෙහි ය.

3229. අපි මෙයින් සිය ගෙදරට ගොස් ආයුධ ගෙන කඩ කඩ කොට කපා සතුටු සිත් ඇත්තෝ ව මස් අනුභව කරන්නෙමු. අපි වනාහි එකාන්තයෙන් ම සර්පයන්ගේ සතුරෝ වෙමු.

3230. විශෙෂයෙන් වැඩුණා වූ ශරීර ඇති බඩගා යන්නා වූ මේ මහානාගයා ඉදින් භොජනය පිණිස ගෙනයනු ලබන්නේ නම් මම තොපට ගවයන් සොළසක් දෙමි. මේ නාගයා බැම්මෙන් මුදනු මැනවි.

3231. අද්ධා හි නො භක්ඛො අයං මනාපො
බහූ ච නො උරගා භුත්තපුබ්බා,
කරොම තෙ තං වචනං අළාර
මිත්තඤ්ච නො හොහි විදෙහපුත්ත.

3232. තදස්සු තෙ බන්ධනා මොචයිංසු
යං නත්ථුතො පටිමොක්ඛස්ස පාසෙ,
මුත්තො ච සො බන්ධනා නාගරාජා
පක්කාමි පාචීනමුඛො මුහුත්තං.

3233. ගන්ත්වාන පාචීනමුඛො මුහුත්තං
පුණ්ණෙහි නෙත්තෙහි පලොකයී මං,
තදස්සහං පිට්ඨිතො අන්වගච්ඡිං
දසඞ්ගුලිං අඤ්ජලිං පග්ගහෙත්වා.

3234. ගච්ඡෙව ඛො ත්වං තරමානරූපො
මා තං අමිත්තා පුනරග්ගහෙසුං,
දුක්ඛො හි ලුද්දෙහි පුනා සමාගමො
අදස්සනං භොජපුත්තාන ගච්ඡ.

3235. අගමාසි සො රහදං විප්පසන්නං
නීලොභාසං රමණීයං සුතිත්ථං,
සමොතතං ජම්බුහි වෙතසාහි
පාවෙක්ඛි නිත්තිණ්ණභයො පතීතො.

3236. සො තං පවිස්ස න චිරස්ස නාගො
දිබ්බෙන මෙ පාතුරහූ ජනින්ද,
උපට්ඨහි මං පිතරං ව පුත්තො
හදයඞ්ගමං කණ්ණසුඛං භණන්තො.

3237. ත්වංමෙසි මාතා ච පිතා අළාර
අබ්භන්තරො පාණදදෙ සහායො,
සකඤ්ච ඉද්ධිං පටිලාභිතොස්මි
අළාර පස්ස මෙ නිවෙසනානි
පහූතභක්ඛං බහු අන්නපානං
මසක්කසාරං විය වාසවස්ස.

3238. තං භූමිභාගෙහි උපෙතරූපං
අසක්ඛරා චෙව මුදූ සුභා ච,
නීචත්තිණා අප්පරජා ච භූමි
පාසාදිකා යත්ථ ජහන්ති සොකං.

3239. අනාවකුලා වෙළුරියූපනීලා
චාතුද්දිසං අම්බවනං සුරම්මං,
පක්කා ච පෙසී ච ඵලා සුඵුල්ලා
නිච්චොතුකා ධාරයන්ති ඵලානි

3231. එකාන්තයෙන් ම මේ තෙම අපගේ සිත් පිනවන්නා වූ ආහාරය වේ. අප විසින් බොහෝ නාගයෝ කන ලද්දෝ ය. විදෙහ පුත්‍ර වූ ආළාරය, නුඹගේ ඒ වචනය කරමු. නුඹ අපගේ මිත්‍රයා ද වෙහි ය.

3232. මහරජ, එකල්හි නාසයෙන් විද ගසන ලද යම් බන්ධනයෝ වූවාහු නම් ඔවුහු ඒ බන්ධනවලින් නාගයා මුද හැරියාහ. බැඳුම්වලින් මිදුණු නාගරාජ තෙමේ නැගෙනහිරට අභිමුඛ ව මොහොතක් ගියේ ය.

3233. පෙරදිගට අභිමුඛව මොහොතක් කල් ගොස් කඳුළු පිරුණු නෙත් වලින් මා දෙස බැලුවේ ය. මම දසැඟිලි එකට තබා ඇඳිලි බැඳ (නයාගේ) පිටු පසින් ගියෙමි.

3234. නුඹ ඉක්මන් කොට යව, නැවත සතුරෝ නො අල්වා ගනිත්වා නැවත වැද්දන් හා එක්වීම යම් හෙයෙකින් දුක් වන්නේ ද, එහෙයින් වැදි පුත්‍රයන්ගේ නො දක්මට (වැදි පුත්‍රයන්ට දැකිය නොහැකි තැනකට) යව.

3235. වෙසෙසින් පහන් වූ නිල් පැහැයෙන් යුතු සිත්කලු වූ මනා කොට ඇති දඹගස්වලින් හා හොමුවගවලින් ගැවසී ගත්තා වූ විලට තුටුසිත් ඇති එතෙර කළ බිය ඇති ඒ නාගරාජයා ගියේ ය.

3236. මහරජ, ඒ නාග තෙම විලට ඇතුළු වී නොබෝ වෙලාවකින් දිව්‍ය වෙශයෙන් මා ඉදිරියෙහි පහළ විය. පියකු ඉදිරියෙහි පුත්‍රයකු මෙන් හෘදයංගම වූ කනට සුව ගෙන දෙන්නා වූ මිහිරි වචන බෙණෙමින් මා වෙත එළඹියේ ය.

3237. පින්වත් ආළාරය, නුඹ මගේ මව ද වෙහි. පියා ද වෙහි ය. අභ්‍යන්තර වූ ප්‍රාණ දනය කරන යහළුවා ද වෙහි ය. සිය සෘද්ධිය ද නැවත ලබා දෙන ලද්දෙම් වෙමි. ආළාරය, බොහෝ කැයුතු ද ඇති ආහාර පානයෙන් නො අඩු ශක්‍රයාගේ දිව්‍ය පුරය වැනි මාගේ නිවාස සථානයන් බලවයි, නාගරාජ තෙම කීයේ ය.

3238. මහරජ, යම් තැනෙක්හි පැමිණියවුන්ගේ ශොකය දුරු කෙරේ ද ඒ නාග භවනයෙහි බිම වනාහි කැට කැබලිති රහිත වූ මෘදු වූ රන් රිදී මැණික්මය වූ සත්රුවන් වැලියෙන් යුත් ඉඳු ගොව්වන්ගේ පිට සමාන වර්ණ ඇති නීච තෘණයෙන් ගැවසී ගත් පසින් තොර වූවකි. නාගවිමානය ඒ බිම් කොටසින් යුතු ය.

3239. එහි සමව පිහිටියා වූ භූමිය වේ. වෛඩූර්‍ය්‍ය බඳු නිල් පැහැ ඇති පොකුණක් වේ. එහි සිව් දිග්හි ඉතා රම්‍ය වූ අඹ වනය වේ. එහි පැසුණා වූ ද තරුණ වූ ද ඵල හට ගත් අඹගස් වේ. ඒ අඹ ගස් හැම සෘතුයෙහි ම මල් ඵල දරන්නේ ය.

3240. තෙසං වනානං නරදෙව මජ්ඣෙ
නිවෙසනං භස්සරසන්නිකාසං,
රජතග්ගළං සොණ්ණමයං උළාරං
පභාසති විජ්ජුරිවන්තලික්ඛෙ.

3241. මණීමයා සොවණ්ණමයා උළාරා
අනෙකචිත්තා සතතං සුනිම්මිතා,
පරිපූරා කඤ්ඤාහි අලඞ්කතාහි
සොවණ්ණකායූරධරාහි රාජ.

3242. සො සඞ්ඛපාලො තරමානරූපො
පාසාදමාරුය්හ අනොමවණ්ණො,
සහස්සථම්භං අතුලානුභාවං
යත්ථස්ස භරියා මහෙසී අහොසි.

3243. එකා ච නාරී තරමානරූපා
ආදාය වෙළුරියමයං මහග්ඝං,
සුභං මණිං ජාතිමන්තූපපන්නං
අචොදිතා ආසනමබ්භිහාසි.

3244. තතො මං උරගො හත්ථෙ ගහෙත්වා
නිසීදයී පමුඛමාසනස්මිං,
ඉදමාසනං අත්‍ර භවං නිසීදතු
භවඤ්හි මෙ අඤ්ඤතරො ගරූනං.

3245. අඤ්ඤා ච නාරී තරමානරූපා
ආදාය වාරිං උපසඞ්කමිත්වා,
පාදානි පක්ඛාලයි මෙ ජනින්ද
භරියාව භත්තු පතිනො පියස්ස.

3246. අපරා ච නාරී තරමානරූපා
පග්ගය්හ සොවණ්ණමයාය පාතියා,
අනෙකසූපං විවිධං වියඤ්ජනං
උපනාමයි භත්ත මනුඤ්ඤරූපං.

3247. තුරියෙහි මං භාරත භුත්තවන්තං
උපට්ඨහුං භත්තු මනො විදිත්වා,
තතුත්තරිං මං නිපතී මහන්තං
දිබ්බෙහි කාමෙහි අනප්පකෙහි.

3248. භරියා මමෙතා තිසතා අළාර
සබ්බත්තමජ්ඣා පදුමුත්තරාභා,
ආළාර එතාසු තෙ කාමකාරො
දදාමි තෙ තා පරිචාරයස්සු.

3240. නරදෙව වූ රජුනි, ඒ වනමැද බබළන්නා වූ රිදීමය දෙර කවුළු ඇති ස්වර්ණමය මහාප්‍රාසාදය අහස්හි විදුලිය සේ බබළන්නේ ය.

3241. මහරජ, එහි මිණිමුවා වූ ද රන්මුවා වූ ද නොයෙක් විසිතුරු සැරසිල්ලෙන් ගැවසීගත්තා වූ නිතරම මනාකොට නිර්මාණය කරන ලද්ද වූ කුළු ගෙවල් හා ගබඩා ගෙවල් ඇත. ස්වර්ණමය වළලු දරන්නා වූ අලංකෘත නාගකන්‍යාවන්ගෙන් සම්පූර්ණ ය.

3242. ඒ සංඛපාල තෙම අතුල්‍ය වර්ණ ඇත්තේ ඉක්මන් ස්වභාව ඇත්තේ දහසක් කණු ඇති නො සම වූ අනුභාව ඇති පහයට නැඟ යම් තැනෙක්හි ඔහුගේ භාර්‍ය්‍යාව වූවා ද, මා අතින් ගෙන එහි පැමිණ වූයේ ය.

3243. එකල්හි නො මෙහෙයන ලද එක් ස්ත්‍රියක් ඉක්මන් ස්වභාව ඇත්තී මාහැඟි ජාතිමත් මැණික් වලින් යුත් වෛඩූර්‍ය්‍යමය වූ යහපත් මැණික් ආසනයක් එළවූහ.

3244. ඉක්බිති නාග තෙමේ මා අත ගෙන ඉදිරි අසුනෙහි හිඳුවී. 'මේ ආසනයයි' පින්වත් තෙමේ මෙහි ඉඳ ගනීවා, පින්වත් තෙමේ මගේ මවුපියන් අතුරෙන් කෙනෙකි' යි කීයේ ය.

3245. මහරජ, අන් ස්ත්‍රියක් ඉක්මන් ස්වභාව ඇත්තී දිය ගෙන මා වෙත එළඹ ප්‍රිය ස්වාමිපුරුෂයක්හුගේ පා දෙවනා භාර්‍ය්‍යාවක මෙන් මගේ පා සේදුවා ය.

3246. තවත් ස්ත්‍රියක් ඉක්මන් ස්වභාව ඇත්තී ස්වර්ණමය තලියකින් නොයෙක් සූප ව්‍යඤ්ජනයෙන් යුත් මනොඥ වූ බත් එළවූවා ය.

3247. භාරත දෙශාධිපති වූ රජුනි, ආහාර අනුභවකළා වූ මට ඒ දිව්‍ය කන්‍යාවෝ ස්වාමිපුරුෂයාගේ සිත දැනගෙන නොයෙක් තූර්‍ය්‍ය වාද්‍යයෙන් උපස්ථාන කළාහු ය. ඉන්පසු නාරජ තෙම මහත් වූ දිව්‍යමය කාමසම්පත්තියෙන් යුක්ත ව මා වෙතට පැමිණියේ ය.

3248. පින්වත් ආළාරය, මාගේ මේ තුන්සියයක් භාර්‍ය්‍යාවෝ සියල්ලෝ තනුමධ්‍ය ප්‍රදෙශ ඇත්තාහ. පියුම් බඳු වර්ණ ඇති සමින් යුක්තයහ. ආළාරය, මේ ස්ත්‍රීන් කෙරෙහි තොපට කැමැත්තක් කරව. තොපට දෙමි. ඒ ස්ත්‍රීන් තොපගේ පාදපරිචාරිකාවන් කරගනුව.

3249. සංවච්ඡරං දිබ්බරසානුභුත්වා
තදස්සහං උත්තරිං පච්චභාසිං,
නාගස්සිදං කින්ති කථඤ්ච ලද්ධං
කථජ්ඣගමාසි විමානසෙට්ඨං.

3250. අධිච්චලද්ධං පරිණාමජන්තෙ
සයං කතං උදාහු දෙවෙහි දින්නං,
පුච්ඡාමි තං නාගරාජෙ තමත්ථං
කථජ්ඣගමාසි විමානසෙට්ඨං.

3251. නාධිච්චලද්ධං න පරිණාමජං මෙ
න සයං කතං නපි දෙවෙහි දින්නං,
සකෙහි කම්මෙහි අපාපකෙහි
පුඤ්ඤෙහි මෙ ලද්ධමිදං විමානං.

3252. කින්තෙ වතං කිං පන බ්‍රහ්මචරියං
කිස්ස සුචිණ්ණස්ස අයං විපාකො,
අක්ඛාහි මෙ නාගරාජෙතමත්ථං
කථන්නු තෙ ලද්ධමිදං විමානං.

3253. රාජා අහොසිං මගධානමිස්සරො
දුය්‍යොධනො නාම මහානුභාවො,
සො ඉත්තරං ජීවිතං සංවිදිත්වා
අසස්සතං විපරිණාමධම්මං.

3254. අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තො
සක්කච්ච දානං විපුලං අදාසිං
ඔපානභූතං මෙ ඝරං තදාසි
සන්තප්පිතා සමණබ්‍රාහ්මණා ච.

3255. මාලඤ්ච ගන්ධඤ්ච විලෙපනඤ්ච
පදීපියං යානමුපස්සයඤ්ච,
අච්ඡාදනං සයනමන්නපානං
සක්කච්ච දානානි අදම්හ තත්ථ.

3256. තං මෙ වතං තං පන බ්‍රහ්මචරියං
තස්ස සුචිණ්ණස්ස අයං විපාකො,
තෙනෙව මෙ ලද්ධමිදං විමානං
පහූතභක්ඛං බහුඅන්නපානං
නච්චෙහි ගීතෙහි චූපෙතරූපං
චිරට්ඨිතිකං න ච සස්සතායං.

3257. අප්පානුභාවා තං මහානුභාවං
තෙජස්සිනං හනති අතෙජවන්තො,
කිමෙව දාඨාවුධ කිං පටිච්ච
හත්ථත්ථ[1]මාගඤ්ඡි වණිබ්බකානං.

1. හත්ථට්ඨ-මජසං.

3249. මහරජ, වර්ෂයක් දිව්‍ය පංචකාමරසයන් අනුභව කොට ඒ නාරජුට මෙසේ කීමි. නාගයාගේ මේ සම්පත් කිනම් කර්‍මයක් කොට කෙසේ ලබන ලද්දේ ද? මේ ශ්‍රෙෂ්ඨ වූ විමානය කෙසේ ලබන ලද්දේ ද?

3250. නාග රාජය, නුඹ විසින් මේ විමානය හෙතුවක් නැතිව ලබන ලද්දේ ද? යම් කිසිවකු විසින් පිරිනමන ලද්දක් ද? තමා විසින් කරන ලද්දක් ද? නැතහොත් දෙවියන් විසින් දෙන ලද්දක් ද? නාග රාජය, මේ කාරණය නුඹ අතින් විචාරමි.

3251. මෙය හෙතුවක් නැති ව ලබන ලද්දක් නො වේ. යම් කිසිවකු විසින් මට පිරිනමන ලද්දක් ද නො වේ. තමන් විසින් කරන ලද්දක් ද නො වේ. දෙවියන් විසිනුදු දෙන ලද්දක් නො වේ. අලාමක වූ සිය කුශල කර්මයන්ගෙන් මේ විමානය මා විසින් ලබන ලදී.

3252. නුඹගේ ව්‍රතය කුමක් ද? කවර බ්‍රහ්මචර්‍ය්‍යයක් රැක්කෙහි ද? මනාව පුරුදු කරන ලද කිනම් කර්මයක්හුගේ මේ විපාක ද? නාග රාජය මේ කාරණය මට කියනු මැනවි. මේ විමානය නුඹ විසින් කෙසේ නම් ලබන ලද්දේ ද?

3253. ආළාරය, මම මගධෙශ්වර වූ දුයෙර්‍ය්‍යාධන නම් මහානුභාව සම්පන්න රජෙක් වීමි. ඒ මම ජීවිතය ස්වල්පය බොහෝ කල් නො පවත්නේ ය. පෙරළෙන ස්වභාවයට පත් වන්නේ යයි මනාව දැන–

3254. පහන් සිත් ඇත්තෙම් මහත් වූ ආහාර පාන සකසා දුන්නෙමි. එකල්හි මාගේ ගෙදොර පැන් පොකුණක් බඳු විය. මහණ බමුණෝ මා විසින් සන්තර්පණය කරන ලද්දෝ ය.

3255. එහි දී මල් ගඳ විලවුන් ද පහන් සහ යානයන් ද ගෙවල් සහ වස්ත්‍ර ද සයනාසන සහ ආහාර පාන ද සකස් කොට දන් දුනිමි.

3256. එය මාගේ ව්‍රත සමාදනය වේ. එය මාගේ බ්‍රහ්මචර්‍ය්‍යය වේ. මනාව පුරුදු කරන ලද ඒ කර්මයාගේ මේ විපාක යි. එයින් ම බොහෝ කැයුතු දෙයක් බොහෝ ආහාර පානත් නෘත්‍ය ගීතයන් ගෙන් යුත් චිරස්ථායී මේ විමානයක් මා විසින් ලබන ලද. මෙය ද සදතන නො වේ යයි නාරජ කීයේ ය.

3257. දළ ම ආයුධ කොට ඇති නාගරාජය, මඳ අනුභාවයක් ඇත්තා වූ තෙජස් විරහිත ඒ වැදි පුත්‍රයෝ මහත් අනුභාව ඇති මහත් තෙජස් ඇති නුඹට කුමක් හෙයින් හිංසා කළාහු ද? කුමක් හෙයින් වැද්දන්ගේ අතට අසුවූයෙහි ද?

3258. භයන්නු තෙ අන්වගතං මහන්තං
තෙජොනු තෙ නාන්වගං දන්තමූලං,
කිමෙව දාඨාවුධ කිං පටිච්ච
කිලෙසමාපජ්ජි වණිබ්බකානං.

3259. න මෙ භයං අන්වගතං මහන්තං
තෙජො න සක්කා මම තෙහි හන්තුං,
සතඤ්ච ධම්මානි සුකිත්තිතානි
සමුද්දවෙලාව දුරච්චයානි.

3260. චාතුද්දසිං පඤ්චදසිං ච’ළාර[1]
උපොසථං නිච්චමුපාවසාමි,
අථාගමුං සොළස භොජපුත්තා
රජ්ජුං ගහෙත්වාන දළ්හඤ්ච පාසං.

3261. භෙත්වාන නාසං අතිකස්ස රජ්ජුං
නයිංසු මං සම්පරිගය්හ ලුද්දා,
එතාදිසං දුක්ඛමහං තිතික්ඛං
උපොසථං අප්පටිකොපයන්තො.

3262. එකායනෙ තං පථෙ අද්දසංසු
බලෙන වණ්ණෙන චු’පෙතරූපං[2],
සිරියා ච පඤ්ඤාය ච භාවිතොසි
කිමත්ථියං නාග තපො කරොසි.

3263. න පුත්තහෙතු න ධනස්ස හෙතු
න ආයුනො චාපි අළාර හෙතු,
මනුස්සයොනිං අභිපත්ථයානො
තස්මා පරක්කම්ම තපො කරොමි.

3264. ත්වං ලොහිතක්ඛො විහතන්තරංසො
අලඞ්කතො කප්පිතකෙසමස්සු,
සුරොසිතො ලොහිතචන්දනෙන
ගන්ධබ්බරාජාව දිසා පභාසසි.

3265. දෙවිද්ධිපත්තොසි මහානුභාවො
සබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතො,
පුච්ඡාමි තං නාගරාජෙතමත්ථං
සෙය්‍යො ඉතො කෙන මනුස්සලොකො.

---

1. අළාර – මජසං.
2. උපෙත – වි. මජසං.

3258. දළ ආයුධ කොට ඇති නාගරාජය, කිම ඔවුහු නුඹගේ තෙජස් දැක බිය නො වූහු ද? නුඹගේ විෂ දත්මුල් අනුව නො ගියේ ද? කුමක් නිසා වණිබ්බකයන්ගෙන් වෙහෙසට පත්වීදැයි? ඇසීය.

3259. මාගේ මහත් තෙජස දැක ඔවුහු බිය නො වූහ. මාගේ තෙජස ඔවුන් විසින් නසන්නට නො පිළිවන. එහෙත් බුද්ධාදි සත්පුරුෂයන් විසින් මනාකොට ප්‍රකාශ කරන ලද්ද වූ ධර්මයෝ මා විසින් මුහුදු වෙරළ මෙන් නො ඉක්මවාලිය හැක්කාහු වෙති.

3260. ආළාරය, තුදුස්වක්හි ද, පසළොස්වක්හි ද නිතර පෙහෙ වස් සමාදන්ව වසමි. එවිට වැදිපුත්‍රයෝ සොළොස් දෙනෙක් දැඩි මළපුඩුවක් හා රැහැනක් ගෙන එහි එළඹුණාහ.

3261. ඒ වැදිපුත්‍රයෝ මාගේ නාසය විද රැහැනකින් බැඳ මා තඩා ලාගෙන ගියාහු ය. මා සමාදන්ව ගත් පෙහෙවස කොපනය නො කරමින් මම මෙතරම් දුකක් ඉවසුවෙමි.

3262. බලයෙන් ද වර්ණයෙන් ද යුත් තොප එකපදික මාර්ගයෙහි දී ඒ වැද්දෝ දුටුවෝ ය. තෙපි වනාහි ඓශ්වර්‍ය්‍යයෙන් හා ප්‍රඥායෙන් වැඩුණාහුය. නාගය, එසේ තිබියදී කුමක් බලාපො-රොත්තුවෙන් තපස් කරහු ද? යි ඇසුවේ ය.

3263. ආළාරය, පුත්‍රයන් හෙතුකොට ගෙන නොවේ. ධනය හෙතුකොට ගෙන ද නොවේ. ආයුෂ හෙතු කොට ගෙන ද නොවේ. මිනිස් උපත පතන්නෙමි. එහෙයින් උත්සාහ දරා තපස් රකිමි යි කීයේ ය.

3264. නාගරාජය, නුඹ ලේවන් ඇස් ඇත්තෙහි ය. නට අන්තරංස (පෙළුණු පපුවක්) ඇත්තෙහි ය. අලංකාර වූයෙහි කපන ලද කෙස් රවුළු ඇත්තෙහි ය. රත් සඳුන් විලවුන් ගල්වන ලද්දෙහි ගන්ධර්වරාජයා මෙන් දිශාවන් බබුළුවහි.

3265. සියලු කාමසම්පත්තීන් යුක්ත වූවෙහි ය. මහත් අනුභාව ඇත්තෙහි දිව්‍යමය සෘද්ධියට පැමිණියේ වෙහි ය. නාග රාජය, නුඹ අතින් මේ කරුණ විචාරමි. මේ නාගභවනයට වඩා මනුෂ්‍යලොකය ශ්‍රෙෂ්ඨ වන්නේ කවර කරුණකින් ද?

3266. ආළාර නාඤ්ඤත්‍ර මනුස්සලොකා
සුද්ධි වා සංවිජ්ජති සඤ්ඤමො වා,
අහඤ්ච ලද්ධාන මනුස්සයොනිං
කාහාමි ජාතිමරණස්ස අන්තං.

3267. සංවච්ඡරො මෙ උසිතො[1] තවන්තිකෙ
අන්නෙන පානෙන උපට්ඨිතොස්මි,
ආමන්තයිත්වාන පලෙමි නාග
චිරප්පවුත්ථොස්මි[2] අහං ජනින්ද.

3268. පුත්තා ච දරා ච 'නුජීවිනො ච
නිච්චානුසිට්ඨා[3] උපතිට්ඨතෙ තං,
කච්චින්නු තෙ නාභිසංසිත්ථ කොචි
පියඤ්හි මෙ දස්සනං තුය්හාළාර.[4]

3269. යථාපි මාතු ච පිතු අගාරෙ
පුත්තො පියො පටිවිහිතො වසෙය්‍ය,
තතොපි මය්හං ඉධ මෙව සෙය්‍යො
චිත්තං හි තෙ නාග මයි පසන්නං.

3270. මණී මමං විජ්ජති ලොහිතඞ්කො
ධනාහරො මණිරතනං උළාරං,
ආදාය තං ගච්ඡ සකං නිකෙතං
ලද්ධා ධනං තං මණිමොස්සජස්සු.

3271. දිට්ඨා මයා මානුසිකාපි කාමා
අසස්සතා විපරිණාමධම්මා,[5]
ආදීනවං කාමගුණෙසු දිස්වා
සද්ධායහං පබ්බජිතොම්හි රාජ.

3272. දුමප්ඵලානෙව පතන්ති මාණවා
දහරා ච වුද්ධා ච සරීරභෙදා,
එතම්පි දිස්වා පබ්බජිතොම්හි රාජ.
අපණ්ණකං සාමඤ්ඤමෙව සෙය්‍යො.

3273. අද්ධා හවෙ සෙවිතබ්බා සපඤ්ඤා
බහුස්සුතා යෙ බහුඨානචින්තිනො,
නාගඤ්ච සුත්වාන තවඤ්චළාර
කාහාමි පුඤ්ඤානි අනප්පකානි.

---

1. වුසිතො – මජසං.
2. වුත්ථො අස්මි – මජසං. වුත්ථොස්මි – සයා.
3. අනිච්චානුසිට්ඨා උපතිට්ඨතෙ තෙ – මජසං.
4. තුය්හං අළාර – මජසං.
5. විප්පරිණාම – මජසං.

3266. ආළාරය, මාර්ග ඵල නිර්වාණ සංඛ්‍යාත ශුද්ධිය හෝ ශීල සංයමය හෝ මිනිස් ලොවින් වෙන්ව විද්‍යමාන නො වන්නේ ය. මම ද මිනිස් උපත ලැබ ජාති මරණයන්ගේ අවසානය කරන්නෙමි.

3267. නුඹ සමීපයෙහි මම වර්ෂයක් විසීමි. ආහාර පානයෙන් මම උපස්ථාන ලද්දෙම් ද වෙමි. නාගය, නුඹට කියා යමි. නාග රාජය, මම බොහෝ කලක් වාසය කෙළෙමි යි කීයේ ය.

3268. ආළාරය, මාගේ පුත්‍රයෝ ද අඹුවෝ ද අනුව ජීවත් වන්නෝ ද නිතර අනුශාසනා කරන ලද්දහු නුඹට උපස්ථාන කිරීමට පැමිණ සිටින්නාහ. කිම, ඔවුනතර කිසිවෙක් නුඹට අසතුටක් කෙළේ ද? නුඹගේ දැක්ම මට ප්‍රිය යයි නාරජ කීයේ ය.

3269. මවුපියන්ගේ ගෙහි පුත්‍රයෙක් යම්සේ පොෂණය කරන ලද්දේ වාසය කෙරේ ද, එයටත් වඩා මට මෙහි ම ශ්‍රෙෂ්ඨය. නාගය, තොපගේ සිත යම් හෙයෙකින් මා කෙරෙහි ප්‍රසන්න ද එහෙයිනි.

3270. යහළු ආළාරය, ධනය ලැබ ගන්නට පිළිවන් වන්නාවූ ලොහිතංක නම් මාණික්‍යයක් මාගේ ඇත. ඒ මහත් වූ මාණික්‍යය ගෙන සිය නිවසට යව. එයින් ධනය ලබාගෙන මා වෙතට ම පමුණුවනු මැනවි.

3271. මහරජ, මා විසින් මිනිසුන් අයත් වූ ද දෙවියන් අයත් වූ ද කාමසම්පත්තිහු දක්නා ලද්දහ. ඒ කාමයෝ අශාස්වතයහ. පෙරළෙන ස්වභාව ඇත්තෝ ය. කාමසම්පත්හි ආදීනව දැක මම සැදැහැයෙන් පැවිදි වූයෙමි.

3272. මහරජ, ගස්වල පැසුණු නො පැසුණු ගෙඩි මෙන් ළදරු වූ ද තරුණ වූ ද මහලු වූ ද යන සියල්ලෝ ම ශරීර භෙදයෙන් වැටෙන්නාහ. මෙය ද දැක පැවිදි වීමි. නෛර්‍යාණික වූ මහණකම වනාහි ශ්‍රෙෂ්ඨ වේ.

3273. ආළාර නම් තාපසය, යම් කෙනෙක් බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තාහු බොහෝ කරුණු සිතන්නෝ වෙද් ද, නුවණැති ඔවුහු එකාන්තයෙන් ම සේවනය කළ යුත්තෝ වෙති යි රජ තෙම කීයේ ය.

3274. අද්ධා හවෙ සෙවිතබ්බා සපඤ්ඤා
බහුස්සුතා යෙ බහුඨානචින්තිනො,
නාගඤ්ච සුත්වාන මමඤ්ච රාජ
කරොහි පුඤ්ඤානි අනප්පකානීති.

සඞ්ඛපාල ජාතකං.

5. චුල්ලසුතසොමජාතකං

3275. ආමන්තයාමි නිගමං
මිත්තාමච්චෙ පාරිසජ්ජෙ ච[1],
සිරස්මිං පලිතං ජාතං
පබ්බජ්ජං දානි රොච'හං.

3276. අභුං මෙ කථන්නු භණසි
සල්ලං මෙ දෙව උරසි කප්පෙසි,
සත්තසතා තෙ භරියා
කථන්නු තෙ තා භවිස්සන්ති.

3277. පඤ්ඤායිහින්ති එතා
දහරා අඤ්ඤම්පි තා ගමිස්සන්ති,
සග්ගඤ්ච පත්ථයානො
තෙනා'හං පබ්බජිස්සාමි.

3278. දුල්ලද්ධං මෙ ආසි සුතසොම
යස්ස තෙ හොමහං මාතා,
යං මෙ විලපන්තියා
අනපෙක්ඛො පබ්බජසි දෙව.

3279. දුල්ලද්ධං මෙ ආසි සුතසොම
යන්තං අහං විජායිස්සං,
යං මෙ විලපන්තියා
අනපෙක්ඛො පබ්බජසි දෙව.

3280. කොනාමෙසො ධම්මො සුතසොම
කා ච නාම පබ්බජ්ජා,[2]
යං නො අම්හෙ ජිණ්ණෙ
අනපෙක්ඛො පබ්බජසි දෙව.

3281. පුත්තාපි තුය්හං බහවො
දහරා අප්පත්තයොබ්බනා,
මඤ්ජූ තෙ[3] තං අපස්සන්තා
මඤ්ඤෙ දුක්ඛං නිගච්ඡන්ති.

---

1. පරිසජ්ජෙ – මජසං.
2. පබ්බජායං – මජසං.
3. තෙපි – මජසං.

3274. යම් කෙනෙක් බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තාහු බොහෝ කරුණු සිතන්නෝ වෙද්ද, නුවණැති ඔවුහු එකාන්තයෙන් ම සෙවනය කළ යුත්තෝ වෙති. මහරජ, සංඛපාල නාගයා ගැන ද මා ගැන ද අසා බොහෝ පින් කරවයි තාපස තෙම අවවාද කෙළේ ය.

සංඛපාල ජාතක යි.

5. චුල්ලසුතසොම ජාතකය

3275. නියම් ගම් වැසි ජනයා ද මිත්‍රාමාත්‍යයන් ද පිරිස් වැසි-යන් ද අමතා දන්වමි. හිසෙහි පැසුණු කෙසක් හටගත්තේ ය. දැන් මම පැවිද්ද කැමැත්තෙමි' යි සුතසොම නම් රජ ප්‍රකාශ කෙළේ ය.

3276. දේවයන් වහන්ස, කෙසේ නම් මට අවැඩක් කියන්නෙහි ද? මාගේ ළයෙහි ඇතින ලද හුලක් මෙන් කෙළෙහි ය. තමුන්නාන්-සේගේ සත්සියයක් භාර්‍ය්‍යාවෝ වෙත්. තමුන්නාන්සේ පැවිදි වූ කල්හි ඒ භාර්‍ය්‍යාවරු කෙසේ ජීවත් වන්නාහු ද? (යි ඔවුනතුරෙන් එකෙක් ඇසීය.)

3277. මේ තරුණ භාර්‍ය්‍යාවරු තම තමන්ගේ කටයුතුවලින් ප්‍රකටවන්නාහ. ඔවුහු අන් සැමියකු වෙත ද යන්නාහ. මම ස්වර්ගය පතන්නෙම් ද වෙමි. එහෙයින් මම පැවිදි වෙමි.

3278. දේවයන් වහන්ස, යම් හෙයෙකින් වැලපෙන්නා වූ මා ගැන අපෙක්ෂා රහිත වූයේ නුඹ පැවිදි වෙහි නම්, සුතසොමය, මම යම්බඳු තොපගේ මව් වීම් ද, එය මා නපුරු කොට ලැබුවකි.

3279. දේවයෙනි, යම් හෙයෙකින් වැලපෙන්නා වූ මා ගැන අපේක්ෂා රහිත වූයේ නුඹ පැවිදි වෙහි නම් සුතසොමය, මම යම්බඳු වූ තොප ප්‍රසූත කෙළෙම් ද, මෙය මා විසින් නපුරු කොට ලබන ලද්දක් වී යයි මව කීවාය.

3280. දේවයෙනි, යම් හෙයකින් ජරාජීර්ණ වූ අප ගැන අපෙක්ෂා රහිත වූයේ නුඹ පැවිදි වෙහි නම්, සුතසොමය, එය කිනම් පැවිද්දක් ද? මෙය කවර නම් ධර්මයක්ද? යි පිය තෙමෙ ඇසුවේ ය.

3281. තොපගේ බොහෝ පුත්‍රයෝ ද නො පැමිණි යොවුන් වයස් ඇති ළදරුවෝ ය. මිහිරි වදන් බෙණෙන්නා වූ ඔවුහු තා නො-දක්නෝ දුකට පත් වෙතැයි හඟිමි.

3282. පුත්තෙහි ච මෙ එතෙහි
දහරෙහි අපත්තයොබ්බනෙහි,
මඤ්ජූහි සබ්බෙහිපි තුම්හෙහි
චිරම්පි දිස්වා විනාභාවො.

3283. ජිණ්ණං නූ තුය්හං හදයං
ආදු[1] කරුණා ච නත්ථි අම්හෙසු,
යං නො වික්කන්දන්තියො
අනපෙක්ඛො පබ්බජසි දෙව.

3284. න ච මය්හං ජිණ්ණං හදයං
අත්ථි කරුණාපි මය්හං තුම්හෙසු,
සග්ගඤ්ච පත්ථයානො
තෙනාහං පබ්බජිස්සාමි.

3285. දුල්ලද්ධං මෙ ආසි සුතසොම
යස්ස තෙ අහං භරියා,
යං මෙ විලපන්තියා
අනපෙක්ඛො පබ්බජසි දෙව.

3286. දුල්ලද්ධං මෙ ආසි සුතසොම
යස්ස තෙ අහං භරියා,
යං මෙ කුච්ඡිපටිසන්ධිං
අනපෙක්ඛො පබ්බජසි දෙව.

3287. පරිපක්කො මෙ ගබ්භො
කුච්ඡිගතො යාව නං විජායාමි,
මාහං එකා විධවා
පච්ඡා දුක්ඛානි අද්දක්ඛිං.[2]

3288. පරිපක්කො තෙ[3] ගබ්භො
කුච්ඡිගතො ඉඞ්ඝ ත්වං[4] විජායස්සු,
පුත්තං අනොමවණ්ණං
තං හිත්වා පබ්බජිස්සාමි.

3289. මා ත්වං චන්දෙ රුදි
මා සොචි වනතිමිරමත්තක්ඛි,
ආරොහ වරපාසාදං
අනපෙක්ඛො අහං ගමිස්සාමි.

3290. කො තං අම්ම කොපෙසි
කිං රොදසි පෙක්ඛසි ච මං බාළ්හං,
කං[5] අවජ්ඣං ඝාතෙමි
ඤාතීනං උදික්ඛමානානං.

---

1. ආදුතෙ - මජසං.
2. අද්දක්ඛිං - මජසං.
3. ච තෙ - මජසං.
4. නං - වි. මජසං.
5. තං අවජ්ඣං - මජසං.

3282. යොවුන් වියට නො පැමිණි මිහිරි වදන් බෙණෙන මේ ළදරු පුත්‍රයන්ගෙන් පමණක් නොව තොප සියලු දෙනාගෙන් ද, බොහෝ කලක් වාසය කොට ද වෙන් වන්නට සිදුවේ. එය නො වැළැක්විය හැක්කකියි බෝසත් තෙම කීය.

3283. දේවයන් වහන්ස, යම් හෙයකින් අප අඬද්දී අපෙක්ෂා රහිතව පැවිදි වෙහි ද? එහෙයින් නුඹ වහන්සේගේ හෘදය සිදුරු වී ද? වැන්දඹු තත්‍වයට වැටෙන අප කෙරෙහි කරුණාවක් නැද්ද? යි භාර්‍ය්‍යාවක් ඇසුවා ය.

3284. මගේ හෘදය සිදුරු නොවීය. තොප කෙරෙහි මාගේ කරුණාව ද ඇත්තේ ය. ස්වර්ග සම්පත්තිය ද පතන්නෙම් වෙමි. එහෙයින් මම පැවිදි වන්නෙමි.

3285. දේවයෙනි, යම් හෙයකින් වැලපෙන්නා වූ මා ගැන අපෙක්ෂා රහිත වූයේ පැවිදි වෙහි ද? සුතසොමය, මම යම්බඳු වූ තොපගේ භාර්‍ය්‍යා වෙම් ද එහෙයින් එය මා නපුරු කොට ලබන ලද්දක් විය.

3286. දේවයෙනි, යම් හෙයකින් මගේ කුස පිළිසිඳ ගැන්ම ගැන අපෙක්ෂා රහිත වූයේ නුඹ පැවිදි වෙහි ද සුතසොමය, මම යම්බඳු තොපගේ භාර්‍ය්‍යා වෙම් ද එහෙයින් එය මා නපුරු කොට ලබන ලද්දක් විය.

3287. මාගේ දරු ගර්භය මුහුකුරා ගියේ ය. කුස හොත් දරුවා යම්තාක් වදම් ද ඒ තාක් ඉවසුව මැනැවි. එකලා වූ මම වැන්දඹු නො කෙරේවා, පසුව දුක් දකිමියි අග මෙහෙසිය කීවාය.

3288. තීගේ දරු ගර්භය මුහුකුරා ගියේ යැයි දනිමි. එබැවින් තී පුත්‍රයකු ප්‍රසූත කරව අලාමක වර්ණ ඇති පුත්‍රයා ද තී ද හැර මම පැවිදි වන්නෙමි' යි බෝසත් තෙම කීයේ ය.

3289. සොඳුර චන්ද්‍රා දේවිය, නො අඬව. ගිනිහිරි මල් බඳු ඇස් ඇත්තිය. නො හඬව. උතුම් ප්‍රාසාදයට නගුව. මම අපෙක්ෂා විරහිතව යන්නෙමි යි කීයේ ය.

3290. මෑනියෙනි, කවරෙක් නුඹ කොප කෙළේ ද? කුමක් හෙයින් හඬන්නෙහි ද? කුමක් නිසා මා දෙස ද දෑඩිව බලන්නෙහි ද? වධ නො කටයුත්තකු වුවත් ඥාතීන් බලා සිටියදී ම නසමි. මට මේ කරුණ පහද දෙව යි වැඩිමහලු පුත්‍ර තෙම ඇසීය.

3291. නහි සො සක්කා හන්තුං
විජිතාවී යො මං තාත කොපෙසි,
පිතා තෙ මං තාත අවච
අනපෙක්ඛො අහං ගමිස්සාමි.

3292. යාහං පුබ්බෙ නියාමි
උය්‍යානං[1] කුඤ්ජරෙ[2] ච යොධෙමි,
සුතසොමෙ[3] පබ්බජිතෙ
කථන්නු දානි කරිස්සාමි.

3293. මාතු ච මෙ රුදන්ත්‍යා[4]
ජෙට්ඨස්ස ච භාතුනො අකාමස්ස,
හත්ථෙපි තෙ ගහෙස්සං[5]
න හි ගච්ඡසි නො අකාමානං.

3294. උට්ඨෙහි ත්වං ධාති
ඉමං කුමාරං[6] රමෙහි අඤ්ඤත්ථ,
මා මෙ පරිපන්ථමකා[7]
සග්ගං මම පත්ථයානස්ස.

3295. යන්නූනිමං දදෙය්‍යං[8] පභඞ්කරං
කො නු මෙ ඉමිනා අත්ථො,
සුතසොමෙ පබ්බජිතෙ
කින්නු මෙ තං කරිස්සාමි.

3296. කොසො ච තුය්හං විපුලො
කොට්ඨාගාරඤ්ච තුය්හං පරිපූරං,
පථවී[9] ච තුය්හං විජිතා[10]
රමස්සු මා පබ්බජස්සු දෙව.

3297. කොසො ච මය්හං විපුලො
කොට්ඨාගාරඤ්ච මය්හං පරිපූරං,
පථවී ච මය්හං විජිතා
තං හිත්වා පබ්බජිස්සාමි.

3298. මය්හම්පි ධනං පහූතං
සඞ්ඛ්‍යාතුං නොපි දෙව සක්කොමි,
තං දෙව තෙ දදමි සබ්බම්පි
රමස්සු මා පබ්බජ දෙව.

---

1. සොහං පුබ්බෙ රථෙන යාමි උය්‍යානං - මජසං.
2. මත්ත කුඤ්ජරෙව යොධෙමි - මජස, සයා.
3. සුතසොම - මජසං.
4. රුදන්තරා - මජසං.
5. ගමිස්සං - වි. මජසං. ගහිස්සං - සයා.
6. කුමාරි - මජසං. කුමාරං කුමාරි - වි.
7. පරිබන්ධමකාසි - මජසං.
8. දදෙය්‍ය - වි. මජසං.
9. පඨවි - මජසං.
10. විජිතාවී

3291. පුත්‍රය, යමෙක් මා කොප කෙළේ ද? හෙතෙමේ ලබන ලද ජය ඇත්තා වූ තොපගේ පියා වන්නේ ය. හෙතෙමේ නසන්නට නො හැකිය. පුත්‍රය, තොපගේ පියා මම අපෙක්ෂා රහිතව යන්නෙමියි මට කීයේ ය.

3292. යම්බඳු මම පෙර රියට නැඟ උයනට ගියෙම් ද, මදෑ කුන්හට ද පහර දුනිම් ද? මා පිය සුතසොමරජ පැවිදි වූ කල්හි දුන් මම ඒවා කෙසේ කරම් දැයි වැඩිමහලු පුත්‍රයා ප්‍රශ්න කෙළේ ය.

3293. පියාණෙනි, මාගේ මව හඬද්දී වැඩිමහල් සහොදරයාගේ ද නො කැමැත්ත තිබියදී පැවිදි වෙහි ද? නුඹ වහන්සේගේ අත් දෙක ද අල්ලා ගන්නෙමි. අප අකමැතිව සිටියදී නො යන්නෙහි යැයි බාල පුත්‍රයා ප්‍රකාශ කළේ ය.

3294. එම්බා කිරිමව, තී නැගිටුව මේ කුමරා අන් තැනක සිත් අලවව. ස්වර්ගය පතන්නා වූ මට උවදුරු නො කරව.

3295. මේ දිලිසෙන්නා වූ මැණික ආපසු දෙන්නෙම් නම් යහපති. මට මෙයින් කවර ප්‍රයොජන ද? සුතසොම රජු පැවිදි වූ කල්හි මේ මැණික ගෙන මම කුමක් කරන්නෙම් ද යි කිරිමව වැලපුණාය.

3296. දේවයන් වහන්ස, භාණ්ඩාගාරය ද මහත් වේ. නුඹගේ කොෂ්ඨාගාරය ද පිරී ගොස් ය. නුඹ විසින් පෘථිවිය ද දිනන ලද්දීය. සිත් අලවා වාසය කරව. පැවිදි නො වනු මැනැවැයි මහඇමති තෙම කීයේ ය.

3297. මාගේ භාණ්ඩාගාරය ද මහත් ය. මාගේ කොෂ්ඨාගාරය ද පිරී ගොස් ය. මා විසින් පෘථිවිය ද දිනන ලද්දී ය. ඒ සියල්ල හැරදමා පැවිදි වෙමියි බෝසත් තෙම කීයේ ය.

3298. දේවයන් වහන්ස, මාගේ ධනය ද බොහෝ ය. ගණින්නට ද නො හැකියි. ඒ සියල්ල ම නුඹ වහන්සේට දෙමි. සිත් අලවා මෙහි ම වාසය කරනු මැනවි. පැවිදි නො වනු මැනැවැයි කුලවඩ්ඪන නම් සිටු තෙම කීයේ ය.

3299. ජානාමි තෙ ධනං පහූතං
කුලවඩ්ඪන පූජිතො තයා ච'ස්මි,
සග්ගඤ්ච පත්ථයානො
තෙනාහං පබ්බජිස්සාමි.

3300. උක්කණ්ඨිතොස්මි බාළ්හං
අරති මං සොමදත්ත ආවිසති,
බහුකා හි අන්තරායා
අජ්ජෙවාහං පබ්බජිස්සාමි.

3301. ඉදම්පි තුය්හං රුචිතං සුතසොම
අජ්ජෙවදානි ත්වං පබ්බජ,
අහම්පි පබ්බජිස්සාමි
න උස්සහෙ තයා විනා අහං ඨාතුං.

3302. න හි සක්කා පබ්බජිතුං
නගරෙ න හි පච්චති ජනපදෙ ච,
සුතසොමෙ පබ්බජිතෙ
කථං නු දානි කරිස්සාම.

3303. උපනීයතිදං මඤ්ඤෙ
පරිත්තං උදකංව චඞ්ගවාරම්හි,
එවං සුපරිත්තකෙ ජීවිතෙ
න ච පමජ්ජිතුං කාලො.

3304. උපනීයතිදං මඤ්ඤෙ
පරිත්තං උදකංව චඞ්ගවාරම්හි,
එවං සුපරිත්තකෙ ජීවිතෙ
අථ බාලා පමජ්ජන්ති.

3305. තෙ වඩ්ඪයන්ති නිරයං
තිරච්ඡානයොනිඤ්ච පෙත්තිවිසයඤ්ච,
තණ්හාබන්ධනබද්ධා
වඩ්ඩෙන්ති අසුරකායං.

3306. ඌහඤ්ඤතෙ රජග්ගං
අවිදූරෙ පුප්ඵකම්හි පාසාදෙ,
මඤ්ඤෙ නො කෙසා ඡින්නා
යසස්සිනො ධම්මරාජස්ස.

3307. අයමස්ස පාසාදො
සොවණ්ණපුප්ඵමාල්‍යවීතිකිණ්ණො,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඉත්ථාගාරෙහි.

3299. කුලවඩ්ඪන සිටාණෙනි, තාගේ ධනය බොහෝ බව දනිමි. තා විසින් ද මම පුදන ලද්දෙම් වෙමි. ස්වර්ග සම්පත්ති ද පතන්නෙම් වෙමි. එහෙයින් මම පැවිදි වන්නෙමියි බෝසත් තෙම කීයේ ය.

3300. සොමදත්ත කුමාරය, මම දැඩිසේ කලකිරුණෙම් වෙමි. නො ඇල්ම මා කෙරෙහි ආවෙශ වෙයි. යම් හෙයකින් අන්තරායයෝ බොහෝ වෙද් ද, එබැවින් අද ම මම පැවිදි වන්නෙමියි සොමදත්ත කුමරුහට රජය පාවා දෙමින් සුතසොම බෝසත් තෙමේ ප්‍රකාශ කළේ ය.

3301. සුතසොමයන් වහන්ස, අද ම පැවිදි වන්නෙමි යි යන මෙය නුඹ විසින් කැමති වන ලද්දක් ද? නුඹ වහන්සේ අද ම පැවිදි වනු මැනවි. මම ද පැවිදි වන්නෙමි. තොප හැර ගිහිගෙයි සිටින්නට මම උත්සාහ නො කරමියි සොමදත්ත නම් සහොදරයා කීයේ ය.

3302. සුතසොම රජු පැවිදි වූ කල්හි දුන් අපි කුමක් කරන්නෙමු දැයි කියා නගරයෙහි ද ජනපදයෙහි ද දූනටමත් ශොකයෙන් ආහාර නො පිසත්. (අප දෙදෙනා ම පැවිදි වූ කල්හි රටවැසියෝ අනාථයෝ වන්නාහ). එබැවින් නුඹට පැවිදි වන්නට නුපුළුවන් යයි සුතසොම තෙම කීයේ ය.

3303. මේ ජීවිතය රදවුන්ගේ අළුපෙරහනෙහි ස්වල්ප වූ ජලයක් මෙන් වහා මැඩ පැවැත්වෙන්නේයයි දනිමි. මෙසේ ස්වල්ප වූ ජීවිත කාලයෙහි ද පමා වන්නට කාලයක් නැත්තේය.

3304. මේ ජීවිතය රජකයන්ගේ අළුපෙරහනෙහි ස්වල්ප වූ දියත්තක් මෙන් වහා මැඩ පැවැත්වෙන්නේයයි දනිමි. මෙසේ ස්වල්ප වූ ජීවිත කාලයෙහි ද අඥානයෝ පමා වන්නාහ.

3305. තෘෂ්ණා බන්ධනයෙන් බැඳුණා වූ ඔවුහු නරකය තිරිසන් යොනිය - ප්‍රෙත විෂය - අසුරකාය යන සිවු අපාය දියුණු කරත්.

3306. අපගේ මහත් යශස් ඇති ධර්ම රාජන් වූ රජුගේ කෙශයෝ සිඳින ලද්දහයි හඟිමි. පුප්ඵ නම් ප්‍රාසාදයට නුදුරු තන්හි රජස් උස්ව නැගේ යැයි මහජනයා හඬමින් කීයේ ය.

3307. අන්තඃපුර ස්ත්‍රීන් විසින් පිරිවරන ලද්ද වූ රජ තෙම යම් ප්‍රාසාදයන්හි හැසුරුණේ ද, මනා වර්ණ ඇති මලින් හා නොයෙක් මල් මාලාවන් ගෙන් ද ගැවසීගත්තා වූ මෙය වනාහි උන්වහන්සේගේ ඒ ප්‍රාසාද යයි.

3308. අයමස්ස පාසාදො
සොවණ්ණපුප්ඵමාල්‍යවීතිකිණ්ණො,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඤාතිසඞ්ඝෙන.

3309. ඉදමස්ස කූටාගාරං
සොවණ්ණපුප්ඵමාල්‍යවීතිකිණ්ණං,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඉත්ථාගාරෙහි.

3310. ඉදමස්ස කූටාගාරං
සොවණ්ණපුප්ඵමාල්‍යවීතිකිණ්ණං,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඤාතිසඞ්ඝෙන.

3311. අයමස්ස අසොකවනිකා
සුපුප්ඵිතා සබ්බකාලිකා රම්මා,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඉත්ථාගාරෙහි.

3312. අයමස්ස අසොකවනිකා
සුපුප්ඵිතා සබ්බකාලිකා රම්මා,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඤාතිසඞ්ඝෙන.

3313. ඉදමස්ස උය්‍යානං
සුපුප්ඵිතං සබ්බකාලිකං රම්මං,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඉත්ථාගාරෙහි.

3314. ඉදමස්ස උය්‍යානං
සුපුප්ඵිතං සබ්බකාලිකං රම්මං,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඤාතිසඞ්ඝෙන.

3315. ඉදමස්ස කණිකාරවනං
සුපුප්ඵිතං සබ්බකාලිකං රම්මං,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඉත්ථාගාරෙහි.

3316. ඉදමස්ස කණිකාරවනං
සුපුප්ඵිතං සබ්බකාලිකං රම්මං,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඤාතිසඞ්ඝෙන.

3317. ඉදමස්ස පාටලිවනං
සුපුප්ඵිතං සබ්බකාලිකං රම්මං,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඉත්ථාගාරෙහි.

3308. නෑ සමූහයා විසින් පිරිවරන ලද්ද වූ රජතෙම යම් ප්‍රාසාදයෙක්හි හැසුරුණේ ද මනා වර්ණ ඇති මලින් හා මල්මාලා-වන්ගෙන් ද ගැවසීගත්තා වූ මෙය වනාහි උන්වහන්සේගේ ඒ ප්‍රාසාද යයි.

3309. අන්තඃපුර ස්ත්‍රීන් විසින් පිරිවරන ලද්ද වූ රජ තෙම යම් කූටාගාරයෙක්හි හැසුරුණේ ද, මනා වර්ණ ඇති මලින් හා මල්මාලාවන්ගෙන් ද ගැවසීගත්තා වූ මෙය වනාහි උන්වහන්සේගේ කූටාගාර යයි.

3310. නෑ සමූහයා විසින් පිරිවරන ලද්ද වූ රජ තෙම යම් කූටාගාරයෙක්හි හැසුරුණේ ද මනා වර්ණ ඇති මලින් හා මල් මාලාවන්ගෙන් යුක්ත වූ මෙය වනාහි උන්වහන්සේගේ ඒ කූටා-ගාරය යි.

3311. අන්තඃපුර ස්ත්‍රීන් විසින් පිරිවරන ලද්ද වූ රජ තෙම යම් උයනෙක්හි හැසුරුණේ ද මෙය වනාහි උන්වහන්ස්ගේ සැම කල්හි මනාව පිපියා වූ සිත්කලු ඒ අශොක වනයයි.

3312. නෑ සමූහයා විසින් පිරිවරන ලද්ද වූ රජ තෙම යම් උයනෙක්හි හැසිරුණේ ද මේ වනාහි උන්වහන්සේගේ සැම කල්හි පිපියා වූ ඒ සිත්කලු අශොක වනය යි.

3313. අන්තඃපුර ස්ත්‍රීන් විසින් පිරිවරන ලද රජ තෙම යම් උයනෙක්හි හැසිරුණේ ද? මෙය වනාහි සියලු කල්හි මනාව පිපියා වූ උන්වහන්සේගේ ඒ සිත්කලු උයනය.

3314. නෑ සමූහයා විසින් පිරිවරන ලද්ද වූ රජ තෙම යම් උයනෙක්හි හැසිරුණේ ද මෙය වනාහි සියලු කල්හි මනාව පිපියා වූ උන්වහන්සේගේ ඒ උයන යි.

3315. අන්තඃපුර ස්ත්‍රීන් පිරිවරන ලද රජ තෙම යම් උය-නෙක්හි හැසිරුණේ ද, මෙය වනාහි සියලු කල්හි මනාව පිපියා වූ උන්වහන්සේගේ කිණිහිරිය මල් උයනය.

3316. නෑ සමූහයා විසින් පිරිවරන ලද රජතෙම යම් උය-නෙක්හි හැසිරුණේ ද මෙය වනාහි සියලු කල්හි මනාව පිපියා වූ උන්වහන්සේගේ ඒ කිණිහිරිය මල් උයනය.

3317. අන්තඃපුර ස්ත්‍රීන් පිරිවරන ලද රජ තෙම යම් උයනෙක්හි හැසිරුණේ ද, මෙය වනාහි සියලු කල්හි මනාව පිපියා වූ ඒ පළොල්වනය යි.

3318. ඉදමස්ස පාටලිවනං
සුපුප්ඵිතං සබ්බකාලිකං රම්මං,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඤාතිසඞ්ඝෙන.

3319. ඉදමස්ස අම්බවනං
සුපුප්ඵිතං සබ්බකාලිකං රම්මං,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඉත්ථාගාරෙහි.

3320. ඉදමස්ස අම්බවනං
සුපිප්ඵිතං සබ්බකාලිකං රම්මං,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඤාතිසඞ්ඝෙන.

3321. අයමස්ස පොක්ඛරණී
සඤ්ඡන්නා අණ්ඩජෙහි වීතිකිණ්ණා,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඉත්ථාගාරෙහි.

3322. අයමස්ස පොක්ඛරණී
සඤ්ඡන්නා අණ්ඩජෙහි වීතිකිණ්ණා,
යහිමනුවිචරි රාජා
පරිකිණ්ණො ඤාතිසඞ්ඝෙන.

3323. රාජා බො පබ්බජිතො
සුතසොමො රජ්ජං ඉමං පහත්වාන,
කාසායවත්ථවසනො
නාගොව එකකොව චරති.

3324. මාස්සු පුබ්බෙ රතිකීළිතානි
හසිතානි අනුස්සරිත්ථ,
මා වො කාමා හනිංසු
රම්මං හි සුදස්සනං නාම නගරං.

3325. මෙත්තං චිත්තඤ්ච භාවෙථ
අප්පමාණං දිවා ච රත්තො ච,
අථ ගච්ඡිත්ථ දෙවපුරං
ආවාසං පුඤ්ඤකම්මිනන්ති.

චුල්ලසුතසොමජාතකං.

චත්තාලීසනිපාතො නිට්ඨිතො.

තස්සුද්දානං:

සුවපණ්ඩිතජම්බුකකුණ්ඩලිනො
සරභඞ්ගමලම්බුසජාතකඤ්ච,
පවරුත්තමසඞ්ඛසිරිව්හයකො
සුතසොම අරින්දම රාජවරොති.

3318. නෑ සමූහයා විසින් පිරිවරන ලද රජ තෙම යම් උයනෙක් හි හැසිරුණේ ද, මෙය වනාහි සියලු කල්හි මනාව පිපියාවූ උන්වහන්සේගේ ඒ පලොල්වනය යි.

3319. අන්තඃපුර ස්ත්‍රීන් විසින් පිරිවරන ලද රජ තෙමේ යම් උයනෙක්හි හැසිරුණේ ද, මෙය වනාහි හැමකල්හි මනාව පිපියා වූ උන්වහන්සේගේ ඒ අඹඋයන ය.

3320. නෑ සමූහයා විසින් පිරිවරන ලද රජතෙමේ යම් උයනෙක්හි හැසිරුණේ ද, මෙය වනාහි හැම කල්හි මනාව පිපියා වූ උන්වහන්සේගේ ඒ අඹ උයන ය.

3321. අන්තඃපුර ස්ත්‍රීන් විසින් පිරිවරන ලද රජතෙමේ යම් පොකුණක් සමීපයෙහි හැසුරුණේ ද, මෙය වනාහි නොයෙක් ජල කුසුමයන්ගෙන් පක්ෂීන්ගෙන් ගැවසීගත්තා වූ උන්වහන්සේගේ ඒ පොකුණ ය.

3322. නෑ සමූහයා විසින් පිරිවරන ලද රජතෙම යම් පොකුණක් සමීපයෙහි හැසුරුණේ ද, මෙය වනාහි නොයෙක් ජලකුසුමයන්ගෙන් හා පක්ෂීන්ගෙන් ගැවසීගත්තා වූ උන්වහන්සේගේ ඒ පොකුණ ය.

3323. සුතසොම රජ තෙම මේ රාජ්‍යය හැර දමා පැවිදි වූයේ ය. කසාවත් හැඳගත්තේ එකචර හස්තිරාජයකු මෙන් එකලාව හැසිරේ.

3324. පෙර තොප විසින් කරන ලද කාමක්‍රීඩා සහ කාය වාචා චිත්ත වශයෙන් කළ ක්‍රීඩා ද තොප සිත්හි පහළ නො වේවා. සිනහ කාරණයත් ද සිහි නො කරමු. යම් හෙයකින් සුදර්ශන නගරය සිත්කලු වන්නේ ද එහෙයින් ඒ නගරය සිහිපත් නො කරව. කාමයෝ වනාහි තොපට හිංසා නො කෙරෙත්වා.

3325. දවල් ද රෑ ද අප්‍රමාණ වූ මෛත්‍රී සිත වඩමු. ඉක්බිති පින් ඇත්තවුන්ගේ වාසස්ථානය වූ දෙව් පුරයට යවූ යි. පිරිසට අවවාද කළේ ය.

චූලසුතසොම ජාතක යි.

චත්තාළීස නිපාතය නිමියේ යි.

එහි උද්දානය:

සුවපණ්ඩිත, ජම්බුක කුණ්ඩලි යන පක්ෂීන් ඇති තෙසකුණ ජාතකය ද, සරභඞ්ග ජාතකය ද, අලම්බුස ජාතකය ද, උතුම් වූ සඞ්ඛ නාගරාජ ජාතකය ද, සුතසොම ජාතකය ද යන මොහු චත්තාළීස නිපාතයෙහි වෙත්.

1. නලිනිකාජාතකං

3326. උඩ්ඩය්හතෙ[1] ජනපදෙ රට්ඨඤ්චාපි විනස්සති,
එහි නලිනිකෙ[2] ගච්ඡ තං මෙ බ්‍රාහ්මණමානය.

3327. නාහං දුක්ඛක්ඛමා රාජ නාහං අද්ධානකොවිදා,
කථං අහං ගමිස්සාමි වනං කුඤ්ජරසෙවිතං.

3328. ඵීතං ජනපදං ගන්ත්වා හත්ථිනා ච රථෙන ච,
දාරුසඞ්ඝාටයානෙන එවං ගච්ඡ නලිනිකෙ[2].

3329. හත්ථී අස්සා රථා පත්ති[3] ගච්ඡෙවාදය ඛත්තියෙ,
තවෙව වණ්ණරූපෙන වසං තං ආනයිස්සසි.

3330. කදලීධජපඤ්ඤාණො ආභුජීපරිවාරිතො,
එසො පදිස්සති රම්මො ඉසිසිඞ්ගස්ස අස්සමො.

3331. එසො අග්ගිස්ස සඞ්ඛාතො එසො ධූමො පදිස්සති,
මඤ්ඤෙ නො අග්ගිං හාපෙති ඉසිසිඞ්ගො මහිද්ධිකො.

3332. තඤ්ච දිස්වාන ආයන්තිං ආමුත්තමණිකුණ්ඩලං[4],
ඉසිසිඞ්ගො පාවිසි භීතො අස්සමං පණ්ණඡාදනං.

3333. අස්සමස්ස ච සා ද්වාරෙ ගෙණ්ඩුකෙනස්ස කීළති,
විදංසයන්තී අඞ්ගානි ගුය්හං පකාසිතානි ච.

3334. තඤ්ච දිස්වාන කීළන්තිං[5] පණ්ණසාලගතො ජටී,
අස්සමා නික්ඛමිත්වාන ඉදං වචනමබ්‍රවි.

3335. අම්භො කො නාම සො රුක්ඛො යස්ස තෙවංගතං ඵලං,
දූරෙපි ඛිත්තං පච්චෙති න තං ඔහාය ගච්ඡති.

3336. අස්සමස්ස මමං[6] බ්‍රහ්මෙ සමීපෙ ගන්ධමාදනෙ,
පබ්බතෙ තාදිසා රුක්ඛා යස්ස තෙවඞ්ගතං ඵලං
දූරෙපි ඛිත්තං පච්චෙති න මං ඔහාය ගච්ඡති.[7]

---

1. උදයහතෙ – මජසං.
2. නිළිනිකෙ – මජසං.
3. හත්ථී අස්ස රථෙ පත්තිං – මජසං.
4. කුණ්ඩලිං – මජසං.
5. කීළන්ති – මජසං,
6. මම – මජසං.
7. ගච්ඡරු – මජසං. ස්‍යා,

1. නලිනිකා ජාතකය

3326. නලිනී කුමරිය, මෙහි එව. ජනපදය තියඟින් දැවේ. රට ද වැනසේ, යව, ඒ මාගේ රටට වැසි වළකන්නා වූ බ්‍රාහ්මණයා (ඉසිසිංග තාපසයා) මෙහි ගෙන එවයි රජ තෙම කීය.

3327. පිය මහරජ, මම දුක් ඉවසිය හැක්කී නොවෙමි. මම හොඳින් මඟ දන්නියක් ද නොවෙමි. ඇතුන් විසින් සෙවුනා ලද වනයෙහි මම කෙසේ නම් යම් දැ යි නලිනිය ඇසුවා ය.

3328. එම්බා නලිනිය, ඇතුපිටින් හා රථයෙන් ද සමෘද්ධ වූ නුවරට ගොස් සුදුසු තන්හි බස්වාගෙන යන දැවමය යානයෙන්ද, නැව් ආදියෙන් ද යව.

3329. ක්‍ෂත්‍රිය කුමරියනි, ඇත් අස් රිය පාබල යන සිව් රඟ සෙනග ගෙන යව. මෙසේ ක්ලාන්ත නොවී ගොස් තිගේ ශරීර වර්ණයෙන් ද රූප සම්පත්තියෙන් ද ඒ බ්‍රාහ්මණයා තමන්ගේ වසයට ගනුවයි කීයේ ය.

3330. කදලි සංඛ්‍යාත කෙසෙල් ධ්වජ සලකුණු ඇත්තා වූ ආභූජී පත්‍ර වනයෙන් පිරිවරන ලද්ද වූ ඉසිසිංග තාපසයාගේ රම්‍ය ආශ්‍රමය අර පෙණේ.

3331. අර ගින්න ඒ තාපසයා විසින් පුදන ලද ගින්න වේ. අර දුම දක්නට ලැබේ. මහත් සෘද්ධි ඇති ඉසිසිංග තාපස තෙම ගින්න නොනිවන්නේ යයි හඟිමි.

3332. ඉසිසිංග තාපස තෙමේ මිණි කොඬොල් පැළඳ එන්නා වූ ඇය දැක බිය වී (කොළ පියසි ඇති) ආශ්‍රමයට ඇතුළු විය.

3333. ඒ නලිනී තොමෝ අසපු දොර සිට රහසඟත් ප්‍රකට නොකටයුතු අවයවත් පෙන්නමින් පන්දුවකින් ක්‍රීඩා කරයි.

3334. පන්සලට පිවිසියා වූ තාපස තෙම ක්‍රීඩා කරන්නා වූ ඇය දැක අසපුවෙන් නික්ම මේ වචන කීයේ ය.

3335. පින්වත, යම්බඳු නුඹගේ දුරට දමන ලද ඵලය (පන්දුව) ආපසු එයි ද තා හැර නොයයි ද, මේ ආකාරයක් ඇති ඵලය හටගන්නා වූ ඒ ගස කවරෙක්දැයි තාපස තෙම ප්‍රශ්න කෙළේ ය.

3336. බ්‍රාහ්මණය, ගන්ධමාදන පර්වතයෙහි මාගේ අසපුව සමීපයෙහි යම් ගසක ඵලය මෙසේ දුරට දමා ගැසූ කල පෙරළා ඒ ද, මා හැරදමාත් නොයා ද එබඳු වෘක්ෂයෝ එහි ඇත්තාහ.

3337. එතු භවං අස්සමිමං අදෙතු
පජ්ජඤ්ච භක්ඛඤ්ච පටිච්ඡ දම්මි,
ඉදමාසනං අත්‍ර භවං නිසීදතු
ඉතො භවං මූලඵලානි ඛාදතු[1]

3338. කින්නෙත ඉදං ඌරුනමන්තරස්මිං
සුපිච්ඡිතං කණ්හරිවප්පකාසති,
අක්ඛාහි මෙ පුච්ඡිතො එතමත්ථං
කොසෙනු තෙ උත්තමඞ්ගං පවිට්ඨං.

3339. අහං වනෙ මූලඵලෙසනං චරං
ආසාදයිං[2] අච්ඡං සුඝොරරූපං,
සො මං පතිත්වා සහසජ්ඣපත්තො[3]
පනුජ්ජ මං අබ්බහි[4] උත්තමඞ්ගං.

3340. සවායං වණො ඛජ්ජති කණ්ඩුවායති
සබ්බඤ්ච කාලං න ලභාමි සාතං,
පහො භවං කණ්ඩුමිමං විනෙතුං
කුරුතං භවං යාචිතො බ්‍රාහ්මණත්ථං.

3341. ගම්භීරරූපො තෙ වණො සලොහිතො
අපූතිකො පක්කගන්ධො මහා ච,
කරොමි තෙ කිඤ්චි කසායයොගං
යථා භවං පරමසුඛී භවෙය්‍ය.

3342. න මන්තයොගා න කසාවයොගා
න ඔසධා බ්‍රහ්මචාරී කමන්ති,
යං තෙ මුදු තෙන විනෙහි කණ්ඩුං
යථා අහං පරමසුඛී භවෙය්‍යං.

3343. ඉතො නු භොතො කතමෙන අස්සමො
කච්චි භවං අභිරමසි අරඤ්ඤෙ,
කච්චිනු තෙ මූලඵලං පහූතං[5]
කච්චි භවන්තං න විහිංසන්ති වාළා.

3344. ඉතො උජුං උත්තරායං දිසායං
ඛෙමා නදී හිමවන්තා පභාති,[6]
තස්සා තීරෙ අස්සමො මය්හ රම්මො
අහො භවං අස්සමං මය්හ පස්සෙ.

1. භුඤ්ජතු - වි. මජසං.
2. අසාදයි - මජසං.
3. සහසා - මජසං.
4. අබ්භහි - මජසං.
5. බහූතං - මජසං.
6. ඛෙමානදී හිමවතා පභවි - මජසං.

3337. පින්වතුන් වහන්සේ මේ ආශ්‍රමයට පිවිසෙන සේක්වා. (ඇති සැටියකින්) ආහාර අනුභව කෙරෙත් වා. පයෙහි ගල්වන තෙල් ද, මිහිරි ඵලාඵල ද සූදනම් කොට දෙමි. මේ නුඹ වහන්සේට ආසනයයි. පින්වතුන් වහන්සේ මෙහි හිඳගන්නා සේක් වා. පින්වතුන් වහන්සේ මෙයින් අලමුල් හා පලවැළ ද අනුභව කෙරෙත් වා.

3338. පින්වත, නුඹගේ කළවායුවල අතර හොඳින් හේත්තු වූ කළුවන් සටහනක් සේ මේ කවරක් නම් පෙනේ ද? මා විසින් විචාරන ලද නුඹ මේ කරුණ මට කියව. තොපගේ රහසඟ ශරීර සංඛ්‍යාත කොෂයෙහි ඇතුළු වීද?

3339. පින්වත් තාපසයෙනි, මම වනයෙහි අල මුල් හා පලතුරු සොයමින් හැසුරුණෙමි ඉතා දරුණු ස්වභාව ඇති වලසකුට ගල-කින් ගැසුවෙමි. ඒ වලසා මා දෙසට පැන වහා මා වෙත පැමිණියේ මා පෙරළා මාගේ රහසඟ කටින් උදුරා ඩැහැ ගත්තේය.

3340. එතැන් පටන් මාගේ ඒ වණය සැරෙයි. කැසීමද හට-ගනී. එහෙයින් හැම කල්හිම සුවයක් නොලබමි. පින්වත් තෙම මේ කැසීම සුව කරන්නට පොහොසත් ය. මා විසින් යදින ලද නුඹ වහන්සේ බ්‍රාහ්මණ වූ මා පිණිස යහපතක් කරන සේක් වා.

3341. පින්වත, තොපගේ වණය ගැඹුරුය. ලේවන් පැහැත්තේ ය. කුණුමස් නැත්තේ ය. මදක් දුගඳ ඇත්තේ ය. විශාල ය. යම් සේ පින්වත් තෙමේ ඉතා සුවපත් වූවෙක් වන්නේ ද එසේ යම්කිසි කෂාය යොගයක් තොපට කරමි.

3342. පින්වත් බ්‍රහ්මචාරිය, මන්ත්‍ර හෝ කසාය යොග හෝ වෙනත් ඖෂධ හෝ මේ වණය සුවපත් නො කෙරේ. යම් සේ මම ඉතා සුවැත්තෙක් වන්නෙම් ද එපරිද්දෙන් නුඹගේ මෘදු වූ යම් අවයවයක් වේ නම් එයින් ගටා මේ කැසීම දුරුකරවයි නලිනී කීවා ය.

3343. පින්වතාගේ ආශ්‍රමය මෙයින් කවර දිශායෙක්හි ද? කිම පින්වතා වනයෙහි සිත් අලවන්නේ ද? කිම නුඹට අල මුල් හා පලතුරු බොහෝ තිබේ ද? කිම ව්‍යාල සත්තු පින්වතා නො වෙහෙසත් ද?

3344. පින්වත, මෙතැනින් සෘජුව උතුරු පැත්තෙහි ඛෙමා නම් ගඟක් හිමවතෙන් ගලා බසියි. මාගේ රම්‍ය වූ ආශ්‍රමය ඒ ගංගාවගේ ඉවුරේ ය. අනේ, පින්වතා මාගේ ආශ්‍රමය දක්නේ නම් යහපතැ යි නලිනී කීවා ය.

3345. අම්බා ච සාලා තිලකා ච ජම්බුයො
උද්දාලකා පාටලියො ච ඵුල්ලා,
සමන්තතො කිම්පුරිසාභිගීතං
අහො භවං අස්සමං මය්හ[1] පස්සෙ.

3346. තාලා ච මූලා ච ඵලා ච මෙත්ථ
වණ්ණෙන ගන්ධෙන උපෙතරූපා,
තං භූමිභාගෙහි උපෙතරූපං
අහො භවං අස්සමං මය්හ පස්සෙ.

3347. ඵලා ච මූලා ච පහූත[2] මෙත්ථ
වණ්ණෙන ගන්ධෙන රසෙනුපෙතා,
ආයන්ති ච ලුද්දකා තං පදෙසං
මා මෙ තතො මූලඵලං අහාසුං.[3]

3348. පිතා මමං මූලඵලෙසනං ගතො
ඉදානි ආගච්ඡති සායකාලෙ,[4]
උභොව ගච්ඡාමසෙ අස්සමං තං
යාව පිතා මූලඵලතො එතු.

3349. අඤ්ඤෙ බහූ ඉසයො සාධුරූපා
රාජීසයො අනුමග්ගෙ වසන්ති,
තෙයෙව පුච්ඡෙසි මමස්සමං තං
තෙ තං නයිස්සන්ති මමං සකාසෙ.

3350. න තෙ කට්ඨානි භින්නානි න තෙ උදකමාභතං,
අග්ගිපි තෙ න හාසිතො[5] කින්නු මන්දොව ඣායසි.

3351. භින්නානි කට්ඨානි හුතො ච අග්ගි
තපනීපි[6] තෙ සමිතා බ්‍රහ්මචාරි,
පීඨඤ්ච මය්හං උදකඤ්ච හොති
රමසි ත්වං බ්‍රහ්මභූතො පුරත්ථා.

3352. අභින්නකට්ඨොසි අනාභතොදකො
අහාසිතග්ගීසි අසිද්ධභොජනො,
න මෙ තුවං ආලපසී මමජ්ජ
නට්ඨන්නු කිං චෙතසිකඤ්ච දුක්ඛං.

1. මය්හං - වි. මජසං.
2. බහූතා - මජසං.
3. අහෙසුං - මජසං.
4. සයානුකාහෙ - මජසං.
5. නහාපිතො - මජසං.
6. තපනීපිතො - මජසං

3345. එහි අඹ ගස් ද සල් ගස් ද එරහැන්ද ගස් ද දඹ ගස් ද ඇහැළ ගස් ද පළොල් ගස් ද පිපියාහු වෙත්. හාත්පසින් කිඳුරන් විසින් ගායනා කරන ලද්දේ වේ. අනේ පින්වතා මාගේ ආශ්‍රමය දක්නේ නම් යෙහෙක.

3346. මෙහි පැහැයෙන් සහ සුවඳින් යුත් තල්ගස් ද තල් අල ද තල් ගෙඩි ද ඇත්තාහ. ඒ ආශ්‍රමය මෙබඳු භූමිභාගයකින් යුක්තය. අනේ පින්වතා මාගේ ආශ්‍රමය දක්නේ නම් යහපති.

3347. මෙහි පැහැයෙන් ද සුවඳින් හා රසයෙන් ද යුත් පලතුරු ද අල මුල් ද බොහෝ ය. ඒ ප්‍රදේශයට වැද්දෝ ද එන්නාහ. ඒ ආශ්‍රමයෙන් ඔවුහු අල මුල් හා පලතුරු හැරගෙන නො යත්වා යි (නලිනිය ප්‍රකාශ කළා ය.)

3348. මාගේ පියා අල මුල් හා පලතුරු සෙවීමට ගියේ ය. සවස් කාලයෙහි දැන් එන්නේ ය. පියා අල මුල් හා පලතුරු සොයා ගෙනා එනතුරු බලව. (එවිට) අපි දෙදෙනා ම ඒ ආශ්‍රමයට යමුයි (තාපසයා කීයේය.)

3349. තාපසය, තවත් බොහෝ යහපත් සවභාව ඇත්තා වූ බ්‍රාහ්මණ ඍෂීහු ද රාජර්ෂීහු ද මාගේ ආශ්‍රමයට යන මාර්ගයෙහි දෙපස වසන්නාහ. නුඹ මාගේ ආශ්‍රමයට යන මග ඔවුන් විචාරා දනුව. ඒ ඍෂිවරු තොප මාගේ අසපුවට පමුණුවන්නා හ. (කියා නලිනී ගියා ය.)

3350. (පුත්‍රය,) තා විසින් දර නොකඩන ලද. දිය නො ගෙනෙන ලද. පූජාග්නිය නො දල්වන ලද. කුමක් නිසා බාලයකු මෙන් සිතුවිල්ලෙහි යෙදී සිටිනෙහිද ?

3351. බ්‍රහ්මචාරී තාපසය, පෙර නුඹ විසින් දර බිඳින ලදහ. පූජාග්නිය ද දල්වන ලද්දේ ය. ගිනි තපින උපකරණ ද තා විසින් ම සපයන ලද්දහ. මාගේ පුටුව ද එළවා තබන ලද්දේ වෙයි. පා දෝනා දිය ද එළවන ලද්දේ ය. නුඹ ද මෙයින් පෙර ශ්‍රේෂ්ඨයෙක් ව මේ ආශ්‍රමයෙහි සිත් ඇලවූවෙහි ය.

3352. ඒ නුඹ අද නොකැඩූ දර ඇත්තෙහි ය. දිය නො-ගෙනායෙහි ය. නොදල්වන ලද පූජාග්නි ඇත්තෙහි ය. පිළියෙළ නොකරන ලද ආහාර ඇත්තෙහි ය. අද නුඹ මා හා කතා නො කරන්නෙහි ය. නුඹගේ යම් කිසිවක් නැතිවී ද? කවර නම් චෛතසික දුකක් ඇත්තෙහි ද? (යි පිය තාපසයා ප්‍රශ්න කළේ ය.)

3353. ඉධාගමා ජටිලො බ්‍රහ්මචාරී
සුදස්සනෙය්‍යො සුතනු විනෙති,
නෙවාතිදීඝො නපනාතිරස්සො
සුකණ්හකණ්හච්ඡදනෙහි භොතො.

3354. අමස්සුජාතො අපුරාණවණ්ණී
ආධාරරූපඤ්ච පනස්ස කණ්ඨෙ,
ද්වෙපස්ස[1] ගණ්ඩා උරෙ සුජාතා
සුවණ්ණපිණ්ඩූපනිභා[2] පභස්සරා.

3355. මුඛඤ්ච තස්ස භුස[3]දස්සනෙය්‍යං
කණ්ණෙසු ලම්බන්ති ච කුඤ්චිතග්ගා,
තෙ ජොතරෙ චරතො මාණවස්ස
සුත්තඤ්ච යං සංයමනං ජටානං.

3356. අඤ්ඤා ච තස්ස සඤ්ඤමනී චතස්සො
නීලා පීතා ලොහිතිකා ච සෙතා,
තා සංසරෙ චරතො මාණවස්ස
චිරීටිසඞ්ඝාරිව පාවුසම්හි.[4]

3357. න මෙඛලං[5] මුඤ්ජමයං ධරෙති
න සන්තචෙ[6] නො පන බබ්බජස්ස,[7]
තා ජොතරෙ ජඝනන්තරෙ[8] විසත්තා
සතෙරිතා විජ්ජුරිවන්තලික්ඛෙ.

3358. අඛීලකානි ච අවණ්ටකානි
හෙට්ඨා නභ්‍යා[9] කටිසමොහිතානි,
අඝට්ටිතා නිච්චකීළිං කරොන්ති
හං තාත කිං රුක්ඛඵලානි තානි.

3359. ජටා ච තස්ස භුසදස්සනෙය්‍යා
පරොසතං වෙල්ලිතග්ගා සුගන්ධා,
ද්වෙධාසිරො සාධුවිභත්තරූපො
අහො නු ඛො මය්හ තථා ජටාස්සු.

3360. යදා ච සො පකිරති තා ජටායො
වණ්ණෙන ගන්ධෙන උපෙතරූපා,
නීලුප්පලං වාතසමෙරිතංව
තථෙව සංවාති වනස්සමො අයං.

---

1. වෙයමාගන්ධා – මජසං.
වෙයමාගණ්ඩා – ස්‍යා.
2. සුවණ්ණතිණ්ඩුක නිභා – මජසං.
3. භුසං – මජසං
4. තාවිංසරෙ – මජසං.
5. න මිඛලං – මජසං,
6. නසන්තරෙ නො – මජසං.
7. පබ්බජස්ස – සී.
8. ජඝනනන්තරෙ – මජසං.
9. නභ්‍යා – මජසං.

3353. (පියාණෙනි,) ජටාධර වූ බ්‍රහ්මචාරී තාපසයෙක් මෙහි පැමිණියේ ය. ඉතා දකුම්කලු ශරීරයක් ඇත්තා වූ හෙතෙම මේ අසපුව බබුළුවයි. ඉතා දික් නොවුයේ ද ඉතා මිටි නොවුයේ ද වේ. ඒ පින්වත් තාපසයාගේ හිස වනාහි ඉතා කළු පැහැත්තා වූ කෙස්වලින් වැසුණේ ය.

3354. හෙතෙමේ රැවුල නැත්තේ ය. පැවිදි වූ නොබෝ කල් ඇත්තේ ය. ගෙලෙහි පාත්‍රාධාරය තරම් පළඳනාවක් ඇත්තේ ය. ළයෙහි හටගත් රන්පිඬු මෙන් බබළන ගෙඩි දෙකක් ද ඔහුට ඇත.

3355. ඔහුගේ මූන ඉතාම දකුම් කලුය. කන් දෙකෙහි අගින් නැමී ගිය යම් කිසිවක් එල්ලෙයි. හැසිරෙන්නාවූ ඒ මාණවකයාගේ ජටා එක්කොට බැඳි තුල ද බබළන්නේ ය.

3356. නිල් – කහ – ලේ – සුදු යන වශයෙන් සිව් වැදෑරුම් වර්ණයන් ඇති තවත් ආභරණ සතරක් තිබේ. එහා මෙහා යන්නා වූ මාණවකයාගේ ඒ පළඳනාවෝ වර්ෂා කාලයෙහි රැහි සමූහයා මෙන් නාද කෙරෙත්.

3357. හෙතෙම මුදු තණින් කළ මෙවුල් දම් නොදරයි. වැහැරිවලින් වියන ලද මෙවුල් දම් ද නොදරයි. බබුස් තණයෙන් කළ මෙවුල් දම් ද නොදරයි. උකුළු අතරෙහි වෙසෙසින් ඇලුණාවූ ඔහුගේ වැහැරි අහස් හි සියරැලි විදුලියක් සේ බබළ යි.

3358. (පියාණෙනි,) ඔහුගේ නාභියෙන් යට ඉණෙහි බඳනා ලද්දවූත් සව් නොකරන ලද්දවූත් නැටටක් නැත්තාවූත් එලයෝ වෙති. නො ගටන ලද ඒ එලයෝ නිතර කිළිං යන අනුකරණය කෙරෙත්. පින්වත් පියාණෙනි, ඒ කවර ගස්වල එල ද?

3359. (පියාණෙනි,) ඔහුගේ ජටාව ද බොහෝ සෙයින් දකුම් කලුය. සියයකටත් වඩා වක්වූ අග්වලින් යුක්තවූවා සුවඳවත් ය. හිස දෙකොටසකට බෙදු මනාකොට බඳින ලද ජටා ඇත්තේ ය. මගේ ජටාවද එසේ වන්නේ නම් යහපති.

3360. යම් කලෙක්හි හෙතෙම වර්ණයෙන් හා සුවඳින් යුතුවූ ඒ ජටාවන් විසුරුවා ද, එකල්හි වාතයෙන් කම්පා කරන ලද නිලුපුල් වනයක් මෙන් මේ වන අසපුව ද සුවඳ හමන්නේය.

3361. පඞ්කා ච තස්ස භුසදස්සනෙය්‍යා
නෙතාදිසො යාදිසො මය්හකායො,
සො වායති එරිතො මාලුතෙන
වනං යථා අග්ගගිම්හෙ සුඵුල්ලං.

3362. නිහන්ති සො රුක්ඛඵලං පථබ්‍යා
සුචිත්තරූපං රුචිරං දස්සනෙය්‍යං,
ඛිත්තඤ්ච තස්ස පුනරෙති හත්ථං
හං තාත කිං රුක්ඛඵලං නු ඛො තං.

3363. දන්තා ච තස්ස භුසදස්සනෙය්‍යා
සුද්ධා සමා සඞ්ඛවරූපපන්නා,
මනො පසාදෙන්ති විවරියමානා
නහ නූන සො සාකමඛාදි තෙහි.

3364. අකක්කසං අගළිතං[1] මුහුං මුදුං
උජුං අනුද්ධතං අචපලමස්ස භාසිතං,
රුදං මනුඤ්ඤං කරවීකසුස්සරං
හදයඞ්ගමං රඤ්ජයතෙව මෙ මනො.

3365. බින්දුස්සරො නාතිවිසට්ඨවාක්‍යො
න නූන සජ්ඣායමතිප්පයුත්තො,
ඉච්ඡාමි ඛො[2] තං පුනරෙව[3] දට්ඨුං
මිත්තං හි මෙ මාණවාහු පුරත්ථා.

3366. සුසන්ධි සබ්බත්ථ විමට්ඨිමං වණං
පුථූ සුජාතං ඛරපත්තසන්නිභං,
තෙනෙව මං උත්තරියාන මාණවො
විවරිය ඌරුං ජඝනෙන පීළයි.

3367. තපන්ති ආභන්ති විරොචරෙ ච
සතෙරතා විජ්ජුරිවන්තලික්ඛෙ,
බාහා මුදූ අඤ්ජනලොමසාදිසා
විචිත්‍රවට්ටඞ්ගුලිකාස්ස සොභරෙ.

3368. අකක්කසඞ්ගො න ච දීඝලොමො
නඛස්ස දීඝා අපි ලොහිතග්ගා,
මුදූහි බාහාහි පලිස්සජන්තො
කල්‍යාණරූපො රමයං උපට්ඨහි.

1. අගගලිතං – මජසං.
2. හො – මජසං.
3. පුනදෙව – මජසං.

3361. ඔහුගේ ඉතා දකුම්කලු කය මාගේ කයමෙන් මඩ සහිත (කිලුටු) නොවේ. හෙතෙම සුලඟින් කම්පා කරන ලද්දේ වසන්ත කාලයෙහි මනාව පිපි වනයක් මෙන් සුවඳ හමන්නේ ය.

3362. හෙතෙම ඉතා විසිතුරු මන වඩන්නාවූ දකුම්කලු වෘක්ෂඵලයක් පොළොවෙහි ගසයි. පොළොවෙහි ගසන ලද ඒ ඵලය නැවත ඔහුගේ අතට පැමිණෙයි. පින්වත් පියාණෙනි, එය කිනම් ගසක ඵලයක් ද?

3363. ඔහුගේ දන්තයෝ ද ඉතා දකුම්කලු වූවාහු සුදු පැහැ ඇත්තාහු මනාකොට සෝදන ලද්දු වූ හක් ගෙඩියක් බඳු වූවාහු විවෘත කරනු ලබන්නාහු සිත පහදවත්. (අප මෙන්) ඒ තරුණ තෙම ඒ දත්වලින් පලා අනුභව නොකෙළේ වනැයි ඒකාන්තයෙන් හඟිමි.

3364. ඔහුගේ වචනය රළු නොවේ. ගොත ගසන්නේ නොවෙයි. නැවත කියන්නේ ද ඉතා මෘදුය, ඍජුය, තැන්පත්ය, අචපලය, කුරවිකෙවිල්ලන්ගේ මෙන් ඉතා මිහිරිය. හෘදයඞ්ගමය, මගේ සිත එහි ඇලේ ම ය.

3365. විනිඳී නොගිය වාක්‍ය ඇත්තේ අප්‍රකට ස්වරයෙන් යුක්තය. හෙතෙමේ හැදෑරීමෙහි ඉතා යෙදුනෙක් නොවේ. ඔහු නැවත දැකීමට මම කැමැත්තෙමි. ඒ මාණවක තෙම පළමු මාගේ මිත්‍රයා විය.

3366. මනා ගැළපීම් ඇති සියලු තන්හි විශේෂයෙන් වටවූ විශාල ලෙස මනාව හටගත්තා වූ නෙලුම් කැකුළකට බඳු වූ ඔහුගේ වණයක් වෙයි. ඒ තරුණ තෙමේ මා වසා මැඩ ගෙන ඌරු යුග්මය විවෘත කොට කටියෙන් මා පෙළවේ ය.

3367. ඒ මානවකයාගේ සිරුරෙන් නික්මෙන්නා වූ රශ්මිහු අහස් හි සියරැලි විදුලි මෙන් දිලිසෙත්. ආලොකවත් වෙත්. බබළත්. ඔහුගේ බාහුව ද අඳුන්වන් ලොම් වැනි ලොම් ඇත්තේ මෘදු වූයේ විසිතුරු වූ ද වට වූ ද ඇඟිලිවලින් යුක්තව බබළ යි.

3368. ඒ මාණවක තෙම කර්කශ නොවූ ශරීරාවයව ඇත්තේ නොදික් ලොම්වලින් යුක්තය. ඔහුගේ නිය දික් වූයේ නමුත් අග රතු පැහැයෙන් යුතුය. යහපත් ස්වභාව ඇති හෙතෙම මෘදු අත්වලින් මා වැළඳ ගෙන අභිරමණය කරවමින් මට උපස්ථාන කෙළේ ය.

3369. දුමස්ස තූලූපනිභා පභස්සරා
සුවණ්ණකම්බූතලවට්ටසුච්ඡවී,
හත්ථා මුදූ තෙහි මං සම්ඵුසිත්වා
ඉතො ගතො තෙන මං දහන්ති තාත.

3370. නහ නූන සො ඛාරිවිධං අභාසි
න නූන කට්ඨානි සයං අභඤ්ජි,
න නූන සො හන්ති දුමෙ කුඨාරියා
න පිස්ස හත්ථෙසු ඛීලානි අත්ථි.

3371. අච්ඡා ච ඛො තස්ස වණං අකාසි
සො මං බ්‍රවී සුඛිතං මං කරොහි,
තාහං කරිං තෙන මමාසි සොඛ්‍යං
සො මං බ්‍රවී සුඛිතොස්මීති බ්‍රහ්මෙ.

3372. අයඤ්ච තෙ මාලුවපණ්ණසන්ථතා
විකිණ්ණරූපාව මයා ච තෙන ච,
කිලන්තරූපා උදකෙ රමිත්වා
පුනප්පුනං පණ්ණකුටිං වජාම.

3373. න මජ්ජ මන්තා පටිභන්ති තාත
න අග්ගිහුත්තං නපි යඤ්ඤතන්ත්‍රං,
න චාපි තෙ මූලඵලානි භුඤ්ජෙ
යාව න පස්සාමි තං බ්‍රහ්මචාරිං.

3374. අද්ධා පජානාසි තුවම්පි තාත
යස්සං දිසායං වසතෙ බ්‍රහ්මචාරී,
තං මං දිසා පාපය තාත ඛිප්පං
මා තෙ අහං අමරිං අස්සමම්හි.

3375. විචිත්‍රපුප්ඵං හි වනං සුතං මයා
දිජාභිඝුට්ඨං දිජසඞ්ඝසෙවිතං,
තං මං වනං පාපය තාත ඛිප්පං
පුරා තෙ පාණං විජහාමි අස්සමෙ.

3376. ඉමස්මාහං ජොතිරසෙ වනම්හි
ගන්ධබ්බදෙවච්ඡරසඞ්ඝසෙවිතෙ,
ඉසීනමාවාසෙ සනන්තනම්හි
නෙතාදිසං අරතිං පාපුණෙථ.

3369. ගසක පුළුන් වැනි සුවපහස් ඇති පැහැ විහිදෙන්නා වූ රන්මුවා කැටපතක් සේ වට වූ ද යහපත් ඊවියක් ඇත්තා වූ ද හස්තයෝ ඒ තරුණයාහට ඇත්තා හ. ඒ අත්වලින් මා වැළඳ ගෙන සිය පහස මා සිරුරෙහි පතුරුවා මෙතැනින් ගියේ ය. පියාණෙනි, ඒ ස්පර්ශයෝ මා දවත් (යයි ඉසිසිංග තවුසා කීයේ ය.)

3370. පියාණෙනි, ඒ මාණවක තෙම ඒකාන්තයෙන් ම තවුස් පිරිකර ගෙන නොගියේ වන. තෙමේ කාෂ්ඨයන් නොබින්දේ යයි හඟිමි. හෙතෙම පොරොවෙන් ගස් නො කැපුයේ යයි හඟිමි. ඔහුගේ අත්වල කරගැට නැත.

3371. ඔහුට වලසෙක් වණයක් ඇති කෙළේ ය. ඒ වණය සුව කරන්නට යැයි හෙතෙම මට කීයේ ය. එය මම කෙළෙමි. එයින් මට ද සැපයක් විය. "බ්‍රාහ්මණය, මම සුවපත් කරන ලද්දෙමි" යි හෙතෙම මට ප්‍රකාශ කෙළේ ය.

3372. (පියාණෙනි,) නුඹ වහන්සේගේ මේ මාලුවා පත්‍රමය ආස්තරණය ද ඔහු විසින් හා මා විසිනුත් විසුරුවන ලද පරිදිමය. ක්ලාන්ත ස්වභාව ඇති වූයෙමි. ජලයෙහි රමණය කොට නැවත නැවතත් පන්සලට වැදුණෙමි.

3373. පියාණෙනි, මට අද මන්ත්‍ර නො වැටහේ. ගිනි පිදීම ද නො වැටහේ. යාග කිරීම ද නො වැටහේ. නුඹ වහන්සේ විසින් ගෙනෙන ලද අල මුල් පලතුරු ද ඒ තාපසයා දකිනතුරු නො බුදිමි.

3374. පියාණෙනි, නුඹ ද ඒ තාපසයා වාසය කරන දිසාව දන්නෙහි නම්, පියාණෙනි, ඒ මා ඒ දෙසට වහා පමුණුවනු මැනවි. මම නුඹ වහන්සේගේ ආශ්‍රමයෙහි නො මැරෙම්වා (යි තාපසයා කීවේ ය.)

3375. පියාණෙනි, ඒ ආශ්‍රමය විසිතුරු මල් ඇත්තෙක. පක්ෂීන් විසින් කරන ලද නාද ඇත්තෙක. පක්ෂි සමූහයා විසින් සෙවුනා ලද යි මා විසින් අසන ලදී. පියාණෙනි, නුඹ වහන්සේගේ අසපුවෙහි මා මැරෙන්ට ප්‍රථම ඒ වනයට පමුණුවන සේක්වා' යි (තාපසයා කීයේ ය.)

3376. හොමාග්නියෙන් බබළන ගාන්ධර්වයන් හා දිව්‍යාප්සරා සමූහයා විසින් සෙවුනා ලද ඉතා පුරාණ වූ ඍෂීන්ගේ වාසභූමිය වන මේ අසපුවෙහි කිසිවෙක් මෙබඳු නො ඇල්මකට නො පැමිණියේය.

3377. භවන්ති මිත්තානි අථො න හොන්ති
ඤාතීසු මිත්තෙසු කරොන්ති පෙමං,
අයඤ්ච ජම්මො කිස්ස වා නිවිට්ඨො
යො නෙව ජානාති කුතොම්හි ආගතො.

3378. සංවාසෙන හි මිත්තානි සන්ධියන්ති පුනප්පුනං,
සෙව මිත්තො අසඞ්ගන්තු අසංවාසෙන ජීරති.

3379. සචෙ තුවං දක්ඛසි බ්‍රහ්මචාරිං
සචෙ තුවං සල්ලපි[1] බ්‍රහ්මචාරිනා,
සම්පන්නසස්සං ච මහොදකෙන
තපොගුණං ඛිප්පමිමං පහස්සසි.[2]

3380. පුනපි චෙ දක්ඛසි බ්‍රහ්මචාරිං
පුනපි චෙ සල්ලපෙ බ්‍රහ්මචාරිනා,
සම්පන්නසස්සං ච මහොදකෙන
උස්මාගතං ඛිප්පමිමං පහස්සසි.[3]

3381. භූතානි හෙතානි චරන්ති තාත
විරූපරූපෙන මනුස්සලොකෙ,
න තානි සෙවෙථ නරො සපඤ්ඤො
ආසජ්ජ නං නස්සති බ්‍රහ්මචාරීති,

නළිනිකාජාතකං.

2. උම්මාදන්තීජාතකං

3382. නිවෙසනං කස්ස නුදං සුනන්ද
පාකාරෙන පණ්ඩුමයෙන ගුත්තං,
කා දිස්සති අග්ගිසිඛාව දූරෙ
වෙහාසයං[4] පබ්බතග්ගෙව අච්චි.

3383. ධීතාන්‍යං කස්ස සුනන්ද හොති
සුණිසාන්‍යං කස්ස අථොපි භරියා,
අක්ඛාහි මෙ ඛිප්පමිධෙව පුට්ඨො
අවාවටා යදි වා අත්ථි භත්තා.

3384. අහං හි ජානාමි ජනින්ද එතං
මත්‍යා ච පෙත්‍යා ච අථොපි අස්සා,
තවෙව සො පුරිසො භූමිපාල
රත්තින්දිවං අප්පමත්තො තවත්ථෙ.

1. සල්ලපෙ – වි. මජසං.
2. පහිය්‍යසි – මජසං.
3. පහිය්‍යසි – මජසං.
4. වෙහායසං – මජසං. සනා.

3377. ලොව සමහරුන්හට මිත්‍රයෝ වෙති. සමහරුන්හට මිත්‍රයෝ නොවෙත්. ඔවුන්ගෙන් සමහරු නෑයන් කෙරෙහි ද සමහරු මිත්‍රයන් කෙරෙහි ද ප්‍රෙම කරත්. යම් මේ (ඉසිසිංග) තාපසයෙක් වේද, හේ කොයින් ආයෙම්ද යි තමා ගැනත් නො දනී. (එසේ වූ මොහු කුමක් හෙයින් මේ මාගම කෙරෙහි මිත්‍රයාය යන හැඟීමෙන් ඇතුළත් වී ද යි සිතුවේ ය.)

3378. පුත්‍රය, එක්ව වාසය කිරීමෙන් වනාහි මිත්‍රයෝ නැවත නැවත එක්වෙත්. ඒ මිත්‍ර තෙමේ එක් වැ වාසය නොකිරීමෙන් ම විනාශ වේ.

3379. පුත්‍රය, ඉදින් නුඹ ඒ බ්‍රහ්මචාරියා දක්නෙහි නම් බ්‍රහ්ම-චාරියා සමග සල්ලාප කරන්නෙහි නම් සමෘද්ධ වූ ශස්‍යයන් මහ දිය පාරකින් ගසාගෙන යන්නාක් මෙන් මේ තපොගුණය වහා ම පැහැර ගන්වන්නෙහි ය.

3380. ඉදින් නුඹ නැවතත් ඒ බ්‍රහ්මචාරියා දක්නෙහි නම් නැවතත් ඒ බ්‍රහ්මචාරියා සමග සල්ලාප කරන්නෙහි නම් සමෘද්ධ වූ ශස්‍යයන් මහදිය පාරකින් ගසාගෙන යන්නාක් මෙන් මේ ශ්‍රමණ තෙජස වහා පැහැර ගන්වන්නෙහි ය.

3381. පුත්‍රය, මනුෂ්‍ය ලොකයෙහි විරූප ස්වභාවයෙන් (මේ යක්ෂිණී සංඛ්‍යාත) භූතයෝ හැසිරෙත්. නුවණැති මිනිසා ඒ භූතයන් සේවනය නො කරන්නේය. බ්‍රහ්මචාරී තාපස තෙම ඒ භූතයාට ළංව නස්නේයයි (තාපස තෙම පුත්‍රයාට අවවාද කෙළේ යැයි වදළ සේක.)

නලිනිකා ජාතක යි.

2. උම්මාදන්ති ජාතකය

3382. එම්බා සුනන්ද නම් සාරථිය, රතුගඩොළුමුවා පවුරෙන් ආරක්‍ෂා කරන ලද මේ ගෙය කාගේ ද? කඳු මුදුනක අහස්හි බබළන ගිනිකඳක් මෙන් ද දුර පිහිටි ගිනිසිළක් මෙන් ද, කවරක් බබළා ද?

3383. සුනන්දය, මෝ තොමෝ කවරකුගේ දුවක් ද? කවරකුගේ ලේලියක් ද? කවරකුගේ බිරියක් ද? විචාරන ලද්ද වූ මට වහා ම මෙහි දී ම කියව. මැයට යම් කිසිවකුගේ රැකවරණයක් ඇත්තේ ද? නැතහොත් ස්වාමිපුරුෂයෙක් ඇත්තේ ද යන බව මට කියව (යි රජ තෙම කීයේ ය.)

3384. රජතුමනි, මැයගේ මව්පසින් ද පියපසින් ද කිවහැකි තොරතුරු මම දනිමි. පෘථිවිපාලක රජතුමනි, රෑ දවල් දෙක්හි නුඹ වහන්සේ සඳහා අප්‍රමාද ව ක්‍රියා කරන්නා වූ ඒ පුරුෂ තෙම නුඹ වහන්සේගේ ම සේවකයෙකි.

3385. ඉද්ධො ච ඵීතො ච සුවඩ්ඪි[1]තො ච
අමච්චො ච තෙ අඤ්ඤතරො ජනින්ද,
තස්සෙසා[2] භරියා අභිපාරකස්ස
උම්මාදන්ති[3] නාමධෙය්‍යෙන රාජ.

3386. අම්භො අම්භො නාමමිදං ඉමිස්සා
මත්‍යා ච පෙත්‍යා ච කතං සුසාධු,
තථා හි[4] මය්හං අවලොකයන්තී
උම්මත්තකං උම්මදන්තී අකාසි.

3387. යා පුණ්ණමාසෙ මිගමන්දලොචනා
උපාවිසි පුණ්ඩරීකත්තචඞ්ගී,
ද්වෙ පුණ්ණමායො තදහූ අමඤ්ඤහං
දිස්වාන පාරාවතරත්තවාසිනිං.

3388. අළාරපම්හෙහි සුභෙහි වග්ගුහි
පලොභයන්තී මං යදා උදික්ඛති,
විජම්භමානා හරතෙව මෙ මනො
ජාතා වනෙ කිම්පුරිසීව පබ්බතෙ.

3389. තදා හි බ්‍රහතී සාමා ආමුත්තමණිකුණ්ඩලා,
එකච්චවසනා නාරී මිගී භන්තාවුදික්ඛති.

3390. කදාස්සු මං තම්බනඛා සුලොමා
බාහා මුදූ චන්දනසාරලිත්තා,
වට්ටඞ්ගුලී සන්නතධීරකුත්තියා
නාරී උපඤ්ඤිස්සති සීසතො සුභා.

3391. කදාස්සු මං කඤ්චනජාලුරච්ඡදා
ධීතා තිරීටිස්ස විලාකමජ්ඣා,
මුදූහි බාහාහි පලිස්සජිස්සති
බ්‍රහාවනෙ ජාතදුමංව මාලුවා.

3392. කදාස්සු ලාඛාරසරත්තසුච්ඡවී
බින්දුත්ථනී පුණ්ඩරීකත්තචඞ්ගී,
මුඛං මුඛෙන උපනාමයිස්සති
සොණ්ඩොව සොණ්ඩස්ස සුරාය ථාලං.

---

1. සුවඩ්ඪී - මජ්සං.
2. තස්සෙව - මජ්සං. ස්‍යා.
3. උම්මාදයන්තීති - මජ්සං.
උම්මාදන්තීති - ස්‍යා.
4. තදහි - මජ්සං.

3385. ජනාධිපතිතුමනි, සම්පත්තින් සමෘද්ධ වූ වස්ත්‍රාලංකාරාදියෙන් පිරුණා වූ ආඪ්‍ය වූ එක්තරා අමාත්‍යයෙක් නුඹ වහන්සේට ඇත. රජතුමනි, උම්මාදන්ති යන නාමයක් ඇති මෝ තොමෝ අභිපාරක නම් වූ ඔහුගේ භාර්‍ය්‍යාව ය.

3386. පින්වත, පින්වතඃ, මැයගේනම මව්පියන් විසින් මනා කොට තබන ලද්දකි. ඒ එසේ ම ය. මා දෙස බලන්නී වූ උම්මාදන්ති තොමෝ මා උමතුවකු කළා ය.

3387. පූර්ණ චන්ද්‍රයාගෙන් යුත් රාත්‍රියෙහි මුව දෙනක මෙන් මද බැලුම් ඇත්තා වූ රන්පියුමකට බඳු සිවියක් ඇති යම් තැනැත්තියක් තොමෝ (කවුළුව සමීපයෙහි) හුන්නී ද, පරවියන්ගේ පා වැනි වර්ණ ඇති වස්ත්‍ර හැඳි ඇය දුක එදවස්හි චන්ද්‍රයෝ දෙදෙනෙක් වූහ යි සිතුවෙමි.

3388. යම් දිනෙක ඕ තොමෝ මා පොළඹවමින් යහපත් වූ ද විශාල වූ ද ඇස්වලින් මා දෙස බැලූ ද, එවිට කම්පාවට පත් ඕ තොමෝ වනයෙහි වූ පර්වතයෙක්හි උපන් කිඳුරු දෙනක මෙන් මාගේ සිත පැහැර ගත්තා ම ය.

3389. එකල්හි මහත් වූ රන් මෙන් ශ්‍යාමවර්ණ වූ පලඳන ලද මිණිකොඩොල් ඇති එක් වස්ත්‍රයක් හැන්ද වූ ඒ ස්ත්‍රී තොමෝ භ්‍රාන්ත වූ මුව දෙනක මෙන් මා දෙස බැලුවා ය.

3390. තඹවන් නිය ඇති යහපත් ලොම් ඇති මොළොක් වූ අත්වලින් යුත් සඳුන්කල්ක ගල්වන ලද වට ඇඟිලි ඇත්තා වූ යහපත් වූ ඒ ස්ත්‍රී තොමෝ කවද නම් හිස පටන් යහපත් ලෙස ස්පර්ශ කිරීමෙන් දක්ෂ ව ක්‍රියා කොට මා තුටු කරන්නීද යි (කියමින් රජ තෙම වැලැපුණේ ය.)

3391. කවර කලෙක්හි රන්මය උර වැස්මෙන් අලංකාර වූ කෘශ වූ මධ්‍යප්‍රදේශ ඇති තිරිටි නම් සිටුහුගේ දියණි තොමෝ විශාලවනයෙහි හටගත් වෘක්ෂයක් මාලුවා වැලක් (වැළඳ ගන්නාක්) මෙන් මා වැළඳ ගන්නී ද.

3392. කවර කලෙක්හි ලාක්ෂාරස පොවන ලද්දක් සේ මනා සිවි ඇත්තා වූ දියබුබුළු මෙන් වට වූ පයෝධර ඇත්තා වූ රත් නෙළුම් බඳු පැහැති ශරීරවර්ණ ඇති ඕ තොමෝ රා සොඬකුහට අන් රා සොඬකු සුරා තැටියක් එළවන්නා සේ මුඛයෙන් මුඛයට ළං වන්නී ද—

3393. යදද්දසං තං තිට්ඨන්තිං සබ්බභද්දං මනොරමං,
තතො සකස්ස චිත්තස්ස නාවබොධාමි කඤ්චිනං.

3394. උම්මාදන්තිමහං දිට්ඨා ආමුක්කමණිකුණ්ඩලං,
න සුපාමි දිවාරත්තිං සහස්සංව පරාජිතො.

3395. සක්කො ච මෙ වරං දජ්ජා සො ච ලබ්භෙථ මෙ වරො,
එකරත්තං දිරත්තං වා භවෙය්‍යං අභිපාරකො
උම්මාදන්ත්‍යා රමිත්වාන සිවිරාජා තතො සියං.

3396. භූතානි මෙ භූතපතී නමස්සතො
ආගම්ම යක්ඛො ඉදමෙවමබ්‍රවි,[1]
රඤ්ඤො මනො උම්මදන්ත්‍යා නිවිට්ඨො
දදාමි තෙ තං පරිචාරයස්සු.

3397. පුඤ්ඤා විධංසෙ[2] අමරො න චම්හි
ජනො ච මෙ පාපමිදඤ්ච ජඤ්ඤා,
භුසො ච ත්‍යස්ස මනසො විඝාතො
දත්වා පියං උම්මදන්තිං අදිට්ඨා.

3398. ජනින්ද නාඤ්ඤත්‍ර තයා මයා වා
සබ්බාපි කම්මස්ස කතස්ස ජඤ්ඤා,
යන්තෙ මයා උම්මදන්තී පදින්නා
භුසෙහි රාජා වනථං සජාහි.

3399. යො පාපකං කම්මකරං මනුස්සො
සො මඤ්ඤති මායිදං මඤ්ඤිංසු අඤ්ඤෙ,
පස්සන්ති භූතානි කරොන්තමෙතං
යුත්තා ච යෙ හොන්ති නරා පථබ්‍යා.

3400. අඤ්ඤො නු තෙ කොචි නරො පථබ්‍යා
සද්දහෙය්‍ය[3] ලොකස්මිං න මෙ පියාති,
භුසො ච ත්‍යස්ස මනසො විඝාතො
දත්වා පියං උම්මදන්තිං අදිට්ඨා.

3401. අද්ධා පියා මය්හ ජනින්ද එසා
න සා මම අප්පියා භූමිපාල,
ගච්ඡෙව ත්වං උම්මදන්තිං භදන්තෙ
සීහොව සෙලස්ස ගුහං උපෙති.

---

1. ඉදමෙතදබ්‍රවි - වි. මජසං. සයා.
2. පුඤ්ඤ වධංසෙ - මජසං.
පුඤ්ඤා ච. ධංසෙ - සයා.
3. සද්ධෙය්‍ය - වි. මජසං.

3393. යම් දිනෙක සිත්කලු වූ සියලු ශරීරාවයව ඇතිවැ සිටුනා ඇය දුක්කෙම් ද, එද පටන් සිය සිත පිළිබඳ කිසිවක් මම නො දනිමි.

3394. පළඳනා ලද මිණිකොඩොල් ඇති උම්මාදන්තී නම් තැනැත්තිය මම දුටුවෙමි. ඒ මොහොතේ සිට මම දහසකින් පැරදුනකු සේ රෑ දවල් නිදි නො ලබමි.

3395. ඉදින් ශක්‍ර තෙමේ මට වරයක් දෙන්නේ නම් මම ඒ වරය ලබමි. (කිනම් වරයක් ද යත් :) එක් රැයක් හෝ දෙරැයක් මම අභිපාරක වන්නෙම්වා. එසේ අභිපාරක වී උම්මාදන්තිය සමග අභිරමණය කොට ඉන්පසු සිවිරජ වෙම්වා (යන මේ වරය යි.)

3396. මහරජ, බිලියම් පිණිස භූතයන් වඳින්නා වූ මට යක්ෂයෙක් අවුත් රජුගේ සිත උම්මාදන්ති ය කෙරෙහි පිහිටියේ ය යන මෙය මෙසේ කීවේ ය. ඔබට ඒ උම්මාදන්ති ය දෙමි. ඇය පරි-චාරිකාව කර ගනුව (යි ඇමති තෙම කීවේ ය.)

3397. යහළු අභිපාරකය, එසේවීනම් මම පිනෙන් පිරිහෙමි. ඇය සමග කෙලෙස් සසඟින් විසූ පමණින් අමරණීය ද නො වෙමි. මහජනයා ද මාගේ මේ ලාමක කමැයි දැන ගන්නේ ය. ප්‍රිය වූ උම්මාදන්තිය නොදක්මෙන් තොපගේ සිතට ද මහත් දුකෙක් ඇති වන්නේ ය.

3398. මහරජ, නුඹ වහන්සේත් මාත් හැර සියලු ප්‍රජාව ම නුඹ වහන්සේට උම්මාදන්ති ය දෙන ලද්දී ය යන කරුණ නොදන්නේ ය. එහෙයින් රජ තෙමේ (ඇය සමග සිත් අලවා වෙසෙමින්) මනදෙළ සපුරා ගනීවා. ඉන්පසු නුඹ වහන්සේ නොරුස්නාහු නම්, ඇය මාහට ම දෙනු මැනවි.

3399. (අභිපාරකය,) පව්කම් කරන යම් මිනිසෙක් වේ නම්, "මා කරන පව්කම් අන්‍යයෝ නො දැන ගනිත්වා" යි හෙ තෙමෙ සිතයි. එහෙත් ලොකයෙහි (බුදු - පසේ බුදු) ඈ ඉදුබල ඇති මනුෂ්‍යයෝත් භූතයෝත් ඒ පාපකර්ම කරන්නහු දකිත්.

3400. (අභිපාරකය,) ලෝකයෙහි කිසියම් මිනිසෙක් මට උම්මදන්ති ය ප්‍රිය නැතැ යි යන තොපගේ අදහස අදහන්නේ ද? ප්‍රිය වූ උම්මදන්ති ය දීමෙන් පසු නො දක්නාවිට නුඹගේ සිතට මහත් දුකෙක් වන්නේ ය.

3401. ප්‍රජාධිපති මහරජතුමනි, මෝ තොමෝ ඒකාන්තයෙන් ම මට ප්‍රිය ය. පෘථිවිපාලය, ඕ තොමෝ මට අප්‍රිය නො වන්නී ය. පින්වතුන් වහන්ස, කාමපරිළාහයෙන් යුතු සිංහයකු සිංහ පොතිකාවක වාසය කරන ගුහාවට යන්නා සේ නුඹ වහන්සේ උම්මදන්තිය වෙත යෙත්වා.

3402. න පීළිතා අත්තදුක්ඛෙන ධීරා
සුඛප්ඵලං කම්මං පරිච්චජන්ති,
සම්මොහිතාවාපි සුඛෙන මත්තා
න පාපකම්මඤ්ච සමාචරන්ති.

3403. තුවඤ්හි මාතා ච පිතා ච මය්හං
භත්තා පතී පොසකො දෙවතා ච,
දාසො අහං තුය්හ සපුත්තදාරො
යථා සුඛං සිබ්බ කරොහි කාමං.

3404. යො ඉස්සරොම්හීති කරොති පාපං
කත්වා ච සො නුත්තපතෙ[1] පරෙසං,
න තෙන සො ජීවති දීඝමායුං
දෙවාපි පාපෙන සමෙක්ඛරෙ නං.

3405. අඤ්ඤාතකං සාමිකෙහී පදින්නං
ධම්මෙ ඨිතා යෙ පටිච්ඡන්ති දානං,
පටිච්ඡකා දායකා චාපි තත්ථ
සුඛප්ඵලඤ්ඤෙව කරොන්ති කම්මං.

3406. අඤ්ඤො නු තෙ කොචි නරො පථබ්‍යා
සද්දහෙය්‍ය[2] ලොකස්මිං න මෙ පියාති,
භුසො ච ත්‍යස්ස මනසො විඝාතො
දත්වා පියං උම්මදන්තිං අදිට්ඨා.[3]

3407. අද්ධා පියා මය්හ ජනින්ද එසා
න සා මමං[4] අප්පියා භූමිපාල,
යෙනෙව මයා උම්මදන්තී පදින්නා
භුසෙහි රාජා වනථං සජාහි.

3408. යො අත්තදුක්ඛෙන පරස්ස දුක්ඛං
සුඛෙන වා අත්තසුඛං දහාති,
යථෙවිදං මය්හ තථා පරෙසං
යො එවං ජානාති ස වෙදි ධම්මං.

3409. අඤ්ඤො නු තෙ කොචි නරො පථබ්‍යා
සද්දහෙය්‍ය ලොකස්මිං න මෙ පියාති,
භුසො ච ත්‍යස්ස මනසො විඝාතො
දත්වා පියං උම්මදන්තිං අදිට්ඨා.

1. නුත්තසතෙ - මජ්සං.
2. සද්ධෙය්‍ය - වි. මජ්සං.
3. දිට්ඨා - මජ්සං.
4. මමං - වි. මජ්සං.

3402. ආත්ම දුඃඛයෙන් පෙළන ලද පණ්ඩිතයෝ සුව විපාක ඇති කර්ම නො හරිත්. එසේ ම සුවයෙන් මත් ව මුළා වූවාහු පාප කර්ම ද නො කරත්.

3403. සිවි රජතුමනි, නුඹ වහන්සේ වනාහි මාගේ මව ද පියා ද ස්වාමියා ද පොෂණය කරන්නා ද දෙවතාවා ද වන්නාහු ය. අඹු දරුවන් සහිත වූ මම වනාහි නුඹ වහන්සේගේ දසයෙක්මි, නුඹ වහන්සේ සිය කැමැත්තක් සුවසේ කරන සේක් වා.

3404. යමෙක් මම් අධිපති වෙමැ යි පව්කම් කෙරේ ද, පව් කොට අනුන්ගේ අපවාදයට බිය නොවේ ද, හෙ තෙම ඒ කර්මයෙන් දිගු කලක් ජීවත් නො වේ. දෙවියෝ ද ඔහු ලාමක වශයෙන් සලකත්.

3405. මහරජ, අන්සතු වූ ඒ ස්වාමීන් විසින් දෙන ලද්ද වූ දනයක් ධර්මයෙහි පිහිටියා වූ යම් කෙනෙක් පිළිගනිද් ද, එහි දයකයෝත් ප්‍රතිග්‍රාහකයෝත් සැප විපාක ඇත්තා වූ ම කර්මයක් කරත්.

3406. අභිපාරකය, මේ ලොකයෙහි කිසියම් මිනිසෙක් "මට උම්මාදන්තී ප්‍රිය නැතැ" යි යන තොපගේ අදහස අදහන්නේ ද? ප්‍රිය වූ උම්මාදන්තිය දීමෙන් පසු නො දක්නාවිට නුඹගේ සිතට මහත් දුකෙක් වන්නේ ය.

3407. ප්‍රජාධිපති මහරජතුමනි, මෝ තොමෝ ඒකාන්තයෙන්ම මට ප්‍රිය ය. පෘථිවිපාලය, ඕ තොමෝ මට අප්‍රිය නො වන්නී ය. පින්වතුන් වහන්ස, කාම පරිළාහයෙන් යුත් සිංහයකු සිංහ පොතිකාවක වාසය කරන ගුහාවට යන්නා සේ නුඹ වහන්සේ උම්මාදන්තිය වෙත යෙත් වා.

3408. යමෙක් තමහට වූ දුකින් අනුන්ගේ දුකක් හෝ අනුන්ගේ සුවයෙන් තමහට සුවයක් හෝ පිහිටුවා ද මෙය මට යම්සේ වේ ද අනුන්ටත් එසේ ම යයි දනී ද, හෙ ධර්මය දන්නෙකි.

3409. අභිපාරකය, මේ ලොකයෙහි කිසියම් මිනිසෙක් "මට උම්මාදන්තිය ප්‍රිය නැතැ" යි යන තොපගේ අදහස අදහන්නේ ද? ප්‍රිය වූ උම්මාදන්තිය දීමෙන් පසු නො දක්නාවිට නුඹගේ සිතට මහත් දුකෙක් වන්නේ ය.

3410. ජනින්ද ජානාසි පියා මමෙසා
න සා මමං අප්පියා භූමිපාල,
පියෙන තෙ දම්මි පියං ජනින්ද
පියදායිනො දෙව පියං ලභන්ති.

3411. සො නූනාහං වධිස්සාමි අත්තානං කාමහෙතුකං,
නහි ධම්මං අධම්මෙන අහං වධිතුමුස්සහෙ.

3412. සචෙ තුවං මය්හ සතිං ජනින්ද
න කාමයාසි නරවීරසෙට්ඨ,
චජාමි නං සබ්බජනස්ස සිබ්බ
මයා පමුත්තං තතො අව්හයෙසි නං.

3413. අදූසියං චෙ අභිපාරක ත්වං
චජාසි කත්තෙ අහිතාය ත්‍යස්ස,
මහා[1] ච තෙ උපවාදොපි අස්ස
න චාපි ත්‍යස්ස නගරම්හි පක්ඛො.

3414. අහං සහිස්සං උපවාදමෙතං
නින්දං පසංසං ගරහඤ්ච සබ්බං,
මමෙතමාගච්ඡතු භූමිපාල
යථා සුඛං සිබ්බ[2] කරොහි කාමං.

3415. යො නෙව නින්දං න පුනප්පසංසං[3]
ආදියති ගරහං නොපි පූජං,
සිරී ච ලක්ඛී ච අපෙති තම්හා
ආපො සුවුට්ඨීව යථා ථලම්හා.

3416. යං කිඤ්චි දුක්ඛං ච සුඛඤ්ච එත්තො
ධම්මාතිසාරඤ්ච මනොවිඝාතං,
උරසා අහං පටිච්ඡිස්සාමි සබ්බං
පථවී යථා ථාවරානං තසානං.

3417. ධම්මාතිසාරඤ්ච මනොවිඝාතං
දුක්ඛං ච නිච්ඡාමි අහං පරෙසං,
එකොපිමං තාරයිස්සාමි භාරං
ධම්මෙ ඨිතො කිඤ්චි අහාපයන්තො.

1. සබ්බා – වි.
2. සිවි – මජසං.
3. න පුනප්පසංසං – මජසං.

3410. ප්‍රජාධිපති මහරජතුමනි, මෝ තොමෝ ඒකාන්තයෙන් ම මට ප්‍රිය යයි දන්නෙහි ය. පෘථිවිපාලය, ඕ තොමෝ මට අප්‍රිය නො වන්නී ය. ජනාධිපති රජතුමනි, මට ප්‍රිය වූවකින් ඔබට ප්‍රිය වූවක් දෙමි. දේවයන් වහන්ස, ප්‍රිය දේ දෙන්නෝ ප්‍රිය දේ ලබති.

3411. ඒකාන්තයෙන් ඒ මම කාම හේතුක වූ අයුත්තක් කොට තමන්ට හිංසා නො කරන්නෙමි. මම වනාහි අධර්මයෙන් ධර්මය නසන්නට උත්සාහ නො කරමි.

3412. ජනාධිපති වූ නරශ්‍රෙෂ්ඨය, ඉදින් නුඹ වහන්සේ මාගේ ඒ බිරිඳ නො කැමැත්තාහු නම්, සිවි රජතුමනි, මම ඇය හැම දෙනාට ම සාධාරණ වන ලෙස හැර දමමි. ඉන්පසු මා විසින් හැර දමන ලද ඇය කැඳවා ගනු මැනවි.

3413. හිතකාරී වූ අභිපාරකය, නුඹ දූෂ්‍ය නොකටයුතු වූ ඇය හැර දමන්නෙහි නම්, එය තොපට අහිත පිණිස වන්නේ ය. තොපට මහත් වූ අපවාදයෙක් ද වන්නේ ය. නගරයෙහි ද ජනයා තොපට පක්ෂ නො වන්නේ ය.

3414. සිවි මහරජතුමනි, මේ දෝෂය ද, නින්දාව ද, ප්‍රශංසාව ද, ගර්හාව ද යන සියල්ල ම මම ඉවසන්නෙමි. භූමිපාලය, මේ සියල්ල මා කරා ඒවා. නුඹ වහන්සේගේ කැමැත්තක් සේ සූවසේ කරනු මැනවි.

3415. යමෙක් නින්දාව නොපිළිගනී ද යළි ප්‍රශංසාවත් නොපිළිගනී ද ගැරහීම නොපිළිගනී ද පූජාවත් නොපිළිගනී ද, ඔහු කෙරෙන් ඓශ්වර්‍ය්‍ය සංඛ්‍යාත ශ්‍රීයත් ප්‍රඥා සංඛ්‍යාත ලක්‍ෂ්මියත් ගොඩබිමින් ලිස්සා යන වර්ෂා ජලයක් මෙන් පහව යේ.

3416. මෙපමණකින් යම්කිසි දුකක් හෝ සැපයක් හෝ ධර්මය ඉක්ම යාමක් හෝ චිත්තසන්තාපයක් හෝ සිදු වන්නේ නම් රහතුන්ගේ ද පුහුදුනන්ගේ ද සියල්ල පිළිගන්නා මහපොළොව මෙන් මම ඒ සියල්ල පිළිගනිමි.

3417. මම අනුන්ගේ ධර්මය ඉක්මවා යැමද චිත්තසන්තාපය ද කායික දුක ද නො කැමැත්තෙමි. මම ධර්මයෙහි පිහිටියෙම් කිසිවකු නො පිරිහෙළන්නේ හුදෙකලා ව මේ දුඃඛභාරය එතෙර කරන්නෙමි (යි රජ තෙම කීවේ ය.)

3418. සග්ගූපගං පුඤ්ඤකම්මං ජනින්ද
මා මෙ තුවං අන්තරායං අකාසි,
දදමි තෙ උම්මදන්තිං පසන්නො
රාජාව යඤ්ඤං[1] ධනං බ්‍රාහ්මණානං.

3419. අද්ධා තුවං කත්තෙ හිතොසි මය්හං
සඛා මම උම්මදන්තී තුවඤ්ච,
නින්දෙය්‍යු දෙවා පිතරො ච සබ්බෙ
පාපඤ්ච පස්සං අභිසම්පරායං.

3420. නහෙතං ධම්මං සිවිරාජ වජ්ජුං
සනෙගමා ජානපද ච සබ්බෙ,
යන්තෙ මයා උම්මදන්තී පදින්නා
භුසෙහි රාජා වනථං සජාහි.

3421. අද්ධා තුවං කත්තෙ හිතොසි මය්හං
සඛා මම උම්මදන්තී තුවඤ්ච,
සතඤ්ච ධම්මානි සුකිත්තිතානි
සමුද්දවෙලාව දුරච්චයානි.

3422. ආහුනෙය්‍යො මෙසි හිතානුකම්පී
ධාතා විධාතා චසි කාමපාලො,
තයී හුතා දෙව මහප්ඵලා හි
කාමෙන මෙ උම්මදන්තිං පටිච්ඡ.

3423. අද්ධා හි සබ්බං අභිපාරක ත්වං
ධම්මං අචාරී මම කත්තුපුත්ත,
අඤ්ඤො නු තෙ කො ඉධ සොත්ථිකත්තා
දිපදො නරො අරුණෙ ජීවලොකෙ.

3424. තුවං නු සෙට්ඨො ත්වමනුත්තරොසි
ත්වං ධම්මගුත්තො ධම්මවිදූ සුමෙධො,
සො ධම්මගුත්තො චිරමෙව ජීව
ධම්මඤ්ච මෙ දෙසය ධම්මපාල.

3325. තදිඞ්ඝ අභිපාරක සුණොහි වචනං මම,
ධම්මන්තෙ දෙසයිස්සාමි සතං ආසෙවිතං අහං.

1. යඤ්ඤෙ - ම. ජ. සං.

3418. ජනාධිපතිතුමනි, නුඹ වහන්සේ මාගේ ස්වර්ගගාමී වූ පින්කමට අනතුරක් නො කළහු ය. මම නුඹ වහන්සේහට පහන් සිතැත්තෙමි. රජ කෙනකුන් බමුණනට යාග සඳහා දෙන ධනයක් මෙන් උම්මදන්තිය දෙමි (යි ඇමති තෙම කීවේ ය.)

3419. වැඩ කැමති ඇමතියාණෙනි, නුඹ ඒකාන්තයෙන් ම මට වැඩ කැමැත්තෙහි ය. උම්මදන්ති ද, නුඹ ද, මාගේ යහළුවෝ ය. දෙවියෝ ද බ්‍රහ්මයෝ ද සියලු රට වැස්සෝ ද යන සියල්ලෝම නින්‍දා කරන්නාහ. පරලෙව්හි විපාක දෙන්නා වූ පාපයක් ද දකිමි.

3420. සිවි රජතුමනි, නියම්ගම් වැස්සන් සහිත සියලු දනවු වැසියෝ ම මා විසින් නුඹ වහන්සේහට උම්දන්ති දෙන ලද්දී ය යන මෙය අධර්මයකැ යි නො කියන්නෝ ය. එබැවින් රජ තෙම ඒ කාමතෘෂ්ණාව දියුණු කෙරේවා (නොරුස්නාහු නම් මාහට ම) දෙනු මැනවි. (ඇමති තෙම කීවේ ය.)

3421. වැඩ කැමති ඇමතියාණෙනි, නුඹ ඒකාන්තයෙන් ම මට වැඩ කැමැත්තෙහි ය. උම්මදන්ති ද නුඹ ද මාගේ යහළු වෝ ය. මනා කොට ප්‍රකාශ කරන ලද්දු වූ සත් පුරුෂ ධර්මයෝ මුහුදු වෙරළ මෙන් නො ඉක්මවාලිය හැක්කෝ වෙති.

3422. දේවයන් වහන්ස, නුඹ වහන්සේ වනාහි මාගේ පිදිය යුත්තාද වන්නාහු ය. හිතානුකම්පා ඇත්තා ද වන්නාහු ය. විධාන කරන්නා ද කැමති දෑ පාලනය කරන්නා ද වන්නාහු ය. එහෙයින් නුඹ වහන්සේ කෙරෙහි පුදන ලද්දී මහත් ඵල වන්නී ය. මාගේ කැමැත්තෙන් උම්මදන්තිය පිළිගනු මැනැවැ යි (ඇමති තෙම කීවේ ය.)

3423. කත්තු නමැත්තහුගේ පුත්‍ර වූ අභිපාරකය, නුඹ එකැතින් ම මට හිතකර වූ හැම දහමෙක්හි ම හැසුරුණෙහි ය. (හෙට) අරුණ නැගි කල්හි මේ මිනිස් ලොව දෙපා ඇත්තා වූ අන් කවර නම් රජෙක් නුඹට යහපතක් කරන්නේ දැ යි (ඔහු නිහඬ කිරීම පිණිස රජ තෙමේ ඇසී ය.)

3424. මහරජතුමනි, නුඹ වහන්සේ ශ්‍රෙෂ්ඨ වන්නාහු ය. උතුම් වන්නාහු ය. නුඹ වහන්සේ ධර්මය රක්නහු ය. ධර්මය දන්නහු ය. මනා නුවණැත්තහු ය. ධර්මය රක්නා වූ ඒ නුඹ වහන්සේ බොහෝ කලක් ජීවත්වන සේක් වා. ධර්මය රක්නා වූ දේවයන් වහන්ස, මට ධර්මය ද දෙසන සේක් වා.

3425. අභිපාරකය, එසේ නම් මාගේ වචනය අසව, මම බුද්ධාදි සත්පුරුෂයන් විසින් සෙවුනා ලද ධර්මය තොපට දෙසන්නෙමි.

3426. සාධු ධම්මරුචි රාජා සාධු පඤ්ඤාණවා නරො,
සාධු මිත්තානමද්දුබ්භො පාපස්සාකරණං සුඛං.

3427. අක්කොධනස්ස විජිතෙ ඨිතධම්මස්ස රාජිනො,
සුඛං මනුස්සා ආසෙථ සීතච්ඡායාය සඞ්ඝරෙ.

3428. න චාහමෙතං අභිරොචයාමි
කම්මං අසමෙක්ඛකතං අසාධු,
යෙ චාපි ඤත්වාන සයං කරොන්ති
උපමා ඉමා මය්හං තුවං සුණොහි.

3429. ගවඤ්චෙ තරමානානං ජිම්හං ගච්ඡති පුඞ්ගවො,
සබ්බා තා ජිම්හං ගච්ඡන්ති නෙත්තෙ ජිම්හං ගතෙ සති.

3430. එවමෙව මනුස්සෙසු යො හොති සෙට්ඨසම්මතො,
සො චෙ අධම්මං චරති පගෙව ඉතරා පජා
සබ්බං රට්ඨං දුඛං සෙති රාජා චෙ හොති අධම්මිකො.

3431. ගවඤ්චෙ තරමානානං උජුං ගච්ඡති පුඞ්ගවො,
සබ්බා තා උජුං ගච්ඡන්ති නෙත්තෙ උජුගතෙ සති.

3432. එවමෙව මනුස්සෙසු යො හොති සෙට්ඨසම්මතො,
සො චෙපි ධම්මං චරති පගෙව ඉතරා පජා
සබ්බං රට්ඨං සුඛං සෙති රාජා චෙ හොති ධම්මිකො.

3433. න චාපහං අධම්මෙන අමරත්තමභිපත්ථයෙ,
ඉමං වා පථවිං සබ්බං විජෙතුං අභිපාරක.

3434. යං හි කිඤ්චි මනුස්සෙසු රතනං ඉධ විජ්ජති,
ගාවො දසො හිරඤ්ඤඤ්ච වත්ථියං හරිචන්දනං.

3435. අස්සිත්ථියො ච රතනං මණිකඤ්ච
යඤ්චාපි මෙ චන්දසූරියා අභිපාලයන්ති,
න තස්ස හෙතු විසමං චරෙය්‍ය
මජ්ඣෙ සිවීනං උසභොස්මි ජාතො.

3426. දහම් කැමති වන්නා වූ රජ තෙම යහපත් වේ. නුවණැති මිනිස් තෙම යහපත් වේ. මිතුරන්ට ද්‍රෝහ නො කරන්නා යහපත් වේ. පාපයා ගේ නො කිරීම සුවයට කරුණු වේ.

3427. නොකිපෙනසුලු වූ ධර්මයෙහි පිහිටි රජුගේ නුවර මනුෂ්‍යයෝ දූපුතුන් නැමිතුරන්ගේ සිහිල් සෙවණැති, නොදැහැමි බිලියම් ආදියෙන් පීඩිත නොවූ සිය ගේදෙර ඇත්තාහු සුවසේ වෙසෙත්.

3428. අපරීක්‍ෂාවෙන් කරන ලද මේ කර්මය ද මම කැමති නො වෙමි. යම් කෙනෙක් (තුමු) සොයා දැන කටයුතු කෙරෙත් නම් එය කැමැත්තෙමි, මාගේ මේ උපමාවන් නුඹ අසව.

3429. ඉදිත් යන්නා වූ ගවයන් අතුරෙන් පෙරටුව යන ගව තෙම වක් වැ යේ නම්, පෙරටුව යන්නා වක් ව ගිය කල්හි ඒ මුළු ගව රැළ ම වක්ව යෙද්ද.

3430. එසේ ම මිනිසුන් අතුරෙහි යම් මිනිසෙක් ශ්‍රෙෂ්ඨය යි සම්මත ද ඉදින් හෙ තෙම අධර්මයෙහි හැසිරේ ද එවිට සෙසු ප්‍රජාව ගැන කවර කථා ද? ඉදින් රජ තෙමේ නොදැහැමි නම් මුළු රට ම දුකසේ වෙසෙයි.

3431. ඉදිත් යන්නා වූ ගවයන් අතුරෙන් පෙරටු ව යන ගව තෙම සෘජු ව යේ නම් පෙරටු ව යන්නා සෘජුව ගිය කල්හි ඒ මුළු ගව රැළම සෘජු ව යෙද්ද.

3432. එසේ ම මිනිසුන් අතුරෙහි යම් මිනිසෙක් ශ්‍රෙෂ්ඨය යි සම්මත ද ඉදින් හෙ ධර්මයෙහි හැසිරේ ද එවිට සෙසු ප්‍රජාව ගැන කවර කථා ද? ඉදින් රජ තෙමේ දැහැමි නම් මුළු රට ම සුවසේ වෙසෙයි.

3433. අභිපාරකය, මම ද නොදැහැමින් දෙවත්වය නො පතන්නෙමි. මේ මුළු පොළොව හෝ දිනන්නට නො කැමැත්තෙමි.

3434. මෙලොව මිනිසුන් කෙරෙහි ගව – දැසි – අමුරන් – වස්ත්‍ර රත් සඳුන් යන යම්කිසි රත්න ජාතියක් විද්‍යමාන වේ ද,

3435. අශ්වයෝ ද, ස්ත්‍රීහු ද, සප්තවිධ මාණික්‍යරත්න ද මහ ඇඟි භාණ්ඩ ද යන යමකුත් මේ චන්ද්‍ර සූර්‍ය්‍යයෝ එළිය කරමින් රකිත් ද, ඒ සක්විති රජය හෙතුකොට ගෙන ද විෂම ව නො හැසිරෙමි. යම් හෙයකින් මම සිවි රජුන් අතර ශ්‍රෙෂ්ඨ ව උපන්නෙම් ද, එහෙයිනි.

3436. නෙතා පිතා උග්ගතො රට්ඨපාලො
ධම්මං සිවීනං අපචායමානො,
සො ධම්මමෙවානුවිචින්තයන්තො
තස්මා සකෙ චිත්තවසෙ න වත්තෙ.

3437. අද්ධා තුවං මහාරාජ නිච්චං අබ්‍යසනං සිවං,
කරිස්සසි චිරං රජ්ජං පඤ්ඤා හි තව තාදිසී.

3438. එතං තෙ අනුමොදමි යං ධම්මං නප්පමජ්ජසි,
ධම්මං පමජ්ජ ඛත්තියො ඨානා චවති ඉස්සරො.

3439. ධම්මං චර මහාරාජ මාතාපිතූසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3440. ධම්මං චර මහාරාජ පුත්තදාරෙසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3441. ධම්මං චර මහාරාජ මිත්තාමච්චෙසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3442. ධම්මං චර මහාරාජ වාහනෙසු බලෙසු ච,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3443. ධම්මං චර මහාරාජ ගාමෙසු නිගමෙසු ච,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3444. ධම්මං චර මහාරාජ රට්ඨෙසු ජනපදෙසු ච,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3445. ධම්මං චර මහාරාජ සමණබ්‍රාහ්මණෙසු ච,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3436. මම වනාහි නායකයෙක් ද, පියෙක් ද, ප්‍රසිද්ධ කෙනෙක් ද රට පාලනය කරන්නෙක් ද, සිවි රජුන්ගේ ධර්මය ගරු කරන්නෙක් ද වෙමි. ඒ මම ඒ ධර්මය අනුව ම සිතන්නෙමි. එහෙයින් තමන්ගේ චිත්ත වසයෙහි නො පවතිමි යි (රජ තෙම කීවේ ය.)

3437. මහරජ, ඒකාන්තයෙන් නුඹ වහන්සේ නිතරම විපත්ති රහිත ව නිර්භය ව බොහෝ කලක් රජය කරවන්නාහු ය. යම් හෙයෙකින් නුඹ වහන්සේගේ ප්‍රඥාව එබඳු වන්නී ද එහෙයිනි.

3438. ධර්මයෙහි ප්‍රමාද නො වව යි යම් බඳු ධර්මයක් ප්‍රකාශ කෙළෙහි ද, නුඹගේ මේ ධර්මයට මම සන්තෝෂ වෙමි. අධිපති ක්‍ෂත්‍රිය තෙම ධර්මයෙහි ප්‍රමාද වී ස්ථානයෙන් චුත වේ.

3439. ක්‍ෂත්‍රිය මහරජ, මව්පියන් කෙරෙහි දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොව මව්පියන් කෙරෙහි පැවැත්වියයුතු සුචරිත ධර්මයෙහි හැසිර පරලොවැ ස්වර්ගයට යන්නෙහි ය.

3440. ක්‍ෂත්‍රිය මහරජ, අඹුදරුවන් කෙරෙහි දැහැමින් හැසිරෙව මහරජ, මෙලොව අඹුදරුවන් කෙරෙහි පැවැත්වියයුතු සුචරිත ධර්මයෙහි හැසිර පරලොවැ ස්වර්ගයට යන්නෙහි ය.

3441. ක්‍ෂත්‍රිය මහරජ, මිත්‍රාමාත්‍යයන් කෙරෙහි දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොව මිත්‍රාමාත්‍යයන් කෙරෙහි පැවැත්වියයුතු සුචරිත ධර්මයෙහි හැසිර පරලොවැ ස්වර්ගයට යන්නෙහි ය.

3442. මහරජ, බළ සේනාවන් කෙරෙහි දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොව බළ සේනාවන් කෙරෙහි පැවැත්වියයුතු සුචරිත ධර්මයෙහි හැසිර පරලොවැ ස්වර්ගයට යන්නෙහි ය.

3443. මහරජ, ගම් නියම්ගම් වැසියන් කෙරෙහි දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොවැ ගම් නියම්ගම් වැසියන් කෙරෙහි පැවැත්වියයුතු සුචරිතධර්මයෙහි හැසිර පරලොවැ ස්වර්ගයට යන්නෙහි ය.

3444. මහරජ, රට වැසියන් කෙරෙහි හා දනව් වැසියන් කෙරෙහි ද, දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොව රටවැසියන් කෙරෙහි හා දනව් වැසියන් කෙරෙහි පැවැත්වියයුතු සුචරිත ධර්මයෙහි හැසිර පරලොවැ ස්වර්ගයට යන්නෙහි ය.

3445. මහරජ, මහණ බමුණන් කෙරෙහි දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොව මහණ බමුණන් කෙරෙහි පැවැත්වියයුතු සුචරිත ධර්මයෙහි හැසිර පරලොවැ ස්වර්ගයට යන්නෙහි ය.

3446. ධම්මං චර මහාරාජ මිගපක්ඛීසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3447. ධම්මං චර මහාරාජ ධම්මො චිණ්ණො සුඛාවහො,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.

3448. ධම්මං චර මහාරාජ සඉන්දා දෙවා සබ්‍රහ්මකා,
සුචිණ්ණෙන දිවං පත්තා මා ධම්මං රාජ පමාදෙති.

උම්මාදන්ති ජාතකං.

3. මහාබොධිජාතකං

3449. කින්නු දණ්ඩං කිමජිනං කිං ඡත්තං කිං උපාහනං,
කිං අඞ්කුසඤ්ච පත්තඤ්ච සඞ්ඝාටිඤ්චාපි බ්‍රාහ්මණ
තරමානරූපො ගණ්හාසි කත්නු පත්ථයසෙ දිසං.

3450. ද්වාදසෙතානි වස්සානි වුසිතානි තවන්තිකෙ,
නාභිජානාමි සොණෙන පිඞ්ගලෙනාභිකූජිතං.

3451. ස්වායං දිත්තොව නදති සුක්කදාඨං විදංසයං,
තව සුත්වා සභරියස්ස වීතසද්ධස්ස මං පති.

3452. අහු එස කතො දොසො යථා භාසසි බ්‍රාහ්මණ,
එස භිය්‍යො පසීදමි වස බ්‍රාහ්මණ මාගමා.

3453. සබ්බසෙතො පුරෙ ආසි තතොපි සබලො අහු,
සබ්බලොහිතකොදානි කාලො පක්කමිතුං මම.

3446. ක්‍ෂත්‍රිය මහරජ, මෘගපක්‍ෂීන් කෙරෙහි දැහැමින් හැසිරෙව. මහරජ, මෙලොවැ මෘගපක්‍ෂීන් කෙරෙහි පැවැත්වියයුතු සුචරිත ධර්මයෙහි හැසිර පරලොවැ ස්වර්ගයට යන්නේ ය.

3447. මහරජ, දැහැමින් හැසිරෙව. පුරුදු කරන ලද ධර්මය තෙමේ සැප ගෙනදෙන්නේ වෙයි. මහරජ, මෙලොවැ ධර්මයෙහි හැසිර පරලොවැ ස්වර්ගයට යව.

3448. මහරජ, දැහැමින් හැසිරෙව. ශක්‍රයා සහිත දෙවියෝත් මහාබ්‍රහ්මයා සහිත සෙසු බ්‍රහ්මයෝත් මොනොවට පුරුදු කරන ලද ධර්මය කරණකොට ගෙන දෙව්ලොවට පැමිණෙන්නාහු ය. මහරජ, ධර්මයෙහි ලා ප්‍රමාද වන්නෙක් නො වව. (මෙසේ අභිපාරක නම් සෙනෙවි තෙම රජහට ධර්ම දෙශනා කෙළේ ය).

උම්මාදන්ති ජාතක යි.

3. මහාබොධි ජාතකය

3449. ස්වාමීනි, තවුස් බ්‍රාහ්මණයන් වහන්ස, නුඹ වහන්සේ කවර හෙයින් දණ්ඩක් ගත්තහු ද? කුමක් හෙයින් වෙලෙව් වැ අඳුන් දිවිසමත්, කුඩයත්, උවහනත්, අකුස්සත්, පාත්‍රයත්, සංඝාටි-යත් ගත්තහු ද? කවර නම් දිසාවකට වැඩම කරනු කැමැත්තහුදැයි (රජ තෙම ඇසූවේ ය.)

3450. මහරජ, මේ දෙළොස් වසක් නුඹ සමීපයෙහි වසන ලදී. එහෙත් පිංගල නම් වූ නුඹගේ සුනඛයා විසින් කරන ලද මෙබඳු මහත් ශබ්දයක් ගැන නො දනිමි.

3451. ඒ මේ සුනඛ තෙම, මා කෙරෙහි පහව ගිය ශ්‍රද්ධා ඇති භාර්‍ය්‍යාව සහිත නුඹගේ (මා මැරවීමට කළ) කථාව අසා සුදු දළ විහිදුවමින් එඩිතරයකු මෙන් (ඔබ මෙහි එන්නේ කිම? රජු විසින් ඔබ මරනු පිණිස අණ කරන ලද බව නොදන්නා සේක්දැයි අඟවමින්) නාදකරයි. (බුරයි).

3452. තාපසයාණන් වහන්ස, යම්සේ කියන්නාහු නම් ඒ දෝෂය අප විසින් කරන ලද්දේය. මම දැන් වැඩියක් පහන් වෙමි. තාපසයන් වහන්ස, මෙහි ම වසනු මැන. නො වඩිනු මැනවැයි (රජ තෙම කීවේ ය.)

3453. මහරජ, පළමුවෙන් (නුඹගේ ගෙහි මට දුන් බත) සුදු විය. (භෙදකයන්ගේ වචන වලින් පසුව) මිශ්‍ර විය. දැන් ලේ වන් විය. එබැවින් මට බැහැර යෑමට දැන් කාලය පැමිණ තිබෙ.

3454. අබ්භන්තරං පුරෙ ආසි තතො මජ්ඣෙ තතො බහි,
පුරා නිද්ධමනා හොති සයමෙව වජාමහං.

3455. වීතසද්ධං න සෙවෙය්‍ය උදපානංව නොදකං,
සචෙපි නං අනුඛණෙ වාරිකද්දමගන්ධිකං.

3456. පසන්නමෙව සෙවෙය්‍ය අප්පසන්නං විවජ්ජයෙ,
පසන්නං පයිරුපාසෙය්‍ය රහදංවොදකත්ථිකො.

3457. භජෙ භජන්තං පුරිසං අභජන්තං න භජ්ජයෙ,[1]
අසප්පුරිසධම්මො සො යො භජන්තං න භජ්ජති.[2]

3458. යො භජන්තං න භජති සෙවමානං න සෙවති,
ස වෙ මනුස්සපාපිට්ඨො මිගො සාඛස්සිතො යථා.

3459. අච්චාභික්ඛණසංසග්ගා අසමොසරණෙන ච,
එතෙන මිත්තා ජීරන්ති අකාලෙ යාචනාය ච.

3460. තස්මා නාභික්ඛණං ගච්ඡෙ න ච ගච්ඡෙ චිරාචිරං,
කාලෙන යාචං යාචෙය්‍ය එවං මිත්තා න ජීයරෙ.

3461. අතිචිරං නිවාසෙන පියො භවති අප්පියො,
ආමන්ත ඛො තං ගච්ඡාම පුරා තෙ හොම අප්පියා.

3462. එවං චෙ[3] යාචමානානං අඤ්ජලිං නාවබුජ්ඣසි,
පරිචාරකානං සතානං වචනං න කරොසි නො
එවං තං අභියාචාම පුන කයිරාසි පරියායං.

3463. එවං චෙ නො විහරතං අන්තරායො න හෙස්සති,
තුම්හං වාපි[4] මහාරාජ අම්හං[5] වා රට්ඨවඩ්ඪන
අප්පෙවනාම පස්සෙම[6] අහොරත්තානමච්චයෙ.

1. නභයෙ නභාජයෙ – වි. මජ්ස‌ං.
2. නභජති – මජ්සං. නභාජති – වි.
3. තෙ – මජ්සං.
4. මයහංවා – වි. මයහං
5. තුයහංවාපි – වි. මජ්සං.
6. පස්සාම – වි.

3454. මහරජ, පළමු මට දුන් අසුන රජ මැඳුර තුළ විය. ඉන්පසු මධ්‍යයෙහි (හිණිහිස) ය. ඉන්පසු පිටත්හිය. නැවත ගෙලෙහි ගෙන ඇද දැමීමට පෙර මම තෙමේම යන්නෙමි.

3455. පහව ගිය ශ්‍රද්ධා ඇත්තහු දිය නැති ලිඳක් මෙන් සේවනය නො කරන්නේ ය. ඉදින් එය නැවත සාරන්නේ නම් මඩ ගඳින් යුත් ජලය ඇති වන්නේ ය. (එමෙන් පහ වූ ශ්‍රද්ධා ඇත්තහු ඇසුරු කරන්නා ලබන ප්‍රත්‍යය මඳ වූයේ ද රූක්ෂ වූයේ ද වෙයි. එහෙයින් පරිභොගයට නුසුදුසු වන්නේ ය.)

3456. පිහිටි ශ්‍රද්ධා ඇත්තහු ම සෙවනය කරන්නේ ය. නො පහන් වූවහු දුරු කරන්නේ ය. දිය කැමැත්තහු ගැඹුරු මහ විලක් මෙන් (පැවිද්ද ද) සැදැහැත්තකු ම ඇසුරු කරන්නේ ය.

3457. තමා භජනය කරන්නකු තෙමේ භජනය කරන්නේය. තමා භජනය නො කරන්නකු (පසමිතුරකු) තෙමේ භජනය නො කරන්නේ ය. තමා කෙරෙහි ඉත සිතින් භජනය කරන්නකු යමෙක් භජනය නොකෙරේ නම් හේ අසත්පුරුෂ ධර්ම ඇත්තෙකි.

3458. යමෙක් තමා භජනය කරන්නකු භජනය නො කෙරේ ද සෙවනය කරන්නකු සෙවනය නො කෙරේ ද හෙතෙම ගස්වල අතු ඇසුරු කළ වඳුරකු මෙන් ඒකාන්තයෙන් මිනිස් පව්ටෙකි.

3459. අධික වූ නිතර ආශ්‍රයෙන් ද එක්ව නො හැසිරීමෙන් ද නො කල්හි ඉල්ලීමෙන් ද යන මේ කරුණින් මිත්‍රයෝ දිරත්. (මිතුරු බව නැතිවේ.)

3460. එහෙයින් නිතර නො එළඹෙන්නේය. ඉබොහෝ කලකින් ද නො එළඹෙන්නේය. සුදුසු කල්හි ඉල්ලිය යුත්තක් ඉල්ලන්නේ ය. මෙසේ ඇති කල්හි මිත්‍රයෝ නො දිරත්. (මිතුරු බව නොනැසී පවතී.)

3461. ඉබොහෝ කලක් එකට විසීමෙන් ප්‍රිය තැනැත්තේත් අප්‍රිය වේ. එහෙයින් තොපට මා අප්‍රිය වන්නට පෙර තොප (හා) කථා කොට යන්නෙමි. (තාපස තෙම කීයේ ය.)

3462. ස්වාමීනි, මෙලෙසින් අයැද සිටින්නා වූ අපගේ අඤ්ජලී ප්‍රණාමය නුඹ වහන්සේ නොපිළිගන්නාහු නම් සමීපචාරී වූ අපගේ කීම නො කරන්නාහු නම් යළි මෙහි එක්වරක් පැමිණීම (පමණක්) කරනු මැනව.

3463. රට වඩන්නා වූ මහරජ, ඉදින් මෙසේ (වෙන්ව) වාසය කරන්නා වූ තොපට ද අපට ද යන අප දෙදෙනාට කිසියම් අන්තරායෙක් නොවන්නේ නම් කල්යැමෙන් දක්නෙමු නම් ඉතා යෙහෙකි.

3464. උදීරණා චෙ සඞ්ගත්‍යා භාවාය මනුවත්තති,
අකාමා අකරණීයං වා කරණීයං වාපි කුබ්බති
අකාමකරණීයස්මිං[1] කුවිධ පාපෙන ලිප්පති[2].

3465. සො චෙ අත්‍ථො ච ධම්මො ච කල්‍යාණො න ච පාපකො,
භොතො චෙ වචනං සච්චං සුහතො වානරො මයා.

3466. අත්තනො චෙ හි වාදස්ස අපරාධං විජානියා,
න මං ත්වං ගරහෙය්‍යාසි භොතො වාදෙ හි තාදිසො.

3467. ඉස්සරො සබ්බලොකස්ස සචෙ කප්පෙති[3] ජීවිතං,
ඉද්ධිබ්‍යසනභාවඤ්ච කම්මං කල්‍යාණපාපකං
නිද්දෙසකාරී පුරිසො ඉස්සරො තෙන ලිප්පති.

3468. සො චෙ අත්‍ථො ච ධම්මො ච කල්‍යාණො න ච පාපකො,
භොතො චෙ වචනං සච්චං සුහතො වානරො මයා.

3469. අත්තනො චෙ හි වාදස්ස අපරාධං විජානියා,
න මං ත්වං ගරහෙය්‍යාසි භොතො වාදෙ හි තාදිසො.

3470. සචෙ පුබ්බෙකතහෙතු සුඛදුක්ඛං නිගච්ඡති,
පොරාණකං කතං පාපං තමෙසො මුඤ්චතෙ ඉණං
පොරාණකඉණමොක්ඛො කුවිධ පාපෙන ලිප්පති.

3471. සො චෙ අත්‍ථො ච ධම්මො ච කල්‍යාණො න ච පාපකො,
භොතො චෙ වචනං සච්චං සුහතො වානරො මයා.

3472. අත්තනො චෙ හි වාදස්ස අපරාධං විජානියා,
න මං ත්වං ගරහෙය්‍යාසි භොතො වාදෙ හි තාදිසො.

---

1. අකාමා කරණීයමහි – මජසං. ස්‍යා.
2. ලිම්පති – මජසං. ස්‍යා.
3. කුප්පෙති – මජසං.

3464. ඉදින් ලෝ වැසි තෙම එක්වීමෙන් හා ස්වභාවයෙන් සුවදුක් අනුව පවත්නේ (ඒ ඒ තන්හි සුව දුක් විඳින්නේ) නො කැමැත්තෙන් වුවද නොකටයුතු පාප කර්මයක් හෝ කටයුතු කුශල කර්මයක් හෝ කෙරෙයි යනු තොපගේ කීම නම් මෙසේ නොකැමැත්තෙන් (ස්වාභාවිකව) කරන මේ ක්‍රියාවෙහි කවරෙක් නම් ඒ පාපකර්මයෙන් බැඳේ ද?

3465. (තොප විසින් ප්‍රකාශ කරන ලද) ඒ අර්ථය ද ධර්මයද (අහෙතුක වාදය) යහපත් වේ නම්, ලාමක නොවේ නම්, භවත්හුගේ වචනය සත්‍යවේ නම්, ඒ වානරයා මා විසින් මනාව නසන ලද්දේ ය. (එහි ලා මාගේ කවර වරදෙක් ද?)

3466. ඉදින් තමාගේ වාදයෙහි අපරාධය දන්නෙහි නම් නුඹ මට නො ගරහන්නෙහිය. භවත්හුගේ වාදය එබඳු යි (තාපස තෙම කීවේ ය.)

3467. ඉදින් (යම් ඒ) ඊශ්වරයෙක් මුළු ලෝකයාගේ දිවි පැවැත්ම සංවිධානය කෙරේ ද, දියුණුව හා පිරිහීමත් කුශල හා අකුශල කර්මත් කරන්නේ ද, (කර්මකාරී) පුරුෂයා ඒ ඊශ්වරයාගේ අණ ඉටුකරන්නෙකි. ඊශ්වරයා ඒ පාපකර්මයෙන් බැඳේ.

3468. (තොප විසින් ප්‍රකාශ කරන ලද) ඒ අර්ථය ද ධර්මය ද (ඊශ්වර නිර්මාණ වාදය) යහපත් වේ නම්, අලාමක වේ නම්, භවත්හුගේ වචනය සත්‍ය වේ නම් ඒ වානරයා මා විසින් මනාව නසන ලද්දේ ය. (එහිලා මාගේ වරද කවරෙක් ද?)

3469. ඉදින් තමාගේ වාදයාගේ දෝෂය දන්නෙහි නම් නුඹ මට නො ගරහන්නෙහි ය. භවත්හුගේ වාදය එබඳුයි (තාපස තෙම කීවේ ය.)

3470. ඉදින් සත්ව තෙම පෙරකළ කර්ම හේතුකොට ගෙන සුව දුක් දෙකට පැමිණෙයි ද, පුරාකෘත පාපසංඛ්‍යාත ඒ ණය මුදු ද, එසේ ඇති කල්හි මාගේ ද මෙය පුරාණ ණයෙන් මිදීම වේ. මෙහිලා කවරෙක් පාප කර්මයෙන් බැඳේ ද?

3471. තොප විසින් ප්‍රකාශ කරන ලද ඒ අර්ථය ද ධර්මය ද (පුබ්බෙකතහෙතු වාදය) යහපත් වේ නම්, අලාමක වේ නම්, භවත්හුගේ වචනය සත්‍ය වේ නම් ඒ වානරයා මා විසින් මනාව නසන ලද්දේ ය. (එහිලා මාගේ වරද කුමක් ද?)

3472. ඉදින් තමාගේ වාදයාගේ දෝෂය දන්නෙහි නම් නුඹ මට නො ගරහන්නෙහි ය. භවත්හුගේ වාදය එබඳු යි. (තාපස තෙම කීවේ ය,)

3473. චතුන්නංයෙවුපාදය රූපං සම්භොති පාණිනං,
යතො ච රූපං සම්භොති තත්ථෙව[1] අනුපගච්ඡති.

3474. ඉධෙව ජීවති ජීවො පෙච්ච පෙච්ච විනස්සති,
උච්ඡිජ්ජති අයං ලොකො යෙ බාලා යෙ ච පණ්ඩිතා
උච්ඡිජ්ජමානෙ ලොකස්මිං කච්ධ පාපෙන ලිප්පති.

3475. සො වෙ අත්ථො ච ධම්මො ච කල්‍යාණො න ච පාපකො,
භොතො වෙ වචනං සච්චං සුහතො වානරො මයා.

3476. අත්තනො වෙ හි වාදස්ස අපරාධං විජානියා,
න මං ත්වං ගරහෙය්‍යාසි භොතො වාදෙ හි තාදිසො.

3477. ආහු ඛත්තවිධා ලොකෙ බාලා පණ්ඩිතමානිනො,
මාතරං පිතරං හඤ්ඤෙ අථො ජෙට්ඨම්පි භාතරං
හනෙය්‍ය පුත්තදාරෙ ච අත්ථො චෙ තාදිසො සියා.

3478. යස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍ය වා,
න තස්ස සාඛං භඤ්ජෙය්‍ය මිත්තදුබ්භො හි පාපකො.

3479. අථ අත්ථෙ සමුප්පන්නෙ සමූලමපි අබ්බහෙ.
අත්ථො මෙ සම්බලෙනාසි සුහතො වානරො මයා.

3480. සො වෙ අත්ථො ච ධම්මො ච කල්‍යාණො න ච පාපකො,
භොතො වෙ වචනං සච්චං සුහතො වානරො මයා.

3481. අත්තනො වෙ හි වාදස්ස අපරාධං විජානියා,
න මං ත්වං ගරහෙය්‍යාසි භොතො වාදෙ හි තාදිසො.

3482. අහෙතුවාදෙ පුරිසො යො ච ඉස්සරකුත්තිකො,
පුබ්බෙකතී ච උච්ඡෙදී යො ච ඛත්තවිධො නරො.

---

1. තත්ථෙවානුප - වි. මජ්ඣ.

3473. සත්ත්වයන්ගේ රූපස්කන්ධය සතර මහා භූතයන් නිසා හට ගනී. යමකින් රූපය හටගනී ද (කාලක්‍රියා කාලයෙහි) යළි එහි ම එළඹෙයි.

3474. සත්ත්වතෙම මෙලොව මැ ජීවත් වෙයි. පරලෙව්හි (උපන් සත්ත්වයා ගති වශයෙන් මෙ ලොවට නො පැමිණ එහි ම) විනාශ වෙයි. මේ ලොකය (තෙමේ ම) විනාශයට පැමිණෙයි. යම් බාල කෙනෙක් හෝ යම් පණ්ඩිත කෙනෙක් හෝ වෙද්ද (ඒ සියල්ලෝ ද විනාශ වෙති.) (මෙසේ) ලොව විනාශයට පත්වන කල්හි මෙහි කවරෙක් නම් පාප කර්මයෙන් බැදේ ද?

3475. (තොප විසින් ප්‍රකාශ කරන ලද) ඒ අර්ථයද ධර්මයද (උච්ඡෙද වාදය) යහපත් වේ නම් අලාමකත් වේ නම් භවත්හුගේ වචනය සත්‍ය වේ නම් ඒ වානරයා මා විසින් මනාව නසන ලද්දේ ය. (එහි ලා මාගේ වරද කුමක් ද?)

3476. ඉදින් තමාගේ වාදයාගේ දෝෂය දන්නෙහි නම්, නුඹ මට නො ගරහන්නෙහි ය. භවත්හුගේ වාදය එබඳු එකකි. (තාපස තෙම කීවේ ය.

3477. ඉදින් එබඳු ප්‍රයෝජනයක් වන්නේ නම් මාපියන් ද යළි දෙටු සොහොවුරා ද අඹුදරුවන් ද නසන්නේ ය යි (කියූ) ක්‍ෂත්‍ර විද්‍යා දත් පණ්ඩිතමානී අඥයෝ වූහ.

3478. යම් ගසක්හුගේ සෙවනෙහි හිදී ද, හොවීද ඒ ගසෙහි අත්තක් හෝ නොබිඳින්නේ ය. යම් හෙයකින් මිත්‍ර ද්‍රොහකම ලාමක වේද එහෙයිනි.

3479. තවද කටයුත්තක් ඇති කල්හි සහමුලින් ම උදුරන්නේය. (යන කීමක් ඇත.) මට මාර්ගොපකරණයෙන් ප්‍රයෝජන විය. එහෙයින් මා විසින් ඒ වානරයා මනාව නසන ලද්දේ ය.

3480. ඒ මිත්‍රද්‍රෝහිත්වය පිළිබඳ කීම අර්ථ සහිතත් වේ නම් දැහැමිත් වේ නම් යහපතුත් වේ නම් අලාමකත් වේ නම්, පින්වතාගේ කීම සත්‍ය නම් ඒ වානරයා මා විසින් මනාව නසන ලදී. එහිලා මාගේ වරද කුමක් ද?

3481. ඉදින් (පින්වත, නුඹ යම් හෙයකින්) තමාගේ වාද-යාගේ දෙෂය දන්නෙහි නම් නුඹ මට නො ගරහන්නෙහි ය. භවත්හුගේ වාදය එබඳු යි (තාපස තෙම කීවේ ය.)

3482. යම් අහේතුකවාදී පුරුෂයෙක, ඊශ්වරවාදියෙක, පූර්-වෙකෘතහේතුවාදියෙක, උච්ඡෙදවාදියෙක, යම් ක්‍ෂත්‍ර විද්‍යා දන්නා පුරුෂයෙකැ යි යන යම් පස් දෙනෙක් වෙත් ද,

3483. එතෙ අසප්පුරිසා ලොකෙ බාලා පණ්ඩිතමානිනො,
කරෙය්‍ය තාදිසො පාපං අථො අඤ්ඤම්පි කාරයෙ
අසප්පුරිසසංසග්ගො දුක්කටො කටුකුද්‍රයො.

3484. උරබ්භරූපෙන බකාසු[1] පුබ්බෙ
අසඞ්කිතො අජයූථං උපෙති,
හන්ත්වා උරණිං අජියං[2] අජඤ්ච
චිත්‍රාසයිත්වා යෙන කාමං පලෙති.

3485. තථා විධෙකෙ සමණබ්‍රාහ්මණාසෙ
ඡදනං කත්වා වඤ්චයන්ති මනුස්සෙ,
අනාසකා ථණ්ඩිලසෙය්‍යකා ච
රජොජල්ලං උක්කුටිකප්පධානං
පරියායභත්තඤ්ච අපාණකත්තං[3]
පාපාචාරා අරහන්තො වදනා.

3486. එතෙ අසප්පුරිසා ලොකෙ බාලා පණ්ඩිතමානිනො,
කරෙය්‍ය තාදිසො පාපං අථො අඤ්ඤම්පි කාරයෙ
අසප්පුරිසසංසග්ගො දුක්කටො කටුකුද්‍රයො.

3487. යමාහු නත්ථි විරියන්ති හෙතුඤ්ච අපවදන්ති[4] යෙ,
පරකාරං අත්තකාරඤ්ච යෙ තුච්ඡං සමවණ්ණයුං.

3488. එතෙ අසප්පුරිසා ලොකෙ බාලා පණ්ඩිතමානිනො,
කරෙය්‍ය තාදිසො පාපං අථො අඤ්ඤම්පි කාරයෙ
අසප්පුරිසසංසග්ගො දුක්කටො[5] කටුකුද්‍රයො.

3489. සචෙ හි විරියං නාස්ස කම්මං කල්‍යාණපාපකං,
න භරෙ වඩ්ඪකිං[6] රාජා නපි යන්තානි[7] කාරයෙ.

3490. යස්මා ච විරියං අත්ථි කම්මං කල්‍යාණපාපකං,
තස්මා යන්තානි කාරෙති රාජා භරති වඩ්ඪකිං.

3491. යදි වස්සසතං දෙවො න වස්සෙ න හිමං පතෙ,
උච්ඡිජ්ජෙය්‍ය අයං ලොකො විනස්සෙය්‍ය අයං පජා.

1. වකස්සු – මජසං. වකාසු – වි.
2. අජිකං – මජසං.
3. අපාණකත්තා – මජසං, සයා.
4. අහෙතුඤ්ච පවදන්තියෙ – මජසං.
5. දුක්ඛනෙතා – මජසං.
6. වඩ්ඪකී – මජසං.
7. තන්තානි – මජසං.

3483. පණ්ඩිතමානී වූ බාල වූ මොවුහු ලොකයෙහි අසත් පුරුෂයෝ වෙත්. එබඳු අසත්පුරුෂයා තෙමේද පව් කරන්නේ ය. වැළි අනුන් ලවාත් පව් කරවන්නේ ය. අසත්පුරුෂයන් හා එක්වීම දුඃඛාන්තයක් ද කටුක විපාක වැඩෙන්නක් ද වන්නේ ය.

3484. පෙර වෘකයෙක් නොසැකවූයේ බැටළු රුවින් එළු රැළකට පැමිණෙයි. තිරෙළු දෙනක් ද එළු දෙනක් ද එළුවකු ද නසා කා කැමති සේ පලා යයි.

3485. එබඳු ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වෙත්. ඔවුහු ආහාර නො බුදින්නාහු ය. ගොඩැලි හිස් බිම්වල සයනය කරන්නාහු රජස් දූලින් යුක්ත වූවාහු උක්කුටිකයෙන් තපස් කරන්නාහු වාර භොජනය ද පැන් පානය නො කිරීම ද කරන්නාහු පහත් හැසිරීම් ඇත්තාහු රහතුම්හ යි ප්‍රකාශ කරන්නාහු පැවිදි වෙසින් සිරුර වසා ගෙන මිනිසුන් රවටත්.

3486. පණ්ඩිතමානී වූ අඥ වූ මොවුහු ලොවෙහි අසත්පුරුෂයෝ වෙති. එබඳු අසත්පුරුෂයා තෙමේ ද පව් කරන්නේ ය. අනුන් ලවා ද (පව්) කරවන්නේය. අසත්පුරුෂයන් හා එක්වීම දුඃඛාන්තයක් ද කටුක විපාක වැඩෙන්නක් ද වන්නේ ය.

3487. යම් කෙනෙක් වීය්‍ර්‍යයක් නැතැයි කියත් ද, යම් කෙනෙක් හෙතුවක් නැතැයි කියත් ද, අනුන්ගේ ක්‍රියා හා තමන්ගේ ක්‍රියා හිස්ය යි යම් කෙනෙක් කියත් ද,

3488. පණ්ඩිතමානී වූ, අඥ වූ මොවුහු අසත්පුරුෂයෝ වෙති. එබඳු අසත්පුරුෂයා තෙමේ ද පව් කරන්නේ ය. අනුන් ලවා ද පව් කරවන්නේ ය. අසත්පුරුෂයන් හා එක්වීම දුඃඛාන්තයක් ද කටුක විපාක වැඩෙන්නක් ද වන්නේ ය.

3489. ඉදින් එබඳු වීය්‍ර්‍යයක් නොවන්නේ නම් යහපත් වූ ද ලාමක වූ ද කර්මයකුත් නොවන්නේ නම් රජ තෙම වඩුවකු පෝෂණය නො කරන්නේ ය. (සත්බුමු පහය ආදි) යන්ත්‍ර ද නො කරවන්නේ ය.

3490. යම් හෙයකින් වීය්‍ර්‍යය ඇත්තේද, යහපත් වූ ද ලාමක වූ ද කර්ම ඇත්තේ ද, එහෙයින් රජ තෙම (ප්‍රාසාදදි) යන්ත්‍රයන් කරවයි. වඩුවා ද පොෂණය කරයි.

3491. ඉදින් හවුරුදු සියයක් වැසි නොවසී ද හිම නොවැටෙ ද, (එකල) මේ ලොකයතෙම සිඳී යන්නේ ය. මේ ප්‍රජා තොමෝ වැනැසෙන්නී ය.

3492. යස්මා ච වස්සති දෙවො හිමං චාපි[1] ඵුසීයති,
තස්මා සස්සානි පච්චන්ති රට්ඨඤ්ච පලලතෙ චිරං.

3493. ගවඤ්චෙ තරමානානං ජිම්හං ගච්ඡති පුඞ්ගවො,
සබ්බා තා ජිම්හං ගච්ඡන්ති නෙත්තෙ ජිම්හං ගතෙ සති.

3494. එවමෙව මනුස්සෙසු යො හොති සෙට්ඨසම්මතො,
සො චෙ අධම්මං චරති පගෙව ඉතරා පජා
සබ්බං රට්ඨං දුක්ඛං සෙති රාජා චෙ හොති අධම්මිකො.

3495. ගවඤ්චෙ තරමානානං උජුං ගච්ඡති පුඞ්ගවො,
සබ්බා තා උජුං ගච්ඡන්ති නෙත්තෙ උජු[2]ගතෙ සති.

3496. එවමෙව මනුස්සෙසු යො හොති සෙට්ඨසම්මතො,
සො චෙව ධම්මං චරති පගෙව ඉතරා පජා
සබ්බං රට්ඨං සුඛං සෙති රාජා චෙ හොති ධම්මිකො.

3497. මහාරුක්ඛස්ස ඵලිනො ආමං ඡින්දති යො ඵලං,
රසඤ්චස්ස න ජානාති බීජඤ්චස්ස විනස්සති.

3498. මහාරුක්ඛූපමං රට්ඨං අධම්මෙන යො පසාසති,
රසඤ්චස්ස න ජානාති රට්ඨඤ්චස්ස විනස්සති.

3499. මහාරුක්ඛස්ස ඵලිනො පක්කං ඡින්දති යො ඵලං,
රසඤ්චස්ස විජානාති බීජඤ්චස්ස න නස්සති.

3500. මහාරුක්ඛූපමං රට්ඨං ධම්මෙන යො පසාසති,
රසඤ්චස්ස විජානාති රට්ඨඤ්චස්ස න නස්සති.

3501. යො ච රාජා ජනපදං අධම්මෙන පසාසති,
සබ්බොසධීහි සො රාජා විරුද්ධො හොති ඛත්තියො.

1. හිමඤ්චානුඵුසයති - මජසං. හිමං චානු ඵුසෙයාති - වි.
2. උජුං - මජසං.

3492. යම් හෙයකින් වැසි වසී ද, හිම ස්පර්ශ කෙරේ ද, එහෙයින් ශස්‍යයෝ පැසෙත්, රට ද බොහෝ කලක් පාලනය කරනු ලැබේ.

3493. ඉදින් යන්නා වූ ගවයන් අතුරෙන් පෙරටුව යන ගව තෙම වක්ව යේ නම්, පෙරටුව යන්නා වක්ව ගිය කල්හි ඒ සියල්ලෝම වක්ව යෙත් ද,

3494. එසේම මිනිසුන් අතුරෙහි යම් මිනිසෙක් ශ්‍රේෂ්ඨ ය යි සම්මත ද ඉදින් හෙතෙම අධර්මයෙහි හැසිරේ නම් සෙසු ප්‍රජාව ගැන කවර කථා ද? ඉදින් රජ තෙම නොදැහැමි වේනම් මුළු රට ම දුකසේ වෙසෙ යි.

3495. ඉදින් යන්නාවූ ගවයන් අතුරෙන් පෙරටුව යන ගවයා සෘජුව යේ නම්, පෙරටුව යන්නා සෘජුව ගිය කල්හි ඒ සියල්ලෝ ම සෘජුව යෙත්.

3496. එසේම මිනිසුන් අතුරෙහි යම් මිනිසෙක් ශ්‍රේෂ්ඨ ය යි සම්මත ද, ඉදින් හෙතෙම ධර්මයෙහි හැසිරේ නම් සෙසු ප්‍රජාව ගැන කවර කථා ද, ඉදින් රජ තෙම දැහැමි නම් මුළු රට ම සුවසේ වෙසෙයි.

3497. යමෙක් පලගත් මහ අඹරුකක්හුගේ අමු ගෙඩියක් කඩයි ද, හෙතෙම ඒ ගෙඩියේ රසය ද නොදනී. ඒ ඵලයෙහි බීජය ද නැසෙයි.

3498. යමෙක් මහ අඹරුකක් බඳු වූ රට අධර්මයෙන් අනු-ශාසනා කෙරේ ද, හෙතෙමේ ඒ රටේ (අයබදු) රසයන් නොවිඳියි. ඔහුගේ රටත් වැනසේ.

3499. යමෙක් පලගත් මහ අඹරුකක්හුගේ පැසුණු ගෙඩියක් කඩයි ද, හෙතෙම ඒ ගෙඩියේ රසය ද දනගනී. එහි බීජය ද නො නැසේ.

3500. යමෙක් මහ අඹරුකක් බඳු වූ රට දැහැමින් අනුශාසනා කෙරේ ද, හෙතෙම ඒ රටේ (අය බදු) රසය ද විඳියි. (ලබයි) ඔහුගේ රට ද නො නැසේ.

3501. යම් රජෙක් අධර්මයෙන් (යම්) දනව්වක් පාලනය කෙරේ ද, ඒ ක්‍ෂත්‍රිය රජ තෙම සියලු ඖෂධයන් හා විරුද්ධ වූයේ වෙයි.

3502. තථෙව නෙගමෙ හිංසං යෙ යුත්තා කයවික්කයෙ,
ඔජදානබලීකාරෙ[1] ස කොසෙන විරුජ්ඣති.

3503. පහාරවරඛෙත්තඤ්ඤූ සඞ්ගාමෙ කතනිස්සමෙ,
උස්සිතෙ හිංසයං රාජා ස බලෙන විරුජ්ඣති.

3504. තථෙව ඉසයො හිංසං සංයමෙ බ්‍රහ්මචාරිනො,[2]
අධම්මචාරී ඛත්තියො සො සග්ගෙන විරුජ්ඣති.

3505. යො ච රාජා අධම්මට්ඨො භරියං හන්ති අදූසකං,
ලුද්දං පසවතෙ පාපං[3] පුත්තෙහි ච විරුජ්ඣති.

3506. ධම්මඤ්චරෙ ජානපදෙ නෙගමෙසු බලෙසු ච,
ඉසයො ච න හිංසෙය්‍ය පුත්තදාරෙ සමඤ්චරෙ.

3507. ස තාදිසො භූමිපති රට්ඨපාලො අකොධනො,
සාමන්තෙ සම්පකම්පෙති ඉන්දොව අසුරාධිපොති.

3. මහාබොධිජාතකං.

පඤ්ඤාසනිපාතො නිට්ඨිතො.

තස්සුද්දානං:-

සනළිනිකමව්හයනො පඨමො
දුතියො පන සඋම්මදන්තිවරො,
තතියො පන බොධි සිරිව්හයනො
කථිතාපන තීණි ජිනෙන සුභාති.

1. ඔජදනෙබලීකාරෙ - වි.
2. බ්‍රහ්මචාරියෙ - වි. මජ්ඣ.
3. ඨානං - මජ්ඣ. සයා.

3502. එසේ ම නිගම වැසියන් ද, වෙළඳාමෙහි යම් කෙනෙක් යෙදුනෝ නම් (ඔවුන් ද) බඩු ගෙන ඊම් සුංවත්දීම් වශයෙන් ඔජදන හා (බදු ගෙවීම් වශයෙන්) බලිදීම කරන්නන් ද (හිංසා කෙරේ නම්) හේ කොෂ්ඨාගාරය හා විරුද්ධ වූයේ වෙයි.

3503. පහරදීමට සුදුසු තැන් දන්නා වූ (ධනුර්ධරයන් ද), යුද්ධයෙහි කළ පුරුදු ඇති (මහා යෝධයන් ද), ප්‍රසිද්ධ වූ (මහ ඇමතියන් ද) (යම් රජෙක් හිංසා කෙරේ නම්) ඒ රජ බලසෙනඟ හා විරුද්ධ වූයේ වෙයි.

3504. එසේ ම සංයම ඇති, බ්‍රහ්මචාරී වූ, පැවිද්දන් හිංසා කරන අධර්මයෙහි හැසිරෙන ඒ ක්‍ෂත්‍රිය තෙම ස්වර්ගය හා විරුද්ධ වූයේ වෙයි.

3505. තවද, අධර්මිෂ්ඨ වූ යම් රජෙක් අදූසක (සිල්වත්) වූ භාර්‍යාව නසා ද හේ රෞද්‍ර වූ පාපය රැස්කරයි. පුත්‍රයන් සමග ද විරුද්ධ වූයේ වෙයි.

3506. (මහරජ, එබැවින්) දනව්වැස්සන් කෙරෙහි ද, නියම් ගම් වැස්සන් කෙරෙහි ද, බලසෙනඟ කෙරෙහි ද ධර්මයෙහි හැසිරෙන්නේය. පැවිද්දන් ද හිංසා නො කරනනේය. අඹු දරුවන් කෙරෙහි ද සමව හැසිරෙන්නේ ය.

3507. රට පාලනය කරන ක්‍රොධ නොකරන එබඳු ඒ මිහිපති තෙම අසුරාධිප නම් වූ ඉන්ද්‍රයා මෙන් අසල්වැසි (සතුරන්) කම්පා කෙරෙයි.

මහාබොධි ජාතක යි.

පඤ්ඤාස නිපාතය නිමි.

එහි උද්දානය:

නලිනිකා නම් වූ පළමුවැන්න ද උම්මාදන්ති නම් වූ දෙවැන්න ද, මහාබොධි නම් වූ තෙවැන්න ද යි මේ ජාතක තුන සර්වඥයන් වහන්සේ විසින් දෙසනලදී.

සට්ඨිනිපාතො

1. සොණකජාතකං

3508. කස්ස සුත්වා සතං දම්මි සහස්සං දට්ඨු[1] සොණකං,
කො මෙ සොණක මක්ඛාති[2] සහායං පංසුකීළිතං.[3]

3509. අථ බ්‍රවී මාණවකො දහරො පඤ්චචූළකො,
මය්හං සුත්වා සතං දෙහි සහස්සං දට්ඨු සොණකං
අහං සොණකමක්ඛිස්සං[4] සහායං පංසුකීළිතං.

3510. කතරස්මිං[5] සො ජනපදෙ රට්ඨෙසු නිගමෙසු ච,
කත්ථ තෙ සොණකො දිට්ඨො[6] තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

3511. තවෙව දෙව විජිතෙ[7] තවෙවුය්‍යානභූමියා,
උජුවංසා මහාසාලා නීලොභාසා මනොරමා
තිට්ඨන්ති මෙඝසමානා රම්මා අඤ්ඤොඤ්ඤනිස්සිතා.

3512. තෙසං මූලස්මිං[8] සොණකො ඣායති අනුපාදනො,
උපාදනෙසු ලොකෙසු දය්හමානෙසු[9] නිබ්බුතො.

3513. තතො ච රාජා පායාසි සෙනාය චතුරඞ්ගියා,
කාරාපෙත්වා සමං මග්ගං අගමා යෙන සොණකො.

3514. උය්‍යානභූමිං ගන්ත්වාන විචරන්තො බ්‍රහාවනෙ,
ආසීනං සොණකං දක්ඛි දය්හමානෙසු නිබ්බුතං.

3515. කපණොවතායං භික්ඛු මුණ්ඩො සඞ්ඝාටිපාරුතො,
අමාතිකො අපිතිකො රුක්ඛමූලස්මිං ඣායති.

3516. ඉමං වාක්‍යං නිසාමෙත්වා සොණකො එතදබ්‍රවි,
න රාජ කපණො හොති ධම්මං කායෙන ඵස්සයං.

---

1. දිස්වා – මජසං. සයා.
2. මක්ඛාසි – මජසං.
3. සහ පංසුකීළිතං – වි.
4. සොණකක්ඛිස්සං – මජසං.
5. කතමස්මිං – මජසං.
6. කත්ථසොණකමද්දක්ඛි – මජසං.
7. ජීවිතෙ – මජසං.
8. මූලම්හි – මජසං.
9. ඩය්හමානෙසු – වි. මජසං, සයා.

සට්ඨිනිපාතය

1. සොණක ජාතකය

3508. සොණක නම් යහළුවා වසන තැන අසා කියන්නා වූ කවරකුහට මම සියයක් දෙම් ද, දැක කියන්නා වූ කවරකුහට දහසක් දෙම් ද, වැලිකෙළියෙහි පටන් යහළු වූ සොණක නම් තැනැත්තා ගැන මට කවරෙක් නම් කියන්නේ ද?

3509. ඉක්බිති තරුණ වූ පඤ්චචූළක නම් මාණවක තෙම ප්‍රතිගායනා වශයෙන් මේ ගාථාව කීවේ ය. මහරජතුමනි, සොණක නම් තැනැත්තා ගැන අසා කියන්නා වූ මට සියයක් දුන මැනැවි. සොණක නම් තැනැත්තා දැක කියන්නා වූ මට දහසක් දුන මැනැවි. වැලිකෙළියෙහි පටන් යහළු වූ සොණක නම් යහළුවා මම කියම් යි.

3510. මාණවකය, ඒ සොණක තෙම නුඹ විසින කිනම් ජනපදයෙක්හි දී දක්නා ලද්දේ ද? කවර රටක දී කවර නියම්-ගමෙක්හි දක්නා ලද ද, ඒ කරුණ විචාරනු ලබන්නා වූ නුඹ මට කියව යි රජ තෙම කීයේ ය.

3511. දේවයන් වහන්ස, නුඹ වහන්සේගේ ම රටෙහි නුඹ වහන්සේගේ ම උයන් බිමෙහි සෘජු වූ කඳ ඇති නිල් පැහැති සිත්කලු වූ වැහිවලාකුළු බඳු ගසින් ගස හා අත්තෙන් අත්ත එකට වෙළීගත් මහා සාලවෘක්ෂයෝ වෙත්.

3512. ඒ සාලවෘක්ෂයන්ගේ මුල්හි සොණක තෙමේ කාමූ-පාදනයන්ගෙන් පිරී පවත්නා ලොකයෙහි කාමූපාදන විරහිත වූයේ එකොළොස් ගින්නෙන් දැවෙන ලොකයෙහි නිවුණේ ම ධ්‍යාන කෙරේ යයි තරුණ තෙම කීයේ ය.

3513. ඉක්බිති ඒ අරින්දම රජතෙම සිවුරඟ සෙනග සමග පිටත් විය. මහ සම කරවා සොණක නම් පසේබුදුන් වහන්සේ යම් තැනෙක්හි නම් එහි ගියේ ය.

3514. රජතෙම උයන් බිමට ගොස් ඒ මහා උයන්හි හැසිරෙන්නේ එකොළොස් ගින්නෙන් දැවෙන සත්‍වයන් අතුරෙහි නිවී වැඩහුන් සොණක නම් පසේබුදුන් වහන්සේ දැක්කේ ය.

3515. හිස මුඩු කරගත් සඟළ සිවුරක් පෙරැවි මේ මහණ තෙම දිළින්දෙකි. මා පියන් නැත්තේ ම ගස මුල ධ්‍යාන කෙරේ යයි කීවේ ය.

3516. සොණක පසේබුදුරජාණන් වහන්සේ මේ වදන් අසා මෙසේ කීහ. ''මහරජ, ආර්‍ය්‍යමාර්ගධර්මය නාමකායයෙන් ස්පර්ශ කරනලද තැනැත්තා දිළින්දෙක් නොවන්නේ ය''.

3517. යො ධ ධම්මං නිරංකත්වා අධම්මමනුවත්තති,
ස රාජ කපණො හොති පාපො පාපපරායනො.

3518. අරින්දමොති මෙ නාමං කාසිරාජාති මං විදූ,
කච්චි භොතො සුඛසෙය්‍යා ඉධ පත්තස්ස සොණක.

3519. සදාපි භද්‍රමධනස්ස අනාගාරස්ස භික්ඛුනො,
න තෙසං කොට්ඨෙ ඔපෙන්ති න කුම්භිං න කළොපියං
පරනිට්ඨිත[1]මෙසානා තෙන යාපෙන්ති සුබ්බතා.

3520. දුතියම්පි භද්‍රමධනස්ස අනාගාරස්ස භික්ඛුනො,
අනවජ්ජපිණ්ඩො හොතබ්බො න ච කොචූපරොධති.

3521. තතියම්පි භද්‍රමධනස්ස අනාගාරස්ස භික්ඛුනො,
නිබ්බුත[2]පිණ්ඩො හොතබ්බො න ච කොචූපරොධති.

3522. චතුත්ථම්පි භද්‍රමධනස්ස අනාගාරස්ස භික්ඛුනො,
මුත්තස්ස රට්ඨෙ චරතො සඞ්ගො යස්ස න විජ්ජති.

3523. පඤ්චමම්පි භද්‍රමධනස්ස අනාගාරස්ස භික්ඛුනො;
නගරම්හි දය්හමානම්හි නාස්ස කිඤ්චි අදය්හථ.

3524. ඡට්ඨම්පි භද්‍රමධනස්ස අනාගාරස්ස භික්ඛුනො,
රට්ඨෙ විලුම්පමානම්හි නාස්ස කිඤ්චි අහාරථ.[3]

3525. සත්තමම්පි භද්‍රමධනස්ස අනාගාරස්ස භික්ඛුනො,
චොරෙහි රක්ඛිතං මග්ගං යෙ චඤ්ඤෙ පරිපන්ථිකා
පත්තචීවරමාදාය සොත්ථිං ගච්ඡති සුබ්බතො.

3526. අට්ඨමම්පි භද්‍රමධනස්ස අනාගාරස්ස භික්ඛුනො,
යං යං දිසං පක්කමති අනපෙක්ඛොව ගච්ඡති.

---

1. පරිනිට්ඨිත – වි. මජ්ඣං, ස්‍යා,
2. නිබ්බුතො – වි. මජ්ඣං,
3, ආහරථ – මජ්ඣං,

3517. මහරජ, මේ ලොකයෙහි යම් කිසිවෙක් දස කුසල් දහම් බැහැර කොට දස අකුසල්හි යෙදේ ද, පාපී වූ ද පාපීන්ට පිහිට වූ ද හෙ තෙමේ දිළින්දෙක් වේ යයි.

3518. අරින්දම යනු මාගේ නම වෙයි. මා කසීරජය යි දනිත්. සොණකයන් වහන්ස, මෙහි පැමිණි පින්වත් නුඹ වහන්සේට සුවපහසු කෙසේ ද යි,

3519. මහරජ, ගිහිගේ හැරපියා පැවිදි වූ නිර්ධන භික්ෂුවකට සැමදා ම යහපත් ය. මහරජ, ඔවුන්ගේ කොෂ්ඨාගාරයෙහි ධන ධාන්‍ය තැන්පත් නො කෙරෙත්. සැළෙහි ද නො දමත්. පැසෙහි ද නො දමත්. මනා පැවතුම් ඇති අනුන් විසින් නිමවන ලද්ද වූ ආහාර සොයන ඔව්හු ඒ අනුන් දෙන අහරින් යැපෙත්.

3520. යම් හෙයෙකින් කැප සරුප් ලෙස ලැබුණු හෙයින් නිරවද්‍ය පිණ්ඩාහාරය වැළැඳිය යුතු වේ ද, ඒ පිණ්ඩාහාරය හෙතුවින් කිසියම් ක්ලෙශයකුත් පීඩා නො කෙරේ ද, එ හෙයින් ගිහිගේ හැරපියා පැවිදි වූ නිර්ධන භික්ෂුහට මේ දෙවැනි යහපත ද වේ.

3521. යම් හෙයෙකින් පස්විකා වැළැඳිය යුතු හෙයින් නිබ්බුතපිණ්ඩය නම් ලත් පිණ්ඩාහාරය වැළැඳිය යුතු වේ ද, ඒ පිණ්ඩාහාරය හෙතුවින් කිසියම් ක්ලේශයකුත් පීඩා නො කෙරේ ද එ හෙයින් ගිහිගේ හැරපියා පැවිදි වූ නිර්ධන භික්ෂුහට තෙවැනි යහපත ද වේ.

3522. යම් හෙයෙකින් කුලාදියෙහි නො ඇලී රටෙහි හැසිරෙන යම් ඒ භික්ෂුවක්හට රාගාදි කිසියම් සඞ්ග කෙනෙක් නැද්ද; එ හෙයින් ගිහිගේ හැරපියා පැවිදි වූ නිර්ධන භික්ෂුහට මේ සිවුවැනි යහපතත් වේ.

3523. යම් හෙයෙකින් නගරය ගින්නෙන් දැවෙනු ලබන කල්හි යම් භික්ෂුවකගේ කිසිවක් නො දැවේ ද, එ හෙයින් ගිහිගේ හැරපියා පැවිදි වූ නිර්ධන භික්ෂුහට මේ පස්වැනි යහපතත් වේ.

3524. යම් හෙයෙකින් රට සොරුන් පැහැර ගනු ලබන කල්හි මේ භික්ෂුවගේ කිසිවක් පැහැර නො ගනු ලැබේ ද, එ හෙයින් ගිහිගේ හැරපියා පැවිදි වූ නිර්ධන භික්ෂුහට මේ සවැනි යහපතත් වේ.

3525. යම් හෙයෙකින් සොරුන් විසින් රක්නා ලද මාර්ගයෙහි ද අන්‍ය වූ යම් බඳු මාර්ගොපද්‍රව ඇත් නම් එ බඳු තැන්හි ද මනා පැවතුම් ඇති භික්ෂු තෙම පා සිවුරු ගෙන සුවසේ යයි ද, එ හෙයින් ගිහිගේ හැරපියා පැවිදි වූ නිර්ධන භික්ෂුහට මේ සත්වැනි යහපතත් වේ.

3526. යම් හෙයෙකින් භික්ෂු තෙම යම් යම් දිසාවකට පිටත් ව යේ ද, ඒ ඒ දිසාවට අපෙක්ෂා රහිත ව යේ ද, එ හෙයින් ගිහිගේ හැරපියා පැවිදි වූ නිර්ධන භික්ෂුහට මේ අට වැනි යහපතත් වේ.

3527. බහූනි[1] සමණභද්‍රානි යෙ ත්‍වං භික්ඛු පසංසසි,
අහඤ්ච ගිද්ධො කාමෙසු කථං කාහාමි සොණක.

3528. පියා මෙ මානුසා කාමා අථො දිබ්‍යාපි[2] මෙ පියා,
අථ කෙන නු වණ්ණෙන උභො ලොකෙ ලභම්හසෙ.

3529. කාමෙසු ගිද්ධා කාමරතා කාමෙසු අධිමුච්ඡිතා,
නරා පාපානි කත්‍වාන උපපජ්ජන්ති දුග්ගතිං.

3530. යෙ ච කාමෙ පහත්‍වාන නික්ඛන්තා අකුතොභයා,
එකොදිභාවාධිගතා න තෙ ගච්ඡන්ති දුග්ගතිං.

3531. උපමන්තෙ කරිස්සාමි තං සුණොහි අරින්දම,
උපමායපිධෙකච්චෙ[3] අත්‍ථං ජානන්ති පණ්ඩිතා.

3532. ගඞ්ගාය කුණපං දිස්‍වා වුය්හමානං මහණ්ණවෙ,
වායසො සමචින්තෙසි අප්පපඤ්ඤො අචෙතසො.

3533. යානඤ්ච වතිදං ලද්ධං භක්ඛොචායං අනප්පකො,
තත්‍ථ රත්තිං තත්‍ථ දිවා තත්‍ථෙව නිරතො මනො.

3534. ඛාදං නාගස්ස මංසානි පිවං භාගීරථොදකං,
සම්පස්සං වනචෙත්‍යානි න පලෙත්‍ථ[4] විහඞ්ගමො.

3535. තඤ්ච ඔතරණී ගඞ්ගා පමත්තං කුණපෙ රතං,
සමුද්දං අජ්ඣගාහාසි අගතී යත්‍ථ පක්ඛිනං.

3536. සො ච භක්ඛපරික්ඛීණො උප්පතිත්‍වා[5] විහඞ්ගමො,
න පච්ඡතො න පුරතො නුත්තරං නොපි දක්ඛිණං.

3537. දීපං සො න අජ්ඣගඤ්ඡි අගතී යත්‍ථ පක්ඛිනං,
සො ච තත්‍ථෙව පාපත්‍ථ යථා දුබ්බලකො තථා.

1. බහූ පි භද්‍රා එතෙසං – මජසං.
බහූපි භද්‍රකා එතෙ – වි.
2. දිබ්බාපි – වි.
3. උපමාය මිධෙකච්චෙ – මජසං.
4. නපලෙථ – මජසං.
5. උපදත්‍වා – වි. මජසං.

3527. භික්ෂූන් වහන්ස, නුඹ වහන්සේ යම් ඒ ශ්‍රමණභද්‍ර-කාරණයන් පසසන සේක් ද, එ බඳු ශ්‍රමණභද්‍රකාරණයෝ බොහෝ වෙති. සොණකයන් වහන්ස, මම වනාහි කාමයන්හි ගිජු කෙනෙක්මි. කෙසේ නම් එය කෙරෙම් ද?

3528. මට මිනිස් කාමයෝ ප්‍රිය වෙත්. වැළි දිව්‍යමය කාමයෝ ද ප්‍රිය වෙත්. එසේ ඇති කල්හි කවර ආකාරයෙකින් දෙ ලොවැ ම කාම සම්පත් ලබන්නෙම් දැ යි රජ තෙමෙ කීවේ ය.

3529. මහරජ, කාමයන්හි ගිජු වූ කාමයන්හි ඇළුණා වූ, කාමයන්හි අධික වශයෙන් මුසපත් වූ මනුෂ්‍යයෝ පාපකර්ම කොට දුගතියෙහි උපදිති.

3530. යමෙක් කාමසම්පත් හැරපියා ගිහි ගෙයින් නික්මුණාහු කොයිනුත් බියක් නැත්තාහු හුදෙකලා වාසයට ගියෝ වෙත් ද, ඒ පැවිද්දෝ දුගතියට නො යත්.

3531. අරින්දම රජුනි, තොපට උපමාවක් ගෙනහැර පාන්නෙමි. එය අසව. මෙ ලොවැ ඇතැම් පණ්ඩිත කෙනෙක් උපමායෙනුදු අර්ථය දැනැගනිත්.

3532. අනුවණ වූ කාරණාකාරණ නොසිතන කවුඩෙක් ගැඹුරු පුළුල් දිය ඇති ගඟෙහි පාවෙමින් යන්නා වූ ඇත් කුණපයක් දැක මෙසේ සිතුවේ ය.

3533. එකාන්තයෙන් මට හස්තියානයෙක් ලැබිණ. මෙය ම මාගේ ආහාරය ද වේ. එහි ම රෑ දවල් ගෙවන්නෙමි යි කවුඩාගේ සිත ඒ ඇත්කුණෙහි ම ඇලී සිටියේ ය.

3534. ඇතාගේ මස් කමින් භාගීරථී ගඟෙහි දිය බොමින් වනයන් හා චෛත්‍ය වෘක්ෂයන් බලමින් යන ඒ කවුඩා පියාසර කොට නො ගියේ ය.

3535. සමුද්‍රාභිමුඛ වැ ගලාබස්නා වූ ගංගා තොමෝ ඇත්කුණෙහි ඇළුණා වූ ප්‍රමාදයට වන් ඒ කවුඩා ද, යම් තැනෙක්හි පක්ෂීන්ට යා හැකි නො වේ ද, එ බඳු මහාසමුද්‍රයට ඇදගෙනැ ගියා ය.

3536. ආහාරය අවසන් වූ ඒ කවුඩු තෙමේ ද අහසට පැන පැළදික්හි ද පිහිටක් නොලැබුවේ ය. පෙර දික්හි ද පිහිටක් නො ලැබුවේ ය. උතුරු දිසාවෙහි ද පිහිටක් නො ලැබුවේ ය. දකුණු දිසාවෙහි ද පිහිටක් නො ලැබුවේ ය.

3537. ඒ කවුඩු තෙම යම් තැනෙක්හි පක්ෂීන්ට නො යාහැකි ද එබඳු සාගරය මැද දිවයිනකට නො පැමිණියේ ය. දුර්වලයකු වැටෙන්නාක් මෙන් සාගර මධ්‍යයෙහි ම වැටුණේ ය.

3538. තත්ථ සාමුද්දිකා මච්ඡා කුම්භීලා මකරා සුසු,
පසය්හකාරා ඛාදිංසු ඵන්දමානං විපක්ඛිනං.[1]

3539. එවමෙව තුවං රාජ යෙ චඤ්ඤෙ කාමභොගිනො,
ගිද්ධා වෙ න වමිස්සන්ති කාකපඤ්ඤාය[2] තෙ විදූ.

3540. එසා තෙ උපමා රාජ අත්ථසන්දස්සනී කතා,
ත්වං ච පඤ්ඤායසෙ තෙන යදි කාහසි වා න වා.

3541. එකවාචම්පි ද්වෙ වාචං භණෙය්‍ය අනුකම්පකො,
තතුත්තරිං[3] න භාසෙය්‍ය දසො වය්‍යස්ස[4] සන්තිකෙ.

3542. ඉදං වත්වාන පක්කාමි සොණකො අමිතබුද්ධිමා,
වෙහාසෙ අන්තලික්ඛස්මිං අනුසාසිත්වාන ඛත්තියං.

3543. කො නු මෙ රාජකත්තාරො සූතා වෙය්‍යත්තිමාගතා,[5]
රජ්ජං නිය්‍යාදයිස්සාමි නාහං රජ්ජෙනමත්ථිකො.

3544. අජ්ජෙව පබ්බජිස්සාමි කො ජඤ්ඤා මරණං සුවෙ,
මාහං කාකොව දුම්මෙධො කාමානං වසමන්වගං.

3545. අත්ථි තෙ දහරො පුත්තො දීඝාවු රට්ඨවඩ්ඪනො,
තං රජ්ජෙ අභිසිඤ්චස්සු සො නො රාජා භවිස්සති.

3546. ඛිප්පං කුමාරං ආනෙථ දීඝාවුං රට්ඨවඩ්ඪනං,
තං රජ්ජෙ අභිසිඤ්චිස්සං සො වො රාජා භවිස්සති.

3547. තතො කුමාරං ආනෙසුං දීඝාවුං රට්ඨවඩ්ඪනං,
තං දිස්වා ආලපි රාජා එකපුත්තං මනොරමං.

3548. සට්ඨි ගාමසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
තෙ පුත්ත පටිපජ්ජස්සු රජ්ජං නිය්‍යාදයාමි තෙ.

---

1. විපක්ඛකං – මජසං.
2. කාකපඤ්ඤාව – මජසං.
3. තදුත්තරි – මජසං.
4. අයියස්ස – වි.
5. සුද්දවෙය්‍යත්තමාගතා – මජසං.,
සුද්දවෙය්‍යත්ති මාගතා – වි

3538. මුහුදෙහි වාසය කරන්නා වූ මත්ස්‍යයෝ ද කිඹුලෝ ද මෝරු ද සුසු නම් චණ්ඩ මත්ස්‍යයෝ ද විසිරීගිය පියාපත් ඇති සැලෙමින් සිටියා වූ ඒ කවුඩා බලාත්කාරයෙන් කෑහ.

3539. මහරජ, මෙ පරිද්දෙන් ම නුඹ ද කාමභොගී වූ අන්‍යයෝ ද කාමයන්හි ගිජු වූවාහු නම් ඉදින් කාමයන් හැර නො දමන්නාහු ද ඔව්හු කවුඩන්ගේ ප්‍රඥාවට බඳු ප්‍රඥා ඇත්තෝය යි නුවණැත්තෝ කියත්.

3540. මහරජ, මා විසින් කරුණු ප්‍රකාශ වන්නා වූ මේ උපමාව තොපට ගෙනහැර දක්වන ලදී. ඉදින් එය කරන්නෙහි හෝ නොකරන්නෙහි හෝ ඒ සැටියෙන් නුඹ ද ප්‍රකාශ වන්නෙහි යයි (පසේබුදුරජාණන් වහන්සේ අවවාද දුන් සේක.)

3541. අනුකම්පා ඇති තැනැත්තේ එක වරක් කීම ද දෙ වරක් කීම ද කරන්නේ ය. දසයකු ස්වාමියා වෙත මෙන් ඉන් මතු නො කියන්නේ ය.

3542. අප්‍රමාණ වූ බුද්ධි ඇති සොණක පසේබුදුරජාණන් වහන්සේ මෙසේ කියා රජුට අනුශාසනා කොට අහසට නැඟ වැඩමකළ සේක

3543. සමර්ථ වූ ව්‍යක්තභාවයට පැමිණි මේ රාජ්‍යයට සුදුස්සෙන් අභිෂෙක කරන්නෝ කොහි ද? මම රජය භාර දෙන්නෙමි. මම රජයෙන් ප්‍රයොජන නැත්තෙක්මි.

3544. අද ම පැවිදි වන්නෙමි. හෙට මරණය වන්නේ ද යි කවරෙක් දනීද ? මම දුෂ්ප්‍රාඥ වූ කවුඩා මෙන් කාමයන්ගේ වසයට නො යමි යි රජ තෙම කීවේ ය.

3545. දේවයන් වහන්ස, නුඹ වහන්සේට රට දියුණු කරන්නා වූ දීඝාවු නම් පුතෙක් ඇත්තේ ය. ඔහු රාජ්‍යයෙහි අභිෂෙක කෙරේවා. හෙ තෙමේ අපගේ රජ වන්නේ යැ යි ඇමතියෝ කීහ.

3546. රට දියුණු කරන්නා වූ දීඝාවු නම් කුමරා වහා ගෙන එව. මම ඔහු රාජ්‍යයෙහි අභිෂෙක කරන්නෙමි. හෙ තොපගේ රජ වන්නේ යයි රජ තෙමේ කීවේ ය.

3547. ඉක්බිති රට දියුණු කරන්නා වූ දීඝාවු කුමාරයා ගෙනාවෝ ය. රජ තෙමේ, සිය එකම පුතු වූ මනරම් ඒ කුමරා දැක මෙ සේ කීය.

3548. පුත්‍රය, හැම ලෙසින් ම සම්පූර්ණ වූ ගම් සැටදහසක් ඇත. ඒ ගම් භාර ගනුව. තොපට රජය පවරා දෙමි.

3549. අජ්ජෙව පබ්බජිස්සාමි කො ජඤ්ඤා මරණං සුවෙ,
මාහං කාණොව දුම්මෙධො කාමානං වසමන්වගං.

3550. සට්ඨිනාගසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
සුවණ්ණකච්ඡා මාතඞ්ගා හෙමකප්පනවාසසා.

3551. ආරූළ්හා ගාමණීයෙහි තොමරඞ්කුසපාණිහි,
තෙ පුත්ත පටිපජ්ජස්සු රජ්ජං නියාදයාමි තෙ.

3552. අජ්ජෙව පබ්බජිස්සාමි කො ජඤ්ඤා මරණං සුවෙ,
මාහං කාණොව දුම්මෙධො කාමානං වසමන්වගං.

3553. සට්ඨිඅස්සසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
ආජානීයා ච ජාතියා සින්ධවා සීඝවාහනා.

3554. ආරූළ්හා ගාමණීයෙහි ඉල්ලියාචාපධාරිහි,
තෙ පුත්ත පටිපජ්ජස්සු රජ්ජං නියාදයාමි තෙ.

3555. අජ්ජෙව පබ්බජිස්සාමි කො ජඤ්ඤා මරණං සුවෙ,
මාහං කාණොව දුම්මෙධො කාමානං වසමන්වගං.

3556. සට්ඨිරථසහස්සානි සන්නද්ධා උස්සිතද්ධජා,
දීපා අථොපි වෙයග්ඝා[1] සබ්බාලඞ්කාරභූසිතා.

3557. ආරූළ්හා ගාමණීයෙහි චාපහත්ථෙහි වම්මිහි,
තෙ පුත්ත පටිපජ්ජස්සු රජ්ජං නියාදයාමි තෙ.

3558. අජ්ජෙව පබ්බජිස්සාමි කො ජඤ්ඤා මරණං සුවෙ,
මාහං කාණොව දුම්මෙධො කාමානං වසමන්වගං.

3559. සට්ඨිධෙනුසහස්සානි රොහඤ්ඤා පුඞ්ගවූසභා,
තා පුත්ත පටිපජ්ජස්සු රජ්ජං නියාදයාමි තෙ.

3560. අජ්ජෙව පබ්බජිස්සාමි කො ජඤ්ඤා මරණං සුවෙ,
මාහං කාණොව දුම්මෙධො කාමානං වසමන්වගං.

3561. සොළසිත්ථිසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
විචිත්‍රවත්ථාභරණා ආමුත්තමණිකුණ්ඩලා
තා පුත්ත පටිපජ්ජස්සු රජ්ජං නියාදයාමි තෙ.

1. වෙයග්ඝා - මජසං.

3549. මම අද මැ පැවිදි වන්නෙමි. මරණය සෙට පැමිණේ දැ යි දන්නේ කවරෙක් ද? මම මෝඩ කවුඩා මෙන් කාමයන්ගේ වසයට නො යමි.

3550. සියලු හස්ත්‍යලංකාරයෙන් සරසන ලද රන් පොරොදු ඇත්තා වූ රන්මුවා අබරණින් වසන ලද ශරීර ඇත්තා වූ මාතඩ්ග නම් හස්තිහු සැට දහසක් ඇත්තාහ.

3551. පුත්‍රය, තෝමර හා අංකුස ගත් අත් ඇති වැ, නැඟුණු ඇතරුවන් ඇති ඒ ඇතුන් භාර ගනුව. තොපට රජය පවරා දෙමි.

3552. මම අද මැ පැවිදි වන්නෙමි. මරණය සෙට පැමිණේ දැ යි දන්නේ කවරෙක් ද? මම මෝඩ කවුඩා මෙන් කාම වසයට නො යමි.

3553. සියලු අශ්වාලංකාරයෙන් සරසන ලද කරුණු නො කරුණු හොඳින් දන්නා වූ සින්ධුදෙශයෙහි උපන්නා වූ ඉක්මන් ගමන් ඇති අශ්වයෝ සැට දහසක් වෙති.

3554. පුත්‍රය, ආයුධ හා දුනු දරන අශ්වාරොහකයන් නැඟුණු ඒ අසුන් භාර ගනුව. තොපට මම රජය පවරාදෙමි.

3555. අද මැ පැවිදි වන්නෙමි. මරණය සෙට දැ යි දන්නේ කවරෙක් ද? මම මෝඩ කවුඩා මෙන් කාම වසයට නො යමි.

3556. සැරසූ, ඔසවන ලද ධජ ඇත්තා වූ දිවි සම් හා ව්‍යාඝ්‍ර සමින් වට කරන ලද්දා වූ සියලු අලංකාරයෙන් අලංකාරවත් වූ රිය සැට දහසෙක් ඇත.

3557. පුත්‍රය, දුනු ගත් අත් ඇති යුද ඇඳුමින් සැරසුණු රියැදුරන් නැඟුණු ඒ රථයන් භාරගනුව. තොපට රජය පවරා දෙමි.

3558. අද මැ පැවිදි වන්නෙමි. මරණය සෙට දැ යි දන්නේ කවරෙක් ද? මම මෝඩ කවුඩා මෙන් කාම වසයට නො යමි.

3559. පුත්‍රය, රතු පැහැති ප්‍රධාන වෘෂභයකු සහිත ධෙනුහු සැට දහසෙක් ඇත. ඔවුන් භාරගනුව. තොපට රජය පවරාදෙමි.

3560. අද මැ පැවිදි වන්නෙමි. මරණය සෙට දැ යි දන්නේ කවරෙක් ද? මම මෝඩ කවුඩා මෙන් කාම වසයට නො යමි.

3561. සියලු අලංකාරයෙන් සරසන ලද්දා වූ වස්ත්‍රාභරණ ඇති පලන් මිණිකොඩොලින් යුත් සොළොස් දහසක් ස්ත්‍රීහු ඇත්තාහ. පුත්‍රය, ඔවුන් භාරගනුව. නුඹට රජය පවරාදෙමි.

3562. අප්පෙව පබ්බජිස්සාමි කො රජ්ජස්ස මරණං සුවෙ,
මාහං කාකොව දුම්මෙධො කාමානං වසමන්වගං.

3563. දහරස්සෙව මෙ තාත මාතා මතාති මෙ සුතං,
තයා විනා අහං තාත ජීවිතුම්පි න උස්සහෙ.

3564. යථා ආරඤ්ඤකං නාගං පොතො අන්වෙති පච්ඡතො,
ජෙස්සන්තං[1] ගිරිදුග්ගෙසු සමෙසු විසමෙසු ච.

3565. එවං තං අනුගච්ඡාමි පුත්තමාදය පච්ඡතො,
සුභරො තෙ භවිස්සාමි න තෙ හෙස්සාමි දුබ්භරො.

3566. යථා සාමුද්දිකං නාවං වාණිජානං ධනෙසිනං,
වොහාරො තත්ථ ගණ්හෙය්‍ය වාණිජා බ්‍යසනී[2] සියා
එවමෙව[3] පුත්තකලි අන්තරායකරො මම.

3567. ඉමං කුමාරං පාපෙථ පාසාදං රතිවඩ්ඪනං,
තත්ථ කම්බුසහත්ථායො යථා සක්කංව අච්ඡරා
තා නං තත්ථ රමෙස්සන්ති තාහි චෙසො රමිස්සති.

3568. තතො කුමාරං පාපෙසුං පාසාදං රතිවඩ්ඪනං,
තං දිස්වා අවචුං[4] කඤ්ඤා දීඝාවුං රට්ඨවඩ්ඪනං.

3569. දෙවතානුසි ගන්ධබ්බො ආදු සක්කො පුරින්දදො,
කො වා ත්වං කස්ස වා පුත්තො කථං ජානෙමු තං මයං.

3570. නම්හි දෙවො න ගන්ධබ්බො නපි[5] සක්කො පුරින්දදො,
කාසි රඤ්ඤො අහං පුත්තො දීඝාවු රට්ඨවඩ්ඪනො
මමං භරථ භද්දං වො[6] අහං භත්තා භවාමි වො.

3571. තං තත්ථ අවචුං කඤ්ඤා දීඝාවුං රට්ඨවඩ්ඪනං,
කුහිං රාජා අනුප්පත්තො ඉතො රාජා කුහිං ගතො.

---

1. දෙස්සන්තං – මජසං.
2. බ්‍යසනං – මජසං.
3. එවමෙවායංපුත්තකලි – වි. මජසං.
4. අවචං – මජසං,
5. නම්හි – මජසං.
6. තෙ – මජසං.

3562. අද මැ පැවිදි වන්නෙමි. මරණය සෙට දැ යි දන්නේ කවරෙක් ද? මම මෝඩ කවුඩා මෙන් කාම වසයට නො යෙමි යි පියරජ තෙම කීයේ ය.

3563. පියාණන් වහන්ස, මා ළදරු කල්හි මැ මාගේ මව මළා යැයි අසන ලදී. පියාණන් වහන්ස, නුඹ වහන්සේගෙන් වෙන් ව මම ජීවත් වන්නටත් නො සිතමි.

3564. සම වූ ද විසම වූ ද ගිරි දුර්ගයන්හි හැසිරෙන්නා වූ වන්‍ය හස්තියකු පසුපසින් ඇත් පැටවෙක් යම්සේ හැසිරේ ද,

3565. එ පරිද්දෙන් මම නුඹ වහන්සේ සමඟ යමි. පුතු ගෙනයන්නා වූ නුඹ වහන්සේට මම සුභර ව (පොෂණයට පහසු ලෙස) පවතින්නෙමි. නුඹ වහන්සේට පොෂණය කට නොහැකි පරිදි (දුභර) නො වන්නෙමි යි පුත්‍රයා කීවේ ය.

3566. ධන සොයන්නා වූ වෙළෙඳුන්ගේ මුහුදු යාත්‍රාවක් ව්‍යවහාරයෙක් (මත්ස්‍ය, රකුස්, දියසුළි ආදී යටට අදනයෙක්) යම්සේ අල්ලා ගනී ද එ විට එහි වෙළෙන්දෝ ව්‍යසනයට පත් වන්නාහු ය. එ මෙන් ම ලාමක පුත්‍රයා මාගේ පැවිද්දට අන්තරාය කරන්නෙකැ යි රජ තෙමේ කීවේ ය.

3567. අමාත්‍යවරුනි, මේ කුමාරයා ඇලුම් වඩන පහයට ගෙන යවු, එහි ස්වර්ණාභරණයෙන් සැරසුණු ඒ ස්ත්‍රීහු අප්සරාවන් විසින් සිත් අලවනු ලබන ශක්‍රයා මෙන් ඒ කුමරහු එහි අභිරමණය කරවන්නාහ. කුමාර තෙමේ ද ඒ ස්ත්‍රීන් සමඟ අභිරමණය කරන්නේ යැ යි රජ තෙම කීයේ ය.

3568. ඉන් පසු කුමරු ඇලුම් වඩන පහයට පැමිණවූහ. එහි නාටක ස්ත්‍රීහු රට දියුණු කරන්නා වූ දීසාවු නම් ඒ කුමරා දැක මෙසේ කීහ:

3569. නුඹ වහන්සේ දේවතාවෙක් ද? ගාන්ධර්වයෙක් ද? නො එසේ නම් පුරින්දද නම් ශක්‍රයා වවු ද? නුඹ වහන්සේ කවරෙක් ද? කාගේ පුතෙක් හෝ වවු ද? ඒ කරුණ අපි කෙසේ දැනගනිමු ද?

3570. මම දෙවියෙක් නො වෙමි. ගාන්ධර්වයෙක් ද නො වෙමි. පුරින්දද නම් ශක්‍රයා නො ද වෙමි. මම වනාහි කසී රජුගේ පුත්‍ර වූ රට දියුණු කරන්නා වූ දීසාවු නමැත්තෙමි. මා කෙරෙහි රුචි කරවු. නුඹලාට යහපතක් වේවා. මම නුඹලාගේ ස්වාමිපුරුෂයා වන්නෙමි යි කුමාරයා කීවේ ය.

3571. එහි ඒ ස්ත්‍රීහු රට දියුණු කරන්නා වූ ඒ දීසාවු කුමරාට මෙසේ කීහ: රජ තෙමේ කොහි පැමිණියේ ද? රජ තෙමේ මෙයින් කොහි ගියේ ද?

3572. පඤ්ඤානං රාජා අතික්කන්තො ඵලෙ රාජා පතිට්ඨිතො,
අකණ්ටකං අගහනං පටිපන්නො මහාපථං.

3573. අහඤ්ච පටිපන්නොස්මි මග්ගං දුග්ගතිගාමිනං,
සකණ්ටකං සගහනං යෙන ගච්ඡන්ති[1] දුග්ගතිං.

3574. තස්ස තෙ ස්වාගතං රාජ සීහස්සෙව ගිරිබ්බජං,
අනුසාස මහාරාජ ත්වං නො සබ්බාසමිස්සරොති.

සොණකජාතකං.

2. සඞ්කිච්චජාතකං

3575. දිස්වා නිසින්නං රාජානං බ්‍රහ්මදත්තං රථෙසභං,
අථස්ස පටිවෙදෙසි යස්සාසි අනුකම්පකො.

3576. සඞ්කිච්චායං අනුප්පත්තො ඉසීනං සාධුසම්මතො,
තරමානරූපො නිය්‍යාහි ඛිප්පං පස්ස මහෙසිනං.

3577. තතො ච රාජා තරමානො යුත්තමාරුය්හ සන්දනං,
මිත්තාමච්චපරිබ්බූළ්හො අගමාසි රථෙසභො.

3578. නික්ඛිප්ප[2] පඤ්ච කකුධානි කාසීනං රට්ඨවඩ්ඪනො,
වාළවීජනිමුණ්හීසං ඛග්ගං ඡත්තඤ්චුපාහනං.

3579. ඔරුය්හ රාජා යානම්හා ඨපයිත්වා[3] පටිච්ඡදං,
ආසීනං දයපස්සස්මිං සඞ්කිච්චමුපසඞ්කමි.

3580. උපසඞ්කමිත්වා සො රාජා සම්මොදි ඉසිනා සහ,
තං කථං වීතිසාරෙත්වා එකමන්තං උපාවිසි.

3581. එකමන්තං නිසින්නොව අථ කාලං අමඤ්ඤථ,
තතො පාපානි කම්මානි පුච්ඡිතුං පටිපජ්ජථ.

1. ගච්ඡාමි - වි. මජසං,
2. නික්ඛිප - මජසං.
3. ඨපයිත්වා - මජසං,

3572. රජ තෙම රාගාදි ක්ලෙශ පංකය ඉක්මැවූයේ ය. රජ තෙම පැවිද්ද නම් වූ ගොඩබිම්හි පිහිටියේ ය. රාගාදි කටු නැත්තා වූ ඒ රාගාදියෙන් ගහන නො වූ ස්වර්ගමොක්‍ෂගාමී වූ මහාමාර්ගයට රජ තෙම පිළිපන්නේ ය.

3573. මම් වනාහි යම් මඟෙකින් දුගතියට යේ නම් රාගාදි කටු සහිත වූ රාගාදියෙන් ගහන වූ ඒ දුගති මඟට පිළිපන්නෙම් වෙමි.

3574. මහරජාණන් වහන්ස, ස්වර්ණමය ගුහාවකට කෙශර සිංහයකුගේ පැමිණීම මෙන් නුඹ වහන්සේගේ මෙහි පැමිණීම යහපත් පැමිණීමෙකි. මහරජාණන් වහන්ස, අපට අනුශාසනා කරන සේක්වා. නුඹ වහන්සේ අප හැමගේ ම අධිපතියහුය.

සොණක ජාතක යි.

2. සඞ්කිච්ච ජාතකය

3575. උයන්පල්ලා රාජසභාවෙහි හුන් ශ්‍රෙෂ්ඨරථාචාය්‍ය‍ී වූ බ්‍රහ්මදත්ත රජු දක අනතුරු ව ඒ රජහට මෙසේ දැන්වී ය: “දේවයන් වහන්ස, නුඹ වහන්සේ යමකුට අනුකම්පා ඇතිසේක් ද,

3576. ඍෂීන් අතුරෙන් මැනැවැයි සම්මත වූ මේ සංකිච්ච නම් තාපස තෙම නුඹ වහන්සේ ගේ උයනට පැමිණියේ වෙයි. එහි වහා යනු මැනැව. නොපමා වැ දකැගනුව” යි කියා යි.

3577. ඉක්බිති ශ්‍රෙෂ්ඨ රථාචාය්‍ය‍ී වූ ඒ රජ තෙමේ සුදුසු වූ යානාවකට නැඟැ මිත්‍රාමාත්‍යයන් විසින් පිරිවරන ලද්දේ වහා ගියේ ය.

3578. කසීරට වැසියන්ගේ රට දියුණු කරන්නා වූ රජ තෙම උයන් දෙරටුවට පැමිණ වල්විදුනාව ද නළල්පට ද කඩුව ද කුඩය ද උපාහනය ද යන පංචරාජකකුධභාණ්ඩයන් බහාතබා,

3579. රජ තෙමේ යානාවෙන් බැස පංචරාජකකුධභාණ්ඩ ඇමතියා අතට දී දයපසස නම් උයනෝ වැඩහුන් සංකිච්ච තාපසයන් වෙතට එළැඹියේ ය.

3580. ඒ රජ තෙමේ ඍෂිවරයා වෙත එළැඹැ ඍෂිවරයා සමඟ සතුටු සාමීචි කථා පැවැත්වී ය. ඒ සතුටු සාමීචි කථාව කොටැ නිමවා එකත් පසෙකැ හිඳගත්තේ ය.

3581. එකත් පසෙක හුන්නේ මැ ප්‍රශ්න ඇසීමට කාලය දැන ගත්තේ ය. ඉක්බිති පාපකර්මයන් විචාරීමට පිළිපන්නේ ය.

3582. ඉසිං පුච්ඡාමි[1] සඞ්කිච්චං ඉසීනං සාධුසම්මතං,
ආසීනං දයපස්සස්මිං ඉසිසඞ්ඝපුරක්ඛතං.[2]

3583. කං ගතිං පෙච්ච[3] ගච්ඡන්ති නරා ධම්මාතිචාරිනො,
අතිචිණ්ණො මයා ධම්මො තමෙතං අක්ඛාහි පුච්ඡිතො.

3584. ඉසි අවච සඞ්කිච්චො කාසීනං රට්ඨවඩ්ඪනං,
ආසීනං දයපස්සස්මිං මහාරාජ සුණොහි මෙ.

3585. උප්පථෙන වජන්තස්ස යො මග්ගමනුසාසති,
තස්ස චෙ වචනං කයිරා නාස්ස මග්ගෙය්‍ය කණ්ටකො.

3586. අධම්මං පටිපන්නස්ස යො ධම්මමනුසාසති,
තස්ස තෙ වචනං කයිරා න සො ගච්ඡෙය්‍ය දුග්ගතිං.

3587. ධම්මො පථො මහාරාජ අධම්මො පන උප්පථො,
අධම්මො නිරයං නෙති ධම්මො පාපෙති සුග්ගතිං.

3588. අධම්මචාරිනො රාජ නරා විසමජීවිනො,
යං ගතිං පෙච්ච ගච්ඡන්ති නිරයෙ තෙ සුණොහි මෙ.

3589. සඤ්ජීවො කාළසුත්තො ච සඞ්ඝාතො[4] ද්වෙ ච රොරුවා,
අථාපරො මහාවීචි තපනො ච පතාපනො.

3590. ඉච්චෙතෙ අට්ඨ නිරයා අක්ඛාතා දුරතික්කමා,
ආකිණ්ණා ලුද්දකම්මෙහි පච්චෙකා සොළසුස්සද.

3591. කදරියතාපනා ඝොරා අච්චිමන්තො මහබ්භයා,
ලොමහංසනරූපා ච භෙස්මා පටිභයා දුඛා.

1. පුච්ඡාම - සයා.
2. පුරක්ඛිතං - මජසං.
3. පච්ච - මජසං.
4. සඞ්ඝාටො - මජසං, PTS.

3582. සෘෂීන් අතුරෙන් මැනැවැ යි සම්මත වූ සෘෂි සමූහයා විසින් පිරිවරන ලද වැ දයපස්ස නම් උයනෙහි හුන්නා වූ සංකිච්ච නම් සෘෂිවරයා විචාරමි.

3583. දශකුශලධර්මය ඉක්මවා හැසිරෙන සත්ත්වයෝ උත්පත්ති වශයෙන් පරලෙව්හි දී කවර ගතියකට යෙද්ද, මා විසින් ධර්මය ඉක්මවන ලදී. ඒ කරුණ විචාරන ලද්ද වූ මට කියනු මැනැවි.

3584. සංකිච්ච සෘෂි තෙමේ කසීරට වැසියන්ගේ රට දියුණු කරන්නා වූ, දයපස්ස උයනේ හුන්නා වූ රජුට මෙසේ කීයේ ය. මහරජ, මාගේ වචනය අසව.

3585. සොරුන්ගෙන් ගැවැසීගත් මඟකින් යන්නහුට යමෙක් නිර්භය මාර්ගය කියා දේ නම්, ඉදින් ඔහුගේ වචනයත් කරන්නේ නම්, සොරු නමැති කටු ඔහුට හමු නො වන්නේ ය.

3586. අධර්මයෙහි පිළිපන්නහුට යමෙක් ධර්මයෙන් අනුශාසනා කෙරේ නම්, ඉදින් ඔහු ඔහුගේ වචනයට අනුව පිළිපදී නම් දුගතියට නො යන්නේ ය.

3587. මහරජ, දශකුශල සංඛ්‍යාත ධර්මය තෙම සුගතිගාමී මාර්ගය බැවින් නියම මාර්ගය වේ. දශ අකුශල සංඛ්‍යාත අධර්මය තෙම අපායගාමී මාර්ගය බැවින් නොමනා වන්නේ ය. අධර්මය තෙම සත්ත්වයා නිරයට පමුණුවයි. ධර්මය තෙම සත්ත්වයා සුගතියට පමුණුවයි.

3588. මහරජ, විසම ජීවිකාවෘත්ති ඇති අධර්මචාරී වූ මනුෂ්‍යයෝ පරලෙව්හි දී උත්පත්ති වශයෙන් යම් බඳු ගතියකට යෙද්ද, ඒ නිරයන් ගැන මම නුඹට කියමි. එය අසව.

3589. සංජීව නම් නරකය ද කාළසූත්‍ර නම් නරකය ද සංඝාත නම් නරකය ද රෞරුව නම් නරක දෙක ද තවද අන්‍ය වූ මහාවීචි නරකය ද තපන නම් නරකය ද ප්‍රතාපන නම් නරකය ද,

3590. යන මේ අටමහා නරකයෝ ඉක්මවාලියැ නො හැක්කාහ යි කියන ලද්දහ. මෙ කී එක එක නරකයෙක්හි සිවුපසැ සොළස බැගින් උස්සද නරකයෝ ද රුදුරු කර්මයෙන් ගැවසීගත්තාහු විද්‍යමාන වෙත්.

3591. ඒ නරකයෝ තද මසුරන් තවන්නෝ යැ. බලවත් දුක් ඇත්තෝ ය. ගිනිසිළු විහිදුවන්නෝ ය. මහත් බිය ඇත්තෝ ය. ලොමුදැහගන්නාසුලු ය. බිහිසුනු වූවාහු ය. ප්‍රතිභය ඇත්තාහු ය. දුක් ගෙන දෙන්නාහ.

3592. චතුක්කණ්ණා චතුද්වාරා විභත්තා භාගසො මිතා,
අයොපාකාරපරියන්තා අයසා පටිකුජ්ජිතා.

3593. තෙසං අයොමයා භූමි ජලිතා තෙජසා යුතා,
සමන්තා යොජනසතං ඵුටා තිට්ඨන්ති සබ්බදා.

3594. එතෙ පතන්ති නිරයෙ උද්ධපාදා අවංසිරා,
ඉසීනං අතිවත්තාරො සඤ්ඤතානං තපස්සිනං.

3595. තෙ භූනහුනො පච්චන්ති මච්ඡා බිලකතා යථා,
සංවච්ඡරෙ අසඞ්ඛෙය්‍යෙ නරා කිබ්බිසකාරිනො.

3596. දය්හ[1]මානෙන ගත්තෙන නිච්චං සන්තරබාහිරං,
නිරයා නාධිගච්ඡන්ති ද්වාරං නික්ඛමනෙසිනො.

3597. පුරත්ථිමෙන ධාවන්ති තතො ධාවන්ති පච්ඡතො,
උත්තරෙනපි ධාවන්ති තතො ධාවන්ති දක්ඛිණං.

3598. යං යං හි ද්වාරං ගච්ඡන්ති තං තදෙව පිථීයති,[2]
බහූනිවස්සසහස්සානි[3] ජනා නිරයගාමිනො.[4]
බාහා පග්ගය්හ කන්දන්ති පත්වා දුක්ඛං අනප්පකං.

3599. ආසීවිසංව කුපිතං[5] තෙජස්සිං[6] දුරතික්කමං,
න සාධුරූපෙ ආසීදෙ සඤ්ඤතානං තපස්සිනං.

3600. අතිකායො මහිස්සාසො අජ්ජුනො කෙකකාධිපො,[7]
සහස්සබාහු උච්ඡින්නො[8] ඉසිමාසජ්ජ ගොතමං.

3601. අරජං රජසා වච්ඡං කිසං අවකිරිය දණ්ඩකී,
තාලොව මූලතො[9] ඡින්නො සරාජා විභවඞ්ගතො.

3602. උපහච්ච මනං මෙජ්ඣා[10] මාතඞ්ගස්මිං යසස්සිනෙ,
සපාරිසජ්ජො උච්ඡින්නො මෙජ්ඣාරඤ්ඤං[11] තදා අහු.

1. ඩය්හ – වි. මජසං.
2. පිධීයරෙ – මජසං.
3. බහූනිසතසහස්සානි – වි. මජසං.
4. වාසිනො – වි.
5. කුප්පිතං – මජසං.
6. තෙජසිං – වි. මජසං.
7. කෙතකාධිපො – වි. මජසං.
8. අවජින්තො – මජසං.
9. මූලකො – මජසං.
10. මෙජ්ඣා – මජසං.
11. මෙජ්ඣාරඤ්ඤං – මජසං.

3592. කොන් සතරක් ඇත්තාහ. දෙර සතරක් ඇත්තාහ. කොටස් වශයෙන් ප්‍රමාණ කොට බෙදන ලද්දහ. යපවුරෙන් පිරිකෙව් කරන ලද්දහ. යපියනින් වසන ලද්දහ.

3593. ඒ නරකයන්ගේ අයොමය භූමිය ගින්නෙන් දිලිසෙන්නී තෙදින් යුතු වූවා ය. හාත්පස යොදුන් සියයක් හැම කල්හි පැතිර සිටී.

3594. තවුස්දම් රක්නා ශීල සංයමයෙන් යුත් සෘෂීන්ට පරුෂ වචන කියමින් ඉක්මවා බණින මොව්හු පා උඩුකුරු වූවාහු යටිකුරු වූ හිස් ඇති ව නිරයෙහි වැටෙති.

3595. සෘෂීන්ට පරුෂ වචන කීමෙන් ඉක්මවා බැන්නා වූ ඒ පව්කාර මිනිස්සු කොටස් වශයෙන් වෙන් කළ මසුන් සේ අසංඛ්‍ය සංවත්සරයන්හි පැසෙත්.

3596. නිතොර ඇතුළත පිටත දෙක්හි ම දනු ලබන ශරීර-යෙන් යුතු ව නරකයෙන් නික්මෙනු කැමැති වූවාහු ද දෙරටුවට නො පැමිණෙත්.

3597. පෙර දිගට දුවත්. ඉන්පසු බටහිරට ද දුවත්. උතුරු දිගට ද දුවත්. ඉන්පසු දකුණු දෙසට ද දුවත්.

3598. යම් යම් දෙරටුවකට යෙත් නම් ඒ ඒ දෙරටු වැසෙයි. මෙසේ නිරයගාමී ජනයෝ අනල්ප වූ නිරය දුකට පැමිණ බොහෝ වර්ෂ දහස් ගණන් දෙ අත් හිස්හි බැඳගත්තාහු හඬත්.

3599. එ හෙයින් ළං වියැ නොහැකි කිපියා වූ තෙදැති ආශීර්විෂයකු සේ සංයම ඇත්තා වූ තපස්වීන්ට පරුෂ වචනයෙන් සටා නො බණින්නේ ය. එ බඳු යහපත් ගති ඇති ගුණවතුන් නො ගටන්නේ ය.

3600. මහත් ශරීර ඇති දුනු දරන්නා වූ දහසක් බාහු ඇත්තා වූ කේකක රටට අධිපති වූ අර්ජුන නම් රජ තෙම ගෞතම නම් සෘෂිවරයා ගටා බැණැ විනාශයට පත්වූයේ ය.

3601. ඒ දණ්ඩකී රජ තෙම රජස් රහිත වූ කිසවච්ඡ තවුසා මතැ රජස් විසුරුවා මුළින් සිඳින ලද තල් ගසක් මෙන් විනාශයට පත් විය.

3602. යශස් ඇති මාතඞ්ග සෘෂිවරයා කෙරෙහි සිත දූෂ්‍ය කරගත් මෙධ්‍ය රජ තෙමේ පිරිස් සහිත වැ සිඳී ගියේ ය. එ කල්හි මෙධ්‍යාරාණ්‍ය විය.

3603. කණ්හදීපායනාසජ්ජ ඉසිං අන්ධකවෙණ්හුයො,
අඤ්ඤමඤ්ඤං මුසලෙ[1] හන්ත්වා සම්පත්තා යමසාධනං.

3604. අථායං ඉසිනා සත්තො අන්තලික්ඛෙ චරො පුරෙ,
පාවෙක්ඛි පථවිං[2] චෙච්චො හීනත්තො පත්තපරියායං.

3605. තස්මා හි ඡන්දාගමනං නප්පසංසන්ති පණ්ඩිතා,
අදුට්ඨචිත්තො භාසෙය්‍ය ගිරං සච්චූපසංහිතං.

3606. මනසා චෙ පදුට්ඨෙන යො නරො පෙක්ඛතෙ මුනිං,
විජ්ජාචරණසම්පන්නං ගන්තා සො නිරයං අධො.

3607. යෙ වුද්ධෙ[3] පරිභාසන්ති ඵරුසූපක්කමා ජනා,
අනපච්චා අදායාද තාලවත්ථු භවන්ති තෙ.

3608. යො ච පබ්බජිතං[4] හන්ති කතකිච්චං මහෙසිනං.
ස කාළසුත්තෙ නිරයෙ චිරරත්තාය පච්චති.

3609. යො ච රාජා අධම්මට්ඨො රට්ඨවිද්ධංසනො[5] චුතො,
තාපයිත්වා ජනපදං තාපනෙ පෙච්ච[6] පච්චති.

3610. යො ච වස්සසහස්සානං[7] සතං දිබ්බානි[8] පච්චති,
අච්චිසඞ්ඝපරෙතො සො දුක්ඛං වෙදෙති වෙදනං.

3611. තස්ස අග්ගිසිඛා කායා නිච්ඡරන්ති පභස්සරා,
තෙජොභක්ඛස්ස ගත්තානි ලොමග්ගෙහි නඛෙහි ච.

3612. දය්හ[9]මානෙන ගත්තෙන නිච්චං සන්තරබාහිරං,[10]
දුක්ඛාභිතුන්නො නදති නාගො තුත්තද්දිතො[11] යථා.

3613. යො ලොභා පිතරං හන්ති දොසා වා පුරිසාධමො,
ස කාළසුත්තෙ නිරයෙ චිරරත්තාය පච්චති.

---

1. මුසලා - මජසං.
2. පථවිං - මජසං.
3. වුඩ්ඪෙ - මජසං.
4. පබ්බජිතං - මජසං.
5. රට්ඨධංසනො - වි. මජසං.
6. පච්ච - මජසං.
7. වස්සසහස්සානි - මජසං.
8. දිබ්බානි - මජසං.
9. ඩය්හ - වි. මජසං.
10. අන්තර - මජසං.
11. තුත්තවට්ටිතො - මජසං.
තුණ්ඩවට්ටිතො - සතා.

3603. අන්ධකවෙණ්හු නම් රජවරු කණ්හදීපායන නම් තවුසා ගටා ඔවුනොවුන් මොහොලින් නසාගෙන යම පුරයට පිවිසියහ.

3604. වැළි දු පෙර අහසැ හැසිරුණා වූ චෙතිය නම් රජ තෙම කපිල තවුසා සමඟ විරුඬ වූයේ ඍද්ධියෙන් පිරිහෙත් ම මරණාසන්න කාලයට පැමිණ පොළොවැ පිවිසියේ ය.

3605. එ හෙයින් නුවණැත්තෝ ඡන්දදියෙන් අගතියට යැම නො පසසත්. දූෂ්‍ය නො වූ සිත් ඇත්තේ සත්‍ය වචන කියන්නේ ය.

3606. ඉදින් යම් මිනිසෙක් ප්‍රදුෂ්‍ය වූ සිතින්, අෂ්ටවිද්‍යා පසළොස්චරණයන්ගෙන් යුත් මුනිවරයකු දෙස බලයි ද, හෙ තෙමේ ඒ අධොගමනීය කර්මයෙන් අධොභාගයෙහි වූ නිරයට යන්නේ ය.

3607. නපුරු ගති ඇති යම් කෙනෙක් ගුණයෙන් හා වයසින් වැඩිහිටියන්ට අවමන් කෙරෙද්ද, ඔව්හු දිටුදැමියෙහි ම මුලින් සිඳින ලද තල් ගසක් මෙන් වැනැසෙති. පරලෝ වශයෙන් දරුවන් හෝ වස්තුව හෝ නො ලබත්.

3608. යමෙක් වනාහි කෘතකෘත්‍ය වූ ප්‍රව්‍රජිත මහර්ෂියකු නසා ද හෙ කාළසූත්‍ර නම් නරකයෙහි බොහෝ කලක් පැසෙනු ලැබේ.

3609. යමෙක් වනාහි අධර්මයෙහි පිහිටා රට වනසන්නේ වේ ද, ජනපදය තවා මෙයින් චුත වැ පරලෙව්හි තාපන නම් නරකයෙහි පැසෙති.

3610. යමෙක් දිව්‍යවර්ෂ ලක්ෂයක් එහි පැසේ ද, ගිනිසිළු සමූහයෙන් වටකරන ලද්ද වූ හෙ තෙමේ දුක් වූ වෙදනාවක් මැ විඳී.

3611. ගිනි මැ අනුභව කරන ඔහුගේ ශරීරයෙන් ප්‍රභාස්වර වූ ගිනිසිළු පිට වේ. ලොමාග්‍රවලින් සහ නිය අගින් ද යුත් සියලු ශරීරාවයවයෝ එක සේ මැ දල්වෙත්.

3612. නිතොර ම ඇතුළත පිටත දෙක්හි දැවෙන්නා වූ ශරීරයෙන් යුත් හෙ තෙම මහත් දුකින් පෙළෙණේ අකුසුවලින් මඩනා ලද ඇතකු මෙන් නාද කරයි.

3613. යම් අධ මැ පුරුෂයෙක් යශස් යැ ධන යැ යන මේවා හෙතු කොටගෙනැ පහළ වූ ලොභය නිසා හෝ ද්වෙෂය නිසා හෝ පියා නසයි ද, හෙ කාළසූත්‍ර නම් නරකයෙහි බොහෝ කාලයක් පැසෙන්නේ ය.

3614. ස තාදිසො පච්චති ලොහකුම්භියං
පක්කඤ්ච සත්තීහි හනන්ති නිත්තචං,
අන්ධං කරිත්වා මුත්තකරීසභක්ඛං
ඛාරෙ[1] නිමුජ්ජන්ති තථාවිධං නරං.

3615. තත්තං පක්කුට්ඨිතං[2] අයොගුළඤ්ච
දීඝෙ ච ඵාලෙ චිරරත්තතාපිතෙ,
වික්ඛම්භමාදාය විභජ්ජ රජ්ජුභි
විවටෙ මුඛෙ සංසවයන්ති[3] රක්ඛසා.

3616. සාමා ච සොණා සබලා ච ගිජ්ඣා
කාකොළසඞ්ඝා ච දිජා අයොමුඛා,
සඞ්ගම්ම ඛාදන්ති විප්ඵන්දමානං
ජිව්හං විභජ්ජ[4] විඝාසං[5] සලොහිතං.

3617. තං දඩ්ඪතාලං පරිභින්නගත්තං
නිප්පොථයන්තා[6] අනුවිචරන්ති රක්ඛසා,
රතී හි තෙසං දුඛිනො පනීතරෙ
එතාදිසස්මිං නිරයෙ වසන්ති
යෙ කෙචි ලොකෙ ඉධ පෙත්තිඝාතිනො.

3618. පුත්තො ච මාතරං හන්ත්වා ඉතො ගන්ත්වා යමක්ඛයං,
භුසමාපජ්ජතෙ දුක්ඛං අත්තකම්මඵලූපගො.

3619. අමනුස්සා අතිබලා[7] හන්තාරං ජනයන්තියා,
අයොමයෙහි වාලෙහි පීළයන්ති පුනප්පුනං.

3620. තං පස්සවං[8] සකා ගත්තා රුධිරං[9] අත්තසම්භවං,
තම්බලොහවිලීනංව[10] තත්තං පායෙන්ති මත්තියං.

3621. ජිගුච්ඡං කුණපං පූති දුග්ගන්ධං[11] ගූථකද්දමං,
පුබ්බලොහිතසඞ්කාසං රහදං[12] ඔගය්හ තිට්ඨති.

3622. තමෙනං කිමයො තත්ථ අතිකායා අයොමුඛා,
ඡවිං ඡෙත්වාන ඛාදන්ති පගිද්ධා මංසලොහිතෙ.

3623. සො ච තං නිරයං පත්තො නිමුග්ගො සතපොරිසං,
පූතිකං කුණපං වාති සමන්තා සතයොජනං.

1. මාදෙ
2. පක්කුට්ඨිතමයොගුළඤ්ච - මජසං.
3. සංපවිසන්ති - මජසං.
4. විභිජ්ජ - මජසං.
5. විඝාසංච - මජසං.
6. නිප්පොථයන්තා - සයා,
7. අසිබලා - මජසං
8. තමස්සවං - මජසං
9. රුහිරං - වි.
10. තම්බලොහවිලීනතංච - මජසං.
11. දුග්ගන්ධං - මජසං.
12. රහදචොගය්හ - මජසං, රහදෙගය්හ - සයා

3614. එ බඳු මෙ තෙම ලෝකුම්භ නිරයෙහි පැසේ. පැසුණා වූ ද සම නැත්තා වූ ද ඔහු අඩයටිවලින් නසත්. එ බඳු සත්වයා ඇස් උපුටා දමා අණ්ඩ කොට මළමූ අනුභව කරන්නකුත් කොට ලෝදියෙහි ගල්වත්.

3615. නිරය පාලකයෝ ගිනියම් කළ පැස වූ යගුළි ද බොහෝ කලක් තවන ලද දික් වූ හීවැලින් මැඩගෙන රැහැන්-වලින් දිව එළියට ඇද හරින ලද මුවෙහි බහාලත්.

3616. ශ්‍යාමවර්ණ වූ සුනඛයෝ ද තිත් සහිත සුනඛයෝ ද රතු හොට ඇති ගිජුලිහිණියෝ ද වන කවුඩු සමූහය ද අයොමය මුඛ ඇත්තා වූ පක්ෂි සමූහය ද එක් ව දිව පිටතට ඇද කම්පා කරමින් ලේ සහිත වැ කඩකඩා කත්.

3617. දැවෙන්නා වූ තල් ගසක් වැනි හැම පසින් ම බිඳුණු ශරීර ඇති ඔහුට තළමින් ඒ නිරය පාලකයෝ පසුපසැ යෙති. එය නිරය පාලකයන්ට ක්‍රීඩාවෙකි. අන්‍ය වූ නිරිසත්තු වනාහි දුක් ඇත්තාහු වෙත්. මේ ලොකයෙහි පිතෘඝාතක කර්ම කරන්නා වූ යම් කෙනෙක් වෙද්ද, මෙ බඳු දුක් ඇති නරකයේ වෙසෙත්.

3618. පුත්‍ර තෙමේ ද මව මරා මෙයින් චුත වැ නිරයට ගොස් ස්වකීය කර්මවිපාක වශයෙන් පැමිණියේ ම මහත් දුකට පැමිණේ.

3619. මහත් ශක්තිය ඇත්තා වූ නිරය පාලකයෝ මව මැරූවහු යමුවා රැහැනින් වෙළා නැවැත නැවැතත් පෙළත්.

3620. මව මැරූ ඔහුට සිය සිරුරින් වැගිරෙන්නා වූ තමා-ගෙන් ම හටගත් රත් වී දිය ව ගිය ලොදිය බඳු රුධිරය පොවත්.

3621. පිළිකුල් වූ ද, අපවිත්‍ර වූ ද, කුණු වූ ද, දුගඳ වූ ද, අසූචි කලල් ඇති පූයා ලේ බඳු ජලය ඇති විලට බැස සිටිති.

3622. එහි මහත් වූ ශරීර ඇති අය සූචි බඳු මුඛ ඇති කෘමීහු මස් ලේ කෙරෙහි ගිජු වූවාහු සිවිය සිඳ කත්.

3623. මෙ තෙමේ ද ඒ නිරයට පැමිණියේ බඹ සියයක් ගිලුණේ වේ. කුණු වූ ද අපිරිසුදු වූ ද දුර්ගන්ධය හාත්පසැ සියක් යොත්නක් හමයි.

3624. චක්ඛුමාපි හි චක්ඛූහි තෙන ගන්ධෙන ජීයති,
එතාදිසං බ්‍රහ්මදත්ත මාතුසාතී[1] ලභෙ දුඛං.

3625. ඛුරධාරමනුක්කම්ම තික්ඛං දුරභිසම්භවං,
පතන්ති ගබ්භපාතිනියො[2] දුග්ගං වෙතරණිං නදිං.

3626. අයොමයා සිම්බලියො සොළසඞ්ගුලකණ්ටකා,
උභතො මභිලම්බන්ති දුග්ගං වෙතරණිං නදිං.

3627. තෙ අච්චිමන්තො තිට්ඨන්ති අග්ගික්ඛන්ධාව ආරකා,
ආදිත්තා ජාතවෙදෙන උද්ධං යොජනමුග්ගතා.

3628. එතෙ සජන්ති නිරයෙ තත්ත තිඛිණකණ්ටකෙ,
නාරියො ච අතිචාරිණියො[3] නරා ච පරදාරගූ.

3629. තෙ පතන්ති අධොක්ඛන්ධා[4] විවත්තා[5] විහතා පුථු,
සයන්ති විනිවිද්ධඞ්ගා දීඝං ජග්ගන්ති සංවරිං.

3630. තතො රත්‍යා විවසනෙ මහතිං පබ්බතූපමං,
ලොහකුම්භිං පවජ්ජන්ති තත්තං අග්ගිසමූදකං.

3631. එවං දිවා ච රත්තො ච දුස්සීලා මොහපාරුතා,
අනුභොන්ති සකං කම්මං පුබ්බෙ දුක්කතමත්තනො.

3632. යා ච භරියා ධනක්කීතා සාමිකං අතිමඤ්ඤති,
සස්සුං වා සසුරං වාපි ජෙට්ඨං වාපි නනන්දරං[6].

3633. තස්සා වඞ්කෙන ජිව්හග්ගං නිබ්බහන්ති සබන්ධනං,
සබ්‍යාමමත්තං කිමිනං ජිව්හං පස්සති අත්තනො
විඤ්ඤාපෙතුං සක්කොති තාපනෙ පෙච්ච[7] පච්චති.

1. මාතුසොලතෙ දුඛං – මජසං, ස්‍යා. මත්තිසො – වි.
2. ගබ්භපාතියො – මජසං.
3. අතිචාරා – මජසං. අතිචාරී – වී.
4. අධක්ඛන්ධා – මජසං, වී.
5. විගත්තා – මජසං.
6. නන්දනං–ස්‍යා. මජසං.
7. පච්ච–මජසං.

3624. ඇස් ඇත්තේ නමුත් ඒ දුර්ගන්ධයෙන් ඇස්වලින් දිරාපත් වන්නේ ය. බ්‍රහ්මදත්ත නම් මහරජුනි, මච මැරූ තැනැත්තේ මෙ බඳු දුකක් ලබන්නේ ය.

3625. ගැබ් හෙළන්නා වූ ස්ත්‍රීහු තියුණු වූ ද ළංවිය නොහැකි වූ ද ඛුරධාර නම් නිරය ඉක්මවා දුර්ගම වූ වෛතරණී නදියට වැටෙත්.

3626. අයොමය වූ සොළොස් අඟල් පමණ කටු ඇති ඉඹුල් ගස් දුර්ගම වූ වෛතරණී ගඟෙහි දෙපසැ එල්බෙයි.

3627. ඒ නිරිසත්තු ගිනිසිළු ඇත්තාහු දුර වූ ගිනි කඳක් මෙන් සිටිත්. ගින්නෙන් දිලිසුණේ ම උඩට යොදුනක් උස්වූවාහු වෙත්.

3628. සැමියා ඉක්මවා හැසිරෙන ස්ත්‍රීහු ද පරස්ත්‍රී සෙවනය කරන පුරුෂයෝ ද යන මොව්හු නිරයෙහි තිබෙන ගිනියම් වූ තියුණු කටු ඇති මේ ඉඹුල් ගස්වලැ නගිත්.

3629. බොහෝ කල්ගියා වූ ඔව්හු නිරය පාලකයන් විසින් පෙළන ලද්දහු පෙරළී යටිකුරු වූ හිස් ඇත්තාහු වෙත්. එවිට හුලින් විනිවිද ගිය ශරීර ඇත්තෝ සයනය කෙරෙත්. දිගු කලක් නිදි වරති.

3630. ඉන්පසු බොහෝ කාලයක්හුගේ ඇවෑමෙන් මහත් වූ පර්වතයක් බඳු රත් වූ ගිනි හා සම ජලය ඇති ලෝකුඹු නම් නිරයෙහි වැටී පැසෙත්.

3631. මෙසේ මොහයෙන් පිරිවරා ගන්නා ලද දුශ්ශීලයෝ දිවා රෑ දෙක්හි ම පෙර තමා විසින් කරන ලද ස්වකීය දුෂ්කෘත කර්මය අනුභව කෙරෙත්.

3632. මිල දී ගන්නා ලද යම් භාර්‍යාවක් වන්නී ද, සැමියා කෙරෙහි කළමනා වතාවත් නොකිරීම් වශයෙන් සැමියා ඉක්මවයි ද නැන්ද හෝ මාමා හෝ සැමියාගේ වැඩිමහලු සහෝදරිය හෝ යන මොවුන් උදෙසා කළමනා වතාවත් නොකිරීම වශයෙන් ඉක්මවයි ද,

3633. ඇගේ ජිහ්වාග්‍රය බෑලුම් සහිත වැ පිටතට අදිත්. ඒ නිරිසතා පණුවන් සහිත බඹයක් පමණ වූ තමාගේ දිව දකී. තමන්ගේ දුක කියනු කැමැති වුව ද කිසිවක් කියා අවබොධ කරවන්නට නො සමත් වෙයි. පසු වැ තාපන නම් නිරයෙහි පැසෙයි.

3634. ඔරබ්භිකා සූකරිකා මච්ඡිකා මිගබන්ධකා,
චොරා ගොඝාතකා ලුද්දා අවණ්ණෙ වණ්ණකාරකා.

3635. සත්තීහි ලොහකූටෙහි නෙත්තිංසෙහි උසූහි ච,
හඤ්ඤමානා ඛාරනදිං පපතන්ති[1] අවංසිරා.

3636. සායං පාතො කූටකාරී අයොකූටෙහි හඤ්ඤති,
තතො වන්තං දුරත්තානං පරෙසං භුඤ්ජතෙ[2] සදා.

3637. ධඞ්කා භෙරණ්ඩකා[3] ගිජ්ඣා කාකොළා ච අයොමුඛා,
විප්ඵන්දමානං[4] ඛාදන්ති නරං කිබ්බිසකාරිනං.

3638. යෙ මිගෙන මිගං හන්ති පක්ඛිං වා පන පක්ඛිනා,
අසන්තො රජසා ඡන්නා ගන්තා තෙ නිරයුස්සදං.

3639. සන්තො ච උද්ධං ගච්ඡන්ති සුචිණ්ණෙනිධ කම්මුනා,
සුචිණ්ණස්ස ඵලං පස්ස සඉන්දා දෙවා සබ්‍රහ්මකා.

3640. තං තං බ්‍රූමි මහාරාජ ධම්මං රට්ඨපතී චර,
තථා[5] තථා රාජ චරාහි ධම්මං
යථා තං සුචිණ්ණං නානුතපෙය්‍ය පච්ඡා.

සඞ්කිච්ච ජාතකං.

සට්ඨිනිපාතං නිට්ඨිතං.

තස්සුද්දානං:

අථ සට්ඨිනිපාතම්හි සුණාථ මම භාසිතං,
පවරො සොණක අරින්දමසව්හයනො
තථා වුත්ත රථෙසභ කිච්ච වරොති.

1. සංපතන්ති-මජසං.
2. භුඤ්ජරෙ-මජසං.
3. භෙදණ්ඩකා-මජසං.
4. විපන්දමානං-වි.
5. තථාරාජ-මජසං.

3634. එළුවන් මරා දිවි රක්නෝ ද ඌරන් මරා දිවි රක්නෝ ද මුවන් මරා දිවි රක්නෝ ද සොරකම් කරන්නෝ ද ගවයන් මරා දිවි රක්නෝ ද යන මෙකී රෞද්‍ර ක්‍රියා ඇත්තෝත් නුගුණෙහි ගුණ කියන්නෝ හෙවත් කේලාම් කියන්නෝ යන මොහු,

3635. අඩයටිවලින් ද ලොහොකුළුවලින් ද කඩුවලින් ද ඊවලින් ද අනිනු ලබන්නාහු යටිකුරු වූ හිස් ඇත්තෝ වෛතරණී නම් නරකයෙහි වැටෙති.

3636. වංචනික ලෙස නඩු විසඳන්නෝ යැ, බොරු නඩු සාදන්නෝ ය, කිරිම් මැනීම්වලින් සහ බොරු කහවණුයෙන් රවටන්නෝ ය, බොරු තක්සේරු කාරයෝ යැ යන කූටකම් කරන්නෝ උදේ සහ සවසත් යකුළුවලින් නසනු ලැබෙති. ඉන් පසු මෙ ලෙස ම දුකට පත් වූ අන් සතුන්ගේ වමනය හැම කල්හි අනුභව කෙරෙති.

3637. කවුඩෝ ද සිවල්ලු ද ගිජුලිහිණියෝ ද වනකවුඩෝ ද යන අයොමය මුඛ ඇත්තාහු පව්කළා වූ නිරිසතා ඔබ මොබ අදිමින් කති.

3638. යමෙක් මුවකුගෙන් (හීලෑ මුවකු ඉදිරිපත් කර ගෙන) මුවකු නසයි ද පක්ෂියකුගෙන් පක්ෂියකු හෝ නසයි ද අසත්-පුරුෂ වූ රජසින් ගැවැසී ගත්තා වූ ඔව්හු ඔසුපත් නිරයට යන්නෝ වෙති.

3639. මේ ලොකයෙහි මනා ව පුරුදු කරන ලද කර්ම නිසා දෙව් ලොවට යෙත්. මනා ව පුරුදු කරන ලද කර්මයා ගේ විපාකය බලව. ශක්‍රයා සහිත දෙවියෝත් බ්‍රහ්මයා සහිත දෙවි-යෝත් එහි වෙති.

3640. මහරජ, එ හෙයින් නුඹට කියමි. රටෙහි අධිපතිතුමනි, සුචරිත ධර්මයෙහි හැසිරෙව. මහරජ යම්සේ මනා ව පුරුදු කරන ලද ධර්මය පසු වැ පසුතැවිල්ල නූපදවා ද එසේ සුචරිත ධර්මයෙහි හැසිරෙවු.

සංකිච්ච ජාතක යි.

සැට වැනි නිපාතය නිමි.

එහි උද්දානය :

සැට වැනි නිපාතයෙහි මාගේ භාෂිතය අසව. අරින්‍දම නම් රජු සහිතවූ සොණක ජාතකයැ එසේමැ බඹදත් රජු සහිත වූ සඞ්කිච්ච ජාතක යැ යි ජාතක දෙකෙකි.

සත්තතිනිපාතො

1. කුසජාතකං

3641. ඉදං තෙ රට්ඨං සධනං සයොග්ගං
සකායූරං සබ්බකාමූපපන්නං,
ඉදන්තෙ රජ්ජං අනුසාස අම්ම
ගච්ඡාමහං යත්ථ පියා පභාවතී.

3642. අනුජ්ජුභූතෙන හරං මහන්තං[1]
දිවා ච රත්තො ච නිසීථකාලෙ[2],
පටිගච්ඡ ත්වං ඛිප්පං කුසාවතිං කුස
න ඉච්ඡාමි[3] දුබ්බණ්ණමහං වසන්තං.

3643. නාහං ගමිස්සාමි ඉතො කුසාවතිං
පභාවතී වණ්ණපලොභිතො තව,
රමාමි මද්දස්ස නිකෙතරම්මෙ
හිත්වාන රට්ඨං තව දස්සනෙ රතො.

3644. පභාවතී වණ්ණපලොභිතො තව
සම්මූළ්හරූපො විචරාමි මෙදිනිං,
දිසං න ජානාමි කුතොම්හි ආගතො
තයම්හි මත්තො මිගමන්දලොචනෙ.

3645. සුවණ්ණචීරවසනෙ ජාතරූපසුමෙඛලෙ,
සුස්සොණි[4] තව කාමා හි නාහං රජ්ජෙනමත්ථිකො.

3646. අබ්භූ හි තස්ස භො හොති යො අනිච්ඡන්තමිච්ඡති,
අකාමං රාජ කාමෙහි අකන්තො කන්ත[5]මිච්ඡසි.

3647. අකාමං වා සකාමං වා යො නරො ලභතෙ පියං,
ලාභමෙත්ථ පසංසාමි[6] අලාභො තත්ථ පාපකො.

---

1. මහන්ති – මජසං.
2. නිසීදකාලෙ – මජසං.
3. නිච්ඡාමි – මජසං.
4. සුසොණි – මජසං.
5. කන්තු – මජසං.
6. පසංසාම – මජසං, වි.

සත්තති නිපාතය

1. කුස ජාතකය

3641. මැණියෙනි, ඔබ තුමියගේ මේ රට ධන සහිත ය. හස්ති සෙනාදියෙන් යුක්ත ය. පඤ්ච රාජකකුධභාණ්ඩ සහිත ය. කැමැති වන තාක් සම්පතින් යුක්ත ය. ඔබ තුමියගේ මේ රජය අනුශාසනා කරනු මැනැවි. මාගේ ප්‍රියාව වන ප්‍රභාවතිය යම් තැනෙක්හි නම් මම එහි යමි යි කුසරජ තෙම කීයේ ය.

3642. කුසරජතුමනි, ඔබතුමා රාත්‍රියෙහි ද දවාලෙහි ද මධ්‍යම රාත්‍රිකාලයෙහි ද වක් සිතින් කදක් ගෙනෙමින් මහත් දුකක් විඳින්නේ ය. ඔබතුමා කුසාවතී නගරයට ආපසු වහා යන්න. මෙහි වසන්නා වූ දුර්වර්ණ ඔබතුමා මම ප්‍රිය නො කරමි යි පභාවතී තොමෝ කීවා ය.

3643. එම්බා ප්‍රභාවතිය, මම මෙයින් නික්ම කුසාවතියට නො යමි. මම වනාහි තීගේ ශරීර වර්ණයෙන් ප්‍රලොභිත වූයෙමි තීගේ දර්ශනයෙහි ඇළුණක් වැ රට හැර මද්‍රරජුගේ සිත්කලු වූ ගෘහයෙහි සිත් අලවා වාසය කරමි.

3644. එම්බා ප්‍රභාවතිය, මම වනාහි තීගේ ශරීර වර්ණයෙන් ප්‍රලොභිත වූයෙමි කෙලෙස් වශයෙන් මුළා වූව වැ පොළෝ තෙලෙහි හැසිරෙමි. මුව දෙනකට බඳු මනෝලොචන ඇත්තී යැ. තී විසින් මම මත් කරන ලද්දෙමි. කොහි සිට පැමිණියෙම් දැ යි දිශාව සලකාගන්නට ද අපොහොසත් වෙමි.

3645. රනින් විසිතුරු කළ වස්ත්‍ර හැන්ද වූ රන්මුවා මෙවුල්දම් ඇති, මනා වැ වැඩුණු මධ්‍යප්‍රදෙශ ඇති ප්‍රභාවතිය, තිට කැමැති හෙයින් මම මෙහි ම වසමි. මම රජයෙන් ප්‍රයොජන නැත්තෙක්මි යි කුස රජ තෙමේ කීය.

3646. පින්වත් කුස රජුනි, යමෙක් නොකැමැත්තහු කැමැත්තේ ද ඔහුට අවැඩක් (පිරිහීමක්) ම වන්නේ ය. මහරජ, ඔබතුමා වනාහි නොකැමැති මා කැමැති වන්නේ ය. අකාන්ත වූයේ දුටුවන් නොපහදනාසුලු වූයේ කාන්ත තැනැත්තියක වූ මා කැමැත්තේ ය.

3647. යම් මිනිසෙක් කැමැති නොවන්නා වූ හෝ කැමැති වන්නා වූ හෝ ප්‍රියාවක් ලබා ද ඒ ලාභය මෙහි ලා පසසමි. නොලැබීම ලාමක වන්නේ යැ යි රජ තෙමේ කීයේ ය,

3648. පාසාණසාරං ඛණසි කණිකාරස්ස දරුනා,
වාතං ජාලෙන බාධෙසි යො අනිච්ඡන්තමිච්ඡසි.

3649. පාසාණො නූන තෙ හදයෙ ඔහිතො මුදුලක්ඛණෙ,
යො තෙ සාතං න වින්දාමි තිරොජනපදගතො.

3650. යදා මං භූකුටිං[1] කත්වා රාජපුත්ති උදික්ඛසි,
ආළාරිකො තදා හොමි රඤ්ඤො මද්දස්ස[2] ඊපුරෙ.

3651. යදා උම්හයමානා මං රාජපුත්ති උදික්ඛසි,
නාළාරිකො තදා හොමි රාජා හොමි තදා කුසො.

3652. සචෙ හි වචනං සච්චං නෙමිත්තානං භවිස්සති,
නෙව මෙ ත්වං පති අස්ස කාමං ඡින්දන්තු සත්තධා.

3653. සචෙ හි වචනං සච්චං අඤ්ඤෙසං යදි වා මම,
නෙව තුය්හං පති අත්ථි අඤ්ඤො සීහස්සරා කුසා.

3654. නෙක්ඛං[3] ගීවන්තෙ කාරෙස්සං පත්වා ඛුජ්ජෙ කුසාවතිං,
සචෙ මං නාගනාසූරු ඔලොකෙය්‍ය පභාවතී.

3655. නෙක්ඛං ගීවන්තෙ කාරෙස්සං[4] පත්වා ඛුජ්ජෙ කුසාවතිං,
සචෙ මං නාගනාසූරු[5] ආලපෙය්‍ය පභාවතී.

3656. නෙක්ඛං ගීවන්තෙ කාරෙස්සං පත්වා ඛුජ්ජෙ කුසාවතිං,
සචෙ මං නාගනාසූරු උම්හායෙය්‍ය[6] පභාවතී.

3657. නෙක්ඛං ගීවන්තෙ කාරෙස්සං පත්වා ඛුජ්ජෙ කුසාවතිං,
සචෙ මං නාගනාසූරු පම්හායෙය්‍ය[7] පභාවතී.

3658. නෙක්ඛං ගීවන්තෙ කාරෙස්සං පත්වා ඛුජ්ජෙ කුසාවතිං,
සචෙ මං නාගනාසූරු පාණිහි[8] උපසම්ඵුසෙ.

---

1. භූකුටිකං – වි.
2. මද්දස්සන්තෙ – මජ්ඣං.
3. නික්ඛං – මජ්ඣං.
4. කාරිස්සං – මජ්ඣං.
5. අනාගනාසූරුං – මජ්ඣං, ස්‍යා. නාගනාසූරං – වි.
6. උම්හාපෙය්‍ය – වි. මජ්ඣං.
7. පම්හාපෙය්‍ය – වි. මජ්ඣං,
8. පාණිනා – මජ්ඣං.

3648. යම් බඳු වූ ඔබ නොකැමැති නැනැත්තියක වූ මා කැමැත්තෙහි නම්, කිණිහිරි දර කඩකින් ගල්හර කණනෙහි ය. දැලකින් සුළඟ වළකන්නෙහි ය.

3649. මෘදු ලක්‍ෂණ ඇත්තිය, යම් බඳු වූ මම අන් රටකින් ආයෙම් තිගේ පිළිසඳර මාත්‍ර වූ සුවයක් වත් නො ලබන්නෙම් නම් මා කෙරෙහි ස්නෙහය වැළැක්වීම පිණිස තිගේ හෘදයෙහි ගලක් තබන ලද්දේ ය කියා හඟිමි.

3650. රාජපුත්‍රිය, යම් විටක බැම හකුළුවා මා දෙස බලහි ද එවිට මදු රජුගේ අන්තඃපුරයෙහි අරක්කැමියෙක් වෙමි.

3651. රාජපුත්‍රිය, යම් විටක සිනාසෙමින් මා දෙස බලහි ද, එවිට මම අරක්කැමියකු මෙන් නො වෙමි. එවිට කුසාවතී නුවර රජ මෙන් වෙමි යි කුසරජ තෙමේ කීවේ ය.

3652. ඉදින් වනාහි නිමිත්තපාඨකයන්ගේ වචනය සත්‍ය වන්නේ නම් මා සත් කඩක් කොට සිඳිතත් ඔබතුමා මට සැමියා නො වන්නේ ය යි ප්‍රභාවතිය කීවා ය.

3653. ඉදින් අනිත් නිමිත්ත පාඨකයන්ගේ හෝ මාගේ හෝ වචනය සත්‍ය වන්නේ නම්, සිංහස්වර ඇත්තා වූ කුසරජුගෙන් අන්‍ය වූවෙක් තිට සැමි නො වන්නේ යැයි කුසරජ තෙමේ කීයේ ය.

3654. එම්බා කුදිය, ඉදින් තිගේ වචනයෙන් ඇත් සොඬට බඳු කලවා ඇති ප්‍රභාවතිය මා දෙස බලන්නී නම් මම කුසාවතියට පැමිණ තිට ස්වර්ණමය ග්‍රීවාභරණයක් කරවන්නෙමි.

3655. එම්බා කුදිය, ඉදින් තිගේ වචනයෙන් ඇත් සොඬට බඳු කලවා ඇති ප්‍රභාවතිය මා හා කථා කරන්නී නම් මම කුසාවතියට පැමිණ තිට ස්වර්ණමය ග්‍රීවාභරණයක් කරවන්නෙමි.

3656. එම්බා කුදිය, ඉදින් තිගේ වචනයෙන් ඇත් සොඬට බඳු කලවා ඇති ප්‍රභාවතිය මා හා මඳ සිනා පවත්වන්නී නම් මම කුසාවතියට පැමිණ තිට ස්වර්ණමය ග්‍රීවාභරණයක් කරවන්නෙමි.

3657. එම්බා කුදිය, ඉදින් තිගේ වචනයෙන් ඇත්සොඬට බඳු කලවා ඇති ප්‍රභාවතිය මා හා මහසිනා පවත්වන්නී නම් මම කුසාවතියට පැමිණ තිට ස්වර්ණමය ග්‍රීවාභරණයක් කරවන්නෙමි.

3658. එම්බා කුදිය, ඉදින් තිගේ වචනයෙන් ඇත් සොඬට බඳු කලවා ඇති ප්‍රභාවතිය අත්වලින් මා ස්පර්ශ කරන්නී නම් මම කුසාවතියට පැමිණ තිට ස්වර්ණමය ග්‍රීවාභරණයක් කර වන්නෙමි යි කුසරජ තෙමේ කී ය.

3659. නහි නූනායං රාජපුත්තී කුසෙ සාතම්පි වින්දති,
ආළාරිකෙ භතෙ[1] පොසෙ වෙතනෙන[2] අනත්ථිකෙ.

3660. නහි නූන[3] අයං ඛුජ්ජා ලභති ජිව්හාය ඡෙදනං,
සූනිසිතෙන සත්ථෙන එවං දුබ්භාසිතං භණං.

3661. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
මහායසොති කත්වාන කරස්සු රුචිරෙ පියං.

3662. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
මහද්ධනොති කත්වාන කරස්සු රුචිරෙ පියං.

3663. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
මහබ්බලොති කත්වාන කරස්සු රුචිරෙ පියං.

3664. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
මහාරට්ඨොති කත්වාන කරස්සු රුචිරෙ පියං.

3665. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
මහාරාජාති කත්වාන කරස්සු රුචිරෙ පියං.

3666. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
සීහස්සරොති කත්වාන කරස්සු රුචිරෙ පියං.

3667. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
වග්ගුස්සරොති කත්වාන කරස්සු රුචිරෙ පියං.

3668. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
බින්දුස්සරොති කත්වාන කරස්සු රුචිරෙ පියං.

3669. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
මඤ්ජුස්සරොති කත්වාන කරස්සු රුචිරෙ පියං.

---

1. භටෙ – මජසං.
2. වෙත්තකෙනෙන – මජසං.
3. නූනායං සා ඛුජ්ජා – මජසං.

3659. මේ රාජපුත්‍රී තොමෝ කුසරජු නිසා ස්වල්පමාත්‍ර සැපතකුදු නො වින්දේ ය යි සිතමි. චේතනයෙන් ද ප්‍රයොජන නැති, අරක්කැමි ව බැළ මෙහෙ කරන්නා වූ මේ පුරුෂයා කෙරෙහි පිළිසඳර මාත්‍රයකුදු නො කරතැ යි කුදිය කීවා ය.

3660. මෙසේ නපුරු තෙපුල් කියන්නා වූ මේ කුදිය සියුම් ආයුධයෙකින් එකාන්තයෙන් ම දිව සිඳීම නො ලබා ද? ලබා ම ය.

3661. එම්බා ප්‍රභාවතිය, ඒ කුස රජතුමා තොපගේ රූපයෙන් හෝ උසමහතින් හෝ ප්‍රමාණ නො කරව. මනොඥ නැනැත්තිය, හෙ තෙම මහත් යශස් ඇත්තෙකැ යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3662. එම්බා ප්‍රභාවතිය, ඒ කුස රජතුමා තොපගේ රූපයෙන් හෝ උසමහතින් හෝ ප්‍රමාණ නො කරව. ප්‍රියදර්ශන ඇත්තිය, හෙ තෙම මහාධනවතෙකැ යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3663. එම්බා ප්‍රභාවතිය, ඒ කුස රජතුමා තොපගේ රූපයෙන් හෝ උසමහතින් හෝ ප්‍රමාණ නො කරව. ප්‍රියදර්ශන ඇත්තිය, හෙ තෙම මහාබලැත්තෙකැ යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3664. එම්බා ප්‍රභාවතිය, ඒ කුස රජතුමා තොපගේ රූපයෙන් හෝ උසමහතින් හෝ ප්‍රමාණ නො කරව. ප්‍රියදර්ශන ඇත්තිය, හෙ තෙම මහත් රටවල් ඇත්තෙකැ යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3665. එම්බා ප්‍රභාවතිය, තොපගේ රූසපුවෙන් හෝ උස මහතින් හෝ ඒ කුස රජතුමා ප්‍රමාණ නො කරව. ප්‍රියදර්ශන ඇත්තිය, හෙ තෙම මහරජෙකැ යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3666. එම්බා ප්‍රභාවතිය, ඒ කුස රජතුමා තොපගේ රූපයෙන් හෝ උසමහතින් හෝ ප්‍රමාණ නො කරව. ප්‍රියදර්ශන ඇත්තිය, හෙ තෙම සිංහස්වර ඇත්තෙකැ යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3667. එම්බා ප්‍රභාවතිය, ඒ කුස රජතුමා තොපගේ රූපයෙන් හෝ උසමහතින් හෝ ප්‍රමාණ නො කරව. මනොඥ දර්ශන ඇත්තිය, හෙ තෙම ලීලායෙන් යුත් ස්වර ඇත්තෙකැ යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3668. එම්බා ප්‍රභාවතිය, ඒ කුස රජතුමා තොපගේ රූපයෙන් හෝ උසමහතින් හෝ ප්‍රමාණ නො කරව. ප්‍රියදර්ශන ඇත්තිය, හෙ තෙම මනා ව එක් වූ හඬ ඇත්තෙකැ යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3669. එම්බා ප්‍රභාවතිය, ඒ කුස රජතුමා තොපගේ රූපයෙන් හෝ උසමහතින් හෝ ප්‍රමාණ නො කරව. ප්‍රියදර්ශන ඇත්තිය, හෙ තෙම සුන්දරස්වර ඇත්තෙකැ යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3670. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
මධුරස්සරොති කත්වාන කරස්සු රුචිරෙ පියං.

3671. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
සතසිප්පොති කත්වාන කරස්සු රුචිරෙ පියං.

3672. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
ඛත්තියොති කරිත්වාන කරස්සු රුචිරෙ පියං.

3673. මා නං රූපෙන පාමෙසි ආරොහෙන පභාවති,
කුසරාජාති කත්වාන කරස්සු රුචිරෙ පියං.

3674. එතෙ නාගා උපත්ථද්ධා සබ්බෙ තිට්ඨන්ති වම්මිතා,
පුරා මද්දන්ති පාකාරං ආනෙනෙත්තං පභාවතිං.

3675. සත්ත බිලෙ[1] කරිත්වාන අහමෙතං පභාවතිං,
ඛත්තියානං පදස්සාමි යෙ මං හන්තුමිධාගතා.

3676. අවුට්ඨහි රාජපුත්ති සාමා කොසෙය්‍යවාසිනී,
අස්සුපුණ්ණෙහි නෙත්තෙහි දසීගණපුරක්ඛතා.

3677. තං නූන කක්කූපසෙවිතං මුඛං
ආදාසදන්තා ථරුපච්චවෙක්ඛිතං,
සුභං සුනෙත්තං විරජං අනඞ්ගණං
ඡුද්ධං වනෙ ඨස්සන්ති ඛත්තියෙහි.

3678. තෙ නූන මෙ අසිතෙ වෙල්ලිතග්ගෙ
කෙසෙ මුදූ චන්දනසාරලිත්තෙ,
සමාකුලෙ සීවථිකාය[2] මජ්ඣෙ
පාදෙහි ගිජ්ඣා පරිකඩ්ඪියන්ති[3].

3679. තා නූන මෙ තම්බනඛා සුලොමා
බාහා මුදූ චන්දනසාරලිත්තා,
ඡින්නා වනෙ උජ්ඣිතා ඛත්තියෙහි
ගය්හ ධඞ්ඛො ගච්ඡති යෙනකාමං.

---

1. බිලෙ – මජසං.
2. සීවයීකාය – මජසං.
3. පරිකඩ්ඪීයන්ති – මජසං.

3670. එම්බා ප්‍රභාවතිය, ඒ කුස රජතුමා තොපගේ රූපයෙන් හෝ උසමහතින් හෝ ප්‍රමාණ නො කරව. ප්‍රියදර්ශන ඇත්තිය, හෙ තෙම මධුර ස්වර ඇත්තෙකැ යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3671. එම්බා ප්‍රභාවතිය, ඒ කුස රජතුමා තොපගේ රූපයෙන් හෝ උසමහතින් හෝ ප්‍රමාණ නො කරව. ප්‍රියදර්ශන ඇත්තිය, හෙ තෙම තමන් විසින් ම දත් සිය ගණන් ශිල්ප ඇත්තෙකැ යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3672. එම්බා ප්‍රභාවතිය, ඒ කුසරජතුමා තොපගේ රූපයෙන් හෝ උසමහතින් හෝ ප්‍රමාණ නො කරව. රුචිර ස්ත්‍රිය, හෙ තෙම අසම්භින්න ක්‍ෂත්‍රියකැ යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3673. එම්බා ප්‍රභාවතිය, ඒ කුසරජතුමා තොපගේ රූසපුවෙන් හෝ උසමහතින් හෝ ප්‍රමාණ නො කරව. ප්‍රිය දැකුම් ඇත්තිය, හෙ තෙම කුසරජ ය යි මෙනෙහි කොට ප්‍රිය කරව.

3674. දේවයන් වහන්ස, මේ රජවරු සත් දෙනා ඉතා තද පරුෂ පැවැතුම් ඇත්තාහු සියල්ලෝ ම යුද්ධයට සැරසී සිටිත්. මොවුන් ප්‍රාකාරය මඩින්නට පෙර මේ ප්‍රභාවතිය ඔවුන් වෙත පමුණුවත්වා යි ඇමතියෝ කීහ.

3675. මා නසන්නට මෙහි පැමිණියා වූ යම් කෙනෙක් ඇද්ද, ඒ ක්‍ෂත්‍රියයන්ට මම මේ ප්‍රභාවතිය සත්කඩක් කොට දෙන්නෙමි යි රජ තෙමේ කී ය.

3676. කොසෙය්‍යවස්ත්‍ර හැන්ද වූ රන්වන් වූ ප්‍රභාවතී නම් ඒ රාජපුත්‍රිය කඳුළු පිරි දෙනෙතින් යුතු ව දසී සමූහයා විසින් පිරිවරන ලදු ව ආසනයෙන් නැගිට්ටා ය. (මව ළඟට ගොස් වැද මෙසේ කීවා ය.)

3677. මෑණියෙනි, පස් වැදෑරුම් සුණුයෙන් සෙවුනා ලද දළ-මුවා මිටින් යුත් කැටපතෙන් බලා සරසන ලද යහපත් නෙත් ඇති රජස් රහිත ගඩු පිළිකාදි දෙෂ විරහිත ඒ මාගේ මුහුණ රජුන් විසින් වනයෙහි හැරපියා දමන ලදු ව තබන්නේ ය.

3678. මෑණියෙනි, කාලවර්ණයෙන් යුත් උස් වූ කෙළවර ඇති මෘදු වූ සඳුන් කල්කයෙන් ගැවසීගත් කෙස් සොහොන් මැද දී ගිජුලිහිණියෝ එකාන්තයෙන් පාවලින් ඔබ මොබ අදින්නාහ යි හඟිමි.

3679. මෑණියනි, තඹවන් නිය ඇති මනා ලොමින් යුත් මෘදු වූ සඳුන්කල්ක ගල්වන ලද්ද වූ මාගේ බාහු යුග්මය රජුන් විසින් සිඳින ලද්දේ වනයෙහි හැර දමන ලද්දේ කවුඩා ඩැහැගෙන සිත් වූ පරිදි කඩ කඩා කමින් යෙතැ යි සිතමි.

3680. තෙ නූන තාලූපත්තෙ අලම්බෙ
නිසෙවිතෙ කාසිකචන්දනෙන,
එතෙසු මෙ ලම්බිස්සති සිගාලො[1]
මාතුව පුත්තො තරුණො තනූජො.

3681. තං නූන සොණිං පුථුලං සුකොට්ටිතං
නිසෙවිතං කඤ්චන මෙඛලාහි,[2]
ඡින්නං වනෙ ඛත්තියෙහී අවත්ථං
සිගාලසඞ්ඝා පරිකඩ්ඪයන්ති.[3]

3682. සොණා ධඞ්කා සිගාලා ච යෙ චඤ්ඤෙ සන්ති දාඨිනො,
අජරා නූන හෙස්සන්ති භක්ඛයිත්වා පභාවතිං.

3683. සචෙ මංසානි හාරෙසුං[4] ඛත්තියා දූරගාමිනො,
අට්ඨීනි අම්ම යාචිත්වා අනුපථෙ[5] දහාථ නං.

3684. ඛෙත්තානි අම්ම කාරෙත්වා කණිකාරෙත්ථ රොපය,
යදා තෙ පුප්ඵිතා අස්සු හෙමන්තානං හිමච්චයෙ
සරෙය්‍යාථ මමං අම්ම එවංවණ්ණා පභාවතී.

3685. තස්සා මාතා උදට්ඨාසි ඛත්තියා දෙවවණ්ණිනී,
දිස්වා අසිඤ්ච සූනඤ්ච රඤ්ඤො මද්දස්ස ථීපුරෙ.

3686. ඉමිනා නූන අසිනා සුසඤ්ඤං තනුමජ්ඣිමං,
ධීතරං මම හන්ත්වාන[6] ඛත්තියානං පදස්සසි.

3687. න මෙ අකාසි වචනං අත්ථකාමාය පුත්තිකෙ,
සාජ්ජ ලොහිතසඤ්ඡන්නා ගච්ඡිසි[7] යමසාධනං.

3688. එවමාපජ්ජතී පොසො පාපියඤ්ච නිගච්ඡති,
යො වෙ හිතානං වචනං න කරං අත්ථදස්සිනං.

3689. සචෙ ත්වං අම්ම ධාරෙසි[8] කුමාරං චාරුදස්සනං,
කුසෙන ජාතං ඛත්තියං සුවණ්ණමණිමෙඛලං
පූජිතං ඤාතිසඞ්ඝෙහි න ගච්ඡිසි යමක්ඛයං.

3690. යත්ථස්සු භෙරී නදති කුඤ්ජරො පටිකූජති,[9]
ඛත්තියානං කුලෙ භද්දෙ කින්නු සුඛතරං තතො.

---

1. සිඞ්ගාලො – වි. මජසං.
2. මෙඛලෙහි – මජසං.
3. ශ්‍යාවකො ගච්ඡති යෙන කාම – වි.
4. හරිංසු – මජසං.
5. අනුපථෙ – මජසං,
6. ධීතරං මද්දහන්ත්වාන.
7. ගච්ඡසි – මජසං.
8. සචෙච අජ්ජධාරෙසි – මජසං.
9. කුඤ්ජරොච නිකූජති – වි, මජසං, ස්‍යා.

3680. මැණියෙනි, රන්වන් තල්ගෙඩි බඳු නො එල්බෙන්නා වූ ද කසී සඳුනෙන් නිතොර සෙවිත වූ ද මාගේ පයොධරයන්හි කුසෙහි උපන් ළදරු පුතකු මවගේ තනයෙහි එල්බෙන්නාක් මෙන් සිවල් තෙම එල්බෙන්නේ ය.

3681. රන්මුවා මෙවුල්දාමින් නිසෙවිත වූ මනා ව වඩනා ලද්ද වූ පුළුල් වූ ඒ මාගේ නිතම්බය ක්‍ෂත්‍රියයන් විසින් සිඳ වනයෙහි හැරදමන ලද්දේ වේ ද, එය සිවල් සමූහයා ඒ මේ අත අදිති හහිමි.

3682. බල්ලෝ ද කවුඩෝ ද සිවල්ලු ද දළ ඇත්තා වූ සෙසු සත්වයෝත් වෙද්ද ඒ හැම ප්‍රභාවතී නම් වූ මා කා එකාන්තයෙන් නොදිරන්නාහු වෙතැ යි සිතමි.

3683. මැණියෙනි, ඉදින් දුර යන්නා වූ ක්‍ෂත්‍රියයෝ මාගේ මස් ගෙන යෙද්ද, ඇට ඉල්ලාගෙන මාර්ගයන් අතර එය දවවූ යයි ප්‍රභාවතිය අඬමින් කීවා ය.

3684. මැණියෙනි, ඒ දවූ තැනැ මල්වතු කරවා කිණිහිරිගස් වවව. යම් දිනෙක හෙමන්ත ඍතුවගේ අවසන්හි එග්ගුන මාස-යෙහි ඒ ගස් මල් පිපෙන්නාහු ද එ විට මැණියෙනි, ප්‍රභාවතී තොමෝ මෙ බඳු වර්ණ ඇත්තී ය කියා මා සිහි කරව යි ප්‍රභාවතිය කීවා ය.

3685. ඒ ප්‍රභාවතියගේ මව වූ දෙවඟනකට බඳු වර්ණ ඇති රාජමහිෂී තොමෝ ආසනයෙන් නැගිට රජු වෙත ගොස් සිටියා ය. මද්‍රරජුගේ අන්තඃපුරයෙහි රජු ඉදිරියෙහි තබන ලද පොරොවත්, දංගෙඩියත් දැක වැලපෙමින් මෙසේ කීවා ය.

3686. හඳුනාගැනීමට පහසු වූ කෘෂ වූ මධ්‍ය ප්‍රදෙශ ඇති මාගේ දුව මේ පොරොවෙන් සිඳ ක්‍ෂත්‍රියයන්ට එකාන්තයෙන් දෙන්නෙහි දැ යි ඇසුවා ය.

3687. දියණියනි, තෝ වැඩ කැමැති වූ මාගේ වචනය නො පිළිගත්තෙහි ය. එ බැවින් ඒ නුඹ අද ලෙයින් වැකීගිය සිරුරු ඇත්තී මෘත්‍යුරාජභවනයට යන්නෙහි ය.

3688. යමෙක් යහපත දක්නා වූ හිතවතුන්ගේ බස් නොපිළිපදී ද, එ බඳු පුරුෂ තෙම මෙසේ ව්‍යසනයට පැමිණේ. මීට වැඩි දුකට ද පත් වේ.

3689. දියණියනි, ඉදින් නුඹ කුසරජු නිසා උපන්, මනා දැකුම් ඇත්තා වූ, රන් මිණි මෙවුල් දරන්නා වූ, නෑ සමූහයා විසින් පුදන ලද කුමරකු දරන්නෙහි (සැමියා වශයෙන් පිළිගන්නෙහි) නම් යමයා වෙත නො යන්නෙහි ය.

3690. සුන්දර වූ දියණියනි, යම් කුසරාජ භවනයෙක්හි බෙර වැයීමාදි තූර්‍ය්‍යනාද පවතී ද, මංගල හස්ති තෙම කුඤ්චනාද කෙරේ ද, ඊට වැඩි සුවය කුමක් ද?

3691. අයෙසා හසිසති ද්වාරෙ කුමාරො උපරොදති,
ඛත්තියානං කුලෙ භද්දෙ කින්නු සුඛතරං තතො.

3692. මයූරකොඤ්චාභිරුදෙ කොකිලාභිනිකූජිතෙ,
ඛත්තියානං කුලෙ භද්දෙ කින්නු සුඛතරං තතො.

3693. කහං නුඛො සත්තුමද්දනො පරරට්ඨප්පමද්දනො,
කුසො සොළාරපඤ්ඤාණො සො නො දුක්ඛා පමොචයෙ.

3694. ඉධෙව සො සත්තුමද්දනො[1] පරරට්ඨප්පමද්දනො,
කුසො සොළාරපඤ්ඤාණො යො නො දුක්ඛා[2] පමොචයෙ.

3695. උම්මත්තිකා නු භණසි ආදු බාලාව[3] භාසසි,
කුසො චෙ ආගතො අස්ස කිං න ජානෙමු තං මයං.

3696. එසො ආළාරිකො පොසො කුමාරිපුරමන්තරෙ,
දළ්හං කත්වාන සංවෙල්ලිං[4] කුම්භිං ධොවති ඔනතො.

3697. වෙණී ත්වමසි චණ්ඩාලී ආදූසි කුලගන්ධිනී,
කථං මද්දකුලෙ ජාතා දසං කයිරාසි කාමුකං.

3698. නම්හි වෙණී න චණ්ඩාලී න චම්හි කුලගන්ධිනී,
ඔක්කාකපුත්තො භද්දන්තෙ ත්වන්නු දාසොති මඤ්ඤසි.

3699. යො බ්‍රාහ්මණසහස්සානි සද භොජෙති වීසතිං,
ඔක්කාකපුත්තො භද්දන්තෙ ත්වන්නු දාසොති මඤ්ඤසි.

3700. යස්ස නාගසහස්සානි සද භොජෙන්ති වීසතිං,
ඔක්කාකපුත්තො භද්දන්තෙ ත්වන්නු දාසොති මඤ්ඤසි.

1. සත්තුමද්දනො - මජසං.
2. සබ්බ වධිස්සති - මජසං.
3. අන්ධබාලා - මජසං.
අන්ධබාලා පභාසසි - සයා.
4. සංවෙල්ලං - මජසං, සයා.

3691. සුන්දර වූ දියණියනි, යම් කුසරාජභවනයෙක්හි මංගල අශ්ව තෙම හෙසාරව පවත්වා ද, මනාව හික්මුණු ගන්ධර්ව කුමාරයෙක් දෙරටුවෙහි සිටිමින් නොයෙක් තූර්‍යභාණ්ඩ ගෙන උපහාර කෙරේ ද, ඊට වැඩි සුවය කුමක් ද?

3692. සුන්දර වූ දියණියනි, මොනරුන් හා කොස්ලිහිණි-යන් විසින් කරන ලද හඬ ඇති, කොවුලන් විසින් මනා ව පවත්වන ලද නාද ඇති, කුසරාජ භවනයෙහි සැපතට වඩා කවර නම් සුවයෙක් ද?

3693. යමෙක් අප දුකින් මුදන්නේ ද? සතුරන් මඩින්නා වූ, අන් රටවල් යටත් කරගන්නා වූ, මහත් ප්‍රඥා ඇති ඒ කුසරජ තෙම කොහි ද?

3694. යමෙක් අප දුකින් මුදන්නේ ද, සතුරන් මඩින්නා වූ අන්රටවල් යටත් කරගන්නා වූ මහත් ප්‍රඥා ඇති ඒ කුසරජ තෙම මෙහි ම ය යි ප්‍රභාවතිය කීවා ය.

3695. තී උමතුවෙන් දෙඩවන්නෙහි ද, එසේ නැත් නම් මෝඩ-කමින් කථා කරන්නේ ද, ඉදින් කුසරජ තෙමේ ආයේ නම්, ඒ කරුණ කුමක් නිසා අපි නො දන්නෙමු ද?

3696. කුමරියන්ගේ අන්තඃපුර අතර දැඩි ලෙස කැසපට බැඳ-ගෙන වළන් සෝදන තැනැත්තා මේ කුසරජ ය යි ප්‍රභාවතිය කීවා ය.

3697. තෝ වඩු කුලයෙහි උපන්නියක් වෙහි ද? නැත හොත් සැඬොලියක් ද? කුලදූෂ්‍ය ස්ත්‍රියක් වෙහි ද? මද්‍ර රජකුලයෙහි උපන්නා වූ තෝ තම ස්වාමියා කෙසේ නම් දසයකු කරන්නෙහි ද යි මව ඇසුවා ය.

3698. මෑණියනි, ඔබ තුමියට යහපතක් වේවා. මම වඩු කුලයෙහි උපන්නියක් නො වෙමි. සැඬොලියක් ද නො වෙමි. කුලදූෂ්‍ය ස්ත්‍රියක් ද නො වෙමි. මෙ තෙම වනාහි ඔක්කාක පුත්‍ර වූ කුසරජ වන්නේ ය. ඔබතුමී වනාහි ඔහු දසයෙකැ යි හඟින්-නෙහි යයි ප්‍රභාවතිය කීවා ය.

3699. මෑණියනි, ඔබට යහපතක් වේවා. යම් ඔක්කාක පුත්‍රයෙක් තෙමේ බමුණන් විසිදහසක් හැමද ම වළඳවයි ද ඔහු නම් මේ කුසරජ ය, නුඹ වනාහි ඔහු දසයෙකැ යි හඟින්නෙහි ද?

3700. මෑණියනි, ඔබට යහපතක් වේවා. යමකුගේ විසි දහසක් ඇතුන් සැම කල්හි යොදවද්ද, ඔහු නම් මේ ඔක්කාක පුත්‍ර වූ කුස රජ ය. නුඹ වනාහි ඔහු දසයෙකැ යි හඟින්නෙහි ද?

3701. යස්ස අස්සසහස්සානි සදා හොජෙන්ති වීසතිං,
ඔක්කාකපුත්තො භද්දන්තෙ ත්වන්නු දසොසි මඤ්ඤසි.

3702. යස්ස රථසහස්සානි සදා යොජෙන්ති වීසතිං,
ඔක්කාකපුත්තො භද්දන්තෙ ත්වන්නු දසොති මඤ්ඤසි.

3703. යස්ස උසභසහස්සානි සදා යොජෙන්ති වීසතිං,
ඔක්කාකපුත්තො භද්දන්තෙ ත්වන්නු දසොති මඤ්ඤසි.

3704. යස්ස ධෙනුසහස්සානි සදා දූහන්ති[1] වීසතිං,
ඔක්කාකපුත්තො භද්දන්තෙ ත්වන්නු දසොති මඤ්ඤසි.

3705. තස්ස තෙ දුක්කටං බාලෙ යං ඛත්තියං මහබ්බලං,
නාගං මණ්ඩූකවණ්ණෙන න තං අක්ඛාසි ආගතං.[2]

3706. අපරාධං මහාරාජ ත්වං නො ඛම රථෙසභ,
යං තං අඤ්ඤාතවෙසෙන නාඤ්ඤාසිම්හා ඉධාගතං.

3707. මාදිසස්ස න තං ඡන්නං යොහං අළාරිකො භවෙ,
ත්වඤ්ඤෙව මෙ පසීදස්සු නත්ථි තෙ දෙව දුක්කටං.

3708. ගච්ඡ බාලෙ ඛමාපෙහි කුසරාජං මහබ්බලං,
ඛමාපිතො කුසරාජා සො තෙ දස්සති ජීවිතං.

3709. පිතුස්ස වචනං සුත්වා දෙවවණ්ණී පභාවතී,
සිරසා අග්ගහී පාදෙ කුසරාජං මහබ්බලං.

3710. යා ඉමා රත්තියො අතික්කන්තා තා ඉමා දෙව තයා විනා.
වන්දෙ තෙ සිරසා පාදෙ මා මෙ කුජ්ඣ රථෙසභ.

3711. සච්චං තෙ[4] පටිජානාමි මහාරාජ සුණොහි මෙ,
න චාපි අප්පියං[5] තුය්හං කරෙය්‍යාමි අහං පුන.

1. දූහන්ති – මජසං. වි. ස්‍යා.
2. නතං ආකඛාසිමාගතං – මජසං. ස්‍යා.
4. සබ්බං තෙ – මජසං.
5. අපියං – මජසං.

3701. මැණියනි, ඔබට යහපතක් වේවා. යමකුගේ විසි දහසක් අසුන් හැම කල්හි යොදවත් ද, ඔහු නම් මේ ඔක්කාක පුත්‍ර වූ කුසරජ ය. නුඹ වනාහි ඔහු දසයෙකැ යි හඟින්නෙහි ද?

3702. මැණියනි, ඔබට යහපතක් වේවා. යමකුගේ රිය විසිදහසක් හැම කල්හි යොදවද්ද, ඔහු නම් මේ ඔක්කාක පුත්‍ර වූ කුසරජ ය. නුඹ වනාහි ඔහු දසයෙකැ යි හඟින්නෙහි ද?

3703. මැණියනි, ඔබට යහපතක් වේවා. යමකුගේ විසි දහසක් වෘෂභයන් හැම කල්හි යොදවද්ද, ඔහු නම් මේ ඔක්කාක පුත්‍ර වූ කුසරජ ය. නුඹ වනාහි ඔහු දසයෙකැ යි හඟින්නෙහි ද?

3704. මැණියනි, ඔබට යහපතක් වේවා. යමකුගේ විසි දහසක් දෙනුන් හැමදා ම දෙවද්ද, ඔහු නම් මේ ඔක්කාක පුත්‍ර වූ කුසරජ ය. නුඹ වනාහි ඔහු දසයෙකැ යි හඟින්නෙහි ද?

3705. අනුවණ තැනැත්තිය, යම් හෙයෙකින් මැඩියකුගේ වෙසින් ආ නාගයකු මෙන් මහත් බලැති ක්‍ෂත්‍රිය රජු ආ බව නො කීයෙහි ද, එ හෙයින් එකාන්තයෙන් ම තී විසින් නපුරක් කරන ලදැ යි රජ තෙම කීයේ ය.

3706. රථේශ්වර වූ මහරජ, අප්‍රසිද්ධ වෙශයෙන් මෙහි පැමිණියා වූ නුඹ වහන්සේ හඳුනාගැනීමට නොපිළිවන් වීම් සංඛ්‍යාත යම් වරදෙක් වී නම් අපගේ ඒ වරද කමා කරන සේක්වා යි කුසරජුට සැලකෙළේ ය.

3707. දේවයෙනි, යම්බඳු මම අරක්කැමියෙක් වූයෙම් ද, එය මා වැන්නකුට නුසුදුසු ය. ඔබ ම මට පහන් වුව මැනවි තොප විසින් කරන ලද නපුරක් නැතැ යි කුසරජ කී ය.

3708. අඥාන තැනැත්තිය, යව මහත් බලැති කුසරජ කමා කරව, කමා කරවන ලද ඒ කුසරජ තෙමේ තිට ජීවිතය දෙන්නේ ය යි පියරජ කීයේ ය.

3709. දෙවඟනකට බඳු පැහැය ඇති ප්‍රභාවතිය පියාගේ වචනය අසා සිරසින් වැටී මහබලැති කුසරජහු පා අල්ලාගත්තී ය.

3710. දේවයන් වහන්ස, යම් මේ රාත්‍රීහු ඉක්ම ගියාහු ද, ඒ රාත්‍රීහු නුඹ වහන්සේගෙන් වෙන් ව ඉක්ම ගියාහු ය. රථේශ්වරයන් වහන්ස, නුඹ වහන්සේගේ පා සිරසින් වඳිමි. මට නො කිපෙනු මැනැවි.

3711. මහරජ, මෙතෙක් කල් මා විසින් නුඹ වහන්සේට අප්‍රිය වූවක් ම කරන ලදී. එය මම සත්‍යයක් බව පිළිගනිමි. නැවැත නුඹ වහන්සේට අප්‍රිය වන්නා වූ කිසිවක් නො කරන්නෙමි.

3712. එවඤ්චෙ යාචමානාය වචනං මෙ න කාහසි,
ඉදනි මං තාතො හන්ත්වා ඛත්තියානං පදස්සති.

3713. එවන්තෙ යාචමානාය කිං න කාහාමි තෙ වචො,
විකුද්ධො ත්‍යස්මි කල්‍යාණි මා ත්වං භායි පභාවති.

3714. සච්චන්තෙ පටිජානාමි රාජපුත්ති සුණොහි මෙ,
න වාපි අප්පියං තුය්හං කරෙය්‍යාමි අහං පුන.

3715. තව කාමා හි සුස්සොණි බහූං දුක්ඛං තිතික්ඛිසං,
පහු මද්දකුලං ගන්ත්වා නයිතුං තං පභාවති.

3716. යොජයන්තු රථෙ අස්සෙ නානාචිත්තෙ සමාහිතෙ,
අථ දක්ඛථ මෙ වෙගං විධමෙන්තස්ස සත්තවො.

3717. තඤ්ච තත්ථ උදික්ඛිංසු රඤ්ඤො මද්දස්ස ථීපුරෙ,[1]
විජම්භමානං සීහංව පොඨෙන්තං දිගුණං භුජං.

3718. හත්ථික්ඛන්ධඤ්ච ආරුය්හ ආරොපෙත්වා පභාවතිං,
සඞ්ගාමං ඔතරිත්වාන සීහනාදං නදී කුසො.

3719. තස්ස තං නදතො සුත්වා සීහස්සෙවිතරෙ මිගා,
ඛත්තියා විපලායිංසු කුසද්දසභයට්ටිතා.

3720. හත්ථාරොහා අනීකට්ඨා රථිකා පත්තිකාරකා,
අඤ්ඤමඤ්ඤස්ස ඡින්දන්ති කුසසද්දභයට්ටිතා.

3721. තස්මිං සඞ්ගාමසීසස්මිං පස්සිත්වා තුට්ඨමානසො,[2]
කුසස්ස රඤ්ඤො දෙවින්දො අද වෙරොචනං මණිං.

3722. සො තං විජිත්වා සඞ්ගාමං ලද්ධා වෙරොචනං මණිං,
හත්ථික්ඛන්ධගතො රාජා පාවෙක්ඛි නගරං පුරං.

3723. ජීවගාහං[4] ගහෙත්වාන බන්ධිත්වා සත්ත ඛත්තියෙ,
සසුරස්සුපනාමෙසි ඉමෙ තෙ දෙව සත්තවො.

---

1. මද්දස්සන්තෙ පුරෙ – මජසං.
2. හට්ඨමානසො – වි. මජසං.
3. ජීවග්ගාහං – මජසං.

3712. මහරජ, මෙසේ යදින්නා වූ මාගේ වචනය තමුන්නාන්සේ නොකරන්නහු නම්, පිය රජ තෙම මා දූන් මරා ක්‍ෂත්‍රියයන්ට දෙන්නේය යි ප්‍රභාවතී කීවා ය.

3713. මෙසේ යාචනා කරන්නා වූ තිගේ වචනය මම කුමක් නිසා නො කරම් ද, සොඳුර, තිට නොකිපියෙක් වෙමි. ප්‍රභාවතිය, තෝ බිය නො වව.

3714. රාජපුත්‍රිය, මාගේ වචනය අසව, තිට නොකිපි බවත්, අප්‍රියයක් නො කළ බවත්, මම සත්‍යයක් බව පිළිගනිමි. නැවත මම තිට අප්‍රිය දනවන්නක් නොකරන්නෙමි.

3715. මනා කටි ප්‍රදෙශ ඇති ප්‍රභාවතිය, මද්‍රරජ කුලයට ගොස්, බලාත්කාරයෙන් තී ගෙනෙන්නට පිළිවන්කම තිබියදීත් තී කැමැත්තෙන් මම බොහෝ දුක් ඉවැසීමි.

3716. නොයෙක් අලංකාරයෙන් විසිතුරු කරන ලද හොඳින් හික්මුණු අසුන් රියෙහි යොදත් වා, එ විට සතුරන් නසන්නා වූ මාගේ වේගය බලවූ ය යි කුසරජ තෙම කීයේ ය.

3717. එහි මද්‍ර රජුගේ අන්තඃපුරයෙහි සිංහයකු මෙන් අත පය දිගහැර ප්‍රාණවත් කරන්නා වූ ද ද්විගුණ කොට අත්පොළසන් දෙන්නා වූ ද කුසරජු දෙස ස්ත්‍රීහු කවුළු හැර බැලූ හ.

3718. ඉක්බිති කුසරජ තෙමේ හස්තිරාජයකු පිට නැඟී ප්‍රභාවතිය ද නංවාගෙන යුද බිමට බැස සිංහනාද කෙළේ ය.

3719. නාද කරන්නා වූ ඒ කුස රජුගේ හඬ අසා සිංහයකුගේ හඬ ඇසූ සෙසු මුවන් මෙන් කුසහඬින් බියපත් වූ සෙසු රජවරු ඒ මේ අත පලාගියහ.

3720. ඇතරුවෝ ද බළ ඇණියෙහි වූවෝ ද රියැදුරෝ ද පාබළ සේනාවෙහි වූවෝ ද කුස හඬින් බියපත් වූවාහු ඔවුනොවුන් සිඳගත්හ.

3721. ඒ යුද බිමෙහි (කුසරජු ගේ පරාක්‍රමය) දැක තුටු සිත් ඇති ශක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ කුස රජුට වෙරොචන නම් මැණිකක් දුන්නේ ය.

3722. ඒ රජ තෙමේ ඒ යුද්ධය දිනා වෙරොචන නම් මැණිකක් ලැබ හස්තිරාජයා පිටට නැගුණේ නගරයට පිවිසියේ ය.

3723. ක්‍ෂත්‍රිය රජුන් සත් දෙන ජීවග්‍රාහයෙන් ගෙන බැඳ, දේවයන් වහන්ස, මොවුහු තමුන්නාන්සේ ගේ සතුරෝ වෙති යි මයිලණු වූ මද්‍ර රජුට භාරදුන්නේ ය.

3724. සබ්බෙව තෙ වසඞ්ගතා අමිත්තා විහතා තව,
කාමං කරොහි තෙ තයා මුඤ්ච වා තෙ හනස්සු වා.

3725. තුම්හෙව[1] සත්තවො එතෙ නහි තෙ මය්හ සත්තවො,
ත්වඤ්ඤෙව නො මහාරාජ මුඤ්ච වා තෙ හනස්සු වා.

3726. ඉමා තෙ ධීතරො සත්ත දෙවකඤ්ඤූපමා සුභා,
දදහි නෙසං එකෙකං හොන්තු ජාමාතරො තව.

3727. අම්හාකඤ්චෙව තාසඤ්ච ත්වං නො සබ්බසමිස්සරො,
ත්වඤ්ඤෙව නො මහාරාජ දෙහි නෙසං යදිච්ඡසි.

3728. එකමෙකස්ස එකෙකං අද සීහස්සරො කුසො,
ඛත්තියානං තද නෙසං රඤ්ඤො මද්දස්ස ධීතරො.

3729. පීණිතා[2] තෙන ලාභෙන තුට්ඨා සීහස්සරෙ කුසෙ,
සකරට්ඨානි පායිංසු ඛත්තියා සත්ත තාවදෙ.

3730. පභාවතිඤ්ච ආදය මණිං වෙරොචනං සුභං,
කුසාවතිං කුසො රාජා අගමාසි මහබ්බලො.

3731. ත්‍යාස්සු එකරථෙ යන්තා පවිසන්තා කුසාවතිං,
සමානා වණ්ණරූපෙන නාඤ්ඤමඤ්ඤමතිරොචයුං.[3]

3732. මාතා පුත්තෙන සඞ්ගඤ්ජි උභයො ච ජයම්පතී,
සමග්ගා තෙ තද ආසුං ඵීතං ධරණිමාවසුන්ති.

1. කුසජාතකං.

1. තුය්හෙව – වි. මජසං. සයා.
2. පණිතා – වි. මජසං.
3. රොචයිංසු – මජසං.

3724. මේ සියල්ලෝ ම තමුන්නාන්සේ ගේ වසයට පැමිණි-යාහුය. තමුන්නාන්සේ ගේ සතුරෝ විනසන ලද්දුහ. කැමැත්තක් කරනු මැනැවි. මොවුන් මිදීම හෝ නැසීම හෝ කරනු මැනැවි.

3725. මහරජ, මොවුහු ඔබගේ ම සතුරෝ වෙති. මොවුහු මාගේ සතුරෝ නො වෙති. තමුන්නාන්සේ ම අපගේ අධිපති-වහු ය. මහරජ, තමුන්නාන්සේ ම මොවුන් මිදීම හෝ නැසීම හෝ කරනු යෙදේ.

3726. දේවයිනි, නුඹගේ මේ දිව්‍ය කන්‍යාවන් බඳු දූවරු සත් දෙනෙක් වෙති. ඔවුන්ගෙන් එක එක දුව බැගින් දෙනු මැනවි. එසේ දීමෙන් මොවුහු ජාමාතෲහු (බෑණාවරු) වෙත් වා.

3727. මහරජ, ඒ දූවරුන්ට ද අපට ද යන සියල්ලන්ට ම අධිපතියා ඔබ ම ය. යම් දුවක යමකුටදෙනු කැමැත්තෙහි නම් ඔබ ම ඇය ඔහුට දෙනු යෙදේ.

3728. එ කල්හි සිංහස්වර ඇති කුස රජ තෙමේ මද්‍ර රජුගේ දූවරුන් ඒ ක්‍ෂත්‍රියයන් අතුරින් එක එක ක්‍ෂත්‍රියයාට එක එක දුව බැගින් දුන්නේ ය.

3729. එ කෙණෙහි ම ඒ රජවරු සත් දෙන ඒ ස්ත්‍රී ලාභය නිසා, සිංහස්වර ඇති කුසරජු කෙරෙහි තුටු සිත් ඇත්තාහු, පිනාගිය සොම්නස් ඇත්තාහු සිය රටවලට ගිය හ.

3730. මහබලැති කුසරජ තෙමේ ප්‍රභාවතිය ද වෙරොචන නම් වූ යහපත් මැණික ද ගෙන කුසාවතියට ගියේ ය.

3731. එක ම රියෙහි යෙමින් කුසාවතියට පිවිසෙන්නා වූ ඒ දෙදෙන (මිණි රුවන් කාන්තිය නිසා) පැහැයෙන් හා රූපයෙන් සමාන වූවාහු ඔවුනොවුන් ඉක්මවා නොබැබළු හ.

3732. කුස රජු ගේ මව් තොමෝ පුත්‍රයා හා එක්වූවා ය. ඒ අඹු සැමි දෙදෙන ද සමඟි වූවාහු එ තැන් පටන් ජීවිතාන්තය දක්වා සමෘද්ධ වූ පෘථිවියෙහි සතුටින් වාසය කළහ.

කුස ජාතක යි.

2. සොණනන්දජාතකං

3733. දෙවතානුසි ගන්ධබ්බො ආදු සක්කො පුරින්දදො,
මනුස්සභූතො ඉද්ධිමා කථං ජානෙමු තං මයං.

3734. නම්හි දෙවො න ගන්ධබ්බො නම්හි සක්කො පුරින්දදො,
මනුස්සභූතො ඉද්ධිමා එවං ජානාහි භාරත.[1]

3735. කතරූපමිදං භොතො[2] වෙය්‍යාවච්චං අනප්පකං,
දෙවම්හි වස්සමානම්හි අනොවස්සං භවං අකා.

3736. තතො වාතාතපෙ ඝොරෙ සීතච්ඡායං භවං අකා,
තතො අමිත්තමජ්ඣෙසු[3] ච සරත්තාණං භවං අකා.

3737. තතො ඵීතානි රට්ඨානි වසිනො තෙ භවං අකා,
තතො එකසතං ඛත්‍යෙ අනුයන්තෙ භවං අකා.

3738. පතීතාස්සු[4] මයං භොතො වර තං භඤ්ඤමිච්ඡසි,[5]
හත්ථියානං අස්සරථං නාරියො ච අලඞ්කතා
නිවෙසනානි රම්මානි මයං භොතො දදමසෙ.

3739. අථ වා අඞ්ගෙ වා මගධෙ[6] මයං භොතො දදමසෙ,
අථ වා අස්සකාවන්තිං සුමනා දම්ම තෙ මයං.

3740. උපඩ්ඪං වාපි රජ්ජස්ස මයං භොතො දදමසෙ,
සචෙ තෙ අත්ථො රජ්ජෙන අනුසාස යදිච්ඡසි.

3741. න මෙ අත්ථොපි රජ්ජෙන නගරෙන ධනෙන වා,
අථොපි ජනපදෙන අත්ථො මය්හං න විජ්ජති.

3742. භොතොව රට්ඨෙ විජිතෙ අරඤ්ඤෙ අත්ථි අස්සමො,
පිතා මය්හං ජනෙත්තී ච උභො සම්මන්ති අස්සමෙ.

3743. තෙසාහං පුබ්බාචරියෙසු පුඤ්ඤං න ලභාමි[7] කාතවෙ,
භවන්තං අජ්ඣාවරං කත්වා සොණං යාචාමු[8] සංවරං.

---

1. භාරධ – මජසං.
2. භොතො – සයා.
3. අමිත්තමජ්ඣෙසු – මජසං, සයා.
4. පතීතස්සු – මජසං,
5. වදතං භුඤ්ජමිච්ඡසි – මජසං.
6. අථවඞ්ගවා මගධෙ – මජසං. සයා.
7. ලබ්භාමි – මජසං.
8. යාචෙමු – මජසං.

2. සොණනන්ද ජාතකය

3733. නුඹ දෙවියෙක් වෙහි ද, ගන්ධර්වයෙක් හෝ වෙහි ද, නැතහොත් පුරින්දද නම් ශක්‍රයා වෙහි ද, මනුෂ්‍ය වූ සෘද්ධි ඇත්තෙක් වෙහි ද, අපි ඒ කරුණ කෙසේ දනුමෝ ද?

3734. රජතුමනි, මම දෙවියෙක් නො වෙමි. ගන්ධර්වයෙක් ද නො වෙමි. පුරින්දද නම් ශක්‍රයා ද නො වෙමි. මනුෂ්‍ය වූ සෘද්ධි ඇත්තෙක් වෙමි. ඒ කරුණ මෙසේ දනුව.

3735. පින්වතා විසින් මහත් කායවෙයාවතික කර්මය කරන ලදී. එ නම් පින්වත් තෙමේ වැසි වස්නා කල්හි නැවැත්වීම කෙළේ ය.

3736. තව ද පින්වත් තෙමේ දරුණු වූ සුළඟ හා අව්ව ඇති කල්හි සිසිල්සෙවණ කෙළේ ය. නැවැත පින්වත් තෙමේ සතුරන් මධ්‍යයෙහි ඊ පහරින් වැළකීම ද කෙළේ ය.

3737. තව ද, පින්වතා සමෘද්ධ රටවල වැසියන් අපට වසඟ කෙළේ ය. තව ද එක් සියයක් රජුන් අප අනුගාමිකයන් කෙළේ ය.

3738. අපි පින්වතාට සතුටු වූවමෝ වෙමු. පින්වතා යම් රත්නයක් කැමැත්තේ නම් එය ඉල්ලාගනු මැනැවි. ඇත්යානා ද, අස් රිය ද, අලංකාරයෙන් සැරසූ ස්ත්‍රීන් ද සිත්කලු ගෙවල් ද යන මේවා අපි පින්වතාට දෙම්හ.

3739. නොහොත් අඟුරටෙහි රජය හෝ මගධ රටෙහි රජය හෝ අපි පින්වතාට දෙම්හ. තව ද අස්සක නම් රට හෝ අවන්ති නම් රට හෝ අපි තුටුසිත් ඇති ව පින්වතාට දෙම්හ.

3740. අපි පින්වතාට රජයෙන් අඩක් හෝ දෙම්හ. ඉදින් මුළු දඹදිව රජයෙන් ප්‍රයෝජන වේ නම් එය ද දෙම්හ. යමක් කැමැති නම් එය අණ කරව' යි (මනොජ රජ කියා සිටියේ ය.)

3741. මහරජ, මට රජයෙන් හෝ නගරයෙන් හෝ ධන-යෙන් හෝ ප්‍රයෝජනයෙක් නැත. වැළි ජනපදයෙන් ද මට ප්‍රයෝ-ජනයෙක් නො වේ.

3742. මහරජ, පින්වත්හු ගේ රජයෙහි ආඥාවක්‍රය පවත්නා දේශය තුළ හිමාලය වනයෙහි ආශ්‍රමයක් ඇත. ඒ ආශ්‍රමයෙහි මාගේ පියත් මවත් දෙදෙනා වෙසෙති.

3743. මම ඒ පූර්වාචාර්‍ය්‍ය වූ මාපියන් කෙරෙහි වත් පිළිවෙත් පවත්වා පින් ලැබ ගැනුමට ඉඩ නො ලබමි. එ බැවින් පින්වත්හු සපිරිවරින් ගොස් සොණ පණ්ඩිතයන් දන්වා ආයතිසංවරය යදිමු යි නන්ද තවුසා කී ය.

3744. කරොමි තෙ තං වචනං යං මං භණසි බ්‍රාහ්මණ,
එතඤ්ච ඛො නො අක්ඛාහි කීවන්තො හොන්තු යාචකා.

3745. පරොසතං ජානපද[1] මහාසාලා ච බ්‍රාහ්මණා,
ඉමෙ ච ඛත්තියා සබ්බෙ අභිජාතා යසස්සිනො
භවඤ්ච රාජා මනොජො අලං හෙස්සන්ති යාචකා.

3746. හත්ථී අස්සෙ ච යොජෙන්තු රථං සන්නය්හ සාරථි,
ආබන්ධනානි ගණ්හාථ පාදෙසුස්සාරයං ධජෙ
අස්සමං තං ගමිස්සාමි යත්ථ සම්මති කොසියො.

3747. තතො ච රාජා පායාසි සෙනාය චතුරඞ්ගිනී,
අගමාසි[2] අස්සමං රම්මං යත්ථ සම්මති කොසියො.

3748. කස්ස කාදම්බයො[3] කාජො වෙහාසං චතුරඞ්ගුලං,
අංසං අසම්ඵුසං එති උදහාරස්ස ගච්ඡතො.

3749. අහං සොණො මහාරාජ, තාපසො සහිතබ්බතො,
භරාමි මාතාපිතරො රත්තින්දිවමතන්දිතො.

3750. වනෙ ඵලඤ්ච මූලඤ්ච ආහරිත්වා දිසම්පති,
පොසෙමි මාතාපිතරො පුබ්බෙකතමනුස්සරං.

3751. ඉච්ඡාම අස්සමං ගන්තුං යත්ථ සම්මති කොසියො,
මග්ගං නො සොණ අක්ඛාහි යෙන ගච්ඡෙමු අස්සමං.

3752. අයං එකපදී රාජ යෙනෙතං මෙඝසන්නිභං,
කොවිළාරෙහි සඤ්ඡන්නං එත්ථ සම්මති කොසියො.

3753. ඉදං වත්වාන පක්කාමි තරමානො මහාඉසි,
වෙහාසෙ අන්තලික්ඛස්මිං අනුසාසිත්වාන ඛත්තියෙ.

3754. අස්සමං පරිමජ්ජිත්වා පඤ්ඤපෙත්වාන ආසනං,
පණ්ණසාලං පවිසිත්වා පිතරං පටිබොධයි.

1. ජනපද – වි. මජසං.
2. අගමා – වි. මජසං.
3. කාදම්බමයො – මජසං.

3744. බ්‍රාහ්මණය, යමක් මට කියහි නම් ඒ ඔබගේ වචනය මම ඉටු කරමි. මේ කරුණ ද අපට කියනු මැනැවි. ඒ ක්‍ෂමාව ඉල්ලන්නෝ කොපමණ ද?

3745. ශතාධික ජනපද වැසියෝ ද ශතාධික බ්‍රාහ්මණ මහා-සාල කුලීනයෝ ද, උසස් උත්පත්ති ඇති යස පිරිවරින් යුත් මේ සියලු රජවරු ද, මනොජ රජ නම් වූ පින්වත් තෙමේ ද යන සියල්ලෝ ම සොණ පණ්ඩිතයන් කමාකරවන්නෝ වෙති.

3746. ඇතරුවෝ ඇතුන් ද, අසරුවෝ අසුන් ද සරසා යොදත්වා සාරථිය, නුඹ ද රිය සරසව. ඇතුන් අසුන් හා රථ සැරැසිය යුතු බඩු ගනිවු රියෙහි තබන ලද ධවජපාදයන්හි ධවජ ඔසවත් වා. යම් අසපුවෙක්හි කොසිය ගොත්‍රිකයා වෙසේ ද, ඒ අසපුවට යන්නෙමි (යි ද රජ තෙමේ නියම කෙළේ ය.)

3747. රජ තෙමේ සිවුරඟසෙනඟින් පිරිවරනා ලද්දේ ඒ නගරයෙන් පිටත්විය. යම් අසපුවෙක්හි කොසිය ගොත්‍රිකයා වෙසෙ ද ඒ අසපුවට ගියේ ය.

3748. කොලොම්මුවා කද සතරඟුලක් උරහිස ස්පර්ශ නො කරමින් ම අහසින් එයි. (මෙය) දිය ගෙනෙන්නට යන්නා වූ කවර නම් කෙනකුගේ කද දැ යි මනොජ රජ ප්‍රශ්න කෙළේ ය.

3749. මහරජ, මම ව්‍රත රක්නෙම් සොණ නම් තවුස්මි. රෑ දවල් නො කම්මැලි වූයෙම් මාපියන් පොෂණය කරමි.

3750. මහරජ, වනයෙහි ගෙඩි ද අල ද ගෙනවුත් පෙර කළ උපකාර සිහිකරමින් මම මා පියන් පොෂණය කරමියි සොණ තාපසයා කී ය.

3751. යම් අසපුවෙක්හි කොසිය ගොත්‍රිකයා වෙසේ ද, ඒ අසපුවට යන්නට කැමැත්තෙමු. සොණ තාපසයන් වහන්ස, යම් මඟකින් අසපුවට යමු ද ඒ මඟ කියනු මැනැවි.

3752. මහරජ, මේ එකපදික මාර්ගය වේ. මේ මඟින් යව. යම් දිසාවෙක්හි මෙඝයට බඳු පැහැති මනා ව පිපී ගිය කොබෝ-ලීල ගසින් ගැවසීගත් වනය පෙනේ ද, මෙහි මාගේ පිය වූ කොසිය ගොත්‍රිකයා වෙසේ ය යි සොණ තාපසයා කීයේ ය.

3753. මහර්ෂි වූ සොණ තාපස තෙම මෙය කියා රජුන්ට අනුශාසනා කොට ඉක්මන් ව අන්තරීක්‍ෂ නම් වූ අහසට පැන නැඟැ (අනොතත්ත විලට) ගියේ ය.

3754. අසපුව හැමද අසුනක් පනවා පන්සලට පිවිස පියාට (ඔවුන් ආ බව) දැන්වී ය.

3755. ඉමෙ ආයන්ති රාජානො අභිජාතා යසස්සිනො,
අස්සමා නික්ඛමිත්වාන නිසීදහි[1] මහාඉසි.

3756. තස්ස තං වචනං සුත්වා තරමානො මහාඉසි,
අස්සමා නික්ඛමිත්වාන පද්වාරම්හි උපාවිසි.

3757. තඤ්ච දිස්වාන ආයන්තං ජලන්තරිව තෙජසා,
ඛත්ත[2] සඞ්ඝපරිබ්බූළ්හං කොසියො එතදබ්‍රවි.

3758. කස්ස භෙරී මුදිඞ්ගා ච සඞ්ඛා පණවදෙණ්ඩිමා,[3]
පුරතො පටිපන්නානි හාසයන්තා රථෙසභං.

3759. කස්ස කඤ්චනපට්ටෙන පුථුනා විජ්ජුවණ්ණිනා,
යුවා කලාපසන්නද්ධො කො එති සිරියා ජලං.

3760. උක්කා මුඛෙ[4] පහට්ඨංව ඛදිරඞ්ගාරසන්නිභං,
මුඛඤ්ච රුචිරං භාති කො එති සිරියා ජලං.

3761. කස්ස පග්ගහිතං ඡත්තං සසලාකං මනොරමං,
ආදිච්චරංසාවරණං[5] කො එති සිරියා ජලං.

3762. කස්ස අඞ්ගං පරිග්ගය්හ වාලවීජනිමුත්තමං,
චරන්ති වරපඤ්ඤස්ස[6] හත්ථික්ඛන්ධෙන ආයතො.

3763. කස්ස සෙතානි ඡත්තානි ආජානීයා ච වම්මිතා,[7]
සමන්තා පරිකිරන්ති කො එති සිරියා ජලං.

3764. කස්ස එකසතං ඛත්‍යා අනුයන්තා යසස්සිනො,
සමන්තා අනුපරියන්ති කො එති සිරියා ජලං.

3765. හත්ථී අස්සා රථා පත්ති සෙනාය චතුරඞ්ගනී,
සමන්තා අනුපරියන්ති කො එති සිරියා ජලං.

3766. කස්සෙසා මහතී සෙනා පිට්ඨිතො අනුවත්තති,
අක්ඛොභනී අපරියන්තා සාගරස්සෙව ඌම්මියො.

---

1. නිසීද ත්වං මහා ඉසෙ – වි. මජසං.ස්‍යා.
2. ඛත්‍ය – මජසං.
3. නිඤ්ඤිමා – මජසං.
4. මුඛං – මජසං.
5. ආදිච්ච රංසාවරණං – ම.ජසං
6. වරපුඤ්ඤස්ස – මජසං,
7. වම්මිකා – මජසං,

3755. මහර්ෂි වූ පියාණන් වහන්ස, උසස් උත්පත්ති ඇති මහපිරිවරින් යුත් මේ රජවරු ඔබ දකුමට එති. අසපුවෙන් නික්ම දෙරටුව සමීපයෙහි පනවා තිබෙන අස්නෙහි හිඳගනු මැනැවි.

3756. මහර්ෂි තෙමේ ඒ සොණ පණ්ඩිතයාගේ වචනය අසා ඉක්මන් කොට අසපුවෙන් නික්ම දෙරටුව සමීපයෙහි පනවා තිබුණු අස්නෙහි හිඳගත්තේ ය.

3757. ක්‍ෂත්‍රිය සමූහයා විසින් පිරිවරන ලද තේජසින් දිලි-සෙන්නාක් මෙන් එන්නා වූ ඒ රජු දැක කොසිය ගොත්‍රික මහර්ෂි තෙම මෙය ප්‍රකාශ කළේ ය.

3758. බෙර ද, මිහිඟු බෙර ද, සක් ද, පනා බෙර ද, ගැට බෙර ද යන මේවා රථශ්‍රේෂ්ඨයන් තුටු කෙරෙමින් කවරකුගේ ඉදිරියෙන් පිළිපන්නේ ද?

3759. මහත් වූ විදුලියක බඳු රන්මුවා නළල් පටින් පරික්ෂිප්ත කරන ලද්දේ කවරකුගේ නළල් කෙළවර ද? දුනු හියවුරු වලින් සැරසී ශොභායෙන් දිලිසෙමින් එන තරුණයා කවරෙක් ද?

3760. කඹුරු උදුනෙහි ඔප කරන ලද ස්වර්ණයක් මෙන් කිහිරඟුරු බඳු වර්ණවත් මුහුණ ද මනොඥ ලෙස බබළයි. ශ්‍රීයෙන් බබළමින් මේ කවරෙක් නම් එයි ද?

3761. හිරු රැස් වළක්වන්නා වූ සලාක සහිත වූ සිත්කලු ඡත්‍රයක් කවරකුහට අල්වන ලද ද, ශොභායෙන් මේ කවරෙක් ඒ ද?

3762. ඇතු පිට නැඟ එන්නා වූ කවර නම් උතුම් නුවණැත්තකුගේ සිරුර පිරිවරාගෙන උතුම් වූ වල් විදුනාව හසුරු-වද් ද,

3763. යුද ඇඳුමින් සරසන ලද ආජානීය අසුන්පිට නැඟී කවරකුගේ හාත්පස ශ්වෙතච්ඡත්‍ර අල්වා සිටිද් ද, ශොභාවෙන් දිලිසෙමින් මේ එන්නේ කවරෙක් ද?

3764. අනුව ගමන් කරන්නා වූ පිරිවරින් යුතු වූ එක් සියයක් ක්‍ෂත්‍රියයෝ කවරකුගේ හාත්පසැ පිරිවරමින් යෙද්ද, ශොභාවෙන් දිලිසෙමින් මේ එන්නේ කවරෙක් ද?

3765. හස්තිහු ය, අශ්වයෝ ය, රිය ය, පාබල සෙනග ය යන සිව්රඟ සෙනග කවරකුගේ හාත්පස පිරිවරා එයි ද, ශොභායෙන් දිලිසෙමින් කවරෙක් නම් එයි ද?

3766. සාගරයාගේ නොකැළඹුණා වූ අසීමිත රළ මෙන් මේ මහත් සේනාව කවරකු පිටිපසින් අනුගමන් කෙරේ ද?

3767. රාජාභිරාජා මනොජො ඉන්දොව ජයතං පති,
නන්දස්සජ්ඣාවරං එති අස්සමං බ්‍රහ්මචාරිනං.

3768. තස්සෙසා මහතී සෙනා පිට්ඨිතො අනුවත්තති,
අක්ඛොභනී අපරියන්තා සාගරස්සෙව ඌම්මියො.

3769. අනුලිත්තා චන්දනෙන කාසිකුත්තමධාරිනො,
සබ්බෙ පඤ්ජලිකා හුත්වා ඉසීනං අජ්ඣුපාගමුං.

3770. කච්චි නු භොතො කුසලං කච්චි භොතො අනාමයං,
කච්චි උඤ්ඡෙන යාපෙථ කච්චි මූලඵලා බහූ.

3771. කච්චි ඩංසා ච මකසා අප්පමෙව සිරිංසපා,
වනෙ වාලමිගාකිණ්ණෙ කච්චි හිංසා න විජ්ජති.

3772. කුසලඤ්චෙව නො රාජ අථො රාජ අනාමයං,
අථො උඤ්ඡෙන යාපෙම අථො මූලඵලා බහූ.

3773. අථො ඩංසා ච මකසා අප්පමෙව සිරිංසපා,[1]
වනෙ වාලමිගාකිණ්ණෙ හිංසා අම්හං[2] න විජ්ජති.

3774. බහූනි වස්සපූගානි අස්සමෙ වසතො[3] ඉධ.
නාභිජානාමි උප්පන්නං ආබාධං අමනොරමං.

3775. ස්වාගතන්තෙ මහාරාජ අථො තෙ අදුරාගතං,
ඉස්සරොසි අනුප්පත්තො යං ඉධත්ථි පවෙදය.[4]

3776. තින්දුකානි[5] පියාලානි මධුකෙ කාස[6] මාරියො,
ඵලානි ඛුද්දකප්පානි භුඤ්ජ රාජ වරං වරං.

3777. ඉදම්පි පානීයං සීතං ආභතං ගිරිගබ්භරා,
තතො පිව මහාරාජ සචෙ ත්වං අභිකඞ්ඛසි.

3778. පටිග්ගහිතං යං දින්නං සබ්බස්ස අග්ඝියං කතං,
නන්දස්සාපි නිසාමෙථ වචනං යං[7] පවක්ඛති.

---

1. සරිසපා – මජසං.
2. මය්හං – මජසං.
3. සම්මතො – මජසං. සම්මුතං – වි.
4. පවෙධය – මජසං.
5. තිණ්ඩුකානි – මජසං.
6. කාසු – වි. මජසං.
7. සො – මජසං.

3767. රාජාධිරාජ වූ මනොජ රජ ජයට පත් තව්තිසා වැසි දෙවියන්ගේ ප්‍රධානයා වූ ශක්‍රයා මෙන් නන්දයාගේ පිරිසට එක් වී අප කමාකරවා ගැනීමට බ්‍රහ්මචාරී වූ අපගේ අසපුවට එන්නේ ය.

3768. සාගරයාගේ නොකැළඹුණා වූ අසීමිත රළ මෙන් මහත් වූ මේ සේනාව ඔහුගේ පිටුපසින් ගමන් කරන්නේ ය.

3769. සඳුන් ගැල් වූ සිරුරු ඇති ව උතුම් කසීසළු දරන්නා වූ ඒ සියලු රජවරු ම ඇඳිලි බැඳගත්තාහු සෘෂීන් සමීපයට එළැඹියහ.

3770. කිමෙක් ද, පින්වතුන් වහන්සේට සැප ද? කිමෙක් ද, පින්වතුන් වහන්සේට රොග පීඩා නැද් ද? කිමෙක් ද, පිඬු සිඟා යැමෙන් යැපෙන සේක් ද? කිමෙක් ද, අල මුල් හා පලවැළ බොහෝ වෙද් ද?

3771. ඩැහැ ලේ බොන මැස්සෝ ද මදුරුවෝ ද දීර්ඝ සර්පයෝ ද කිම ස්වල්ප වෙද් ද, ව්‍යාලමෘගයන්ගෙන් ගැවැසීගත් මේ වනයෙහි කිම හිංසාවක් නැද් ද?

3772. මහරජ, අපට සැප ය. අපට රෝගා පීඩා ද නැත. තව ද මහරජ, අපි පිඬු සිඟීමෙන් යැපෙමු. අල මුල් හා පලවැළ ද බොහෝ ය.

3773. තව ද ඩැහැ ලේ බොන මැස්සෝ ද මදුරුවෝ ද දීර්ඝ ජාතික සර්පයෝ ද ස්වල්ප වෙති. ව්‍යාලමෘගයන්ගෙන් ගැවැසීගත් මේ වනයෙහි අපට හිංසාවක් නැත.

3774. බොහෝ අවුරුදු ගණන් මේ අසපුවෙහි වසන්නා වූ මට හටගත් අමනොඥ ආබාධයක් ගැන නො දනිමි.

3775. මහරජ, ඔබ ගේ මෙහි පැමිණීම යහපත් පැමිණීමකි. ඔබ ගේ පැමිණීම අයහපත් පැමිණීමක් නො වේ. මෙහි පැමිණි ඔබ අධිපති වෙහි ය. මෙහි යමක් ඔබ කැමැත්තෙහි නම් එය දන්වනු මැනැවි.

3776. මහරජ, මී මෙන් මිහිරි රසැති රත්වන් තිඹිරි ය, මොර ය, එරමිණියා ය යන කුඩා ඵලවර්ග වෙති. එයින් හොඳ හොඳ ගෙඩි අනුභව කරව.

3777. අනවතප්ත විලෙන් ගෙනෙන ලද මේ සිසිල් පැන් ද තිබේ. මහරජ, කැමැත්තෙහි නම් එයින් පානය කරනු මැනවි.

3778. තාපසයන් වහන්ස, අපට යමක් දෙන ලද නම් එය අප විසින් පිළිගන්නා ලදී. අප සියලු දෙනාට ම නුඹ වහන්සේ විසින් ආගන්තුක සත්කාර කරන ලදී. නන්ද පණ්ඩිත තෙමේ යමක් කියා නම් ඔහු ගේ කීම ද අසනු මැනවි.

3779. අජ්ඣාවරම්හා නන්දස්ස භොතො සන්තිකමාගතා,
සුණන්තු මෙ භවං වචනං නන්දස්ස පරිසාය ච.

3780. පරොසතං ජානපදා මහාසාලා ච බ්‍රාහ්මණා,
ඉමෙ ච ඛත්තියා සබ්බෙ අභිජාතා යසස්සිනො
භවඤ්ච රාජා මනොජො අනුමඤ්ඤන්තු මෙ වචො.

3781. යෙ වසන්ති සමීතාරො යක්ඛානි ඉධ අස්සමෙ,
අරඤ්ඤෙ භූතභව්‍යානි සුණන්තු වචනං මම.

3782. නමො කත්වාන භූතානං ඉසිං වක්ඛාමි සුබ්බතං,
සො ත්‍යාහං දක්ඛිණො[1] බාහු තව කොසිය සම්මතො.

3783. පිතරං මෙ ජනෙත්තිඤ්ච භත්තුකාමස්ස මෙ සතො,
වීර පුඤ්ඤමිදං ඨානං මා මං කොසිය වාරය.

3784. සබ්භිහෙතං උපඤ්ඤාතං මමෙතං උපනිස්සජ,
උට්ඨානපාරිචරියාය දීඝරත්තං තයා කතං
මාතාපිතූසු පුඤ්ඤානි මම ලොකදදො භව.

3785. තථෙව සන්ති මනුජා ධම්මෙ ධම්මපදං විදූ,[2]
මග්ගො සග්ගස්ස ලොකස්ස යථා ජානාසි ත්වං ඉසෙ.

3786. උට්ඨානපාරිචරියාය මාතාපිතු සුඛාවහං,
තං මං පුඤ්ඤා නිවාරෙති අරියමග්ගාවරො නරො.

3787. සුණන්තු භොන්තො වචනං භාතු[3] රජ්ඣාවරා මම,
කුලවංසං මහාරාජ පොරාණං පරිහාපයං
අධම්මචාරී[4] යො ජෙට්ඨො නිරයං සො උපපජ්ජති.

---

1. දක්ඛිණං – මජසං
2. විද – මජසං
3. භාත – වි. මජසං.
4. අධම්මචාරී ජෙට්ඨෙසු – මජසං, සයා.
අධචාරී ජෙඨෙයො – වි.

3779. අපි නන්දපණ්ඩිතයාගේ ඉල්ලීම නිසා පින්වතුන් වහන්සේ වෙත ආම්හ. පින්වත් සොණ පණ්ඩිත තෙමේ මාගේ වචනය අසාවා, නන්ද පණ්ඩිතයාගේ ද පිරිසගේ ද වචනය අසාවා.

3780. ශතාධික ජනපද වැසියෝ ද ශතාධික බ්‍රාහ්මණ මහාසාල කුලීනයෝ ද උසස් උත්පත්ති ඇති යස පිරිවරින් යුත් මේ සියලු රජවරු ද මනොජ රජ නම් වූ පින්වත් තෙමේ ද මාගේ වචනය අනුදනිත් වා.

3781. මේ ආශ්‍රමයෙහි රැස් වූ යම් අමනුෂ්‍ය කෙනෙක් වෙද්ද, වෘද්ධභාවයට පත් වූ හෙයින් භූත නම් වූ ද තරුණ හෙයින් භව්‍ය නම් වූ ද යම් දෙවි කෙනෙක් වෙද්ද, ඒ සියල්ලෝ ම මාගේ වචනය අසත් වා.

3782. දෙවියන්ට නමස්කාර කොට යහපත් ව්‍රත ඇති සොණ ඍෂිවරයන්හට මෙය කියමි. කොසිය ගොත්‍රික ඍෂිවරය, ඒ මම දකුණු අත යයි සම්මත ඔබගේ සහෝදරයා වෙමි.

3783. මාගේ පියා ද මව ද පොෂණය කරන්නට කැමැත්තා වූ මට කමාකළ මැනවි. වීරයන් වහන්ස, මාපියනට උවටැන් කිරීම් නිසා අන්වන පින ස්වර්ගලොකොත්පත්තියට හේතු වන්නකි. කොසිය ගොත්‍රිකය, මා ඒ පිනෙන් නො වළක්වනු මැනැවි.

3784. මේ මවු පිය උපස්ථානය වනාහි සත්පුරුෂයන් විසින් වර්ණනා කරන ලද්දකි. මෙය කිරීමට මට ඉඩ හරුව. ඔබ විසින් දිගුකලක් දක හුනස්නෙන් නැගිටීම ය, කුදු මහත් වතාවත් කිරීම ය යන වශයෙන් උපස්ථාන කරන ලදී. මම ද මවු පියන් කෙරෙහි උවටැන් කොට පින් සිදු කර ගනු කැමැත්තෙමි. එයට ඉඩහැර ඔබ මට ස්වර්ගලොකය සාධා දෙන්නෙක් වව.

3785. ඍෂිවරය, නුඹ වහන්සේ මෙන් ම දන්නා වූ වෙනත් මිනිස්සු මෙහි ඇත. ඔවුහු නොයෙක් ආකාර ඇති ධර්මයෙහි වෘද්ධාපචායනයට අයත් වන මවු පිය උපස්ථානය ස්වර්ගලොකයට මාර්ගය බව කියති.

3786. මවු පියන්ට කායික චෛතසික සුව ගෙනදෙන්නා වූ දක හුනස්නෙන් නැගිටීම ය, කුදු මහත් වතාවත් කිරීම ය යන මෙයින් උපස්ථාන කිරීමට ඉඩ නො දී යමෙක් මා වළකන්නේ නම් ඒ මිනිසා ආයර්‍යමාර්ගය වළකන්නෙකි යි නන්ද පණ්ඩිතයා කීවේ ය.

3787. මාගේ සහෝදරයාගේ පිරිසට අයත් ව ආවා වූ මේ සියලු පින්වත්හු මාගේ වචනය අසත්වා. මහරජ, පැරණි වූ කුලවංශය පිරිහෙළමින් අධර්මයෙහි හැසිරෙන්නා වූ යම් වැඩිමහල්ලෙක් වෙයි ද, හෙතෙම නිරයෙහි උපදී.

3788. යෙ ච ධම්මස්ස කුසලා පොරාණස්ස දිසම්පති,
චාරිත්තෙන ච සම්පන්නා න තෙ ගච්ඡන්ති දුග්ගතිං.

3789. මාතාපිතා ච භාතා ච භගිනී ඤාතිබන්ධවා,
සබ්බෙ ජෙට්ඨස්ස තෙ භාරා එවං ජානාහි භාරත.[1]

3790. ආදියිත්වා ගරුං භාරං නාවිකො විය උස්සහෙ,
ධම්මඤ්ච නප්පමජ්ජාමි[2] ජෙට්ඨොචස්මි රථෙසභ.

3791. අධිගතමහා[3] තමෙ ඤාණං ජාලංව ජාතවෙදතො,[4]
එවමෙව නො භවං ධම්මං කොසියො පවිදංසයි.

3792. යථා උදයමාදිච්චො වාසුදෙවො පභඞ්කරො,
පාණීනං පවිදංසෙති රූපං කල්‍යාණපාපකං
එවමෙව නො භවං ධම්මං කොසියො පවිදංසයි.

3793. එවං මෙ යාචමානස්ස අඤ්ජලිං නාවබුජ්ඣථ,
තව බද්ධචරො[5] හෙස්සං වුට්ඨිතො පරිචාරකො.[6]

3794. අද්ධා නන්ද පජානාසි සද්ධම්මං සබ්භි දෙසිතං,
අරියො අරියසමාචාරො බාළ්හං ත්වං මම රුච්චසි.

3795. භවන්තං වදමි භොතිඤ්ච සුණාථ වචනං මම,
නායං භාරො භාරමත්තො අහු මය්හං කුදචනං.

---

1. භාරධ – මජසං.
2. පමජ්ජාමි න – මජසං.
3. අධිගමා – මජසං. අධිගමනා – සයා.
4. ජාතවෙදසො – මජසං.
5. තවුපට්ඨචරො – මජසං. තවපට්ඨචරො – සයා.
6. පරිචාරිකො – මජසං.

3788. මහරජ, වෘද්ධාපචායන සංඛ්‍යාත ප්‍රවෙණි ධර්මයට දක්ෂ වූ යම් කෙනෙක් වෙද්ද, චාරිත්‍ර ශීලයෙන් ද යුක්ත වූ ඔව්හු දුගතියට නො යත්.

3789. රාජ්‍යභාරය උසුලන්නා වූ මහරජ, මාපියෝ ද සහෝදරයෝ ද සහෝදරියෝ ද ඥාති බන්ධූහු ද යන සියල්ලෝ ම වැඩිමහල්ලාහට භාර වෙති යි දැනගනුව.

3790. රථෛශ්වරය, මහත් වූ බරක් ගත් නැවියෙක් අභිමතස්ථානය කරා නිරුපද්‍රැත ව නැව ගෙනයාමට යම් සේ උත්සාහ කෙරේ ද එ මෙන් ම මම ජ්‍යෙෂ්ඨාපචායන ධර්මයෙහි අප්‍රමාද වෙමි. මම මුළු ලෝ වැස්සාට ම ජ්‍යෙෂ්ඨ ද වෙමි. එ බැවින් මම ම නන්ද සමඟ මාපියන් උවටැන්හි යෙදීමට සුදුසු වෙමි. (කියා සොණ පණ්ඩිත තෙමේ කීයේ ය.)

3791. වැසී තිබුණු ජෙට්ඨාපචායන ධර්මයෙහි දැනුම ලැබෙන පරිදි අපට කොසිය ගොත්‍රික තාපස තෙම ධර්මය ප්‍රකාශ කෙළේ ය. කඳු මුදුන්හි දල් වූ ගින්නෙකින් හාත්පස රූපයන් බැබැළී පෙනෙන්නාක් මෙනි.

3792. ප්‍රභාව උපදවමින් පෘථිවිය බබුළුවන්නා වූ සූර්‍ය්‍ය තෙම උදවෙමින් යහපත් වූත් අයහපත් වූත් රූපයන් සත්ත්වයනට යම් සේ ප්‍රකාශ කෙරෙයි ද, එ මෙන් ම කොසිය ගොත්‍රික තාපස තෙමේ අපට ධර්මය ප්‍රකාශ කෙළේ යයි රජ තෙම කී ය.

3793. මෙ සේ කමාව ඉල්ලන්නා වූ මාගේ ඇඳිලිබැඳීම ඔබ නො පිළිගන්නහු නම් ඔබ ම මාපියන් උවටැන් කරව. මම ඔබ හා එක් ව හැසිරෙන්නෙමි. වතාවත් කරන්නෙක් වන්නෙමි. දිවා රෑ දෙක්හි අනලස් ව ක්‍රියා කරන්නෙමි යි නන්ද පණ්ඩිත තෙමේ කී ය.

3794. නන්දය, සත්පුරුෂයන් විසින් දෙශනා කරන ලද සද්ධර්මය නුඹ එකාන්තයෙන් දන්නෙහිය. යහපත්වූ යහපත් හැසිරීම් ඇත්තෙක්වූ නුඹ මට අතිශයින් ප්‍රියය.

3795. පින්වත් පියාණන්ටත් පින්වත් මෑණියන්ටත් මෙ කරුණ කියමි. මගේ වචනය අසනු මැනවි මේ මවු පිය උපස්ථානය මට කිසි විටෙකත් ස්වල්පමාත්‍රවූ ද බරෙක් නොවේ ම ය.

3796. තං මං උපට්ඨිතං සන්තං මාතාපිතු සුඛාවහං,
නන්දො අජ්ඣාවරං කත්වා උපට්ඨානාය යාචති.

3797. යො වෙ ඉච්ඡති කාමෙන සන්තානං බ්‍රහ්මචාරිනං,
නන්දං වො වරථ එකො කං නන්දො උපතිට්ඨතු.

3798. තයා තාත අනුඤ්ඤාතා සොණ තං නිස්සිතා මයං,
උපඝායිතුං[1] ලභෙ නන්දං මුද්ධනි බ්‍රහ්මචාරිනං.

3799. අස්සත්ථස්සෙව තරුණං පවාළං මාලුතෙරිතං,
චිරස්සං නන්දං දිස්වාන හදයං මෙ පවෙධති.

3800. යදා සුත්තාපි සුපිනෙ[2] නන්දං පස්සාමි ආගතං,
උදග්ගා සුමනා හොමි නන්දො නො ආගතො අයං.

3801. යදා ච පටිබුජ්ඣිත්වා නන්දං පස්සාමි නාගතං,
භීයො[3] ආවිසතී සොකො දොමනස්සඤ්චනප්පකං.

3802. සාහං අජ්ජ චිරස්සම්පි නන්දං පස්සාමි ආගතං,
භත්තු ච මය්හඤ්ච පියො නන්දො නො පාවිසී ඝරං.

3803. පිතු ච[4] නන්දො සුප්පියො[5] යං නන්දො නප්පවසෙ ඝරා,[6]
ලභතු තාත නන්දො තං මං නන්දො උපතිට්ඨතු.

3804. අනුකම්පිකා[7] පතිට්ඨා ච පුබ්බෙ රසදදී ච නො,
මග්ගො සග්ගස්ස ලොකස්ස මාතා තං වරතෙ ඉසෙ.

3805. පුබ්බෙ රසදදී ගොත්ති මාතා පුඤ්ඤූපසංහිතා,
මග්ගො සග්ගස්ස ලොකස්ස මාතා තං වරතෙ ඉසෙ.

3806. ආකඞ්ඛමානා පුත්තඵලං දෙවතාය නමස්සති,
නක්ඛත්තානි ච පුච්ඡති උතුසංවච්ඡරානි ච.

3807. තස්සා උතුසිනාතාය හොති ගබ්භස්සාවක්කමො,[8]
තෙන දොහළිනී හොති සුහදා තෙන වුච්චති.

1. උපඝාතුං - මජසං, ස්‍යා.
2. සුප්පන්තෙන - මජසං, ස්‍යා.
3. භියො - මජස,
4. පිතුපි - වී, මජසං.
5. සුපියො - මජසං
6. ඝරං - මජසං, ස්‍යා.
7. අනුකම්පකා - මජසං, ස්‍යා.
8. වොක්කමො - වී, මජසං.

3796. මාපියන්හට සුව ගෙනදෙන පරිදි උපස්ථාන කළාවූ ඒ මා, නන්ද තෙම පැරැත්ත කොට උපස්ථානය කිරීම ඉල්ල යි.

3797. ශාන්ත වූ බ්‍රහ්මචාරී වූ තමුන්නාන්සේලා දෙදෙන අතුරෙන් යමෙක් කැමැති වේ ද, ඔහුගේ කැමැත්තෙන් නන්ද තෙමේ කවරකුට උපස්ථාන කෙරේදැයි නියම කරගනු මැනැවි යි සොණ පණ්ඩිත තෙම කීය.

3798. පුත්‍ර වූ සොණය, අපි තොප ඇසුරුකළෝ වෙමු. තොප විසින් අනුදන්නා ලද මම බ්‍රහ්මචාරීවූ නන්දයා මස්තකයෙහි සිඹින්නට ලබන්නෙමි යි මව කීවා ය.

3799. පවනින් කම්පිත වූ ඇසතු දල්ලක් මෙන් බොහෝ කලකින් නන්දයා දැක මගේ හෘදය කම්පා වෙයි.

3800. යම් කලෙක නිද්‍රොපගත වූ මම ආවා වූ නන්දයා සිහිනෙන් දකිම් ද, එකල්හි ඔදවැඩීගිය සතුටු සිත් ඇත්තියක් වෙම් ද, අපගේ ඒ මේ නන්ද තෙම මෙහි ආයේ ය.

3801. යම් කලෙක්හි පිබිද ආවාවූ නන්දයා නො ම දක්නෙම් ද එවිට බොහෝ සෙයින් ශොකය හටගනී. මහත් වූ දෙම්නසට ද පැමිණෙම්.

3802. ඒ මම අද බොහෝ කාලයකින් පැමිණියා වූ ද නන්දයා දකිමි. මගේ ස්වාමියාහට ද මට ද ප්‍රිය වූ අපගේ නන්දයා ගෙට පිවිසේවා.

3803. යම් හෙයෙකින් නන්දයා පියාට ද ඉතා ප්‍රියයෙක් වේ ද එහෙයින් නන්ද තෙමේ ගෙදරින් පිට නො වෙසේවා, පුත්‍ර සොණය, නන්දයා යමක් කැමතිවේ නම් එය ලබාවා. නුඹ පියාට උපස්ථාන කරව. නන්ද තෙමේ මට උපස්ථාන කෙරේවා.

3804. නන්ද සෘෂිවරය, පළමුකොට ම පිහිටවූ ද මොලොක් සිත් ඇත්තා වූ ද ලේ කිරි කොට දුන්නා වූ ද අපගේ මව් තොමෝ නුඹ කැමැති වෙයි. ඒ මවට උපස්ථාන කිරීම ස්වර්ගලොකයට මාර්ගය වෙයි.

3805. පෙර කිරි දුන්නාවූ ද මව් තොමෝ පින් රැස්කර දෙන්නී වෙයි. ඒ මවට උපස්ථාන කිරීම ස්වර්ගලොකයට මාර්ගය වන්නේය. නන්ද සෘෂිවරය, ඒ මව නුඹ කැමතිවන්නී ය.

3806. පුත්‍ර ඵලය බලාපොරොත්තු වන්නාවූ මව් තොමෝ දෙවියන් වඳියි. නැකැත්ද සෘතු හා අවුරුදු ද විචාරයි.

3807. ඔසප් ව ස්නානය කළා වූ ඇයට දරු ගැප් පිහිටීම වෙයි. ඒ ගැබින් ඕ තොමෝ දෙළදුක් ඇත්තී වෙයි. එවිට සෙනෙහස උපදී. එහෙයින් මවුතොමෝ සුහදයයි කියනු ලැබේ.

3808. සංවච්ඡරං වා ඌනං වා පරිහරිත්වා විජායති,
තෙන සා ජනයන්තීති ජනෙත්තී තෙන වුච්චති.

3809. ථනක්ඛීරෙන ගීතෙන අඞ්ගපාපුරණෙන ච,
රොදන්තං පුත්තං තොසෙති[1] තොසෙන්තී තෙන වුච්චති.

3810. තතො වාතාතපෙ ඝොරෙ මමං[2] කත්වා උදික්ඛති,
දාරකං අප්පජානන්තං[3] පොසෙන්තී තෙන වුච්චති.

3811. යඤ්ච මාතු ධනං හොති යඤ්ච හොති පිතුද්ධනං,
උභයම්පෙතස්ස ගොපෙති අපි පුත්තස්ස නො සියා
එවං පුත්ත අදුං පුත්ත ඉති මාතා විහඤ්ඤති.

3812. පමත්තං පරදාරෙසු නිසීථෙ[4] පත්තයොබ්බනෙ,
සායං පුත්තං අනායන්තං ඉති මාතා විහඤ්ඤති.

3813. එවං කිච්ඡා භතො පොසො මාතු අපරිචාරකො,
මාතරි මිච්ඡා චරිත්වාන නිරයං සො උපපජ්ජති.

3814. එවං කිච්ඡා භතො පොසො පිතු අපරිචාරකො,[5]
පිතරි මිච්ඡා චරිත්වාන නිරයං සො උපපජ්ජති.

3815. ධනාපි[6] ධනකාමානං නස්සති ඉති මෙ සුතං.
මාතරං අපරිචරිත්වාන කිච්ඡං වා සො නිගච්ඡති.

3816. ධනාපි ධනකාමානං නස්සති ඉති මෙ සුතං,
පිතරං අපරිචරිත්වාන කිච්ඡං වා සො නිගච්ඡති.

3817. ආනන්දො ච පමොදො ච සදා හසිතකීළිතං,
මාතරං පරිචරිත්වාන ලබ්භමෙතං[7] විජානතො.

---

1. තොසෙන්ති - වි. මජසං.
2. මඤ්ඤං - මජසං. මමිං - වි.
3. අප්පජානන්තං - වි. මජසං.
4. නිසීදෙ - මජසං. නිසීවෙ - සතා.
5. අපරිචාරිකො-මජසං
6. ධනංපි - මජසං. සතා.
7. ලබ්භතෙන - මජසං. සතා.

3808. අවුරුද්දක් හෝ ඊට අඩු කාලයක් හෝ ගැබ පරිහරණය කොට දරුවා වදයි. එහෙයින් ඕ තොමෝ දරුවන් වදනුයි ‘‘ජනෙත්‍ති’’ යි කියනු ලැබේ.

3809. තන කිරි දීමෙන් ද ගී කියා නැළවීමෙන් ද ශරීරාංශයට හොවාගෙන සුඛස්පර්ශය ඇතිකිරීමෙන් ද අඩන පුත්‍රයා තුටු කරයි. එහෙයින් මව ‘‘තොසෙනතී’’ යි කියනු ලැබේ.

3810. නැවත දරුණු වූ අව් සුළං ඇති කල්හි මමායනය කොට නොදන්නා වූ දරුවා බලයි. එහෙයින් ‘‘පොසෙනතී’’ යි කියනු ලැබේ.

3811. මවගේ යම් ධනයක් වෙයි ද පියාගේ යම් ධනයකුත් වේ ද ඒ දෙයාකාරවූ ම ධනය අපගේ පුත්‍රයාට මේ ධනය වන්නේ යයි මේ පුත්‍රයා සඳහා ආරක්‍ෂාකොට තබයි. පුත්‍රය මෙසේ පිළිගනුව, මෙසේ ක්‍රියා කරව, යනාදීන් කියමින් මව වෙහෙස වන්නීය.

3812. පුතු යොවුන් වියට පත් කල්හි පරදරාවන් කෙරෙහි ඇලුම්කොට ගෙදර නො එන්නාවූ පුත්‍රයා බලමින් වෙහෙස වෙයි.

3813. මෙසේ දුකසේ පොෂණය කරනලද පුරුෂයෙක් මවට උපස්ථාන නොකෙරේද, මව කෙරෙහි උපස්ථාන නොකිරීම් සංඛ්‍යාත මිථ්‍යාචයර්‍යයෙහි හැසිර හෙතෙමේ නිරයේ උපදී.

3814. මෙසේ දුකසේ පොෂණය කරනලද පුරුෂයෙක් පියාට උපස්ථාන නො කෙරේද, පියා කෙරෙහි උපස්ථාන නො කිරීම් සංඛ්‍යාත මිථ්‍යාචයර්‍යයෙහි හැසිර, හෙතෙමේ නිරයෙහි උපදී.

3815. මවට උපස්ථාන නොකොට ධන කැමැත්තවුන්හට, ලැබී තිබෙන ධනය පවා විනාශ වෙයි, හෙතෙමේ දුකට හෝ පැමිණෙයි කියා ද මා විසින් අසන ලදී.

3816. පියාට උපස්ථාන නොකොට ධන කැමැත්තවුන්හට ලැබී තිබෙන ධනය පවා වැනසේය යි ද හෙතෙමේ දුකට හෝ පැමිණේයයි ද මා විසින් අසන ලදී.

3817. සතුට ද ප්‍රමෝදය ද හැමකල්හි සිනාව හා ක්‍රීඩාව ද මවට උපස්ථාන කොට නුවණැත්තාහට ලැබිය හැකිය.

3818. ආනන්දො ච පමොදො ච සදා හසිතකීළිතං,
පිතරං පරිචරිත්වාන ලබ්භමෙතං විජානතො.

3819. දානඤ්ච පියවාචා ච අත්ථචරියා ච යා ඉධ,
සමානත්තතා ච ධම්මෙසු තත්ථ තත්ථ යථාරහං.

3820. එතෙ ඛො සඞ්ගහා ලොකෙ රථස්සාණීව යායතො,
එතෙ ච සඞ්ගහා නාස්සු න මාතා පුත්තකාරණා
ලභෙථ මානං පූජං වා පිතා වා පුත්තකාරණා.

3821. යස්මා ච සඞ්ගහා[1] එතෙ සමවෙක්ඛන්ති පණ්ඩිතා,
තස්මා මහත්තං පප්පොන්ති පාසංසා[2] ච භවන්ති තෙ.

3822. බ්‍රහ්මාති මාතාපිතරො පුබ්බාචරියාති වුච්චරෙ,
ආහුනෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා.

3823. තස්මා හි තෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ[3] පණ්ඩිතො,
අන්නෙන අථො පානෙන වත්ථෙන සයනෙන ච
උච්ඡාදනෙන නහාපනෙන පාදානං ධොවනෙන ච.

3824. තාය නං පාරිචරියාය මාතාපිතූසු පණ්ඩිතා,[4]
ඉධෙව[5] නං පසංසන්ති පෙච්ච සග්ගෙ පමොදතීති.

2. සොණනන්දජාතකං.

සත්තතිනිපාතො නිට්ඨිතො.

තස්සුද්දානං:

අථ සත්තතිමම්හි නිපාතවරෙ
ස භවං තු කුසාවති රාජවරො,
අථ සොණනන්දවරො ච පුන
අභිවාසිත සත්තතිමම්හි සුතෙති.

1. සඞ්සහෙ - මජසං.
2. පසංසා - වි. මජසං,
3. සක්කරෙය්‍යාච - මජසං.
4. පණ්ඩිතො - මජසං.
5. ඉධචෙව - වි.

3818. සතුට ද ප්‍රමෝදය ද හැමකල්හි සිනාව හා ක්‍රීඩාව ද පියාට උපස්ථාන කොට නුවණැත්තාට ලැබිය හැකිය.

3819. මේ ලොකයෙහි දනය ද ප්‍රියවචනය ද වැඩ සිදුකරදීම ද ජෙට්ඨාපචායන ධර්මයන් පුරමින් පිරිස් මැදදීත්, රහසිගතවත් හැමතන්හිදී ම වැදීමාදී ක්‍රියා සමව කිරීමයයි කියනු ලබන සමාංනාත්මතාවත් වේද,

3820. ලෙව්හි මේ සංග්‍රහයෝ වනාහි යන්නාවූ රියට කඩ ඇණය මෙන් වෙති. ඉදින් මේ සංග්‍රහයෝ නොවන්නාහු නම් පුත්‍රයකු වීම පමණින් මව බුහුමනක් හෝ පූජාවක් හෝ නො ලබන්නීය. පුත්‍රයකු වීම පමණින් පියා ද බුහුමනක් හෝ පූජාවක් හෝ නො ලබන්නේ ය.

3821. යම් හෙයකින් නුවණැත්තෝ මේ සංග්‍රහයන් මනා කොට දනිද්ද, එහෙයින් ශ්‍රෙෂ්ඨබවට පැමිණෙති. ඔව්හු ප්‍රශංසා කටයුත්තෝ ද වෙති.

3822. පුත්‍ර ප්‍රජාවට අනුකම්පා කරන්නා වූ මවුපියෝ වනාහි බ්‍රහ්මසමයහ, පූර්වාචාර්‍ය්‍යහ, ආහුනෙය්‍යහ යි කියනු ලැබෙත්.

3823. එහෙයින් නුවණැත්තේ ඔවුන් වඳින්නේය. නැවත ආහාර දීමෙන් ද පානවර්ග දීමෙන් ද වස්ත්‍ර දීමෙන් ද සයනාසන දීමෙන් ද ඇඟ ඉලීමෙන් ද නැවීමෙන් ද පා සේදීමෙන් ද සත්කාර කරන්නේ ය.

3824. මාපියන් කෙරෙහි ඒ උපස්ථාන කිරීම නිසා නුවණැත්තෝ මෙලොවදී ම ඔහුට පසසත්. පරලෙව්හිදී හෙතෙමේ ස්වර්ග ලොකයෙහි ඉපිද සතුටුවේය යි සොණ පණ්ඩිත තෙම ධර්ම දෙශනා කෙළේ ය.

සොණනන්ද ජාතක යි.

සත්තති නිපාතය නිමියේ ය.

එහි උද්දනය:

සත්තති නිපාතයෙහි කුසජාතක යැ සොණනන්‍ද ජාතකයැයි ජාතක දෙකෙකි.

අසීතිනිපාතො

1. චූලහංසජාතකං

3825. සුමුඛ අනුපචිනන්තා පක්කමන්ති විහඞ්ගමා,
ගච්ඡ තුවම්පි මා කඞ්ඛි නත්ථි බද්ධෙ[1] සහායතා.

3826. ගච්ඡෙ වාහං න වා ගච්ඡෙ න තෙන අමරො සියං,
සුඛිතං තං උපාසිත්වා දුක්ඛිතං තං කථං ජහෙ.

3827. මරණං වා තයා සද්ධිං ජීවිතං වා තයා විනා,
තදෙව මරණං සෙය්‍යො යඤ්චෙ ජීවෙ තයා විනා.*

3828. නෙස ධම්මො මහාරාජ යං තං එවං ගතං[2] ජහෙ,
යා ගති තුය්හං සා මය්හං රුච්චතෙ විහගාධිප.[3]

3829. කා නු පාසෙන බද්ධස්ස[4] ගති අඤ්ඤා මහානසා,
සා කථං චෙතයානස්ස මුත්තස්ස තව රුච්චති.

3830. කං වා ත්වං පස්සසෙ අත්ථං මම තුය්හඤ්ච පක්ඛිම,
ඤාතීනං වාවසිට්ඨානං උභින්නං ජීවිතක්ඛයෙ.

3831. යං නු කඤ්චනදෙපිඤ්ඡ[5] අන්ධෙන තමසා ගතං,
තාදිසෙ සඤ්චජං පාණං කමත්ථමභිජොතයෙ.

3832. කථන්නු පතතං සෙට්ඨ ධම්මෙ අත්ථං න බුජ්ඣසෙ,
ධම්මො අපචිතො සන්තො අත්ථං දස්සෙති පාණිනං.

3833. සොහං ධම්මං අපෙක්ඛමානො ධම්මා චත්ථං සමුට්ඨිතං,
භත්තිඤ්ච තයි සම්පස්සං නාවකඞ්ඛාමි ජීවිතං.

3834. අද්ධා එසො සතං ධම්මො යො මිත්තො මිත්තමාපදෙ,
නච්චජෙ ජීවිතස්සාපි හෙතු ධම්මං අනුස්සරං.

3835. ස්වායං ධම්මො ච තෙ චිණ්ණො භත්ති ච විදිතා මයි,
කාමං කරස්සු මය්හෙතං ගච්ඡෙවානුමතො මයා.

1. නත්ථි බන්ධෙ – මජසං.
2. කතං – මජසං.
3. විහඞ්ගාධිප – මජසං.
4. බන්ධස්ස – මජසං.
5. වෙපිඤ්ඡ – මජසං.
* අයං ගාථා පාදෙ මරම්මපොත්ථකෙසු න දිස්සති.

අසීති නිපාතය

1. චුල්ලහංස ජාතකය

3825. සුමුඛය, ස්නෙහවශයෙන් නො බලන්නා වූ හංසයෝ බැහැර යෙති. තෝ ද යව, බලාපොරොත්තු නො වව. පාසයෙහි බැඳුණු නෑනැත්තා කෙරෙහි යහළු බවෙක් නැතැ යි හංසරාජ තෙම කීයේ ය.

3826. හංසරාජය, මම යන්නෙම් හෝ වේවා නො යන්නෙම් හෝ වේවා. එයින් නොමැරෙන්නෙක් නො වෙමි. සුවපත් වූ ඔබ ඇසුරු කොට දුකට පැමිණියා වූ ඔබ කෙසේ හැරදමා යන්නෙම් ද?

3827. මෙහි ඔබ සමග මරණය හෝ ඔබගෙන් වෙන් ව ජීවත්වීම හෝ වන්නේ ය. ඉදින් යම් ලෙසෙකින් ඔබගෙන් වෙන් ව ජීවත්වන්නේ නම් එයට වඩා මරණය උතුම්.

3828. මහරජ, මෙසේ විපතට පත් වූ ඔබ අත්හැරීම ය යන යමක් ඇද්ද එය සත්පුරුෂ ධර්මයෙක් නො වේ. පක්ෂිරාජය, ඔබට යම් දෙයක් වේ නම් එය මට ද රුචි ය.

3829. සුමුඛය, පාසයෙන් බැඳුණහුට මුළුනැන්ගෙය හැර අන් කවර ගතියෙක් ද? සිතියහැකි නුවණැත්තා වූ පාස විරහිත තට එය කෙසේ නම් රුචි වේ ද?

3830. පියාපත් ඇති සුමුඛය, මාගේ ද තොපගේ ද යන දෙදෙනාගේ ජීවිත විනාශය ඇති කල්හි අප දෙදෙනාට හෝ සෙසු නෑයන්ට හෝ කවර නම් යහපතක් හෝ දක්නෙහි ද?

3831. රන්වන් පියාපත් දෙක ඇති සුමුඛය, අන්ධයකු විසින් අඳුරෙහි කරනලද්දක් මෙන් ඔබ විසින් යම් ප්‍රාණත්‍යාගයෙක් කරන ලද්දේ ද, එහි ලා ඔබ කිනම් ප්‍රයොජනයක් දක්නහු ද?

3832. පක්ෂිරාජය, කෙසේ නම් ධර්මයෙහි අර්ථය නො දන්නෙහි ද, ධර්මය තෙම පුදනලද්දේ ම සත්වයනට දියුණුව පෙන්වයි.

3833. ඒ මම ධර්මය ද ධර්මයෙන් සිදුවන යහපත ද දක්නෙමි. ඔබ කෙරෙහි භක්තිය දකිමින් ජීවිතය බලාපොරොත්තු නො වෙමි.

3834. යම් මිත්‍රයෙක් ධර්මය සිහි කරමින් ජීවිතය හෙතුකොට ගෙන ද විපතේ දී මිත්‍රයා නො හරී නම් එකාන්තයෙන් ම එය සත්පුරුෂ ධර්මයෙකි.

3835. ඒ මේ සත්පුරුෂධර්මය ද නුඹ විසින් පුරුදු කරන ලදී, මා කෙරෙහි භක්තිය ද ප්‍රකට කරනලදී. මළපුඩුවෙහි බැඳුණු මට මේ වැද්ද කැමැත්තක් කෙරේවා, නුඹ මා විසින් අනුදන්නාලද්දේ යව.

3836. අපි ත්වෙවං ගතෙ කාලෙ යං බද්ධං ඤාතිනං මයා,
තයා තං බුද්ධිසම්පන්න අස්ස පරමසංවුතං.

3837. ඉච්චෙවං මන්තයන්තානං අරියානං අරියවුත්තිනං,
පච්චදිස්සථ නෙසාදො ආතුරානමිවන්තකො.

3838. තෙ සත්තුං අභිසංචික්ඛ දීඝරත්තං හිතා දිජා,
තුණ්හීමාසිත්ථ උභයො න ච සඤ්චලුමාසනා.

3839. ධතරට්ඨෙ ච දිස්වාන සමුඩ්ඩෙන්තෙ තතො තතො,
අභික්කමථ වෙගෙන දිජසත්තු දිජාධිපෙ.

3840. සො ච වෙගෙනභික්කම්ම ආසජ්ජ පරමෙ දිජෙ,
පච්චකම්පිත්ථ නෙසාදො බද්ධා ඉති විචින්තයං.

3841. එකඤ්ච බද්ධමාසීනං අබද්ධඤ්ච පුනාපරං,
ආසජ්ජ බද්ධමාසීනං පෙක්ඛමානමදීනවං.

3842. තතො සො විමතො යෙව පණ්ඩරෙ අජ්ඣභාසථ,
පවද්ධකායෙ ආසීනෙ දිජසඞ්ඝගණාධිපෙ.

3843. යන්නු පාසෙන මහතා බද්ධො න කුරුතෙ දිසං,
අථ කස්මා අබද්ධො ත්වං බලී පක්ඛී න ගච්ඡසි.

3844. කින්නු තායං දිජො හොති මුත්තො බද්ධං උපාසසි,
ඔහාය සකුණා යන්ති කිං එකො අවහීයසි.

3845. රාජා මෙ සො දිජාමිත්ත සඛා පාණසමො ච මෙ,
නෙව නං විජහිස්සාමි යාව කාලස්ස පරියායං.

3846. කථං පනායං විහඞ්ගො නාද්දසා පාසමොඩ්ඩිතං,
පදං හෙතං මහන්තානං බොද්ධුමරහන්ති ආපදං.

3847. යදා පරාභවො හොති පොසො ජීවිතසඞ්ඛයෙ,
අථ ජාලඤ්ච පාසඤ්ච ආසජ්ජාපි න බුජ්ඣති.

3848. අපි ත්වෙව මහාපඤ්ඤ පාසා බහුවිධා තතා,
ගූළ්හමාසජ්ජ බජ්ඣන්ති අථෙවං ජීවිතක්ඛයෙ.

3836. තවද මෙසේ පාසයෙහි බැඳී කල්ගිය කල්හි ඤාතීන් උදෙසා මා විසින් කිරීමට බැඳී පවත්නා යම් යුතුකමෙක් වේ ද, සුලක්ෂණවන්තය එය නුඹ විසින් පිරිමැසිය හැකි වන්නේ ය.

3837. ආයතී පැවතුම් ඇති උතුම් වූ හංසයන් දෙදෙනා මෙසේ කථා කරමින් සිටිය දී ම ගිලනුන්ට මාරයා මෙන් වැද්ද පෙනුණේ ය.

3838. බොහෝ කලක් හිතවත් වූ ඒ පක්ෂීන් දෙදෙනා සතුරු වැද්ද දැක නිශ්ශබ්ද වූහ. අසුනෙන් නො සෙල්වුණාහ.

3839. පක්ෂීන්ට සතුරු වූ වැදි තෙම මරණ භයින් ඒ මේ අත උඩට පනින හංසයන් දැක ඔවුන් වෙත වේගයෙන් ළංවිය.

3840. ඒ වැදි තෙම වේගයෙන් පැමිණ ඒ උතුම් පක්ෂිරාජයන් වෙත එළඹ බැඳුණාහු ය යි, සිතමින් කම්පිත විය.

3841. මළපුඩුවෙහි බැඳී හුන්නා වූ එකකු ද නැවත නො බැඳී ආදීනව බලමින් බැඳුණාහු සමීපයෙහි හුන් අනෙකකු ද දැක්කේ ය.

3842. එහෙයින් හෙතෙම භයගත් විමති ඇත්තේ ම පක්ෂි සමූහයාට අධිපති වූ හොඳින් වැඩුණු සිරුරු ඇති එක්ව හුන්නා වූ ඒ ශ්වෙතහංසයන් දෙදෙනාට මෙසේ කී ය.

3843. මෙතෙම යම් හෙයෙකින් මහත් වූ පුඩුවෙහි බැඳුණේ වේ ද එහෙයින් දිශාවකට පලායෑම නො කෙරෙයි. එහෙත් බලවත් පියාපත් ඇති නො බැඳුණු තෝ කුමක් නිසා නො යන්නෙහි දැ යි ඇසී ය.

3844. මිදුණා වූ තෝ බැඳුණා වූ මොහු සමීපයෙහි හිඳින්නෙහි ය. තට මේ පක්ෂියා කවරෙක් ද? අනික් පක්ෂීහු මොහු හැර යත්. තනි නුඹ පමණක් කුමක් නිසා නො යන්නෙහි ද?

3845. පක්ෂීන්ගේ සතුරු වූ වැදි පුත්‍රය, මෙතෙමේ මාගේ රජ ය. ප්‍රාණසම යහළුවා ය. මරණය පැමිණෙන තුරු මම මොහු අත් නො හරින්නෙමි.

3846. මේ පක්ෂිරාජ තෙම අටවනලද මළපුඩුව කෙසේ නම් නො දැක්කේ ද? උසස් බවට පත්වූවන් විසින් විපත්ති දැනීම නම් වූ කාරණය දැනගන්නට වටනේ ය.

3847. යම් කාලෙක්හි පිරිහීමෙක් වේ ද, ජීවිත විනාශය පැමිණියා වූ ඒ කාලයෙහි පුරුෂ තෙමේ දැලට ද මළපුඩුවට ද ළංව සිටියත් නො දැනගනී.

3848. මහාප්‍රාඥය, යළි එක් කරුණක් ඇත. අටවනලද්ද වූ මළපුඩු බොහෝ වෙති. එසේ ද වුවත් මෙසේ ජීවිත විනාශය පැමිණි කල්හි සැඟවුණු මළපුඩුවට පැමිණ බැඳෙත් යයි වැද්ද කියේ ය.

3849. අපි නායං තයා සද්ධිං සම්භාසස්ස සුබුද්ධයො,
අපි නො අනුමඤ්ඤාසි අපි නො ජීවිතං දදෙ.

3850. න චෙව මෙ ත්වං බද්ධොසි නපි ඉච්ඡාමි තෙ වධං,
කාමං ඛිප්පමිතො ගන්ත්වා ජීව ත්වං අනිඝො චිරං.

3851. න වාහමෙතං[1] ඉච්ඡාමි අඤ්ඤත්‍රෙතස්ස ජීවිතා,
සචෙ එකෙන තුට්ඨොසි මුඤ්චෙතං මඤ්ච භක්ඛය.

3852. ආරොහපරිණාහෙන තුල්‍යස්මා වයසා උභො,
න තෙ ලාභෙන ජීනත්ථි[2] එතෙන නිම්මිනා තුවං.

3853. තදිඞ්ඝ සමවෙක්ඛස්සු හොතු ගිද්ධි තවාස්මසු,
මං පුබ්බෙ බන්ධ පාසෙන පච්ඡා මුඤ්ච දිජාධිපං.

3854. තාවදෙව ච තෙ ලාභො කතස්ස යාචනාය ච,
මිත්ති ච ධතරට්ඨෙහි යාවජීවාය තෙ සියා.

3855. පස්සන්තු නො මහාසඞ්ඝා තයා මුත්තං ඉතො ගතං,
මිත්තාමච්චා ච භච්චා ච පුත්තදාරා ච බන්ධවා.

3856. න ච තෙ තාදිසා මිත්තා බහුන්නං[3] ඉධ විජ්ජති,
යථා ත්වං ධතරට්ඨස්ස පාණසාධාරණො සඛා.

3857. සො තෙ සහායං මුඤ්චාමි හොතු රාජා තවානුගො,
කාමං ඛිප්පමිතො ගන්ත්වා ඤාතිමජ්ඣෙ විරොචථ.

3858. සො පතීතො පමුත්තෙන භත්තුනා භත්තුගාරවො,
අජ්ඣභාසථ වක්කඞ්ගො වාචං කණ්ණසුඛං භණං.

3859. එවං ලුද්දක නන්දස්සු සහ සබ්බෙහි ඤාතිභි,
යථාහමජ්ජ නන්දාමි මුත්තං දිස්වා දිජාධිපං.

3860. එහි තං අනුසික්ඛාමි යථා තුවම්පි ලච්ඡසෙ,
ලාභං යථායං[4] ධතරට්ඨො පාපං කිඤ්චි න දක්ඛති.

3861. ඛිප්පමන්තෙපුරං නෙත්වා[5] රඤ්ඤො දස්සෙහි නො උභො,
අබද්ධෙ පකතිභූතෙ කාජෙ උභයතො ඨිතෙ.

---

1. නෙවාහං – මජසං.
2. ජීවත්ථි – මජසං
3. බහූනං – මජසං.
4. තථායං – මජසං. සයා.
5. ගන්ත්වා – මජසං. සයා.

3849. වැද්දුණෙනි, නුඹ සමග වූ මේ සම්භාෂණය සැපවූ විපාක ඇත්තක් වන්නේ නම් අපට යෑමට අවසර දෙන්නෙහි ය. අපගේ ජීවිතය ද දෙන්නෙහි යයි සුමුඛ තෙම කීයේ ය.

3850. නුඹ මා විසින් නො බඳනා ලද්දෙහි ය. තොපගේ වධය ද මම නො කැමැත්තෙමි. මෙයින් නික්ම කැමැති තැනකට වහා ගොස් බොහෝ කලක් නිරුපද්‍රැත ව ජීවත් වව යි වැද්ද කීයේ ය.

3851. මොහුගේ ජීවිතයෙන් වෙන් ව මම ජීවත්වීම නො කැමැත්තෙමි. ඉදින් නුඹ එකකුගෙන් තුටුවෙහි නම් මොහු මුදවා මා කව.

3852. අපි දෙදෙන උස මහතින් ද වයසින් ද සම වෙමු. මේ මාරුකිරීමෙන් නුඹට ලාභයෙන් අඩුවක් නැත්තේ ය.

3853. එහෙයින් සලකාබලව, අප කෙරෙහි තොපගේ ආසාවක් වේ නම් පළමු ව මා පාසයෙන් බඳුව. පසුව පක්ෂි රාජයා මුදලව.

3854. එපමණෙකින් ම තොපට ලාභය ද වන්නේ ය. මාගේ ඉල්ලීම ද කරන ලද්දේ වෙයි. හංසයන් සමග දිවි ඇති තාක් මෛත්‍රිය ද තට වන්නේ ය යි සුමුඛ තෙම කී ය.

3855. පක්ෂිරාජය, (තොපගේ ඇවිටිල්ල නිසා මුදන ලද බැවින්) තා විසින් මුදනලද්ද වූ මෙතැනින් ගිය මේ පක්ෂියා මිත්‍රාමාත්‍යයෝ ද ස්වාමීහු ද අඹු දරුවෝ ද නෑයෝ ද යන මහත් සමූහයා දකිත්වා.

3856. යම්සේ නුඹ ධෘතරාෂ්ට්‍ර නම් පක්ෂි රාජයාහට ප්‍රාණය හා සම යහළුවා වෙහි ද, එබඳු යහළුවෝ බොහෝ දෙනකුන්ට නැත.

3857. ඒ ඔබගේ යහළුවා මුදමි. ඒ පක්ෂිරාජ තෙම ඔබ අනුව යන්නෙක් වේවා. වහා ම මෙයින් ගොස් නෑ සමූහයා මැද රැචි පරිදි බබළව යි වැද්ද කී ය.

3858. මුදනලද ස්වාමියා කරණකොටගෙන ප්‍රමුදිත වූ ස්වාමි ගෞරවය ඇති ඒ සුමුඛ නම් හංස තෙම කනට සුව එළවන්නා වූ වචන කියමින් මෙසේ ප්‍රකාශ කෙළේ ය.

3859. මුදනලද හංසරාජයා දැක මම අද යම්සේ සතුටු වෙම ද, වැදි පුත්‍රය, ඔබ ද සියලු නෑයන් සමග එසේ ම තුටු වව.

3860. නුඹ යම්සේ ධනය ලබන්නෙහි ද, මේ හංසරාජ තෙමේත් කිසියම් නපුරක් නො දක්නේ ද, එලෙස මම තට අනුශාසනා කරමි. මා සමග එව.

3861. නොබැඳි ප්‍රකෘති ස්වභාවයෙන් කද දෙකෙළවර සිටි අප දෙදෙන වහා අන්තඃපුරයට ගෙන ගොස් රජුට පෙන්වව.

3862. ධතරට්ඨා මහාරාජ හංසාධිපතිනො ඉමෙ,
අයං හි රාජා හංසානං අයං සෙනාපතීතරො.

3863. අසංසයං ඉමං දිස්වා හංසරාජං නරාධිපො,
පතීතො සුමනො චිත්තො බහුං දස්සති තෙ ධනං.

3864. තස්ස තං වචනං සුත්වා කම්මිනා[1] උපපාදයි,
ඛිප්පමන්තෙපුරං ගන්ත්වා රඤ්ඤො හංසෙ අදස්සයි.
අබද්ධෙ පකතිභූතෙ කාජෙ උභයතො ඨිතෙ.

3865. ධතරට්ඨා මහාරාජ හංසාධිපතිනො ඉමෙ,
අයං හි රාජා හංසානං අයං සෙනාපතීතරො.

3866. කථං පනිමෙ විහගා[2] තව හත්ථත්තමාගතා,
කථං ලුද්දො මහන්තානං ඉස්සරෙමිධමජ්ඣගා.

3867. විහිතා සන්ති මෙ පාසා පල්ලලෙසු ජනාධිප,
යං යදායතනං මඤ්ඤෙ දිජානං පාණරොධනං.

3868. තාදිසං පාසමාසජ්ජ හංසරාජා අබජ්ඣථ,
තං අබද්ධො උපාසීනො මමායං අජ්ඣභාසථ.

3869. සුදුක්කරං අනරියෙහි දහතෙ භාවමුත්තමං,
භත්තුරත්ථෙ පරක්කන්තො ධම්මෙ යුත්තො විහඞ්ගමො.

3870. අත්තනායං චජිත්වාන ජීවිතං ජීවිතාරහො,
අනුත්ථුනන්තො ආසීනො භත්තු යාචිත්ථ ජීවිතං.

3871. තස්ස තං වචනං සුත්වා පසාදමහමජ්ඣගං,
තතො නං පාමුචිං පාසා අනුඤ්ඤාසිං සුඛෙන ච.

3872. සො පතීතො පමුත්තෙන භත්තුනා භත්තුගාරවො,
අජ්ඣභාසථ වක්කඞ්ගො වාචං කණ්ණසුඛං භණං.

1. කම්මුනා – මජසං., සයා.
2. විහඞ්ග – මජසං., සයා.

3862. මහරජ, මොහු වනාහි ධෘතරාෂ්ට්‍ර නම් වූ හංසයන්ගේ අධිපතිහු වෙති. මෙතෙමේ හංසයන්ගේ රජ ය. අනෙක් තැනැත්තා හංස සෙනාපති වෙයි.

3863. රජ තෙමේ මේ හංස රාජයා දැක ප්‍රීතිමත් යහපත් සිතැත්තෙක් ව සතුටු වූයේ නිසැක ව ම නුඹට බොහෝ ධනය දෙන්නේ ය කියා සුමුඛ නම් හංසයා කීයේ ය.

3864. ඔහුගේ ඒ වචනය අසා වැදි තෙම කායකර්මයෙන් එය සම්පාදනය කෙළේ ය. නොබැඳි ප්‍රකෘති ස්වභාවයෙන් කද දෙකෙළවර සිටි හංසයන් දෙදෙන වහා අන්තඃපුරයට ගෙන ගොස් රජුට පෙන්වී ය.

3865. මහරජ, මොහු වනාහි ධතරට්ඨ නම් වූ හංසයන්ගේ අධිපතිහු වෙති. මෙතෙමේ හංසයන්ගේ රජ ය. අන්‍යයා හංස සෙනාපති ය.

3866. මේ පක්ෂීහු කෙසේ නම් තොපගේ අතට පත්වූහු ද? වැදි තෙම කෙසේ නම් මහත්බවට පත් මේ හංසයන්ගේ අයිති-කරුවා වී ද?

3867. මහරජ, පක්ෂීන්ගේ ජීවිත විනාශය සිදු කරන්නා වූ යම් යම් තැන් තිබේ නම් ඒ ඒ තැන්වල පිහිටි මඩ වගුරුවල මා විසින් මළ පුඩු යොදනලදී.

3868. හංසරාජ තෙම ළංවැ එබඳු මළ පුඩුවෙක බැඳුණේ ය. නොබැඳුණු මේ සේනාපති හංස තෙමේ ඒ බැඳුණු හංසයා සමීපයෙහි වූයේ මට මෙසේ කී ය.

3869. ස්වාමියාගේ යහපත පිණිස උත්සාහ කරන්නා වූ ධර්මයෙහි යෙදුණා වූ පක්ෂි තෙම අප වැනි අනාර්‍යයන් විසින් නො කටහැකි වූ තමන්ගේ උතුම් අදහස ප්‍රකාශ කෙළේ ය.

3870. ජීවත්වීමට සුදුසු වූ මේ හංස තෙම තම දිවි හැරපියා ස්වාමියාගේ ගුණ වණමින් ළඟ හිඳගෙන ස්වාමියාගේ ජීවිතය මගෙන් ඉල්ලී ය.

3871. ඔහුගේ ඒ වචනය අසා මම ප්‍රසාදයට පැමිණියෙමි. එහෙයින් ඔහු මළපුඩුවෙන් මිදුවෙමි. ඥාතීන් සමග සුවසේ වසන්නට අනුදත්තෙමි.

3872. මුදනලද ස්වාමියා කරණකොටගෙන ප්‍රමුදිත වූ ස්වාමි ගෞරවය ඇති ඒ සුමුඛ නම් හංස තෙම කනට සුව එළවන වචන කියමින් මෙසේ ප්‍රකාශ කෙළේ ය.

3873. එවං ලුද්දක නන්දස්සු සහ සබ්බෙහි ඤාතිභි,
යථාහමජ්ජ නන්දාමි මුත්තං දිස්වා දිජාධිපං.

3874. එහි තං අනුසික්ඛාමි යථා ත්වමපි ලච්ඡසෙ,
ලාභං යථායං ධතරට්ඨො පාපං කිඤ්චි නදක්ඛති.[1]

3875. ඛිප්පමන්තෙපුරං ගන්ත්වා රඤ්ඤො දස්සෙහි නො උභො,
අබද්ධෙ පකතිභූතෙ කාජෙ උභයතො ඨිතෙ.

3876. ධතරට්ඨා මහාරාජ හංසාධිපතිනො ඉමෙ,
අයං හි රාජා හංසානං අයං සෙනාපතීතරො.

3877. අසංසයං ඉමං දිස්වා හංසරාජං නරාධිපො,
පතීතො සුමනො විත්තො බහුං දස්සති තෙ ධනං.

3878. එවමෙතස්ස වචනා ආනීතාමෙ උභො මයා,
එත්ථෙව හි ඉමෙ අස්සු උභො අනුමතා මයා.

3879. සොයං එවං ගතො පක්ඛී දිජො පරමධම්මිකො,
මාදිසස්ස හි ලුද්දස්ස ජනයෙය්‍යාථ මද්දවං.

3880. උපායනං හි[2] තෙ දෙව නාඤ්ඤං පස්සාමි එදිසං,
සබ්බසාකුණිකගාමෙ තං පස්ස මනුජාධිප.

3881. දිස්වා නිසින්නං රාජානං පීඨෙ සොවණ්ණයෙ සුභෙ,
අජ්ඣභාසථ වක්කඞ්ගො වාචං කණ්ණසුඛං භණං.

3882. කච්චි නු භොතො කුසලං කච්චි භොතො අනාමයං,
කච්චි රට්ඨමිදං ඵීතං ධම්මෙන මනුසිස්සසි.[3]

3883. කුසලඤ්චෙව මෙ හංස අථො හංස අනාමයං,
අථො රට්ඨමිදං ඵීතං ධම්මෙන මනුසිස්සසි.

3884. කච්චි භොතො අමච්චෙසු දොසො කොචි න විජ්ජති,
කච්චිනු තෙ තවත්ථෙසු නාවකඞ්ඛන්ති ජීවිතං.

3885. අථොපි මෙ අමච්චෙසු දොසො කොචි න විජ්ජති,
අථොපි තෙ මමත්ථෙසු නාවකඞ්ඛන්ති ජීවිතං.

---

1. නදක්ඛසි - මජ්සං.
2. ච - මජ්සං.
3. මනුසාසති - මජ්සං. ස්‍යා.

3873. මුදනලද හංසරාජයා දැක මම අද යම්සේ තුටු වෙමි ද, වැදිපුත්‍රය, ඔබ සියලු නෑයන් සමග එසේ තුටු වව.

3874. නුඹ යම්සේ ධනය ලබන්නෙහි ද, මේ හංසරාජ තෙමේත් කිසියම් නපුරක් නොදක්නේ ද, එලෙස මම තට අනුශාසනා කරමි. මා සමග එව.

3875. නොබැඳි ප්‍රකෘති ස්වභාවයෙන් කද දෙකොළවර සිටි අප දෙදෙන වහා අන්තඃපුරයට ගෙනගොස් රජුට පෙන්වව.

3876. මහරජ, මොහු වනාහි ධතරට්ඨ නම් වූ හංසයන්ගේ අධිපතිහු වෙති. මේ හංසයන්ගේ රජ ය. අනෙක් තැනැත්තා නම් හංස සෙනාපති ය.

3877. මහරජ තෙමේ මේ හංස රාජයා දැක ප්‍රීතිමත් යහපත් සිතැති ව සතුටු වූයේ නිසැක ව ම නුඹට බොහෝ ධනය දෙන්නේ ය. කියා මේ සුමුඛ හංසයා කීයේ ය.

3878. මෙසේ මොහුගේ වචනයෙන් මේ දෙදෙන මා විසින් ගෙන එන ලද්දහු වෙති. මේ මානස නම් විලෙහිදී ම මොහු දෙදෙනා චිත්‍රකූට පර්වතයට යනු පිණිස මා විසින් අනුදන්නා ලද්දහ.

3879. මෙසේ සතුරන් අතට පත් පරම ධාර්මික වූ ද්විජ නම් වූ ඒ මේ පක්ෂී තෙම මා වැනි වැද්දකුගේ පවා මෛත්‍රිය පහළ කෙළේ ය.

3880. දේවයන් වහන්ස, මේ වනාහි ඔබ වහන්සේට ගෙනෙන ලද තුටුපඬුරෙකි. මුළු වැදිගමෙහි මෙබඳු අනෙක් පඬුරක් නො දකිමි. නරශ්‍රෙෂ්ඨ වූ මහරජ එය බලනු මැනවි.

3881. හංසරාජ තෙම රන්මුවා යහපත් පුටුවෙහි හුන් ඒ සකුල නම් රජු දැක කනට සුව එළවන්නා වූ බස් බෙණෙමින් මෙසේත් කී ය.

3882. පින්වත් රජුට යහපත් ද? පින්වතාට ආරොග්‍යය තිබේ ද? කිම, සමෘද්ධ වූ මේ රට දැහැමින් අනුශාසනා කරන්නෙහි ද?

3883. හංස රාජය, මට යහපති. යළි මට ආරොග්‍යය ද තිබේ. තවද, සමෘද්ධ වූ මේ රට මා විසින් දැහැමින් අනුශාසනා කරනු ලැබේ ය යි රජ තෙමේ කී ය.

3884. කිම, පින්වතුන්ගේ ඇමතියන් අතර කිසියම් දෝෂයක් නැද්ද? කිම, ඔවුහු ඔබගේ යුද්ධාදි කාර්‍ය්‍යයන්හි දිවි නොතකා ක්‍රියා කෙරෙද්ද?

3885. මාගේ ඇමතියන් අතර කිසියම් දෝෂයක් නැත. වැළි ඔවුහු මාගේ යුද්ධාදි කාර්‍ය්‍යයන්හි දිවි නොතකා ක්‍රියා කෙරෙති.

3886. කච්චි තෙ සාදිසී භරියා අස්සවා පියභාණිනී,
පුත්තරූපයසූපෙතා තව ඡන්දවසානුගා.

3887. අථො මෙ සාදිසී භරියා අස්සවා පියභාණිනී,
පුත්තරූපයසූපෙතා මම ඡන්දවසානුගා.

3888. භවං තු කච්චි නු මහාසත්තුහත්ථත්තතං ගතො,
දුක්ඛමාපජ්ජි විපුලං තස්මිං පඨමමාපදෙ.

3889. කච්චියං[1] නාපතිත්වාන දණ්ඩෙන සමපොථයි,
එවමෙතෙසං ජම්මානං පාකතිකං භවති තාවදෙ.

3890. ඛෙමමාසි මහාරාජ එවමාපදි[2] සංසති,
න චායං කිඤ්චි රස්මාසු සත්තූව සමපජ්ජථ[3].

3891. පච්චගමිත්ථ නෙසාදො පුබ්බෙව අජ්ඣභාසථ,
තදායං සුමුඛොයෙව පණ්ඩිතො පච්චභාසථ[4].

3892. තස්ස තං වචනං සුත්වා පසාදමයමජ්ඣගා,
තතො මං පාමුඤ්චි පාසා අනුඤ්ඤාසි සුඛෙන ච,

3893. ඉදඤ්ච සුමුඛෙනෙව එතදත්ථාය චින්තිතං,
භොතො සකාසෙ ආගමනං එතස්ස ධනමිච්ඡතා.

3894. ස්වාගතඤ්චෙවිදං භවතං පතීතො චස්මි දස්සනා,
එසො අපි බහුං විත්තං ලභතං යාවතිච්ඡති.

3895. සන්තප්පයිත්වා නෙසාදං භොගෙහි මනුජාධිපො,
අජ්ඣභාසථ වක්කඞ්ගං[5] වාචං කණ්ණසුඛං භණං

3896. යං ඛලු ධම්මමධීනං[6] වසො වත්තති කිඤ්චනං,
සබ්බත්ථිස්සරියං[7] භවතං පසාසථ[8] යදිච්ඡථ.

3897. දානත්ථං උපභොත්තුං වා යඤ්චඤ්ඤං උපකප්පති,
එතං දදාමි වො විත්තං ඉස්සරං විස්සජාමි වො.

3898. යථා ච ම්‍යායං සුමුඛො අජ්ඣභාසෙය්‍ය පණ්ඩිතො,
කාමසා බුද්ධිසම්පන්නො තං ම්‍යාස්ස පරමප්පියං.

---

1. කච්චියනෙනා – මජසං.
2. එවමාපරියාසති – ස්‍යා.
එවමාපදියාසති – මජසං.
3. මාපජ්ජථ – මජසං.
4. අජ්ඣභාසථ – මජසං.
5. වක්කඞ්ගො – මජසං ස්‍යා.
6. ධම්මමාධීනං - මජසං. ස්‍යා.
7. සබ්බිස්සරියං – මජසං.
8. තං පසාසං – මජසං,

3886. කිම, ඔබගේ බිරිය සමාන ජාති ඇත්තී ද? අවවාදක්‍ෂම ද? ප්‍රිය තෙපුල් කියන්නී ද? දරු සම්පතින් හා රූපයෙන් ද යසසින් ද සමන්විත ද? ඔබගේ අදහස් අනුව පවතින්නී ද?

3887. මාගේ බිරිය සමාන ජාති ඇත්තීය. අවවාදක්‍ෂම ය. ප්‍රිය තෙපුල් කියන්නී ය. දරු සම්පතින් හා රූපයෙන් ද යශසින් ද මාගේ අදහස් අනුව පවත්නීය.

3888. කිමෙක් ද පින්වතා වනාහි මහා සතුරාගේ අතට අසු-වූයේ ඒ පළමු විපතෙහි දී දැඩි දුකට පත්වී ද?

3889. කිමෙක් ද, මේ වැද්ද පැන නොයන්නට දණ්ඩකින් පෙළුයේ ද? මෙසේ කිරීම මේ නිවයන්ගේ ඒ වේලාවෙහි ස්වභාව ය.

3890. මහරජ, මෙසේ විපත්තිය පැමිණි කල්හි නිර්භය වීමි. මෙතෙම අප කෙරෙහි සතුරකු මෙන් නො පිළිපන්නේ යැ.

3891. මහරජ, මේ වැදිතෙම පළමු කොට අප දැක මඳක් පසුබට විය. ඉන්පසු කථා කෙළේ ය. එවිට මේ පණ්ඩිත වූ සුමුඛ තෙම පිළිතුරු දුන්නේ ය.

3892. ඔහුගේ ඒ වචනය අසා මෙතෙම පැහැදුණේ ය. ඉන්පසු මා පාසයෙන් මිදුවේ ය. සුවසේ චිත්‍රකූටයට ගොස් වසන්නට ද අනුදත්තේ ය.

3893. පින්වත් ඔබ වෙත මේ පැමිණීම ද මොහුට ධනය ලබාදෙනු කැමැති වූ සුමුඛයා විසින් ම මොහු සඳහා ම සිතන ලද්දෙකැ යි හංස රාජයා කීයේ ය.

3894. පින්වතුන්ගේ මේ පැමිණීම යහපත් පැමිණීමෙකි. ඔබ දැක්මෙන් මම සොම්නස් වීමි. මෙතෙමේ ද යම්තාක් ධනය කැමති වේ නම් ඒ තාක් බොහෝ ධනය ලබන්නේ ය.

3895. රජ තෙම සම්පතින් වැද්ද සතප්වා මිහිරි වදන් කියමින් හංස රාජයාට මෙසේ කීයේ ය.

3896. හංසරාජය, යම්කිසිවක් මා වසයෙහි පවතී ද ඒ සියල්ල මම ධර්මයට අයත් කොට හෙවත් ධර්මපූජා වශයෙන් දෙමි. ඒ සියල්ලෙහි අධිපති බව පින්වතාට වේවා. රුචි පරිදි අනුශාසනා කරනු මැනවි.

3897. දනයට හෝ පරිභොගයට හෝ අන්කිසි යමකට හෝ කැමැත්තේ නම් එය කරව. ඒ සම්පත ඔබට දෙමි. මාගේ අධිපති භාවය ඔබට පවරා දෙමි යි රජ කී ය.

3898. ඉදින් මේ පණ්ඩිත වූ බුද්ධිසම්පන්න සුමුඛයාත් තම කැමැත්තෙන් යමක් කියන්නේ නම් එය මට ඉතා ප්‍රිය වන්නේ ය යි රජ කීයේ ය.

3899. අහං ඛලු මහාරාජ නාගරාජාරිවන්තරං,
පටිවත්තුං න සක්කොමි න මෙ සො විනයො සියා.

3900. අම්හාකඤ්චෙව යො සෙට්ඨො ත්වඤ්ච උත්තමසත්තවො,
භූමිපාලො මනුස්සින්දො පූජා බහූහි හෙතුහි.

3901. තෙසං උභින්නං භණතං වත්තමානෙ විනිච්ඡයෙ,
නානන්තරං[1] පටිවත්තබ්බං පෙස්සෙන[2] මනුජාධිප.

3902. ධම්මෙන කිර නෙසාදො පණ්ඩිතො අණ්ඩජො ඉති,
නහෙව අකතත්තස්ස නයො එතාදිසො සියා.

3903. එවං අග්ගපකතිමා එවං උත්තමසත්තවො,
යාවතත්ථි මයා දිට්ඨා නාඤ්ඤං පස්සාමි එදිසං.

3904. තුට්ඨොස්මි වො පකතියා වාක්‍යෙන මධුරෙන ච,
එසො චාපි මම ඡන්දො චිරං පස්සෙය්‍ය වො උභො.

3905. යං කිච්චං පරමෙ මිත්තෙ කතමස්මාසු[3] තං තයා,
පත්තා නිස්සංසයං ත්‍යාහං භත්තිරස්මාසු යා තව.

3906. අද්ධා නූන සුමහා ඤාතිසඞ්ඝස්ස මන්තරං,
අදස්සනෙන අස්මාකං දුක්ඛං බහුසු පක්ඛිසු.

3907. තෙසං සොකවිඝාතාය තයා අනුමතා මයං,
තං පදක්ඛිණතො කත්වා ඤාති පස්සෙ මරින්දම[4].

3908. අද්ධාහං විපුලං පීතිං භවතං වින්දාමි දස්සනා,
එසො චාපි මහා අත්ථො ඤාතිවිස්සාසනා සියා.

3909. ඉදං වත්වා ධතරට්ඨො[5] හංසරාජා නරාධිපං,
උත්තමජවමත්තාය ඤාතිසඞ්ඝමුපාගමුං.

3910. තෙ අරොගෙ අනුප්පත්තෙ දිස්වාන පරමෙ ද්විජෙ,
කෙකාතිමකරුං හංසා පුථු සද්දො අජායථ

1. නන්තරං – මජ්සං, ස්‍යා.
2. පෙසෙන – මජ්සං.
3. කතිමස්මාසු – මජ්සං.
4. මුරින්දම – මජ්සං. ස්‍යා.
5. ධතරට්ඨො – වි. මජ්සං. ස්‍යා.

3899. මහරජ, මම වනාහි මහගල් පව් දෙකත් අතරට වූ ඇත් රජකු මෙන් ඔබ අතර කථා කරන්නට නො හැක්කෙමි. එසේ කථා කරන්නෙම් නම් එය හික්මීම ද නො වන්නේ ය.

3900. අපගේ සයානූදහසක් හංසයන්ට ශ්‍රෙෂ්ඨ වූ යම් ඒ හංස රාජයෙක් වේ ද, හෙ තෙමේ ද පාථිවිය පාලනය කරන්නා වූ මිනිසුන්ට අධිපති වූ උතුම් කෙනකු වන ඔබ ද යන දෙදෙනා බොහෝ හේතූන් නිසා පිදිය යුත්තෝ ය.

3901. නර ශ්‍රෙෂ්ඨ මහරජතුමනි, ඔවුන් දෙදෙනා කථා කරද්දී විනිශ්චය පවත්නා විට මෙහෙකරු වූ මා විසින් අතර තුර කථා නො කළයුතු ය.

3902. වැදි තෙම ඇතිසැටියෙන් ම පණ්ඩිත වූ පක්ෂියෙකැ යි කීසේ ය. පුරුදු නොකළ සිනැත්තකුට මෙබඳු ප්‍රඥාවක් නො වන්නේ ම ය.

3903. මෙතෙම මෙසේ උතුම් ස්වභාව ඇත්තෙකි. මෙසේ උතුම් සත්වයෙකි. මා විසින් දක්නාලද යම්තාක් පක්ෂීහු ඇද්ද, ඔවුනතර මෙබඳු අන් පක්ෂියකු නො දකිමි.

3904. යහළු හංසරාජය, මම (පළමු කොට ම) ඔබ දැක්මෙන් ප්‍රකෘතියෙන් තුටු වූයෙම් වෙමි. දැන් ඔබගේ මිහිරි වචනයෙන් සතුටු වූයෙම් වෙමි. ඔබ දෙදෙනා (මෙහි ම වාසය කරවාගෙන) බොහෝ කලක් බලන්නෙමි යි යන මෙය ද මගේ කැමැත්ත වේ.

3905. මහරජ, උතුම් මිත්‍රයකු කෙරෙහි කටයුතු යමක් වේ ද, ඔබ විසින් ඒ සියල්ල අප කෙරෙහි කරනලදී. අප කෙරෙහි ඔබගේ යම් බඳු භක්තියක් වේ ද, ඒ භක්තියෙන් අපි නිසැක ව ම ඔබ සමග සහ වාසයට පැමිණියමෝ වෙමු.

3906. බොහෝ පක්ෂීන් කෙරෙහි අප නො දැක්මෙන් දුකෙක් උපන්නේ ද, තෙල අපගේ, ඥාති සමූහයාගේ මහත් දුබල බවෙකි.

3907. මහරජ, ඔවුන්ගේ ශෝකය දුරු කිරීම පිණිස ඔබ විසින් අනුදන්නාලද අපි ඔබ ප්‍රදක්ෂිණා කොට නෑයන් දක්නෙමු.

3908. මම පින්වත්හුගේ දැක්මෙන් ඒකාන්තයෙන් ම මහත් ප්‍රීතියක් විඳිමි. යම් නෑයන් දැක්මෙක් වේ නම් මෙය ද මහත් අභිවෘද්ධියක් වේ යයි හංස තෙම කීයේ ය.

3909. ධතරට්ඨ නම් වූ හංස රාජයෝ රජුට මෙය කියා මහත් ජවයෙන් නෑ සමූහයා වෙත එළැඹියහ.

3910. නීරොග වූ එහි පැමිණි ඒ උතුම් හංසයන් දැක හංසයෝ කෙ, කෙ, යන රාවය කළහ. එයින් මහත් ශබ්දයෙක් හටගති.

3911. තෙ පතිතා පමුත්තෙන භත්තුනා භත්තුගාරවා,
සමන්තා පරිකරිංසු අණ්ඩජා ලද්ධපච්චයා.

3912. එවං මිත්තවතං අත්ථා සබ්බෙ හොන්ති පදක්ඛිණා,
හංසා යථා ධතරට්ඨා ඤාතිසඞ්ඝමුපාගමුන්ති.

1. චුල්ලහංසජාතකං.

2. මහාහංසජාතකං

3913. එතෙ හංසා පක්කමන්ති වක්කඞ්ගා භයමෙරිතා,
හරිත්තච හෙමවණ්ණ කාමං සුමුඛ පක්කම.

3914. ඔහාය මං ඤාතිගණා එකං පාසවසං ගතං,
අනපෙක්ඛමානා ගච්ඡන්ති කිං එකො අවහීයසි.

3915. පතෙව පතතං සෙට්ඨ නත්ථි බද්ධෙ[1] සහායතා,
මා අනීඝාය හාපෙසි කාමං සුමුඛ පක්කම.

3916. නාහං දුක්ඛපරෙතොති[2] ධතරට්ඨ තවං ජහෙ,
ජීවිතං මරණං වා මෙ තයා සද්ධිං භවිස්සති.

3917. නාහං දුක්ඛපරෙතොති ධතරට්ඨ තවං[3] ජහෙ.
න මං අනරියසංයුත්තෙ කම්මෙ යොජෙතුමරහසි.

3918. සකුමාරො සඛා ත්‍යස්මි සච්චිත්තෙ වස්මි තෙ ඨිතො,
ඤාතො සෙනාපති ත්‍යාහං හංසානං පවරුත්තම.

3919. කථං අහං විකත්ථිස්සං[4] ඤාතිමජ්ඣෙ ඉතො ගතො,
තං හිත්වා පතතං සෙට්ඨ කිංනෙත වක්ඛාමිතො ගතො.
ඉධ පාණං චජිස්සාමි නානරියං කත්තුමුස්සහෙ.

3920. එසො හි ධම්මො සුමුඛ යං ත්වං අරියපථෙ ඨිතො,
යො භත්තාරං සඛාරං මං න පරිච්චත්තුමුස්සහෙ[5].

---

1. බන්ධෙ – මජසං. ස්‍යා.
2. පි – මජසං., ස්‍යා.
3. තුවං – මජසං. ස්‍යා.
4. විකත්ථිස්සං – මජසං.
5. පරිච්චත්තු – මජසං.

3911. මළපුඩුවෙන් මිදුණා වූ ස්වාමියා කරණකොට ගෙන තුටු සිත් ඇත්තා වූ ඒ හංසයෝ ස්වාමි ගෞරවය ඇත්තාහු 'පක්ෂීහු පිහිටලද්දෝ ය' යි ඔහු හාත්පස පිරිවරාගත්හ.

3912. මෙසේ කල්‍යාණමිත්‍රයන් ඇත්තවුන්ගේ සියලු අභිවෘද්ධිය සැලසෙන්නේ ය. ධතරට්ඨ නම් වූ හංසයෝ යම් සේ නෑ සමූහයා වෙතට පැමිණියාහු ද එමෙනැ යි වදළසේක.

චූලහංස ජාතක යි.

2. මහාහංස ජාතකය

3913. රන්වන් සිවිය ඇති හෙයින් ස්වර්ණ වර්ණ වූ සුන්දර වූ මුඛ ඇත්තා වූ සුමුඛ ය, බියෙන් තැතිගත් මේ හංසයෝ බැහැර යෙත්. නුඹ ද යව.

3914. තනිව මළපුඩුවෙහි අසු වූ මා හැරදමා ඥාති සමූහයෝ අපෙක්ෂා රහිත වූවාහු යෙත්. එකලා වූ තෝ කුමක් හෙයින් පසු-බස්නෙහි ද?

3915. ශ්‍රෙෂ්ඨ පක්ෂිය, තෝ ද පැනයව. බැඳුණහු කෙරෙහි යහළුබවෙක් නැත. නිදුක් බැවින් නො පිරිහෙව. සුමුඛය, එකාන්ත-යෙන් බැහැර යව.

3916. ධතරට්ඨනම් මහරජ, මම දුකින් පෙළුණෙමැ යි කියා ඔබ අත් නො හරිමි. මාගේ ජීවිතය හෝ මරණය හෝ ඔබ සමග වන්නේ ය.

3917. ධතරට්ඨ නම් මහරජ, මම දුකින් පෙළුණෙමැ යි කියා ඔබ නො හරිමි. මිත්‍රද්‍රොහි අනායර්‍යයන්ගේ කායර්‍යයෙක්හි මා යොදවන්නට නුසුදුස්සෙහි ය.

3918. හංසරාජය, මම ඔබ හා සමාන ව උපන් බැවින් සමාන කුමාර වෙමි. එක්ව වැඩුණු බැවින් යහළුවා ද වෙමි. ඔබ සිතැඟි පරිදි හැසිරෙන්නෙක් ද වෙමි. සෙන්පතියකු වශයෙන් ද ප්‍රකට වූයෙමි.

3919. මෙයින් ගියා වූ මම නෑයන් මැද කෙසේ කියන්නෙම් ද, පක්ෂි ශ්‍රෙෂ්ඨය, ඔබ හැර මෙයින් ගියා වූ මම ඥාතීන් විසින් විචාරන ලද්දෙම් ඔවුන්ට කුමක් කියම් ද? මෙහි ම පණ හරින්නෙමි. අනායර්‍ය ක්‍රියාවක් කරන්නට උත්සාහ නො කරමි.

3920. සුමුඛය, ස්වාමි වූ ද යහළු වූ ද මා හැර යන්නට යම් හෙයකින් තෙපි උත්සාහ නො කරවු ද ඒ තෙපි ආයර්‍ය මාර්ගයෙහි පිහිටියහු ය. මෙය වනාහි පුරාතන ධර්මය වන්නේ ය.

3921. තං හි මෙ පෙක්ඛමානස්ස භයං න තෙව ජායති,
අධිගච්ඡසි ත්වං මය්හං එවම්භූතස්ස ජීවිතං.

3922. ඉච්චෙව මන්තයන්තානං අරියානං අරියවුත්තිනං,
දණ්ඩමාදය නෙසාදො ආපදී[1] තුරිතො භුසං.

3923. තමාපතන්තං දිස්වාන සුමුඛො අපරි[2]බ්‍රූහයි,
අට්ඨාසි පුරතො රඤ්ඤො හංසො විස්සාසයං ව්‍යථං[3].

3924. මා භායි පතතං සෙට්ඨ නහි භායන්ති තාදිසා,
අහං යොගං පයුඤ්ජිස්සං යුත්තං ධම්මූපසංහිතං.
තෙන පරියාපදනෙන[4] ඛිප්පං පාසා පමොක්ඛසි.

3925. තස්ස තං වචනං සුත්වා සුමුඛස්ස සුභාසිතං,
පහට්ඨලොමො නෙසාදො අඤ්ජලිස්ස පණාමයි.

3926. න මෙ සුතං වා දිට්ඨං වා භාසන්තො මානුසිං[5] දිජො,
අරියං බ්‍රුවානො[6] වක්කඞ්ගො චජන්තො මානුසිං ගිරං.

3927. කින්නු තායං දිජො හොති මුත්තො බද්ධං[7] උපාසසි,
ඔහාය සකුණා යන්ති කිං එකො අවහීයසි.

3928. රාජා මෙ සො දිජාමිත්ත සෙනාපච්චස්ස කාරයිං,
තමාපදෙ පරිච්චත්තුං නුස්සහෙ විහගාධිපං.

3929. මහාගණාය භත්තා මෙ මා එකො ව්‍යසනං අගා,
තථා තං සම්ම නෙසාද භත්තායං අභිතො රමෙ.

3930. අරියවත්තසි වක්කඞ්ග යො පිණ්ඩමපචායසි,
චජාමි තෙ තං භත්තාරං ගච්ඡථූභො යථා සුඛං.

3931. සචෙ අත්තප්පයොගෙන ඔහිතො හංසපක්ඛිනං,
පතිගණ්හාම[8] තෙ සම්ම එතං අභයදක්ඛිණං.

3932. නො චෙ අත්තප්පයොගෙන ඔහිතො හංසපක්ඛිනං,
අනිස්සරො මුඤ්චමම්හෙ ථෙය්‍යං කයිරාසි ලුද්දක.

---

1. ආපති – මජසං. සයා.
2. අති – මජසං. සයා.
3. බ්‍යධං – මජසං.
4. පරියාදනෙන – මජසං.
5. මානුසං – මජසං.
6. බ්‍රූහන්තො – වි. මජසං. සයා,
7. බන්ධං – මජසං, සයා.
8. පටිගණ්හම – මජසං.

3921. නුඹ දක්නා වූ මට වනාහී බියෙක් නොම උපදී. මෙසේ වූ මාගේ ජීවිතය ඔබ ලබාදුන්නහු ය.

3922. ආයුෂ්‍ය වූ ආයුෂ්‍ය පැවතුම් ඇත්තා වූ හංසයන් මෙසේ මන්ත්‍රණය කරමින් සිටිද්දී ම වැදිපුත්‍ර තෙම දැඩි වූ මුගුරක් ගෙන වහා පැමිණියේ ය.

3923. එන්නා වූ ඒ වැද්ද දැක සුමුඛ තෙමේ ''බිය නො වව'' යි මහ හඬින් කී ය. සුමුඛ නම් හංස තෙම බියපත් වූ හංස රජුට විශ්වාසය ඇති කරවමින් හංස රජු ඉදිරිපිට සිටියේ ය.

3924. පක්ෂි ශ්‍රෙෂ්ඨය, බිය නො වව, තොප වැන්නෝ බිය නොවෙත්. මම දැහැමි වූ ස්ථානොචිත උත්සාහයක් කරන්නෙමි. ඒ උත්සාහ කිරීමෙන් මළ පුඩුවෙන් වහා මිදෙන්නෙහි ය.

3925. ඒ සුමුඛයාගේ සුභාෂිත වූ ඒ වචන අසා හටගත් රොමොද්-ගමනය ඇති වැද්ද ඔහුට ඇඳිලි බැන්දේ ය.

3926. මිනිස් හඬ නිකුත් කරමින් නිදෙස් ව මිනිස් බස් කියන පක්ෂියෙක් මින් පෙර මා විසින් නො දක්නා ලදී, නො අසන ලද්දේ ද වෙයි.

3927. (පාසයෙන්) මිදුණා වූ නුඹ, බැඳුණා වූ මොහු සමීපයෙහි හිදින්නෙහි ය. තට මේ පක්ෂියා කවරෙක් වෙයි ද? අනිත් පක්ෂීහු මොහු හැරයෙත්. තනි නුඹ පමණක් කුමක් නිසා නො යන්නෙහි ද?

3928. පක්ෂීන්ගේ සතුරු වූ වැද්දණනි, මෙතෙම මගේ රජ ය. මම මොහුගේ සෙන්පති බව කරවීමි. ඒ පක්ෂිරාජයා විපතෙහි හැරපියන්නට උත්සාහ නොකරමි.

3929. මහත් හංස සමූහයාගේ ද මාගේ ද ස්වාමි වූ මෙතෙම තනිව විපතට නො පැමිණේවා. යහළු වැදි පුත්‍රය, එය එසේ ම ය. මෙතෙම මාගේ ස්වාමියා වේ. මම මොහු සමීපයෙහි සිත් අලවා වෙසෙමි.

3930. හංසය, යමෙක් ස්වාමියාගෙන් ලත් පිණ්ඩාහාරයට පුදන්නෙහි ද, ඒ නුඹ ආයුෂ්‍යන්ගේ පැවැත්මෙන් යුක්ත වෙහි. මම නුඹගේ ඒ ස්වාමියා හරිමි. දෙදෙන සුවසේ යවු.

3931. මිත්‍රය, ඉදින් ඔබ විසින් ස්වකීය ප්‍රයොජනය පිණිස හංසයන්ට හා වෙනත් පක්ෂීන්ට උගුල අටවන ලද්දේ නම් ඔබගේ මේ අභය දනය පිළිගනිමි.

3932. ඉදින් ඔබ විසින් තමන්ගේ ප්‍රයොජනය සඳහා හංසයන්ට සහ වෙනත් පක්ෂීන්ට උගුල අටවන ලද්දේ නො වේ නම්, නුඹ අධිපති නො වෙහි ය. වැදිපුත්‍රය, අප මුදු හරින්නාවූ නුඹ සොරකමක් කරන්නෙහි ය.

3933. යස්ස ත්වං හතකො[1] රඤ්ඤො කාමං තස්සෙව පාපය,
තත්ථ සංයමනො රාජා යථාභිඤ්ඤං කරිස්සති.

3934. ඉච්චෙව වුත්තො නෙසාදෙ හෙමවණ්ණෙ හරිත්තචෙ,
උභො හත්ථෙහි සඞ්ගය්හ[2] පඤ්ජරෙ අජ්ඣවොදහි.

3935. තෙ පඤ්ජරගතෙ පක්ඛී උභො භස්සරවණ්ණිනෙ,
සුමුඛං ධතරට්ඨඤ්ච ලුද්දො ආදාය පක්කමි.

3936. හරීයමානො ධතරට්ඨො සුමුඛං එතදබ්‍රවි,
බාළ්හං භායාමි සුමුඛ සාමාය ලක්ඛණූරුයා
අස්මාකං වධමඤ්ඤාය අථත්තානං වධිස්සති.

3937. පාකහංසා ච සුමුඛ සුහෙමා හෙමසුත්තචා,
කොඤ්චී සමුද්දතීරෙව කපණා නූන රුච්ඡති.

3938. එවං මහන්තො ලොකස්ස අප්පමෙය්‍යො මහාගණී,
එකිත්ථිමනුසොචෙය්‍ය න ඉදං පඤ්ඤවතොමිව.

3939. වාතො ච ගන්ධමාදෙති උභයං ඡෙකපාපකං,
බාලො ආමකපක්කං ච ලොලො අන්ධො ච ආමිසං.

3940. අවිනිච්ඡයඤ්ඤූ අත්ථෙසු මන්දොව පටිභාසි[3] මං,
කිච්චාකිච්චං න ජානාසි සම්පත්තො කාලපරියායං.

3941. අඩ්ඪුම්මත්තො උදීරෙසි යො සෙය්‍යො මඤ්ඤසිත්ථියො,
බහුසාධාරණා හෙතා සොණ්ඩානංව සුරාඝරං.

1. හටකො – මජසං,
2. පග්ගය්හ – මජසං. සයා.
3. පටිභාති – මජසං.

3933. නුඹ යම් රජකුගේ බැළයෙක් වෙහි ද එකාන්තයෙන් ඔහු වෙතට ම අප පමුණුව. එහි දී ඇණවුම් සහිත රජ තෙම අභිමත වූවක් කරන්නේ ය(යි හංස සේනාපතියා කීයේ ය.)

3934. මෙසේ කියනු ලැබූ වැදි තෙම රන්වන් සිවි ඇති ස්වර්ණ වර්ණවූ ඒ හංස රාජයන් දෙදෙන දෙඅතින් අල්ලාගෙන මැදිරිවල තැබීය.

3935. ප්‍රභාස්වර වූ වර්ණ ඇති සුමුඛ, ධතරට්ඨ යන ඒ පඤ්ජරගත පක්ෂීන් දෙදෙන ගෙන වැද්ද ගියේ ය.

3936. ගෙන යනු ලබන්නාවූ ධතරට්ඨ නම් හංස තෙම සුමුඛ නම් හංසයාට මෙය කීය. එම්බා සුමුඛය, රන්වන් අලංකාර ඌරු යුග්මයක් ඇති (භාර්‍යාවගේ) මරණයට දැඩිව බියවෙමි. අපගේ මරණය අසා ඕ තමාම නැසෙන්නී ය.

3937. සුමුඛය, පාකහංස දුහිතෘ වූ රන්වන් මනා සිවිය ඇති සුහේමා නම් වූ ඕ තොමෝ (මුහුදෙහි වැටී ස්වාමියා මළ කල්හි) වෙරළෙහි සිට බැගෑපත්ව හඬන කොස්ළිහිණිදෙනක මෙන් හඬන්නීය යි සිතමි.

3938. මෙසේ හංස ලොකයාගේ ගෞරවයට සුදුසු වූ අප්‍රමෙය ගුණ ඇති ගණ ප්‍රධානවූ ඔබ එකම හංස ධෙනුවක සඳහා ශොක කරන්නහුය. මෙය නුවණැත්තකුට නොගැළපෙන්නෙකි.

3939. මහරජ, සුගන්ධ දුර්ගන්ධ දෙකම (නොතෝරා) ගන්නා වූ වාතය මෙන් ද, (අඹ දඹ ඈ ඵලහරිත ගසක් යට හිඳ) පැසුණු නොපැසුණු විසින් විභාග නොකොට අතට අසුවූවක් ගෙන කන්නාවූ කුඩා ළමයකු මෙන් ද රස තෘෂ්ණායෙන් ආහාරයක් බුදින ලොල්වූ අන්ධයකු මෙන් ද,

3940. මරණාසන්න අවස්ථාව පැමිණියා වූ ඔබ යම් හෙයකින් කළයුත්ත නොකළයුත්ත නොදන්නහු ද, කාරණාකාරණයන්හි විනිශ්චය නොදන්නහු ද, එහෙයින් ඔබ අන්ධ බාලයකු මෙන් මට වැටහෙයි.

3941. යමෙක් ස්ත්‍රීහු උතුම් යයි හඟින්නේ නම් හෙතෙම අඩක් උමතු වූවකු මෙන් කථාකරන්නේ ය. මේ ස්ත්‍රීහු නම් සුරා සොඬුන්හට සුරා සැල මෙන් බොහෝ දෙනකුට සාධාරණ වෙති.

3942. මායා චෙසා මරීචී ච සොකො රොගො චුපද්දවො,
ඛරා ච බන්ධනා චෙතා මච්චුපාසො ගුහාසයො
තාසු යො විස්සසෙ පොසො සො නරෙසු නරාධමො.

3943. යං වුද්ධෙහි[1] උපඤ්ඤාතං කො තං නින්දිතුමරහති,
මහාභූතිත්ථියො නාම ලොකස්මිං උදපජ්ජිසුං.

3944. ඛිඩ්ඩා පණිහිතා ත්‍යාසු රති ත්‍යාසු පතිට්ඨිතා,
බීජානි ත්‍යාසු රූහන්ති යදිදං සත්තා පජායරෙ
තාසු කො නිබ්බිදෙ පොසො පාණමාසජ්ජ පාණිහි.

3945. ත්වමෙව නඤ්ඤො සුමුඛ ථීනං අත්ථෙසු යුඤ්ජසි,
තස්ස ත්‍යජ්ජ භයෙ ජාතෙ භීතෙන ජායතෙ මති.

3946. සබ්බො හි සංසයං පත්තො භයං භීරු තිතික්ඛති,
පණ්ඩිතා ච මහන්තානො අත්ථෙ යුඤ්ජන්ති දුය්‍යුජෙ.

3947. එතදත්ථාය රාජානො සූරමිච්ඡන්ති මන්තිනං,
පටිබාහති යං සූරො ආපදං අත්තපරියායං.

3948. මා නො අජ්ජ විකන්තිංසු රඤ්ඤො සූද මහානසෙ,
තථාහි වණ්ණො පත්තානං ඵලං වෙළුංව තං වධි.

3949. මුත්තො න ඉච්ඡි ඔඩ්ඩෙතුං සයං බන්ධං උපාගමි,
සොපජ්ජ සංසයං පත්තො අත්ථං ගණ්හාහි මා මුඛං.

1. බුද්ධෙහි - මජ්ඣසං.

3942. තවද මේ ස්ත්‍රීහු නම් (පුරුෂයන් රවටන හෙයින්) මායාවක් වැන්න. (අතට අසු නොවන හෙයින්) මිරිඟුවක් වැන්න. (තමන් ඇසුරු කරන්නවුනට ශොකය හා කාශස්වාසාදී රෝගත් ඇතිකරන හෙයින්) ශොක රෝගාදි උපද්‍රවයනට හේතුය, ක්‍රොධාදීන් තද බැවින් කෲරය, අන්දු බන්ධනාදියට හේතුය. මේ ස්ත්‍රී නම් ශරීර ගුහාව ඇසුරු කරන්නා වූ මාර පාසය කී. එ බඳු ස්ත්‍රීන් කෙරෙහි යම් පුරුෂයෙක් විශ්වාස කෙරේ නම් හේ මිනිසුන් අතුරෙහි අධම මිනිසෙකි. (සුමුඛයා කී ය.)

3943. මාතුගාම සංඛ්‍යාත වූ යම් වස්තුවක් නුවණැත්තන් විසින් ම දක්නා ලද ද, ඒ ස්ත්‍රියට නින්ද කරන්නට කවරෙක් සුදුසු වේ ද? මහත් ගුණැති ස්ත්‍රීහු නම් ලොකයෙහි පළමුකොට උපන්නාහුය.

3944. සුමුඛය, ඒ ස්ත්‍රීන් කෙරෙහි කායවචී ක්‍රීඩාවෝ ද පිහිටියාහ. ඒ ස්ත්‍රීන් කෙරෙහි පස්කම් ගුණයෙහි ආලය ද පිහිටි යේය. (බුදු පසේ බුද ආදි) යම් සත්‍ව කෙනෙක් උපදිත් නම් ඒ බීජයෝ ද ඔවුන් කෙරෙහි ම වැඩෙති. දිවි හැරීමෙන් වුව ද කවර නම් පුරුෂයෙක් ඔවුන් කෙරෙහි කලකිරෙන්නේ ද?

3945. සුමුඛය, අනෙකකු නොව නුඹ ම ස්ත්‍රීන්ගේ කටයුතුවල යෙදෙන්නෙහිය. ඒ නුඹට අද බිය ඇතිවූ කල්හි ඒ මරණ බිය නිසා ස්ත්‍රීන්ගේ අගුණ දැකීමෙහි තියුණු නුවණක් ඇතිවීය යි හඟිමි.

3946. ජීවිතසංසයට පත් සියලු දෙන ම ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිතැතිව ඒ බිය ඉවසත්. පණ්ඩිත වූ, මහාත්මයෝ දුකසේ යෙදියයුතු අර්ථයෙහි (වැඩවල) යෙදෙත්.

3947. මේ සඳහා රජවරු ශූර මන්ත්‍රියකු කැමතිවෙති. යම් හෙයෙකින් ශූරතෙමේ සවාමියාට පැමිණි ආපදවන් වළකාලයි ද ආත්මාරක්ෂාවත් සිද්ධ කෙරේ ද එහෙයිනි.

3948. (සුමුඛය,) අද රජුගේ අරක්කැමියෝ මුළුතැන්ගෙහිදී අප නොකපත්වා. යම්සේ හුණ ඵලය, හුණ ගස නසන්නේද, අපගේ පියාපත්වල වර්ණද එසේය. අපගේ විනාශයට (හේතුය) එසේ තා ද මා ද නො නසව.

3949. වැදි පුත්‍රයා විසින් මුදන ලද්දේ ද පියාඹා යන්නට නොකැමැති වූවෙහිය. තෙමේ ම බන්ධනයට එළැඹියෙහි. හෙද දුන් ජීවිත සැකයට පැමිණියේය. අප මිදෙන කරුණක් සිතා ගනුව. (ස්ත්‍රීන්ට නින්ද කිරීම පිණිස) මුව විවෘත නො කරව.

3950. සො තං යොගං පයුඤ්ජස්සු යුත්තං ධම්මූපසංහිතං,
තවං පරියාපදනෙන[1] මම පාණෙසනං චර.

3951. මාභායි පතතං සෙට්ඨ නහි භායන්ති තාදිසා,
අහං යොගං පයුඤ්ජිස්සං යුත්තං ධම්මූපසංහිතං
මම පරියාපදනෙන ඛිප්පං පාසා පමොක්ඛසි.

3952. ස ලුද්දො හංසකාජෙන රාජද්වාරං උපාගමි,
පටිවෙදෙථ මං රඤ්ඤො ධතරට්ඨායමාගතො.

3953. තෙ දිස්වා පුඤ්ඤසඞ්කාසෙ උභො ලක්ඛඤ්ඤසම්මතෙ,
ඛලු සඤ්ඤමනො[2] රාජා අමච්චෙ අජ්ඣභාසථ.

3954. දෙථ ලුද්දස්ස වත්ථානි අන්නං පානඤ්ච භොජනං,
කාමං කරො හිරඤ්ඤස්ස යාවන්තො එස ඉච්ඡති.

3955. දිස්වා ලුද්දං පසන්නත්තං කාසිරාජා[3] තදබ්‍රවි,
යදයං සම්ම ඛෙමක පුණ්ණා හංසෙහි තිට්ඨති.

3956. කථං රුචිං[4] මජ්ඣගතං පාසහත්ථො උපාගමි,
ඔකිණ්ණං ඤාතිසඞ්ඝෙහි නිමජ්ඣිමං[5] කථං ගහි.

3957. අජ්ජ මෙ සත්තමා රත්ති ආදනානි[6] උපාසතො,
පදමෙතස්ස අන්වෙසං අප්පමත්තො ඝටස්සිතො.

3958. අථස්ස පදමද්දක්ඛිං චරතො අදනෙසනං,
තත්ථාහං ඔදහිං පාසං එවෙතං[7] දිජමග්ගහිං.

3959. ලුද්ද දෙව ඉමෙ සකුණා අථ එකොති භාසසි,
චිත්තන්නු තෙ විපරියත්තං ආදු කින්නු ජිගිංසසි.[8]

3960. යස්ස ලොහිතකා තාලා තපනෙය්‍යනිභා සුභා,[9]
උරං සංහච්ච තිට්ඨන්ති සො මෙ බන්ධං උපාගමි.

---

1. පරියාදනෙන – මජසං.
2. සංසමනො – මජසං, සයා.
3. කාසිරාජෙතදබ්‍රවි – මජසං, සයා.
4. රුචි – මජසං, සයා.
5. නිම්මජ්ඣිමං – මජසං, සයා.
6. අදනානි – මජසං.
7. එවං තං – මජසං, සයා.
8. ජිගීසති – මජසං.
9, සභා – මජසං,

3950. (යහළු සුමුඛය,) ඒ නුඹ පළමු කී දැහැමින් යුත් උත්සාහය යොදව. තොපගේ ඒ පිරිසුදු වූ උත්සාහයෙන් මාගේ ජීවිතය සෙවීම කරව (යි හංස රජ කීයේ ය.)

3951. පක්ෂිරාජය, බිය නොවව, ඔබ වැන්නෝ බිය නො වෙති. මම දැහැමින් යුත් සුදුසු උත්සාහයක් යොදන්නෙමි. මාගේ ඒ පිරිසුදු උත්සාහයෙන් වහා දුඃඛපාසයෙන් මිදෙන්නෙහිය. (සුමුඛයා කීයේ ය.)

3952. ඒ වැදිතෙම හංසයන් රැගත් කදින් යුක්තව රජගෙදර දොරටුවට එළඹියේය. මා පැමිණි බව රජුට කියවු. මේ ධතරට්ඨ නම් හංස රජු ද ආයේය යි ද රජුට දන්වවු (යි දොරටුපාලයාට කීයේ ය.)

3953. තමන්ගේ පිනට සරිලන, ශ්‍රෙෂ්ඨයයි සම්මත ඒ හංසයන් දෙදෙන දැක සතුටු සිත් ඇති රජතෙම ඇමතියන්ට මෙසේ කීය.

3954. මේ වැද්දට වස්ත්‍ර ද, ආහාර පාන ද භොජන ද දෙවු. මේ තෙම යම්තාක් කැමැත්තේ නම් ඒ තාක් අමුරන් දෙවු යි.

3955. කසී රජතෙම පහන් වූ ඒ වැද්ද දැක මෙසේ කීය. යහළු ඛෙමක නම් වැද්දණෙනි, ඉදින් අපගේ පොකුණ හංසයන්ගෙන් පිරීපවතී නම්,

3956. මනා දැකුම් ඇති හංසයන් මැද සිටියා වූද හංසයන් විසින් පිරිවරන ලද්ද වූ ද මේ හංස රාජයා වෙතට මළ පුඩුව ගත් අත් ඇතිව ගියෙහි ද? මේ නුඹ, හංස රාජයා කෙසේ අල්ලාගත්තෙහි ද?

3957. මොහු ගොදුරු ගන්නා තැන් සොයා යන්නා වූ මට අද සත්වැනි රැය ය. මම මොහුගේ පියවර සොයමින් වාටිපඤ්-ජරයක් ඇසුරු කරමින් අප්‍රමාද වීමි.

3958. ඉක්බිති ගොදුරු පිණිස හැසිරෙන්නාවූ මොහුගේ පියවර දුටිමි. මම එහි පාසය බහාලීමි. මෙසේ මේ පක්ෂියා ගත්තෙමියි (වැද්ද කීයේ ය.)

3959. එම්බල වැදිපුත්‍රය, මේ පක්ෂීහු දෙදෙනෙක් වෙති. එසේ ඇති කල්හි එකෙකැයි කියන්නෙහිය. කිම, තාගේ සිත පෙරළී ද? නැතහොත් අනෙකා අතිකකුට දෙනු කැමැත්තෙහිද?

3960. (මහරජ,) යම් පක්ෂියකුගේ රත් රන් වන් රේඛාවෝ බබළමින් ගෙල වටා ගොස් උදරයට හැපී සිටිද්ද, හෙතෙම මාගේ බන්ධනයට පැමිණියේ ය.

3961. අථායං හස්සරො පක්ඛී අබද්ධො[1] බද්ධමාතුරං,
අරියං බ්‍රුවානො අට්ඨාසි වජ්ජෙන්තො මානුසිං ගිරං.

3962. අථ කින්නු[2] දානි සුමුඛ හනුං සංහච්ච තිට්ඨසි,
ආදු මෙ පරිසං පත්වා භයා භීතො න භාසසි.

3963. නාහං කාසිපතී භීතො ඔගය්හ පරිසං තව,
නාහං භයා න භාසිස්සං වාක්‍යං අත්ථස්මිං තාදිසෙ.

3964. න තෙ අභිසරං පස්සෙ න රථෙ නපි පත්තිකෙ,
නාස්ස චම්මංව කීටං වා වම්මිතෙ ච ධනුග්ගහෙ.

3965. න හිරඤ්ඤං සුවණ්ණං වා නගරං වා සුමාපිතං,
ඔකිණ්ණපරිඛං[3] දුග්ගං දළ්හමට්ටාලකොට්ඨකං,
යත්ථ පවිට්ඨො සුමුඛ භායිතබ්බං න භායසි.

3966. න මෙ අභිසරෙනත්ථො නගරෙන ධනෙන වා,
අපථෙන පථං යාම අන්තලික්ඛෙ චරා මයං.

3967. සුතාච පණ්ඩිතා ත්‍යම්හා නිපුණා අත්ථචින්තකා,
භාසෙමත්ථවතිං වාචං සච්චෙචස්ස පතිට්ඨිතො.

3968. කිඤ්ච තුය්හං අසච්චස්ස අනරියස්ස කරිස්සති,
මුසාවාදිස්ස ලුද්දස්ස භණිතම්පි සුභාසිතං.

3969. තං බ්‍රාහ්මණානං වචනා ඉමං ඛෙමිං[4] අකාරයි,
අභයඤ්ච තයා ඝුට්ඨං ඉමායො දසධා දිසා.

3970. ඔගය්හ තෙ පොක්ඛරණිං විප්පසන්නොදකං සුචිං,
පහූතඤ්චාදනං[5] තත්ථ අහිංසාචෙත්ථ පක්ඛිනං.

---

1. අබන්ධො බන්ධ - මජසං.
2. කිං - මජසං.
3. පරික්ඛං - මජසං.
4. ඛෙමං - මජසං.
5. බහුකං ඛාදනං - මජසං, පහූතං ඛාදනං - සයා.

3961. ඉක්බිති මේ ප්‍රභාස්වරවූ පක්ෂිතෙම නොබැඳුණේ, බැඳුණු ගිලන් වූ ස්වාමියා සනසමින් (ඉදිරියට පැමිණ) මා සමග මිනිස් තෙපුලෙන් කථාකරමින් සිටියේයයි (වැද්ද කීයේ ය.)

3962. සුමුඛය, එසේ ඇතිකල්හි දුන් කුමක් හෙයින් හනු එකට තද කොට ගෙන සිටිනෙහි ද? කිමෙක් ද? මාගේ පිරිසට පැමිණියේ බියෙන් තැතිගත්තෙහි කථා නොකෙරෙහිද යි රජ ඇසී ය.

3963. කසීරටට අධිපති මහරජතුමනි, මම ඔබගේ පිරිසට වැද බියපත්වූයෙම් නොවෙමි. මම බියෙන් නො බෙණෙන්නෙම් ද නොවෙමි. කථාකළයුතු සුදුසු අවස්ථා යෙහි කථා කරමි යි සුමුඛයා කීයේ ය.

3964. තට රැකවරණ කරගෙන සිටින පිරිසක් නොදකිමි. රිය ද නොදකිමි. පාබළ සෙනගක් ද නොදකිමි. ඊ පහර වළකාලන චර්මයක් ද නොදකිමි. වාටිකපාලයක් ද නොදකිමි. යුද ඇඳුමින් සැරසුණු ධනුර්ධරයන් ද නොදකිමි.

3965. අමුරන්ද ස්වර්ණද නොදකිමි. දිය අගලකින් වටකරන ලද දුර්ගම වූ දැඩි අටලු හා කොටු ඇති යහපත්කොට තනනලද නගරයක්ද නොදකිමි. සුමුඛය, යම් තැනෙක්හි පැමිණියේ බිය විය යුත්තෙහි බිය නො වෙහි ද, එබඳු තැනක් නොදකිම් යි රජතෙම කීය.

3966. මහරජ, මට රැකවරණය කරගෙන සිටින්නාවූ පිරිසෙන් ප්‍රයෝජනයක් නැත. නුවරින් හෝ ධනයෙන්ද ප්‍රයෝජනයක් නැත. අහසින් ගමන් කරන්නාවූ අපි අමාර්ගයෙහි මාර්ගය තනාගෙන යම්හ.

3967. අපි නුවණැත්තෝය, දක්ෂයෝය, කරුණු සිතන්නෝය යි ඔබ විසින් අසනලද්දමෝ වෙමු. ඉදින් ඔබ සත්‍යයෙහි පිහිටි කෙනෙක් වන්නහු නම් අර්ථ සහිත වචනයක් කියන්නෙමි.

3968. සත්‍ය විරහිතවූ අනාර්‍ය්‍ය වූ බොරු කියන්නා වූ රෞද්‍ර ගති ඇති ඔබට කියනලද සුභාෂිතයක් වුවත් කවර නම් යහපතක් සලසා ද?

3969. (මහරජ,) ඔබ බ්‍රාහ්මණයන්ගේ කීමෙන් මේ ඛෙම් නම් පොකුණ කරවූවහුය. ඔබ විසින් මේ දශ දිශායෙහි ම අභය ද ප්‍රකාශ කරන ලදී.

3970. ඔබගේ පොකුණට බැස පිරිසුදු වූ ප්‍රසන්න ජලය ද බොහෝ වූ ආහාර ද ලබන්නාවූ පක්ෂීන්ට හිංසාවක් නැතැයි (ප්‍රකාශ කරනලදී.)

3971. ඉදං සුත්වාන නිග්ඝොසං ආගතම්හා[1] තවන්තිකෙ,
තෙ තෙ බද්ධසමා[2] පාසෙන එතං තෙ භාසිතං මුසා.

3972. මුසාවාදං පුරක්ඛත්වා ඉච්ඡාලොභඤ්ච පාපකං,
උභොසන්ධිං අතික්කම්ම අසාතං උපපජ්ජති.

3973. නාපරජ්ඣාම සුමුඛ නපි ලොභා වමග්ගහිං,
සුතා ච පණ්ඩිතාත්‍යත්ථ නිපුණාඅත්ථචින්තකා.

3974. අප්පෙවත්ථවතිං වාචං ව්‍යාකරෙය්‍යුං ඉධාගතා,
තථා තං සම්ම නෙසාදෙ වුත්තො සුමුඛ මග්ගහි.

3975. නෙව භීතා[3] කාසිපති උපනීතස්මිං ජීවිතෙ,
භාසෙමත්ථවතිං වාචං සම්පත්තා කාලපරියායං.

3976. යො මිගෙන මිගං හන්ති පක්ඛිං වා පන පක්ඛිනා,
සුතෙන වා සුතං කිණෙ[4] කිං අනරියතරං තතො.

3977. යො ච අරියරුදං භාසෙ අනරියධම්මවස්සිතො,
උභො සො ධංසතෙ ලොකා ඉධචෙව පරත්ථ ච.

3978. න මජ්ජෙථ යසං පත්තො න ව්‍යථෙ[5] පත්තසංසයං,
වායමෙථෙව කිච්චෙසු සංවරෙ විවරානි ච.

3979. යෙ වද්ධා[6] අබ්භාතික්කන්තා සම්පත්තා කාලපරියායං,
ඉධ ධම්මං චරිත්වාන එවෙතෙ[7] තිදිවං ගතා.

3980. ඉදං සුත්වා කාසිපති ධම්මමත්තනි පාලය,
ධතරට්ඨඤ්ච මුඤ්චාහි හංසානං පවරුත්තමං,

3981. ආහරන්තුදකං පජ්ජං ආසනඤ්ච මහාරහං,
පඤ්ජරතො පමොක්ඛාමි ධතරට්ඨං යසස්සිනං.

---

1. අගතම්හ - මජසං.
2. බන්ධසමා - වි. මජසං.
3. භූතා - මජසං. ස්‍යා.
4. කිණ්‍යා - මජසං. කිල්‍යා - ස්‍යා.
5. නබ්‍යාධෙ - මජසං. ස්‍යා.
6. වුඩ්ඪානාබ්භතික්කන්තා - මජසං.
7. එවං තෙ - මජසං. ස්‍යා.

3971. මෙය අසා ඔබගේ සමීපයට (ඔබ විසින් කරවනලද පොකුණට) ආවෙමු. ඒ අපි ඔබගේ පාසයෙන් බැඳුණෙමු. මෙය ඔබ විසින් කියනලද බොරුවයි.

3972. මුසාවාදය පෙරදැරි කොට ලාමක වූ ඉච්ඡා සංඛ්‍යාත ලොභය ද කොට දෙව් මිනිස් යන ප්‍රතිසන්ධි දෙක ඉක්මවා නිරයෙහි උපදින්නේය යි (සුමුඛයා රජුට ලජ්ජා ඉපදවීය.)

3973. එම්බා සුමුඛය, තොපට අපරාධ නොකරමු. ලොභයෙන්ද තොප නොගත්තෙමි. තෙපි පණ්ඩිතයෝය, දක්ෂයෝය, අර්ථ-චින්තකයෝ යී අසනලද්දේ ද වෙයි.

3974. මෙහි පැමිණියාවූ තෙපි අර්ථ සහිත වචන ප්‍රකාශ කරන්නාහු නම් යෙහෙකැයි සිතුවෙමි. යහළු සුමුඛය, ඒ පිණිස මා විසින් කියන ලද වැද්ද තොප අල්ලා ගත්තේය.

3975. කසී රජුනි, මරණයට ළංවූ කල්හි බියවූවමෝ ජීවිතාව-සානයට පත්වූවමෝ අර්ථවත් වචන කියන්නෙමු.

3976. මනාව පුරුදු කරන ලද යමෙක් දීපක මුවකු කරණකොට ගෙන මුවකු නසයි ද, දීපක පක්ෂියකු කරණකොටගෙන පක්ෂියකු නසයිද, නිර්භයයයි ප්‍රසිද්ධ (දීපක මෘග සදෘශ) පියුම් විලකින් ධර්මකථිකයෙකැයි අසන ලද කෙනකුට හිංසා කරයිද, ඊට වඩා අනාර්‍යවූ කුමක් ඇත් ද?

3977. යමෙක් අනාර්‍ය ධර්මයෙහි පිහිටියේ ආර්‍ය වචන කියයිද, හෙතෙම මෙලෝ පරලෝ යන උභය ලොකයෙන ම පිරිහෙන්නේය.

3978. යමෙක් යසසට පැමිණ මත් නොවන්නේ ද ජීවිත සංසයට පැමිණි නමුදු චිත්ත පීඩාවට නො පැමිණෙන්නේ ද කටයුතුවල උත්සාහ කරන්නේ ද, තමන්ගේ සිදුරු වසන්නේ ද,

3979. ගුණවෘද්ධ වූ මරණකාලයට පැමිණියා වූ යම් කෙනෙක් මේ මිනිස් ලොව ඉක්මවද්ද, මෙලොව කුශලධර්මයෙහි හැසිර මෙසේ මොවුහු දෙව්ලොවට පැමිණියාහු වෙති.

3980. කශීරජුනි, මෙය අසා තමන් කෙරෙහි ධර්මය රැකගනුව. ධතරට්ඨ නම් හංස රාජයා ද මුදලව යි සුමුඛ කීයේ ය.

3981. පා දෝනා දිය ද, පා ගල්වන තෙල් ද, මා ඇඟි අසුනක් ද ගෙනෙත්වා. යශස් ඇත්තා වූ ධතරට්ඨ නම් හංස රාජයා කුඩුවෙන් මුදන්නෙමි.

3982. තඤ්ච සෙනාපතිං ධීරං නිපුණං අත්ථචින්තකං,
යො සුමුඛො සුඛිතො රඤ්ඤො දුක්ඛිතෙ හොති දුක්ඛිතො.

3983. එතාදිසා[1] ඛො අරහන්ති පිණ්ඩමසනාතු භත්තුනො,
යථායං සුමුඛො රඤ්ඤො පාණසාධාරණො සඛා.

3984. පීඨඤ්ච සබ්බසොවණ්ණං අට්ඨපාදං මනොරමං,
මට්ඨං කාසිකපත්ථිණ්ණං[2] ධතරට්ඨො උපාවිසි.

3985. කොච්ඡඤ්ච සබ්බසොවණ්ණං වෙයග්ඝපරිසිබ්බිතං,
සුමුඛො අජ්ඣුපාවෙක්ඛි ධතරට්ඨස්ස අනන්තරං.

3986. තෙසං කඤ්චනපත්තෙහි පුථූ ආදාය කාසියො,
හංසානං අභිහාරෙසුං අග්ගං රඤ්ඤො පවාසිතං.

3987. දිස්වා අභිහටං අග්ගං කාසිරාජෙන පෙසිතං,
කුසලො ඛත්තධම්මානං තතො පුච්ඡි අනන්තරා.

3988. කච්චි භොතො කුසලං කච්චි භොතො අනාමයං,
කච්චි රට්ඨමිදං ඵීතං ධම්මෙනමනුසිස්සති.

3989. කුසලඤ්චෙව මෙ හංස අථො හංස අනාමයං,
අථො රට්ඨමිදං ඵීතං ධම්මෙනමනුසිස්සති.

3990. කච්චි භොතො අමච්චෙසු දොසො කොචි න විජ්ජති,
කච්චිනු තෙ තවත්ථෙසු නාවකඞ්ඛන්ති ජීවිතං.

3991. අථොපි මෙ අමච්චෙසු දොසො කොචි න විජ්ජති,
අථොපි තෙ මමත්ථෙසු නාවකඞ්ඛන්ති ජීවිතං.

3992. කච්චි තෙ සාදිසී භරියා අස්සවා පියභාණිනී,
පුත්තරූපයසූපෙතා මම ඡන්දවසානුගා.

3993. අථො මෙ සාදිසී භරියා අස්සවා පියභාණිනී,
පුත්තරූපයසූපෙතා මම ඡන්දවසානුගා.

3994. කච්චි රට්ඨං අනුප්පීළං අකුතොචි උපද්දවං,
අසාහසෙන ධම්මෙන සමෙන මනුසිස්සසි[3].

---

1. එදිසො ඛො අරහති – මජසං. සනා.
2. මත්ථිනනං – මජසං. වත්ථිනං – සනා.
3. සමෙනමනුසාසසි – මජසං.

3982. යම් හංසයෙක් රජුගේ සැපතෙහි සුවපත්වූයේ ද, දුකෙහිදී දුඃඛිත වූයේ ද ප්‍රාඥවූ දක්ෂවූ යහපත සිතන්නාවූ ඒ සෙන්පතියා ද මුදන්නෙමි.

3983. යම් සේ මේ සුමුඛ තෙම හංස රජුගේ ප්‍රාණ-සාධාරණ යහළුවා වේද, මෙබන්දෝ ස්වාමියාගේ ආහාරය අනුභව කරන්නට සුදුස්සෝ වෙති.

3984. සියල්ල ස්වර්ණමය වූ පා අටක් ඇති වැඩ අවසන් කළ කශීවස්ත්‍රයෙන් අතුරනලද පුටුවක ධතරට්ඨ නම් හංසරාජයා හිඳ ගත්තේ ය.

3985. සියල්ල ස්වර්ණමය වූ ව්‍යාඝ්‍රසම්න් වටකොට මසනලද කොච්ඡ නම් පුටුවෙහි සුමුඛ තෙමේ ධතරට්ඨ හංසරාජයාට අනතුරුව හිඳගත්තේය.

3986. රජු විසින් පඬුරු පිණිස එවනලද ඒ උතුම් භෝජනය කශීරට වැසි බොහෝ දෙන ස්වර්ණභාජනවලින් ගෙනවුත් හංසයන්ට එළවූහ.

3987. ඉක්බිති කශී රජු විසින් යවනලදුව තමන් වෙත එළවනලද ඒ අග්‍ර භොජනය දැක අනතුරුව, ක්ෂත්‍රියධර්මයන්හි දක්ෂ වූ හංස රජතෙම (එකින් එක) විචාළේ ය.

3988. පින්වත් රජුට යහපත්ද, භවත්හට ආරොග්‍යය තිබේ ද, කිම, සමෘද්ධ වූ මේ රට දැහැමින් අනුශාසනා කරනු ලැබේ ද?

3989. හංසරාජය, මට යහපති, යළි මට ආරොග්‍යයද තිබේ. තවද, සමෘද්ධ වූ මේ රට මා විසින් දැහැමින් අනුශාසනා කරනු ලැබේ.

3990. කිම භවත්හුගේ ඇමතියන් අතර කිසියම් දෙසෙක් නැද්ද? කිම, ඔව්හු ඔබගේ යුද්ධාදි කාර්‍යයන්හි දිවි නොතකා ක්‍රියා කෙරෙද් ද?

3991. මාගේ ඇමතියන් අතර කිසියම් දෙසෙක් නැත. වැලි ඔව්හු මාගේ යුද්ධාදි කාර්‍යයන්හි දිවි නොතකා ක්‍රියාකෙරෙති.

3992. කිම ඔබගේ බිරිය සමාන ජාති ඇත්තී ද, අවවාදක්‍ෂම ද, ප්‍රිය තෙපුල් කියන්නී ද, දරු සම්පතින් රූපයෙන් හා යසසින් සමන්විත ද, ඔබගේ අදහස් අනුව පවත්නී ද?

3993. මාගේ බිරිය සමාන ජාති ඇත්තියකි. අවවාදක්‍ෂමය. ප්‍රිය තෙපුල් කියන්නීය. දරු සම්පතින් රූපයෙන් හා යසසින් ද සමන්විතය. මාගේ අදහස් අනුව පවත්නීය.

3994. කිම, රටවැසියා නො පෙළනු ලැබේ ද? කිසිවකිනුත් උවදුරෙක් නැද් ද? සාහසික නොවූ ඔබ විසින් දැහැමින් සෙමෙන් රට අනුශාසනා කරනු ලැබේ ද?

3995. අථො රට්ඨං අනුප්පීළං අකුතොචි උපද්දවං,
අසාහසෙන ධම්මෙන සමෙන මනුසිස්සති[1].

3996. කච්චි සන්තො අපචිතා අසන්තො පරිවජ්ජිතා,
නො චෙ ධම්මං නිරඞ්කත්වා අධම්මමනුවත්තසි.[2]

3997. සන්තො ච මෙ අපචිතා අසන්තො පරිවජ්ජිතා,
ධම්මමෙවානුවත්තාමි අධම්මො මෙ නිරඞ්කතො,

3998. කච්චි නානාගතං දීඝං සමවෙක්ඛසි ඛත්තිය,
කච්චි න මත්තො මදනීයෙ පරලොකං න සන්තසි.

3999. නාහං අනාගතං දීඝං සමවෙක්ඛාමි පක්ඛිම,
ඨිතො දසසු ධම්මෙසු පරලොකං න සන්තසෙ.

4000. දානං සීලං පරිච්චාගං අජ්ජවං මද්දවං තපං;
අක්කොධං[3] අවිහිංසඤ්ච ඛන්තිඤ්ච අවිරොධනං.

4001. ඉච්චෙතෙ කුසලෙ ධම්මෙ ඨිතෙ පස්සාමි අත්තනි,
තතො[4] මෙ ජායතෙ පීති සොමනස්සඤ්චනප්පකං.

4002. සුමුඛො ච අචින්තෙත්වා විස්සජි ඵරුසං ගිරං,
භාවදොසමනඤ්ඤාය අස්මාකායං විහඞ්ගමො.

4003. සො කුද්ධො ඵරුසං වාචං නිච්ඡාරෙසි අයොනිසො,
යානස්මාසු[5] න විජ්ජන්ති න ඉදං පඤ්ඤවතාමිව.

4004. අත්ථි මෙතං අතිසාරං වෙගෙන මනුජාධිප,
ධතරට්ඨෙ ච බද්ධස්මිං දුක්ඛං මෙ විපුලං අහු.

4005. ත්වං නො පිතාව පුත්තානං භූතානං ධරණීරිව,
අස්මාකං අධිපන්නානං ඛමස්සු රාජකුඤ්ජර.

4006. එතං තෙ අනුමොදම යං භාවං න නිගූහසි,
ඛිලං පභින්දසි පක්ඛි උජුකොසි විහඞ්ගම.

---

1. මනුසිස්සහං – මජසං.
2. මවත්තසි – මජසං.
3. අකොධං – මජසං.
4. අථො – මජසං.
5. යානසෙමසු – මජසං.

3995. රටවැසියා නො පෙළනලදී. කිසිවකිනුත් උවදුරෙක් නැත. සාහසික නොවූ මා විසින් දැහැමින් සෙමෙන් රට අනුශාසනා කරනු ලැබේ.

3996. කිම, ඔබ විසින් ශීලාදි ගුණයුක්ත සත්පුරුෂයෝ පුදන ලද්දහු ද? අසත්පුරුෂයෝ දුරුකරන ලද්දහු ද? ධර්මය හැරදමා අධර්මය අනුව නොපවත්නෙහි ද?

3997. මා විසින් ශීලාදි ගුණයුක්ත සත්පුරුෂයෝ පුදන ලද්දහුය. අසත්පුරුෂයෝ දුරුකරන ලද්දහුය. ධර්මය අනුව ම පවත්නෙමි. මා විසින් අධර්මය දුරුකරනලදී.

3998. මහරජ, කිමෙක්ද, ආයුෂ මඳ බව නො සලකන්නෙහි ද? කිමෙක් ද, මත්වියයුතු රූපාදි අරමුණෙහි මත් නො වන්නෙහි ද? කිමෙක් ද, පරලොවට බිය නැත්තෙහි ද?

3999. පක්ෂිරාජය, මම ආයුෂ මඳ බව සලකන්නෙමි. දශරාජ ධර්මයන්හි පිහිටියෙමි. පරලොවට බිය නො වන්නෙමි.

4000. දන්දීමය, සිල්රැකීමය, පරිත්‍යාගය, ඍජුබවය, මෘදුබවය, උපොසථශීලසමාදන සංඛ්‍යාත තපසය, මෛත්‍රී පූර්වභාග කොට ඇති අක්‍රොධය, කරුණා පූර්වභාගකොට ඇති අවිහිංසාවය, අධිවාසනා සංඛ්‍යාත ක්ෂාන්තිය ය, එකඟබවය.

4001. මෙකී කුශල ධර්මයන් මා කෙරෙහි පිහිටියවුන් බලමි. මට එයින් ප්‍රීතියත්, මහත් සොම්නසත්, පහළ වන්නේය.

4002. මේ සුමුඛ පක්ෂි තෙමේ ද මාගේ ගුණසමුදය නොදැන සිත දූෂ්‍යවන බව නොසලකා මට පරොස් බස් කීයේ ය.

4003. හෙතෙම කිපියේ නුනුවණින් පරොස් බස් පිට කෙළේය. අප කෙරෙහි යම් වරදක් නැත්තේ ද, එහෙයින් සුමුඛගේ මේ කීම නුවණැත්තකුගේ කීමක් මෙන් නො වැටහේයයි (රජතෙමේ කීයේය).

4004. නරශ්‍රෙෂ්ඨය, ධතරට්ඨ හංසරාජයා පාසයෙහි බැඳුණු කල්හි මට මහත් දුකෙක් විය. ඒ දුක් වේගයෙන් මා විසින් එය පමණ ඉක්මවා කරනලද ප්‍රකාශයෙකි.

4005. ශ්‍රෙෂ්ඨ මහරජතුමනි, ඔබ වනාහි දරුවන්ට පියා මෙන්ද, සත්‍වයන්ට පොළොව මෙන්ද, අපට උපකාරය. වරදට යටත් වූ අපට කමා කරනු මැනවි. (සුමුඛ තෙමෙ කීයේ ය).

4006. එම්බා විහඞ්ගම වූ පක්ෂිය, නුඹ යම්හෙයකින් අදහස නොසඟවන්නෙහි ද, සිතෙහි හුල බිඳින්නෙහි ද, ඍජු වූයෙහි ද, එහෙයින් නුඹගේ මේ දෝෂය කමාකරමියි රජතෙම කීයේ ය.

4007. යං කිඤ්චි රතනං අත්ථි කාසිරාජනිවෙසනෙ,
රජතං ජාතරූපඤ්ච මුත්තා වෙළුරියා බහූ.

4008. මණයො සඞ්ඛමුත්තඤ්ච වත්ථකං හරිචන්දනං,
අජිනං දන්තභණ්ඩඤ්ච ලොහං කාළායසං බහුං
එතං දදාමි වො විත්තං ඉස්සරං විස්සජාමි වො.

4009. අද්ධා අපචිතා ත්‍යම්හා සක්කතා ච රථෙසභ,
ධම්මෙසු වත්තමානානං ත්වං නො ආචරියො භව.

4010. ආචරියසමනුඤ්ඤාතා තයා අනුමතා මයං,
තං පදක්ඛිණතො කත්වා ඤාති පස්සෙමරින්දම.

4011. සබ්බරත්තිං චින්තයිත්වා මන්තයිත්වා යථාතථං,
කාසිරාජා අනුඤ්ඤාසි හංසානං පවරුත්තමං.

4012. තතො රත්‍යා විවසනෙ සූරියස්සුග්ගමනං[1] පති,
පෙක්ඛතො කාසිරාජස්ස භවනා[2] තෙ විගාහිසුං.

4013. තෙ අරොගෙ අනුප්පත්තෙ දිස්වාන පරමෙ දිජෙ,
කෙකෙති මකරුං හංසා පුථුසද්දො අජායථ.

4014. තෙ පතීතා පමුත්තෙන භත්තුනා භත්තුගාරවා,
සමන්තා පරිකරිංසු අණ්ඩජා ලද්ධපච්චයා.

4015. එවං මිත්තවතං අත්ථා සබ්බෙ හොන්ති පදක්ඛිණා,
හංසා යථා ධතරට්ඨා ඤාතිසඞ්ඝමුපාගමුන්ති.

මහාහංසජාතක ද්වි.

3. සුධාභොජනජාතකං

4016. *නෙව කිණාමි නපි වික්කිණාමි
න චාපි මෙ සන්නිචයො ච අත්ථි,
සුකිච්ඡරූපං වතිදං පරිත්තං
පත්ථොදනො නාලමයං දුවින්නං.

1. සුරියුග්ගමනං – මජසං.
2. භවනතො – මජසං.

* "නෙව කිණාමි නපි වික්කිණාමි" ත්‍යාදි ඉමා එකවීසති ගාථායො හෙට්ඨා චුද්දසනිපාතෙ කොසියජාතකෙපි දිස්සන්ති. ඉමස්මිම්පි ඨානෙ ආගතා. අට්ඨකථාචරියො පන– "නගුත්තමෙ ගිරිවරෙ ගන්ධමාදනෙ"ති ඉතො පට්ඨාය සුධාභොජනජාතකං දස්සෙසීති.

4007. කශීරජනිවෙස්හි යම්කිසි රත්න සමූහයක් නිදන්කොට ඇත්තේ ද, එනම රිදී ද, රන් ද, මුතු ද, බොහෝ වෛඩූර්‍ය්‍ය ද,

4008. මිණිමුවා බඩු ද, සක් හා මුතු ද, කසීසළු ද, රත්සඳුන් ද, අඳුන් මුව සම් ද, දළමුවා බඩු ද, තඹලෝමුවා බඩු ද, කාල ලොහමය බඩු ද බොහෝ ඇත. මේ වස්තුව ඔබට දෙමි. මේ මාගේ බරණැස් රජයේ ආධිපත්‍යය ඔබට පවරා දෙමි යි (රජතෙම කීය).

4009. ශ්‍රෙෂ්ඨ රජතුමනි, ඔබ විසින් අපි පුදන ලද්දමෝ වෙමු. සත්කාර කරන ලද්දමෝ ද වෙමු. කුශල කර්මපථ ධර්මයන්හි පිහිටා ක්‍රියාකරන්නා වූ අපට ඔබ ආචාර්‍ය්‍ය වනු මැනව.

4010. මහරජ, ආචාර්‍ය්‍ය වූ ඔබ විසින් අනුදන්නාලද අනුමත කරනුලැබූ අපි ඔබ පැදකුණු කොට නැයන් දකිමු යි හංසරජ කීය.

4011. කශීරජතෙම මුළුරැයම, ඔවුන් සමග සුදුසු පරිදි චින්තනය කොට මන්ත්‍රණය කොට උතුම් වූ ඒ හංසයන්ට යැම පිණිස අනුදත්තේය.

4012. ඉන්පසු රාත්‍රිය ඇවෑමෙන් හිරු උදවන වේලෙහි එදෙස බලාසිටි කසීරජුගේ භවනයෙන් ඒ හංසයෝ අහසට නැංගාහ.

4013. නීරොග වූ එහි පැමිණි ඒ උතුම් හංසයන් දැක, හංසයෝ කෙ කෙ යන රාවය කළහ. එයින් මහත් ශබ්දයක් හටගති.

4014. මළ පුඩුවෙන් මිදුණා වූ ස්වාමියා කරණ කොටගෙන තුටු සිත් ඇත්තා වූ ඒ හංසයෝ ස්වාමිගෞරවය ඇත්තාහු "පක්ෂිහු පිහිට ලද්දෝය"යි ඔහු හාත්පස පිරිවරා ගත්හ.

4015. මෙසේ කල්‍යාණමිත්‍රයන් ඇත්තවුන්ගේ සියලු අභිවෘද්ධිය සැලසෙන්නේය. ධතරට්ඨ නම් වූ හංසයෝ යම් සේ නෑ සමූහයා වෙතට පැමිණියාහු ද එමෙනැයි වදාළසේක.

මහාහංස ජාතක යි.

3. සුධාභොජන ජාතකය

4016. මම නො මැ මිලයට ගනිමි. නො ද විකුණමි. මා විසින් රැස්කළ ධනයෙක් ද නැත. මේ අල්ප ආහාරය ද දුකසේ ලබන ලද මැ යැ. මේ පතක් පමණ වූ බත දෙදෙනකුන්ට පමණ නො වෙයි.

4017. අප්පම්හා අප්පකං දජ්ජා අනුමජ්ඣතො මජ්ඣකං,
බහුම්හා බහුකං දජ්ජා අදානං නුපපජ්ජති.

4018. තං තං වදාමි කොසිය දෙහි දානානි භුඤ්ජ ච,
අරියං මග්ගං සමාරුහ නෙකාසී ලභතෙ සුඛං.

4019. මොඝඤ්චස්ස හුතං හොති මොඝඤ්චාපි සමීහිතං,
අතිථිස්මිං යො නිසින්නස්මිං එකො භුඤ්ජති භොජනං.

4020. තං තං වදාමි කොසිය දෙහි දානානි භුඤ්ජ ච,
අරියං මග්ගං සමාරුහ නෙකාසී ලභතෙ සුඛං.

4021. සච්චං තස්ස හුතං හොති සච්චඤ්චාපි සමීහිතං,
අතිථිස්මිං යො නිසින්නස්මිං නෙකො භුඤ්ජති භොජනං.

4022. තං තං වදාමි කොසිය දෙහි දානානි භුඤ්ජ ච,
අරියං මග්ගං සමාරුහ නෙකාසී ලභතෙ සුඛං.

4023. සරඤ්ච ජුහති යො සො බහුකාය ගයාය ච,
දොණෙ තිම්බරුතිත්ථස්මිං සීඝසොතෙ මහාවහෙ.

4024. අත්‍ර චස්ස හුතං හොති අත්‍ර චස්ස සමීහිතං,
අතිථිස්මිං යො නිසින්නස්මිං නෙකො භුඤ්ජති භොජනං.

4025. තං තං වදාමි කොසිය දෙහි දානානි භුඤ්ජ ච,
අරියං මග්ගං සමරුහ නෙකාසී ලභතෙ සුඛං.

4026. බලිසං හි සො නිගිලති දීඝසුත්තං සබන්ධනං,
අතිථිස්මිං යො නිසින්නස්මිං එකො භුඤ්ජති භොජනං.

4027. තං තං වදාමි කොසිය දෙහි දානානි භුඤ්ජ ච,
අරියං මග්ගං සමාරුහ නෙකාසී ලභතෙ සුඛං.

4028. උළාරවණ්ණා වත බ්‍රාහ්මණා ඉමෙ
අයඤ්ච වො සුනඛො කිස්ස හෙතු,
උච්චාවචං වණ්ණනිභං විකුබ්බති
අක්ඛාථ නො බ්‍රාහ්මණා කෙනු තුම්හෙ.

4017. අල්පමාත්‍ර දූයින් අල්පමාත්‍රයක් දෙන්නේ යැ. අණුමාත්‍ර අර්ධයෙන් අඩක් දෙන්නේ යැ. බොහෝ දූයින් බොහෝ දූයක් දෙන්නේ යැ. නො දෙනු නො වටනේ යි.

4018. කොසිය සිටාණෙනි, එකරුණෙන් තොපට කියමි: දන් දෙව, වළඳ ද කරව, ආයඝීමාර්ගයට නැඟෙව, එකලා වැ වළඳනුයේ සුව නො ලබා.

4019. යමෙක් ආගන්තුකයකු හුන් කල්හි එකලා වැ බොජුන් බුදී නම් ඔහුගේ හොම සිස් වෙයි. ධනොපායන වීයඝී ද සිස් වෙයි.

4020. කොසිය සිටාණෙනි, එයින් තොපට කියමි. දන් දෙව, වළඳ ද කරව, ආයඝීමාර්ගයට නැඟෙව, එකලා වැ වළඳනුයේ සුව නො ලබා.

4021. යමෙක් ආගන්තුකයකු හුන් කල්හි එකලා වැ බොජුන් නො බුදී නම් ඔහුගේ දනය සත්‍ය වෙයි. ධනොපායන වීයඝී ද සත්‍ය වෙයි.

4022. කොසිය සිටාණෙනි, එයින් තොපට කියමි. දන් දෙව තමා ද වළඳ කරව. ආයඝීමාර්ගයට නැඟෙව. එකලා වැ වළඳ-නුයේ සුව නො ලබා.

4023. යම් පුරුෂයෙක් (ලවණසමුද්‍ර පුෂ්කරණී ආදි) ජලාශයක් කරා එළැඹැ බලිකර්ම කෙරේ ද, බාහුකා නදී යැ ගයාපුෂ්කරණී යැ ද්‍රොණ තීර්‍ථ යැ තිම්බරු තීර්‍ථ යැ මහත් වූ ජලප්‍රවාහ ඇති ශීඝ්‍ර ශ්‍රොතස් යැ යන මෙහි බලිකර්ම කෙරේ ද,

4024. යමෙක් අමුත්තකු හුන් කල්හි එකලා වැ බොජුන් නො බුදී නම් ඔහු විසින් තෙල තන්හි දූ බලිකර්ම කරනලද වෙයි. තෙල තන්හි දූ ධනොපායන වීයඝී කරනලද වෙයි.

4025. කොසිය සිටාණෙනි, එයින් තොපට කියමි: දන් දෙව. තෙමේත් වළඳ කරව, ආයඝීමාර්ගයට නැඟෙව, එකලා වැ වළඳ-නුයේ සුව නො ලබා.

4026. යමෙක් අමුත්තකු හුන් කල්හි එකලා වැ අහර වළඳ කෙරේ ද, හේ දීර්ඝසූත්‍රයක් ඇති බන්ධන සහිත වූ බිලියක් ගිලියි.

4027. කොසිය සිටාණෙනි, එයින් තොපට කියමි: දන් දෙව, තෙමේ ද වළඳ කරව, ආයඝීමාර්ගයට නැඟෙව, එකලා වැ වළඳ-නුයේ සුව නො ලබා.

4028. මේ බ්‍රාහ්මණයෝ උදරවර්ණ ඇතියාහු මැ යැ. තොපගේ මේ සුනඛ තෙම කවර හෙයින් උස්පහත් පැහැසටහන් විකුර්වණ (නිර්මාණ) කෙරේ ද? බ්‍රාහ්මණයාණෙනි, අපට කියව, තෙපි කවරහු ද?

4029. චන්දො ච සූරියො ච උභො ඉධාගතා
අයං පන මාතලි දෙවසාරථී,
සක්කොහමස්මි තිදසානමින්දො
එසො ච ඛො පඤ්චසිඛොති වුච්චති.

4030. පාණිස්සරා මුතිඞ්ගා ච මුරජාළම්බරානි ච,
සුත්තමෙනං පබොධෙන්ති පටිබුද්ධො ච නන්දති.

4031. යෙ කෙචිමෙ මච්ඡරිනො කදරියා
පරිභාසකා සමණබ්‍රාහ්මණානං,
ඉධෙව නික්ඛිප්ප සරීරදෙහං
කායස්ස භෙදා නිරයං වජන්ති.

4032. යෙ කෙචිමෙ සුගතිමාසසානා
ධම්මෙ ඨිතා සංයමෙ සංවිභාගෙ,
ඉධෙව නික්ඛිප්ප සරීරදෙහං
කායස්ස භෙදා සුගතිං වජන්ති.

4033. ත්වං නො ඤාති පුරිමාසු ජාතිසු
සො මච්ඡරී රොසකො පාපධම්මො,
තවෙව අත්ථාය ඉධාගතම්හා
මා පාපධම්මො නිරයං අපත්ථ.

4034. අද්ධා හි මං වො හිතකාමා යං මං සමනුසාසථ,
සොහං තථා කරිස්සාමි සබ්බං වුත්තං හිතෙසිභි.

4035. එසාහමජ්ජෙව උපාරමාමි
න චාපහං කිඤ්චි කරෙය්‍ය පාපං,
න චාපි මෙ කිඤ්චි අදෙය්‍යමත්ථි
න චාපි දත්වා උදකම්පහං පිබෙ.

4036. එවඤ්ච මෙ දදතො සබ්බකාලං
භොගා ඉමෙ වාසව ඛීයිස්සන්ති,
තතො අහං පබ්බජිස්සාමි සක්ක
හිත්වාන කාමානි යථොධිකානීති.

4037. නගුත්තමෙ ගිරිවරෙ ගන්ධමාදනෙ
මොදන්ති තා දෙවවරාභිපාලිතා,
අථාගමා ඉසිවරො සබ්බලොකගූ
සුපුප්ඵිතං දුමවරසාඛමාදිය.

4029. සඳ හිරු දෙදෙන මෙහි ආහ. මේ වූකලි දෙවසාරථී වූ මාතලී වෙයි. මම තිදස්වැසි දෙවියනට අධිපති සක්දෙව්රජ වෙමි. තෙල තැනැත්තේ පඤ්චසිඛ යැ යි කියනු ලැබේ.

4030. අත්තල නාදයෝ ද මිහිඟුබෙර හඬ ද මුරජ බෙර හඬ ද පණාබෙර හඬ ද නිදිගත් මොහු පුබුදු කෙරෙති. පිබිදියේ තුටු වේ.

4031. යම්කිසි කෙනෙක් මසුරු වූවාහු තදමසුරු වූවාහු මහණ බමුණන්ට පිරිහෙළා කථා කරන්නාහු වෙත් ද, ඔහු ශරීර සංඛ්‍යාත දෙහය මෙලොව්හි මැ බහාතබා කාබුන් මරණින් මතු නිරයට යති යි.

4032. යම්කිසි කෙනෙක් සුගතිය පතන්නාහු සංයම සංඛ්‍යාත දශශීලධර්‍මයෙහි ද සංවිභාග සංඛ්‍යාත දනධර්‍මයෙහි ද සිටියාහු වෙත් ද, ඔහු ශරීර සංඛ්‍යාත දෙහය මෙලොව්හි මැ බහාතබා කායභෙදයෙන් මතු සුගතියට යති යි.

4033. තෙපි පූර්වජාතියෙහි අපගේ ඥාති යැ. ඒ තොපි මසුරු වවු. රොස්පරොස් බස් ඇතියහු. පාපධර්‍ම ඇතියහු යැ. තොපට වැඩ සඳහා මැ මෙහි ආම්හ. පාපධර්‍ම ඇතියහු නිරයට නො යවු.

4034. යම්හෙයෙකින් තෙපි මට මැනැවින් අනුශාසනා කරවු ද, එහෙයින් එකාන්තයෙන් මැ තෙපි මට හිත කැමැත්තවු යැ. හිත කැමැතියන් විසින් කියනලද සියල්ල ඒ මම එසේ මැ කරන්නෙමි.

4035. තෙල මම් අද මැ මසුරු බැවින් වෙන් වෙමි. මම කිසි පවකුදු නො කරමි. (මෙතැන් පටන්) නො දියයුතු කිසිවක් මට නැත. කිසිවක්හට නො දී මම දියපතකුදු නො බොමි.

4036. සක්දෙව්රජුනි, හැම කල්හි දෙන්නා වූ මාගේ මේ භොගයෝ ක්‍ෂය වන්නාහ. සක්දෙව්රජුනි, එකල්හි මම (වස්තුකාම ක්ලෙශකාම විසින්) ශෙෂ වැ සිටි කාමයන් හැරපියා පැවිදි වන්නෙමි යි.

4037. පර්වතයන්ට අධිපති වූ ගන්ධමාදන නම් උතුම් පර්වතයෙහි සක් දෙවිඳුන් විසින් රක්නා ලද ඒ දිව්‍යස්ත්‍රීහු සන්තොෂ වෙති. එවිට මුළුලොවැ යා හැකි ඍෂිවරයෙක් මනාව පිපීගිය ශාඛා පුෂ්පයක් ගෙන පැමිණියේ ය.

4038. සුචිං සුගන්ධං තිදසෙහි සක්කතං
පුප්ඵුත්තමං අමරවරෙහි සෙවිතං,
අලද්ධ මච්චෙහි වා දානවෙහි වා
අඤ්ඤත්‍ර දෙවෙහි තදරහං හිදං.

4039. තතො චතස්සො කනකත්තචූපමා
උට්ඨාය නාරියො පමදාධිපා මුනිං,
ආසා ච සද්ධා ච තතො සිරි හිරි
ඉච්චබ්‍රවුං නාරද දෙවබ්‍රාහ්මණං.

4040. සචෙ අනුද්දිට්ඨං තයා මහාමුනි
පුප්ඵං ඉමං පාරිඡත්තස්ස බ්‍රහ්මෙ,
දදහි නො සබ්බගති තෙ ඉජ්ඣතු
තුවම්පි නො හොහි යථෙව වාසවො.

4041. තං යාචමානාභිසමෙක්ඛ නාරදො
ඉච්චබ්‍රවී සඞ්කලහං උදීරයි,
න මය්හමත්ථී ඉමෙහි කොචිනං
යා යෙව වො සෙය්‍යසී සා පිළය්හථ[1].

4042. ත්වං නොත්තමොවාභිසමෙක්ඛ නාරද,
යස්සිච්ඡසි තස්සං අනුප්පවෙච්ඡසු,
යස්සා හි නො නාරද ත්වං පදස්සසි
සා යෙව නො හොහිති සෙට්ඨසම්මතා.

4043. අකල්ලමෙතං වචනං සුගත්තෙ
කො බ්‍රාහ්මණො කො කලහං උදීරයෙ,
ගන්ත්වාන භූතාධිපමෙව පුච්ඡථ
සචෙ න ජානාථ ඉධුත්තමාධමං.

4044. තා නාරදෙන පරමප්පකොපිතා
උදීරිතා වණ්ණමදෙන මත්තා,
සකාසෙ[2] ගන්ත්වාන සහස්සචක්ඛුනො
පුච්ඡිංසු භූතාධිපං කා නු සෙය්‍යසී.

4045. තා දිස්වා ආයත්තමනා පුරින්දදො
ඉච්චබ්‍රවී දෙවවරො කතඤ්ජලී,
සබ්බාව වො හොථ සුගත්තෙ සාදිසී
කො නෙව භද්දෙ කලහං උදීරයි.

1. පිළන්ධථ – වි. මජසං.
2. සකාසං – මජසං.

4038. දෙවියන් විසින් සත්කාර කරනලද්ද වූ ද, ශක්‍රයා විසින් සෙවුනා ලද්ද වූ ද, පිරිසුදු සුවඳැති මේ උතුම් මල දෙවියන් මිස මිනිසුන් විසින් හෝ අසුරයන් විසින් හෝ නොලද හැකිය. එය දෙවියන්ට ම සුදුසු වේ.

4039. ඉක්බිති රන්බඳු සිවිය ඇති ස්ත්‍රීන්හට අධිපතිවූ ආසාය, සද්ධාය, සිරි ය, හිරිය යන මේ ස්ත්‍රීහු සතරදෙන නැගිට නාරද දෙව බ්‍රාහ්මණ නම් වූ මුනිවරයාට මෙසේ කීහ.

4040. මහා ඍෂි වූ බ්‍රාහ්මණය, ඉදින් ඔබ විසින් මේ පරසතු මල කිසිවකුට නො උදෙසනලද නම් අපට දෙනුමැනවි. ඔබ වහන්සේගේ සියලු අදහස් සමෘද්ධ වේවා. අපට ශක්‍ර තෙම යම් සේ වේ ද ඔබ වහන්සේ ද එසේ ම වේත්වා.

4041. නාරද තෙම ඒ මල දක ඉල්ලන්නවුන්හට මෙසේ කීවේ ය. මහත් කලහ වැඩෙන කථාවක් ඇති විය. මට මේ මලින් කිසි වැඩක් නැත. නුඹලා අතුරින් යම් තැනැත්තියක් ගුණයෙන් ජ්‍යෙෂ්ඨ වූ නම් ඕ පැළඳගන්නීය යි ඍෂි තෙම කීවේ ය.

4042. උතුම් නාරද ඍෂිවරය, නුඹවහන්සේ ම අප බලා අප අතුරින් යම් තැනැත්තියකට දෙනු කැමැත්තේ නම් ඇට දුන මැනැවි. නාරද ඍෂිවරය, නුඹ වහන්සේ අප අතුරින් යම් තැනැත්තියකට දෙන්නහු නම් අප අතුරින් ඕ තොමෝ ම ශ්‍රෙෂ්ඨ සම්මත වන්නීය යි කීහ.

4043. මනා සිරුරත්තිය, ඒ කීම නුසුදුසු ය. කවර නම් බ්‍රාහ්මණයෙක් කලහ ඇති කෙරේ ද? ඉදින් මෙහි තොප අතුරින් උත්තම වූ හෝ අධම වූ හෝ තැනැත්තිය කවරීද යි නොදන්නහු නම් භූතාධිපති වූ සක්දෙව්රජු වෙත ගොස් විචාරව යි ඍෂිතෙම කීයේ ය.

4044. නාරද ඍෂිවරයා විසින් (කුසුම නො දෙමින්) ඉතා ම කුපිත කර වූ, සක්දෙව්ඳුගෙන් අසවැ යි කියනලද වර්ණමදයෙන් මත් වූ ඒ අප්සරාවෝ සක්දෙව්රජු සමීපයට ගොස් කවර නම් තැනැත්තියක් ශ්‍රෙෂ්ඨ දැ යි විචාළහ.

4045. දෙවියනට ශ්‍රෙෂ්ඨ වූ දෙවියන් විසින් ඇඳිලි බඳනාලද ශක්‍ර තෙම උත්සුක වූ සිත් ඇති ඒ අප්සරාවන් දක මෙසේ කීයේ ය. මනා සිරුරු ඇති අප්සරාවනි, තෙපි හැම දෙන ම සමානවවු. සුන්දර අප්සරාවරුනි, මෙසේ කවර කෙනෙක් කලහ වර්ධනය කළෝ ද? කියා යි.

4046. යො සබ්බලොකං චරකො මහාමුනි
ධම්මෙ ඨිතො නාරදෙ සච්චනික්කමො,
සො නො බ්‍රවී ගිරිවරෙ ගන්ධමාදනෙ
ගච්ඡාත භූතාධිපමෙව පුච්ඡථ
සචෙ න ජානාථ ඉධුත්තමාධමං.

4047. අසු බ්‍රහාරඤ්ඤචරො මහාමුනී
නාදත්වා භත්තං වරගත්තෙ භුඤ්ජති,
විචෙය්‍ය දානානි දදාති කොසියො
යස්සා හි සො දස්සති සාව සෙය්‍යසී.

4048. අසූහි යො සම්මති දක්ඛිණං දිසං
ගඞ්ගාය තීරෙ හිමවන්තපස්සනී,
ස කොසියො දුල්ලභපානභොජනො
තස්ස සුධං පාපය දෙවසාරථි.

4049. ස මාතලී දෙවවරෙන පෙසිතො
සහස්සයුත්තං අභිරුය්හ සන්දනං,
ස ඛිප්පමෙව උපගම්ම අස්සමං
අදිස්සමානො මුනිනො සුධං අදා[1].

4050. උදග්ගිහුත්තං උපතිට්ඨතො හි මෙ
පභඞ්කරං ලොකතමොනුදුත්තමං,
සබ්බානි භූතානි අතිච්ච වාසවො
කො නෙව මෙ පාණිසු කිං සුධොදහි.

4051. සංඛූපමං සෙතමතුල්‍යදස්සනං
සුචිං සුගන්ධං පියරූපමබ්භුතං,
අදිට්ඨපුබ්බං මම ජාත[2]චක්ඛුහි
කා දෙවතා පාණිසු කිං සුධොදහි.

4052. අහං මහින්දෙන මහෙසි පෙසිතො
සුධාභිහාසිං තුරිතො මහාමුනි,
ජානාසි මං මාතලි දෙව සාරථි
භුඤ්ජස්සු භත්තුත්තමං මා විචාරයි[3].

4053. භුත්තා ච සා ද්වාදස හන්ති පාපකෙ
ඛුදං පිපාසං අරතිං දරක්ලමං[4],
කොධූපනාහඤ්ච විවාදපෙසුනං
සීතුණ්හතන්දිඤ්ච රසුත්තමං ඉදං.

1. අදසි - මජසං.
2. ජාතු - මජසං.
3. මාභිචාරයි - මජසං.
4. දරථක්ලමං - මජසං, දූරක්කමං - වි. දරථං කිලං - සයා.

4046. සත්‍ය වූ පරාක්‍රම ඇති ධර්මයෙහි පිහිටි මුළු ලොව හැසිරෙන්නා වූ නාරද නම් යම් ඍෂිවරයෙක් වේ ද හේ තොප අතුරින් උත්තම හෝ අධම තැනැත්තිය කවර දැ යි නොදනිවු නම්, ශක්‍රයා වෙතට ගොස් අසව යි ගන්ධමාදන නම් උතුම් පර්වතයෙහි දී අපට කීයේ යයි ඒ අප්සරාවෝ කීහ.

4047. උතුම් සිරුරැති දිව්‍යාංගනාවරුනි, තෙල මහවනයෙහි හැසිරෙන මහාමුනි තෙම අන්හට නොදී වළඳ නොකරයි. ඒ කොසිය තාපස තෙම පරීක්‍ෂා කොට දන් දෙයි. හෙ තෙම තොපගෙන් යම් තැනැත්තියකට දෙන්නේ නම් ඕ තොමෝ ම ශ්‍රෙෂ්ඨ වේ යයි ශක්‍ර තෙම කීයේ ය.

4048. දෙව සාරථිය, යම් තාපසයෙක් දකුණු දිග ගං ඉවුරෙහි හිමවත් පාර්ශ්වයෙහි වාසය කෙරේ ද, ඒ කොසිය තාපස තෙම දුර්ලභ ආහාර පාන ඇත්තේ ය. ඔහුට සුධාභොජනය පමුණුව යි කීයේ ය.

4049. දෙවොත්තමයා විසින් යවනලද ඒ මාතලි දිව්‍යපුත්‍ර තෙම දහසක් අසුන් යෙදූ යානයට නැඟ වහා අසපුවට පැමිණ අදෘශ්‍යමාන වූයේ ඍෂිවරයාහට සුධාභොජනය දුන්නේ ය.

4050. උදැසන ගිනි දෙවියා පුදා ලොකාන්ධකාරය දුරු කරන්නා වූ පභංකර වූ උතුම් හිරු වෙත එළඹ සිටි මාගේ අත්වල කවරෙක් සුධාභොජනය බහාලී ද? කිම, සියලු භූතයන් ඉක්මවා සිටින ශක්‍ර තෙමේ ද?

4051. සක් ගෙඩියක් මෙන් සුදු වූ අසමාන වූ දකුම් ඇති පිරිසුදු සුවඳවත් දකුම්කලු වූ අද්භූත වූ පියවි ඇසින් නො දක්නා ලද විරූ සුධාභොජනය කවර නම් දෙවියෙක් කවර හෙයින් මා අතැ තැබීදැ යි ඍෂිවරයා ප්‍රශ්න කෙළේ ය.

4052. මහර්ෂි වූ මහා මුනිවරය, මම වනාහි සක්දෙව් රජු විසින් මෙහෙයවන ලද්දෙම් වහා සුධාභොජනය ගෙන ආයෙමි. මා දෙවසාරථී වූ මාතලී බව දනුමැනවි. උතුම් බත වළඳනු මැනවි. ප්‍රපඤ්ච නො කරව.

4053. වළඳන ලද්දා වූ ඒ සුධාභොජනය බඩගින්න ය, පිපාස ය, නො ඇල්ම ය, කායදරථ ය, ක්ලාන්තගති ය, කොප ය, බද්ධ වෛර ය, විවාද ය, කේලාම් කීම ය, සීත ය, උෂ්ණ ය, අලස බව ය යන දෙළොස් පාපධර්මයන් නසන්නේ ය.

4054. න කප්පති මාතලි මය්හ භුඤ්ජිතුං
පුබ්බෙ අදත්වා ඉති මෙ වතුත්තමං,
න චාපි එකාසනමරියපූජිතං
අසංවිභාගී ච සුඛං න වින්දති.

4055. ථීඝාතකා යෙචිමෙ පාරදරිකා
මිත්තද්දූනො යෙච සපන්ති සුබ්බතෙ,
සබ්බෙච තෙ මච්ඡරිපඤ්චමාධමා
තස්මා අදත්වා උදකම්පි නාස්මියෙ.

4056. යො හිත්ථියා වා පුරිසස්ස වා පන
දස්සාමි දානං විදුසම්පවණ්ණිතං,
සද්ධා වදඤ්ඤූ ඉධ වීතමච්ඡරා
භවන්ති හෙතෙ සුචිසම්මසම්මතා[1].

4057. අතො මුතා[2] දෙවවරෙන පෙසිතා
කඤ්ඤා චතස්සො කනකත්තචූපමා,
ආසා ච සද්ධා ච සිරී තතො හිරී
තං අස්සමං ආගමුං යත්ථ කොසියො.

4058. තා දිස්වා සබ්බො පරමප්පමොදිතො
සුභෙන වණ්ණෙන සිඛාරිවග්ගිනො,
කඤ්ඤා චතස්සො චතුරො චතුද්දිසා
ඉච්චබ්‍රවී මාතලිනො ච සම්මුඛා.

4059. පුරිමං දිසං කා ත්වං පභාසි දෙවතෙ
අලඞ්කතා තාරවරාව ඔසධී,
පුච්ඡාමි තං කඤ්චනවෙල්ලිවිග්ගහෙ
ආචික්ඛ මෙ ත්වං කතමාසි දෙවතා[3].

4060. සිරාහං දෙවී[4] මනුජෙසු පූජිතා
අපාපසත්තූපනිසෙවිනී සදා,
සුධාවිවාදෙන තවන්තිමාගතා
තං මං සුධාය වරපඤ්ඤ භාජය.

4061. යස්සාහමිච්ඡාමි සුධං මහාමුනි
ස[5] සබ්බකාමෙහි නරො පමොදති,
සිරීති[6] මං ජානහි ජූහතුත්තම
තං මං සුධාය වරපඤ්ඤ භාජය.

---

1. සුචිසච්ච – වි. මජසං. සයා.
2. මතා – මජසං. සයා.
3. දෙවතෙ – මජසං.
4. දෙව – මජසං.
5. සො – වි. මජසං. සයා.
6. සිරිතූ – මජසං සිරිහි – වි.

4054. එම්බා මාතලිය, පළමුකොට නොදී වැළඳීම මට කැප නැත. මෙසේ මගේ උතුම් ව්‍රතයෙක් ඇත. එකලා වැ වැළඳීම ආර්‍ය්‍යයන් විසින් නො පුදන ලද්දෙ යැ. බෙදගෙන නොවළඳන තැනැත්තේ දෙව් මිනිස් සුව නො විඳියි.

4055. ස්ත්‍රීන් නසන, පරදරාවන් කරා යන මේ යම් කෙනෙකුත් වෙත් ද, මිත්‍රද්‍රෝහී යම් කෙනෙකුත් වෙත් ද, දැහැමි මහණ බමුණන්ට ආක්‍රෝශ කරන යම් කෙනෙකුත් වෙත් ද, මසුරු කම පස් වැනි කොට ඇති ඒ හැම දෙන අධමයෝ ය. එහෙයින් නොදී දිය පවා නො බොමි.

4056. යම්බඳු මම ස්ත්‍රියකට හෝ පුරුෂයකුට හෝ බුද්ධාදි පණ්ඩිතයන් විසින් වර්ණනා කරනලද දනය දෙමි ද එසේ මේ ලෝකයෙහි සැදැහැති ප්‍රතිග්‍රාහකයන්ගේ වචන දන්නා වූ පහව ගිය මසුරු මල ඇති මේ පුරුෂයෝ උතුම් යයි සම්මත වෙති.

4057. ඉක්බිති සක්දෙව් රජු විසින් අනුදන්නාලදු වැ පිටත් කොට හරිනලද, ස්වර්ණයට බඳු සිරුරු සමින් හොබනා වූ ආශාය, ශ්‍රද්ධා ය, ශ්‍රී ය, හ්රී ය යන කන්‍යාවන් සතර දෙන යම් අසපුවෙක්හි කොසිය (තවුස්) තෙම වෙසේ ද ඒ අසපුවට පැමිණියහ.

4058. ශොභන වූ වර්ණයෙන් ගිනිසිළු මෙන් සතර දිශායෙහි සිටියා වූ, දක්ෂ වූ, ඒ දිව්‍යප්සරාවන් සතර දෙන දැක අතිශය ප්‍රීතියට පත් කොසිය තවුස් තෙම මාතලී දිව්‍යපුත්‍රයා හමුවෙහි මෙසේ කීය.

4059. එම්බා දෙව්දුව, උතුම් ඔසධී තරුව මෙන් පෙරදිග බබුළුවන්නා වූ තෝ කිනම් වෙහි ද? රන්රුවකට බඳු සිරුරු ඇත්තිය, තී විචාරමි. තෝ කවර නම් දෙව්දුවක් වෙහිදැයි මට කියව.

4060. හැම කල්හි අලාමක සත්වයන් විසින් සෙවුනා ලබන්නා වූ මිනිසුන් කෙරෙහි පූජ්‍යත්වයට පත් මම ශ්‍රී නම් වෙමි. මහාප්‍රාඥය, සුධාභොජනය පිළිබඳ විවාදයෙන් ඔබ සමීපයට ආමි. ඒ මට සුධාභොජනය දුන මැනවි.

4061. මහාතාපසය, මම යමකුට සැප කැමතිවෙම් ද, ඒ මිනිස් තෙම සියලු කාමසම්පතින් තුටු වෙයි. හෝම කරන්නවුන් අතුරෙන් ශ්‍රේෂ්ඨය, මා ශ්‍රී නමැයි දනුව. මහාප්‍රාඥ තාපසයාණනි, ඒ මට සුධාභොජනය දුන මැනවැ යි කීවාය.

4062. සීලෙන විජ්ජාචරණෙන බුද්ධියා
නරා උපෙතා පගුණා සකම්මුනා,
තයා විහීනා න ලභන්ති කිඤ්චනං
තයිදං න සාධු යදිදං තයා කතං.

4063. පස්සාමි පොසං අලසං මහග්ඝසං
සුදුක්කුලීනම්පි අරූපිමං නරං,
තයානුගුත්තො සිරි ජාතිමං අපි
පෙසෙති දාසං විය භොගවා සුඛී.

4064. තං තං අසච්චං අවිභජ්ජසෙවිනිං
ජානාමි මූළ්හං විදූරානුපාතිනිං,
න තාදියී අරහති ආසනූදකං
කුතො සුධා ගච්ඡ න මය්හ රුච්චසි.

4065. කා සුක්කදාඨා පටිමුත්ත[1]කුණ්ඩලා
චිත්තඞ්ගදා කම්බුවිමට්ඨධාරිනී,
ඔසිත්තවණ්ණං පරිදය්හ සොභසි
කුසග්ගිරත්තං අපිළය්හ මඤ්ජරිං.

4066. මිගීව භන්තා සරචාපධාරිනා
විරාධිතා මන්දමිව උදික්ඛසි,
කො තෙ දුතියො ඉධ මන්දලොචනෙ
න භායසි එකිකා කානනෙ වනෙ.

4067. න මෙ දුතියො ඉධමත්ථි කොසිය
මසක්කසාරප්පභවම්හි දෙවතා,
ආසා සුධාසාය තවන්තිමාගතා
තං මං සුධාය වරපඤ්ඤ භාජය.

4068. ආසාය යන්ති වාණිජා ධනෙසිනො
නාවං සමාරුය්හ පරෙන්ති අණ්ණවෙ,
තෙ තත්ථ සීදන්ති අථොපි එකදා
ජිනාධනා එන්ති විනට්ඨපාභතා.

4069. ආසාය ඛෙත්තානි කසන්ති කස්සකා
වපන්ති බීජානි කරොන්තුපායසො,
ඊතීනිපාතෙන අවුට්ඨිතාය වා
න කිඤ්චි වින්දන්ති තතො ඵලාගමං.

1. පටිමුක්ක - මජසං.

4062. හස්තිශිල්පාදි ශිල්පඥානයෙන් ද වෙදත්‍රය සංඛ්‍යාත විද්‍යායෙන් හා ශීලයෙන් ද බුද්ධිමහිමයෙන් ද යුත් තමහට සුදුසු කෘෂි වණික් ආදි කර්ම ප්‍රගුණකොට ගත්තා වූ මනුෂ්‍යයෝ තීගෙන් තොර වූවාහු ස්වල්ප මාත්‍ර වූ හෝ කවර සැපයක් වත් නො ලබත් ද, තී විසින් කරන ලද මේ යමක් ඇත් නම් එය නො සුදුසු ය.

4063. තී විසින් රකිනු ලබන අලස වූ බොහෝ බුදිනසුලු නීචකුලීන වූ මිනිසෙක් වේ ද, සම්පතින් යුත් සුව දිවියක් ගෙවන කුලීනයෝත් ඔහුගේ දසභාවයට පත් වෙති.

4064. ඒ ස්වභාව සත්‍යය නැති යුක්ති අයුක්ති විභාග නැති වැ සෙවුනා, පණ්ඩිතයන් පහත හෙළන්නා වූ මූඪ වූ තී හඳුනමි. තී වැන්නෝ අසුනක් පැනක් ලබනට වත් නො සුදුසු ය. සුධා-භොජනය ලැබීමට කොයින් සුදුසු වේ ද? මෙතැනින් යව. මට රුචි නො වෙහි යී (තවුසා කීය.)

4065. සුදු දත් ඇති පළඳනාලද කුණ්ඩලාභරණ ඇති විසිතුරු අඟුපළඳනා ඇති වෙසෙසින් මටකරනලද රන්මුවා අබරණ දරන තී වත්කළ දියදහරක් බඳු දිව දුහුලක් හැඳ කුසතණින් දල්වුණු ගිනිසිළුවක් බඳු පත්‍ර සහිත හෝපලු කැනක් කනැ පැළඳ හොබනීය. තො කවරක් ද?

4066. වැද්දකු විසින් විදිනලද පහර වැරද වූ බියපත් මුව දෙනකගේ මඳ බැල්ම මෙන් බලන්නෙහිය. මඳ බැලුම් ඇත්තිය, මෙහි තොපගේ කවර දෙවැන්නෙක් වේ ද? කානන නම් වූ වනයෙහි එකලා වූවා බිය නො වෙහි ද?

4067. කොසිය තවුසාණනි, මෙහි මට දෙවැන්නෙක් නැත. මම් වනාහි තව්තිසා දෙව්ලොව උපන්නියක්මු. ආශා නම් වූ මම සුධාභොජනය කෙරෙහි ආශාව හෙතුකොටගෙන නුඹවහන්සේ සමීපයට ආමි. උතුම් ප්‍රඥ ඇති තාපසය, ඒ මට සුධාභොජනය දුන මැනවි.

4068. ධන සොයන වෙළෙන්දෝ ධනාශායෙන් නැව් නැග මහසයුරෙහි පරතෙරට යෙත්. ඔවුහු එහි ගිලෙති. වැළි ඇතැම් විට නැසුණු මාර්ගොපකරණ ඇත්තාහු පිරිහුණු ධන ඇත්තෝ වන්නාහ.

4069. ගොවියෝ ආශායෙන් කෙත් සාති. බිජුවට වපුරති. උපාය වශයෙන් නොයෙක් දේ කරති. උවදුරු පැමිණීමෙන් හෝ වැසි නොලැබීමෙන් හෝ එයින් කිසි ප්‍රයෝජනයක් නො විඳිති.

4070. අත්ථනකාරානි කරොන්ති හත්තුසු
ආසං පුරක්ඛත්වා නරා සුඛෙසිනො,
තෙ හත්තුරත්වා අතිගාළ්හිතා පුන
දිසා පනස්සන්ති අලද්ධ කිඤ්චනං.

4071. ජහිත්වා[1] ධඤ්ඤඤ්ච ධනඤ්ච ඤාතකෙ
ආසාය සග්ගාධිමනා සුඛෙසිනො,
තපන්ති ලූඛම්පි තපං චිරන්තරං
කුම්මග්ග[2]මාරුය්හ පරෙන්ති දුග්ගතිං.

4072. ආසා විසංවාදිකසම්මතා[3] ඉමෙ
ආසෙ සුධාසං[4] විනයස්සු අත්තනි,
න තාදිසී අරහති ආසනූදකං[5]
කුතො සුධා ගච්ඡ න මය්හ රුච්චසි.

4073. දද්දල්ලමානා යසසා යසස්සිනී
ජීඝඤ්ඤ[6]නාමව්හයනං දිසං පති,
පුච්ඡාමි තං කඤ්චනවෙල්ලිවිග්ගහෙ
ආචික්ඛ මෙ ත්වං කතමාසි දෙවතා[7].

4074. සද්ධාහං දෙවී[8] මනුජෙසු පූජිතා
අපාපසත්තූපනිසෙවිනී සදා,
සුධාවිවාදෙන තවන්තිමාගතා
තං මං සුධාය වරපඤ්ඤ භාජය.

4075. දනං දමං චාගමථොපි සංයමං
ආදය සද්ධාය කරොන්ති හෙකදා,
ථෙය්‍යං මුසාකූටමථොපි පෙසුනං
කරොන්ති හෙකෙ පුන විච්චුතා තයා.

4076. හරියාසු පොසො සදිසීසු පෙක්ඛවා
සීලූපපන්නාසු පතිබ්බතාසුපි,
විනෙත්වා ඡන්දං කුලධීතියාසුපි
කරොති සද්ධං පන[9] කුම්භදාසියා.

---

1. හිත්වාන – මජසං.
2. කුමග්ග – මජසං.
3. විසංවාදක – මජසං.
4. සුධාය – මජසං.
5. ආසනූදකං – මජසං.
6. දීඝඤ්ඤ – මජසං.
7. දෙවතෙ – මජසං.
8. දෙව – මජසං.
9. පුන – වි,

4070. සැප සොයන්නා වූ මනුෂ්‍යයෝ ආශාව පෙරදැරි කොට ස්වාමිවරුන් පිණිස යුදබිමහි වීයර්‍ය කරති. දැඩි වෙහෙස දරා ක්‍රියා කළ ඔහු නැවත කිසිවකුත් නොලබා පලායන්නාහ.

4071. සැප සොයා ස්වර්ගාරොහණය කරනු කැමැත්තෝ ධාන්‍ය ද ධනය ද නෑදැයින් ද හැර ආශායෙන් බොහෝ කලක් මුළුල්ලේ රූක්‍ෂ වූ තපස් පවා රකිති. ඔවුහු කුමගට වැටී දුගතියට පැමිණෙති.

4072. මේ සත්‍වයෝ ආශාව නිසා රැවැටෙන්නාහ යි සම්මතව ඇත. ආශාවෙනි, තමා කෙරෙහි පවත්නා සුධාභොජන ආශාව දුරුකරව. තී වැන්නෝ අසුන් හා ජලයවත් ලැබීමට සුදුසු නො වෙති. එබැවින් සුධාභොජනය කොයින් ලැබේ ද? යව. තී මට නො රුස්නෙහි ය යි (තාපස තෙම කීය.)

4073. පරිවාර සම්පතින් දිලියෙමින් බටහිර දික්හි සිටින යසස් ඇති තී කිනම් වෙහි ද? රන්රුවකට බඳු සිරුරු ඇත්තිය, ඒ කරුණ තොප විචාරමි. තෙපි එය මට කියව. කිනම් දෙවතාවක් වෙහි ද?

4074. මහත් ප්‍රඥා ඇති තාපසයන් වහන්ස, මිනිසුන් කෙරෙහි සැම කල්හි පූජිත වූ, උසස් සත්‍වයන් විසින් සෙවුනාලද, මම සද්ධා නම් වෙමි. සුධාභොජනය පිළිබඳ විවාදයෙන් නුඹ වහන්සේ වෙත ආමි. ඒ මට සුධාභොජනය දුන මැනව.

4075. ඇතැම් කාලයෙක්හි සත්‍වයෝ තොප හා එක් වූවාහු දන් දීම ය, ඉන්ද්‍රියදමන ය, පරිත්‍යාග ය, සිල්රැකීම ය, යන මේවා කරති. කිසි කලෙක්හි එම සත්‍වයෝ තීගෙන් වෙන් වූවාහු සොරකම ද බොරු කීම ද කූටකර්මය ද කේලාම් කීම ද කෙරෙත්.

4076. සමාන ජාති ඇති සිල්වත් පතිව්‍රතා ගුණොපෙත කුල දුහිතෘන් වන භාර්‍ය්‍යාවන් කෙරෙහි ගිජු වූ පුරුෂ තෙම ඔවුන් කෙරෙහි ආශාව හැරදමා කුම්භදාසියගේ වචනය පවා අදහන්නේය.

4077. ත්වමෙව සද්ධෙ පරදාරසෙවිනී
පාපං කරොසි කුසලම්පි රිඤ්චසි,
න තාදිසී අරහසි ආසනූදකං
කුතො සුධා ගච්ඡ න මය්හ රුච්චසි.

4078. ජිසඤ්ඤුරත්තිං අරුණසම්මුහතෙ
යා දිස්සති උත්තමරූපවණ්ණිනී,
තථූපමා මං පටිභාසි දෙවතෙ
ආචික්ඛ මෙ ත්වං කතමාසි අච්ඡරා.

4079. කාළා නිදසෙරිව අග්ගජාතිව
අනිලෙරිතා ලොහිතපත්තමාලිනී,
කා තිට්ඨසි මන්දමිවාවලොකයං
භාසෙසමානාව ගිරං න මුඤ්චසි.

4080. හිරාහං දෙවී[1] මනුජෙසු පූජිතා
අපාපසත්තූපනිසෙවිනී සදා.
සුධා විවාදෙන තවන්තිමාගතා
සා තං න සක්කොමි සුධම්පි යාචිතුං
කොපිනරූපා විය යාචනිත්ථියා.

4081. ධම්මෙන ඤායෙන සුගත්තෙ ලච්ඡසි
එසො හි ධම්මො නහි යාචනා සුධා,
තං තං අයාචන්තිමහං නිමන්තයෙ
සුධාය යඤ්චිච්ඡසි තම්පි දම්මි තෙ.

4082. සා ත්වං මයා අජ්ජ සකම්හි අස්සමෙ
නිමන්තිතා කඤ්චනවෙල්ලි[2]විග්ගහෙ
තුවං හි මෙ සබ්බරසෙහි පූජියා
තං පූජයිත්වාන සුධම්පි අස්මියෙ.

4083. සා කොසියෙනානුමතා ජුතීමතා
අද්ධා හිරි රම්මං පාවිසියස්සමං,
උදඤ්ඤවන්තං ඵලමරියපූජිතං
අපාපසත්තූපනිසෙවිතං සදා.

4084. රුක්ඛග්ගහණා බහුකෙත්ථ පුප්ඵිතා
අම්බා පියාලා පනසා ච කිංසුකා,
සොභඤ්ජනා ලොද්දමථොපි පද්මකා
කෙකා ච භඞ්ගා තිලකා ච පුප්ඵිතා.

1. දෙව – මජසං.
2. වෙල්ල – මජසං.

4077. ශ්‍රද්ධාවෙනි, පුරුෂයා තීගේ වසයට පැමිණීමෙන් ම පරදර සේවනය කරන හෙයින් තී පරදර සේවනය කරන්නෙහි ය. පව් කරන්නෙහි ය. කුසල් හිස් කරන්නෙහි ය. තී වැන්නෝ අසුන් හා ජලය (පමණකුදු) ලැබීමට නො සුදුසු වෙති. සුධාභොජනය කොයින් ලැබේ ද? යව. තී මට නො රුස්නෙහි ය යි (තවුසා කීය.)

4078. රාත්‍රි කාලයාගේ අවසන්හි අරුණොද්ගමන වේලායෙහි උතුම් රූපයෙන් හා වර්ණයෙන් යුක්ත වූ යම් පූර්වදිශාවක් දක්නා ලැබේ ද, දෙව්දුව, තී එබඳුය යි මට වැටහෙ යි. තී කිනම් අප්සරාවක් දැ යි මට කියව.

4079. නියං සමයෙහි පළමුව හටගත් සුළඟින් කම්පාවන්නා වූ ලේවන් කොළවලින් පිරිවැරුණු කළුවැලක් සේ මඳ බැල්මෙන් යුතුව කවර නම් තැනැත්තියක් සිටින්නේ ද? කථාකිරීමට කැමැත්ත දක්වන්නේ නමුදු වචන නො මුදන්නෙහි ය.

4080. තාපසයන් වහන්ස, මම වනාහි මිනිසුන් කෙරෙහි පූජිත වූ හැම කල්හි අලාමක සත්ත්වයන් විසින් සෙවුනා ලද හිරි නම් දෙවඟන වෙමි. සුධා විවාදයෙන් ඔබ වෙත පැමිණි ඒ මම සුධාභොජන ඉල්ලීමට ද නො හැක්කෙමි. ස්ත්‍රියගේ ඉල්ලීම වූකලී රහසඟ පෙන්වීම බඳු හෙයිනි.

4081. මනා සිරුරු ඇත්තිය, ස්වාභාවික ක්‍රමයෙන් සුධාභොජනය ලබන්නෙහිය. ඉල්ලීමෙන් සුධාභොජනය නො ලබන්නෙහිය. මේ වනාහි ස්වභාව ධර්මය වේ. එහෙයින් නො ඉල්ලන්නා වූ තිට මම සුධාභොජනයෙන් නිමන්ත්‍රණය කරමි. එපමණක් නොව තී යමක් කැමති නම් එය ද තිට දෙමි.

4082. ස්වර්ණරාශියකට බඳු ශරීර ඇත්තිය, ඒ නුඹ අද මා විසින් සිය අසපුවෙහි නිමන්ත්‍රණය කරන ලද්දෙහි ය, තී වනාහි මා විසින් හැම රසයෙන් පිදිය යුත්තී ය. තී පුදා මම ද සුධාභොජනය වළඳන්නෙමි යි (තාපස තෙමෙ කීය.)

4083. අනුභාව සම්පන්න කොසිය තවුසා විසින් අනුදන්නාලද ඒ හිරි නම් දිව්‍යාංගනා තොමෝ ඒ ඒ තැන්හි දිය ඇත්තා වූ, නොයෙක් පලතුරුවලින් ගැවසීගත්තා වූ, නීවරණ දෙෂයෙන් මිදුණු ධ්‍යානලාභීන් විසින් පුදනලද්ද වූ, අලාමක සත්ත්වයන් විසින් සෙවුනා ලද, ආශ්‍රමයට පිවිසියා ය.

4084. මෙහි වනාහි මලින් හා පලින් සැදුම්ලත්, වෘක්ෂ සමූහයෝ බොහෝ වෙති. අඹ ය, මොර ය, කොස් ය, කැල ය, මුරුංගා ය, ලොත් ය, පද්මක ය, කේතක ය, හංග ය, පිපියා වූ එරහැන්ද ය,

4085. සාලා කකුධා බහුකෙත්ථ ජම්බුයො
අස්සත්ථා නිග්‍රොධ මධුකා ච වෙතසා,
උද්දාලකා පාටලීසින්දුවාරකා
මනුඤ්ඤගන්ධා මුචලින්දකෙතකා.

4086. හරෙණුකා වෙළුකා වෙණුතින්දුකා[1]
සාමාක නීවාරමථොපි චීනකා,
මොචා කදලී බහුකෙත්ථසාලියො
පවීහයො ආභුජිනො ච තණ්ඩුලා.

4087. තස්ස ච උත්තරෙ පස්සෙ[2] ජාතා පොක්ඛරණී සිවා,
අකක්කසා අපබ්භාරා[3] සාධු අප්පටිගන්ධියා.

4088. තත්ථ මච්ඡා[4] සන්නිරතා ඛෙමිනො බහුභොජනා,
සිඞ්ගූ සවඞ්කා සකුලා[5] සතවඞ්කා ච රොහිතා
ආලිගග්ගරකාකිණ්ණා පාඨීනා කාකමච්ඡකා.

4089. තත්ථ පක්ඛී සන්නිරතා ඛෙමිනො බහුභොජනා,
හංසා කොඤ්චා මයූරා ච චක්කවාකා ච කුක්කුහා
කුණාලකා බහුචිත්‍රා සිඛණ්ඩී ජීවංජීවකා.

4090. තත්ථ පානායමායන්ති නානාමිගගණා බහූ,
සීහා ව්‍යග්ඝා වරාහා ච අච්ඡකොකතරච්ඡයො.

4091. පලාසාද ච ගවජා මහිසා රොහිතා රුරූ,
එණෙය්‍යා ච වරාහා ච ගණිනො නිඞ්කසූකරා[6].

4092. කදලිමිගා බහූ වෙත්ථ[7] බිළාරා සසකණ්ණිකා
ඡමාගිරි පුප්ඵවිචිත්‍ර සන්ථතා
දිජාභිඝුට්ඨා දිජසඞ්ඝසෙවිතා.

4093. සා සුත්තචා නීලදුමාභිලම්බිතා
විජ්ජු මහාමෙඝරිවානුපජ්ජථ,
තස්සා සුසම්බන්ධ සිරං[8] කුසාමයං
සුචිං සුගන්ධං අජිනූපසෙවිතං
අත්‍රිච්ඡකොච්ඡං හිරිමෙතදබ්‍රවි
නිසීද කල්‍යාණි සුඛයිදමාසනං.

---

1. කෙණුතිණ්ඩුකා – මජසං.
2. උත්තරපස්සෙන – මජසං. සයා.
3. අකක්කසය අපබ්භරා – මජසං.
4. පච්ඡා – මජසං.
5. සඞ්කුලා – මජසං.
6. නීකසූකරා – වී මජසං. සයා.
7. බහුකෙත්ථ – මජසං.
බහු කෙත්ථ – සයා.
8. සූරං – මජසං.

4085. සල් ය, පුණ්ණවර්ණ ය, දඹ ය, ඇසතු ය, නුග ය, මී ය, හොමුවගු ය, ඇසළ ය, පලොල් ය, නික ය, මනා සුවඳැති මිදෙල්ල ය, පංචවිධ කෙතකීවෘක්ෂ ය යන මොහු මෙහි බොහෝ වෙත්.

4086. අපරණ්ණ ගණයට අයත් හරේණුක (නම් ධාන්‍ය) ද වංසචොරක ද වල්මෑ ද තියඹරා[1] ද බොඩහමු ද ඌරුහැල් ද යළි රජමෑ ද ඇටකෙහෙල් ද කෙහෙල් ද හැල් ද නොයෙක් විවර්ග ද භූජපත්‍ර ද ස්වයංජාත සහල් ද මෙහි බොහෝ වෙති.

4087. ඒ අසපුවට උතුරු දෙසින් හටගත් යහපත් පොකුණෙක් ඇත. ඕ අකර්කශ ය. නො සුන් ඉවුරින් යුතු ය. සුවඳ දියෙන් සුවඳවත් ය.

4088. ඒ පොකුණෙහි නිර්භය වූ ගොදුරු සුලභ වූ නිතොර වෙසෙන සිඞ්ගු ය, සවඞ්ක ය, සකුල ය, සතවංක ය, රොහිත ය, ආලි ය, ගග්ගරක ය, පෙටි ය, කාකමච්ඡ ය යන මත්ස්‍යයෝ වෙති.

4089. එහි නිර්භය වූ සුලභ වූ ගොදුරු ඇති හංස ය, කොස් ලිහිණි ය, මොනර ය, සක්වාලිහිණි ය, ඇටිකුකුළු ය, කොවුල් ය, විසිතුරු පියාපත් ඇති බහුචිත්‍ර නම් පක්ෂි ය, ඔසවනලද මුදුන් ඇති මොනර ය, ජීවඤ්ජීවක ය යන පක්ෂීහු නිතර වෙසෙති.

4090. එහි බොහෝ වූ මෘග සමූහයෝ පැන් බීමට එති. එනම් සිංහයෝ ද, ව්‍යාඝ්‍රයෝ ද, ඌරෝ ද, වලස්සු ද, වෘකයෝ ද, කළුහිස්වලස්සු ද,

4091. කඟවෙහෙණහු ද, ගවරු ද, මහිසයෝ ද, රොහිත මෘගයෝ ද, රුරු මුවෝ ද, එණී මුවෝ ද, වරාහ නම් මුවෝ ද ගෝන්නු ද සමූහ වශයෙන් ඇති නිංක නම් ඌරෝ ද,

4092. කෙහෙල්මුවෝ ද, බළල්ලු ද සාවෝ ද කර්ණක මෘගයෝ ද එති. විසිතුරු මල් අතුරනලද භූමියෙහි වූ පිටිපහණ පක්ෂීන් විසින් ඝොෂාකරනලද්දේ පක්ෂි සමූහයා විසින් සෙවුනාලද්දේ ද වෙයි.

4093. මනා සිවි ඇති ඕ තොමෝ නිල්වන් වෘක්ෂශාඛාවන් පරාමර්ශනය කරමින් මහාමෙඝයක් අතරින් දිස්වන විදුලියක් මෙන් පහළවූවා ය. හොඳින් සම්බන්ධ කළ ඌර්ධවභාග ඇති ඉතා කැමතිවිය යුතු කුශතෘණමය කොච්ඡ නම් අසුනක් පිරිසුදු සුවඳැති අඳුන්දිවිසමකින් සෙවුනාලදූ ව පනවා, සුන්දරිය, මේ අසුන සුව වෙයි. මෙහි හිඳගනුව යි හිරි දෙව්දුවට තාපස තෙම කීය.

---

[1] තිණ්ඩුකානි තිම්බරු රුක්ඛා - අට්ඨකථා (තිම්බරුසකා ?)

4094. තස්සා තදා කොච්ඡගතාය කොසියො
යදිච්ඡමානාය ජටාජිනං ධරො,
නවෙහි පත්තෙහි සයං සහූදකං
සුධාභිහාසී තුරිතො මහාමුනි.

4095. සා තං පග්ගය්හ[1] උභොහි පාණිහි
ඉච්චබ්‍රවි අත්තමනා ජටාධරං,
හන්දහං එතරහි පූජිතා තයා
ගච්ඡෙය්‍ය බ්‍රහ්මෙ තිදිවං ජිතාවිනී.

4096. සා කොසියානුමතා ජුතීමතා
උදීරිතා[2] වණ්ණමදෙන මත්තා,
සකාසෙ[3] ගන්ත්වාන සහස්සචක්ඛුනො
අයං සුධා වාසව දෙහි මෙ ජයං.

4097. තමෙන සක්කොපි තදා අපූජයි
සහින්දා ච දෙවා සුර[4]කඤ්ඤමුත්තමං,
සා පඤ්ජලී දෙවමනුස්සපූජිතා
නවම්හි කොච්ඡම්හි යදා උපාවිසි.

4098. තමෙව සංසී පුනරෙව මාතලිං
සහස්සනෙත්තො තිදසානමින්දො,
ගන්ත්වාන වාක්‍යං මම බෲහි කොසියං
ආසාය සද්ධා සිරියා ච කොසිය
හිරී සුධං කෙන මලත්ථ හෙතුනා.

4099. තං සුප්ලවත්ථං උදතාරයී රථං
දද්දල්ලමානං උපකිරිය[5] සාදිසං,
ජම්බොනදීසං තපනෙය්‍ය සන්නිභං
අලඞ්කතං කඤ්චනචිත්තසන්තිකං.

4100. සුවණ්ණචන්දෙත්ථ බහූ නිපාතිතා
හත්ථී ගවස්සා කිකිව්‍යග්ඝදීපියො[6],
එණෙය්‍යකා[7] ලඞ්ඝිමයෙත්ථ පක්ඛියො
මිගෙත්ථ වෙළුරියමයා යුධායුතා[8].

---

1. පටිග්ගය්හ – මජසං.
2. උදීරයි - මජසං.
3. සඞ්කාසෙ – මජසං. සයා.
4. සුර – මජසං.
5. උපකකිරිය – සයා. උපකාරිය – මජසං.
6. කිංපුරිස – මජසං. සයා.
7. ලඞ්ඝ – මජසං. සයා.
8. යුථායුතා – සයා. යුතායුතා – මජසං.

4094. කොවඡ නම් අසුනෙහි හුන් සුධාභොජනය කැමැත්තා වූ ඒ හිරි නම් දෙව්දුවට දළඹඩුලු අඳුන් දිව්සම් දරන කොසිය මහතවුස් තෙම තමා විසින් එකෙණෙහි ගෙනෙනලද නෙළුම්පතින් දක්ෂිණෝදකය සහිත සුධාභොජනය වහා ගෙනවුත් එළවීය.

4095. ඕ තොමෝ එය දෑතින් පිළිගෙන තුටු සිත් ඇත්තී තවුසාට මෙසේ කීවාය. "දැන් මම නුඹ වහන්සේ විසින් එකාන්තයෙන් පුදන ලද්දෙමි. තවුසාණනි, ජයප්‍රාප්ත වූ මම දෙව්ලොවට යන්නෙමි" යි.

4096. කොසිය තවුසා විසින් අනුදන්නාලද අනුභාවසම්පන්න වූ වර්ණමදයෙන් මත් වූ ඒ හිරි නම් දෙව්දුව සක්දෙව්රජුගේ සමීපයට ගොස් "මේ සුධාභොජනය වේ, මට දිනුම දෙව" යි කීවාය.

•

4097. ඇඳිලි බැඳගත් දෙව්මිනිසුන් විසින් පුදනලද ඒ හිරි නම් දෙව්දුව යම් කලෙක්හි අලුත් කොවඡ නම් අසුනෙහි හුන්නී ද එකල්හි ශක්‍ර තෙමේ ද ඒ උතුම් දෙවඟනට පූජා කෙළේ ය. ඉන්ද්‍රයා සහිත සෙසු දෙවියෝ ද (පරසතු මල් ආදියෙන්) ඇය පිදූහ.

4098. නැවත, දෙවියනට අධිපති වූ දහසක් නෙත් ඇති ශක්‍ර තෙම ඒ මාතලී දෙව්පුත්හට මෙසේ කීය. මාතලිය, කොසිය තවුසා වෙත ගොස් මාගේ මේ වචනය කියව. "කොසිය තවුසාණනී, ආසා ය, සද්ධා ය, සිරි ය යන මොවුන් හැර හිරි දෙව්දුව කවර හෙතුවකින් සුධාභොජනය ලැබීද" යි අසව යි (කීය.)

4099. මණ්ඩිත උපකරණයනට අනුකූල ව බබළන්නා වූ ගිනිසිළු බඳු දඹරන්මුවා රියහිස හා අටමඟලින් යුත් සරසනලද ඒ රිය සුවසේ ගමන් සඳහා පිළියෙළ කෙළේ ය.

4100. මේ රියෙහි රන්මුවා සඳරු බොහෝ නෙළනලද යැ. රන්මුවා ඇත් – ගව – අස් – විනුරු – වග – දිවි – ඒණිමුව රූ නෙළන ලද යැ, මෙහි ඉගිලෙන සැහැවි ලිහිණි රූ ඇත. මෙහි වෙරළුමිණිමුවා මෘගයෝ යුද කෙරෙති.

4101. තස්ස රාජහරයො[1] අයොජයුං
දසසතානි සුසූනාගසාදිසෙ,
අලඞ්කතෙ[2] කඤ්චනජාලුරච්ඡදෙ
ආවෙළිකෙ සද්දගමෙ අසඞ්ගිතෙ.

4102. තං යානසෙට්ඨං අභිරුය්හ මාතලි
දසදිසා ඉමා අභිනාදයිත්ථ,
නභඤ්ච සෙලඤ්ච වනප්පතිනි[3] ච
සසාගරං පබ්‍යථයිත්ථ මෙදිනිං[4].

4103. ස ඛිප්පමෙව උපගම්ම අස්සමං
පාවාරමෙකංසකතො කතඤ්ජලී,
බහුස්සුතං වද්ධං[5] විනීතවන්තං[6]
ඉච්චබ්‍රවි මාතලි දෙවබ්‍රාහ්මණං.

4104. ඉන්දස්ස වාක්‍යං නිසාමෙහි කොසිය
දූතො අහං පුච්ඡති තං පුරින්දදො,
ආසාය සද්ධා සිරියා ච කොසිය
හිරී සුද්ධං කෙන මලත්ථ හෙතුනා.

4105. අන්ධා සිරී මං පටිභාති මාතලි
සද්ධා අනිච්චා පන දෙව සාරථී,
ආසා විසංවාදිකසම්මතා හි මෙ
හිරී ච අරියම්හි ගුණෙ පතිට්ඨිතා.

4106. කුමාරියො යාචිමා ගොත්තරක්ඛිතා
ජිණ්ණා ච යා යා ච සභත්තුඉත්ථියො,
තා ඡන්දරාගං පුරිසෙසු උග්ගතං
හිරියා නිවාරෙන්ති සචිත්තමත්තනො.

4107. සඞ්ගාමසීසෙ සරසත්තිසංයුතෙ
පරාජිතානං පතතං පලායිනං,
හිරියා නිවත්තන්ති ජහිත්ව ජීවිතං
තෙ සංපටිච්ඡන්ති පුනා හිරීමනා.

4108. වෙලා යථා සාගරවෙගවාරිණී
හිරායං හි පාපජනං නිවාරණී,
තං සබ්බලොකෙ හිරිමරියපූජිතං
ඉන්දස්ස[7] තං වෙදය දෙවසාරථී.

1. රාජනරියො – සයා. රාජහරයො – මජසං.
2. අථං – මජසං.
3. වනප්පතිඤ්ච – මජසං. සයා.
4. මෙදනිං – මජසං. සයා.
5. වුද්ධං – මජසං.
6. වන්තං – වි. සයා.
7. ඉන්දයෙසතං – මජසං.

4101. බලයෙන් තරුණ ඇතුන් හා සම වූ සරසනලද රන් දල්මුවා උරසැදින් යුත්, ආවෙලි නම් කර්ණාභරණ ඇති, කෙවිටි පහරක් නැති වැ ශබ්ද මාත්‍රයෙන් ම ගමන් කරනසුළු වූ, ශීඝ්‍රගාමී වූ නිල්වන් අස්රජුන් දහසක් ඒ රියෙහි යෙදූහ.

4102. මාතලි නම් දිව්‍යපුත්‍ර තෙම ඒ උතුම් යානයට නැග මේ දශදිශාවන් ඒකනින්නාද කෙළේ ය. අහස ද, පර්වත ද, වන-දෙවු ගස් ද සයුර සහිත පොළොව ද කම්පා කළේ ය.

4103. ඒ මාතලි නම් දිව්‍යපුත්‍ර තෙම වහා ම අසපුවට පැමිණ ඒකස් කොට පොරවනලද දිව්‍යවස්ත්‍ර ඇත්තේ බද්ධාඤ්ජලි වූයේ බහුශ්‍රැත වූ ගුණවෘද්ධ වූ විනීත පැවැත්මෙන් යුත් දෙවියන් සම බ්‍රාහ්මණයාහට මෙසේ කීය.

4104. කොසිය තාපසයාණනි, ශක්‍රයාගේ වචනය අසනු මැනවි. මම ඔහුගේ දූතයෙමි. ශක්‍ර තෙම ඔබ විචාරයි. "කොසිය තාපසයාණනි, ආසාවට ද ශ්‍රද්ධාවට ද ශ්‍රීයට ද වඩා කවර හෙතුවකින් හිරි තොමෝ සුධාභොජනය ලැබූ ද" යනු යි.

4105. මාතලිය, ශ්‍රී තොමෝ (ශිල්ප දන්නා නො දන්නා කවුරුනුත් සේවනය කරන හෙයින්) අන්ධ යැ යි මට වැටහෙයි. ශ්‍රද්ධා තොමෝ (ඒ ඒ වස්තූන් හැර වෙනත් වස්තූන්හි පිහිටන හෙයින්) අනිත්‍ය යැ යි මට වැටහෙයි. ආසාව වනාහි රැවටිලි ඇත්තී යැ යි සම්මත ය. හිරි තොමෝ වනාහි ආර්‍ය්‍යගුණයෙහි පිහිටියා යැ යි.

4106. මාතලිය, ප්‍රවේණිධර්මය රක්නා වූ කුලගෙහි වැඩෙන කුමරියෝ ය, වැන්දඹු ස්ත්‍රීහු ය, ස්වාමිපුරුෂයන් යටතෙහි සිටින ස්ත්‍රීහු ය යන මේ ත්‍රිවිධ ස්ත්‍රීවර්ගයා ම පරපුරුෂයන් අරමුණු කොට තම සිතෙහි හටගත් ඡන්දරාගය හිරියෙන් වළකාලති.

4107. ඊ පහරින් හා අඩයටි පහරින් යුත් යුදබිමෙහි පරදින-වුන් ද වැටෙන්නවුන් ද පලායන්නවුන් ද අතර ලජ්ජායෙන් යුතුවූවාහු ජීවිතය හැරදමා නවතිත්. නැවත ඔවුහු තමන්ගේ ස්වාමියා මුදගනිත්.

4108. සාගරවෙගය වළකාලන වෙරළ මෙන් මේ හිරි තොමෝ ජනයා පවින් වළක්වන්නී ය. දෙවසාරථිය, ඒ හිරි තොම මුළු ලෙවෙහි පුදනලද්දී යැ යි ශක්‍රයාට කියව යි තාපසයා කීය.

4109. කො තෙ ඉමං කොසිය දිට්ඨිමොදහි
බ්‍රහ්මා මහින්දො අථවා පජාපති,
හිරායං දෙවෙසු හි සෙට්ඨසම්මතා
ධීතා මහින්දස්ස මහෙසි ජායථ.

4110. හන්දෙහිදනි තිදිවං සමක්කම[1]
රථං සමාරුය්හ මමායිතං ඉමං,
ඉන්දො ච තං ඉන්දසගොත්ත කඞ්ඛති
අජ්ජෙව ත්වං ඉන්දසහව්‍යතං වජ.

4111. එවං සමිජ්ඣන්ති අපාපකම්මිනො
අථො සුචිණ්ණස්ස ඵලං න නස්සති,
යෙ කෙචි මද්දක්ඛු සුධාය භොජනං
සබ්බෙව තෙ ඉන්දසහව්‍යතං ගතාති.

4112. හිරී උප්පලවණ්ණාසි කොසියො දනපති භික්ඛු,
අනුරුද්ධො පඤ්චසිඛො ආනන්දො ආසි මාතලි.

4113. සූරියො කස්සපො භික්ඛු මොග්ගල්ලානොසි චන්දිමා,
නාරදො සාරිපුත්තොසි සම්බුද්ධො ආසි වාසවොති.

3. සුධාභොජනජාතකං.

4. කුණාල ජාතකං

එවමක්ඛායති, එවමනුසූයති; සබ්බොසධධරණිධරෙ[2] නෙකපුප්ඵමාල්‍යවිතතෙ[3] ගජගවජමහිසරුරුචමරපසදඛග්ග[4]ගොකණ්ණසීහබ්‍යග්ඝදීපිඅච්ඡකොකතරච්ඡඋද්දාරකදලිමිගබිළාරසසකණ්ණකානුචරිතෙ ආකිණ්ණනෙලමණ්ඩලමහාවරාහනාගකුලකරෙණුසඞ්ඝාධිවුත්ථෙ ඉස්සමිගසාඛමිගසරභමිගඑණිමිගවාතමිගපසදමිගපුරිසලුකිම්පුරිසයක්ඛරක්ඛසනිසෙවිතෙ අමජ්ජමඤ්ජරිධරබ්‍රහට්ඨ[5]පුප්ඵපුප්ඵිතග්ගනෙකපාදපගණවිතතෙ[6] කුරරචකොරවාරණමයූර[7]පරභුත[8]ජීවඤ්ජීවක[9]චෙලාවක-

1. අපක්කම - මජසං. සතා. සපක්කම - වි.
2. සබ්බොසථ - මජසං.
3. මල්‍යවිටතෙ - මජසං.
4. මමහිංස - මජසං.
5. පහට්ඨ - මජසං.
6. වීහදෙ - මජසං.
7. වඞ්කොර - මජසං.
8. පරභත - මජසං.
9. ජීවජීවක - මජසං.

4109. කොසිය තාපසය, මේ ලබ්ධිය ඔබගේ සිත්හි කවරෙක් පිහිටුවී ද? බ්‍රහ්මයා ද ශක්‍රයා ද නැතහොත් ප්‍රජාපති නම් දිව්‍ය පුත්‍රයා ද? මහර්ෂිය, ශක්‍රයාගේ දුහිතෘ වූ මේ හිරි තොමෝ දෙවියන් අතර ශ්‍රේෂ්ඨ යැ යි සම්මත වී යැ යි මාතලී දෙව්පිත් කීය.

4110. කොසිය තාපසයන් වහන්ස, එනු මැනවි. මේ දිවියෙන් ච්‍යුත වන නුඹ වහන්සේ මා විසින් ගෙනෙනලද මේ රියට නැග දෙව් ලොවට ගමන් කරන සේක්වා. ඉන්ද්‍රයාට සම ගොත්‍ර ඇති තාපසයන් වහන්ස, ඉන්ද්‍ර තෙමේ ද ඔබගේ පැමිණීම බලාපොරොත්තු වෙයි. නුඹ වහන්සේ අද ම ඉන්ද්‍රයා හා එක්ව විසීමට යනු මැනවැ යි මාතලී දෙව්පිත් කීය.

4111. පව්කම් නැත්තෝ මෙසේ පිරිසුදු වෙති. තවද, මනාව පුරුදු කරනලද කර්මයාගේ විපාකය නො නැසේ. යම් කෙනෙක් ශක්‍රයාගේ සුධාභොජන දනය දුටුහු ද, ඒ සියල්ලෝ ම ශක්‍රයා සමග විසීමට ගියාහු ය.

4112. හිරි දෙව්දූ උප්පලවණ්ණා මෙහෙණ යි. දනපති භික්ෂුව කොසිය තවුස් විය. අනුරුද්ධ ස්ථවිර පංචසිඛ නම් දිව්‍යපුත්‍ර විය. ආනන්ද ස්ථවිර මාතලී රියැදුරු විය.

4113. සූර්‍ය්‍ය දිව්‍යපුත්‍ර නම් කාශ්‍යප භික්ෂු ය. චන්ද්‍ර දිව්‍යපුත්‍ර මොග්ගල්ලාන ස්ථවිර ය. නාරද ඍෂි නම් ශාරිපුත්‍ර ස්ථවිර ය. ශක්‍ර වූයෙම් සම්බුදු වූ මම වේදැ යි වදළසේක.

සුධාභොජන ජාතක යි.

4. කුණාල ජාතකය

එය (එම කුණාල වනෂණ්ඩය) මෙබඳු යැ යි කියනු ලැබේ. මෙබඳු යැ යි අසනු ලැබේ. සකලෞෂධයෙන් යුක්ත වූ පොළෝ තලය ඇති (එලපනක වූ ද පිළන්ධනූපග වූ ද) නොයෙක් පුෂ්පයෙන් සමලංකෘත වූ ඇත්තු ය, ගවරු ය, මහීෂයෝ ය, රන්වන් මුවෝ ය, සෙමරු ය, පසදමුවෝ ය, කඟවෙහෙණු ය, ගෝන්නු ය, සිංහයෝ ය, ව්‍යාඝ්‍රයෝ ය, දිවියෝ ය, වලස්සු ය, වෘකයෝ ය, කළුහිස් වලස්සු ය, උද්දරක නම් මුවෝ ය, කෙසෙල් මුවෝ ය, බළල්ලු ය, සසකණ්ණකයෝ ය යන මොවුන්ගේ නිරතුරු හැසිරීමෙන් යුත්, ගැවසීගත් ඇත්පොවු මඬුල්ලෙන් යුත් මහ ඇතුන් ද දසවැදෑරුම් ඇත්කුලයෙහි ඇතුන් හා ඇතින්නන් සමූහයා ද වාසය කරන්නා වූ, කාලසිංහ ය, ශාඛාමෘග ය, සරහමෘග ය, එණිමෘග ය, මහාවාතමෘග ය, චිත්‍රමෘග ය, වඩවාමුඛයක්ෂිණීහු ය, කිඳුරු ය, යක්ෂ ය, රකුසු ය යන මොවුන් විසින් නිති සෙවුනාලද, මල් කැකුළින් හා මල් පොකුරින් ද සුපිපි මලින් හා අතුඅග (පමණක්) පිපුණු මලින් ද යුත් නන් වැදෑරුම් ගස් සමූහයෙන් පැතිරීගත්තා වූ, උකුසු ඇටිකුළු ඇත්කඳලිහිණි මොනර කොවුල් ජීවඤ්ජීවක චේලාවක

හිඞ්කාරසාරවිකම්මත්තවිගඞ්ගසතසම්පසූතෙ අඤ්ජනමනොසිලාහරිතාලහිඞ්ගුලකහෙමරජතකනකානෙකධාතුසතවිනද්ධපතිමණ්ඩිතප්පදෙසෙ එවරූපෙ ඛලු භො රම්මෙ වනසණ්ඩෙ කුණාලො නාම සකුණො පටිවසති අතිවිය චිත්තො අතිවිය චිත්තපත්තච්ඡදනො. තස්සෙව ඛලු භො කුණාලස්ස සකුණස්ස අඩ්ඪුඩ්ඪානි ඉත්ථිසහස්සානි පරිචාරිකා දිජකඤ්ඤායො. අථ ඛලු භො ද්වෙ දිජකඤ්ඤායො කට්ඨං මුඛෙන ඩසිත්වා[1] තං කුණාලං සකුණං මජ්ඣෙ නිසීදාපෙත්වා උඩ්ඩෙන්ති[2] මා නං කුණාලං සකුණං අද්ධානපරියායපථෙ කිලමථො උබ්බාහෙත්ථාති. පඤ්චසතා දිජකඤ්ඤායො හෙට්ඨතො හෙට්ඨතො ඩෙන්ති සචායං කුණාලො සකුණො ආසනා පරිපතිස්සති මයං තං පක්ඛෙහි පටිග්ගහෙස්සාමාති. පඤ්චසතා දිජකඤ්ඤායො උපරූපරි ඩෙන්ති මා නං කුණාලං සකුණං ආතපො පරිතාපීති[3]. පඤ්චසතා දිජකඤ්ඤායො උභතො පස්සෙන ඩෙන්ති මා නං කුණාලං සකුණං සීතං වා උණ්හං වා තිණං වා රජො වා වාතො වා උස්සාවො වා උපප්ඵුසීති. පඤ්චසතා දිජකඤ්ඤායො පුරතො පුරතො ඩෙන්ති මා නං කුණාලං සකුණං ගොපාලකා වා පසුපාලකා වා තිණහාරකා වා කට්ඨහාරකා වා වනකම්මිකා වා කට්ඨෙන වා කථලාය වා[4] පාණිනා වා (පාසාණෙන වා) ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා සක්ඛරාය වා පහාරං අදංසු, මායං කුණාලො සකුණො ගච්ඡෙහි වා ලතාහි වා රුක්ඛෙහි වා සාඛාහි වා ථම්භෙහි වා පාසාණෙහි වා බලවන්තෙහි වා පක්ඛීහි සඞ්ගාමෙසීති. පඤ්චසතා දිජකඤ්ඤායො පච්ඡතො පච්ඡතො ඩෙන්ති සණ්හාහි සඛිලාහි මඤ්ජූහි මධුරාහි වාචාහි සමුදාචරන්තියො මායං කුණාලො සකුණො ආසනෙ පරියුක්කණ්ඨීති. පඤ්චසතා දිජකඤ්ඤායො දිසොදිසං ඩෙන්ති අනෙකරුක්ඛවිවිධවිකතිඵලමාහරන්තියො මායං කුණාලො සකුණො ඛුදාය පරිකිලමිත්ථාති. අථ ඛලු භො තා දිජකඤ්ඤායො තං කුණාලං සකුණං ආරාමෙනෙව ආරාමං උය්‍යානෙනෙව උය්‍යානං නදීතිත්ථෙනෙව නදීතිත්ථං පබ්බතසිඛරෙනෙව පබ්බතසිඛරං අම්බවනෙනෙව අම්බවනං ජම්බුවනෙනෙව ජම්බුවනං ලබුජවනෙනෙව ලබුජවනං නාළිකෙරසඤ්චාරියෙනෙව නාළිකෙරසඤ්චාරියං ඛිප්පමෙව අභිසම්භොන්ති රතත්ථාය. අථ ඛලු භො කුණාලො සකුණො තාහි දිජකඤ්ඤාහි දිවසං පරිබ්බූළ්හො එවං අපසාදෙති, නස්සථ තුම්හෙ වසලියො විනස්සථ තුම්හෙ වසලියො චොරියො ධුත්තියො අසතියො ලහුචිත්තායො කතස්ස අප්පටිකාරිකායො අනිලො විය යෙනකාමඞ්ගමායොති.

1. ඩංසිත්වා – මජසං. සයා.
2. ඩෙන්ති – මජසං.
3. පරිතාපෙසීති – වි. මජසං. සයා.
4. කඨලාය – මජසං.

හිඞකාර කරවීක යන සිය ගණන් මත් විහඟුන්ගේ නාදයෙන් මනහර වූ, අඳුන් මනොසිලා හිරියල් හිඟුල් හෙම රිදී කනක යන නොයෙක් සියගණන් වර්ණධාතු රාජීන් පැතිරීමෙන් අලංකෘත වූ පෙදෙස් ඇති මෙබඳු රම්‍ය වනලැහැබෙක්හි අතිශයින් චිත්‍ර වූ අතිශයින් විචිත්‍ර වූ පියාපත් ඇති කුණාල නම් පක්ෂියෙක් වෙසෙයි. හවත්නි, ඒ කුණාල පක්ෂියාට පරිචාරිකා වූ පක්ෂිකන්‍යාවෝ තුන් දහස් පන්සියයක් වෙති. වැලි දු, පක්ෂිකන්‍යාවන් දෙදෙනෙක් මුවින් දඬුකඩක් ඩැහැගෙන ඒ කුණාල පක්ෂියා ඒ මත හිඳුවා-ගෙන "අතරමගදී ඒ කුණාල පක්ෂියාට ගමන් වෙහෙසින් බාධාවක් නො වේවා" යි පියාසර කරති. "ඉදින් මේ කුණාල පක්ෂියා අසුනෙන් පෙරළි වැටෙන්නේ නම් අපි අපගේ පියාපත්වලින් ඔහු පිළිගනුම්හ" යි පන්සියයක් පක්ෂිකන්‍යාවෝ යටින් පියාසර කරති. "ඒ කුණාල පක්ෂියා සූය්‍යාතාපයෙන් නො තැවේව" යි පන්සියයක් පක්ෂි කන්‍යාවෝ මත්තෙහි පියාසර කරති. "ඒ කුණාල පක්ෂියා ශීතය හෝ උෂ්ණය හෝ තෘණ හෝ දූවිලි හෝ වාතය හෝ පිනිබිඳු හෝ ස්පර්ශ නො කෙරේව" යි පන්සියයක් පක්ෂිකන්‍යාවෝ දෙපසින් පියාසර කරති. "ඒ කුණාල පක්ෂියා ගොපල්ලෝ හෝ පශුපාලකයෝ හෝ තණ ගෙනයන්නෝ හෝ දර ගෙන යන්නෝ හෝ වන කාර්මිකයෝ හෝ කාෂ්ඨයෙන් වේවයි කැබි-ලිත්තෙන් වේවයි අතින් වේවයි (ගලින් වේවයි) මැටි කැටයෙන් වේවයි දණ්ඩෙන් වේවයි අව්යෙන් වේවයි බොරළු කැටින් වේවයි පහර නො දෙත්වා යී ද ඒ කුණාල පක්ෂියා පැලෑටි සමග හෝ වැල් සමග හෝ ගස් සමග හෝ අතු සමග හෝ කණු සමග හෝ ගල් සමග හෝ බලවත් පක්ෂීන් සමග හෝ එක් නො වේවා" යී ද පන්සියයක් පක්ෂි කන්‍යාවෝ ඉදිරියෙන් පියාසර කරති. "මේ කුණාල පක්ෂියා අසුනෙහි උකටලීව නො සිටීවා" යි මට සිලිටි වූ ප්‍රියංකර වූ මිහිරි වදනින් පරිවරණය කරමින් පන්සියයක් පක්ෂි කන්‍යාවෝ පිටුපසින් පියාසර කරති. "මේ කුණාල පක්ෂි තෙම කුසගින්නෙන් ක්ලාන්ත නො වේව" යි පන්සියයක් පක්ෂි කන්‍යාවෝ නොයෙක් වෘක්ෂයන්ගෙන් විවිධ පලවැල ගෙනෙමින් දිගින් දිගට පියාසර කෙරෙත්. වැලි දු හවත්නි, ඒ පක්ෂි කන්‍යාවෝ අරමින් අරමට උයනින් උයනට ගංතොටින් ගංතොටට කඳුමුදුනින් කඳුමුදුනට අඹවනයෙන් අඹවනයට දඹවනයෙන් දඹවනයට දෙල්වනයෙන් දෙල්වනයට පොල්උයනින් පොල්උයනට සිත් ඇලවීම පිණිස ඒ කුණාල පක්ෂියා වහා පමුණුවත්. ඉක්බිති හවත්නි, ඒ කුණාල පක්ෂියා ඒ පක්ෂි කන්‍යාවන් විසින් දවස මුළුල්ලේ ඔසවාගෙනයන ලද්දේ නමුත් "නීච තෙනැත්තියනි, තෙපි නොපෙනී යව, නීච වූ සොර වූ සල්ලාල වූ සිහි නැත්තා වූ වහා පෙරළෙන සිත් ඇත්තා වූ කළ උපකාර නො සලකන්නා වූ සුළඟ මෙන් කැමති යම් ඒ තැනකට යන්නා වූ තෙපි වැනසෙව" යි මෙසේ බැහැර කෙරෙයි.

තස්සෙව ඛලු භො හිමවතො පබ්බතරාජස්ස පුරත්ථිමදිසාභාගෙ සුසුඛුමසුනිපුණගිරිප්පභවා හරිතූපයන්තියො උප්පලකුමුදපදුමනලිනසතපත්තසොගන්ධිකමන්දාලවසම්පතිවිරූළ්හසුචිගන්ධමනුඤ්ඤපාවකප්පදෙසෙ කුරවක[1]මුචලින්දකෙතකවෙතසවඤ්ජුලපුන්නාගබකුලතිලකපියකහසනසාලසළලචම්පකාසොකනාගරුක්ඛතිරීටිභුජපත්තලොද්දචන්දනොඝවනෙ, කාළාගරුපද්මකපියඞ්ගුදෙවදාරුකචොචගහනෙ කකුධකුටජඅඞ්කොලකච්චිකාරකණිකාරකණ්ණිකාරකනවෙරකොරණ්ඩකකොවිළාරකිංසුකයොධිවනමල්ලිකමනඞ්ගණමනවජ්ජභණ්ඩිසුරුචිරභගිනිමාලාදිමාල්‍යධරෙ ජාතිසුමනමධුගන්ධිකධනුකාරිතාළීසතගරඋසීරකොට්ඨකච්ඡවිතතෙ, අතිමුත්තකසඞ්කුසුමිතලතාවිතතපතිමණ්ඩිතප්පදෙසෙ, හංසපිලවකාදම්බකාරණ්ඩවාභිනදිතෙ, විජ්ජාධරසිද්ධසමණතාපසගණාධිවුත්ථෙ වරදෙවයක්ඛරක්ඛසදානවගන්ධබ්බකින්නරමහොරගානුචිණ්ණප්පදෙසෙ එවරූපෙ ඛලු භො රම්මෙ වනසණ්ඩෙ පුණ්ණමුඛො නාම ඵුස්සකොකිලො පටිවසති අතිවිය මධුරගිරො විලසිතනයනමත්තක්ඛො.

තස්සෙව ඛලු භො පුණ්ණමුඛස්ස ඵුස්සකොකිලස්ස අඩ්ඪුඩ්ඪානි ඉත්ථිසතානි පරිචාරිකා දිජකඤ්ඤායො. අථ ඛලු භො ද්වෙ දිජකඤ්ඤායො කට්ඨං මුඛෙන ඩසිත්වා තං පුණ්ණමුඛං ඵුස්සකොකිලං මජ්ඣෙ නිසීදාපෙත්වා උඩ්ඩෙන්ති, මා නං පුණ්ණමුඛං ඵුස්සකොකිලං අද්ධානපරියායපථෙ කිලමථො උබ්බාහෙත්ථාති. පඤ්ඤාස දිජකඤ්ඤායො හෙට්ඨතො හෙට්ඨතො ඩෙන්ති, සචායං පුණ්ණමුඛො ඵුස්සකොකිලො ආසනා පරිපතිස්සති මයං තං පක්ඛෙහි පටිග්ගහෙස්සාමාති. පඤ්ඤාස දිජකඤ්ඤායො උපරූපරි ඩෙන්ති, මා නං පුණ්ණමුඛං ඵුස්සකොකිලං ආතපො පරිතාපීති. පඤ්ඤාස දිජකඤ්ඤායො උභතො පස්සෙන ඩෙන්ති මා නං පුණ්ණමුඛං ඵුස්සකොකිලං සීතං වා උණ්හං වා තිණං වා රජො වා වාතො වා උස්සාවො වා උපප්ඵුසීති. පඤ්ඤාස දිජකඤ්ඤායො පුරතො පුරතො ඩෙන්ති මා නං පුණ්ණමුඛං ඵුස්සකොකිලං ගොපාලකා වා පසුපාලකා වා තිණහාරකා වා කට්ඨහාරකා වා වනකම්මිකා වා කට්ඨෙන වා කඨලාය වා පාණිනා වා (පාසාණෙන වා) ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා සක්ඛරාහි වා

1. කුරාවක - මජසං.

භවත්නි, ඒ හිමවත් පර්වතරාජයාගේ ම පූර්ව දිශාභාගයෙහි ඉතා මටසිලිටි ඉතා සුන්දර පර්වතයන් ප්‍රභව කොට ඇති (කුණාල විලට) ගලා බස්නා වූ නිල්වන් නදීහු ඇත්තාහ. (එහි) නිලුපුල් ය කුමුදු ය පියුම් ය හෙළපියුම් ය පිරිපුන් සියපත් පියුම් ය සෙව්වන්දිය මන්දරව ය යන (මෙකී) අභිනව ජාත (පුෂ්ප) සුගන්ධයෙන් මනහර වූ පවිත්‍ර ප්‍රදෙශ ඇති, කරවු ය මීදෙල්ල ය වැටකේ ය හොමුවඟු ය හෝපලු ය දෙඹ ය මුහුළු ය ඇසළ ය හෙළපියාය පියාය සල්ය සලලය සපුය අසෝකය නාරුක් ය රිටිගස් ය භූජපත්‍ර (අළුගස්) ය ලොත් ය සඳුන් ය යන වෘක්ෂසමූහයෙන් ගැවැසීගත් වනය ඇති, කළුඅගිල් ය පද්මක ය ප්‍රියඞ්ගු ය (පුවඟු) දෙව්දුරු ය කෙසෙල් ය යන මෙයින් ගහන වූ, කුඹුක් ය කෙළිඳ ය රුක්අඟන ය කච්චිකාර ය රුක්කිණිහිරි ය වැල්කිණිහිරි ය කණෙවෙර (කරවීර) ය කුරණ්ඩක ය කොබෝලීලය කැලය යූථිකා (සීනිද්ද) ය යොහොඹුය නොකිලිටි නිදෙස්වූ භණ්ඩි නම් පුෂ්පය අතිශයින් රුසිරු වූ භගිනිමාලා නම් පුෂ්පය යනාදි මල් දරන්නා වූ, දෑසමන් ය මධුගන්ධික ය දුනුපළොල් ය තලිස් ය තුවරලා ය සුවඳහොට ය කොට්ටක ය යන මෙයින් යුත් දෙණිවලින් ගැවැසීගත්, යොහොඹුවැලින් හා මනාව පිපුණු (මල් ඇති) සෙසු නොයෙක් වැලින් ද සැරසුණු පෙදෙස් ඇති, හංස මහවවුල් විල්ලිහිණි දියකිරල යන පක්ෂීන් විසින් පවත්වනලද මිහිරි නාද ඇති, විද්‍යාධර සිද්ධ ශ්‍රමණ තවුස් සමූහයන් වාස කළා වූ, උතුම් දෙව් යක් රකුස් අසුර ගඳඹ කිඳුරු මහොරගයන් හැසිරෙන පෙදෙස් ඇති, මෙබඳු මනරම් වනලැහැබෙක්හි භවත්නි, අතිශයින් මිහිරි නාද ඇති, මනොඥ වූ මඳ රත් පැහැ යුතු ඇස් ඇති, පූර්ණමුඛ නම් වූ පුස්ස කොකිල-(පරපුටු කොවුලෙක්) යෙක් වෙසෙයි.

භවත්නි, ඒ පූර්ණමුඛ නම් පරපුටු කොවුලාට පරිවාරිකා වූ පක්ෂි කන්‍යාවෝ තෙසිය පනස් දෙනෙක් වෙති. එකල්හි පක්ෂි කන්‍යාවෝ දෙදෙනෙක් මුවින් දඬු කඩක් ඩැහැගෙන ඒ පූර්ණමුඛ පුස්ස කොකිල පක්ෂියා එය මැද හිඳුවා "ඒ පූර්ණමුඛ පුස්ස කොකිල පක්ෂියා අතරමග දී ගමනින් පීඩා නො විඳීව" යි පියාසර කරති. "ඉදින් මේ පූර්ණමුඛ පුස්ස කොකිලයා අසුනෙන් ගිලිහී වැටෙන්නේ නම් අපි (අපගේ) පියාපත්වලින් ඔහු පිළිගන්නෙමු" යි පක්ෂි කන්‍යාවන් පනස්දෙනෙක් යටින් පියාසර කරති. "ඒ පූර්ණමුඛ පුස්ස කොකිලයා අව්වෙන් නො තැවේව" යි පක්ෂි කන්‍යාවන් පනස් දෙනෙක් මත්තෙහි පියාසර කරති. "ඒ පූර්ණමුඛ පුස්ස කොකිලයා සීතල හෝ උණුසුම හෝ තණ හෝ දූලි හෝ පවන හෝ පින්න හෝ ස්පර්ශ නො කෙරේව" යි පක්ෂි කන්‍යාවන් පනස් දෙනෙක් දෙපසින් පියාසර කරති. "ගොපල්ලෝ හෝ පසුපාලකයෝ හෝ තණ ගෙනයන්නෝ හෝ දර ගෙනයන්නෝ හෝ වන කාර්මිකයෝ හෝ කැටින් වේවයි කැබිලිත්තෙන් වේවයි අතින් වේවයි (පහණින් වේවයි) මැටි කැටයෙන් වේවයි දණ්ඩෙන් වේවයි

පහාරං අදංසු. මායං පුණ්ණමුඛො ඵුස්සකොකිලො ගච්ඡෙහි වා ලතාහි වා රුක්ඛෙහි වා සාඛාහි වා ථම්භෙහි වා පාසාණෙහි වා බලවන්තෙහි වා පක්ඛීහි සංගාමෙසීති. පඤ්චසත දිජකඤ්ඤායො පවජන්තා පවජන්තො ඩෙන්ති සණ්හාහි සඛිලාහි මඤ්ජූහි මධුරාහි වාචාහි සමුදචරන්තියො, මායං පුණ්ණමුඛො ඵුස්සකොකිලො ආසනෙ පරියුක්කණ්ඨීති. පඤ්චසත දිජකඤ්ඤායො දිසොදිසං ඩෙන්ති නෙකරුක්ඛවිවිධවිකතිඵලමාහරන්තියො මායං පුණ්ණමුඛො ඵුස්සකොකිලො ඛුදය පරිකිලමිත්ථාති. අථ ඛලු භො තා දිජකඤ්ඤායො තං පුණ්ණමුඛං ඵුස්සකොකිලං ආරාමෙනෙව ආරාමං උය්‍යානෙනෙව උය්‍යානං නදීතිත්ථෙනෙව නදීතිත්ථං පබ්බතසිඛරෙනෙව පබ්බතසිඛරං අම්බවනෙනෙව අම්බවනං ජම්බුවනෙනෙව ජම්බුවනං ලබුජවනෙනෙව ලබුජවනං නාළිකෙරසඤ්චාරියෙනෙව නාළිකෙරසඤ්චාරියං ඛිප්පමෙව අභිසම්භොන්ති රතත්ථාය. අථ ඛලු භො පුණ්ණමුඛො ඵුස්සකොකිලො තාහි දිජකඤ්ඤාහි දිවසං පරිබ්බූළ්හො එවං පසංසති සාධු සාධු භගිනියො එථ ඛො භගිනියො තුම්හාකං පතිරූපං කුලධීතානං යං තුම්හෙ භත්තාරං පරිචරෙය්‍යාථාති.

අථ ඛලු භො පුණ්ණමුඛො ඵුස්සකොකිලො යෙන කුණාලො සකුණො තෙනුපසඞ්කමි. අද්දසංසු ඛො කුණාලස්ස සකුණස්ස පරිචාරිකා දිජකඤ්ඤායො තං පුණ්ණමුඛං ඵුස්සකොකිලං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන යෙන පුණ්ණමුඛො ඵුස්සකොකිලො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා තං පුණ්ණමුඛං ඵුස්සකොකිලං එතදවොචුං. අයං සම්ම පුණ්ණමුඛ, කුණාලො සකුණො අතිවිය ඵරුසො අතිවියඵරුසවාචො අප්පෙවනාම ත්වම්පි ආගම්ම පියවාචං ලභෙය්‍යාමාති. අප්පෙවනාම භගිනියොති වත්වා යෙන කුණාලො සකුණො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා කුණාලෙන සකුණෙන සද්ධිං පටිසම්මොදිත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො පුණ්ණමුඛො ඵුස්සකොකිලො තං කුණාලං සකුණං එතදවොච: කිස්ස ත්වං සම්ම කුණාල, ඉත්ථීනං සුජාතානං කුලධීතානං සම්මා පටිපන්නානං මිච්ඡා පටිපන්නොසි. අමනාපභාණීනම්පි කිර සම්ම කුණාල, ඉත්ථීනං මනාපභාණිනා භවිතබ්බං කිමඞ්ගං පන මනාපභාණීනන්ති. එවං වුත්තෙ කුණාලො සකුණො තං පුණ්ණමුඛං ඵුස්සකොකිලං එවං අපසාදෙසි. නස්ස ත්වං සම්ම ජම්ම වසල, විනස්ස ත්වං සම්ම ජම්ම වසල කොනු තයා වියත්තො ජායාජිනෙනාති. එවං අපසාදිතො ච පන පුණ්ණමුඛො ඵුස්සකොකිලො තතො හෙව පටිනිවත්ති.

සැතින් වේවයි බොරළුයෙන් වේවයි ඒ පූර්ණමුඛ පුස්ස කොකිලයාට පහර නො දෙත්වා '' යි ද, ''මේ පූර්ණමුඛ පුස්ස කොකිලයා පැලැටි සමග හෝ වැල් සමග හෝ ගස් සමග හෝ අතු සමග හෝ කණු සමග හෝ ගල් සමග හෝ බලවත් පක්ෂීන් සමග හෝ දුඃඛ ස්පර්ශ වශයෙන් එක් නො වේවා '' යි ද (අදහසින්) පක්ෂි කන්‍යාවන් පනස්දෙනෙක් ඉදිරියෙන් පියාසර කරති. ''මේ පූර්ණ මුඛ පුස්ස කොකිල තෙම අසුනෙහි උකටලී නො වේව '' යි පක්ෂි කන්‍යාවන් පනස්දෙනෙක් මට සිලුටු මනොඥ මිහිරි වදනින් පරිවරණය කෙරෙමින් පසුපසින් පියාසර කරති. ''මේ පූර්ණමුඛ පුස්ස කොකිලයා කුසගින්නෙන් ක්ලාන්ත නො වේව '' යි පක්ෂි කන්‍යාවන් පනස්දෙනෙක් නොයෙක් ගස්වලින් විවිධ පලවැළ ගෙනෙමින් දිගින් දිගට පියාසර කරත්. තව ද, ඒ පක්ෂි කන්‍යාවෝ ඒ පූර්ණමුඛ පුස්ස කොකිලයා අරමින් අරමට උයනින් උයනට ගංතොටින් ගංතොටට කඳුමුදුනින් කඳුමුදුනට අඹවන-යෙන් අඹ වනයට දෙල් වනයෙන් දෙල් වනයට පොල් වනයෙන් පොල්වනයට සිත් ඇලවීම පිණිස වහා පමුණුවත්. භවත්නි, එකල්හි ඒ පූර්ණමුඛ පුස්ස කොවුල් තෙම ඒ පක්ෂි කන්‍යාවන් විසින් දිවා කල්හි පිරිවරන ලද්දේ ''නැගණිවරුනි, (බුහුනනි,) ඉතා මැනව, ඉතා මැනව, බුහුනනි, යම්හෙයකින් තෙපි (තොපගේ) සැමියා සෙවුනානු ද තෙල තොප බඳු කුලදූන්හට සුදුස්සෙකැ '' යි මෙසේ පසසයි.

භවත්නි, ඉක්බිති ඒ පූර්ණමුඛ නම් පරපුටු කොවුලා කුණාල පක්ෂියා යම් තැනෙක ද එතැනට එළඹියේ ය. කුණාල පක්ෂියාගේ පරිවාරක පක්ෂි කන්‍යාවෝ එන්නා වූ ඒ පූර්ණමුඛ නම් පරපුටු කොවුලා දුරදී ම දුටහ. දැක පූර්ණමුඛ නම් පරපුටු කොවුලා යම් තැනෙක ද එහි එළඹියහ. එළඹ ඒ පූර්ණමුඛ නම් පරපුටු කොවුලාට මෙසේ කීහු. ''යහළු පූර්ණමුඛය, මේ කුණාල පක්ෂියා ඉතා පරුෂය. ඉතා රළු වදන් ඇත්තේ ය. ඔබ ඇසුරට පැමිණ හෝ ප්‍රිය වචන ලබන්නමෝ නම් ඉතා යෙහෙකැ'' යි. බුහුනනි, එය මැනවැ යි කියා කුණාල පක්ෂියා යම් තැනෙක්හි ද එතැනට එළඹියේ ය. එළඹ කුණාල පක්ෂියා සමග පිළිසඳර කොට එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් පූර්ණමුඛ පුස්ස කොකිලයා ඒ කුණාල පක්ෂියාට මෙසේ කීය. ''යහළු කුණාලය, මනාසේ පිළිපදනා වූ සමානජාති ඇති කුලදෝණී වූ ඉතිරින්ට තෙපි කවරහෙයින් වරදවා පිළිපදනහු ද ? යහළු කුණාලය, අමනාප බස් බණන ඉතිරින්හට ද මනාප බස් ඇත්තකු විය යුතු ය. මනාප බස් ඇත්තන් ගැන කියනු කිම?'' යි. මෙසේ කී කල්හි කුණාල පක්ෂියා ඒ පූර්ණමුඛ පුස්ස කොකිලයාට මෙසේ නොසතුට පළ-කෙළේ ය. ''ලාමක අදහස් ඇති යහළු නීචය, තෝ මෙතැනින් යව. ලාමක අදහස් ඇති යහළු නීචය, තෝ වැනසෙව. ගැහැනුන් විසින් පරදවනලද තට වඩා වියතෙක් අන් කවරෙක් දැ'' යි. මෙසේ ගරහන ලද ඒ පූර්ණමුඛ පුස්ස කොකිලයා එයින් ම නැවතුනේ ය.

අථ ඛලු භො පුණ්ණමුඛස්ස ඵුස්සකොකිලස්ස අපරෙන සමයෙන න චිරස්සෙව (අච්චයෙන) ඛරො ආබාධො උප්පජ්ජි, ලොහිතපක්ඛන්දිකා බාළ්හා වෙදනා වත්තන්ති මාරණන්තිකා. අථ ඛලු භො පුණ්ණමුඛස්ස, ඵුස්සකොකිලස්ස පරිචාරිකානං දිජකඤ්ඤානං එතදහොසි. ආබාධිකො ඛො අයං පුණ්ණමුඛො ඵුස්සකොකිලො අප්පෙවනාම ඉමම්හා ආබාධා වුට්ඨහෙය්‍යාති. තං එකකං අදුතියං ඔහාය යෙන කුණාලො සකුණො තෙනුපසඞ්කමිංසු. අද්දසා ඛො කුණාලො සකුණො තා දිජකඤ්ඤායො දූරතොව ආගච්ඡන්තියො, දිස්වාන තා දිජකඤ්ඤායො එතදවොච: කහං පන තුම්හං වසලියො භත්තාති. ආබාධිකො ඛො සම්ම කුණාල පුණ්ණමුඛො ඵුස්සකොකිලො, අප්පෙවනාම තම්හා ආබාධා වුට්ඨහෙය්‍යාති. එවං වුත්තෙ කුණාලො සකුණො තා දිජකඤ්ඤායො එවං අපසාදෙසි. නස්සථ තුම්හෙ වසලියො, විනස්සථ තුම්හෙ වසලියො, චොරියො ධුත්තියො අසතියො ලහුචිත්තායො කතස්ස අප්පටිකාරිකායො අනිලො විය යෙන කාමඞ්ගමායොති. වත්වා යෙන පුණ්ණමුඛො ඵුස්ස කොකිලො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා තං පුණ්ණමුඛං ඵුස්ස කොකිලං එතදවොච: හං සම්ම පුණ්ණමුඛාති, හං සම්ම කුණාලාති, අථ ඛලු භො කුණාලො සකුණො තං පුණ්ණමුඛං ඵුස්සකොකිලං පක්ඛෙහි ච මුඛතුණ්ඩෙන ච පරිග්ගහෙත්වා වුට්ඨාපෙත්වා නානාභෙසජ්ජානි පායාපෙසි. අථ ඛලු භො පුණ්ණමුඛස්ස ඵුස්සකොකිලස්ස සො ආබාධො පටිප්පස්සම්භීති.

අථ ඛලු භො කුණාලො සකුණො තං පුණ්ණමුඛං ඵුස්සකොකිලං ගිලානා වුට්ඨිතං අචිරවුට්ඨිතං ගෙලඤ්ඤා එතදවොච. දිට්ඨා මයා සම්ම පුණ්ණමුඛ කණ්හා දෙව[1]පිතිකා පඤ්චපතිකාය ඡට්ඨෙ පුරිසෙ චිත්තං පටිබද්ධන්තියා යදිදං කවන්ධෙ පීඨසප්පිම්හීති. භවති ච පනු[2]ත්තරෙත්ථ වාක්‍යං.

4114. අජ්ජුනො නකුලො භීමසෙනො
යුධිට්ඨිලො සහ[3]දෙවො ච රාජා,
එතෙ පතී[4] පඤ්චමතිච්ච නාරී
අකාසි ඛුජ්ජවාමනකෙන පාපන්ති.

දිට්ඨා මයා සම්ම පුණ්ණමුඛ සච්චත[5]පාවී නාම සමණී සුසාන මජ්ඣෙ වසන්තී චතුත්ථභත්තං පරිණාමයමානා තුලාපුත්තකෙන[6] පාප මකාසි.

---

1. කණ්හා දෙවී – මජසං.
2. පුනු – මජසං.
3. සීහ – මජසං.
4. පතිකා – මජසං,
5. සච්චක – මජසං,
6. සුරාධුත්තකෙන – සයා.
   සුරාධුත්තකෙන – සා. මජසං.

භවත්නි, ඉක්බිති ඊට පසු නොබෝ කලකින් ඒ පූර්ණමුඛ වුස්ස කොකිලයාට ලොහිත පක්ඛන්දිකා නම් (ලේ අතිසාරය) දරුණු ආබාධයෙක් හටගත්තේ ය. මාරාන්තික වූ දැඩි වෙදනාවෝ පැවැත්තාහ. එකල ඒ පූර්ණමුඛ නම් වුස්ස කොකිලයාගේ පරිචාරක පක්ෂි කන්‍යාවන්ට මේ අදහස විය. "මේ පූර්ණමුඛ වුස්ස කොකිලයා හටගත් ආබාධ ඇත්තේ ය. මේ තෙම මෙ ආබාධයෙන් නැගිටින්නේ දෝහෝ යි සැක සහිත යැ" යි (ඒ පක්ෂි කන්‍යාවෝ) ඔහු තනිව එකලා ව (එහි) හැරදමා කුණාල පක්ෂියා යම් තැනෙක්හි ද එහි එළඹියහ. කුණාල පක්ෂියා එන්නා වූ ඒ පක්ෂි කන්‍යාවන් දුරදී ම දුටුවේ ය. දැක ඒ පක්ෂි කන්‍යාවන්ට මෙසේ කීය. "නීච තැනැත්තියනි, තොපගේ සැමියා කොහි ද" යි. "යහළු කුණාලය, ඒ පූර්ණමුඛ වුස්ස කොකිලයා හටගත් ආබාධ ඇත්තේ ය. ඒ ආබාධයෙන් නැගිටීම සැක සහිත යැ" යි (ඔවුහු කීහ.) මෙසේ කී කල්හි කුණාල පක්ෂියා ඒ පක්ෂි කන්‍යාවන්ට මෙසේ නො සතුට පැවසී ය. "නීච තෙනැත්තියනි, තෙපි මෙතැනින් යවු. නීච වූ සෙර වූ ධූර්ත වූ සිහි නැත්තා වූ වහා පෙරළෙන සිත් ඇත්තා වූ කළ උපකාරයට ප්‍රත්‍යුපකාර නො කරන්නා වූ පවන මෙන් කැමති යම් ඒ තැනෙකට යන්නා වූ තෙපි වැනසෙවු" යි මෙසේ කියා පූර්ණමුඛ වුස්ස කොකිලයා යම් තැනෙක්හි ද එහි එළඹියේ ය. එළඹ ඒ පූර්ණමුඛ වුස්ස කොකිලයාට "යහළු පූර්ණමුඛය, ජීවත්වෙහි" ද යි කීය. "යහළු කුණාලය, ජීවත්වෙමි" යි හේ කීය. භවත්නි, ඉක්බිති කුණාල පක්ෂියා ඒ පූර්ණමුඛ වුස්ස කොකිලයා පියාපත්වලින් හා මුවතුඩින් ගෙන නහාසිටුවා නොයෙක් බෙහෙත් පෙවී ය. භවත්නි, ඉන්පසු පූර්ණමුඛ වුස්ස කොකිලයාගේ ඒ ආබාධය සන්හිඳුණේ යයි.

වැලිදු භවත්නි, ගිලන් බැවින් නැගී සිටි ගිලන් බැවින් මිදුණු නො බෝකල් ඇති ඒ පූර්ණමුඛ වුස්ස කොකිලයාට මෙසේ කීය. යහළු පූර්ණමුඛය, පියවරුන් දෙදෙනකු ඇති සැමියන් පස්දෙනකු ඇති කණ්හා නම් ස්ත්‍රිය සවැනි පුරුෂයකු වූ හිස සුන් සිරුර ඇතියකු බඳු පිළකු කෙරෙහි සිත් බඳින්නී මා විසින් දක්නා ලද, මෙහි මතු දැක්වෙන වාක්‍යය ද වෙයි.

4114. ඉක්බිති අර්ජුන ය, නකුල ය, භීමසෙන ය, යුධිෂ්ඨිර ය, සහදෙව ය යන රජවරුන් වූ මේ සැමියන් පස්දෙන ඉක්මවා ස්ත්‍රියක් කුදු මිට්ටකු සමග ලාමක වූ අනාචාර කර්මයක් කළා ය.

යහළු පූර්ණමුඛය, සච්චතපාවී* නම් ශ්‍රමණියක් සොහොන මැද වසන්නී සිව්වැනි බත ද ප්‍රතික්ෂෙප කරන්නී රන්කරු පුතකු සමග අනාචාර කර්මය කළා ය. (ඕ) මා විසින් දක්නාලදු.

---

* මෙහි පාළි පොතෙහි සච්චතපාවී කියා ඇතත් සිහල ජාතක පොතේ ඇත්තේ පණ්ඩිතපාලිනී කියායි. එය පසුව අපච්චපාලිනී වෙයි.

දිට්ඨා මයා සම්ම පුණ්ණමුඛ කාකාතී නාම දෙවී සමුද්දමජ්ඣෙ වසන්තී භරියා වෙනතෙය්‍යස්ස නටකුවෙරෙන පාපමකාසි. දිට්ඨා මයා සම්ම පුණ්ණමුඛ කුරුඞ්ගදෙවී නාම ලොමසුන්දරී එළකමාරකං කාමයමානා ඡළඞ්ගකුමාරධනන්තෙවාසිනා පාපමකාසි.

4115. එවං හෙතං මයා ඤාතං බ්‍රහ්මදත්තස්ස මාතරං,
ඔහාය කොසලරාජං පඤ්චාලචණ්ඩෙන පාපමකාසි.

4116. එතා ච අඤ්ඤා ච අකංසු පාපං
තස්මාහං ඉත්ථීනං න විස්සසෙ නප්පසංසෙ,
මහී යථා ජගතී[1] සමානරත්තා
වසුන්ධරා ඉතරීතරා පතිට්ඨා.
සබ්බංසහා අඵන්දනා අකුප්පා
තථිත්ථියො තායො න විස්සසෙ නරො.

4117. සීහො යථා ලොහිතමංසභොජනො
වාළමිගො පඤ්චාවුධො[2] සුරුද්දො[3],
පසය්හ ඛාදී පරහිංසනෙ රතො
තථිත්ථියො තායො න විස්සසෙ නරො.

න ඛලු භො සම්ම පුණ්ණමුඛ වෙසියො නාරියො ගමනියො, නහෙතාව බන්ධකියො නාම වධිකායො නාම එතායො, යදිදං වෙසියො නාරියො ගමනියොති. චොරා විය වෙණිකතා මදිරා[4] විය දිද්ධා වාණිජා විය වාචාසන්ථුතියො ඉස්සසිඞ්ගමිව විපරිවත්තායො උරගමිව දුජිව්හායො සොබ්භමිව පටිච්ඡන්නා පාතාලමිව දුප්පූරා රක්ඛසී විය දුත්තොසා යමොවෙකන්තහාරියො සිඛිරිව සබ්බභක්ඛා නදීරිව සබ්බවාහිනී අනිලො විය යෙන කාමඤ්චරා නෙරුවිය අවිසෙසකරා විසරුක්ඛො විය නිච්චඵලිතායොති. භවති ච පනුත්තරෙත්ථ වාක්‍යං.

1. ජගතී – මජසං.
2. පඤ්චාවුධො – මජසං.
3. සුරුද්ධො – සී.මු.
4. මදිරාව දිට්ඨා – මජසං.

යහළු පුණ්ණමුඛය, කාකාතී නම් දේවී මුහුද මැද වසන්නී ගුරුළකුගේ බිරිය වූවා ගන්ධර්වයකු සමග අනාචාර කර්මයක් කළා ය. ඕ මා විසින් දක්නා ලදූ. යහළු පුණ්ණමුඛය, ලොමසුන්දරී නම් කුරඞගදේවී තොමෝ එළකමාරක නම් තෙනැත්තහු කැමති වන්නී ඡළඞග කුමාරයා හා ධනන්තෙවාසික නම් අතවැස්සා ද සමග අනාචාර ක්‍රියාවක් කළා ය, (ඕ) මා විසින් දක්නා ලදූ.

4115. (යම් තෙනැත්තියක්) කොසොල් රජ හැරදමා පඤ්චාල චණ්ඩ සමග අනාචාර කර්මය කළා ද, බඹදත් රජුගේ මව පිළිබඳ වූ තෙල කරුණ මා විසින් දන්නා ලද්දේ ය.

4116. මේ ස්ත්‍රීහු ද අන් ස්ත්‍රීහු ද ලාමක ක්‍රියාව කළාහු ය. එහෙයින් මම ස්ත්‍රීන් විශ්වාස නො කරමි. ඔවුන්ට නො පසසමි. යම්සේ ජගතී නම් වූ පෘථිවි තොමෝ සමාන ඇලුම් ඇත්තී ද, ධනය උසුලන්නී ද, හීන ප්‍රණීත සියල්ලන්ට ම පිහිටවන්නී ද, සියල්ල ඉවසන්නී ද නො සැලෙන්නී ද, නො කිපෙන්නී ද, ස්ත්‍රීහු ද එසේ වෙති. (නුවණැති) මනුෂ්‍ය තෙම ඔවුන් විශ්වාස නො කරන්නේ ය.

4117. ලේ මස් බුදින, (මුඛය ගාත් සතරය යන) අත් පසක් ඇති, ඉතා දරුණු ව්‍යාල මෘග වූ සිංහයා යම්සේ පරහිංසාවෙහි ඇලුණේ බලාත්කාරයෙන් අල්වාගෙන කන්නේ වේ ද, ස්ත්‍රීහු ද එසේ වෙත්. (නුවණැති) මනුෂ්‍ය තෙම ඔවුන් විශ්වාස නො කරන්නේ ය.

එම්බා යහළු පුණ්ණමුඛය, මොහු වෙසීහු, නාරීහු, ගණිකාවෝ පමණක් නො වෙති. යම් මේ වෙසීහු ය, නාරීහු ය, ගණිකාවෝ යයි (නාමයෝ) කියනු ලැබෙත් ද, ඔහු බන්ධකී නමුදු වෙති. වධිකා (සැමියන් නසන්නෝ) නමුදු වෙත්. මොවුහු (බඳනා ලද හිස් වැසුම් ඇති) සොරුන් වැන්න. විෂ යෙදූ සුරා වැන්න. පැසසුම් කරන වදන් ඇත්තාහු (පණ්‍ය වස්තුවෙහි අගුණ වසා ගුණ ම කියන) වෙළඳුන් වැන්න. ඉස්ස නම් මුවාගේ අඟ මෙන් වහා පෙරළෙන සිතැත්තෝ ය. උරගයකු මෙන් (මුසාවාදී බැවින්) දෙදිව් ඇතියහ. (පුවරු ආදියෙන්) වැසුණු අසූචි වළක් මෙන් (වස්ත්‍රාභරණාදියෙන්) වැසී සිටිනාහු ය. (මහසයුරෙහි) පාතාලය මෙන් (සිත) පිරවීමට දුෂ්කරයහ. (මසට ම ගිජු රකුසියක මෙන් තුටු කිරීමට දුෂ්කරයහ. යමයා මෙන් (කිසිවකු නො හැර) එකාන්තයෙන් පැහැර ගන්නෝ ය. ගින්න මෙන් සියල්ල භක්ෂණය කරන්නෝ ය. (සියල්ලන් ම සේවනය කරන්නෝය.) නදිය මෙන් සියල්ල උසුලාගෙන යන්නෝ ය. (සියල්ලන් භජනය කරන්නෝ ය.) පවන මෙන් කැමති තැනෙක හැසිරෙන්නෝ ය. (හිමවතැ) නේරු පර්වතය මෙන් (කිසිවකුට) වෙනසක් නො කරන්නෝ ය. විෂ රුකක් මෙන් නිති පල දරන්නෝ ය. (නිතර රමණීය ලෙස පෙනෙන්නෝ ය.) මෙහි මතු දැක්වෙන වාක්‍යය ද වෙයි.

4118. යථා චොරො යථා දිද්ධා[1] වාණිජොව විකත්ථනී,
ඉස්සසිඞ්ගමිවාවට්ටා[2] දුජිව්හා උරගො යථා[3].

4119. සොබ්භමිව පටිච්ඡන්නා පාතාලමිව දුප්පූරා,
රක්ඛසී විය දුත්තොසා යමොවෙකන්තහාරියො
යථා සිඛී නදී වාහො *අනිලො කාමචාරවා[4].

4120. නෙරුව අවිසෙසා ච විසරුක්ඛො විය නිච්චඵලා,
නාසයන්ති ඝරෙ භොගං රතනානන්තකරිත්ථියොති.

චත්තාරිමානි සම්ම පුණ්ණමුඛ යානි පරකුලෙ න වාසෙතබ්බානි. ගොණං ධෙනුං යානං භරියං, චත්තාරි එතානි පණ්ඩිතො ඤාති ඝරා න විප්පවාසයෙ.

4121. ගොණං ධෙනුඤ්ච යානඤ්ච
භරියං ඤාතිකුලෙ න වාසයෙ,
භඤ්ජන්ති[5] රථං අයානකා
අතිවාහෙන හනන්ති පුඞ්ගවං
දොහෙන හනන්ති වච්ඡකං
භරියා ඤාතිකුලෙසු දුස්සතීති.

ඡ ඉමානි සම්ම පුණ්ණමුඛ යානි වත්ථූනි කිච්චෙ ජාතෙ අනත්ථචරානි භවන්ති.

4122. අගුණං ධනු ඤාතිකුලෙ ච භරියා
පාරං නාවා අක්ඛභග්ගඤ්ච යානං,
දූරෙ මිත්තො පාපසහායකො ච
කිච්චෙ ජාතෙ අනත්ථචාරිනී භවන්ති[6].

අට්ඨහි ඛලු සම්ම පුණ්ණමුඛ ඨානෙහි ඉත්ථී සාමිකං අවජානාති: දළිද්දතා ආතුරතා ජිණ්ණතා සුරාසොණ්ඩතා මුද්ධතා පමත්තතා සබ්බකිච්චෙසු අනුවත්තිතා සබ්බධනානුප්පදානෙන, ඉමෙහි ඛලු සම්ම පුණ්ණමුඛ අට්ඨහි ඨානෙහි ඉත්ථී සාමිකං අවජානාති. භවති ච පනුත්තරෙත්ථ වාක්‍යං.

1. දිට්ඨා – මජ්ඣං. දුට්ඨා – සයා.
2. පරිවත්තා – මජ්ඣං. සයා.
3. විය – මජ්ඣං.
4. කාමපාරවා – වි. සයා.
5. භඤ්ජන්ති – මජ්ඣං.
6. අනත්ථචරානි – වි. මජ්ඣං.
* අයං ගාථාපාදෙ මරම්ම පොත්ථකෙසු න දිස්සති.

4118. (ස්ත්‍රීහු නම්) සොරකු මෙන් ද, විෂ මිශ්‍ර සුරාවක් මෙන් ද, (විකිණිය යුතු දැහි අගුණ වසා ගුණ ම පවසන) වෙළඳකු මෙන් ද වෙති. ඉස්ස නම් මුවාගේ අඟ මෙන් වහා පෙරළෙන්නෝ ය. (බොරු කියන හෙයින්) සර්පයකු මෙන් දෙදිව් ඇත්තෝ ය.

4119. (පුවරු ආදියෙන් වැසුණු) අසුචි වළක් මෙන් ප්‍රතිච්ඡන්නයහ. (මහමුහුදෙහි) පාතාලය මෙන් දුෂ්පූරයහ. යමයා මෙන් ඒකාන්තයෙන් පැහැර ගන්නෝ ය. ගින්න මෙන් ද, සියල්ල උසුලාගෙන (ගසා ගෙන) යන නදිය මෙන් ද වෙති. වාතය මෙන් කැමති තැන හැසිරෙන්නෝ වෙති.

4120. (හිමවතෙහි) නෙරු පර්වතය මෙන් (වෙතට පැමිණි හැම පුරුෂයන්) එකසේ දකිති. (කිම්පක්ක) නම් විෂ රුක මෙන් නිති පල ඇත්තන් ලෙස පැනෙති. (සැමියා විසින් දුකසේ සපයන ලද) රත්නයන්ට අන්තරායකාරී ස්ත්‍රීහු ගෙහි භොගය නසත්.

යහළු පුණ්ණමුඛය, අන්කුලයෙක්හි නො වැසැවිය යුතු යම් සතරෙක් වෙත් ද, ගොනු ය, දෙන ය, යාන ය, බිරිය ය යන මේ සතර නුවණැත්තේ සිය ගෙයින් වෙන් කොට වාස නො කරන්නේ ය.

4121. ගොනා ද දෙන ද යානය ද බිරිය ද යන සතර නෑ කුලයෙක්හි නො වැසැවිය යුත්තේ ය. රියක් නැත්තෝ රිය පරිභෝග කෙරෙති. අධික බර වහනය කරවීමෙන් ගවයා නසති. අධික දෙවීමෙන් වසුපැටියා නසති. නෑකුලයන්හි දී බිරිය දූෂණය කරනු ලබයි.

යහළු පුණ්ණමුඛය, යම් වස්තුවක් වැඩක් ඇති කල්හි අනර්ථකර වේ ද එබඳු වස්තු සයෙකි.

4122. දුනුදිය රහිත දුන්න ද, නෑ කුලයෙහි වූ බිරිය ද, පරතීරයෙහි වූ නැව ද, කඩ ඇණය බුන් යානය ද, දුර සිටුනා මිතුරා ද, පව්ටු මිතුරා ද යන සය වැඩක් පැමිණි කල්හි ප්‍රයොජනවත් නො වෙති.

යහළු පුණ්ණමුඛය, ස්ත්‍රිය කරුණු අටෙකින් සැමියා පහත් කොට සිතයි. දිළිඳුබව ය, ගිලන්බව ය, මහලුබව ය, සුරාසොඬබව ය, මෝඩබව ය, ප්‍රමත්තබව ය, හැම කිසෙහි අනුව පවත්නා බව ය, සියලු ධනය දීමෙන් දැ යි යන මේ අට කරුණෙන් යහළු පුණ්ණමුඛය, ස්ත්‍රිය සැමියා අවමන් කොට සිතයි. මෙහි මතු දැක්වෙන වාක්‍යය ද වෙයි.

4123. දලිද්දං ආතුරඤ්චාපි ජිණ්ණකං සුරාසොණ්ඩකං,
පමත්තං මුද්ධපත්තඤ්ච රත්තං[1] කිච්චෙසු හාපනං
සබ්බකාමප්පදානෙන අවජානන්ති සාමිකන්ති.

නවහි ඛලු සම්ම පුණ්ණමුඛ ඨානෙහි ඉත්ථී පදෙසමාහරති. ආරාමගමනසීලා ච හොති උය්‍යානගමනසීලා ච හොති නදීතිත්ථගමනසීලා ච හොති ඤාතිකුලගමනසීලා ච හොති පරකුලගමනසීලා ච හොති ආදසදුස්සමණ්ඩනානුයොගමනුයුත්තසීලා ච හොති මජ්ජපායිනී ච හොති නිල්ලොකනසීලා ච හොති පද්වාරට්ඨායිනී[2] ච හොති. ඉමෙහි ඛලු සම්ම පුණ්ණමුඛ නවහි ඨානෙහි ඉත්ථී පදෙසමාහරතීති. භවති ච පනුත්තරෙත්ථ වාක්‍යං.

4124. ආරාමසීලා ච උය්‍යානං
නදී ඤාතිපරකුලං,
දුස්සමණ්ඩනමනුයුත්තා[3]
යා චිත්ථී මජ්ජපායිනී.

4125. යා ච නිල්ලොකනසීලා
යා[4] ච පද්වාරට්ඨායිනී,
නවහෙතෙහි ඨානෙහි
පදෙසමාහරන්තිත්ථියොති.

චත්තාළීසාය ඛලු සම්ම පුණ්ණමුඛ ඨානෙහි ඉත්ථී පුරිසං අච්චාවදති[5]: විජම්භති විනමති විලාසති විලජ්ජති නඛෙන නඛං ඝට්ටෙති පාදෙන පාදං අක්කමති කට්ඨෙන පථවිං ලිඛති[6] දාරකං උල්ලංඝෙති ඔලංඝාපෙති කීළති කීළාපෙති චුම්බති චුම්බාපෙති භුඤ්ජති භුඤ්ජාපෙති දදති ආයාචති කතමනුකරොති උච්චං භාසති නීචං භාසති අවිච්චං භාසති විච්චං භාසති නච්චෙන ගීතෙන වාදිතෙන රොදිතෙන[7] විලසිතෙන විභූසිතෙන ජග්ඝති පෙක්ඛති කටිං චාලෙති ගුය්හභණ්ඩකං සඤ්චාලෙති ඌරුං විවරති ඌරුං පිදහති ථනං දස්සෙති කච්ඡං දස්සෙති නාභිං දස්සෙති අක්ඛිං නිඛණති භමුකං උක්ඛිපති ඔට්ඨං පලිඛති ජිව්හං නිල්ලාලෙති දුස්සං මුඤ්චති දුස්සං පටිබන්ධති සිරසං මුඤ්චති සිරසං බන්ධති ඉමෙහි ඛලු සම්ම පුණ්ණමුඛ චත්තාළීසාය ඨානෙහි ඉත්ථී පුරිසං අච්චාවදති.

1. සබ්බං - මජසං. දත්තං - ස්‍යා.
2. සද්වාර - මජසං.
3. ආදස දුස්සමණ්ඩන - මජසං.
4. යාව සද්වාර - මජසං.
5. අච්චාචරති - මජසං.
6. විලෙඛති - වි. මජසං.
7. රොදනෙන - මජසං.

4123. දිළින්ද ද රෝගියා ද මහල්ලා ද සුරාසොඬහු ද ප්‍රමත්තවූවහු ද මුළාවට පැමිණි (තමා කෙරෙහි) ඇලුණහු ද කෘත්‍යයන් පිරිහෙළීම කරන්නහු ද සියලු කැමති දෑ දීමෙන් ද (ස්ත්‍රීහු) සැමියාට අවමන් කෙරෙත්.

යහළු පුණ්ණමුඛය, ස්ත්‍රිය නව ආකාරයකින් (ස්වාමියා කෙරෙහි) ද්වෙෂය එළවන්නී ය. (සැමියා නොවිචාරා) පුෂ්පාරාමාදියට යන සුලු ද, උයනට යනසුලු ද, ගංතොටට යනසුලු ද, නෑදෑගෙවලට යන සුලු ද, (සන්දිට්ඨ සම්භක්ත ආදි) අන් ගෙවලට යනසුලු ද, කැටපතින් බලමින් වස්ත්‍රාභරණාදියෙන් සැරසීමෙහි යෙදෙනසුලු ද, මත්පැන් බොන්නී ද, (කවුළු ආදියෙන්) බලනසුලු ද, (අඟ පසඟ දක්වමින්) දොරකඩ සිටිනසුලු ද වෙයි. යහළු පුණ්ණමුඛය, මේ නව කරුණෙන් ස්ත්‍රිය සැමියා කෙරෙහි ද්වෙෂය එළවන්නී ය. මෙහි මතු දැක්වෙන වාක්‍යය ද වේ.

4124. යම් ස්ත්‍රියක් (සැමියා නොවිචාරා) පුෂ්පාරාමාදියට ද, උයනට ද, ගංතොටට ද, නෑකුලයට ද, අන් කුලවලට ද යන ස්වභාව ඇත්තී ද, වස්ත්‍රාදියෙන් සැරසීමෙහි යෙදුනී ද, මත්පැන් පානය කරන්නී ද,

4125. යම් ස්ත්‍රියක් (කවුළු ආදියෙන් නිතර) බලනසුලු ද, යම් ස්ත්‍රියක් (අඟ පසඟ පෙන්වමින්) දොරකඩ සිටින්නී ද මේ නව කරුණින් ස්ත්‍රීහු සැමියා කෙරෙහි ද්වෙෂය එළවන්නෝ යි.

යහළු පුණ්ණමුඛය, කරුණු සතළිසකින් ස්ත්‍රිය පුරුෂයා ඉක්මවා හැසිරෙන්නී ය. විජෘම්භනය කරයි. නැමෙයි, (ගමනාදි ඉරියව්වලින්) ලීලා දක්වයි, ඉරි අදියි, ලජ්ජාවෙයි, නියෙන් නිය ගටයි, පයින් පය ඇක්මෙයි, දඬුවෙන් පොළොවෙහි ලියයි, දරුවකු ගෙන ඔසොවයි, පහතට වඩයි, (ඒ දරුවා) සිඹියි, (දරුවා ලවා) සිඹීම කරවයි, (තොමෝ) බුදියි, (දරුවා ලවා) කවයි, (දරුවකුට කිසිවක්) දෙයි, (පසුව එය) ඉල්වයි, (දරුවා කළ දෑ) අනුව කරයි, උස් හඬින් කියයි, පහත් හඬින් කියයි, මහසෙනග මැද (අපටිච්ඡන්න ව) කියයි, තනිව (පටිච්ඡන්න ව) කියයි, නැටීමෙන්, ගී කීමෙන්, වාදිතයෙන්, හැඬීමෙන්, සැරසීමෙන් ආභරණ පැළඳීමෙන් නිමිති දක්වයි, මහත් හඬින් සිනාසෙයි, බලයි, කටිය සොලවයි, රහස් පියස සොලවයි, කලවය විවෘත කරයි, කලවය වසයි, පියයුරු පෙන්වයි, කිසිල්ල පෙන්වයි, නැබ පෙන්වයි, ඇස් සාරයි (පොඩි කරයි), බැම ඔසොවයි, තොල හපයි, දිව ලෙලවයි, වස්ත්‍රය, මුදයි, වස්ත්‍රය නැවත හඳියි, කේශ බන්ධනය ලිහයි, කේශ බන්ධනය බඳියි, යහළු පුණ්ණමුඛය, මේ සතළිස් කරුණින් ස්ත්‍රී පුරුෂයා ඉක්මවා හැසිරෙන්නී ය යි.

පඤ්චවීසාය බලු සම්ම පුණ්ණමුඛ ඨානෙහි ඉත්ථී පදුට්ඨා වෙදිතබ්බා භවති. සාමිකස්ස පවාසං වණ්ණෙති පවුත්ථං[1] න සරති ආගතං නාභිනන්දති අවණ්ණං තස්ස භණති වණ්ණං තස්ස න භණති අනත්ථං තස්ස චරති අත්ථං තස්ස න චරති අකිච්චං තස්ස කරොති කිච්චං තස්ස න කරොති පරිදහිත්වා සයති පරම්මුඛී නිපජ්ජති පරාවත්තකජාතා[2] ඛො පන හොති කුඞ්කුමියජාතා දීඝං අස්සසති[3] දුක්ඛං වෙදයති උච්චාරපස්සාවං අභිණ්හං ගච්ඡති විලොමං ආචරති පරපුරිසසද්දං සුත්වා කණ්ණසොතවිවරමොදහති නිහතභොගා ඛො පන හොති පටිවිස්සකෙහි සන්ථවං කරොති නික්ඛන්තපාදා ඛො පන හොති විසිඛානුචාරිනී අතිචාරිනී ඛො පන හොති සාමිකෙ අගාරවා පදුට්ඨමනසඞ්කප්පා අභිණ්හං ද්වාරෙ තිට්ඨති කච්ඡානි අඞ්ගානි ථනානි දස්සෙති දිසොදිසං ගන්ත්වා පෙක්ඛති. ඉමෙහි බලු සම්ම පුණ්ණමුඛ පඤ්චවීසාය ඨානෙහි ඉත්ථී පදුට්ඨා වෙදිතබ්බා භවති.

භවති ච පනුත්තරෙත්ථ වාක්‍යං.

4126. පවාසමස්ස වණ්ණෙති
ගතං නානුසොචති,[4]
දිස්වා පතිං ආගතං නාභිනන්දති
භත්තාරවණ්ණං න කදචි භාසති
එතෙ පදුට්ඨාය භවන්ති ලක්ඛණා.

4127. අනත්ථං තස්ස චරති අසඤ්ඤතා
අත්ථඤ්ච හාපෙති අකිච්චකාරිණී,
පරිදහිත්වා සයති පරම්මුඛී
එතෙ පදුට්ඨාය භවන්ති ලක්ඛණා.

4128. පරාවත්තජාතා[5] ච භවති කුඞ්කුමී
දීඝඤ්ච අස්සසති දුක්ඛවෙදිනී,
උච්චාරපස්සාවමභිණ්හං ගච්ඡති
එතෙ පදුට්ඨාය භවන්ති ලක්ඛණා.

4129. විලොමමාචරති අකිච්චකාරිණී
සද්දං නිසාමෙති පරස්ස භාසතො,
හතභොගා ච කරොති සන්ථවං[6]
එතෙ පදුට්ඨාය භවන්ති ලක්ඛණා.

---

1. පවුත්ථං නිසරති – මජසං.
2. පරිවත්තකජාතා – වි. මජසං. සයා.
3. අස්සාසති – වි. මජසං, සයා.
4. ගතං තස්ස නසොචති – වි. මජසං.
5. පරිවත්තජාතා – වි. මජසං, සයා.
6. සන්ධවං – මජසං.

යහළු පුණ්ණමුඛය, පස්විසි කරුණෙකින් කිපුණු ස්ත්‍රී දතයුත්තී වෙයි. සැමියාගේ ප්‍රවාසය (අන් තැනෙක විසීම) වර්ණනා කරයි, ප්‍රවාසයට ගියහු නො සිහි කරයි, (යළි) පැමිණියහුට නො සතුටු වෙයි, ඔහුගේ අගුණ කියයි, ඔහුගේ ගුණ නො කියයි, ඔහුගේ අනර්ථය පිණිස හැසිරෙයි, ඔහුගේ අර්ථය පිණිස නො හැසිරෙයි, ඔහුගේ නො කළයුතු කිස කරයි, කළයුතු කිස නො කරයි, දැඩි ලෙස හැඳ පෙරව නිදයි, විමුඛ ව නිදයි, ඒ මේ අත පෙරළෙන්නී කලහ කරන්නී වෙයි, දීර්ඝව ආශ්වාස කරයි, දුක් වෙදනා පවසයි, නිතර මල මූ සඳහා (බැහැර) යයි, විලොම් ව හැසිරෙයි, පර-පුරුෂයකුගේ හඬ අසා කන් සිදුර එළවයි (ඇහුම්කන් දෙයි), භොග විනාශ කරන්නී වෙයි, අසල්වැසියන් සමග (කෙලෙස් වශයෙන්) සන්ථවය කරයි, (සොර සැමියාගේ උපධාරණය පිණිස) නික්මුණු පා ඇත්තී වීථී සංචාරයෙහි යෙදුනී වෙයි, (සිය සැමියා කෙරෙහි අගෞරවයෙන් ප්‍රදුෂ්ට සිත් ඇත්තී (සැමියා) ඉක්මවා හැසිරෙන්නී වෙයි, නිතර දෙරකඩ සිටියි, කිසිලි ද අවයව ද පියයුරු ද දක්වයි, දිගින් දිග ගොස් බලයි, යහළු පුණ්ණමුඛය, මේ පස්විසි කරුණින් කිපුණු ස්ත්‍රී දතයුතු වේ යි. මෙහි මතු දැක්වෙන වාක්‍යය ද වෙයි.

4126. ඔහුගේ (සැමියාගේ) පිටත වාසය වනයි. බැහැර ගියහු (සැමියා) අනුව ශොක නො කරයි. ගෙට පැමිණි (සැමියා) දැක සතුටුවීම නො කරයි. කිසි විටෙක සැමියාගේ ගුණ නො කියයි. මේ ප්‍රදුෂ්ට ස්ත්‍රියගේ ලක්‍ෂණයෝ වෙති.

4127. සංයම නැත්තී ඔහුගේ අනර්ථය පිණිස හැසිරෙයි. නො කළයුතු දෑ කරන්නී අර්ථය ද නසයි. දැඩි කොට හැඳ විමුඛ ව නිදයි. මේ ප්‍රදුෂ්ට ස්ත්‍රියගේ ලක්‍ෂණයෝ වෙති.

4128. ඔබ මොබ පෙරළී කලබල කරන්නී වෙයි. දීර්ඝ ලෙස ආශ්වාස කරන්නී දුක් වෙදනා ඇත්තී යැ යි කියයි. නිතර මලමූකිස පිණිස යයි. මේ ප්‍රදුෂ්ට ස්ත්‍රියගේ ලක්‍ෂණයෝ වෙති.

4129. විලොම් ව හැසිරෙයි. නො කළමනා කිස කරන්නී වෙයි. කථා කරන පරපුරුෂයන්ගේ ශබ්දය අසයි. නසන ලද භොග ඇත්තී ක්ලෙශ සන්ථවය කරයි. මේ ප්‍රදුෂ්ට ස්ත්‍රියගේ ලක්‍ෂණයෝ ය.

4130. කිච්චෙන ලද්ධං කසිරෙනාභතං[1] ධනං
විත්තං විනාසෙති දුක්ඛෙන සම්භතං,
පටිවිස්සකෙහි ච කරොති සන්ථවං
එතෙ පදුට්ඨාය භවන්ති ලක්ඛණා.

4131. නික්ඛන්තපාදා විසිඛානුචාරිනී
නිච්චං ස සාමිම්හි පදුට්ඨමානසා,
අතිචාරිණී හොති තථෙව[2]ගාරවා
එතෙ පදුට්ඨාය භවන්ති ලක්ඛණා.

4132. අභික්ඛණං තිට්ඨති ද්වාරමූලෙ
ථනානි කච්ඡානි ච දස්සයන්තී,
දිසොදිසං පෙක්ඛති භන්තචිත්තා
එතෙ පදුට්ඨාය භවන්ති ලක්ඛණා.

4133. සබ්බා නදී වඞ්කගතී[3] සබ්බෙ කට්ඨමයා වනා,
සබ්බිත්ථියො කරෙ පාපං ලභමානෙ[4] නිවාතකෙ.

4134. සචෙ ලභෙථ ඛණං වා රහො වා
නිවාතකං වාපි ලභෙථ තාදිසං,
සබ්බාව ඉත්ථී කරෙය්‍යු[5] නො පාපං
අඤ්ඤං අලද්ධා පීඨසප්පිනාපි සද්ධිං.

4135. නරානමාරාමකරාසු නාරිසු
අනෙකචිත්තාසු අනිග්ගහාසු ච,
සබ්බත්ථනාපීතිකරාපි චෙ සියා[6]
න විස්සසෙ තිත්ථසමා හි නාරියො.

4136. යං වෙ දිස්වා කණ්ඩරීකින්නරානං[7]
සබ්බිත්ථියො න රමන්ති අගාරෙ,
තං තාදිසං මච්චං චජිත්වා භරියා
අඤ්ඤං දිස්වා පුරිසං පීඨසප්පිං.

4137. බකස්ස ච පාවාරිකස්ස[8] රඤ්ඤො
අච්චන්තකාමානුගතස්ස භරියා,
අවාචරි බද්ධවසානුගස්ස[9]
කං වාපි ඉත්ථී නාතිචරෙ තදඤ්ඤං.

---

1. කසිරා භතං – වි, මජසං.
2. අපෙත – වි. මජසං,
3. වඞ්කනදී – මජසං. වඞ්කගතා – වි.
4. ලභමානා – වි.
5. කයිරුං – මජසං.
6. චෙසියුං – වි. සයා. චෙසියා – මජසං,
7. කින්නර – මජසං. සයා.
8. බාවරිකස්ස – මජසං.
9. අනාචරිපට්ඨවසානුවකස්ස – මජසං.

4130. දුකසේ ලද, දුකසේ ගෙනනලද ධනය ද, දුකසේ රැස්කරනලද වස්තුව ද විනාශ කරයි. අසල්වැසියන් සමග ක්ලේශ සන්ථවය කරයි. මේ ප්‍රදුෂ්ට ස්ත්‍රියගේ ලක්‍ෂණයෝ යි.

4131. (සොර සැමියන් සෙවීම පිණිස) බැහැර කරනලද පා ඇත්තී ය. වීථි සඤ්චාරය කරන්නී ය. නිතර සිය සැමියා කෙරෙහි ප්‍රදුෂ්‍ය වූ සිත් ඇත්තී (සිය) සැමියා ඉක්මවා හැසිරෙයි. එසේ ම ගෞරව නැත්තී වෙයි. මේ ප්‍රදුෂ්ට ස්ත්‍රියගේ ලක්‍ෂණයෝ යි.

4132. පියොවුරු සහ කිසිලි පෙන්වමින් නිතර දොරළඟ සිටී. භ්‍රාන්ත වූ සිත් ඇත්තී දිශානුදිශාවන් බලයි. මේ ප්‍රදුෂ්ට ස්ත්‍රියගේ ලක්‍ෂණයෝ යි.

4133. සියලු නදීහු වක් වූ ගමන් ඇත්තාහ. සියලු වනයෝ කාෂ්ටමයහ. රහස් තැනක් ලද කල්හි සියලු ස්ත්‍රීහු පව් කරන්නාහ.

4134. ඉදින් මන්ත්‍රණය කිරීමට සුදුසු අවකාශයක් හෝ එබඳු රහස් තැනක් හෝ ලැබේ නම් සියලු ස්ත්‍රීහු ම අන් පුරුෂයකු නො ලද කල්හි පිළකු සමග හෝ පාපකර්මය (අනාචාරය) කෙරෙත් මැ නු.

4135. මිනිසුන්ගේ සිත් ඇලුම් කරන්නා වූ නොයෙක් දෙනා කෙරෙහි පිහිටි සිත් ඇත්තා වූ නිග්‍රහයෙන් හික්මවාලිය නො හැක්කා වූ මේ ස්ත්‍රීහු (මිනිසුන් විසින්) මුළු හිතින් තුටු කරවනු ලබන්නාහු නමුත් වෙශ්‍යාවෝ වෙත් ද (එහෙයින් ස්ත්‍රීන් කෙරෙහි) විශ්වාස නො කරන්නේ ය. ස්ත්‍රීහු වනාහි තීර්ථ සම වෙත්.

4136. කණ්ඩරී රජ ය, කින්නරා දෙවී ය යන මොවුන්ගේ යම් නො ඇල්මෙක් වී ද, එය දක සියලු ස්ත්‍රීහු එකාන්තයෙන් ගෘහයෙහි (ස්වකීය) ස්වාමිවරුන් කෙරෙහි නො ඇලෙති යි දත යුතු ය. ඒ එසේ මැ යි. අන්‍ය වූ පිළු පුරුෂයකු (පීඨසප්පි) දක එබඳු රජු හැර භාය්‍ය්‍යාව පාපකර්මය (අනාචාරය) කළා යැ යි කීයේ ය.

4137. අත්‍යන්තයෙන් කැමැත්ත අනුව පැවැත්තා වූ බක නම් රජුගේ ද පාවාරික නම් රජුගේ ද භාය්‍ය්‍යා වූ පංචපාපා තොමෝ තම සිත බැඳුණු තම වසයෙහි සිටි පණිවිඩකරුවකු සමීපයෙහි ලාමක සේ හැසිරුණීය. (එහෙයින්) ස්ත්‍රී එයින් අන්‍ය වූ කවර නම් පුරුෂයකු ඉක්මවා නො හැසිරෙන්නී ද?

4138. පිඞ්ගියානී සබ්බලොකිස්සරස්ස
රඤ්ඤො පියා බ්‍රහ්මදත්තස්ස භරියා,
අවාචරි බද්ධවසානුගස්ස
තං වාපි සා නාජ්ඣගා කාමකාමිනී.

4139. බුඤ්ඤනං[1] ලහුචිත්තානං අකතඤ්ඤුන දුභිනං[2],
නාදෙවසත්තො පුරිසො ථීනං සද්ධාතුමරහති.

4140. න තා පජානන්ති කතං න කිච්චං
න මාතරං පිතරං භාතරං වා,
අනරියා සමතික්කන්තධම්මා
සස්සෙව චිත්තස්ස වසං වජන්ති.

4141. චිරානුවුත්ථම්පි පියං මනාපං
අනුකම්පකං පාණසමම්පි සන්තං[3],
ආවාසු[4] කිච්චෙසු ච නං ජහන්ති
තස්මාහං ඉත්ථීනං න විස්සසාමි.

4142. ථීනං හි චිත්තං යථා වානරස්ස
කන්නප්පකන්නං යථා රුක්ඛඡායා,
චලාචලං හදයං ඉත්ථියානං
චක්කස්ස නෙමි විය පරිවත්තති.

4143. යදා තා පස්සන්ති සමෙක්ඛමානා
ආදෙය්‍යරූපං පුරිසස්ස විත්තං,
සණ්හාහි වාචාහි නයන්ති මෙනං
කම්බොජකා ජලජෙනෙව අස්සං.

4144. යදා න පස්සන්ති සමෙක්ඛමානා
ආදෙය්‍යරූපං පුරිසස්ස විත්තං,
සමන්තතො තං පරිවජ්ජයන්ති
තිණ්ණො නදීපාරගතොව කුල්ලං.

4145. සිලෙසූපමා සිඛිරිව සබ්බභක්ඛා
තික්ඛමායා නදීරිව සීඝසොතා,
සෙවන්ති හෙතා පියමප්පියඤ්ච
නාවා යථා ඔරකූලං පරඤ්ච.

1. ධුද්දනා – මජසං.
2. දුබ්භිනං – වි. මජසං. ස්‍යා.
3. සහන්තං – මජසං.
4. ආවාසුං – මජසං.

4138. මුළු ලොවට අධිපති වූ බඹදත් රජුගේ පිඞ්ගියානී නම් භාර්‍යාව තම වසඟයෙහි සිටියකු (අස්ගොව්වකු) සමග අනාචාරයෙහි හැසුරුනී ය. කාමයන් පතන්නා වූ ඕ තොමෝ එය ද (අස්ගොව්වා ද අගමෙහෙසුන් තනතුර ද යන දෙක ම) නො ලැබුවා ය.

4139. බඳනාලද සොරුන් කෙරෙහි පවා ඇලෙන ලාමක වූ වහා පෙරළෙන සිත් ඇත්තා වූ අකෘතඥ වූ ද්‍රොහී වූ ස්ත්‍රීන්ගේ සිල්වත් ස්වභාවය භූතාවිෂ්ට නො වූ පුරුෂයෙක් නො අදහන්නේ ය.

4140. ඒ ස්ත්‍රීහු කළ දෑ නො දනිත්. කළ යුතු දෑ නො දනිත්. මව හෝ පියා හෝ සහෝදරයා හෝ නො දනිත්. ලජ්ජාවිරහිත වූ ඉක්ම වූ ගුණදම් ඇති ඔවුහු තම චිත්තයාගේ වසඟයට ම යෙත්.

4141. බොහෝ කාලයක් එක්ව විසුවා වූ ප්‍රිය වූ මනාප වූ අනුකම්පා ඇති ප්‍රාණ සම වූ ඒ ස්වාමියා ආපදපන්න අවස්ථාවන්හි ද කටයුත්තක් පැමිණි කල්හි ද හැරදමති. එබැවින් මම ස්ත්‍රීන්ගේ ස්වභාවය විශ්වාස නො කරමි.

4142. ස්ත්‍රීන්ගේ සිත වනාහි වඳුරාගේ සිත මෙනි. උස් පහත් භේදයක් නැතිව වැටෙන ගස් සෙවණ මෙන් ස්ත්‍රීන්ගේ සිත එක තැනෙක නො පිහිටයි. ගමන්කරන රථචක්‍රයාගේ නිම්වළල්ල මෙන් (ස්ත්‍රීන්ගේ සිත) නොයෙක් අරමුණට පෙරළෙයි.

4143. සොයා බලන්නා වූ ඒ ස්ත්‍රීහු යම් විටෙක පුරුෂයා අයත් ගතයුතු යම් වස්තුවක් දකිත් ද එවිට කාම්බෝජ වැසියන් දියෙහි හටගත් සෙවෙලින් අසකු අල්වාගන්නා මෙන් මෘදු වචනයෙන් ඒ පුරුෂයා තම වසයට ගනිත්.

4144. සොයා බලන්නා වූ ඒ ස්ත්‍රීහු යම් විටෙක පුරුෂයා අයත් ගතයුතු වස්තුවක් නො දකිත් ද (එවිට) ගඟ තරණය කළ, ගඟින් එතෙර වූ තෙනැත්තා පසුර අත්හරින්නා මෙන් ඒ පුරුෂයා හාත්පසින් දුරු කෙරෙත්.

4145. (පුරුෂයන්ගේ සිත් අලවන හෙයින්) ලාටු බඳු වූ ද, සියල්ල භක්ෂණය කරන හෙයින් ගින්න බඳු වූ ද, (වේගයෙන් ගලා යන දිය පහර ඇති නදීන් මෙන්) ශීඝ්‍ර (තියුණු) මායා ඇති මේ ස්ත්‍රීහු එගොඩ මෙගොඩ දෙක ම සේවනය කරන්නා වූ නැවක් මෙන් ප්‍රිය වූවහු ද අප්‍රිය වූවහු ද සේවනය කෙරෙත්.

4146. න තා එකස්ස න ද්වින්නං ආපණොව පසාරිතො,
යො තා මය්හන්ති මඤ්ඤෙය්‍ය වාතං ජාලෙන බාධයෙ[1].

4147. යථා නදී ච පන්ථො ච පානාගාරං සභා පපා,
එවං ලොකිත්ථියො නාම වෙලා තාසං න විජ්ජති.

4148. ඝතාසනසමාහෙතා කණ්හසප්පසිරූපමා,
ගාවො බහි තිණස්සෙව ඔමසන්ති වරං වරං.

4149. ඝතාසනං කුඤ්ජරං කණ්හසප්පං
මුද්ධාභිසිත්තං පමදා ච සබ්බා,
එතෙ නරො නිච්චයතො භජෙථ
තෙසං හවෙ දුබ්බිදූ සච්චභාවො[2].

4150. නාච්චන්තවණ්ණා[3] න බහූන කන්තා
න දක්ඛිණා පමදා සෙවිතබ්බා,
න පරස්ස භරියා න ධනස්ස හෙතු
එතිත්ථියො පඤ්ච න සෙවිතබ්බා.

අථ ඛලු භො ආනන්ද ගිජ්ඣරාජා කුණාලස්ස සකුණස්ස ආදි-මජ්ඣකථාපරියොසානං විදිත්වා තායං වෙලායං ඉමා ගාථායො අභාසි.

4151. පුණ්ණම්පි චෙමං පථවිං ධනෙන
දජ්ජිත්ථියා පුරිසො සම්මතාය,
ලද්ධා ඛණං අතිමඤ්ඤෙය්‍ය තම්පි
තාසං වසං අසතීනං න ගච්ඡෙ.

4152. උට්ඨාහකඤ්චෙපි අලීනවුත්තිං
කොමාරභත්තාරං පියං මනාපං,
ආවාසු කිච්චෙසු ච නං ජහන්ති
තස්මා හි ඉත්ථීනං න විස්සසාමි.

4153. න විස්සසෙ ඉච්ඡති මන්ති පොසො
න විස්සසෙ රොදති මෙ සකාසෙ,
සෙවන්ති හෙතා පියමප්පියඤ්ච
නාවා යථා ඔරකුලං පරඤ්ච.

---

1. බන්ධයෙ - මජසං, ස්‍යා.
2. සබ්බභාවො - මජසං.
3. නච්චන්ත - මජසං.
4. ආදිමජ්ඣගාථා - වි. මජසං, ස්‍යා.

4146. ඒ ස්ත්‍රීහු එකකුට (අයිති) නො වෙති. දෙදෙනකුට ද නො වෙති. විවෘත කරනලද සල්පිළක් බඳු ය. යමෙක් ඒ ස්ත්‍රීන් මගේ යැ යි සිතන්නේ නම් හෙතෙම දැලින් සුළඟ වැළැක්ම ද කරන්නේ ය.

4147. ගංගාව ද මාර්ගය ද සුරාපානශාලාව ද සභාව ද පැන් හල ද යන මොහු යම්සේ වෙත් ද, ලොකයෙහි ස්ත්‍රීහු ද එබඳු වෙත්. ඔවුනට මර්‍යාදාවක් (සීමාවක්) නැත.

4148. මේ ස්ත්‍රීහු වනාහි ගින්න හා සම වෙති. කෘෂ්ණ සර්පයකුගේ හිසට බඳු උපමා ඇත්තාහ. (තණ කෑ තැන් අත්හැර) පිටත අලුත් අලුත් තණ සොයා යන ගෙරින් සේ ස්ත්‍රීහු උතුම් පුරුෂයකු (ධන නැත්තහු හැරදමා ධනවතකු) සොයති.

4149. ගින්න ද ඇතා ද කෘෂ්ණසර්පයා ද රජු ද සියලු ස්ත්‍රීහු ද යන මොවුන් මනුෂ්‍ය තෙම සිහි ඇත්තෙක් ව සේවනය කරන්නේ ය. එකාන්තයෙන් ඔවුන්ගේ ඇති තතු දැනගැනීම දුෂ්කර ය.

4150. විශිෂ්ට රූ ඇත්තී ද බොහෝ දෙනාට ප්‍රිය තෙනැත්තී ද නෘත්‍ය ගීතයන්හි දක්‍ෂ වූ ස්ත්‍රිය ද අනෙකකුගේ භාර්‍යාව ද සේවනය නො කටයුත්තී ය. ධන හෙතුවෙන් ද සේවනය නො කටයුත්තී ය. මේ ස්ත්‍රීහු පස්දෙන සේවනය නො කටයුත්තාහු වෙති යි කුණාල පක්ෂියා කීය.

භවත්නි, ඉක්බිති ආනන්ද නම් ගිජුලිහිණි රජ කුණාල පක්ෂි රාජයාගේ කථාව පිළිබඳ මුල මැද අග තේරුම් ගෙන එවේලෙහි මේ ගාථාවන් කීය.

4151. ඉදින් යම් පුරුෂයෙක් ධනයෙන් සම්පූර්ණ වූ පෘථිවිය සම්මත වූ යම් ස්ත්‍රියකට දෙයි ද, ඕ ඉඩක් ලැබ ඒ පුරුෂයා ද ඉක්මවන්නී ය. එහෙයින් එබඳු ස්මෘති විරහිත ස්ත්‍රීන්ගේ වසයට නො යන්නේ ය.

4152. උත්සාහවත් නො පසුබට පැවතුම් ඇති ප්‍රිය වූ මන වඩන තුරුණු වියෙහි සිටි සැමියා පවා විපත්වලදී ද ඇවැසි කට-යුත්තක් පැමිණි කල්හි ද (ස්ත්‍රීහු) යම් හෙයකින් හැර දමත් ද එහෙයින් ස්ත්‍රීන්ගේ (සදචාර ස්වභාවය) විශ්වාස නො කරමි.

4153. (මෝ තොමෝ) මා කැමති වන්නී යැ යි පුරුෂ තෙම ස්ත්‍රිය විශ්වාස නො කරන්නේ ය. මා සමීපයෙහි හඬා යයි ස්ත්‍රිය විශ්වාස නො කරන්නේ ය. යම් හෙයකින් එගොඩ මෙගොඩ දෙක ම සෙවුනා නැව මෙන් මේ ස්ත්‍රීහු ප්‍රිය අප්‍රිය දෙදෙන ම සේවනය කෙරෙත් ද එහෙයිනි.

4154. න විස්සසෙ සාඛපුරාණසන්ථතං
න විස්සසෙ මිත්තපුරාණචොරං,
න විස්සසෙ රාජා[1] සඛා මමන්ති
න විස්සසෙ ඉත්ථී දසන්නමාතරං.

4155. න විස්සසෙ රාමකරාසු නාරිසු
අච්චන්තසීලාසු අසඤ්ඤතාසු,
අච්චන්තපෙමානුගතස්ස භරියා
න විස්සසෙ තිත්ථසමා හි නාරියො.

4156. හනෙය්‍යු[2] ඡින්දෙය්‍යුම්පි ඡෙදයෙය්‍යුං
කණ්ඨම්පි ඡෙත්වා රුධිරං පිබෙය්‍යුං,
මා දීනකාමාසු අසඤ්ඤතාසු
භාවං කරෙ ගඞ්ගතිත්ථූපමාසු.

4157. මුසා තාසං යථා සච්චං සච්චං තාසං[3] යථා මුසා,
ගාවො බහි තිණස්සෙව ඔමසන්ති වරං වරං.

4158. ගතෙනෙතා පලොභෙන්ති පෙක්ඛිතෙන[4] මිහිතෙන ච,
අථොපි දුන්නිවත්ථෙන මඤ්ජුනා භණිතෙන ච.

4159. චොරියො කථිනා[5]හෙතා වාළා ච ලපසක්ඛරා,
න තා කිඤ්චි න ජානන්ති යං මනුස්සෙසු වඤ්චනං.

4160. අසා ලොකිත්ථියො නාම වෙලා තාසං න විජ්ජති,
සාරත්තා ච පගබ්භා ච[6] සිඛී සබ්බඝසො යථා.

4161. නත්ථිත්ථීනං පියො නාම අප්පියොපි[7] න විජ්ජති,
සෙවන්ති හෙතා පියමප්පියඤ්ච නාවා යථා ඔරකූලංපරඤ්ච.

4162. නත්ථිත්ථීනං පියො නාම අප්පියොපි න විජ්ජති,
ධනත්තා පතිවෙල්ලන්ති[8] ලතාව දුමනිස්සිතා.

4163. හත්ථිබන්ධං අස්සබන්ධං ගොපුරිසඤ්ච චණ්ඩාලං[9],
ඡවඩාහකං පුප්ඵඡඩ්ඩකං සධනමනුපතන්ති නාරියො.

---

1. රාජානං – මජසං.
2. හනෙය්‍යුං – මජසං.
3. භාසං – මජසං.
4. පක්ඛිතෙනම්හිතෙනච – සයා.
5. කඨිනා – මජසං.
6. පගබ්භාච – මජසං.
7. අපියොපි – මජසං.
8. ධනත්තාපටිවෙල්ලන්ති – මජසං.
9. මණ්ඩලං – මජසං.

4154. පැරණි කොළ ඇතිරිය විශ්වාස නො කරන්නේ ය. පැරණි මිතුරකු වූ හොරා විශ්වාස නො කරන්නේ ය. මගේ යහළු-වෙකැ යි රජු විශ්වාස නො කරන්නේ ය. දස දෙනකුන්ගේ මව වුව ද ස්ත්‍රිය විශ්වාස නො කරන්නේ ය.

4155. බාලයන් විසින් ඇලුම් කරනු ලබන, ඉක්මවන ලද සිල් ඇති, අසංස්කෘත වූ ස්ත්‍රීන් කෙරෙහි විශ්වාස නො කටයුතු ය. අත්‍යන්ත ප්‍රෙමයෙන් යුතු තෙනැත්තහුගේ භාර්‍ය්‍යාව ද විශ්වාස නො කටයුතු ය. ස්ත්‍රීහු තීර්ථ සම වෙත් ද එහෙයිනි.

4156. (යම් හෙයකින් කිපුණා වූ හෝ අන් පුරුෂයන් කෙරෙහි ඇලුණා වූ හෝ ස්ත්‍රීහු) සැමියා නසන්නාහු සිඳින්නාහු සිඳවන්නාහු බොටුව සිඳ ලේ බොන්නාහු වෙත් ද එහෙයින් ලාමක අදහස් ඇති සංයම නැති ගංගා තීර්ථ බඳු ස්ත්‍රීන් කෙරෙහි ස්නෙහ නො කරන්නේ ය.

4157. ඒ ස්ත්‍රීන්ගේ බොරුව සත්‍යය මෙනි. සත්‍යය බොරුව මෙනි. තණ බිමෙන් පිටත් තැන්හි හොඳ හොඳ තණ සොයන ගවයන් මෙන් (ඔවුහු) අන් පුරුෂයන් සොයත්.

4158. මේ ස්ත්‍රීහු ගමනින් ද බැල්මෙන් ද මඳ සිනාවෙන් ද නපුරු කොට වස්ත්‍ර හැඳීමෙන් ද මිහිරි වදන් බිණීමෙන් ද (පුරුෂ යන්) පොලොඹවත්.

4159. මේ ස්ත්‍රීහු සෙරහ. තද සිත් ඇත්තාහ. දුෂ්ටයහ. හකුරු මෙන් මිහිරි වදන් ඇත්තාහ. මිනිසුන් අතර යම් වංචාවක් ඇත් නම් (එයින්) ඔවුන් නො දන්නා කිසිවක් නැත.

4160. ලොකයෙහි ලාමක වූ මේ ස්ත්‍රීහු නම් හැම කල්හි රාගයෙන් ඇලුණාහු ය. කායප්‍රගල්භාදියෙන් යුක්ත වූවාහු ය. සියල්ල භක්‍ෂණය කරන (දවන) ගින්න මෙන් සියල්ල වනසනසුලු ය. ඔවුනට සීමාවෙක් නැත.

4161. ස්ත්‍රීන්ට ප්‍රියයෙක් නම් නැත. අප්‍රියයෙක් ද නැත. එගොඩ මෙගොඩ දෙක ම සෙවුනා නැව මෙන් මොවුහු ප්‍රියයා ද අප්‍රියයා ද සේවනය කෙරෙත්.

4162. ස්ත්‍රීන්හට ප්‍රියයෙක් නම් නැත. අප්‍රියයෙක් ද නැත. ගස ඇසුරු කරන්නා වූ වැල මෙන් ධන හෙතුවෙන් (පුරුෂයා) වැළඳගනිත්.

4163. ස්ත්‍රීහු නම් ඇත්ගොව්වා ද අස්ගොව්වා ද ගොපල්ලා ද සැඩොලා ද සොහොන්ගොව්වා ද කසළශොධකයා ද යන මොවුන් අතුරින් කවරකු වුව ද සධනයා (ධන ඇත්තා) කරා යෙත්.

4164. කුලපුත්තම්පි ජහන්ති අකිඤ්චනං ඡවකසමසදිසම්පි,
අනුගච්ඡන්ති අනුපතන්ති ධනහෙතු හි නාරියොති.

අථ ඛලු භො නාරදො දෙවබ්‍රාහ්මණො ආනන්දස්ස ගිජ්ඣරාජස්ස ආදිමජ්ඣකථා[1]පරියොසානං විදිත්වා තායං වෙලායං ඉමා ගාථායො අභාසි.

4165. චත්තාරො මෙ න පූරෙන්ති තෙ මෙ සුණාථ භාසතො[2],
සමුද්දො බ්‍රාහ්මණො රාජා ඉත්ථී චාපි දිජම්පති.

4166. සරිතා සාගරං යන්ති යා කාචි පථවිංසිතා[3],
තා සමුද්දං න පූරෙන්ති ඌනත්තා[4] හි න පූරති.

4167. බ්‍රාහ්මණො ච අධීයාන වෙදමක්ඛානපඤ්චමං,
භිය්‍යොපි සුතමිච්ඡෙය්‍ය ඌනත්තා හි න පූරති.

4168. රාජා ච පථවිං[5] සබ්බං සසමුද්දං සපබ්බතං,
අජ්ඣාවසං[6] විජිනිත්වා අනන්තරතනොචිතං
පාරං සමුද්දං පත්ථෙති ඌනත්තා හි න පූරති.

4169. එකමෙකාය ඉත්ථියා අට්ඨට්ඨ පතිනො සියා,
සූරා ච බලවන්තො ච සබ්බකාමරසාහරා
කරෙය්‍ය නවමෙ ඡන්දං ඌනත්තා හි න පූරති.

4170. සබ්බිත්ථියො සිඛිරිව සබ්බභක්ඛා
සබ්බිත්ථියො නදීරිව සබ්බවාහිනී[7],
සබ්බිත්ථියො කණ්ටකානං ව සාඛා
සබ්බිත්ථියො ධනහෙතු වජන්ති.

4171. වාතඤ්ච ජාලෙන නරො පරාමසෙ
ඔසිඤ්චියා සාගරමෙකපාණිනා,
සකෙන හත්ථෙන හනෙය්‍ය ඝොසං
යො සබ්බභාවං පමදාසු ඔස්සජෙ.

4172. චොරීනං බහුබුද්ධීනං යාසු සච්චං සුදුල්ලභං,
ථීනං භාවො දුරාජානො මච්ඡස්සෙවොදකෙ ගතං.

1. ආදිමජ්ඣගාථා – වි. මජසං.
2. සුණාථ මම භාසතො – මජසං.,
3. පථවිස්සිතා – මජසං.
4. ඔනත්තා – සයා.
5. පථවිං – මජසං.
6. අජ්ඣාවසෙ– සීමු.
7. වාහී – මජසං.,

4164. ස්ත්‍රීහු ධනය නැති කුලපුත්‍රයා ද හැරදමති. ධනය ඇති සැඬොලා අනුව ද යෙත්. යම් හෙයකින් ස්ත්‍රීහු ධනහෙතුවෙන් ම පුරුෂයා අනුව යෙත් ද, එහෙයිනි.

භවත්නි, ඉක්බිති නාරද දෙවබ්‍රාහ්මණ තෙම ආනන්ද නම් ගිජුලිහිණි රජුගේ කථාව පිළිබඳ මුල මැද අග දැන එවේලෙහි මේ ගාථාවන් ප්‍රකාශ කෙළේය.

4165. පක්ෂිරාජය, මේ සතර දෙනෙක් තෘප්ත නො වෙති. එය ප්‍රකාශ කරන මාගේ වචනය අසව. සමුද්‍රය ද බ්‍රාහ්මණයා ද රජ ද ස්ත්‍රී ද (යන සතර දෙන ය.)

4166. පොළොව ඇසුරු කළා වූ යම්කිසි ගංගාවෝ වෙත් ද, ඒ සියල්ලෝ ම සයුරට බැස යෙති. ඔවුහු සයුර නො පුරවත්. (දිය පිහිටන තැන් මහත් හෙයින්) ඌනව ම පවත්නා නිසා නො පිරෙයි.

4167. බ්‍රාහ්මණයා ඉතිහාසය පස්වැනි කොට ඇති වෙදය හදරා මත්තෙහි ද ඉගෙනීමට කැමති වන්නේ ය. හෙ ද (අදහස මහත් බැවින්) ඌනව ම වෙසෙන හෙයින් නො පිරෙයි.

4168. රජ ද මුහුදු සහිත වූ පර්වත සහිත වූ අනන්තරත්න යෙන් යුක්ත වූ මුළු පොළොව දිනා (නොයෙක් රත්නයෙන් පූර්ණ ව) වෙසේ ද, එහෙත් මුහුදින් එතෙර ද පතයි. (හෙ ද තෘෂ්ණා මහත්ත්වයෙන් යුතු හෙයින්) ඌන හෙතුවෙන් ම නො පිරෙයි.

4169. එපරිද්දෙන් ම එක ස්ත්‍රියකට ශූර වූ ද බලවත් වූ ද සියලු කාමරසයන් ගෙනදෙන්නා වූ ද සැමියන් අට අට දෙනා සිටිත් ද, එසේ වුවත් නවවැන්නකු කෙරෙහි ආශා කරන්නී ය. (කාමතෘෂ්ණා මහත්ත්වයෙන් යුතු හෙයින්) ඌන බැවින් නො පිරෙයි.

4170. සියලු ස්ත්‍රීහු ගින්න මෙන් සියල්ල කාදමන්නෝ ය (වනසන්නෝ ය.) සියලු ස්ත්‍රීහු ගංගාව මෙන් සියල්ල වහනය කරන්නෝ ය. සියලු ස්ත්‍රීහු කටුගස්වල අතු වැනි වෙති. සියලු ස්ත්‍රීහු ධනහෙතුවෙන් පරපුරුෂයන් කරා යෙත්.

4171. යම් පුරුෂයෙක් ස්ත්‍රීන් කෙරෙහි සිය රහස් ප්‍රකාශ කෙරේ ද (ඒ රහස් අනුන් හා නො බැණ ස්ත්‍රීන් වෙත රැකුණ-හොත්) ඒ පුරුෂ තෙම දැලෙන් වාතය රඳවන්නේ ය. එක අත්ලෙන් සයුරු දිය හිස් කරන්නේ ය. සිය එක අතින් (ඒ අතට ම ගසා) හඬ නගන්නේ ය.

4172. යම් හෙයෙකින් ස්ත්‍රීන් කෙරෙහි සත්‍යය ඉතා දුර්ලභ වේ ද, චෞර වූ බහුබුද්ධික වූ ස්ත්‍රීන්ගේ අදහස දියෙහි මසුන්ගේ ගමන් මග මෙන් දැනගැනීම දුෂ්කර ය.

4173. අනලා මුදුසම්භාසා දුප්පූරා තා නදීසමා,
සීදන්ති නං විදිත්වාන ආරකා පරිවජ්ජයෙ.

4174. ආවට්ටනී මහාමායා බ්‍රහ්මචරියවිකොපනා,
සීදන්ති නං විදිත්වාන ආරකා පරිවජ්ජයෙ.

4175. යඤ්ඤෙතා[1] උපසෙවන්ති ඡන්දසා වා ධනෙන වා,
ජාතවෙදෙව සණ්ඨානං ඛිප්පං අනුදහන්ති නන්ති.

අථ ඛලු භො කුණාලො සකුණො නාරදස්ස දෙවබ්‍රාහ්මණස්ස ආදිමජ්ඣ[2]කථාපරියොසානං විදිත්වා තායං වෙලායං ඉමා ගාථායො අභාසි.

4176. සල්ලපෙ නිසිත[3]ඛග්ගපාණිනා
පණ්ඩිතො අපි පිසාචදෙසිනා,
උග්ගතෙජඋරගම්පි ආසිදෙ
එකො එකාය පමදාය නාලපෙ.

4177. ලොකචිත්තමථනා හි නාරියො
නච්චගීතභණිතම්හිතාවුධා,
බාධයන්ති අනුපට්ඨිතස්සතිං
දීප[4]රක්ඛසිගණාව වාණිජෙ.

4178. නත්ථි තාසං විනයො න සංවරො
මජ්ජමංසනිරතා අසඤ්ඤතා,
තා ගිලන්ති පුරිසස්ස පාභතං
සාගරෙව මකරං තිමිඞ්ගලො[5].

4179. පඤ්චකාමගුණසාතගොචරා
උද්ධතා අනියතා අසඤ්ඤතා,
ඔසරන්ති පමදා පමාදිනං
ලොණතොයවතියංව ආපගා[6].

4180. යං නරං උපරමන්ති[7] නාරියො
ඡන්දසාව රතියා ධනෙනවා,
ජාතවෙදසදිසම්පි තාදිසං
රාගදෙසවතියො[8] ඩහන්ති[9] නං.

1. යංඑතා – මජසං.
2. ගාථා – වි. මජසං. සයා.
3. නීසිත – මජසං.
4. දීපෙ – වි. මජසං. සයා.
5. තිමිඞ්ගයො – මජසං.
6. ආපකා – සීමු.
7. පලාපෙන්ති – මජසං. උපලපෙන්ති – වි. සයා.
8. වධියො – – මජසං. සයා.
9. දහන්ති – මජසං. සයා.

4173. (ගිහි ධර්මවලින්) මෙතෙකින් පමණ යැ යි කීමක් නැති, මොළොක් වචන ඇති, කෙලෙස් රතියෙන් පිරවිය නො හැකි ඒ ස්ත්‍රීහු නදී සමයහ. ඒ ස්ත්‍රීහු සෙවනය කළවුන් සතර අපායෙහි ගිල්වත් යැ යි දැන දුරින් ම දුරුකටයුතු ය.

4174. අනුන් මොහනය කරන්නා වූ මහාමායා ඇති, බඹසර නසන්නා වූ ඒ ස්ත්‍රීහු සෙවනය කළවුන් සතර අපායෙහි ගිල්වත් යැ යි දැන දුරින් ම දුරු කළ යුත්තාහ.

4175. මේ ස්ත්‍රීහු ප්‍රියසංවාස වශයෙන් හෝ ධන හෙතුවෙන් හෝ යම් පුරුෂයකු සෙවනය කෙරෙත් ද (තමා) පහස ලත් ලත් තැන දවන ගින්න මෙන් වහා ඔහු විනාශයට පමුණුවත් ය යි කීය.

භවත්නි, ඉක්බිති කුණාල පක්ෂි තෙම නාරද නම් දෙව-බ්‍රාහ්මණයාගේ කථාව පිළිබඳ මුල මැද අග තේරුම් ගෙන ඒ වේලායෙහි මේ ගාථාවන් ප්‍රකාශ කෙළේ ය.

4176. නුවණැත්තෝ තියුණු මුවහත් කඩුගත් අත් ඇත්තකු සමග කථා කරන්නේ ය. කිපුණු පිශාචයකු සමග කථා කරන්නේ ය. උග්‍ර තෙජස් ඇති සර්පයකු වෙත හිඳිනේ ය. (එහෙත්) හුදෙකලා වූයේ හුදෙකලා වූ ස්ත්‍රියක සමග කථා නො කරන්නේ ය.

4177. නැටීම ය ගී කීම ය බිණීම ය සිනාව ය යන මේවා අවි කොට ඇති ඒ ස්ත්‍රීහු වනාහි ලොකයාගේ සිත් මඩින්නාහ. යක්ෂද්වීප යෙහි මිනිසුන් පොළඹවා ගෙන කාදමන රකුසියන් මෙන් එළඹ සිටි සිහි නැත්තහු විනාශ කෙරෙත්.

4178. ඔවුන්ගේ හික්මීමෙක් නැත. සංවරයෙක් ද නැත. මත්පැනෙහි හා මස්කෑමෙහි ගිජු වූ සංයම විරහිත ඒ ස්ත්‍රීහු මහ සයුරෙහි මෝරකු ගිලින තිමිඞගල නම් මත්ස්‍යයා මෙන් පුරුෂයා දුකසේ සපයනලද ධනය වනසත්.

4179. පස්කම්සුව විඳීම ගොදුරු කොට ඇත්තා වූ උඩඟු වූ අස්ථිර සිත් ඇත්තා වූ සංයත නො වූ ස්ත්‍රීහු ගංගාවන් ඇදගන්න-සාගරය මෙන් ප්‍රමාද වූවහු සිය වසයට ගනිත්.

4180. ස්ත්‍රීහු ප්‍රෙමයෙන් හෝ පංචකාමරතියෙන් හෝ ධන හෙතුවෙන් හෝ යම් මිනිසකුට ඇලුම් කෙරෙත් ද, රාග ද්වෙෂ යන්ගෙන් යුක්ත වූ ඒ ස්ත්‍රීහු (ගුණසම්පත්තියෙන් යුක්ත හෙයින්) ගින්නක් මෙන් දිලියෙන එබඳු පුරුෂයා විනාශ කරත්.

4181. අඩ්ඪං ඤත්වා පුරිසං මහද්ධනං
ඔසරන්ති සධනා සහත්තනා,
රත්තවිත්තං අතිවෙඨයන්ති නං
සාලං මාලුවලතාව කානනෙ.

4182. තා උපෙන්ති විවිධෙන ඡන්දසා
චිත්‍රබිම්බමුඛියො අලඞ්කතා,
උහසන්ති පහසන්ති නාරියො,
සම්බරොව සතමායකොවිදා.

4183. ජාතරූපමණිමුත්තභූසිතා
සක්කතා පතිකුලෙසු නාරියො,
රක්ඛිතා අතිචරන්ති සාමිකං
දානවංව හදයන්තරස්සිතා[1].

4184. තෙජවාපි හි නරො විචක්ඛණො
සක්කතො බහුජනස්ස පූජිතො,
නාරීනං වසගතො න භාසති
රාහුනා උපගතොව[2] චන්දිමා.

4185. යං කරෙය්‍ය කුපිතො දිසො දිසං
දුට්ඨචිත්තො වසමාගතං අරි
තෙන භිය්‍යො ව්‍යසනං නිගච්ඡති
නාරීනං වසගතො අපෙක්ඛවා.

4186. කෙසලූනනඛඡින්නතජ්ජිතා
පාදපාණිකසදණ්ඩතාළිතා,
හීනමෙව උපගතා හි නාරියො
තා රමන්ති කුණපෙව මක්ඛිකා.

4187. තා කුලෙසු විසිඛන්තරෙසු වා
රාජධානිනිගමෙසු[3] වා පුන,
ඔඩ්ඩිතං නමුචිපාසවාකරං[4]
චක්ඛුමා පරිවජ්ජයෙ[5] සුඛත්ථිකො.

---

1. හදයන්තදස්සිතා - මජසං.
හදයන්තරනිස්සිතා - සයා.
2. උපහතොව - මජසං, සයා.
3. රාජධානි - මජසං.
4. වාකුරං - මජසං. වාගුරං - සයා.
5. පරිවජ්ජෙ - සීමු.

4181. ආඪ්‍ය වූ මහත් ධනය ඇති පුරුෂයා දූත සිය ධනයෙන් ද ආත්මපරිත්‍යාගය කරන්නක මෙන් ද එළැඹෙත්. රාගයෙන් රත් වූ සිත් ඇති ඔහු වෙනෙහි සල්ගස වැළඳගත් මාළුවා වැල මෙන් අතිශයින් වෙළාගනිත් (වැළඳගෙන පෙළත්.)

4182. සැරසීමෙන් විසිතුරු කරනලද ශරීර හා මුඛ ඇති, අලංකෘත වූ, සියගණන් මායාවන්හි දක්‍ෂ වූ ඒ ස්ත්‍රීහු මායාකාරයකු මෙන් හෙවත් සම්බර නම් අසුරයා මෙන් නොයෙක් ආකාර ඇල්මෙන් පැමිණෙත්. මහත් කොට සිනාසෙත්. මදහස කෙරෙත්.

4183. රන් මිණි මුතුවලින් සැරසුණු පතිකුලයන්හි සත්කාර කරනලද ස්ත්‍රීහු රක්නාලද වුවත් සැමියා ඉක්මවා හැසිරෙත්, හෘදයාභ්‍යන්තරයෙහි ආරක්ෂිත වූ ස්ත්‍රිය අසුරයා ඉක්ම පැවැත්තී ද එමෙනි.

4184. බොහෝ දෙනා විසින් සත්කාර කරන ලද පුදනලද නුවණැති තෙජස්වී පුරුෂ තෙමේ ද ස්ත්‍රී වසයට ගියේ රාහු වසයට ගිය සඳ මෙන් නො බබළයි.

4185. කිපුණු දුෂ්ට සිත් ඇති සතුරෙක් තමා වසයට පැමිණි සතුරකුට යමක් කරන්නේ ද, ස්ත්‍රී වසයට ගිය තෘෂ්ණා සහිත පුරුෂ තෙම එයට වඩා බොහෝ වූ විපතකට පැමිණෙයි.

4186. හිසකේ ඇද කැඩීමෙන්, නියවලින් සීරීමෙන්, තර්ජනය කරනලද්ද වූ, අත් පා කස දඬුවලින් කළන ලද්ද වූ ඒ ස්ත්‍රීහු කුණපයෙහි ම ඇලෙන මැස්සන් මෙන් හීනයා වෙත ම එළඹීයාහු ඇලෙත්.

4187. කුලයන්හි හා වීථි අතර ද රාජධානිවල හා නියම් ගම්වල ද (කෙලෙස්) මරහු විසින් අටවනලද මලපුඩුවක් වැනි වූ ද දැලක් වැනි වූ ද ඒ ස්ත්‍රීන් නුවණැස් ඇති දෙලෝ සුව කැමති මිනිස් තෙම දුරු කරන්නේ ය.

4188. ඔස්සජිත්වා[1] කුසලං තපොගුණං
යො අනරියචරිතානිමාචරි,
දෙවතාහි නිරයං නිමිස්සති[2]
ඡෙදගාමි මණියං ච වාණිජො.

4189. සො ඉධ ගරහිතො පරත්ථ ච
දුම්මති උපගතො[3] සකම්මුනා,
ගච්ඡති අනියතො ගලාගලං
දුට්ඨගද්‍රභරථොව උප්පථෙ.

4190. සො උපෙති නිරයං පතාපනං
සත්තිසිම්බලිවනඤ්ච ආයසං[4]
ආවසිත්වා තිරච්ඡානයොනියං[5]
පෙතරාජවිසයං න මුඤ්චති.

4191. දිබ්බඛිඩ්ඩරතියො ච නන්දනෙ
චක්කවත්තිචරිතඤ්ච මානුසෙ,
නාසයන්ති පමදා පමාදිනං
දුග්ගතිඤ්ච පටිපාදයන්ති තං.

4192. දිබ්බඛිඩ්ඩරතියො න දුල්ලභා
චක්කවත්තිචරිතඤ්ච මානුසෙ,
සොණ්ණ[6]ව්‍යම්හනිලයා ච අච්ඡරා
යෙ චරන්ති පමදහනත්ථිකා.

4193. කාමධාතුසමතික්කමා ගති
රූපධාතුයා[7] භවො න දුල්ලභො,
වීතරාගවිසයූපපත්තියා
යෙ චරන්ති පමදහනත්ථිකා.

4194 සබ්බදුක්ඛසමතික්කමං සිවං
අච්චන්තං අචලිතං අසඞ්ඛතං,
නිබ්බුතෙහි සුචිහී න දුල්ලභං
යෙ චරන්ති පමදහනත්ථිකා.

4195. කුණාලො හං තදා ආසිං උදයී ඵුස්සකොකිලො,
ආනන්දො ගිජ්ඣරාජාසි සාරිපුත්තො ච නාරදො
පරිසා බුද්ධපරිසා එවං ධාරෙථ ජාතකන්ති.

4. කුණාලජාතකං.

1. ඔසජිත්වා – මජසං.
2. නයිස්සති – මජසං.
3. උපහතො – මජසං.
4. මායස – සීමු.
5. යොනියා – මජසං. යොනියෙ – සයා.
6. සුවණ්ණ – මජසං.
7. රූපධාතුභාවො – මජසං.
රූපධාතුසම්භවො – සයා.

4188. යමෙක් දෙව් මිනිස් සුව ගෙනදෙන්නා වූ තවුස් ගුණය අතහැර අනායසී වූ කාමසෙවනය කෙරේ ද, හෙතෙම දෙව්ලොවින් (පෙරළී) නිරයට යෙයි. (මහඟු මිණිරුවන් දී) නො වටනා කඳ මිණක් ගන්නා (ලාමක) වෙළෙන්දකු මෙනි.

4189. (ස්ත්‍රී වසයට ගිය) ඒ අනුවණ තෙනැත්තා මෙලෝ පරලෝ දෙකෙහි ම ගර්හිත වූයේ, ස්වකර්මයෙන් විපාක විඳීමට එළඹියේ මෙතෙක් කලැයි අනියත වූයේ දෙව් මිනිස් දෙලොවින් ගිලිහී අපායට ම යයි. කුළු ගදුබුවකු යොදනලද රිය නො මහෙහි ම යනු මෙනි.

4190. ස්ත්‍රී වසයට ගිය ඒ පෙනැත්තා අතිශයින් තැවීම් ඇත්තා වූ නිරයට ද අයොමය කටුවලින් යුත් කඩුඉඹුල්වන නම් වූ නිරයට ද පැමිණේ. එහි වැස තිරිසන් යොනිය ද ප්‍රෙතවිෂය ද කාලකඤ්ජක නම් අසුරවිෂය ද නො ඉක්මවයි.

4191. ප්‍රමදවෝ ප්‍රමාදයෙන් යුත් පුරුෂයන්ගේ නන්‍දනොද්‍යාන-යෙහි දිව්‍ය ක්‍රීඩාවන්හි ඇල්ම ද මනුෂ්‍ය ලොකයෙහි චක්‍රවර්ති රාජසම්පත්තිය ද නසත්. ඒ පුරුෂයන්ට දුගති දුක ද සලසත්.

4192. යම් කෙනෙක් ස්ත්‍රීන්ගෙන් වැඩෙක් නැතැයි (සිතා බඹසර) හැසිරෙත් ද ඕවුනට දිව්‍ය ක්‍රීඩාවන්හි ඇල්ම ද මිනිස් ලොවෙහි සක්විති සැපත ද රන්මුවා විමන් වැසි දෙවඟනෝ ද දුලබ නො වෙති.

4193. යම් කෙනෙක් ස්ත්‍රීන්ගෙන් වැඩෙක් නැතැයි (සිතා බඹසර) හැසිරෙත් ද, (ඔවුනට) කාමධාතුව ඉක්මවීමෙන් ලැබෙන රූපභවය පිළිබඳ (උත්පත්ති වශයෙන් වූ) ගතිය ද වීතරාගීන්ට විෂය වූ ශුද්ධාවාසයන්හි උත්පත්තිය ද දුලබ නො වේ.

4194. යම් කෙනෙක් ස්ත්‍රීන්ගෙන් වැඩෙක් නැතැයි (සිතා බඹසර) හැසිරෙත් ද ඔවුනට නිවනලද කෙලෙස් ගිනි ඇති පිරිසුදුවූවන් විසින් ලදහැක්කා වූ හැම දුක් ඉක්මවාලන්නා වූ, නිර්භය වූ වෙනස් නො වන්නා වූ කෙලෙසුන්ගෙන් අකම්ප්‍ය වූ හෙතු-ප්‍රත්‍යයෙන් සකස් නො වූ නිර්වාණය දුර්ලභ නො වේ.

4195. එකල මම කුණාල නම් වීමි. උදයී පුස්සකොකිල නම් විය. ආනන්‍ද (ස්ථවිර තෙම) ගිජුලිහිණි රජ විය. සාරිපුත්‍ත (ස්ථවිර තෙම) නාරද නම් විය. පිරිස බුදුපිරිස ම ය. මෙසේ මේ ජාතකය දරව යී (වදළ සේක.)

කුණාල ජාතක යි.

5. මහාසුතසොමජාතකං.

4196. කස්මා තුවං රසක එදිසානි
කරොසි කම්මානි සුදාරුණානි,
හනාසි ඉත්ථී පුරිසෙ ච මූළ්හො
මංසස්ස හෙතු ආදු[1] ධනස්ස කාරණා.

4197. න අත්තහෙතු න ධනස්ස කාරණා
න පුත්තදාරස්ස සහායඤාතිනං,
භත්තා ච මෙ භගවා භූමිපාලො
සො ඛාදති මංසං භදන්තෙ එදිසං.

4198. සචෙ තුවං භත්තුරත්ථෙ පයුත්තො
කරොසි කම්මානි සුදාරුණානි,
පාතො ච අන්තෙපුරං පාපුණිත්වා
ලපෙය්‍යාසි මෙ රාජිනො සම්මුඛෙ තං.

4199. තථා කරිස්සාමි අහං භදන්ත
යමෙව ත්වං භාසසි කාළහත්ථී,
පාතො ච අන්තෙපුරං පාපුණිත්වා
වක්ඛාමි තෙ රාජිනො සම්මුඛෙ තං.

4200. තතො රත්‍යා විවසනෙ සුරියස්සුග්ගමනං පති,
කාළො රසකමාදාය රාජානං උපසඞ්කමි
උපසඞ්කමිත්වා රාජානං ඉදං වචනමබ්‍රවී.

4201. සච්චං කිර මහාරාජ රසකො පෙසිතො තයා,
හනාති[2] ඉත්ථී පුරිසෙ තුවං මංසානි ඛාදසි.

4202. එවමෙවං තථා කාළ රසකො පෙසිතො මයා,
මම අත්ථං කරොන්තස්ස කිමෙතං පරිභාසසි.

4203. ආනන්දො සබ්බමච්ඡානං ඛාදිත්වා රසගිද්ධිමා,
පරික්ඛීණාය පරිසාය අත්තානං ඛාදියා මතො.

4204. එවං පමත්තො රසගාරවෙ රත්තො
බාලො යදි ආයතිං නාවබුජ්ඣති,
විධම්ම පුත්තෙ චජි[3] ඤාතකෙ ච
පරිවත්තිය අත්තානමෙව ඛාදති.

1. අදු – මජසං.
2. හනති – මජසං.
